බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 17

## සූත්‍රාන්තපිටකයෙහි

08 වන ග්‍රන්ථය

# සංයුත්තනිකාය

## ද්විතීය භාගය

## නිදානවග්ගය

---

ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවෙහි

**සංයුත්තනිකාය සංශෝධක මණ්ඩලය**

විසින් කරණ ලද

**සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.**

---

බු. ව. 2557
ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 17

The Eighth Book in the
**Suttanta-Pitaka**
**8**

# SAMYUTTANIKĀYA (II)

With the Sinhala translation by

**The Samyuttanikāya Editorial Board**
**of**
**The Tripitaka Translation Committee**

**Published by**
**Dharma Chakkra Child Foundation**
Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka
Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /
**Co-published, printed and donated by**
**The Corporate Body of the Buddha Educational Foundation**
11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.
Tel: +886 2 23951198, Fax: +886 2 23913415
Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/
**B.E. 2557**
**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතව කරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ඛුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්ධකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චර්යාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගිනී, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපිතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**

## බෝදාගම චන්දිම නායක ස්ථවිර

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
වීදාගම,
බණ්ඩාරගම.

2557 / 2013

බුද්ධ ජයන්ති ත්‍රිපිඨක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ
බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක
වි. ජ. මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි
තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි
## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මගින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදී.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- ❉ පූජ්‍ය අත්තුඩාවේ ඤාණානන්ද නාහිමි
- ❉ පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ❉ ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ❉ ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- ❉ දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි
- ❉ ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ❉ ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- ❉ පූජ්‍ය බඹරැන්දේ ධම්මසිරි හිමි
- ❉ පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- ❉ මිලිනා සුමතිපාල මැතිණිය
- ❉ ජගත් සුමතිපාල මැතිතුමා
- ❉ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- ❉ දොස්තර අරුණ රබෙල් මහත්මා
- ❉ සුජිත් මොහොට්ටි මහත්මා
- ❉ රංජිත් අමරසිංහ මහත්මා
- ❉ ගාමිණී කාරියවසම් මහත්මා
- ❉ අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ❉ ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- ❉ මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- ❉ සිරිසේන හේරත් මැතිතුමා
- ❉ විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

දුතියො භාගො

## නිදානවග්ගො

සූත්‍රාන්තපිටකයෙහි

# සංයුත්තනිකාය

ද්විතීය භාගය

## නිදාන වර්ගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය.)

# පටුන

## CONTENTS


| | පිටුව |
|---|---|
| සංස්කාරකනිවේදනය ... ... ... | xi |
| සඞ්කේතනිරූපණය — ABBREVIATIONS ... | xii |
| පාළිහෝඩිය — PĀLI ALPHABET ... ... | xiii |
| නිදානවග්ග-විසයසූචි ... ... ... | xvi |
| පෙළ හා පරිවර්තනය ... ... ... | 2-441 |
| ගාථාදිපාදානුක්කමණිකා ... ... ... | 442 |
| සඤ්ඤනාමානුක්කමණිකා ... ... ... | 443 |
| පදානුක්කමණිකා ... ... ... | 445 |
| ශුද්ධි පත්‍රය ... ... ... ... | 483 |

# සංස්කාරක නිවේදනය

**සංයුත්තනිකායෙහි නිදානවග්ගය** අවසන් කොට ඇති සංයුත්ත නවයෙකින් යුත් ද්විතීයභාගය බුද්ධ**ජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලා** සඞ්ඛ්‍යායෙන් තුදුස් (14) වැනි, **සූත්‍රාන්තපිටකග්‍රන්ථ** සඞ්ඛ්‍යායෙන් අටවැනි ග්‍රන්ථ ය යි.

මේ භාගය සිංහලභාෂාවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී **ලඞ්කාබෞද්ධ මණ්ඩලය** විසින් පවරණ ලද්දේ ආචාර්ය පණ්ඩිත **දෙහිගස්පේ පඤ්ඤාසාර** නායකස්ථවිරයන් වහන්සේට ය. උන්වහන්සේ රෝගී වීමෙන් ඒ කාර්ය්‍ය පර්ය්‍යාප්ත නොවූ බැවින් ත්‍රිපිටකසංස්කාරකසභායෙහි සම්මතයෙන් සංයුත්තනිකාය සංශෝධකමණ්ඩලයට අයත් පණ්ඩිත **හෑගොඩ ධම්මින්ද** නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත **වතුගෙදර අමරසීහ** නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත **ගලගම සරණඞ්කර** ස්ථවිරයන් වහන්සේ යන තෙනම විසින් සිංහලයට අමුතුවෙන් පරිවර්තනය කොට පෙළ ද ලිපිදෙසාපගත කොට ලියා සූත්‍රසඞ්ඛ්‍යා ද දක්වමින් සකස් කරණ ලදි.

මුද්‍රණාවස්ථායෙහි දක්නා ලද ස්ඛලිතස්ථාන හා ධර්මවිරෝධස්ථාන ධර්මාර්ථයානුකූල ව යථාවයට පත් කිරීම ද, සූත්‍රප්‍රදේශ හකුළුවාලීම් හඟවන අස්ථානපතිත පෙය්‍යාලමුඛ යුක්තස්ථානයෙහි යෙදීම හා වාක්‍ය සම්බන්ධය අර්ථාවබෝධයට නිසිවන සේ දත හෙන පරිදි යෙදිය යුතු පෙය්‍යාලමුඛ අර්ධ චතුරස්‍ර [—] රේඛා අතර යෙදීම ද, ඇතැම් පාළි පදයනට යුක්තාර්ථ කථනය ද, දුර්ගම අර්ථයන් සුගම කොට අධෝලිපි යෙදීම ද, විෂයානුරූප වන සේ ඇතැම් සූත්‍රනාමයන් සකස් කිරීම ද මෙහි අප විසින් කරණ ලද සංස්කරණයෝ වෙති.

පරිවර්තක ස්ථවිරවරුන් විසින් සම්පාදිත විෂයසූචි, ගාථාදිපාද-සඤ්ඤානාම-පදානුක්කමණිකා සහිත මේ පර්ය්‍යාප්තිධර්මග්‍රන්ථය මුද්‍රණාධාරයෙන් ප්‍රසිද්ධියට පමුණුවාලීමෙන් ජනිතකුසලමහිමයෙන් පරිවර්තන-සංශෝධන-සංස්කරණ කාර්ය්‍යයන්හි නියුක්ත සහකාරි තෙරවරු ද, **ලඞ්කා රජය** හා **සාංස්කෘතිකකාර්ය්‍යාංශයෙහි** අධිකාරීහු ද, මුද්‍රණශිල්පීහු ද ප්‍රත්‍යයානුරූප සේ ලෞකික-ලෝකෝත්තර සුඛලාභීහු වෙත්වා.

**පරවාහැර වජිරඤාණ ස්ථවිර.**

ත්‍රිපිටක පරිවර්තන කාරක සභායෙහි ද
සංස්කාරක මණ්ඩලයෙහි ද සම්පාදක.

ත්‍රිපිටක කාර්ය්‍යාලය, ධර්මදූතාශ්‍රම විද්‍යාලය.
දෙමටගොඩ, කොළඹ.

# සඞ්කෙතනිරූපණය

## ABBREVIATIONS

| | | |
|---|---|---|
| සී. 1 | — | 'පැල්මඩුල්ල' මහාවිහාර- සීහල තාලපණ්ණපොත්ථකං |
| සී. 2 | — | 'ගාල්ල' පරමානන්ද විහාර- සීහල තාලපණ්ණපොත්ථකං |
| සීමු. | — | බණ්ඩරමුල්ලේ අමරසීහත්ථෙර සංසොධිත සීහලක්ඛර-මුද්දිතපොත්ථකං |
| ස්‍යා. | — | ස්‍යාමක්ඛර-මුද්දිතපොත්ථකං |
| මඡසං. | — | මරම්මඡට්ඨසඞ්ගීති-පිටකපොත්ථකං |
| PTS. | — | Pali Text Society-edition. |

# PALI ALPHABET

## IN SINHALESE CHARACTERS.

## VOWELS

අa ආā ඉi ඊī උu ඌū එe ඔo

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| කka | ඛkha | ගga | ඝgha | ඞṅa |
| චca | ඡcha | ජja | ඣjha | ඤña |
| ටṭa | ඨṭha | ඩḍa | ඪḍha | ණṇa |
| තta | ථtha | දda | ධdha | නna |
| පpa | ඵpha | බba | භbha | මma |

යya රra ලla වva සsa හha ළḷa අංṃ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කka | කාkā | කිki | කීkī | කුku | කූkū | කෙke | කොkō |
| ඛkha | ඛාkhā | ඛිkhi | ඛීkhī | ඛුkhu | ඛූkhū | ඛෙkhe | ඛොkhō |
| ගga | = | = | = | = | = | = | = |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| කකkka | ඤචñca | ත්වtva | මඵmpha |
| කඛkkha | ඤඡ=ඤ්ඡñcha | ද්දdda | මබ=ම්බmba |
| ක්‍යkya | ඤජ=ඤ්ජñja | දධ=ද්ධddha | මභmbha |
| ක්‍රිkri | ඤඣñjha | ද්‍රdra | මමmma |
| ක්වkva | ඤඤñña | දව=ද්වdva | මහmha |
| ඛ්‍යkhya | ඤහñha | ධ්වdhva | යය=ය්‍යyya |
| ඛ්වkhva | ටටṭṭa | නතnta | යහyha |
| ගගgga | ටඨ=ට්ඨṭṭha | නථntha | ලලlla |
| ගඝggha | ඩඩḍḍa | න්දnda | ල්‍යlya |
| ග්‍රgra, | ඩඪḍḍha | න්ධndha | ලහlha |
| ඞකṅka | ණටṇṭa | නනnna, | වහvha |
| ඞඛṅkha | ණණṇṇa | නහnha | සමsma |
| ඞගṅga | ණඨṇṭha | පපppa | සවsva |
| ඞඝṅgha | ණඩ=ණ්ඩṇḍa | පඵppha | සසssa |
| චචcca | ණහṇha | බබbba | හමhma |
| චඡccha | තතtta | බභbbha | හවhva |
| ජජjja | තථttha | බ්‍රbra | ළහḷha |
| ජඣjjha | ත්‍රtra | මපmpa | |

ා ā ි i ී ī ු u ූ ū ෙ e ො o

# සංයුත්තනිකායො

## නිදානවග්ග – විසයසූචි

**විසයා** **පිට්ඨඞ්කා**


### 1. අභිසමයසංයුත්තං 2–220

**1. බුද්ධවග්ගො 2–18**

| | | | |
|---|---|---|---|
| 1. | පටිච්චසමුප්පාද | සුත්තං ... ... ... | 2 |
| 2. | විභඞ්ග | ,, ... ... ... | 4 |
| 3. | පටිපදා | ,, ... ... ... | 8 |
| 4. | විපස්සී | ,, ... ... ... | 14 |
| 5. | සිඛී | ,, ... ... ... | 14 |
| 6. | වෙස්සභූ | ,, ... ... ... | 14 |
| 7. | කකුසන්ධ | ,, ... ... ... | 16 |
| 8. | කොණාගමන | ,, ... ... ... | 16 |
| 9. | කස්සප | ,, ... ... ... | 16 |
| 10. | ගොතම | ,, ... ... ... | 16–18 |

බුද්ධවග්ගො පඨමො.

**2. ආහාරවග්ගො 20–42**

| | | | |
|---|---|---|---|
| 1 | ආහාර | සුත්තං ... ... ... | 20 |
| 2. | මොළියඵග්ගුන | ,, ... ... ... | 22 |
| 3. | සමණබ්‍රාහ්මණ | ,, ... ... ... | 24 |
| 4. | දුතිය සමණබ්‍රාහ්මණ | ,, ... | 26 |
| 5. | කච්චානගොත්ත | ,, ... ... ... | 28 |
| 6. | ධම්මකථික | ,, ... ... ... | 30 |
| 7. | අචෙලකස්සප | ,, ... ... ... | 30 |
| 8. | තිම්බරුක | ,, ... ... ... | 36 |
| 9. | බාලපණ්ඩිත | ,, ... ... ... | 38 |
| 10. | පච්චය (පච්චයුප්පන්න) | ... ... ... | 40–42 |

ආහාරවග්ගො දුතියො.

**3. දසබලවග්ගො 44–72**

| | | | |
|---|---|---|---|
| 1. | දසබල | සුත්තං ... ... ... | 44 |
| 2. | දුතියදසබල | ,, ... ... ... | 44 |
| 3. | උපනිස | ,, ... ... ... | 46 |
| 4. | අඤ්ඤතිත්ථිය | ,, ... ... ... | 52 |
| 5. | භූමිජ | ,, ... ... ... | 58 |
| 6. | උපවාණ | ,, ... ... ... | 64 |
| 7. | පච්චය | ,, ... ... ... | 66 |
| 8. | භික්ඛු | ,, ... ... ... | 68 |
| 9. | සමණබ්‍රාහ්මණ | ,, ... ... ... | 70 |
| 10. | දුතිය සමණබ්‍රාහ්මණ | ,, ... ... ... | 72 |

දසබලවග්ගො තතියො

| විෂයය | | | පිටඅංකය |
|---|---|---|---|
| | **4. කළාරඛත්තියවග්ගො** | | **74-104** |
| 1. | භූත | සුත්තං | 74 |
| 2. | කළාර | ,, | 78 |
| 3. | ඤාණවත්ථු | ,, | 88 |
| 4. | දුතියඤාණවත්ථු | ,, | 92 |
| 5. | අවිජ්ජාපච්චය | ,, | 94 |
| 6. | දුතිය අවිජ්ජාපච්චය | ,, | 98 |
| 7. | නතුම්හ | ,, | 100 |
| 8. | චේතනා | ,, | 102 |
| 9. | දුතිය චේතනා | ,, | 102 |
| 10. | තතිය චේතනා | ,, | 104 |

කළාරඛත්තියවග්ගො චතුත්ථො.

| | | | |
|---|---|---|---|
| | **5. ගහපතිවග්ගො** | | **106-124** |
| 1. | පඤ්චභයවෙර | සුත්තං | 106 |
| 2. | දුතිය පඤ්චභයවෙර | ,, | 110 |
| 3 | දුක්ඛ | ,, | 112 |
| 4. | ලොක | ,, | 114 |
| 5. | ඤාතික | ,, | 114 |
| 6. | අඤ්ඤතරබ්‍රාහ්මණ | ,, | 116 |
| 7. | ජාණුස්සොණි | ,, | 118 |
| 8 | ලොකායතික | ,, | 118 |
| 9. | පඨම අරියසාවක | ,, | 120 |
| 10. | දුතිය අරියසාවක | ,, | 122-124 |

ගහපතිවග්ගො පඤ්චමො.

| | | | |
|---|---|---|---|
| | **6. දුක්ඛවග්ගො** | | **126-146** |
| 1. | පරිවීමංසන | සුත්තං | 126 |
| 2. | උපාදාන | ,, | 134 |
| 3. | සඤ්ඤොජන | ,, | 134 |
| 4. | දුතිය සඤ්ඤොජන | ,, | 136 |
| 5. | මහාරුක්ඛ | ,, | 138 |
| 6. | දුතිය මහාරුක්ඛ | ,, | 138 |
| 7. | තරුණරුක්ඛ | ,, | 140 |
| 8. | නාමරූප | ,, | 142 |
| 9. | විඤ්ඤාණ | ,, | 142 |
| 10. | නිදාන [පටිච්චසමුප්පාද] | | 144-146 |

දුක්ඛවග්ගො ඡට්ඨො.

| විසයා | | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|---|
| | **7. මහාවග්ගො** | | | | | **148-198** |
| 1. | අස්සුතවන්තු | සුත්තං | ... | ... | ... | 548 |
| 2. | දුතියඅස්සුතවන්තු | ,, | ... | ... | ... | 150 |
| 3. | පුත්තමංස | ,, | ... | ... | ... | 152 |
| 4. | අත්ථිරාග | ,, | ... | ... | ... | 158 |
| 5. | නගර | ,, | ... | ... | ... | 162 |
| 6. | සම්මසන | ,, | ... | ... | ... | 166 |
| 7. | නළකලාප | ,, | ... | ... | ... | 176 |
| 8. | කෝසම්බි | ,, | ... | ... | ... | 180 |
| 9. | උපයන්ති | ,, | ... | ... | ... | 186 |
| 10. | සුසිම | ,, | ... | ... | ... | 188-198 |

**මහාවග්ගො සත්තමො.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **සමණබ්‍රාහ්මණවග්ගො** | | | | | **200-202** |
| 1. | ජරාමරණ | සුත්තං | ... | ... | ... | 200 |
| 2. | ජාති | ,, | ... | ... | ... | 200 |
| 3. | භව | ,, | ... | ... | ... | 200 |
| 4. | උපාදාන | ,, | ... | ... | ... | 200 |
| 5. | තණ්හා | ,, | ... | ... | ... | 200 |
| 5. | වෙදනා | ,, | ... | ... | ... | 202 |
| 7. | ඵස්ස | ,, | ... | ... | ... | 202 |
| 8. | සළායතන | ,, | ... | ... | ... | 202 |
| 9. | නාමරූප | ,, | ... | ... | ... | 202 |
| 10. | විඤ්ඤාණ | ,, | ... | ... | ... | 202 |
| 11. | සඞ්ඛාර | ,, | ... | ... | ... | 202 |

**සමණබ්‍රාහ්මණවග්ගො අට්ඨමො.**

## 9. අන්තරපෙය්‍යාලො 204-210

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **1. සත්ථුවග්ගො** | | | | | **204-210** |
| 1 | ජරාමරණ | සුත්තං | ... | ... | ... | 204 |
| 2. | ජාති | ,, | ... | ... | ... | 204 |
| 3. | භව | ,, | ... | ... | ... | 204 |
| 4. | උපාදාන | ,, | ... | ... | ... | 204 |
| 5. | තණ්හා | ,, | ... | ... | ... | 204 |
| 6. | වෙදනා | ,, | ... | ... | ... | 206 |
| 7. | ඵස්ස | ,, | ... | ... | ... | 206 |
| 8. | සළායතන | ,, | ... | ... | ... | 206 |
| 9. | නාමරූප | ,, | ... | ... | ... | 206 |
| 10. | විඤ්ඤාණ | ,, | ... | | ... | 206 |
| 11. | සඞ්ඛාර | ,, | ... | ... | ... | 206 |

| විසයා | | පිට්ඨඞ්කා |
|---|---|---|
| | **2. සික්ඛාවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... ... | 208 |
| | **3. යොගවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... ... | 208 |
| | **4. ඡන්දවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... | 208 |
| | **5. උස්සොළ්හිවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... ... | 208 |
| | **6. අප්පටිවානිවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... ... | 208 |
| | **7. ආතප්පවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... ... | 208 |
| | **8. විරියවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... ... | 210 |
| | **9. සාතච්චවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... ... | 210 |
| | **10. සතිවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... ... | 210 |
| | **11. සම්පජඤ්ඤවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... ... | 210 |
| | **12. අප්පමාදවග්ගො** | |
| 1-11. | ජරාමරණාදි සුත්තානි ... ... | 210 |

අන්තරපෙය්‍යාලො නවමො.

සුත්තන්තා අන්තරපෙය්‍යාලා නිට්ඨිතා.

| | | | |
|---|---|---|---|
| | **10. අභිසමයවග්ගො** | | **212-220** |
| 1. | නඛසිඛා | සුත්තං ... ... ... | 212 |
| 2. | පොක්ඛරණී | ,, ... ... ... | 212 |
| 3. | සම්භෙජ්ජඋදක | ,, ... ... ... | 214 |
| 4. | දුතිය සම්භෙජ්ජඋදක | ,, ... ... ... | 214 |
| 5. | පඨවී | ,, ... ... ... | 216 |
| 6. | දුතියපඨවී | ,, ... ... ... | 216 |
| 7. | සමුද්ද | ,, ... ... ... | 216 |
| 8. | දුතියසමුද්ද | ,, ... ... ... | 216 |
| 9. | පබ්බතූපම | ,, ... ... ... | 218 |
| 10. | දුතියපබ්බතූපම | ,, ... ... ... | 218 |
| 11. | තතියපබ්බතූපම | ,, ... ... ... | 220 |


අභිසමයවග්ගො දසමො.

අභිසමයසංයුත්තං සමත්තං.

විසයා පිට්ඨඞ්කා

## 2. ධාතුසංයුත්තං 222–274

### 1. නානත්තවග්ගො 222–232

1. ධාතුනානත්ත සුත්තං ... ... ... 222
2. ඵස්සනානත්ත ,, ... ... ... 222
3. නො ඵස්සනානත්ත ,, ... ... ... 222
4. වෙදනානානත්ත ,, ... ... ... 224
5. නො වෙදනානානත්ත ,, ... ... ... 224
6. බාහිරධාතුනානත්ත ,, ... ... ... 226
7. පරියෙසනා නානත්ත ,, .. ... .. 226
8 නො පරියෙසනා නානත්ත ... ... ... 228
9. ලාභනානත්ත ,, ... ... ... 230
10. නො ලාභනානත්ත ,, ... ... ... 230–232

නානත්තවග්ගො පඨමො.

### 2. සත්තධාතුවග්ගො 234–256

1. සත්තධාතු සුත්තං ... ... ... 234
2. සනිදාන ,, .... ... ... 236
3. ගිඤ්ජකාවසථ ,, ... ... ... 238
4. හීනාධිමුත්තික ,, ... ... ... 240
5. චඞ්කම ,, ... ... ... 242
6. සගාථ ,, ... ... ... 244
7. අස්සද්ධ ,, ... ... ... 246
8. අස්සද්ධමූලකතිකපඤ්චක සුත්තං ... ... 248
9. අහිරිකමූලකතිකචතුක්ක ,, ... ... 252
10. අනොත්තප්පමූලකතිකත්තය ,, ... ... 254
11. අප්පස්සුතමූලකතිකද්වය ,, ... ... 256
12. කුසීතමූලකතිකෙක්ක ,, ... ... 256

සත්තධාතුවග්ගො දුතියො.

### 3. කම්මපථවග්ගො 258–262

1. අසමාහිත සුත්තං ... ... ... 258
2. දුස්සීල ,, ... ... ... 258
3. පඤ්චසික්ඛාපද ,, ... ... ... 258
4. සත්තකම්මපථ ,, ... ... ... 260
5. දසකම්මපථ ,, ... ... ... 260
6. අට්ඨඞ්ගික ,, ... ... ... 262
7. දසඞ්ගික ,, ... ... ... 262

කම්මපථවග්ගො තතියො.

| විසයා | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| | **4. චතුධාතුවග්ගො** | | **264-274** |
| 1. | චතුධාතු | සුත්තං | 264 |
| 2. | පුබ්බ | ,, | 264 |
| 3. | අස්සාදපරියෙසන | ,, | 266 |
| 4. | නොචෙදං | ,, | 268 |
| 5. | දුක්ඛ | ,, | 270 |
| 6. | අභිනන්දන | ,, | 272 |
| 7. | උප්පාද | ,, | 272 |
| 8. | සමණබ්‍රාහ්මණ | ,, | 272 |
| 9. | දුතිය සමණබ්‍රාහ්මණ | ,, | 274 |
| 10. | තතිය සමණබ්‍රාහ්මණ | ,, | 274 |

චතුධාතුවග්ගො චතුත්ථො.

ධාතුසංයුත්තං සමත්තං.

## 3. අනමතග්ගසංයුත්තං 276-296

| | | | |
|---|---|---|---|
| | **1. තිණකට්ඨවග්ගො** | | **276-286** |
| 1. | තිණකට්ඨ | සුත්තං | 276 |
| 2. | පඨවී | ,, | 276 |
| 3. | අස්සු | ,, | 278 |
| 4. | මාතුථඤ්ඤ | ,, | 280 |
| 5. | පබ්බත | ,, | 280 |
| 6. | සාසප | ,, | 282 |
| 7. | සාවක | ,, | 282 |
| 8. | ගඞ්ගා | ,, | 284 |
| 9. | දණ්ඩ | ,, | 284 |
| 10. | පුග්ගල | ,, | 286 |

තිණකට්ඨවග්ගො පඨමො.

| | | | |
|---|---|---|---|
| | **2. දුග්ගතවග්ගො** | | **288-296** |
| 1. | දුග්ගත | සුත්තං | 288 |
| 2. | සුඛිත | ,, | 288 |
| 3. | තිංසමත්ත | ,, | 288 |
| 4. | මාතු | ,, | 290 |
| 5. | පිතු | ,, | 290 |
| 6. | භාතු | ,, | 292 |
| 7 | භගිනී | ,, | 292 |
| 8 | පුත්ත | ,, | 292 |
| 9. | ධීතු | ,, | 292 |
| 10. | වෙපුල්ලපබ්බත | ,, | 292-296 |

දුග්ගතවග්ගො දුතියො.

අනමතග්ග සංයුත්තං සමත්තං.

විසයො පිට්ඨඞ්කො

## 4. කස්සපසංයුත්තං 298–342


### 1. කස්සපවග්ගො 298–342

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | සන්තුට්ඨ | සුත්තං | ... | ... | ... | 298 |
| 2. | අනොත්තාපි | ,, | ... | ... | ... | 300 |
| 3. | චන්දූපම | ,, | ... | ... | ... | 302 |
| 4. | කුලූපග | ,, | ... | ... | ... | 306 |
| 5. | ජිණ්ණ | ,, | ... | ... | ... | 308 |
| 6. | ඔවාද | ,, | ... | ... | ... | 310 |
| 7. | දුතිය ඔවාද | ,, | ... | ... | ... | 314 |
| 8. | තතිය ඔවාද | ,, | ... | | ... | 318 |
| 9. | ඣානාභිඤ්ඤා | ,, | ... | ... | ... | 320 |
| 10. | භික්ඛුනුපස්සය | ,, | ... | ... | ... | 326 |
| 11. | චීවර | ,, | ... | ... | ... | 330 |
| 12. | පරම්මරණා | ,, | .. | ... | ... | 336 |
| 13. | සද්ධම්මපතිරූපක | ,, | ... | ... | ... | 338–342 |


කස්සපවග්ගො පඨමො.

කස්සපසංයුත්තං සමත්තං.

## 5. ලාභසක්කාරසංයුත්තං 344–372


### 1. දාරුණවග්ගො. 344–352

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | දාරුණ | සුත්තං | | ... | ... | 344 |
| 2. | බළිස | ,, | ... | ... | ... | 344 |
| 3. | කුම්ම | ,, | ... | ... | ... | 346 |
| 4. | දීඝලොමි එළක | ,, | ... | ... | ... | 346 |
| 5. | මීළ්හක | ,, | ... | ... | ... | 348 |
| 6. | අසනිවිචක්ක | ,, | ... | ... | ... | 348 |
| 7. | දිද්ධවිසල්ල | ,, | ... | ... | .. | 348 |
| 8. | සිඟාල | ,, | ... | ... | ... | 350 |
| 9. | වෙරම්බ | ,, | ... | ... | ... | 348 |
| 10. | සගාථ | ,, | ... | ... | ... | 352 |


දාරුණවග්ගො පඨමො.


### 2. පාතිවග්ගො 354–356

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | සුවණ්ණපාති | සුත්තං | | ... | ... | 354 |
| 2. | රූපියපාති | ,, | ... | ... | ... | 354 |
| 3–10 | සුවණ්ණනික්ඛසුත්තාදි අට්ඨකං | | | ... | ... | 356 |


පාතිවග්ගො දුතියො.

| විසයා | | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|---|
| | **3. මාතුගාමවග්ගො.** | | | | | **358–364** |
| 1. | මාතුගාම | සුත්තං | ... | ... | ... | 358 |
| 2. | ජනපදකල්‍යාණී | ,, | ... | ... | ... | 354 |
| 3. | ඒකපුත්තක | ,, | ... | ... | ... | 354 |
| 4. | ඒකධීතු | ,, | ... | ... | ... | 360 |
| 5. | සමණබ්‍රාහ්මණ | ,, | ... | | ... | 360 |
| 6 | දුතියසමණබ්‍රාහ්මණ | ,, | ... | ... | ... | 362 |
| 7. | තතියසමණබ්‍රාහ්මණ | ,, | ... | ... | ... | 362 |
| 8. | ඡවිං ඡින්දති | ,, | ... | ... | ... | 362 |
| 9. | වාලරජ්ජු | ,, | ... | ... | ... | 364 |
| 10. | ඛීණාසව භික්ඛු | ,, | ... | ... | ... | 364 |

**මාතුගාමවග්ගො තතියො.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **4. සඞ්ඝභෙදවග්ගො.** | | | | | **366–372** |
| 1. | සඞ්ඝභෙද | සුත්තං | ... | ... | ... | 366 |
| 2. | කුසලමූලසමුච්ඡෙද | ,, | ... | ... | ... | 366 |
| 3. | කුසලධම්මසමුච්ඡෙද | ,, | ... | ... | ... | 366 |
| 4. | සුක්කධම්මසමුච්ඡෙද | ,, | ... | ... | ... | 366 |
| 5. | අත්තවධ | ,, | ... | ... | ... | 366 |
| 6. | දෙවදත්ත | ,, | ... | ... | ... | 368 |
| 7. | මාතු | ,, | ... | ... | ... | 370 |
| 8–13 | පිතුසුත්තාදි ඡක්කං | ,, | ... | ... | ... | 370–372 |

**සඞ්ඝභෙදවග්ගො චතුත්ථො.**

**ලාභසක්කාරසංයුත්තං සමත්තං.**

## 6. රාහුලසංයුත්තං 374–388

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **1 පඨමො වග්ගො.** | | | | | **374–380** |
| 1. | චක්ඛුද්වාරාදි | සුත්තං | ... | ... | ... | 374 |
| 2. | රූපාදි ආරම්මණ | ,, | ... | ... | ... | 376 |
| 3. | විඤ්ඤාණ | ,, | ... | ... | ... | 176 |
| 4. | සම්ඵස්ස | ,, | ... | ... | ... | 376 |
| 5. | වෙදනා | ,, | ... | ... | ... | 378 |
| 6. | සඤ්ඤා | ,, | ... | ... | ... | 678 |
| 7. | සඤ්චෙතනා | ,, | ... | ... | ... | 378 |
| 8. | තණ්හා | ,, | ... | ... | ... | 380 |
| 9. | ධාතු | ,, | ... | ... | ... | 380 |
| 10. | ඛන්ධ | ,, | ... | ... | ... | 380 |

**වග්ගො පඨමො.**

| විසයො | | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|---|
| | දුතියො වග්ගො. | | | | | 382–388 |
| 1. | චක්ඛුද්වාරාදි | සුත්තං | ... | ... | .. | 382 |
| 2. | රූපාදි ආරම්මණ | ,, | ... | ... | ... | 382 |
| 3. | විඤ්ඤාණ | ,, | ... | | ... | 382 |
| 4. | සම්ඵස්ස | ,, | ... | ... | ... | 384 |
| 5. | වේදනා | ,, | ... | ... | ... | 384 |
| 6. | සඤ්ඤා | ,, | ... | ... | ... | 384 |
| 7. | සඤ්චෙතනා | ,, | ... | ... | ... | 384 |
| 8. | තණ්හා | ,, | ... | ... | ... | 384 |
| 9. | ධාතු | ,, | ... | ... | ... | 384 |
| 10. | ඛන්ධ | ,, | ... | ... | ... | 384 |
| 11. | මානානුසය | ,, | ... | ... | ... | 366 |
| 12. | මානාපගත | ,, | ... | ... | ... | 386–388 |
| | වග්ගො දුතියො. | | | | | |

## 7. ලක්ඛණසංයුත්තං 390–404

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 1. පඨමො වග්ගො. | | | | | 390–396 |
| 1. | අට්ඨිසඞ්ඛලික | සුත්තං | ... | ... | ... | 390 |
| 2. | මංසපෙසි | ,, | ... | ... | ... | 392 |
| 3. | මංසපිණ්ඩ | ,, | ... | ... | ... | 392 |
| 4. | නිච්ඡවි | ,, | ... | ... | ... | 392 |
| 5. | අසිලොම | ,, | ... | ... | ... | 394 |
| 6. | සත්තිලොම | ,, | ... | ... | ... | 394 |
| 7. | උසුලොම | ,, | ... | ... | ... | 394 |
| 8. | සූචිලොම | ,, | ... | ... | ... | 394 |
| 9. | දුතියසූචිලොම | ,, | ... | ... | ... | 396 |
| 10. | කුම්භණ්ඩ | ,, | ... | ... | ... | 396 |
| | පඨමො වග්ගො. | | | | | |
| | දුතියො වග්ගො. | | | | | 398–404 |
| 1. | ගූථකූප | සුත්තං | ... | ... | ... | 398 |
| 2. | ගූථඛාදී | ,, | ... | ... | ... | 398 |
| 3. | නිච්ඡවිත්ථි | ,, | ... | ... | ... | 398 |
| 4. | මඞ්ගුලිත්ථි | ,, | ... | ... | ... | 398 |
| 5. | ඔකිලිනී | ,, | ... | ... | ... | 398 |
| 6. | අසීසක | ,, | ... | ... | ... | 398 |
| 7. | භික්ඛු | ,, | ... | ... | ... | 398 |
| 8. | භික්ඛුණී | ,, | ... | ... | ... | 398 |
| 9. | සික්ඛමානා | ,, | ... | ... | ... | 402 |
| 10. | සාමණෙර | ,, | ... | ... | ... | 402 |
| 11. | සාමණෙරී | ,, | ... | ... | ... | 402–404 |
| | වග්ගො දුතියො | | | | | |


ලක්ඛණසංයුත්තං සමත්තං.

| විසයො | | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|---|

## 8. ඔපම්මසංයුත්තං 406-420

### 1. පඨමො වග්ගො 406-420

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | කූට | සුත්තං | ... | ... | ... | 406 |
| 2. | නඛසිඛා | ,, | ... | ... | ... | 406 |
| 3. | කුල | ,, | ... | ... | ... | 408 |
| 4. | ඔක්ඛාසත | ,, | ... | ... | ... | 408 |
| 5. | සත්ති | ,, | ... | ... | ... | 410 |
| 6. | ධනුග්ගහ | ,, | ... | ... | ... | 410 |
| 7. | ආණි | ,, | ... | ... | ... | 412 |
| 8. | කලිඞ්ගරූපධාන | ,, | ... | ... | ... | 414 |
| 9. | නාග | ,, | ... | ... | ... | 414 |
| 10. | බිළාල | ,, | ... | ... | ... | 416 |
| 11. | සිගාල | ,, | ... | ... | ... | 418 |
| 12. | දුතියසිගාල | ,, | ... | ... | ... | 420 |

වග්ගො පඨමො.

ඔපම්මසංයුත්තං සමත්තං.

## 9. භික්ඛුසංයුත්තං 422-440

### 1. පඨමො වග්ගො. 422-440

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | මොග්ගල්ලාන | සුත්තං | ... | ... | ... | 422 |
| 2. | සාරිපුත්ත | ,, | ... | ... | ... | 424 |
| 3. | මහානාග සුත්තං | ,, | ... | ... | ... | 424 |
| 4. | නවභික්ඛු | ,, | ... | ... | ... | 428 |
| 5. | සුජාත | ,, | ... | ... | ... | 430 |
| 6. | ලකුණ්ටකභද්දිය | ,, | ... | ... | ... | 430 |
| 7. | විසාඛපඤ්චාලිපුත්ත | ,, | ... | ... | ... | 432 |
| 8. | නන්ද | ,, | ... | ... | ... | 432 |
| 9. | තිස්ස | ,, | ... | ... | ... | 434 |
| 10. | ථෙරනාමක | ,, | ... | ... | ... | 434 |
| 11. | මහාකප්පින | ,, | ... | ... | ... | 438 |
| 12. | සහායක | ,, | ... | ... | ... | 438-440 |

වග්ගො පඨමො.

භික්ඛුසංයුත්තං සමත්තං.

නිදානවග්ගො නිට්ඨිතො.

සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

දුතියො භාගො

# සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

## දුතියො භාගො

---

## නිදානවග්ගො

## 1. අභිසමයසංයුත්තං

### 1. බුද්ධවග්ගො

### නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

#### 1. 1. 1.

#### පටිච්චසමුප්පාදසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා[1] එතදවොච:

පටිච්චසමුප්පාදං වො භික්ඛවෙ, දෙසිස්සාමි. තං සුණාථ. සාධුකං මනසි කරොථ. භාසිස්සාමීති. 'එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා[1] එතදවොච:

කතමො ච භික්ඛවෙ, පටිච්චසමුප්පාදො? අවිජ්ජාපච්චයා භික්ඛවෙ සඞ්ඛාරා. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං. විඤ්ඤාණපච්චයා නාමරූපං. නාමරූපපච්චයා සළායතනං. සළායතනපච්චයා ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තණ්හාපච්චයා උපාදානං. උපාදානපච්චයා භවො. භවපච්චයා ජාති. ජාතිපච්චයා ජරාමරණං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අයං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදො.

---

1. පච්චස්සොසුංභගවා - සී 1, 2.

# සූත්‍රාන්තපිටකයෙහි

# සංයුත්තනිකාය

## ද්විතීය භාගය

---

## නිදානවර්ගය

# 1. අභිසමයසංයුත්තය

## 1. බුද්ධවර්ගය

### ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

1. 1. 1.

**පටිච්චසමුප්පාද සූත්‍රය**

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬුසිටුහුගේ** අරමෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'පින්වතුන් වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, තොපට පටිච්චසමුප්පාදය දේශනා කරමි. එය අසවු. මනා කොට මෙනෙහි කරවු. දේශනා කරමි. 'එසේ ය, වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, පටිච්චසමුප්පාදය කවරේ ද? මහණෙනි, අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ. විඥානප්‍රත්‍යයයෙන් (නාමය ද, රූපය ද,) නාමරූපය ද වේ. නාමරූපප්‍රත්‍යයයෙන් (ෂඩායතනය ද) ෂඩායතනය ද වේ. ෂඩායතනප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ. ස්පර්ශ-ප්‍රත්‍යයයෙන් වේදනාව වේ. වේදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණා-ප්‍රත්‍යයයෙන් උපාදානය වේ. උපාදානප්‍රත්‍යයයෙන් භවය වේ. භවප්‍රත්‍යය-යෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ, සෝක පරිදේව දුක්ඛ දෞමනස්ස උපායාසයෝ හටගණිත්. මෙසේ මේ මුළු දුඃඛස්කන්ධයාගේ උත්පත්තිය වේ. මහණෙනි, මේ (ප්‍රත්‍යයාකාරය) පටිච්චසමුප්පාද ය යි කියනු ලැබේ.

අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො. විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො. නාමරූපනිරොධා සළායතනනිරොධො. සළායතනනිරොධා ඵස්සනිරොධො. ඵස්සනිරොධා වෙදනානිරොධො. වෙදනානිරොධා තණ්හානිරොධො. තණ්හානිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො. භවනිරොධා ජාතිනිරොධො. ජාතිනිරොධා ජරාමරණං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

*ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

## 1. 1. 2,

## විභඞ්ගසුත්තං

2. **සාවත්ථියං**-[1]

පටිච්චසමුප්පාදං වො භික්ඛවෙ, දෙසිස්සාමි. විභජිස්සාමි. තං සුණාථ. සාධුකං මනසි කරොථ. භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමො ච භික්ඛවෙ, පටිච්චසමුප්පාදො? අවිජ්ජාපච්චයා භික්ඛවෙ,සඞ්ඛාරා. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං. විඤ්ඤාණපච්චයා නාමරූපං. නාමරූපපච්චයා සළායතනං. සළායතනපච්චයා ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තණ්හාපච්චයා උපාදානං. උපාදානපච්චයා භවො. භවපච්චයා ජාති. ජාතිපච්චයා ජරාමරණං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

කතමඤ්ච භික්ඛවෙ, ජරාමරණං? යා[2] තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චති ජරා.

කතමඤ්ච භික්ඛවෙ, මරණං? යා[2] තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චුමරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස[3] නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො[4]. ඉදං වුච්චති මරණං. ඉති අයඤ්ච ජරා ඉදඤ්ච මරණං, ඉදං වුච්චති භික්ඛවෙ, ජරාමරණං.

කතමා ච භික්ඛවෙ, ජාති? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති නිබ්බත්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො, අයං වුච්චති භික්ඛවෙ, ජාති.

කතමො ච භික්ඛවෙ, භවො? තයොමෙ භික්ඛවෙ, භවා: කාමභවො රූපභවො අරූපභවො. අයං වුච්චති භික්ඛවෙ, භවො.

---

* කත්ථචි න දිස්සති.

1. සාවත්ථියං විහරති. - ස්‍යා. 2. යං - සීමු, සී, 1, 2. 3. කලෙවරස්ස - ස්‍යා, මජසං.
4 ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො, අයං පාඨො න දිස්සතෙ. - සීමු. මජසං. මජසං, සිමු. න දිස්සතෙ.

අවිද්‍යාවේ ම අශේෂවිරාග (අනුශය සමුද්ඝාත) නම් වූ නිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධය වේ. විඥාන-නිරෝධයෙන් නාමරූපනිරෝධය වේ. නාමරූපනිරෝධයෙන් ෂඩායතන-නිරෝධය වේ. ෂඩායතනනිරෝධයෙන් ස්පර්ශනිරෝධය වේ. ස්පර්ශනිරෝධයෙන් වේදනානිරෝධය වේ. වේදනානිරෝධයෙන් තෘෂ්ණානිරෝධය වේ. තෘෂ්ණා-නිරෝධයෙන් උපාදානනිරෝධය වේ. උපාදානනිරෝධයෙන් භවනිරෝධය වේ. භවනිරෝධයෙන් ජාතිනිරෝධය වේ. ජාතිනිරෝධයෙන් ජරාමරණ, ශෝක පරිදේව දුක්ඛ දෞර්මනස්‍ය උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වෙයි. මෙය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගත්හ.

## 1. 1. 2.

## විභඞ්ගසූත්‍රය

2. සැවැත්නුවර-

මහණෙනි, තොපට පටිච්චසමුප්පාදය දේශනා කරමි. බෙදා දක්වමි. එය අසවු. මනා කොට මෙනෙහි කරවු. කියමි. "එසේය වහන්සැ"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, පටිච්චසමුප්පාදය කවරේ ද? මහණෙනි, අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වේ. විඥානප්‍රත්‍යයෙන් නාමරූප වේ. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය වේ. ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ. වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානය වේ. උපාදානප්‍රත්‍යයෙන් භවය වේ. භව-ප්‍රත්‍යයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ, සෝක පරිදේව දුක්ඛ දෞර්මනස්‍ය උපායාසයෝ හටගණිත්. මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, ජරාමරණ කවරේ ද? ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකාය-යෙහි යම් දිරීමෙක් දිරණබවෙක් දත් වැටීමෙක් කෙහෙ පැසීමෙක් ඇඟ රැළි වැටීමෙක් ආයු පිරිහීමෙක් ඉඳුරන්ගේ පැසීමෙක් වේ ද, මේ ජරා ය යි කියනු ලැබේ.

මහණෙනි, මරණය කවරේ ද? ඒ ඒ සත්ත්වනිකායයෙන් ඒ ඒ සත්ත්ව-යන්ගේ යම් වෙන් වීමෙක් වෙන් වන බවෙක් බිඳීමෙක් අතුරුදන් වීමෙක් මච්චු නම් වූ මරණයෙක් කාලක්‍රියාවෙක් (සම්මුතිමරණයෙක්) ස්කන්ධයන්ගේ බිඳීමෙක් සිරුර හැර දැමීමෙක් ජීවිතෙන්ද්‍රියයාගේ සිඳී යෑමෙක් වේ ද, මේ මරණ ය යි කියනු ලැබේ. මෙසේ මේ ජරාව ද මේ මරණය ද යන මෙය, මහණෙනි, ජරාමරණ ය යි කියනු ලැබේ.

මහණෙනි, ජාතිය කවරේ ද? ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායයෙහි හටගැණීමෙක් පිරිපුන් හටගැණීමෙක් කුසට බැස ගැන්මෙක් ඉපැද්මෙක් වෙසෙස් ඉපැද්මෙක් ස්කන්ධයන්ගේ පහළ වීමෙක් ආයතනයන්ගේ පිළි-ලැබීමෙක් වේ ද, මහණෙනි, මේ ජාති ය යි කියනු ලැබේ.

මහණෙනි, භවය කවරේ ද? මහණෙනි, කාමභවය, රූපභවය, අරූප-භවය යි මේ භව තුණෙකි. මහණෙනි, මේ භව ය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ උපාදානං? චත්තාරිමානි භික්ඛවෙ, උපාදානානි: කාමූපාදානං දිට්ඨූපාදානං සීලබ්බතූපාදානං අත්තවාදූපාදානං. ඉදං වුච්චති භික්ඛවෙ උපාදානං.

කතමා ච භික්ඛවෙ තණ්හා? ඡයිමෙ භික්ඛවෙ, තණ්හාකායා: රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා. අයං වුච්චති භික්ඛවෙ තණ්හා.

කතමා ච භික්ඛවෙ වෙදනා? ඡයිමෙ භික්ඛවෙ, වෙදනාකායා: චක්ඛුසම්ඵස්සජා වෙදනා, සොතසම්ඵස්සජා වෙදනා, ඝාණසම්ඵස්සජා වෙදනා, ජිව්හාසම්ඵස්සජා වෙදනා, කායසම්ඵස්සජා වෙදනා, මනොසම්ඵස්සජා වෙදනා. අයං වුච්චති භික්ඛවෙ වෙදනා.

කතමො ච භික්ඛවෙ ඵස්සො? ඡයිමෙ භික්ඛවෙ, ඵස්සකායා: චක්ඛුසම්ඵස්සො, සොතසම්ඵස්සො, ඝාණසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො, කායසම්ඵස්සො, මනොසම්ඵස්සො. අයං වුච්චති භික්ඛවෙ, ඵස්සො.

කතමඤ්ච භික්ඛවෙ සළායතනං? චක්ඛායතනං සොතායතනං ඝාණායතනං ජිව්හායතනං කායායතනං මනායතනං. ඉදං වුච්චති භික්ඛවෙ, සළායතනං.

කතමඤ්ච භික්ඛවෙ නාමරූපං? වෙදනා සඤ්ඤා චෙතනා ඵස්සො මනසිකාරො, ඉදං වුච්චති නාමං. චත්තාරො ච මහාභූතා, චතුන්නං ච මහාභූතානං උපාදායරූපං, ඉදං වුච්චති රූපං. ඉති ඉදඤ්ච නාමං, ඉදඤ්ච රූපං, ඉදං වුච්චති භික්ඛවෙ, නාමරූපං.

කතමඤ්ච භික්ඛවෙ විඤ්ඤාණං? ඡයිමෙ භික්ඛවෙ, විඤ්ඤාණකායා: චක්ඛුවිඤ්ඤාණං සොතවිඤ්ඤාණං ඝාණවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං කායවිඤ්ඤාණං මනොවිඤ්ඤාණං. ඉදං වුච්චති භික්ඛවෙ, විඤ්ඤාණං.

කතමෙ ච භික්ඛවෙ සඞ්ඛාරා? තයොමෙ භික්ඛවෙ, සඞ්ඛාරා: කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරො. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, සඞ්ඛාරා.

කතමා ච භික්ඛවෙ අවිජ්ජා? යං ඛො භික්ඛවෙ දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛසමුදයෙ අඤ්ඤාණං, දුක්ඛනිරොධෙ අඤ්ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං, අයං වුච්චති භික්ඛවෙ, අවිජ්ජා.

ඉති ඛො භික්ඛවෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

මහණෙනි, උපාදාන කවරේ ද? මහණෙනි, කාමඋපාදානය දිට්ඨිඋපාදානය සීලබ්බතඋපාදානය අත්තවාදඋපාදාන ය යි මේ උපාදාන සතරෙකි. මහණෙනි, මේ උපාදාන ය යි කියනු ලැබේ

මහණෙනි, තෘෂ්ණාව කවරේ ද? මහණෙනි, රූපතෘෂ්ණාව ශබ්දතෘෂ්ණාව ගන්ධතෘෂ්ණාව රසතෘෂ්ණාව ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණාව ධර්මතෘෂ්ණාව යි මේ තෘෂ්ණාරාශි සයෙකි. මහණෙනි, මේ තෘෂ්ණා යයි කියනු ලැබේ.

මහණෙනි, වේදනාව කවරේ ද? ඇසෙහි (අරමුණ) ගැටීමෙන් වන වේදනා ය, කණෙහි ගැටීමෙන් වන වේදනා ය, නැහැයෙහි ගැටීමෙන් වන වේදනා ය, දිවෙහි ගැටීමෙන් වන වේදනා ය, සිතෙහි ගැටීමෙන් වන වේදනා ය යි මේ වේදනාරාශි සයෙකි. මහණෙනි, මේ වේදනා ය යි කියනු ලැබේ.

මහණෙනි, ස්පර්ශය කවරේ ද? මහණෙනි, ඇසෙහි (අරමුණ) ගැටීම ය, කණෙහි ගැටීම ය, නැහැයෙහි ගැටීම ය, දිවෙහි ගැටීම ය, කයෙහි ගැටීම ය, සිතෙහි ගැටීම ය යි මේ ස්පර්ශරාශි සයෙකි. මහණෙනි, මේ ස්පර්ශ ය යි කියනු ලැබේ

මහණෙනි, ෂඩායතන කවරේ ද? චක්ඛුආයතනය, සොතආයතනය, ඝාණආයතනය, ජිව්හාආයතනය, කායආයතනය, මනආයතනය, මහණෙනි, මේ ෂඩායතන ය යි කියනු ලැබේ.

මහණෙනි, නාමරූප කවරේ ද? වේදනා ය, සංඥා ය, චේතනා ය, ස්පර්ශ ය, මනසිකාර ය යන මෙය නාම ය යි කියනු ලැබේ. සතර මහාභූතයෝ ද සතර මහාභූතයන්ගේ උපාදායරූප ද යන මෙය රූප ය යි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මේ නාමය ද මේ රූපය ද යන මේ නාමරූප ය යි කියනු ලැබේ.

මහණෙනි, විඤ්ඤාණය කවරේ ද? මහණෙනි, චක්ඛුවිඤ්ඤාණය, සොතවිඤ්ඤාණය, ඝාණවිඤ්ඤාණය, ජිව්හාවිඤ්ඤාණය, කායවිඤ්ඤාණය, මනොවිඤ්ඤාණ ය, යි මේ විඤ්ඤාණ රාශි සයෙකි. මහණෙනි, මෙය විඤ්ඤාණය යි කියනු ලැබේ.

මහණෙනි, සංස්කාරයෝ කවරහු ද? මහණෙනි, කායසංස්කාර ය, වාක්සංස්කාර ය, චිත්තසංස්කාර ය යි මේ සංස්කාර තුනෙකි. මහණෙනි, මොහු සංස්කාරයෝ ය යි කියනු ලැබෙත්.

මහණෙනි, අවිද්‍යාව කවරේ ද? මහණෙනි, දුඃඛසත්‍යයෙහි යම් නො දැනීමෙක්, දුඃඛසමුදයසත්‍යයෙහි යම් නො දැනීමෙක්, දුඃඛනිරොධසත්‍යයෙහි යම් නො දැනීමෙක්, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාසත්‍යයෙහි යම් නො දැනීමෙක් වේ ද, මහණෙනි, මේ අවිද්‍යා ය යි කියනු ලැබේ.

මහණෙනි, මෙසේ අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ හටගණිත්. සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි. ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

අවිද්‍යාවගේ ම අශේෂවිරාග නම් වූ නිරොධයෙන් සංස්කාරනිරොධය වේ. සංස්කාරනිරොධයෙන් විඥානනිරොධය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරොධය වේ.

## 1. 1. 3.

## පටිපදාසුත්තං

3. සාවත්ථියං-

මිච්ඡාපටිපදඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි සම්මාපටිපදඤ්ච. තං සුණාථ. සාධුකං මනසි කරොථ. භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමා ච භික්ඛවෙ, මිච්ඡාපටිපදා? අවිජ්ජාපච්චයා භික්ඛවෙ, සඞ්ඛාරා. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අයං වුච්චති භික්ඛවෙ, මිච්ඡාපටිපදා.

කතමා ච භික්ඛවෙ, සම්මාපටිපදා? අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයං වුච්චති භික්ඛවෙ, සම්මාපටිපදාති.

## 1. 1. 4.

## විපස්සිසුත්තං

4. සාවත්ථියං-

විපස්සිස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: "කිච්ඡං[1] වතායං ලොකො ආපන්නො ජායති ච ජීයති ච මීයති ච චවති ච උපපජ්ජති ච. අථ ච පනිමස්ස දුක්ඛස්ස නිස්සරණං නප්පජානාති ජරාමරණස්ස. කුදාස්සු[2] නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සා"ති.

අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති ජරාමරණං හොති? කිම්පච්චයා ජරාමරණ"න්ති? අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "ජාතියා ඛො සති ජරාමරණං හොති, ජාතිපච්චයා ජරාමරණ"න්ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති ජාති හොති? කිම්පච්චයා ජාතී"ති? අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "භවෙ ඛො සති ජාති හොති, භවපච්චයා ජාතී"ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති භවො හොති? කිම්පච්චයා භවො"ති? අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "උපාදානෙ ඛො සති භවො හොති, උපාදානපච්චයා[3] භවො"ති.

---

1. කිච්ඡා - සී. 1, 2.  2. කුදස්සු - සීමු, මජසං.  3. උපාදානප්පච්චයා - සී 2.

## 1. 1. 3.

### පටිපදා සූත්‍රය

3. සැවැත්නුවර—

මහණෙනි, තොපට මිථ්‍යාප්‍රතිපදාව ද, සම්‍යක්ප්‍රතිපදාව ද දේශනා කිරීම. එය අසවු. මැනවින් මෙනෙහි කරවු. කියන්නෙමි යි. වහන්ස, එසේ ය යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, මිථ්‍යාප්‍රතිපදාව කවරේ ද? මහණෙනි, අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ හටගණිත්. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ. මහණෙනි, මේ මිථ්‍යා-ප්‍රතිපදා යි කියනු ලැබේ.

මහණෙනි, සම්‍යක්ප්‍රතිපදාව කවරේ ද? අවිද්‍යාවගේ ම අනවශේෂ-විරාග නම් වූ නිරොධයෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාරනිරොධයෙන් විඥානනිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරොධය වේ. මහණෙනි, මේ සම්‍යක්ප්‍රතිපදා යි කියනු ලැබේ.

## 1. 1. 4.

### විපස්සී සූත්‍රය

4. සැවැත්නුවර—

මහණෙනි, සම්බොධියට පෙර බුදුබවට නො පැමිණි බෝසත් වූ ම භාග්‍යවත් අර්හත් විපස්සී සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට මෙබඳු අදහසෙක් වී ය: "මේ ලෝවැසි තෙමේ දුක්පත් ම ය. උපදියි. දිරයි. මියෙයි. චුත වෙයි. (නැවතත්) උපදියි. එහෙත් මේ ජරාමරණ දුකෙහි නික්ම යැම නො දනී. කවදා නම් මේ ජරාමරණ දුකෙහි නික්ම යාමෙක් පෙණෙන්නේ දැ"යි.

ඉක්බිති විපස්සී බෝධිසත්ත්වයන් වහන්සේට "කුමක් ඇති කල්හි ජරා-මරණ වේ ද? කිනම් ප්‍රත්‍යයයකින් ජරාමරණ වේ දැ"යි මේ අදහස පහළ විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝධිසත්ත්වයන් වහන්සේට නුවණින් මෙනෙහි කිරීමෙන් ද ප්‍රඥයෙන් ද "ඉපදීම ඇති කල්හි ජරාමරණ වෙයි. ඉපදීම ප්‍රත්‍යය-යෙන් ජරාමරණ වේ"යි අවබෝධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සී බොධිසත්ත්වයන් වහන්සේට "කුමක් ඇති කල්හි ඉපැද්ම වේ ද? කිනම් ප්‍රත්‍යයයකින් ඉපැද්ම වේ දැ"යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝධිසත්ත්වයන් වහන්සේට උපායමනසකාර-යෙන් ද ප්‍රඥයෙන් ද "භවය ඇති කල්හි ඉපැද්ම වෙයි. භවය ප්‍රත්‍යය කොට ඉපැද්ම වේ"යි අවබොධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සී බොධිසත්ත්වයන් වහන්සේට "කුමක් ඇති කල්හි භවය වේ ද? කිනම් ප්‍රත්‍යයයකින් භවය වේ දැ"යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝධිසත්ත්වයන් වහන්සේට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "උපාදාන ඇති කල්හි භවය වෙයි. උපාදානප්‍රත්‍යයයෙන් භවය වේ"යි අවබෝධ වී ය.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති උපාදානං හොති? කිම්පච්චයා උපාදාන"න්ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "තණ්හාය ඛො සති උපාදානං හොති. තණ්හාපච්චයා[1] උපාදාන"න්ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති තණ්හා හොති? කිම්පච්චයා තණ්හා"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "වෙදනාය ඛො සති තණ්හා හොති. වෙදනාපච්චයා[2] තණ්හා"ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති වෙදනා හොති? කිම්පච්චයා වෙදනා"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "ඵස්සෙ ඛො සති වෙදනා හොති. ඵස්සපච්චයා[3] වෙදනා"ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති ඵස්සො හොති? කිම්පච්චයා ඵස්සො"ති: අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "සළායතනෙ ඛො සති ඵස්සො හොති. සළායතනපච්චයා[4] ඵස්සො"ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති සළායතනං හොති? කිම්පච්චයා සළායතන"න්ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "නාමරූපෙ ඛො සති සළායතනං හොති. නාමරූපපච්චයා[5] සළායතන"න්ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති නාමරූපං හොති? කිම්පච්චයා නාමරූප"න්ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "විඤ්ඤාණෙ ඛො සති නාමරූපං හොති. විඤ්ඤාණපච්චයා නාමරූප"න්ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති විඤ්ඤාණං හොති? කිම්පච්චයා විඤ්ඤාණ"න්ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "සඞ්ඛාරෙසු[6] ඛො සති විඤ්ඤාණං හොති. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණ"න්ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති සඞ්ඛාරා හොන්ති. කිම්පච්චයා සඞ්ඛාරාති? අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "අවිජ්ජාය ඛො සති සඞ්ඛාරා හොන්ති. අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"ති.

---

1. තණ්හාපපච්චයා, - සී 1, 2. 2. වෙදනාපපච්චයා - සී 1, 2 3. ඵස්සපපච්චයා - සී 1, 2.
4. සළායතනපපච්චයා - සී 1, 2. 5. නාමරූපපච්චයා - සී 1, 2. 6. සඞ්ඛාරෙ - සභා.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝධිසත්ත්වයන්ට "කුමක් ඇති කල්හි උපාදාන වේ ද? කිනම් ප්‍රත්‍යයෙකින් උපාදාන වේ ද?"යි මේ අදහස විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "තෘෂ්ණාව ඇති කල්හි උපාදාන වෙයි. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදාන වේ"යි අවබොධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් ඇති කල්හි තෘෂ්ණාව වේ ද? කිනම් ප්‍රත්‍යයෙකින් තෘෂ්ණාව වේ ද?"යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "වේදනාව ඇති කල්හි තෘෂ්ණාව වෙයි. වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ"යි අවබොධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් ඇති කල්හි වේදනාව වේ ද? කිනම් ප්‍රත්‍යයෙකින් වේදනාව වේ ද?"යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "ස්පර්ශය ඇති කල්හි වේදනාව වෙයි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ"යි අවබොධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් ඇති කල්හි ස්පර්ශය වේ ද? කිනම් ප්‍රත්‍යයෙකින් ස්පර්ශය වේ ද?"යි මේ අදහස විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන්ද "ෂඩායතනය ඇති කල්හි ස්පර්ශය වෙයි. ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ"යි අවබොධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් ඇති කල්හි ෂඩායතනය වේ ද? කිනම් ප්‍රත්‍යයෙකින් ෂඩායතනය වේ ද?"යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "නාමරූප ඇති කල්හි ෂඩායතනය වෙයි. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය වේ"යි අවබොධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් ඇතිකල්හි නාමරූප වේ ද? කිනම් ප්‍රත්‍යයෙකින් නාමරූප වේ ද?" යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "විඥනය ඇති කල්හි නාමරූප වෙයි. විඥනප්‍රත්‍යයෙන් නාමරූප වේ" යි අවබොධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් ඇතිකල්හි විඥනය වේ ද? කිනම් ප්‍රත්‍යයෙකින් විඥනය වේ ද?" යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "සංස්කාර ඇති කල්හි විඥනය වෙයි. සංස්කාරප්‍රත්‍යයෙන් විඥනය වේ" යි අවබොධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් ඇතිකල්හි සංස්කාරයෝ වෙත් ද? කිනම් ප්‍රත්‍යයෙකින් සංස්කාරයෝ වෙත් ද?" යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "අවිද්‍යාව ඇති කල්හි සංස්කාරයෝ වෙත්. අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති"යි අවබොධ වී ය.

ඉති හිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. "සමුදයො සමුදයො"ති බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි. ආලොකො උදපාදි.

අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු බො අසති ජරාමරණං න හොති? කිස්ස නිරොධා ජරාමරණනිරොධො?"ති. අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "ජාතියා බො අසති ජරාමරණං න හොති. ජාතිනිරොධා ජරාමරණනිරොධො"ති.

අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු බො අසති ජාති න හොති? කිස්ස නිරොධා ජාතිනිරොධො?"ති. අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "භවෙ බො අසති ජාති න හොති. භවනිරොධා ජාතිනිරොධො"ති.

අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු බො අසති භවො න හොති? කිස්ස නිරොධා භවනිරොධො?"ති. අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "උපාදානෙ බො අසති භවො න හොති. උපාදානනිරොධා භවනිරොධො"ති.

අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු බො අසති උපාදානං න හොති? කිස්ස නිරොධා උපාදානනිරොධො?"ති. අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "තණ්හාය බො අසති උපාදානං න හොති. තණ්හානිරොධා උපාදානනිරොධො"ති.

අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු බො අසති තණ්හා න හොති? කිස්ස නිරොධා තණ්හානිරොධො?"ති. අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "වෙදනාය බො අසති තණ්හා න හොති. වෙදනානිරොධා තණ්හානිරොධො"ති.

අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු බො අසති වෙදනා න හොති? කිස්ස නිරොධා වෙදනානිරොධො?"ති. අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "ඵස්සෙ බො අසති වෙදනා න හොති. ඵස්සනිරොධා වෙදනා-නිරොධො"ති.

අථ බො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු බො අසති ඵස්සො න හොති? කිස්ස නිරොධා ඵස්සනිරොධො?"ති. අථ බො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "සළායතනෙ බො අසති ඵස්සො න හොති. සළායතනනිරොධා ඵස්සනිරොධො"ති.

මෙසේ මේ අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙත්. සංස්කාර ප්‍රත්‍යයයෙන් විඥානය වෙයි ... මෙසේ මේ හුදු දුක්රැසෙහි හට ගැණීම වෙයි. මහණෙනි, විපස්සී බෝසතුන්ට "සමුදය ය, සමුදය ය"යි පෙර නො ඇසූවිරූ දහම්හි දශීනය පහළ විය. නුවණ පහළ විය. ප්‍රඥව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් නැතිකල්හි ජරා මරණ නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් ජරාමරණනිරොධය වේ ද?" යි මේ අදහස විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාර-යෙන් ද ප්‍රඥයෙන් ද "ඉපැද්ම නැති කල්හි ජරාමරණ නො වේ. ඉපැද්ම නිරුද්ධ වීමෙන් ජරාමරණ නිරොධය වේ" යි අවබොධ විය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් නැති කල්හි ඉපැද්ම නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් ඉපැද්ම නිරුද්ධ වේ ද?" යි මේ අදහස විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "භවය නැති කල්හි ඉපැද්ම නො වේ. භවය නිරුද්ධ වීමෙන් ඉපැද්ම නිරුද්ධ වේ' යි අවබෝධ විය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් නැති කල්හි භවය නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වේ ද?" යි මේ අදහස විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "උපාදන නැති කල්හි භවය නො වේ. උපාදන නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වේ" යි අවබෝධ විය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් නැති කල්හි උපාදන නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් උපාදන නිරුද්ධ වේ ද?"යි මේ අදහස විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "තණ්හාව නැති කල්හි උපාදන නො වේ. තණ්හාව නිරුද්ධ වීමෙන් උපාදනනිරොධය වේ"යි අවබෝධ විය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් නැති කල්හි තණ්හාව නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් තණ්හාව නිරුද්ධ වේ ද"?යි මේ අදහස විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "වේදනාව නැති කල්හි තණ්හාව නො වේ. වේදනාව නිරුද්ධ වීමෙන් තණ්හානිරොධය වේ"යි අවබොධ විය

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් නැති කල්හි වෙදනාව නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් වෙදනානිරොධය වේ ද"?යි මේ අදහස විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "ස්පර්ශය නැති කල්හි වෙදනාව නො වේ. ස්පර්ශය නිරුද්ධ වීමෙන් වෙදනානිරොධය වේ'යි අවබෝධ විය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් නැති කල්හි ස්පර්ශය නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් ස්පර්ශනිරොධය වේ ද"යි මේ අදහස විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "ෂඩායතනය නැති කල්හි ස්පර්ශය නො වේ. ෂඩායතනය නිරුද්ධ වීමෙන් ස්පර්ශනිරොධය වේ"යි අවබොධ විය.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො අසති සළායතනං න හොති? කිස්ස නිරොධා සළායතනනිරොධො?"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "නාමරූපෙ ඛො අසති සළායතනං න හොති. නාමරූපනිරොධා සළායතනනිරොධො"ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො අසති නාමරූපං න හොති? කිස්ස නිරොධා නාමරූපනිරොධො?"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "විඤ්ඤාණෙ ඛො අසති නාමරූපං න හොති. විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො"ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො අසති විඤ්ඤාණං න හොති? කිස්ස නිරොධා විඤ්ඤාණනිරොධො?"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "සඞ්ඛාරෙසු ඛො අසති විඤ්ඤාණං න හොති. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො"ති.

අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො අසති සඞ්ඛාරා න හොන්ති? කිස්ස නිරොධා සඞ්ඛාරනිරොධො?"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "අවිජ්ජාය ඛො අසති සඞ්ඛාරා න හොන්ති. අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො"ති.

ඉති හිදං අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

"නිරොධො නිරොධො"ති ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි. ආලොකො උදපාදීති.

( සත්තන්නම්පි බුද්ධානං එවං විත්ථාරෙතබ්බා. )

## 1. 1. 5.

## සිඛිසුත්තං

5. **සිඛිස්ස** භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්ස එව සතො එතදහොසි. -පෙ-

## 1. 1. 6.

## වෙස්සභූසුත්තං

6. **වෙස්සභුස්ස** භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්ස එව සතො එතදහොසි. -පෙ-

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් නැති කල්හි ෂඩායතනය නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් ෂඩායතනනිරොධය වේ ද?" යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපාය ප්‍රඥයෙන් ද "නාමරූප නැති කල්හි ෂඩායතනය නො වේ. මනසකාරයෙන් ද නාමරූප නිරුද්ධ වීමෙන් ෂඩායතනනිරෝධය වේ ය"යි අවබෝධ විය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් නැති කල්හි නාමරූප නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් නාමරූප නිරුද්ධ වේ ද?"යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "විඤ්ඤාණය නැති කල්හි නාමරූප නො වේ. විඤ්ඤාණය නිරුද්ධ වීමෙන් නාමරූපනිරොධය වේ ය" යි අවබෝධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට "කුමක් නැති කල්හි විඤ්ඤාණය නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් විඤ්ඤාණය නිරුද්ධ වේ ද"?යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "සංස්කාර නැති කල්හි විඤ්ඤාණය නො වේ. සංස්කාර නිරුද්ධ වීමෙන් විඤ්ඤාණනිරොධය වේ ය" යි අවබෝධ වී ය.

මහණෙනි, ඉක්බිති විපස්සීබෝසතුන්ට "කුමක් නැති කල්හි සංස්කාර නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් සංස්කාර නිරුද්ධ වේ ද?"යි මේ අදහස වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසතුන්ට උපායමනසකාරයෙන් ද ප්‍රඥයෙන් ද "අවිද්‍යාව නැති කල්හි සංස්කාර නො වේ. අවිද්‍යාව නිරුද්ධ වීමෙන් සංස්කාරනිරොධයවේ ය" යි අවබොධ වී ය.

මෙසේ මේ අවිද්‍යාව නිරුද්ධ වීමෙන් සංස්කාරනිරොධය වේ. සංස්කාර නිරුද්ධ වීමෙන් විඥානනිරොධය වේ. – ... – මෙසේ මේ හුදු දුක්රැසේ නිරොධය වේ.

මහණෙනි, විපස්සී බෝසතුන්ට "නිරොධය නිරොධය" යි පෙර නො ඇසූවිරූ දහම්හි දශීනය පහළ වි ය. ඥානය පහළ විය. ප්‍රඥව පහළ වි ය. විද්‍යාව පහළ වී ය. ආලෝකය පහළ වී ය.

(සත් බුදුවරයන් වහන්සේ පිළිබඳ ව ම මෙසේ විස්තර කටයුතු ය.)

### 1. 1. 5.

### සිඛිසූත්‍රය

5. මහණෙනි, සම්බොධියට පෙර බුදුබවට නොපැමිණි, බෝසත් වූ ම භාග්‍යවත් අභීත් සිඛී සම්මා සම්බුද්ධරජාතන් වහන්සේට මෙබඳු අදහසෙක් වී ය: ...

### 1. 1. 6.

### වෙස්සභූ සූත්‍රය

6. මහණෙනි, සම්බොධියට පෙර බුදුබවට නො පැමිණි බෝසත් වූව භාග්‍යවත් අභීත් වෙස්සභූ සම්මාසම්බුද්ධරජාතන් වහන්සේට මෙබඳු අදහසෙක් වී ය: ...

## 1. 1. 7.

### කකුසන්ධසුත්තං

7 **කකුසන්ධස්ස** භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: - පෙ -

## 1. 1. 8.

### කොනාගමනසුත්තං

8. **කොනාගමනස්ස**[1] භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: - පෙ -

## 1. 1. 9.

### කස්සපසුත්තං

9. **කස්සපස්ස** භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: - පෙ -

[පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨානි (5-9) ඉමානි සුත්තන්තානි විපස්සිසුත්තාගතපාළිනයෙනෙව විත්ථාරතො දට්ඨබ්බානි.]

## 1. 1. 10.

### ගොතමසුත්තං

10. පුබ්බෙව මෙ භික්ඛවෙ, සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: "කිච්ඡං වතායං ලොකො ආපන්නො. ජායති ච, ජීයති ච, මීයති ච, චවති ච, උපපජ්ජති[2] ච. අථ ච පනිමස්ස දුක්ඛස්ස නිස්සරණං නප්පජානාති ජරාමරණස්ස. කුදස්සු[3] නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සා"ති

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "කිම්හි නු ඛො සති ජරාමරණං හොති? කිම්පච්චයා ජරාමරණ?"න්ති.[4] තස්ස මය්හං භික්ඛවෙ, යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "ජාතියා ඛො සති ජරාමරණං හොති. ජාතිපච්චයා ජරාමරණ"න්ති.

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "කිම්හි නු ඛො සති ජාති හොති? - පෙ - භවො - උපාදානං - තණ්හා - වෙදනා - ඵස්සො - සළායතනං - නාමරූපං - විඤ්ඤාණං - සඞ්ඛාරා හොන්ති? කිම්පච්චයා සඞ්ඛාරා"ති? තස්ස මය්හං භික්ඛවෙ යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "අවිජ්ජාය ඛො සති සඞ්ඛාරා හොන්ති. අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"ති.

ඉති හිදං[5] අවිජ්ජාපච්චයා සඞ්ඛාරා. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං - පෙ - එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

"සමුදයො සමුදයො"ති ඛො මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි. ආලොකො උදපාදි.

---

1. කොණාගමනස්ස සී. මු. මජ්ඣං "කොනකමුනි - කනකමුනි" - බෞද්ධසංස්කෘත.
2. උපපජ්ජන්ති 3. කුදස්සු - මජ්ඣං, සී. මු. 4. ජරාමරණං - සීමු. 5 ඉතිහිදං භික්ඛවෙ - සීමු, සී. 1, 2.

## 1. 1. 7.

### කකුසන්ධ සූත්‍රය

7. මහණෙනි, සම්බෝධියට පෙර බුදුබවට නො පැමිණි බෝසත් වූ ම භාග්‍යවත් අතීත් **කකුසඳ**[1] සම්මාසම්බුදුරජාණන් වහන්සේට මෙබඳු අදහසෙක් වී ය: ...

## 1. 1. 8.

### කෝනාගමන සූත්‍රය

8. මහණෙනි, සම්බෝධියට පෙර බුදුබවට නො පැමිණි බෝසත් වූ ම භාග්‍යවත් අතීත් **කෝනාගමන** සම්මාසම්බුදුරජාණන් වහන්සේට මෙබඳු අදහසෙක් වී ය: ...

## 1. 1. 9.

### කාශ්‍යප සූත්‍රය

9. මහණෙනි, සම්බෝධියට පෙර බුදුබවට නො පැමිණි බෝසත් වූ ම භාග්‍යවත් අතීත් **කසුප්** සම්මාසම්බුදුරජාණන් වහන්සේට මෙබඳු අදහසෙක් වී ය. ...

[පෙය්‍යාලයෙන් සංක්ෂිප්ත වූ (5 - 9) මේ සූත්‍රාන්තයෝ විපස්සි සූත්‍රයෙහි ආ පැවියෙන් විස්තර විසින් දත යුතු වෙත්.]

## 1. 1. 10.

### ගෞතම සූත්‍රය

10. මහණෙනි, බුදු වීමට පෙර ම බුදු නො වූ බෝසත් වූ මට මේ සිත පහළ විය: "ඒකාන්තයෙන් මේ ලෝකයා දුකට පැමිණියේ ය. උපදී. දිරයි. මියෙයි. ච්‍යුත වෙයි. නැවතත් උපදී. එහෙත් දිරීම මැරීම පිළිබඳ දුකින් නික්ම යැමක් නො දනී. කවර කලෙක නම් ජරාමරණ සංඛ්‍යාත මේ දුකින් නික්ම යැමෙක් පෙණේ ද"යි.

මහණෙනි, ඒ මට "කුමක් ඇති කල්හි ජරාමරණ වේ ද? කිනම් ප්‍රත්‍යයෙකින් ජරාමරණ වේ ද?" යි මේ අදහස පහළ විය. මහණෙනි, ඒ මට උපාය මනසිකාරයෙන් ද ප්‍රඥායෙන් ද "ඉපදීම ඇති කල්හි ජරාමරණ වෙයි. ඉපදීම්-ප්‍රත්‍යයෙන් ජරාමරණ වේ ය" යි අවබෝධ විය.

මහණෙනි, ඒ මට "කුමක් ඇති කල්හි ඉපැද්ම වේ ද? ... භවය - උපාදන - තෘෂ්ණාව - වේදනාව - ස්පර්ශය - ෂඩායතන - නාමරූප - විඥානය - සංස්කාරයෝ වෙද් ද? කිනම් ප්‍රත්‍යයෙකින් සංස්කාරයෝ හටගණිද්ද?"යි මේ අදහස විය. මහණෙනි, ඒ මට උපායමනසිකාරයෙන් ද ප්‍රඥායෙන් ද "අවිද්‍යාව ඇති කල්හි සංස්කාරයෝ වෙති. අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ හටගණිති"යි අවබෝධ විය.

මෙසේ මේ අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්. සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය හටගණී. ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, "සමුදය, සමුදය" යි පෙර නො ඇසූවිරූ දහම්හි මට දර්ශනය පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

---

1. ක්‍රකුච්ඡන්ද - බෞද්ධසංස්කෘත.

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "කිම්හි නු ඛො අසති ජරාමරණං න හොති? කිස්ස නිරොධා ජරාමරණනිරොධො?"ති. තස්ස මය්හං භික්ඛවෙ, යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "ජාතියා ඛො අසති ජරාමරණං න හොති. ජාතිනිරොධා ජරාමරණනිරොධො"ති.

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "කිම්හි නු ඛො අසති ජාති න හොති? -පෙ- භවො - උපාදානං - තණ්හා - වෙදනා - ඵස්සො - සළායතනං - නාම-රූපං - විඤ්ඤාණං - සඞ්ඛාරා න හොන්ති? කිස්ස නිරොධා සඞ්ඛාරනිරොධො?"ති. තස්ස මය්හං භික්ඛවෙ, යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "අවිජ්ජාය ඛො අසති සඞ්ඛාරා න හොන්ති. අවිජ්ජානිරොධා සඞ්ඛාර-නිරොධො"ති.

ඉති හිදං අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණ-නිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

"නිරොධො නිරොධො"ති ඛො මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි. ආලොකො උදපාදීති.

බුද්ධවග්ගො පඨමො.

තස්සුද්දානං[1]:

දෙසනා විභඞ්ග පටිපදා ච[2]
විපස්සී සිඛී ච වෙස්සභූ,
කකුසන්ධො[3] කොනාගමනො ච[4] කස්සපො
(මහායසො සක්‍යමුනී ච) ගොතමොති[5]

---

1. තස්ස උද්දානං භවති - ස්‍යා. 2. විභඞ්ගං පටිපදං - ස්‍යා. 3. කකුසන්ධො ච - සීමු.
4. කොනාගමනො - මජසං. 5. මහාසක්‍යමුනී ච ගොතමොති - මජසං, ස්‍යා.

මහණෙනි, ඒ මට "කුමක් නැති කල්හි ජරාමරණ නො වේ ද? කුමක් නිරුද්ධ වීමෙන් ජරාමරණනිරෝධය වේ ද?" යි මේ අදහස විය. මහණෙනි, ඒ මට නුවණින් මෙනෙහි කිරීමෙන් ද ප්‍රඥයෙන් ද "ඉපැදීම නැති කල්හි ජරාමරණ නො වේ. ඉපැදීම නිරුද්ධ වීමෙන් ජරාමරණනිරෝධය වේ" යි අවබෝධ විය.

මහණෙනි, ඒ මට "කුමක් නැති කල්හි ඉපැදීම නො වේ ද? ... භවය - උපාදාන - තෘෂ්ණාව - වේදනාව - ස්පර්ශය - ෂඩායතන - නාමරූප - විඥානය - සංස්කාරයෝ නො වෙද් ද? කුමක් නිරුද්ධ වීමෙන් සංස්කාරනිරෝධය වේ ද"? යි මේ අදහස විය. මහණෙනි, ඒ මට නුවණින් මෙනෙහි කිරීමෙන් ද ප්‍රඥයෙන් ද "අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නො වෙත්. අවිද්‍යාව නිරුද්ධ වීමෙන් සංස්කාරනිරෝධය වේ" යි අවබෝධ විය.

මෙසේ මේ අවිද්‍යාව නිරුද්ධ වීමෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාර නිරුද්ධ වීමෙන් විඥානනිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

මහණෙනි, "නිරෝධය නිරෝධය" යි පෙර නො ඇසූවිරූ දහම්හි මට දර්ශනය පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

## බුද්ධවර්ගය පළමුවැනි යි

**උද්දානය:**

දෙසනා, විභඞ්ග, පටිපදා, විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසන්ධ, කොනාගමන, කස්සප, (මහායස සක්‍යමුනි) ගොතම ය යි සූත්‍ර දශයෙකි.

# 2. ආහාරවග්ගො

## 1. 2. 1.

### ආහාරසුත්තං

11. සාවත්ථියං-

චත්තාරෙමෙ භික්ඛවෙ, ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය. කතමෙ චත්තාරො? කබලිඞ්කාරො[1] ආහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය.

ඉමෙ ඛො භික්ඛවෙ,[2] චත්තාරො ආහාරා කින්නිදානා? කිංසමුදයා? කිඤ්ජාතිකා? කිම්පභවා? ඉමෙ චත්තාරො ආහාරා තණ්හානිදානා, තණ්හාසමුදයා, තණ්හාජාතිකා, තණ්හාපභවා [3]

තණ්හා චායං භික්ඛවෙ, කින්නිදානා? කිංසමුදයා? කිඤ්ජාතිකා? කිම්පභවා? තණ්හා වෙදනානිදානා, වෙදනාසමුදයා, වෙදනාජාතිකා, වෙදනාපභවා.

වෙදනා චායං භික්ඛවෙ, කින්නිදානා? කිංසමුදයා? කිඤ්ජාතිකා? කිම්පභවා? වෙදනා ඵස්සනිදානා, ඵස්සසමුදයා, ඵස්සජාතිකා, ඵස්සප්පභවා.

ඵස්සො චායං භික්ඛවෙ, කින්නිදානො? කිංසමුදයො? කිඤ්ජාතිකො? කිම්පභවො? ඵස්සො සළායතනනිදානො, සළායතනසමුදයො, සළායතනජාතිකො, සළායතනප්පභවො.

සළායතනඤ්චිදං භික්ඛවෙ, කින්නිදානං? කිංසමුදයං? කිඤ්ජාතිකං? කිම්පභවං? සළායතනං නාමරූපනිදානං, නාමරූපසමුදයං, නාමරූපජාතිකං, නාමරූපප්පභවං.

නාමරූපඤ්චිදං භික්ඛවෙ, කින්නිදානං? කිංසමුදයං? කිඤ්ජාතිකං? කිම්පභවං? නාමරූපං විඤ්ඤාණනිදානං, විඤ්ඤාණසමුදයං, විඤ්ඤාණජාතිකං, විඤ්ඤාණප්පභවං.

---

1 කබලීකාරො - මජසං, සතා. 2. ඉමෙ භික්ඛවෙ - මජසං. ඉමෙ ච භික්ඛවෙ - සතා ඉමෙ - සීමු. 3. තණ්හාප්පභවා - සීමු.

# 2. ආහාරවග්ගය

## 1. 2. 1.

### ආහාරසූත්‍රය

11. සැවැත්නුවර-

මහණෙනි, උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසත්, උපදින්නා වූ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසත් මේ ආහාර සතරෙකි: කවර සතරෙක් ද? යත්: දළ වූ හෝ සියුම් වූ හෝ කබලීකාර (=පිඩු කොට බුදින බත් ආදී) ආහාරය, ස්පර්ශය දෙවැන්න ය, මනෝසඤ්චේතනාව තෙවැන්න ය, විඥානය සිවුවැන්න ය. මහණෙනි, මේ සතර ආහාරයෝ උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසත් උපදින්නා වූ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසත් වෙති.

මහණෙනි, මේ ආහාර සතර කුමක් නිදාන (කරුණු) කොට, කුමක් හේතු කොට, කුමක් ප්‍රභව කොට ඇත්තෝ ද? මේ සතර ආහාරයෝ තෘෂ්ණාව නිදාන කොට, තෘෂ්ණාව හේතු කොට, තෘෂ්ණාව ජාති කොට, තෘෂ්ණාව ප්‍රභව කොට ඇත්තෝ ය.

මහණෙනි, මේ තෘෂ්ණාව කුමක් නිදාන කොට, කුමක් හේතු කොට, කුමක් ජාති කොට, කුමක් ප්‍රභව කොට, ඇත්තී ද? තෘෂ්ණාව වේදනාව නිදාන කොට, වේදනාව හේතු කොට, වේදනාව ජාති කොට, වේදනාව ප්‍රභව කොට ඇත්තී ය.

මහණෙනි, මේ වේදනාවත් කුමක් නිදාන කොට, කුමක් හේතු කොට, කුමක් ජාති කොට, කුමක් ප්‍රභව කොට ඇත්තී ද? වේදනාව ස්පර්ශය නිදාන කොට, ස්පර්ශය හේතු කොට, ස්පර්ශය ජාති කොට, ස්පර්ශය ප්‍රභව කොට ඇත්තී ය.

මහණෙනි, මේ ස්පර්ශය කුමක් කරුණු කොට, කුමක් හේතු කොට, කුමක් ජාති කොට කුමක් ප්‍රභව කොට, ඇත්තේ ද? ස්පර්ශය ෂඩායතනය කරුණු කොට, ෂඩායතනය හේතු කොට, ෂඩායතනය ජාති කොට, ෂඩායතනය ප්‍රභව කොට ඇත්තේ ය.

මහණෙනි, මේ ෂඩායතනය කුමක් කරුණු කොට, කුමක් හේතු කොට, කුමක් ජාති කොට, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද? ෂඩායතනය නාමරූප කරුණු කොට, නාමරූප හේතු කොට, නාමරූප ජාති කොට, නාමරූප ප්‍රභව කොට ඇත්තේ ය.

මහණෙනි, මේ නාමරූප කුමක් කරුණු කොට, කුමක් හේතු කොට, කුමක් ජාති කොට, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද? නාමරූප විඥානය කරුණු කොට, විඥානය හේතු කොට, විඥානය ජාති කොට, විඥානය ප්‍රභව කොට ඇත්තේ ය.

**විඤ්ඤාණඤ්චිදං** භික්ඛවෙ, කින්නිදානං? **කිංසමුදයං**? කිඤ්ජාතිකං? කිම්පභවං? විඤ්ඤාණං සඞ්ඛාරනිදානං, සඞ්ඛාරසමුදයං, සඞ්ඛාරජාතිකං, සඞ්ඛාරප්පභවං.

සඞ්ඛාරා චිමෙ භික්ඛවෙ, කින්නිදානා? කිංසමුදයා? කිඤ්ජාතිකා? කිම්පභවා? සඞ්ඛාරා අවිජ්ජානිදානා, අවිජ්ජාසමුදයා, අවිජ්ජාජාතිකා, අවිජ්ජාපභවා.

ඉති ඛො භික්ඛවෙ, අවිජ්ජාපච්චයා සඞ්ඛාරා. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- **එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.**

අවිජ්ජාය **ත්වෙව** අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා **විඤ්ඤාණනිරොධො** - පෙ - එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස **නිරොධො හොතීති.**

## 1. 2. 2.

## මොළියඵග්ගුන[1]සුත්තං

12. **සාවත්ථියං-**

චත්තාරො'මෙ භික්ඛවෙ, ආහාරා භූතානං වා සත්තානං ඨිතියා, සම්භවෙසීනං වා අනුග්ගහාය. කතමෙ චත්තාරො? කබළිඞ්කාරො ආහාරො ඔළාරිකො වා සුඛුමො වා, **ඵස්සො** දුතියො, මනොසඤ්චෙතනා තතියා, **විඤ්ඤාණං** චතුත්ථං. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ආහාරා භූතානං වා සත්තානං ඨිතියා, සම්භවෙසීනං වා අනුග්ගහායාති.

එවං වුත්තෙ ආයස්මා **මොළියඵග්ගුනො** භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ **විඤ්ඤාණාහාරං** ආහාරෙතීති? නො කල්ලො පඤ්හොති භගවා අවොච: ආහාරෙතීති අහං න වදාමි. ආහාරෙතීති චාහං වදෙය්‍යං, තත්‍රස්ස කල්ලො පඤ්හො 'කො නු ඛො භන්තෙ, ආහාරෙතී'ති. එවඤ්චාහං න වදාමි. එවං මං අවදන්තං යො එවං පුච්ඡෙය්‍ය: 'කිස්ස නු ඛො භන්තෙ විඤ්ඤාණාහාරො'ති, එස කල්ලො පඤ්හො. තත්‍ර කල්ලං වෙය්‍යාකරණං, විඤ්ඤාණාහාරො ආයතිං පුනබ්භවාභිනිබ්බත්තියා පච්චයො. තස්මිං භූතෙ සති සළායතනං, සළායතනපච්චයා ඵස්සොති.

කො නු ඛො භන්තෙ, ඵුසතීති. නො කල්ලො පඤ්හොති භගවා අවොච. ඵුසතීති අහං න වදාමි. ඵුසතීති චාහං වදෙය්‍යං, තත්‍රස්ස කල්ලො පඤ්හො 'කො නු ඛො භන්තෙ, ඵුසතී'ති. එවං චාහං න වදාමි. එවං මං අවදන්තං යො එවං පුච්ඡෙය්‍ය 'කිම්පච්චයා නු ඛො භන්තෙ, ඵස්සො'ති, එස කල්ලො පඤ්හො. තත්‍ර කල්ලං වෙය්‍යාකරණං 'සළායතනපච්චයා ඵස්සො. ඵස්සපච්චයා වෙදනා'ති.

1. මොලියඵග්ගුන - සතා. මොළියඵග්ගුණ - සීමු.

මහණෙනි, මේ විඥානය කුමක් කරුණු කොට, කුමක් හේතු කොට, කුමක් ජාති කොට, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද? විඥානය සංස්කාරයන් කරුණු කොට, සංස්කාරයන් හේතු කොට, සංස්කාරයන් ජාති කොට, සංස්කාරයන් ප්‍රභව කොට ඇත්තේ ය.

මහණෙනි, මේ සංස්කාරයෝ කුමක් කරුණු කොට, කුමක් හේතු කොට, කුමක් ජාති කොට, කුමක් ප්‍රභව කොට ඇත්තාහු ද? සංස්කාරයෝ අවිද්‍යාව කරුණු කොට, අවිද්‍යාව හේතු කොට, අවිද්‍යාව ජාති කොට, අවිද්‍යාව ප්‍රභව කොට ඇත්තාහු ය.

මහණෙනි, මෙසේ අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙත්. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ.

අවිද්‍යාවේ ම අනවශේෂවිරාග සඞ්ඛ්‍යාත නිරොධයෙන් සංස්කාර නිරොධය වේ. සංස්කාරනිරොධයෙන් විඥානනිරොධය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරොධය වේ.

## 1. 2. 2.

## මොළියඵග්ගුන සූත්‍රය.

12. **සැවැත්නුවර-**

මහණෙනි, උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසත් උපදින්නා වූ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසත් මේ ආහාර සතරෙකි. කවර සතරෙක් ද? දළ වූ හෝ සියුම් වූ හෝ කබලීකාර ආහාරය ය, ස්පර්ශය දෙවැන්න ය, මනොසඤ්චෙතනාව තෙවැන්න ය, විඥානය සිවුවැන්න ය. මහණෙනි, මේ ආහාර සතර උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසත් උපදින්නා වූ සත්ත්වයන්ට අනුග්‍රහය පිණිසත් වේ.

මෙසේ වදාළ කල ආයුෂ්මත් මොළියඵග්ගුන ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ "වහන්ස, කවරෙක් විඥානාහාරය අනුභව කෙරේ ද" යි විචාළේ ය. "ප්‍රශ්නය යුක්ත නො වේ ය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. '(පුද්ගලයෙක්) අනුභව කෙරේ ය'යි මම නො කියමි. ඉදින් (පුද්ගලයෙක්) අනුභව කෙරේ ය යි මම කියන්නෙම් නම්, එහි ලා 'වහන්ස, කවරෙක් අනුභව කෙරේ ද'යි යන ප්‍රශ්නය යුක්ත වන්නේ ය. මම එසේ නො කියමි. එසේ නොකියන මාගෙන් යමෙක් 'වහන්ස, විඥානය කුමකට ආහාරය (ප්‍රත්‍යය) වේ ද' යි මෙසේ විචාරන්නේ නම් මේ ප්‍රශ්නය යුක්ත ය. 'විඥානාහාරය (ප්‍රතිසන්ධිය) මතු පුනර්භවය (නාම රූප) හටගැනීම පිණිස ප්‍රත්‍යය වෙයි. ඒ පුනබ්භවාභිනිබ්බත්ති සඞ්ඛ්‍යාත නාමරූප ඇති වූ කල්හි ෂඩායතන වෙයි. ෂඩායතනප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ ය'යි එහි ලා විසඳීම සුදුසු ය.

වහන්ස, කවරෙක් ස්පර්ශ කෙරේ ද? මේ ප්‍රශ්නය යුක්ත නො වේ ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක (සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක්) ස්පර්ශ කෙරේ ය යි මම නො කියමි. ඉදින් ස්පර්ශ කෙරේ ය යි මම කියන්නෙම් නම්, එහි ලා 'වහන්ස, කවරෙක් ස්පර්ශ කෙරේ ද?' යන මේ ප්‍රශ්නය යුක්ත වන්නේ ය. මම එසේ නො ම කියමි. එසේ නොකියන මාගෙන් යමෙක් "වහන්ස, කිනම් ප්‍රත්‍යයකින් ස්පර්ශය වේ ද"යි මෙසේ විචාරන්නේ නම්, මේ ප්‍රශ්නය යුක්ත ය. එහි ලා "ෂඩායතනප්‍රත්‍යයයෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වෙදනාව වේ ය"යි විසඳීම යුක්ත ය.

කො නු බො භන්තෙ, වෙදියතීති[1]. නො කල්ලො පඤ්හොති භගවා අවොච. වෙදියතීති අහං න වදාමි. වෙදියතීති චාහං වදෙය්‍යං, තත්‍රස්ස කල්ලො පඤ්හො "කො නු බො භන්තෙ, වෙදියතී"ති. එවං චාහං න වදාමි. එවං මං අවදන්තං යො එවං පුච්ඡෙය්‍ය 'කිම්පච්චයා නු බො භන්තෙ වෙදනා'ති, එස කල්ලො පඤ්හො. තත්‍ර කල්ලං වෙය්‍යාකරණං "ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා"ති.

කො නු බො භන්තෙ, තණ්හීයතීති[2]. නො කල්ලො පඤ්හොති භගවා අවොච. තණ්හීයතීති අහං න වදාමි. තණ්හීයතීති චාහං වදෙය්‍යං, තත්‍රස්ස කල්ලො පඤ්හො "කො නු බො භන්තෙ, තණ්හීයතී"ති. එවං චාහං න වදාමි. එවං මං අවදන්තං යො එවං පුච්ඡෙය්‍ය "කිම්පච්චයා නු බො භන්තෙ, තණ්හා"ති, එස කල්ලො පඤ්හො. තත්‍ර කල්ලං වෙය්‍යාකරණං "වෙදනාපච්චයා තණ්හා. තණ්හාපච්චයා උපාදාන"න්ති.

කො නු බො භන්තෙ, උපාදියතීති. නො කල්ලො පඤ්හොති භගවා අවොච. උපාදියතීති අහං න වදාමි. උපාදියතීති චාහං වදෙය්‍යං, තත්‍රස්ස කල්ලො පඤ්හො "කො නු බො භන්තෙ, උපාදියතී"ති. එවං චාහං න වදාමි. එවං මං අවදන්තං යො එවං පුච්ඡෙය්‍ය "කිම්පච්චයා නු බො භන්තෙ, උපාදාන"න්ති එස කල්ලො පඤ්හො. තත්‍ර කල්ලං වෙය්‍යාකරණං "තණ්හා-පච්චයා උපාදානං. උපාදානපච්චයා භවො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති."

ඡන්නං ත්වෙව ඵග්ගුන, ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා ඵස්ස-නිරොධො. ඵස්සනිරොධා වෙදනානිරොධො. වෙදනානිරොධා තණ්හානිරොධො. තණ්හානිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො. භව-නිරොධා ජාතිනිරොධො. ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## 1. 2. 3.

## සමණබ්‍රාහ්මණසුත්තං

13. සාවත්ථියං-

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං නප්පජානන්ති, ජරාමරණසමුදයං නප්පජානන්ති, ජරාමරණනිරොධං නප්පජානන්ති, ජරා-මරණනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති. ජාතිං -පෙ- භවං - උපාදානං - තණ්හං - වෙදනං - ඵස්සං - සළායතනං - නාමරූපං - විඤ්ඤාණං - සඞ්ඛාරෙ නප්පජානන්ති, සඞ්ඛාරසමුදයං නප්පජානන්ති, සඞ්ඛාරනිරොධං නප්පජානන්ති, සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං[3] නප්පජානන්ති. න මෙ තෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා. බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

---

1. වෙදයතීති - කත්ථචි. 2. තසති - මජ්ඣං. 3. ගාමිනිපටිපදං - සයා.

"වහන්ස, කවරෙක් විඳී ද?". ප්‍රශ්නය යුක්ත නො වේ ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. විඳී ය යි මම නො කියමි. ඉදින් විඳී ය යි මම කියන්නෙම් නම්, එහි ලා "වහන්ස, කවරෙක් විඳී ද?" යන මේ ප්‍රශ්නය යුක්ත වන්නේ ය. මම එසේ නො ම කියමි. එසේ නො කියන මාගෙන් යමෙක් 'වහන්ස, කිනම් ප්‍රත්‍යයෙකින් වේදනාව වේ ද'යි මෙසේ විචාරන්නේ නම්, මේ ප්‍රශ්නය යුක්ත ය. එහි ලා "ස්පර්‍ශප්‍රත්‍යයෙන් වේදනාව වේ. වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ ය"යි විසඳීම යුක්ත ය.

වහන්ස, කවරෙක් තෘෂ්ණාව කෙරේ ද?. ප්‍රශ්නය යුක්ත නො වේ ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. තෘෂ්ණාව කෙරේ ය යි මම නො කියමි. ඉදින් මම තෘෂ්ණාව කෙරේ ය යි කියන්නෙම් නම්, එහි ලා 'වහන්ස, කවරෙක් තෘෂ්ණාව කෙරේ ද?' යන ප්‍රශ්නය යුක්ත වන්නේ ය. මම එසේ නො කියමි. එසේ නො කියන මාගෙන් යමෙක් 'වහන්ස, කිනම් ප්‍රත්‍යයෙකින් තෘෂ්ණාව වේ ද'යි මෙසේ විචාරන්නේ නම්, මේ ප්‍රශ්නය යුක්ත ය. එහි ලා 'වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වෙයි. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදාන වේ ය' යි විසඳීම යුක්ත ය.

වහන්ස, කවරෙක් උපාදානය කෙරේ (දැඩි කොට ගණී) ද?. ප්‍රශ්නය යුක්ත නො වේ ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. උපාදානය කෙරේ ය යි මම නො කියමි. ඉදින් මම උපාදානය කෙරේ ය යි කියන්නෙම් නම්, එහි ලා "වහන්ස, කවරෙක් උපාදානය කෙරේ ද?" යන ප්‍රශ්නය යුක්ත වන්නේ ය. මම එසේ නො කියමි. එසේ නො කියන මාගෙන් යමෙක් 'වහන්ස, කිනම් ප්‍රත්‍යයෙකින් උපාදානය වේ ද' යි මෙසේ විචාරන්නේ නම්, මේ ප්‍රශ්නය යුක්ත ය. එහි ලා 'තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදාන වේ. උපාදානප්‍රත්‍යයෙන් භවය වේ ය යි විසඳීම යුක්ත ය. මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ.

එගුත, ස්පර්‍ශායතන සයෙහි ම නිරවශේෂවිරාගනිරොධයෙන් ස්පර්‍ශනිරෝධය වේ ස්පර්‍ශනිරෝධයෙන් වේදනානිරෝධය වේ. වෙදනානිරෝධයෙන් තණ්හානිරෝධය වේ. තණ්හානිරෝධයෙන් උපාදානනිරෝධය වේ උපාදානනිරෝධයෙන් භවනිරෝධය වේ. භවනිරෝධයෙන් ජාතිනිරෝධය වේ. ජාතිනිරෝධයෙන් ජරාමරණසොකපරිදෙව දුක්ඛදොමනස්සඋපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ ය යි වදාළ සේක.

## 1. 2. 3.

## සමණබ්‍රාහ්මණසූත්‍රය

13. සැවැත්නුවර-

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ නො දනිත් ද, ඔහු තුමූ ජරාමරණ සමුදය නො දනිත්. ජරාමරණනිරෝධය නො දනිත්. ජරාමරණනිරොධගාමිනීප්‍රතිපදාව නො දනිත්. ජාතිය ... භවය - උපාදානය - තණ්හාව - වෙදනාව - ස්පර්‍ශය - සළායතන - නාමරූප - විඤ්ඤාණය - සඞ්ඛාර නො දනිද් ද, ඔහු සඞ්ඛාරසමුදය නො දනිත්. සඞ්ඛාරනිරොධය නො දනිත්. සඞ්ඛාරනිරොධගාමිනීපටිපදාව නො දනිත්. මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසම්මත වූවෝත් බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණසම්මත වූවෝත් නො වෙත්. ඒ ආයුෂ්මත්හු (ආයතිඵල සඞ්ඛ්‍යාත) ශ්‍රමණයන් පිළිබඳ අර්‍ථයත් බමුණන් පිළිබඳ අර්‍ථයත් මෙ ලොව්හි දී ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ නො ද වෙසෙති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං පජානන්ති, ජරාමරණසමුදයං පජානන්ති. ජරාමරණනිරොධං පජානන්ති. ජරාමරණනිරොධගාමිනිං පටිපදං පජානන්ති. ජාතිං -පෙ- භවං -උපාදානං- තණ්හං - වෙදනං - ඵස්සං - සළායතනං - නාමරූපං - විඤ්ඤාණං - සඞ්ඛාරෙ පජානන්ති, සඞ්ඛාරසමුදයං පජානන්ති. සඞ්ඛාරනිරොධං පජානන්ති. සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං පජානන්ති. තෙ ඛො මෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා. බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා. තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 1. 2. 4.

## දුතියසමණබ්‍රාහ්මණසුත්තං

14 සාවත්ථියං-

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙ ධම්මෙ නප්පජානන්ති, ඉමෙසං ධම්මානං සමුදයං නප්පජානන්ති. ඉමෙසං ධම්මානං නිරොධං නප්පජානන්ති. ඉමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති. කතමෙ ධම්මෙ නප්පජානන්ති? කතමෙසං ධම්මානං සමුදයං නප්පජානන්ති? කතමෙසං ධම්මානං නිරොධං නප්පජානන්ති? කතමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති? ජරාමරණං නප්පජානන්ති. ජරාමරණසමුදයං නප්පජානන්ති. ජරාමරණනිරොධං නප්පජානන්ති. ජරාමරණනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති. ජාතිං -පෙ- භවං - උපාදානං - තණ්හං - වෙදනං - ඵස්සං - සළායතනං - නාමරූපං - විඤ්ඤාණං - සඞ්ඛාරෙ නප්පජානන්ති, සඞ්ඛාරසමුදයං නප්පජානන්ති. සඞ්ඛාරනිරොධං නප්පජානන්ති. සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති.

ඉමෙ ධම්මෙ නප්පජානන්ති, ඉමෙසං ධම්මානං සමුදයං නප්පජානන්ති. ඉමෙසං ධම්මානං නිරොධං නප්පජානන්ති. ඉමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති. න මෙ තෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙ ධම්මෙ පජානන්ති, ඉමෙසං ධම්මානං සමුදයං පජානන්ති. ඉමෙසං ධම්මානං නිරොධං පජානන්ති. ඉමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං පජානන්ති. කතමෙ ධම්මෙ පජානන්ති? කතමෙසං ධම්මානං සමුදයං පජානන්ති? කතමෙසං ධම්මානං නිරොධං පජානන්ති? කතමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං පජානන්ති? ජරාමරණං පජානන්ති. ජරාමරණසමුදයං පජානන්ති. ජරාමරණනිරොධං පජානන්ති. ජරාමරණනිරොධගාමිනිං පටිපදං පජානන්ති. ජාතිං -පෙ- භවං - උපාදානං - තණ්හං - වෙදනං - ඵස්සං - සළායතනං - නාමරූපං - විඤ්ඤාණං - සඞ්ඛාරෙ පජානන්ති, සඞ්ඛාරසමුදයං පජානන්ති. සඞ්ඛාරනිරොධං පජානන්ති. සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං පජානන්ති.

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ දනිද් ද, ඔහු ජරාමරණසමුදය දනිත්, ජරාමරණනිරෝධය දනිත්. ජරාමරණනිරෝධගාමිනීපටිපදාව දනිත්, ජාතිය -පෙ- භවය - උපාදාන - තෘෂ්ණාව - වේදනාව - ස්පර්ශය - ෂඩායතන - නාමරූප - විඥානය - සංස්කාරයන් දනිද් ද, ඔහු සංස්කාරසමුදය දනිත්. සංස්කාරනිරෝධය දනිත්. සංස්කාරනිරෝධගාමිනීප්‍රතිපත්තිය දනිත්. මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහිත් ශ්‍රමණ ය යි සම්මතයහ. බ්‍රාහ්මණයන් කෙරෙහිත් බ්‍රාහ්මණ ය යි සම්මතයහ. ඒ ආයුෂ්මත්හු ද ආයසීඵලසඞ්ඛ්‍යාත ශ්‍රමණභාවය පිළිබඳ අර්ථයත් බ්‍රාහ්මණභාවය පිළිබඳ අර්ථයත් මේ අත්බැව්හි දී ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට (ඊට) පැමිණ වෙසෙත්.

## 1. 2. 4.

## දුතිය සමණබ්‍රාහ්මණ සූත්‍රය.

14 සැවැත්නුවර

මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ ධර්මයන් නො දනිද් ද, ඔහු තුමූ මේ ධර්මයන්ගේ සමුදය නො දනිත්. මේ ධර්මයන්ගේ නිරෝධය නො දනිත්. මේ ධර්මයන්ගේ නිරෝධගාමිනී-ප්‍රතිපත්තිය නො දනිත්. කවර ධර්මයන් නො දනිද් ද ? කවර ධර්මයන්ගේ සමුදය නො දනිද් ද ? කවර ධර්මයන්ගේ නිරෝධය නො දනිද් ද ? කවර ධර්මයන්ගේ නිරෝධගාමිනීප්‍රතිපදාව නො දනිද් ද ? ජරාමරණ නො දනිත්. ජරාමරණසමුදය නො දනිත්. ජරාමරණනිරෝධය නො දනිත්. ජරාමරණනිරෝධගාමිනීප්‍රතිපදාව නො දනිත්. ජාතිය .... භවය - උපාදාන - තණ්හාව - වේදනාව - ඵස්සය - සළායතන - නාමරූප - විඤ්ඤාණය- සඞ්ඛාර නො දනිද් ද ? සඞ්ඛාරසමුදය නො දනිත්. සඞ්ඛාරනිරෝධය නො දනිත්. සඞ්ඛාරනිරෝධගාමිනීප්‍රතිපදාව නො දනිත්.

(යම් කෙනෙක්) මේ ධර්මයන් නො දනිද් ද, (ඔහුතුමූ) මේ ධර්මයන්ගේ සමුදය නො දනිත්. මේ ධර්මයන්ගේ නිරෝධය නො දනිත්. මේ ධර්මයන්ගේ නිරෝධගාමිනීප්‍රතිපදාව නො දනිත්. මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝත් බ්‍රාහ්මණයෝත් ශ්‍රමණයන් කෙරෙහිත් ශ්‍රමණයෝ ය යි සම්මත නො වෙති. බ්‍රාහ්මණයන් කෙරෙහිත් බ්‍රාහ්මණයෝ ය යි සම්මත නො වෙති. ඒ ආයුෂ්මත්-හු ද ශ්‍රමණභාවය පිළිබඳ අර්ථය හෝ බ්‍රාහ්මණභාවය පිළිබඳ අර්ථය හෝ මේ අත්බැව්හි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට (ඊට) පැමිණ නො වෙසෙත්.

මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ ධර්මයන් දනිද් ද, ඔහු මේ ධර්මයන්ගේ සමුදය දනිත්. මේ ධර්මයන්ගේ නිරෝධය දනිත්. මේ ධර්මයන්ගේ නිරෝධගාමිනීප්‍රතිපදාව දනිත්. කවර ධර්මයන් දනිද් ද ? කවර ධර්මයන්ගේ සමුදය දනිද් ද ? කවර ධර්මයන්ගේ නිරෝධය දනිද් ද ? කවර ධර්මයන්ගේ නිරෝධගාමිනීප්‍රතිපදාව දනිද් ද ? ජරාමරණ දනිත්. ජරාමරණසමුදය දනිත්. ජරාමරණ-නිරොධය දනිත්. ජරාමරණනිරොධගාමිනීප්‍රතිපදාව දනිත්. ජාතිය ... භවය - උපාදාන - තණ්හාව - වේදනාව - ඵස්සය - සළායතන - නාමරූප - විඤ්ඤාණය - සඞ්ඛාර දනිද් ද, සඞ්ඛාරසමුදය දනිත්. සඞ්ඛාරනිරොධය දනිත්. සඞ්ඛාරනිරොධගාමිනීප්‍රතිපදාව දනිත්.

ඉමෙ ධමෙම පජානනති, ඉමෙසං ධමමානං සමුදයං පජානනති. ඉමෙසං ධමමානං නිරොධං පජානනති. ඉමෙසං ධමමානං නිරොධගාමිනිං පටිපදං පජානනති. තෙ ඛොමෙ භිකඛවෙ සමණා වා බ්‍රාහමණා වා සමණෙසු චෙව සමණසමමතා බ්‍රාහමණෙසු ච බ්‍රාහමණසමමතා. තෙ ච පනායසමනෙතා සාමඤඤතථඤච බ්‍රහමඤඤතථඤච දිටෙඨව ධමෙම සයං අභිඤඤා සචඡිකතවා උපසමපජජ විහරනතීති.

## 1. 2. 5.

## කචචානගොතතසුතතං

15. සාවතථියං-

අථ ඛො ආයසමා කචචානගොතෙතා යෙන භගවා තෙනුපසඞකමි උපසඞකමිතවා භගවනතං අභිවාදෙතවා එකමනතං නිසීදි. එකමනතං නිසිනෙනා ඛො ආයසමා කචචානගොතෙතා භගවනතං එතදවොච: "සමමාදිටඨි සමමාදිටඨි"ති භනෙත වුචචති, කිතතාවතා නු ඛො භනෙත සමමාදිටඨි හොතීති.?

[2]ද්වයංනිසසිතො ඛො'යං කචචාන ලොකො යෙභුයයෙන අතථිතඤචෙව නතථිතඤච. ලොකසමුදයඤච ඛො කචචාන යථාභූතං සමමපපඤඤාය පසසතො යා ලොකෙ නතථිතා, සා න හොති. ලොකනිරොධං ඛො කචචාන යථාභූතං සමමපපඤඤාය පසසතො යා ලොකෙ අතථිතා, සා න හොති. උපායුපාදානාභිනිවෙසවිනිබනෙධා[3] ඛවායං කචචාන ලොකො යෙභුයයෙන තඤච උපායුපාදානං චෙතසො අධිටඨානං අභිනිවෙසානුසයං න උපෙති, න උපාදියති, නාධිටඨාති 'අතතා මෙ'ති. දුකඛමෙව උපපජජමානං උපපජජති, දුකඛං නිරුජඣමානං නිරුජඣතීති න කඞඛති. න විචිකිචඡති. අපරපපචචයා ඤාණමෙවසස එතථ හොති. එතතාවතා[4] ඛො කචචාන, සමමාදිටඨි හොති.

සබබමතථීති ඛො කචචාන, අයමෙකො අනෙතා. සබබං නතථීති අයං දුතියො අනෙතා. එතෙ තෙ කචචාන උභො අනෙත අනුපගමම මජඣෙන තථාගතො ධමමං දෙසෙති. අවිජජාපචචයා සඞඛාරා. සඞඛාරපචචයා විඤඤාණං - පෙ - එවමෙතසස කෙවලසස දුකඛකඛනධසස සමුදයො හොති. අවිජජාය තෙවව අසෙසවිරාගනිරොධා සඞඛාරනිරොධො. සඞඛාරනිරොධා විඤඤාණනිරොධො - පෙ - එවමෙතසස කෙවලසස දුකඛකඛනධසස නිරොධො හොතීති.

## 1. 2. 6

## ධමමකථිකසුතතං

16. සාවතථියං-

අථ ඛො අඤඤතරො භිකඛු යෙන භගවා තෙනුපසඞකමි. උපසඞකමිතවා භගවනතං අභිවාදෙතවා එකමනතං නිසීදි. එකමනතං නිසිනෙනා ඛො සො භිකඛු භගවනතං එතදවොච: 'ධමමකථිකො ධමමකථිකො'ති භනෙත වුචචති, කිතතාවතා නු ඛො භනෙත, ධමමකථිකො හොතී'ති?

---

1. කචචායන - සී 1. 2. 2. ද්වය - මජසං, සයා, 3. විනිබනධා - මජසං, සයා, සීමු. 4. එතතාවතා නු ඛො - සී, 1. 2.

(යම් කෙනෙක්) මේ ධර්මයන් දනිද් ද, (ඔහු) මේ ධර්මයන්ගේ සමුදය දනිත්. මේ ධර්මයන්ගේ නිරෝධය දනිත්. මේ ධර්මයන්ගේ නිරෝධගාමිනී-ප්‍රතිපදාව දනිත්. මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝත් බ්‍රාහ්මණයෝත් ශ්‍රමණයන් කෙරෙහිත් ශ්‍රමණ ය යි සම්මතයහ. බ්‍රාහ්මණයන් කෙරෙහිත් බ්‍රාහ්මණ ය යි සම්මතයහ. ඒ ආයුෂ්මත්හුත් ශ්‍රමණත්වය පිළිබඳ අර්ථයත් බ්‍රාහ්මණත්වය පිළිබඳ අර්ථයත් මේ අත්බව්හි ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසෙත් ය යි වදාළ සේක.

## 1. 2. 5.

## කච්චානගොත්තසූත්‍රය

15. **සැවැත්නුවර-**

ඉක්බිති ආයුෂ්මත් කච්චානගොත්ත ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් කච්චානගොත්ත ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. වහන්ස, සම්මාදිට්ඨි සම්මාදිට්ඨි ය යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් සම්මාදිට්ඨි ඇත්තේ වේ ද?

කච්චාන, මේ ලෝකයා අස්තිත්වය (ශාශ්වතය) ද නාස්තිත්වය (උච්ඡේදය) ද යන දෙ කොටස බෙහෙවින් ඇසුරු කෙළේ වේ. කච්චාන, ලෝකසමුදයය තත් වූ පරිද්දෙන් මනා නුවණින් දක්නාහට, ලෝකයෙහි යම් නාස්තිත්වයෙක් ඇද් ද, එය නො වේ. කච්චාන, ලෝකනිරෙධය තත් වූ පරිද්දෙන් මනා නුවණින් දක්නාහට, ලෝකයෙහි යම් අස්තිත්වයෙක් ඇද් ද, එය නො වේ. කච්චාන, මේ ලෝකයා තෘෂ්ණාදෘෂ්ටිසඞ්ඛ්‍යාත උපාය උපාදාන අභිනිවෙසයන්ගෙන් බැඳුනේ සිත පිහිටන තැන වූ ඒ උපාය උපාදාන සඞ්ඛ්‍යාත තෘෂ්ණා දෘෂ්ටි අභිනිවේශානුශයයට බෙහෙවින් නො පැමිණේ. 'මාගේ ආත්මය'යි නො ගණී. නො ඉටයි. 'උපදින්නේ දුක ම උපදියි. නිරුද්ධ වන්නේ දුක ම නිරුද්ධ වේ ය'යි (සලකයි. අන්‍ය වූ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් ඇතැයි) සැක නො කෙරේ. විචිකිච්ඡා නූපදවයි. මෙහි ලා ඔහුට පරප්‍රත්‍යයරහිත-භාවයෙන් ආත්මප්‍රත්‍යක්ෂඥානය ම වේ. කච්චාන, මෙතෙකින් ම සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වෙයි.

කච්චාන, සියල්ල ඇතැ යි යන මෙය එක් අන්තයෙකි. සියල්ල නැතැ යි යන මෙය දෙවෙනි අන්තය යි. කච්චාන, ඒ මේ අන්ත දෙකට නො පැමිණ මැදුම්පිළිවෙතින් තථාගත තෙමේ දහම් දෙසයි. "අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙත්. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වෙයි. ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැන්ම වෙයි. අවිද්‍යාවගේ ම නිරවශේෂවිරාග-නිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාරනිරෝධයෙන් විඥාන-නිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ ය." කියා යි.

## 1. 2. 6.

## ධම්මකථිකසූත්‍රය

16. **සැවැත්නුවර-**

ඉක්බිති එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: වහන්ස, ධර්මකථික ය, ධර්මකථික ය යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් ධර්මකථික වේ ද?

ජරාමරණස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති, ධම්මකථිකො භික්ඛූති අලං වචනාය.

ජරාමරණස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති, ධම්මානුධම්මපටිපන්නො භික්ඛූති අලං වචනාය.

ජරාමරණස්ස චෙ භික්ඛු නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති, දිට්ඨධම්මනිබ්බාණප්පත්තො භික්ඛූති අලං වචනාය.

ජාතියා චෙ භික්ඛු – පෙ – භවස්ස චෙ භික්ඛු – උපාදානස්ස චෙ භික්ඛු – තණ්හාය චෙ භික්ඛු – වෙදනාය චෙ භික්ඛු – ඵස්සස්ස චෙ භික්ඛු – සළායතනස්ස චෙ භික්ඛු – නාමරූපස්ස චෙ භික්ඛු – විඤ්ඤාණස්ස චෙ භික්ඛු- සඞ්ඛාරානං චෙ භික්ඛු – අවිජ්ජාය චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති, ධම්මකථිකො භික්ඛූති අලං වචනාය.

[ජාතියා චෙ භික්ඛු -පෙ-] අවිජ්ජාය චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති, ධම්මානුධම්මපටිපන්නො භික්ඛූති අලං වචනාය.

[ජාතියා චෙ භික්ඛු -පෙ-] අවිජ්ජාය චෙ භික්ඛු නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති, දිට්ඨධම්මනිබ්බාණප්පත්තො භික්ඛූති අලං වචනායාති.

## 1. 2. 7.

## අචෙලකස්සපසුත්තං

17. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ**. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර- මාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො **අචෙලො කස්සපො**[1] භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො අචෙලො කස්සපො භගවන්තං එතදවොච: පුච්ඡෙය්‍යාම මයං භවන්තං ගොතමං කඤ්චිදෙව දෙසං, සචෙ නො භවං ගොතමො ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායාති.

1. අචෙලකස්සපො - සීමු

මහණෙ, ඉදින් මහණ තෙමේ ජරාමරණ පිළිබඳ ව කලකිරීම පිණිස නො ඇලීම පිණිස නැති කිරීම පිණිස දහම් දෙසා නම්, ඒ මහණ තෙමේ 'ධර්මකථික' ය යි කීමට යුතු වෙයි.

මහණ තෙමේ ජරාමරණ දෙක්හි කලකිරීම පිණිස නැති කිරීම පිණිස පිළිපන්නේ වේ නම්, ඒ මහණ තෙමේ 'ධර්මානුධර්මප්‍රතිපන්න' ය යි කීමට යුතු වෙයි.

ඉදින් මහණ තෙමේ ජරාමරණ පිළිබඳ ව කලකිරීමෙන් නො ඇලීමෙන් නැති කිරීමෙන් (කිසි ධර්මයක්) දැඩි ව නො ගෙණ මිදුනේ නම්, ඒ මහණ තෙමේ 'මේ අත්බැව්හි ම නිවණට පැමිණියේ' ය යි කීමට යුතු වෙයි.

ඉදින් මහණ තෙමේ ඉපැද්ම පිළිබඳ ව – ... – ඉදින් මහණ තෙමේ භවය පිළිබඳ ව – ඉදින් මහණ තෙමේ උපාදාන පිළිබඳ ව – ඉදින් මහණ තෙමේ තෘෂ්ණාව පිළිබඳ ව – ඉදින් මහණ තෙමේ වේදනාව පිළිබඳ ව – ඉදින් මහණ තෙමේ ස්පර්ශය පිළිබඳ ව – ඉදින් මහණ තෙමේ ෂඩායතන පිළිබඳ ව – ඉදින් මහණ තෙමේ නාමරූප පිළිබඳ ව – ඉදින් මහණ තෙමේ විඥානය පිළිබඳ ව – ඉදින් මහණ තෙමේ සංස්කාර පිළිබඳ ව – ඉදින් මහණ තෙමේ අවිද්‍යාව පිළිබඳ ව කලකිරීම පිණිස නො ඇලීම පිණිස නැති කිරීම පිණිස දහම් දෙසා නම්, ඒ මහණ තෙමේ 'ධර්මකථික' ය යි කීමට යුතු වෙයි.

ඉදින් මහණ තෙමේ ජාතිය පිළිබඳ ව ... ඉදින් මහණ තෙමේ අවිද්‍යාව පිළිබඳ ව කලකිරීම පිණිස නො ඇලීම පිණිස නැති කිරීම පිණිස පිළිපන්නේ වේ නම්, ඒ මහණ තෙමේ 'ධර්මානුධර්මප්‍රතිපන්න' ය යි කීමට යුතු වෙයි.

ඉදින් මහණ තෙමේ ජාතිය පිළිබඳ ව ... ඉදින් මහණ තෙමේ අවිද්‍යාව පිළිබඳ ව කලකිරීමෙන් නො ඇලීමෙන් නැති කිරීමෙන් (කිසි ධර්මයක්) දැඩි ව නො ගෙණ මිදුනේ වේ නම්, ඒ මහණ තෙමේ 'මේ අත්බැව්හි ම නිවණට පැමිණියේ' ය යි කීමට යුතු වෙයි.

## 1. 2. 7.

## අචෙලකාශ්‍යප සූත්‍රය

17. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැද පෙරෙව පා සිවුරු ගෙණ රජගහනුවරට පිඩු පිණිස පිවිසි සේක. අචෙලකාශ්‍යප තෙමේ වැඩම කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුර දී ම දුටුයේ ය. දැක භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී ය. සතුටු විය යුතු වූ ද, සිත් ඇලවියයුතු වූ ද කථාව කොට නිමවා එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටියා වූ අචෙලකාශ්‍යප තෙමේ භාග්‍යවතුන් වහන්සේට " ඉදින් භවත් ගෞතම තෙමේ ප්‍රශ්නයක් ප්‍රකාශ කිරීම පිණිස අපට අවකාශ කෙරේ නම්, අපි භවත් ගෞතමයන්ගෙන් කිසි යම් කරුණක් විචාරන්නෙමු " යි මෙය සැළ කෙළේ ය.

අකාලො ඛො තාව කස්සප, පඤ්හස්ස. අන්තරඝරං පවිට්ඨම්හාති. දුතියම්පි ඛො අචෙලො කස්සපො භගවන්තං එතදවොච: පුච්ඡෙය්‍යාම මයං භවන්තං ගොතමං කඤ්චිදෙව දෙසං, සචෙ නො භවං ගොතමො ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායාති. අකාලො ඛො තාව කස්සප පඤ්හස්ස, අන්තරඝරං පවිට්ඨම්හාති. තතියම්පි ඛො අචෙලො කස්සපො භගවන්තං එතදවොච: පුච්ඡෙය්‍යාම මයං භවන්තං ගොතමං කඤ්චිදෙව දෙසං, සචෙ නො භවං ගොතමො ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායාති. අකාලො ඛො තාව කස්සප පඤ්හස්ස, අන්තරඝරං පවිට්ඨම්හාති.

එවං වුත්තෙ අචෙලකස්සපො භගවන්තං එතදවොච: න ඛො පන මයං භවන්තං ගොතමං බහුදෙව පුච්ඡිතුකාමාති.

පුච්ඡ කස්සප, යදාකඞ්ඛසීති.

කින්නු ඛො භො ගොතම, සයංකතං දුක්ඛන්ති'? මා හෙවං කස්සපාති භගවා අවොච.

කිම්පන භො ගොතම, පරංකතං[1] දුක්ඛන්ති? මා හෙවං කස්සපාති භගවා අවොච.

කින්නු ඛො භො ගොතම, සයංකතඤ්ච පරකතඤ්ච දුක්ඛන්ති? මා හෙවං කස්සපාති භගවා අවොච.

කිම්පන භො ගොතම, අසයංකාරං අපරංකාරං[2] අධිච්චසමුප්පන්නං දුක්ඛන්ති? මා හෙවං කස්සපාති භගවා අවොච.

කින්නු ඛො භො ගොතම, නත්ථි දුක්ඛන්ති. න ඛො කස්සප, නත්ථි දුක්ඛං. අත්ථි ඛො කස්සප, දුක්ඛන්ති.

තෙන හි භවං ගොතමො දුක්ඛං න ජානාති න පස්සතීති? නඛ්වාහං[3] කස්සප, දුක්ඛං න ජානාමි, න පස්සාමි. ජානාමි ඛ්වාහං[4] කස්සප, දුක්ඛං, පස්සාමි ඛ්වාහං කස්සප, දුක්ඛන්ති.

'කින්නු ඛො භො ගොතම, සයංකතං දුක්ඛ'න්ති ඉති පුට්ඨො සමානො 'මා හෙවං කස්සපා'ති වදෙසි. 'කිම්පන භො ගොතම පරංකතං දුක්ඛ'න්ති ඉති පුට්ඨො සමානො 'මා හෙවං කස්සපා'ති වදෙසි. 'කින්නු ඛො භො ගොතම, සයංකතඤ්ච පරකතඤ්ච දුක්ඛ'න්ති ඉති පුට්ඨො සමානො 'මා හෙවං කස්සපා'ති වදෙසි. 'කිම්පන භො ගොතම අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛ'න්ති ඉති පුට්ඨො සමානො 'මා හෙවං කස්සපා'ති වදෙසි. 'කින්නු ඛො භො ගොතම නත්ථි දුක්ඛ'න්ති ඉති පුට්ඨො සමානො 'න ඛො කස්සප නත්ථි දුක්ඛං, අත්ථි ඛො කස්සප දුක්ඛ'න්ති වදෙසි. 'තෙන හි භවං ගොතමො දුක්ඛං න ජානාති, න පස්සතී'ති ඉති පුට්ඨො සමානො 'න ඛ්වාහං කස්සප, දුක්ඛං න ජානාමි, න පස්සාමි. ජානාමි ඛ්වාහං කස්සප දුක්ඛං, පස්සාමි ඛ්වාහං කස්සප දුක්ඛ'න්ති වදෙසි. 'ආචික්ඛතු[5] මෙ භන්තෙ භගවා දුක්ඛං, දෙසෙතු[6] මෙ භන්තෙ භගවා දුක්ඛ'න්ති.

---

1. පරංකතං - 2. අපරංකාරං 3. නඛොහං - සී. මු. සී1. 2 4. ඛොහං - සී. මු, සී. 1 2. 5. ආචික්ඛතු ච - මජසං, සතා 6. දෙසෙතු ච - මජසං, සතා.

"කාශ්‍යපය, ඇතුළුගමට පිවිසියෝ වෙමු. (එහෙයින්) ප්‍රශ්නයට තව ම කල් නො වෙයි." දෙවනු ව ද අචෙලකාශ්‍යප තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ඉදින් භවත් ගෞතම තෙමේ ප්‍රශ්නයක් ප්‍රකාශ කිරීම පිණිස අපට අවකාශ කෙරේ නම්, අපි භවත් ගෞතමයන්ගෙන් කිසි යම් කරුණක් විචාරන්නෙමු" යි මෙය සැළ කෙළේ ය. "කාශ්‍යපය, ඇතුළුගමට පිවිසියෝ වෙමු. (එහෙයින්) ප්‍රශ්නයට තව ම කල් නො වෙයි." තෙවනු ව ද අචෙල-කාශ්‍යප තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ඉදින් භවත් ගෞතම තෙමේ ප්‍රශ්නයක් ප්‍රකාශ කිරීම පිණිස අපට අවකාශ කෙරේ නම්, අපි භවත් ගෞතමයන්ගෙන් කිසි යම් කරුණක් විචාරන්නෙමු" යි මෙය සැළ කෙළේ ය. "කාශ්‍යපය, ඇතුළුගමට පිවිසියෝ වෙමු. (එහෙයින්) ප්‍රශ්නයට තව ම කල් නො වෙයි."

මෙසේ වදාළ කල්හි අචෙලකාශ්‍යප තෙමේ භාග්‍යවතුන් වහන්සේට "අපි භවත් ගෞතමයන්ගෙන් බොහෝ වූ යමක් ම විචාරණු කැමැත්තෝ නො වෙමු" යි මෙය කී ය.

"කාශ්‍යපය, යමක් කැමැතියෙහි නම් එය විචාරව."

"භවත් ගෞතමයෙනි, කිම, දුක තමා විසින් කරණ ලද්දක් ද?" "කාශ්‍යපය, එසේ නො කියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"භවත් ගෞතමයෙනි, කිම, දුක මෙරමා විසින් කරණ ලද්දක් ද?" "කාශ්‍යපය, එසේ නො කියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"භවත් ගෞතමයෙනි, කිම, දුක තමා විසිනුත් මෙරමා විසිනුත් කරණ ලද්දක් ද?" "කාශ්‍යපය, එසේ නො කියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"භවත් ගෞතමයෙනි, කිම, දුක තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ අාකස්මිකව (ඉබේ) හටගත්තක් ද?" "කාශ්‍යපය, එසේ නො කියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"භවත් ගෞතමයෙනි, කිම, දුක නැත්තේ ද?" "කාශ්‍යපය, දුක නො ම නැත්තේ ය. කාශ්‍යපය, දුක ඇත්තේ ම ය."

"එසේ නම් භවත් ගෞතම තෙමේ දුක නො දනී ද? නො දකී ද?" "කාශ්‍යපය, මම දුක නො ම නො දනිමි. නො ම නො දකිමි. කාශ්‍යපය, මම දුක දනිම් ම ය. කාශ්‍යපය, මම දුක දකිම් ම ය."

"භවත් ගෞතමයෙනි, කිම, දුක තමා විසින් කරණ ලද්දක් ද"යි මෙසේ විචාරණ ලද්දෙහි ම "කාශ්‍යපය, එසේ නො කියව"යි වදාරනෙහි ය. 'භවත් ගෞතමයෙනි, කිම, දුක මෙරමා විසින් කරණ ලද්දක් ද'යි මෙසේ විචාරණ ලද්දෙහි ම "කාශ්‍යපය එසේ නො කියව"යි වදාරනෙහි ය. 'භවත් ගෞතම-යෙනි, කිම, දුක තමා විසිනුත් මෙරමා විසිනුත් කරණ ලද්දක් ද' යි මෙසේ විචාරණ ලද්දෙහි ම "කාශ්‍යපය, එසේ නො කියව"යි වදාරනෙහි ය. 'භවත් ගෞතමයෙනි, කිම, දුක තමා විසිනුත් මෙරමා විසිනුත් නොකරණ ලද්දේ ඉබේ හටගත්තක් ද' යි මෙසේ විචාරණ ලද්දෙහි ම "කාශ්‍යපය, එසේ නො කියව" යි වදාරනෙහි ය. 'භවත් ගෞතමයෙනි, කිම, දුක නැත්තේ ද' යි මෙසේ විචාරණ ලද්දෙහි ම "කාශ්‍යපය, දුක නො ම නැත්තේ ය. කාශ්‍යපය, දුක ඇත්තේ ම ය" යි වදාරනෙහි ය. "එසේ නම් භවත් ගෞතම තෙමේ දුක නො දනී ද? දුක නො දකී ද"යි මෙසේ විචාරණ ලද්දේ ම "කාශ්‍යපය; මම දුක නො ම නො දනිමි. නො ම නො දකිමි. කාශ්‍යපය, මම දුක දනිම් ම ය. කාශ්‍යපය, මම දුක දකිම් ම ය" යි වදාරනෙහි ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට දුක කියන සේක්වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට දුක දේශනා කරණ සේක්වා."

“සො කරොති සො පටිසංවෙදියතී”ති[1] ඛො කස්සප, ආදිතො සතො “සයං කතං දුක්ඛ”න්ති ඉති වදං සස්සතං එතං පරෙති. “අඤ්ඤො කරොති අඤ්ඤො පටිසංවෙදියතී”ති ඛො කස්සප, වෙදනාභිතුන්නස්ස සතො “පරංකතං දුක්ඛ”න්ති ඉති වදං උච්ඡෙදං එතං පරෙති.

එතෙ තෙ කස්සප, උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති: අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ: සෙය්‍යථාපි භන්තෙ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය -පෙ- චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.

යො ඛො කස්සප, අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං. ආකඞ්ඛති උපසම්පදං, සො චත්තාරො මාසෙ පරිවසති. චතුන්නං මාසානං අච්චයෙන පරිවුත්ථපරිවාසං[2] ආරද්ධචිත්තා භික්ඛූ. ආකඞ්ඛමානා[3] පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය, අපි ච මෙත්ථ පුග්ගලවෙමත්තතා විදිතාති.

සචෙ භන්තෙ, අඤ්ඤතිත්ථියපුබ්බා ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛන්තා පබ්බජ්ජං, ආකඞ්ඛන්තා උපසම්පදං චත්තාරො මාසෙ පරිවසන්ති චතුන්නං මාසානං අච්චයෙන පරිවුත්ථපරිවාසෙ ආරද්ධචිත්තා භික්ඛූ ආකඞ්ඛමානා පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය, අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි, චතුන්නඤ්ච වස්සානං අච්චයෙන පරිවුත්ථපරිවාසං ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්තු උපසම්පාදෙන්තු භික්ඛුභාවායාති.[4]

අලත්ථ ඛො අචෙලො[5] කස්සපො භගවතො සන්තිකෙ පබ්බජ්ජං. අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ච පනායස්මා කස්සපො[6] එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා කස්සපො අරහතං අහොසීති.

1 පටිසංවෙදියතී - සීමු, සී 1, 2. 2. පරිවුත්ථපරිවාසං - න දිස්සතෙ මරම්මපොත්ථකෙ
3 ආකඞ්ඛමානා - න දිස්සතෙයමපි මරම්ම පොත්ථකෙ. 4. සචෙ භන්තෙ -පෙ- උපසම්පාදෙන්තු භික්ඛුභාවායාති - ඉමස්ස වාක්‍යඛණ්ඩස්ස මරම්මපොත්ථකෙ විසදිසතා දිස්සතෙ.
5. අචෙලකො කස්සපො - සී 1, 2. 6. අචෙලකස්සපො - සීමු.

කාශ්‍යප, "හේ කෙරෙයි, හේ විඳී ය"යි මුල දී ම මෙබඳු ලබ්ධි ඇති කල්හි (පසුව "දුක තමා විසින් ම කරණ ලද්දකැ"යි මෙබඳු ලබ්ධි වෙයි. එබැවින්) "දුක තමා විසින් කරණ ලද"යි මෙසේ කියන්නේ තෙල ශාශ්වතදෘෂ්ටියට පැමිණේ. කාශ්‍යප, "අනෙකෙක් කෙරෙයි, අනෙකෙක් විඳී ය"යි (මුලදී ම මෙබඳු ලබ්ධි ඇති කල්හි පසුව එයින් උපදනා උච්ඡේදදිට්ඨි සහගත) වේදනාවෙන් පෙළුනහුට ("දුක මෙරමා විසින් කරණ ලද්දකැ" යි මෙබඳු ලබ්ධි වෙයි එබැවින්) "දුක මෙරමා විසින් කරණ ලද"යි මෙසේ කියන්නේ තෙල උච්ඡේදදෘෂ්ටියට පැමිණෙයි.

කාශ්‍යප, තථාගත තෙමේ ඒ මේ දෙඅන්තයට නො පැමිණ මැදුම්පිළි-වෙතෙහි සිටියේ දහම් දෙසයි: "අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වෙයි. ... මෙසේ මේ හුදු දුක්රැසේ හට-ගැණීම වේ. අවිද්‍යාවේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් සංස්කාරනිරෝ-ධය වේ. සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ" ය යි.

මෙසේ වදාළ කල්හි අචේලකාශ්‍යප තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: "වහන්ස, ඉතා මැනැවි. වහන්ස, ඉතා මැනැවි. වහන්ස, යටිකුරු වූවක් හෝ යම් සේ උඩුකුරු කරන්නේ ද, ... ඇස් ඇත්තෝ රූප දක්නාහු ය යි එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේ ය. වහන්ස, මේ මම භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද සඞ්ඝයා ද සරණ යෙමි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබම්වා, උපසපුව ලබම්වා" යි.

කාශ්‍යප, අන්තොටු වූ විරූ යමෙක් මෙසස්නෙහි පැවිද්ද කැමති වේ ද, උපසපුව කැමති වේ ද, හෙ තෙමේ සිවුමසක් පිරිවෙසෙයි. සිවුමස් ඇවෑමෙන් සතුටු කළ සිත් ඇති භික්‍ෂූහු කැමති වන්නාහු නම් වුසු පිරිවෙස් ඇත්තහු භික්‍ෂූභාවය පිණිස පැවිදි කෙරෙත්, උපසපත් කෙරෙත්· එහෙත් මා විසින් පුද්ගලනානාත්වය දන්නාලද්දේ ය.

වහන්ස, ඉදින් අන්තොටු වූ විරූවෝ මෙසස්නෙහි පැවිද්ද කැමැත්තාහු උපසපුව කැමැත්තාහු සිවුමසක් පිරිවෙසෙද්ද, සිවුමස ඇවෑමෙන් සතුටු-කළ සිත් ඇති භික්‍ෂූහු කැමැත්තාහු නම් වුසු පිරිවෙස් ඇත්තවුන් භික්‍ෂූභාවය පිණිස පැවිදි කෙරෙද්ද, උපසපත් කෙරෙද්ද, මම සිවුවසක් පිරිවෙසෙන් නෙමි. සිවුවස ඇවෑමෙන් සතුටු සිත් ඇති භික්‍ෂූහු වුසු පිරිවෙස් ඇති මා භික්‍ෂූභාවය පිණිස පැවිදි කෙරෙත්වා, උපසපත් කෙරෙත්වා යි.

අචේලකාශ්‍යප තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලද්දේ ම ය. උපසපුව ලද්දේ ම ය. උපසපත් වූ නො බෝ කල් ඇති අචේලකාශ්‍යප ආයුෂ්මත් තෙමේ එකලා ව (ගණයා කෙරෙන්) වෙන් ව නො පමා ව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති ව නිවන් පිණිස යෙදූ සිත් ඇති ව වෙසෙනුයේ නො බෝ කලෙකින් ම යමක් පිණිස කුලපුත්‍රයෝ මැනැවින් ම ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණෙද් ද, මගබඹසර කෙළවර වූ ඒ නිරුත්තර වූ අර්හත්ත්වය මෙ ලොව්හි දී ම තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ විසුයේ ය. ඉපැද්ම ක්‍ෂීණ විය. බඹසර වැස නිමවන ලදී. කටයුතු කරණලදී. මේ අර්හත්ත්වය පිණිස කටයුතු අනෙකක් නැතැයි දැන ගත්තේ ය. ආයුෂ්මත් කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ රහතුන් අතුරෙන් එක්-තරා කෙනෙක් වූහ.

## 1. 2. 8.

## තිම්බරුකසුත්තං

18. සාවත්ථියං-

අථ ඛො තිම්බරුකො[1] පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො තිම්බරුකො පරිබ්බාජකො භගවන්තං එතදවොච:

කින්නු ඛො භො ගොතම, සයංකතං සුඛදුක්ඛන්ති? "මා හෙවං තිම්බරුකා"ති භගවා අවොච. කිම්පන භො ගොතම, පරංකතං සුඛදුක්ඛන්ති? "මා හෙවං තිම්බරුකා"ති භගවා අවොච. කින්නු ඛො භො ගොතම, සයංකතඤ්ච පරංකතඤ්ච සුඛදුක්ඛන්ති? "මා හෙවං තිම්බරුකා"ති භගවා අවොච. කිම්පන භො ගොතම, අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛන්ති? "මා හෙවං තිම්බරුකා"ති භගවා අවොච. කින්නු ඛො භො ගොතම, නත්ථි සුඛදුක්ඛන්ති? න ඛො තිම්බරුක නත්ථි සුඛදුක්ඛං, අත්ථි ඛො තිම්බරුක, සුඛදුක්ඛන්ති. තෙන හි භවං ගොතමො සුඛදුක්ඛං න ජානාති, න පස්සති? නඛ්වාහං තිම්බරුක, සුඛදුක්ඛං න ජානාමි, න පස්සාමි. ජානාමි ඛො අහං තිම්බරුක, සුඛදුක්ඛං. පස්සාමි ඛ්වාහං තිම්බරුක, සුඛදුක්ඛන්ති.

කින්නු ඛො භො ගොතම, "සයංකතං සුඛදුක්ඛන්ති" ඉති පුට්ඨො සමානො මා හෙවං තිම්බරුකාති වදෙසි. "කිම්පන භො ගොතම, පරංකතං සුඛදුක්ඛන්ති" ඉති පුට්ඨො සමානො මා හෙවං තිම්බරුකාති වදෙසි. "කින්නු ඛො භො ගොතම, සයංකතඤ්ච පරංකතඤ්ච සුඛදුක්ඛන්ති" ඉති පුට්ඨො සමානො මා හෙවං තිම්බරුකාති වදෙසි. "කිම්පන භො ගොතම, අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛන්ති" ඉති පුට්ඨො සමානො මා හෙවං තිම්බරුකාති වදෙසි. "කින්නු ඛො භො ගොතම, නත්ථි සුඛදුක්ඛන්ති" ඉති පුට්ඨො සමානො න ඛො තිම්බරුක, නත්ථි සුඛදුක්ඛං, අත්ථි ඛො තිම්බරුක, සුඛදුක්ඛන්ති වදෙසි. "තෙන හි භවං ගොතමො සුඛදුක්ඛං න ජානාති න පස්සතීති" ඉති පුට්ඨො සමානො 'න ඛ්වාහං තිම්බරුක, සුඛදුක්ඛං න ජානාමි, න පස්සාමි. ජානාමි ඛ්වාහං තිම්බරුක, සුඛදුක්ඛං, පස්සාමි ඛ්වාහං තිම්බරුක, සුඛදුක්ඛ'න්ති වදෙසි. ආචික්ඛතු ච මෙ භවං ගොතමො සුඛදුක්ඛං. දෙසෙතු ච[2] මෙ භවං ගොතමො සුඛදුක්ඛන්ති.

"සා වෙදනා, සො වෙදියතී"ති ඛො තිම්බරුක, ආදිතො සතො "සයංකතං සුඛදුක්ඛ"න්ති එවම්පහං[3] න වදාමි. අඤ්ඤා වෙදනා "අඤ්ඤො වෙදියතී"ති ඛො තිම්බරුක, වෙදනාභිතුන්නස්ස සතො "පරංකතං සුඛදුක්ඛ"න්ති, එවම්පහං[3] න වදාමි.

---

1. තිම්බරුකෙඛා. සයා. 2. ච - ක දිස්සතෙ සීමු - පොත්ථකෙ 3 එවම්පාහං - මජසං, සයා.

## 1. 2. 8.

## තිම්බරුකසූත්‍රය

18. **සැවැත්නුවර-**

ඉක්බිති **තිම්බරුක** පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී ය. සතුටු විය යුතු සිහි කටයුතු කතාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් තිම්බරුක පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය:

භවත් ගෞතමයෙනි, කිමෙක් ද, සුවදුක් තමා විසින් කරණ ලද ද? තිම්බරුක, "එසේ නො කියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. භවත් ගෞතමයෙනි, කිමෙක් ද, සුවදුක් මෙරමා විසින් කරණ ලද ද? තිම්බරුක, "එසේ නො කියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. භවත් ගෞතමයෙනි, කිමෙක් ද, සුවදුක් තමා විසිනුත් මෙරමා විසිනුත් කරණ ලද ද? තිම්බරුක, "එසේ නො කියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. භවත් ගෞතමයෙනි, කිමෙක් ද, තමා විසිනුත් මෙරමා විසිනුත් නො කරණ ලද්දේ, ඉබේ හට ගත්තේ ද? තිම්බරුක, "එසේ නො කියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. භවත් ගෞතමයෙනි, කිමෙක් ද, සුවදුක් නැත්තේ ද? තිම්බරුක, සුවදුක් නැත්තේ නො වේ. තිම්බරුක, සුවදුක් ඇත්තේ ම ය. එසේ නම් භවත් ගෞතම තෙමේ සුවදුක් නො දනී ද, නො දකී ද? තිම්බරුක, මම සුවදුක් නොම නො දනිමි. නො ම නො දකිමි. තිම්බරුක, මම සුවදුක් දනිමි ම ය. තිම්බරුක, මම සුවදුක් දකිමි ම ය.

"භවත් ගෞතමයෙනි, කිමෙක් ද, සුවදුක් තමා විසින් කරණ ලද ද"යි මෙසේ විචාරණ ලද්හු "තිම්බරුක, එසේ නො කියව"යි කියහු. "භවත් ගෞතමයෙනි, කිමෙක් ද, සුවදුක් මෙරමා විසින් කරණ ලද ද"යි මෙසේ විචාරණ ලද්හු "තිම්බරුක, එසේ නො කියව" යි කියහු. "භවත් ගෞතමයෙනි, කිමෙක් ද, සුවදුක් තමා විසිනුත් මෙරමා විසිනුත් කරණ ලද ද"යි මෙසේ විචාරණ ලද්හු "තිම්බරුක, එසේ නො කියව" යි කියහු. "භවත් ගෞතමයෙනි, කිමෙක් ද, සුවදුක් තමා විසිනුත් මෙරමා විසිනුත් නොකරණ ලද්දේ ඉබේ හට ගත්තේ ද" යි මෙසේ විචාරණ ලද්හු "තිම්බරුක, එසේ නොකියව"යි කියහු. "භවත් ගෞතමයෙනි, කිමෙක් ද, සුවදුක් නැත්තේ ද"යි මෙසේ විචාරණ ලද්හු "තිම්බරුක, සුවදුක් නො ම නැත්තේ ය. තිම්බරුක, සුවදුක් ඇත්තේ ම ය"යි කියහු. "එසේ නම් භවත් ගෞතම තෙමේ සුවදුක් නො දනී ද, නො දකී ද"යි මෙසේ විචාරණ ලද්හු "තිම්බරුක, මම සුවදුක් නො ම නො දනිමි. නො ම නො දකිමි. තිම්බරුක, මම සුවදුක් දනිමි ම ය. මම සුවදුක් දකිමි ම ය"යි කියහු. භවත් ගෞතමයන් වහන්සේ මට සුවදුක් වදාරණ සේක්වා, දේශනා කරණ සේක්වා.

තිම්බරුක, "ඕ වේදනා ය. හේ විඳී ය"යි මුල දී ම මේ ලබ්ධිය ඇති කල්හි (පසුව "සුවදුක් තමා විසින් කරණ ලද"යි මෙබඳු ලබ්ධි වෙයි. එබැවින්) සුවදුක් තමා විසින් කරණ ලද" යි මෙසේ මම නො කියමි. තිම්බරුක, "වෙදනාව අනෙකක, අනෙකෙක් විඳී ය"යි (මුලදී ම මේ ලබ්ධිය ඇති කල්හි පසුව එයින් උපදනා උච්ඡෙදදිට්ඨිසහගත) "වෙදනාවෙන් පෙළුනහුට (සුවදුක් මෙරමා විසින් කරණ ලද" යි මෙබඳු ලබ්ධි වෙයි. එබැවින්) සුවදුක් මෙරමා විසින් කරණ ලද" යි මෙසේත් මම නො කියමි.

එතෙ තෙ තිම්බරුක, උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති: "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං. -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො. -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති.

එවං වුත්තෙ තිම්බරුකො පරිබ්බාජකො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- එසාහං[1] භවන්තං[2] ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 1. 2. 9.

## බාලපණ්ඩිතසුත්තං

19. සාවත්ථියං-

අවිජ්ජානීවරණස්ස භික්ඛවෙ, බාලස්ස තණ්හාය සම්පයුත්තස්ස[3] එවමයං කායො සමුදාගතො. ඉති අයඤ්චෙව කායො බහිද්ධා ච නාමරූපං ඉත්ථෙතං ද්වයං ද්වයං පටිච්ච ඵස්සො, සළෙවායතනානි යෙහි ඵුට්ඨො බාලො සුඛදුක්ඛං පටිසංවෙදියති එතෙසං වා අඤ්ඤතරෙන.

අවිජ්ජානීවරණස්ස භික්ඛවෙ, පණ්ඩිතස්ස තණ්හාය සම්පයුත්තස්ස එවමයං කායො සමුදාගතො. ඉති අයඤ්චෙව කායො බහිද්ධා ච නාමරූපං ඉත්ථෙතං ද්වයං ද්වයං පටිච්ච ඵස්සො. සළෙවායතනානි යෙහි ඵුට්ඨො පණ්ඩිතො සුඛදුක්ඛං පටිසංවෙදියති එතෙසං වා අඤ්ඤතරෙන.

තත්‍ර හි[4] භික්ඛවෙ, කො විසෙසො කො අධිප්පායො[5] කිං නානාකරණං පණ්ඩිතස්ස බාලෙනාති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා, භගවන්නෙත්තිකා භගවම්පටිසරණා. සාධු වත භන්තෙ, භගවන්තඤ්ඤෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති. තෙන හි භික්ඛවෙ, සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. "එවම්භන්තෙ"ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

යාය ච භික්ඛවෙ, අවිජ්ජාය නිවුතස්ස බාලස්ස යාය ච තණ්හාය සම්පයුත්තස්ස අයං කායො සමුදාගතො, සා චෙව අවිජ්ජා බාලස්ස අප්පහීනා. සා ච තණ්හා අපරික්ඛීණා. තං කිස්ස හෙතු? න හි භික්ඛවෙ,[6] බාලො අචරි බ්‍රහ්මචරියං සම්මා දුක්ඛක්ඛයාය. තස්මා බාලො කායස්ස භෙදා කායූපගො හොති. සො කායූපගො සමානො න පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

---

1. එසාහං භන්තෙ]- සයා, සීමු. 2. භගවන්තං - කාළුවි. 3. සංයුත්තස්ස - සයා.
4. තත්‍ර හි - ඉති න දිස්සතෙ සයා, මජ්ස 5. අධිපයාසො - මජ්සං. අධිප්පායාසො - සයා.
6. න භික්ඛවෙ - මජ්සං.

තිම්බරුක, තථාගත තෙමේ ඒ මේ අන්ත දෙකට නො පැමිණ මැදුම් පිළිවෙතින් දහම් දෙසයි: "අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙත්. සංස්කාර-ප්‍රත්‍යයයෙන් විඥානය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ. මේ අවිද්‍යාවේ ම නිරවශේෂ විරාගනිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ. සංස්කාර-නිරෝධයෙන් විඥානනිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ" යි.

මෙසේ වදාළ කල්හි තිම්බරුක පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනව ... ඒ මම භවත් ගෞතමයන් වහන්සේත් ධර්මයත් භික්ෂුසඞ්ඝයාත් ශරණ යමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් ශරණ ගිය මා උපාසකයකු කොට දරණසේක්වා යි

## 1. 2. 9.

## බාලපණ්ඩිත සූත්‍රය

19. සැවැත්නුවර-

මහණෙනි, අවිද්‍යානීවරණ ඇති තෘෂ්ණාවෙන් යුක්ත වූ බාලයාගේ මේ කය මෙසේ හටගත්තේ ය. මෙසේ මේ කය ද බාහිර නාමරූප ද මේ දෙකක් දෙකක් හේතු කොට ස්පර්ශය වේ. ආයතනයෝ සයෙකි. මෙයින් හෝ මෙයින් එක්තරා එකකින් හෝ පහස්නා ලද බාල තෙමේ සුවදුක් විඳී.

මහණෙනි, අවිද්‍යානීවරණ ඇති තෘෂ්ණාවෙන් යුක්ත වූ පණ්ඩිතයාගේ මේ කය මෙසේ හටගත්තේ ය මෙසේ මේ කය ද බාහිර නාමරූප ද මේ දෙකක් දෙකක් හේතු කොට ස්පර්ශය වේ. ආයතනයෝ සයෙකි. මෙයින් හෝ මෙයින් එක්තරා එකකින් හෝ පහස්නා ලද පණ්ඩිත තෙමේ සුවදුක් විඳී.

මහණෙනි, එහි ලා බාලයා සමග පණ්ඩිතයාගේ කවර වෙසෙසෙක් ද? කිනම් වැඩි ප්‍රයෝගයෙක් ද? කුමන වෙනසෙක් දැ?යි.

වහන්ස, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට භාග්‍යවතුන් වහන්සේ නායක කොට භාග්‍යවතුන් වහන්සේ පිහිට කොට ඇත්තාහ. වහන්ස මේ දේශනාවෙහි අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහු ය යි. මහණෙනි, එසේ නම් අසව්. මැනවින් මෙනෙහි කරව්. දේශනා කරන්නෙමි. වහන්ස, එසේ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, යම් අවිද්‍යාවකින් වැසුනු යම් තෘෂ්ණාවකින් යුක්ත වූ බාලයාගේ මේ කය හටගත්තේ ද, බාලයාගේ ඒ අවිද්‍යාවත් ප්‍රහීණ නුවූවා ය. ඒ තෘෂ්ණාවත් ක්ෂීණ නුවූවා ය. කවර හෙයින යත්: මහණෙනි, බාලතෙමේ මැනැවින් දුක් ගෙවීම පිණිස බඹසර නො කෙළේ ය. එහෙයින් බාලතෙමේ කය බිඳීමෙන් (අනෙක් පටිසන්ධි) කයකට පැමිණියේ වේ. අන් කයකට පැමිණියේ ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් පරිදේවයෙන් දුකින් දොම්නසින් උපායාසයෙන් නො මිදෙයි. (සියලු) දුකින් නො මිදේ යි කියමි.

යා ච භික්ඛවෙ, අවිජ්ජාය නිවුතස්ස පණ්ඩිතස්ස යා ච තණ්හාය සම්පයුත්තස්ස අයං කායො සමුදාගතො. සා චෙව අවිජ්ජා පණ්ඩිතස්ස පහීනා. සා ච තණ්හා පරික්ඛීණා තං කිස්ස හෙතු? අචරි භික්ඛවෙ, පණ්ඩිතො බ්‍රහ්මචරියං සම්මා දුක්ඛක්ඛයාය. තස්මා පණ්ඩිතො කායස්ස භෙදා න කායූපගො හොති. සො අකායූපගො සමානො පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

අයං ඛො භික්ඛවෙ, විසෙසො අයං අධිප්පායො ඉදං නානාකරණං පණ්ඩිතස්ස බාලෙන, යදිදං බ්‍රහ්මචරියවාසොති.

## 1. 2. 10.

## පච්චය (පච්චයුප්පන්න) සුත්තං*

20. සාවත්ථියං—

පටිච්චසමුප්පාදඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි[1] පටිච්චසමුප්පන්නෙ ච ධම්මෙ. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමො ච භික්ඛවෙ, පටිච්චසමුප්පාදො? ජාතිපච්චයා භික්ඛවෙ ජරාමරණං උප්පාදා වා[2] තථාගතානං අනුප්පාදා[2] වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා. තං තථාගතො අභිසම්බුජ්ඣති, අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති[3] පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති. පස්සථාති චාහ. "ජාතිපච්චයා භික්ඛවෙ ජරාමරණං"[4] [ඉති ඛො භික්ඛවෙ, යා තත්‍ර තථතා අවිතථතා අනඤ්ඤථතා ඉදප්පච්චයතා. අයං වුච්චති භික්ඛවෙ, පටිච්චසමුප්පාදො.]

භවපච්චයා භික්ඛවෙ ජාති -පෙ- උපාදානපච්චයා භික්ඛවෙ භවො -පෙ- තණ්හාපච්චයා භික්ඛවෙ උපාදානං - වෙදනාපච්චයා භික්ඛවෙ තණ්හා- ඵස්සපච්චයා භික්ඛවෙ වෙදනා - සළායතනපච්චයා භික්ඛවෙ ඵස්සො - නාමරූපපච්චයා භික්ඛවෙ සළායතනං- විඤ්ඤාණපච්චයා භික්ඛවෙ නාමරූපං- සඞ්ඛාරපච්චයා භික්ඛවෙ විඤ්ඤාණං - අවිජ්ජාපච්චයා භික්ඛවෙ සඞ්ඛාරා උප්පාදා වා තථාගතානං අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා. තං තථාගතො අභිසම්බුජ්ඣති, අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති. පස්සථාති චාහ. "අවිජ්ජාපච්චයා භික්ඛවෙ සඞ්ඛාරා" ඉති ඛො භික්ඛවෙ, යා තත්‍ර තථතා අවිතථතා අනඤ්ඤථතා ඉදප්පච්චයතා, අයං වුච්චති භික්ඛවෙ, පටිච්චසමුප්පාදො.†

---

1 දෙසෙස්සාමි - මජසං. ස්‍යා. 2. උප්පාදෙ වා-සීමු. අනුප්පාදෙ වා සීමු. 3 පඤ්ඤපෙති- මජසං 4. ජරාමරණං -පෙ- හොතීති සීමු. ස්‍යා

* විසුද්ධිමග්ගෙ 'පටිච්චසමුප්පාද පටිච්චසමුප්පන්නධම්මදෙසනා සුත්ත'න්ති නිද්දිට්ඨං.

† ඉමස්මිං සුත්තෙ පෙය්‍යාලවසෙන සංඛිත්ත වාරෙසු සබ්බත්‍ථ 'උප්පාදාවා තථාගතානං' ආදි (පාඨොච 'ඉතිඛො භික්ඛවෙ යා තත්‍ර තථතා' ආදි පාඨො ච යථායොගං පච්චෙකං යොජෙතබ්බා.

මහණෙනි, යම් අවිද්‍යාවකින් වැසුනු යම් තෘෂ්ණාවකින් යුක්ත වූ පණ්ඩිත-යාගේ මේ කය හට ගත්තේ ද, ඒ පණ්ඩිතයාට අවිද්‍යාවත් ප්‍රහීණ වූවා ය. ඒ තෘෂ්ණාවත් ක්ෂීණ වූවා ය. කවරහෙයින යත්: මහණෙනි, පණ්ඩිත තෙමේ මැනැවින් දුක් ගෙවීම පිණිස බඹසර කෙළේ ය. එහෙයින් පණ්ඩිත තෙමේ කය බිඳීමෙන් (අනෙක්) කයකට නො පැමිණියේ වේ. හෙතෙමේ (අනෙක්) කයකට නො පැමිණියේ ම ජාතියෙන් ජරාමරණයෙන් සෝකයෙන් පරිදේව-යෙන් දුක්ඛයෙන් දෞමනස්සයෙන් උපායාසයෙන් මිදෙයි. (සියලු) දුකින් මිදේ යයි කියමි.

මහණෙනි, යම් මේ බඹසර විසීමෙක් වේ ද, මේ වනාහි බාලයා හා පණ්ඩිතයාගේ වෙසෙස යි. මේ අධිකප්‍රයොග ය යි. මේ වෙනස යි.

## 1. 2. 10.

## පච්චය (පච්චයුප්පන්න) සූත්‍රය

20. සැවැත්නුවර—

මහණෙනි, තොපට පටිච්චසමුප්පාදය ද පටිච්චසමුප්පන්න ධර්ම ද දේශනා කරන්නෙමි. එය අසවු. මැනවින් මෙනෙහි කරවු. කියන්නෙමියි. වහන්ස, එසේ යි භාග්‍යවතුන් වහන්සේට ඒ භික්ෂූහු පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, පටිච්චසමුප්පාදය කවරේ ද යත්: මහණෙනි, තථාගතයන්ගේ උත්පාදයෙහි දු තථාගතයන්ගේ අනුත්පාදයෙහි දු ජාතිප්‍රත්‍යයෙන් මරණය වේ යන ඒ ප්‍රත්‍යයස්වභාවය ධර්මස්ථිතිය (ප්‍රත්‍යයොත්පන්න කාරණය) ධර්මනියාමය (ප්‍රත්‍යයසමුත්පන්නධර්මනියමය) ඉදප්පච්චයතාව (මේ ප්‍රතීත්‍ය-සමුත්පන්නභාවය) සිටියේ ම ය. (පවත්නේ ම ය) ඒ ඉදම්ප්‍රත්‍යයතාව තථාගත තෙමේ අවබෝධ කෙරෙයි. අභිසමය කෙරෙයි. අවබෝධ කොට අභිසමය කොට දක්වයි. දේශනා කරයි. පණවයි. පිහිටුවයි. විවෘත කරයි. බෙදයි. ප්‍රකට කෙරෙයි. බලවු යි පවසයි. "මහණෙනි, ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ." මහණෙනි, මෙසේ 'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ" [යන මෙහි යම් ප්‍රත්‍යය ස්වභාවයෙක්, යම් අමෘෂාභාවයෙක්, යම් අනන්‍ය ස්වභාවයෙක්, යම් ප්‍රත්‍යයොත්පන්නභාවයෙක් ඇද් ද, මේ ප්‍රතීත්‍යසමුත්පාදය යි කියනු ලැබේ.]

මහණෙනි, භවප්‍රත්‍යයෙන් ජාතිය වේ ... මහණෙනි, උපාදාන-ප්‍රත්‍යයෙන් භවය වේ. ... මහණෙනි, තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදාන වේ ... මහණෙනි, වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ ... මහණෙනි, ස්පර්ශ-ප්‍රත්‍යයෙන් වේදනාව වේ ... මහණෙනි, ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ... මහණෙනි, නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතන වේ ... මහණෙනි, විඥාන-ප්‍රත්‍යයෙන් නාමරූප වේ....මහණෙනි, සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වේ ... මහණෙනි, තථාගතයන්ගේ උත්පාදයෙහි දු තථාගතයන්ගේ අනුත්පාද-යෙහි දු අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති යන ඒ ප්‍රත්‍යයස්වභාවය ධර්මස්ථිතිය ධර්මනියාමය ඉදප්පච්චයතාව සිටියා ම ය. තථාගත තෙමේ එය අවබෝධ කෙරෙයි. අභිසමය කෙරෙයි අවබෝධ කොට අභිසමය කොට දක්වයි. දේශනා කරයි. පණවයි. පිහිටුවයි. විවරණ - විභජන කෙරෙයි. ප්‍රකට කෙරෙයි. බලවු යි දු පවසයි. "මහණෙනි, අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති." යන මෙහි යම් ස්වභාවයෙක් අමෘෂාභාවයෙක් අනන්‍යථාභාවයෙක් ඉදම්ප්‍රත්‍යයතායෙක් ඇද් ද, මහණෙනි, මේ පටිච්ච-සමුප්පාද යයි කියනු ලැබේ.

කතමෙ ච භික්ඛවෙ, පටිච්චසමුප්පන්නා ධම්මා? ජරාමරණං භික්ඛවෙ, අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං, ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං. ජාති භික්ඛවෙ, අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා. භවො භික්ඛවෙ, අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො ඛයධම්මො වයධම්මො විරාගධම්මො නිරොධධම්මො. උපාදානං භික්ඛවෙ -පෙ- තණ්හා භික්ඛවෙ - වෙදනා භික්ඛවෙ - ඵස්සො භික්ඛවෙ- සළායතනං භික්ඛවෙ- නාමරූපං භික්ඛවෙ- විඤ්ඤාණං භික්ඛවෙ- සඞ්ඛාරා භික්ඛවෙ - අවිජ්ජා භික්ඛවෙ අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, පටිච්චසමුප්පන්නා ධම්මා.

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස අයඤ්ච පටිච්චසමුප්පාදො ඉමෙ ච පටිච්චසමුප්පන්නා ධම්මා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා[1] හොන්ති, සො වත[2] පුබ්බන්තං වා පටිධාවිස්සති[3]: "අහොසිං නු ඛො අහං අතීතමද්ධානං, න නු ඛො අහොසිං අතීතමද්ධානං, කිං නු ඛො අහොසිං අතීතමද්ධානං, කථං නු ඛො අහොසිං අතීතමද්ධානං, කිං හුත්වා කිං අහොසිං නු ඛො අහං අතීතමද්ධානන්ති"; අපරන්තං වා උපධාවිස්සති: "භවිස්සාමි නු ඛො අහං අනාගතමද්ධානං, න නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කිං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කථං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කිං හුත්වා කිං භවිස්සාමි නු ඛො අහං අනාගතමද්ධානන්ති"; එතරහි වා පච්චුප්පන්නං අද්ධානං අජ්ඣත්තං කථංකථී භවිස්සති: "අහං නු ඛොස්මි, නො නු ඛොස්මි කිං නු ඛොස්මි, කථං නු ඛොස්මි, අයං නු ඛො සත්තො කුතො[4] ආගතො, සො කුහිං ගාමී භවිස්සතී"ති නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු? තථා හි භික්ඛවෙ, අරියසාවකස්ස අයඤ්ච පටිච්චසමුප්පාදො, ඉමෙ ච පටිච්චසමුප්පන්නා ධම්මා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨාති.

## ආහාරවග්ගො දුතියො.

තස්සුද්දානං:-

ආහාරඵග්ගුණා චෙව ද්වෙ ච සමණබ්‍රාහ්මණා,
කච්චානගොත්තො ධම්මකථී අචෙලතිම්බරුකෙන ච,
බාලපණ්ඩිතතො චෙව දසමො පච්චයෙන චාති.

1 සුඋද්දිට්ඨා - සී 2. සුද්දිට්ඨා - සී 1. 2. සො ච - සතං. 3. උපධාවිස්සති - සතං. පටිධාවිස්සති - මජ්සං. 4 කුතො නු ඛො - සීමු. 5 ගමිස්සතීති - මජ්සං.

මහණෙනි, ප්‍රතීත්‍යසමුත්පන්නධර්මයෝ කවරහ යත්: මහණෙනි, ජරා-මරණ අනිත්‍ය ය. සංස්කෘත ය. හේතුප්‍රත්‍යයයෙන් හටගත්තේ ය. ක්‍ෂය ස්වභාවය ඇත්තේ ය. ව්‍යයස්වභාවය ඇත්තේ ය. විරාගස්වභාවය ඇත්තේ ය. නිරෝධස්වභාවය ඇත්තේ ය. මහණෙනි, ඉපැද්ම අනිත්‍ය ය. සංස්කෘත ය. ප්‍රතීත්‍යසමුත්පන්න ය. ක්‍ෂයධර්ම ය. ව්‍යයධර්ම ය. විරාගධර්ම ය. නිරෝධධර්ම ය. මහණෙනි, භවය අනිත්‍ය ය. සංස්කෘත ය. ප්‍රතීත්‍යසමුත්පන්න ය. ක්‍ෂයධර්ම ය. ව්‍යයධර්ම ය. විරාගධර්ම ය. නිරෝධධර්ම ය. මහණෙනි, උපාදාන ··· මහණෙනි, තෘෂ්ණාව ... මහණෙනි, වේදනාව ... මහණෙනි, ස්පර්ශය...මහණෙනි, ෂඩායතන ... මහණෙනි, නාමරූප ... මහණෙනි, විඥාන...මහණෙනි, සංස්කාරයෝ...මහණෙනි, අවිද්‍යාව අනිත්‍ය ය. සංස්කෘත ය. ප්‍රතීත්‍යසමුත්පන්න ය ක්‍ෂයධර්ම ය. ව්‍යයධර්ම ය. විරාගධර්ම ය. නිරෝධධර්ම ය. මහණෙනි, මේ ප්‍රතීත්‍යසමුත්පන්නධර්මයෝ යි කියනු ලැබෙත්.

මහණෙනි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවකයා විසින් මේ පටිච්චසමුප්පාදයත් මේ පටිච්චසමුප්පන්න ධර්මයෝත් තතු සේ සම්‍යක්ප්‍රඥායෙන් මැනැවින් දක්නා ලද්දහු වෙද්ද, හෙ තෙමේ "අතීත කාලයෙහි මම වූයෙම් දෝ? අතීත කාලයෙහි නො වූයෙම් දෝ? අතීත කාලයෙහි කවරෙක් වූයෙම් දෝ? අතීත කාලයෙහි කෙසේ වූයෙම් දෝ? අතීත කාලයෙහි මම කවරෙක් ව කවරෙක් වූයෙම් දෝ?" යි පූර්වාන්තය කරාත් දුවන්නේ ය – "මම අනාගත කාලයෙහි වන්නෙම් දෝ? අනාගත කාලයෙහි නො වන්නෙම් දෝ? අනාගත කාලයෙහි කවරෙක් වන්නෙම් දෝ? අනාගත කාලයෙහි කෙසේ වන්නෙම් දෝ? අනාගත කාලයෙහි මම කවරෙක් ව කවරෙක් වන්නෙම් දෝ?"යි අපරාන්තය කරාත් දුවන්නේ ය– දැන් වර්තමාන කාලයෙහිත් "මම වෙම් දෝ? නො වෙම් දෝ? කවරෙක් වෙම් දෝ? කෙසේ වෙම් දෝ? මේ සත්ත්වතෙමේ කොහි සිට ආයේ දෝ? හෙ තෙමේ කොහි යන්නෙක් වන්නේ දෝ?"යි තමා පිළිබඳ කෙසේ කෙසේ දැ යි පැවැති සැක ඇත්තේ වන්නේය - යන මේ කරුණ විද්‍යමාන නො වේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, ආර්‍ය්‍ය ශ්‍රාවකයා විසින් මේ පටිච්චසමුප්පාදය ද, මේ පටිච්චසමුප්පන්න ධර්මයෝ ද තතු සේ මනා නුවණින් දක්නා ලද්දහු ය. එහෙයිනි.

ආහාරවර්ගය දෙවැනි යි.

එහි උද්දානය:

ආහාර ය, ඵග්ගුණ ය, සමණබ්‍රාහමණ දෙක ය, කච්චානගොත්ත ය, ධම්මකථික ය, අචේලකය, තිම්බරුක ය, බාලපණ්ඩිත ය, දසවැනි ප්‍රත්‍යය සූත්‍රය දැ යි සූත්‍ර දශයෙකි.

# 3. දසබලවග්ගො.

## 1. 3. 1.

### දසබලසුත්තං

21. සාවත්ථියං-

දසබලසමන්නාගතො භික්ඛවෙ, තථාගතො චතූහි ච වෙසාරජ්ජෙහි සමන්නාගතො ආසභං ඨානං පටිජානාති. පරිසාසු සීහනාදං නදති. බ්‍රහ්මචක්කං පවත්තෙති: ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථංගමො.[1] ඉති වෙදනා, ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථංගමො. ඉති සඤ්ඤා, ඉති සඤ්ඤාය සමුදයො, ඉති සඤ්ඤාය අත්ථංගමො. ඉති සඞ්ඛාරා, ඉති සඞ්ඛාරානං සමුදයො, ඉති සඞ්ඛාරානං අත්ථංගමො. ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථංගමො. ඉති ඉමස්මිං සති ඉදං හොති. ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. ඉමස්මිං අසති ඉදං න හොති. ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති.

යදිදං: අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො. -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති

## 1. 3. 2.

### දුතියදසබලසුත්තං

22. සාවත්ථියං-

දසබලසමන්නාගතො භික්ඛවෙ, තථාගතො චතූහි ච වෙසාරජ්ජෙහි සමන්නාගතො ආසභං ඨානං පටිජානාති. පරිසාසු සීහනාදං නදති. බ්‍රහ්මචක්කං පවත්තෙති: ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථංගමො[1]. ඉති වෙදනා, ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථංගමො. ඉති සඤ්ඤා, ඉති සඤ්ඤාය සමුදයො, ඉති සඤ්ඤාය අත්ථංගමො ඉති සඞ්ඛාරා, ඉති සඞ්ඛාරානං සමුදයො, ඉති සඞ්ඛාරානං අත්ථංගමො. ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථංගමො. ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති.

---

1. අත්ථගමො - සී 1, 2.

# 3. දසබල වර්ගය.

## 1. 3. 1.

## දසබල සූත්‍රය.

21. සැවැත්නුවර-

මහණෙනි, දශබලයෙන් සමන්විත වූ සිවුවැදෑරුම් විශාරද බැවින් ද යුක්ත වූ තථාගත තෙමේ ශ්‍රේෂ්ඨස්ථානයට පැමිණෙයි. පිරිස්මැද සිංහනාද කෙරෙයි. බ්‍රහ්මචක්‍රය (=ධර්මචක්‍රය) පවත්වයි. (කෙසේ ද යත්:) මේ රූපය. රූපයේ හටගැන්ම මෙසේ ය. රූපයාගේ නිරෝධය මෙසේ ය. මේ වේදනාව. වේදනාවේ හටගැන්ම මෙසේ ය. වේදනාවේ නිරෝධය මෙසේ ය. මේ සංඥාව. සංඥාවේ හටගැන්ම මෙසේ ය. සංඥාවේ නිරෝධය මෙසේ ය. මේ සංස්කාර. සංස්කාරයන්ගේ හටගැන්ම මෙසේ ය. සංස්කාරයන්ගේ නිරෝධය මෙසේ ය. මේ විඥානය. විඥානයේ හටගැන්ම මෙසේ ය. විඥානයේ නිරෝධය මෙසේ ය. මෙසේ මෙය ඇති කල්හි මෙය වේ. මෙය ඉපැද්මෙන් මෙය උපදී. මෙය නැති කල්හි මෙය නො වේ. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ.

ඒ කෙසේය යත්: අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාර-ප්‍රත්‍යයයෙන් විඥානය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැන්ම වේ. අවිද්‍යාවගේ ම අශේෂවිරාගනිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාර-නිරෝධයෙන් විඥානනිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

## 1. 3. 2.

## දෙවැනි දසබල සූත්‍රය

22. සැවැත්නුවර-

මහණෙනි, දසබලයෙන් සමන්නාගත වූ සිවුවැදෑරුම් විශාරද බැවින් යුක්ත වූ තථාගත තෙමේ ශ්‍රේෂ්ඨස්ථානයට පැමිණේ. පිරිස්මැද සිංහනාද කෙරෙයි. ධර්මචක්‍ර පවත්වයි. (කෙසේ ද යත්:) මේ රූපය. රූපයේ හටගැන්ම මෙසේ ය. රූපයේ නිරෝධය මෙසේ ය. මේ වේදනාව. වේදනාවේ හටගැන්ම මෙසේ ය. වේදනාවේ නිරෝධය මෙසේ ය. මේ සංඥාව. සංඥාවේ හටගැන්ම මෙසේ ය. සංඥාවේ නිරෝධය මෙසේ ය. මේ සංස්කාරය. සංස්කාරයන්ගේ හටගැන්ම මෙසේ ය. සංස්කාරයන්ගේ නිරෝධය මෙසේ ය. මේ විඥානය. විඥානයේ හටගැන්ම මෙසේ ය. විඥානයේ නිරෝධය මෙසේ ය. මෙසේ මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය ඉපදීමෙන් මෙය උපදියි. මෙය නැති කල්හි මෙය නො වේ. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ.

යදිදං: අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

එවං ස්වාක්ඛාතො භික්ඛවෙ, මයා ධම්මො උත්තානො විවටො පකාසිතො ඡින්නපිලොතිකො. එවං ස්වාක්ඛාතෙ ඛො භික්ඛවෙ, මයා ධම්මෙ උත්තානෙ විවටෙ පකාසිතෙ ඡින්නපිලොතිකෙ අලමෙව සද්ධාපබ්බජිතෙන කුලපුත්තෙන විරියං[1] ආරභිතුං: කාමං තචො ච න්හාරු ච අට්ඨී ච අවසිස්සතු, සරීරෙ උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසත්ථාමෙන[2] පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සති.

දුක්ඛං හි භික්ඛවෙ, කුසීතො විහරති වොකිණ්ණො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි. මහන්තඤ්ච සදත්ථං පරිහාපෙති. ආරද්ධවිරියො ච ඛො භික්ඛවෙ සුඛං විහරති පවිවිත්තො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි. මහන්තඤ්ච සදත්ථං පරිපූරෙති.

න භික්ඛවෙ, හීනෙන අග්ගස්ස පත්ති හොති. අග්ගෙන ච ඛො[3] අග්ගස්ස පත්ති හොති. මණ්ඩපෙය්‍යමිදං භික්ඛවෙ, බ්‍රහ්මචරියං, සත්ථා[4] සම්මුඛීභූතො. තස්මාතිහ භික්ඛවෙ, විරියං ආරභථ අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය, අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, "එවං නො අයං අම්හාකං පබ්බජ්ජා අවඤ්ඣා[5] භවිස්සති, සඵලා සඋද්‍රයා, යෙසං[6] මයං පරිභුඤ්ජාම චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, තෙසං තෙ කාරා අම්හෙසු මහප්ඵලා භවිස්සන්ති මහානිසංසා"ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං. අත්තත්ථං වා හි භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං. පරත්ථං වා හි භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං. උභයත්ථං වා හි භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුන්ති.

## 1. 3. 3.

## උපනිසසුත්තං

23. සාවත්ථියං-

ජානතො අහං භික්ඛවෙ, පස්සතො ආසවානං ඛයං වදාමි, නො අජානතො නො අපස්සතො. කිඤ්ච භික්ඛවෙ ජානතො කිං පස්සතො ආසවානං ඛයො හොති? "ඉති රූපං ඉති රූපස්ස සමුදයො ඉති රූපස්ස අත්ථංගමො, ඉති වෙදනා -පෙ- ඉති සඤ්ඤා -පෙ- ඉති සඞ්ඛාරා -පෙ- ඉති විඤ්ඤාණං ඉති විඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථංගමොති" එවං ඛො භික්ඛවෙ ජානතො එවං පස්සතො ආසවානං ඛයො හොති.

---

1. වීරියං - මජසං. 2. පුරිසථාමෙන මජසං. 3. අග්ගෙන ච ඛො භික්ඛවෙ - මජසං.
4. සත්ථුස්ස - සීමු. 5 අවඣාතා අවඤ්ඣා - සයා. 6. යෙසඤ්ච - මජසං.

කෙසේ ය යත්: අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යය-යෙන් විඥානය වේ, ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැන්ම වේ. අවිද්‍යාවේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

මහණෙනි, මෙසේ මා විසින් ධර්මය මනාකොට දේශනා කරණලද්දේ ය. ප්‍රකට කරණලද්දේ ය. විවෘත කරණලද්දේ ය. ප්‍රකාශ කරණලද්දේ ය. සුත්-වැරහැලි ඇත්තේ ය, හෙවත් සුත්කසට ඇත්තේ ය. මහණෙනි, මෙසේ මා විසින් මොනොවට දේශනා කරණලද ප්‍රකට කරණලද විවෘත කරණලද ප්‍රකාශ කරණලද සුත්වැරහැලි ඇති ධර්මය ඇති කල්හි සැදැහැයෙන් පැවිදි වූ කුලපුත්‍ර විසින් "සිරුරෙහි සම ද නහර ද ඇට ද ඒකාන්තයෙන් ඉතිරි වේවා. මස් ලේ වියලේවා. පුරුෂ ශක්තියෙන් පුරුෂවීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් පැමිණිය යුතු ඒ යමක් වේ නම් ඊට නො පැමිණ වීර්‍ය්‍යයාගේ සිටුමෙක් (=නැවැත්මෙක්) නො වන්නේ ය" යි වැර අරඹන්නට සුදුසු ම ය.

මහණෙනි, කුසීත පුද්ගල තෙමේ පවිටු අකුසල් දහමින් ගැවසුනේ දුක සේ වෙසෙසි. මහත් වූ ද යහපත් අර්ථය පිරිහෙළයි. මහණෙනි, ඇරඹූ වැර ඇති පුගුල් තෙමේ පවිටු අකුසල් දහමින් වෙන් වූයේ සුවසේ වෙසෙයි. මහත් වූ ද යහපත් අර්ථය සම්පූර්ණ කෙරෙයි (රහත් බවට පැමිණෙයි)

මහණෙනි, හීන වූ ශ්‍රද්ධාදියෙන් අග්‍ර වූ රහත් බවට පැමිණීමෙක් නො වේ. අග්‍ර වූ ශ්‍රද්ධාදියෙන් අග්‍ර වූ රහත්බවට පැමිණීම වේ. මහණෙනි, මේ බඹසර පහන් මිහිරි පැනක් බඳු ය. ශාස්තෲන් වහන්සේ හමු වූ සේක. මහණෙනි, එහෙයින් නො පැමිණි ධර්මයට පැමිණීම පිණිස අවබෝධ නො කළ ධර්ම අවබෝධ කිරීම පිණිස පසක් නො කළ ධර්මය පසක් කිරීම පිණිස වැර අරඹවු: "මෙසේ අපගේ පැවිද්ද නො සිස් වන්නේ ය. සඵල වන්නේ ය. වැඩීම් සහිත වන්නේ ය. අපි යම් කෙනකුන්ගේ සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර වළඳමෝ නම් ඔවුන්ගේ ඒ සත්කාරයෝ අප විෂයයෙහි මහත්ඵල මහානිසංස වන්නාහ"යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු ය. මහණෙනි, ආත්මාර්ථය අපේක්ෂා කරන්නහු විසින් ද නො පමා ව සියලු කටයුතු සපයන්නට සුදුසු ම ය. පරාර්ථය අපේක්ෂා කරන්නහු විසිනුදු නො පමාව සියලු කටයුතු සපයන්නට සුදුසු ම ය. මහණෙනි, උභයාර්ථය අපේක්ෂා කරන්නහු විසිනුදු නො පමා ව සියලු කටයුතු සපයන්නට සුදුසු ම ය.

## 1. 3. 3.

## උපනිස සූත්‍රය

23 සැවැත්නුවර-

මහණෙනි, මම දන්නහුට දක්නහුට ආස්‍රවක්ෂය කියමි. නො දන්නහුට නො දක්නහුට නො වේ. මහණෙනි, කුමක් දන්නහුට කුමක් දක්නහුට ආස්‍රවක්ෂය වේ ද? "මේ රූපය. රූපයේ හටගැන්ම මෙසේ ය. රූපයේ නිරෝ-ධය මෙසේ ය. මේ වේදනා ය ... මේ සංඥා ය. ... මේ සංස්කාර ය. ... මේ විඥානය ය. විඥානයේ හටගැන්ම මෙසේ ය. විඥානයේ නිරෝධය මෙසේ ය"යි මහණෙනි මෙ සේ දන්නහුට මෙසේ දක්නහුට ආස්‍රවක්ෂය වේ.

යම්පිස්ස[1] තං භික්ඛවෙ, ඛයස්මිං ඛයෙ ඤාණං, තම්පි සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ ඛයෙ ඤාණස්ස උපනිසා? විමුත්තීතිස්ස වචනීයං. විමුත්තිම්පහං[2] භික්ඛවෙ සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, විමුත්තියා උපනිසා? විරාගොතිස්ස වචනීයං. විරාගම්පහං[3] භික්ඛවෙ සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, විරාගස්ස උපනිසා? නිබ්බිදාතිස්ස වචනීයං. නිබ්බිදම්පහං[4] භික්ඛවෙ සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, නිබ්බිදාය උපනිසා? යථාභූතඤාණදස්සනන්තිස්ස වචනීයං.

යථාභූතඤාණදස්සනම්පහං[5] භික්ඛවෙ සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, යථාභූතඤාණදස්සනස්ස උපනිසා? සමාධීතිස්ස වචනීයං. සමාධිම්පහං භික්ඛවෙ සඋපනිසං වදාමි. නො අනුපනිසං. කා ච භික්ඛවෙ, සමාධිස්ස උපනිසා? සුඛන්තිස්ස වචනීයං. සුඛම්පහං භික්ඛවෙ සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, සුඛස්ස උපනිසා ? පස්සද්ධීතිස්ස වචනීයං. පස්සද්ධිම්පහං භික්ඛවෙ සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, පස්සද්ධියා උපනිසා? පීතීතිස්ස වචනීයං. පීතිම්පහං භික්ඛවෙ සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ පීතියා උපනිසා? පාමුජ්ජන්තිස්ස වචනීයං. පාමුජ්ජම්පහං භික්ඛවෙ සඋපනිසං වදාමි. නො අනුපනිසං.

කා ච භික්ඛවෙ, පාමුජ්ජස්ස උපනිසා? සද්ධාතිස්ස වචනීයං. සද්ධම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, සද්ධාය උපනිසා? දුක්ඛන්තිස්ස වචනීයං දුක්ඛම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, දුක්ඛස්ස උපනිසා? ජාතීතිස්ස වචනීයං. ජාතිම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, ජාතියා උපනිසා? භවොතිස්ස වචනීයං. භවම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, භවස්ස උපනිසා? උපාදානන්තිස්ස වචනීයං. උපාදානම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, උපාදානස්ස උපනිසා ? තණ්හාතිස්ස වචනීයං. තණ්හම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, තණ්හාය උපනිසා ? වෙදනාතිස්ස වචනීයං. වෙදනම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, වෙදනාය උපනිසා? ඵස්සොතිස්ස වචනීයං. ඵස්සම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං.

1. යම්පි - සයා 2. විමුත්තිම්පාහං - මජසං. 3. විරාගම්පාහං - මජසං. 4. නිබ්බිදම්පාහං - මජසං 5. දස්සනම්පාහං - මජසං.

මහණෙනි, ආස්‍රවක්‍ෂය වූ කල්හි අර්හත්ඵලසඞ්ඛ්‍යාත ක්‍ෂයයෙහි යම් ඒ ප්‍රත්‍යවේක්‍ෂාඥානයෙක් වන්නේ ද, එය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, ක්‍ෂයඥානයෙහි ප්‍රත්‍යය කුමක් ද? (අර්හත්ඵල) විමුක්තිය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම විමුක්තිය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, විමුක්තියට ප්‍රත්‍යය කුමක් ද? විරාගය (මාර්ගය) යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම විරාගය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, විරාගයට ප්‍රත්‍යය කුමක් ද? නිර්වේදය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, නිර්වේදය ද ප්‍රත්‍යය සහිත යයි මම කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, නිර්වේදයට ප්‍රත්‍යය කුමක් ද? යථාභූත-ඥානදර්ශනය යි කිය යුතු වන්නේ ය.

මහණෙනි, යථාභූතඥානදර්ශනය ද ප්‍රත්‍යය සහිත ය යි මම කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, යථාභූතඥානදර්ශනයට ප්‍රත්‍යය කුමක් ද? සමාධිය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම සමාධිය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, සමාධියට ප්‍රත්‍යය කුමක් ද? සුඛය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම සුඛය ද ප්‍රත්‍යය සහිත යයි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, සුඛයට ප්‍රත්‍යය කුමක් ද? පස්සද්ධි ය යි කියයුතු වන්නේ ය. මහණෙනි, මම පස්සද්ධිය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, පස්සද්ධියට ප්‍රත්‍යය කුමක් ද? ප්‍රීතිය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම ප්‍රීතිය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, ප්‍රීතියට ප්‍රත්‍යය කුමක් ද? ප්‍රාමොද්‍යය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම ප්‍රාමොද්‍යය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි.

මහණෙනි, ප්‍රාමොද්‍යයට ප්‍රත්‍යය කුමක් ද? ශ්‍රද්ධාව යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම ශ්‍රද්ධාව ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, ශ්‍රද්ධාවට ප්‍රත්‍යය කුමක් ද? දුඃඛය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම දුඃඛය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි මහණෙනි, දුඃඛයට ප්‍රත්‍යය කුමක් ද? ජාතිය යි කියයුතු වන්නේ ය. මහණෙනි, මම ජාතිය ද ප්‍රත්‍යය සහිත යයි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, ජාතියට ප්‍රත්‍යය කුමක් ද? භවය යි කිය යුතු වන්නේය. මහණෙනි, මම භවය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, භවයට ප්‍රත්‍යය කුමක් ද? උපාදානය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම උපාදානය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, උපාදානයට ප්‍රත්‍යය කුමක් ද? තෘෂ්ණාව යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම තෘෂ්ණාව ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, තෘෂ්ණාවට ප්‍රත්‍යය කුමක් ද? වේදනාව යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම වේදනාව ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, වේදනාවට ප්‍රත්‍යය කුමක් ද? ස්පර්ශය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම ස්පර්ශය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි.

කා ච භික්ඛවෙ, ඵස්සස්ස උපනිසා? සළායතනන්තිස්ස වචනීයං. සළායතනම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, සළායතනස්ස උපනිසා? නාමරූපන්තිස්ස වචනීයං. නාමරූපම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, නාම-රූපස්ස උපනිසා? විඤ්ඤාණන්තිස්ස වචනීයං. විඤ්ඤාණම්පහං භික්ඛවෙ, සඋපනිසං වදාමි, නො අනුපනිසං. කා ච භික්ඛවෙ, විඤ්ඤාණස්ස උපනිසා? සඞ්ඛාරාතිස්ස වචනීයං. සඞ්ඛාරෙපහං භික්ඛවෙ, සඋපනිසෙ වදාමි, නො අනුපනිසෙ. කා ච භික්ඛවෙ,සඞ්ඛාරානං උපනිසා? අවිජ්ජාතිස්ස වචනීයං.

ඉති ඛො භික්ඛවෙ, අවිජ්ජූපනිසා සඞ්ඛාරා. සඞ්ඛාරූපනිසං විඤ්ඤාණං. විඤ්ඤාණූපනිසං නාමරූපං. නාමරූපූපනිසං සළායතනං. සළායතනූපනිසො ඵස්සො. ඵස්සූපනිසා වෙදනා වෙදනූපනිසා තණ්හා. තණ්හූපනිසං උපාදානං. උපාදානූපනිසො භවො. භවූපනිසා ජාති. ජාතූපනිසං දුක්ඛං. දුක්ඛූපනිසා සද්ධා. සද්ධූපනිසං පාමුජ්ජං. පාමුජ්ජූපනිසා පීති. පීතූපනිසා පස්සද්ධි. පස්සද්ධූපනිසං සුඛං. සුඛූපනිසො සමාධි. සමාධූපනිසං යථාභූතඤාණදස්සනං යථාභූතඤාණදස්සනූපනිසා නිබ්බිදා. නිබ්බිදූපනිසො විරාගො. විරාගූපනිසා විමුත්ති. විමුත්තූපනිසං ඛයෙ ඤාණං.

සෙය්‍යථාපි භික්ඛවෙ, උපරි පබ්බතෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ තං උදකං යථානින්නං පවත්තමානං පබ්බතකන්දර පදරසාඛා පරිපූරෙති, පබ්බතකන්දර පදරසාඛා පරිපූරා කුසොබ්භෙ[1]. පරිපූරෙන්ති, කුසොබ්භා පරිපූරා මහාසොබ්භෙ පරිපූරෙන්ති, මහාසොබ්භා පරිපූරා කුන්නදියො පරිපූරෙන්ති, කුන්නදියො පරිපූරායො මහානදියො පරිපූරෙන්ති, මහානදියො පරිපූරායො මහාසමුද්දං[2] පරිපූරෙන්ති.

එවමෙව ඛො භික්ඛවෙ, අවිජ්ජූපනිසා සඞ්ඛාරා, සඞ්ඛාරූපනිසං විඤ්ඤාණං. විඤ්ඤාණූපනිසං නාමරූපං. නාමරූපූපනිසං සළායතනං. සළායතනූපනිසො ඵස්සො. ඵස්සූපනිසා වෙදනා. වෙදනූපනිසා තණ්හා. තණ්හූපනිසං උපාදානං. උපාදානූපනිසො භවො. භවූපනිසා ජාති. ජාතූපනිසං දුක්ඛං. දුක්ඛූපනිසා සද්ධා. සද්ධූපනිසං පාමොජ්ජං. පාමොජ්ජූපනිසා පීති. පීතූපනිසා පස්සද්ධි. පස්සද්ධූපනිසං සුඛං. සුඛූපනිසො සමාධි. සමාධූපනිසං යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනූපනිසා නිබ්බිදා. නිබ්බිදූපනිසො විරාගො. විරාගූපනිසා විමුත්ති. විමුත්තූපනිසං ඛයෙ ඤාණන්ති.

1 කුසුබ්භෙ - ස්‍යා - සීමු, සී 1, 2. 2. මහාසමුද්දං සාගරං - සී 1, 2.

මහණෙනි, ස්පර්ශයට ප්‍රත්‍යය කුමක් ද? ෂඩායතනය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම ෂඩායතනය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, ෂඩායතනයට ප්‍රත්‍යය කුමක් ද? නාමරූප යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම නාමරූප ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, නාමරූපයට ප්‍රත්‍යය කුමක් ද? විඥානය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, මම විඥානය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, විඥානයට ප්‍රත්‍යය කුමක් ද? සංස්කාර ය යි කිය යුතු වන්නේ ය. මහණෙනි, සංස්කාර ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. ප්‍රත්‍යය රහිත ය යි නො කියමි. මහණෙනි, සංස්කාරයන්ට ප්‍රත්‍යය කුමක් ද? අවිද්‍යාව යි කිය යුතු වන්නේ ය.

මහණෙනි, මෙසේ සංස්කාරයෝ අවිද්‍යාව ප්‍රත්‍යය කොට ඇත්තාහ. විඥානය සංස්කාර ප්‍රත්‍යය කොට ඇත්තේ ය. නාමරූප විඥානය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ෂඩායතන නාමරූප ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ස්පර්ශය ෂඩායතන ප්‍රත්‍යය කොට ඇත්තේ ය. වේදනාව ස්පර්ශය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. තෘෂ්ණාව වේදනාව ප්‍රත්‍යය කොට ඇත්තේ ය උපාදාන තෘෂ්ණාව ප්‍රත්‍යය කොට ඇත්තේ ය. භවය උපාදාන ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ජාතිය භවය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. දුඃඛය ජාතිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ශ්‍රද්ධාව දුඃඛය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ප්‍රමොද්‍යය ශ්‍රද්ධාව ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ප්‍රීතිය ප්‍රමොද්‍යය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. පස්සද්ධිය ප්‍රීතිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. සුඛය පස්සද්ධිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. සමාධිය සුඛය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. යථාභූතඥානදර්ශනය සමාධිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. නිර්වේදය යථාභූතඥානදර්ශනය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. විරාගය නිර්වේදය ප්‍රත්‍යය කොට ඇත්තේය. විමුක්තිය විරාගය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ප්‍රත්‍යවෙක්ෂාඥානය විමුක්තිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය,

මහණෙනි, කඳුමුදුනක මහත් දියබිඳු ඇති වැස්ස වස්නා කල්හි ඒ දිය පහත් බිම අනුව පවත්නේ කඳු බෑවුම් පැලිවිවර හා කුඩා දිය අගල් යම් සේ පුරවා ද, කඳුබෑවුම් පැලිවිවර සහ කුඩා දිය අගල් පිරුණාහු කුඩා වළවල් පුරවත් ද, කුඩා වළවල් පිරුණාහු මහ වළවල් පුරවත් ද, මහවළවල් පිරුණාහු කුඩා ගඞ්ගා පුරවත් ද, කුඩා ගඞ්ගා පිරුණාහු මහාගඞ්ගා පුරවත් ද, මහාගඞ්ගා පිරුණාහු මහසමුදුර පුරවත් ද,

මහණෙනි, එපරිද්දෙන් ම සංස්කාරයෝ අවිද්‍යාව ප්‍රත්‍යය කොට ඇත්තාහ. විඥානය සංස්කාර ප්‍රත්‍යය කොට ඇත්තේ ය. නාමරූප විඥානය ප්‍රත්‍යය කොට ඇත්තේ ය ෂඩායතන නාමරූප ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ස්පර්ශය ෂඩායතන ප්‍රත්‍යය කොට ඇත්තේ ය. වේදනාව ස්පර්ශය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. තෘෂ්ණාව වේදනාව ප්‍රත්‍යය කොට ඇත්තේ ය. උපාදාන තෘෂ්ණාව ප්‍රත්‍යය කොට ඇත්තේ ය. භවය උපාදාන ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ජාතිය භවය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. දුඃඛය ජාතිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය ශ්‍රද්ධාව දුඃඛය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ප්‍රමොද්‍යය ශ්‍රද්ධාව ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ප්‍රීතිය ප්‍රමොද්‍යය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. පස්සද්ධිය ප්‍රීතිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය සුඛය පස්සද්ධිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. සමාධිය සුඛය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. යථාභූත-ඥානදර්ශනය සමාධිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. නිර්වේදය යථාභූතඥාන-දර්ශනය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. විරාගය නිර්වේදය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. විමුක්තිය විරාගය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ප්‍රත්‍යවෙක්ෂා-ඥානය විමුක්තිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය.

## 1. 3. 4.

## අඤ්ඤතිත්ථියසුත්තං

24. **රාජගහෙ**-

අථ ඛො ආයස්මා **සාරිපුත්තො** පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය **රාජගහං** පිණ්ඩාය පාවිසි. අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස එතදහොසි: අතිප්පගො ඛො තාව රාජගහෙ පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සාරිපුත්තං තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එතදවොචුං:

සන්තාවුසො සාරිපුත්ත, එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති. සන්ති පනාවුසො සාරිපුත්ත, එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා පරංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති. සන්තාවුසො සාරිපුත්ත, එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතඤ්ච පරංකතඤ්ච දුක්ඛං පඤ්ඤපෙන්ති. සන්ති පනාවුසො සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති. ඉධ පනාවුසො සාරිපුත්ත, සමණො ගොතමො කිංවාදී, කිමක්ඛායී? කථං බ්‍යාකරමානා ච මයං වුත්තවාදිනො චෙව සමණස්ස ගොතමස්ස අස්සාම? න ච සමණං ගොතමං අභූතෙන අබ්භාචික්ඛෙය්‍යාම? ධම්මස්ස චානුධම්මං[1] බ්‍යාකරෙය්‍යාම න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යාති?

පටිච්චසමුප්පන්නං ඛො ආවුසො දුක්ඛං වුත්තං භගවතා. කිම්පටිච්ච? ඵස්සං පටිච්ච. ඉති වදං වුත්තවාදී චෙව භගවතො අස්ස. න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛෙය්‍ය ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍ය. න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍ය.

තත්‍ර ආවුසො යෙ තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා. යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා පරංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා. යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතඤ්ච පරංකතඤ්ච දුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා. යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා.

---

1. ධම්මස්ස අනුධම්මං සී. මු.

## 1. 3. 4.

## අඤ්ඤතිත්ථිය සූත්‍රය

24. **රජගහනුවර-**

ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පෙරවරු හැඳ පෙරව පා සිවුරු ගෙණ රජගහනුවරට පිඩු පිණිස පිවිසි සේක. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට, “රජගහ නුවර පිඩු පිණිස හැසිරීමට ඉතා අලුයම මම අන්තොටු පිරිවැජ්ජන්ගේ අරම කරා එළඹෙන්නෙම් නම් ඉතා යෙහෙකැ”යි මේ අදහස පහළ විය. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අන්තොටු පිරිවැජ්ජන්ගේ අරම කරා එළැඹියහ. එළැඹ ඒ අන්තොටු පිරිවැජ්ජන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන්නා වූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ඒ අන්තොටු පිරිවැජ්ජෝ මෙය කීවාහු ය:

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කම්වාදී වූ ඇතැම් මහණබමුණෝ ඇත්තාහ. ඔහු දුක තමා විසින් කරණ ලද්දේ ය යි පණවත්. ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, කම්වාදී වූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. ඔහු දුක මෙරමා විසින් කරණ ලද්දේ ය යි පණවත්. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කම්වාදී වූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. ඔහු දුක තමා විසිනුත් මෙරමා විසිනුත් කරණ ලද යි පණවත්. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි. කම්වාදී වූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. ඔහු දුක තමා විසිනුත් මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ආකස්මිකව (ඉබේ) හට ගත්තේ ය යි පණවත්. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, මෙහි ලා මහණ ගොයුම් තෙමේ කිනම් වාද ඇත්තේ ද, කුමක් කියන සුලු වූයේ ද, කෙසේ විසඳන්නා වූ අපි මහණ ගොයුම්හු විසින් කියන ලද්දක් කියන්නමෝ ද? මහණ ගොයුම්හට බොරුවෙන් නො ම අබිබවා කියන්නමෝ ද? දහමට ද අනුදහමක් පවසන්නමෝ ද? කරුණු සහිත කිසියම් වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නොම පැමිණෙන්නේ ද’යි.

ඇවැත්නි, දුක ප්‍රත්‍යයයෙන් හට ගත්තෙකැ යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලදී. කුමක් ප්‍රත්‍යය කොට ද? ස්පර්ශය ප්‍රත්‍යය කොට ය. මෙසේ කියන්නේ භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නේ වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් නො ද අබිබවා කියන්නේ ය. දහමට ද අනුදහමක් පවසන්නේ ය. කරුණු සහිත කිසියම් වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නො ද පැමිණෙන්නේ ය.

ඇවැත්නි, කම්වාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙක් දුක තමා විසින් කරණ ලද්දේ ය යි පණවත් ද, එ ද ස්පර්ශප්‍රත්‍යයෙනි. කම්වාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙකුත් දුක මෙරමා විසින් කරණ ලද යි පණවද් ද, එ ද ස්පර්ශප්‍රත්‍යයෙනි. කම්වාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙකුත් දුක තමා විසිනුදු මෙරමා විසිනුදු කරණ ලද යි පණවත් ද, එ ද ස්පර්ශප්‍රත්‍යයෙනි. කම්වාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙකුත් දුක තමා විසිනුත් මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ආකස්මිකව හටගත්තේ ය යි පණවද් ද, එ ද ස්පර්ශප්‍රත්‍යයෙනි.

තත්‍ර ආවුසො යෙ තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති[1] නෙතං ඨානං විජ්ජති. යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා පරංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතඤ්ච පරංකතඤ්ච දුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජතීති.

අස්සොසි ඛො ආයස්මා ආනන්දො, ආයස්මතො සාරිපුත්තස්ස තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං ඉමං කථාසල්ලාපං. අථ ඛො ආයස්මා ආනන්දො රජගහෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො යාවතකො ආයස්මතො සාරිපුත්තස්ස තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං අහොසි කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි

සාධු සාධු ආනන්ද, යථා තං සාරිපුත්තො ච[2] සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍ය, පටිච්චසමුප්පන්නං ඛො ආනන්ද දුක්ඛං වුත්තං මයා. කිං පටිච්ච? ඵස්සං පටිච්ච. ඉති වදං වුත්තවාදී චෙව මෙ අස්ස. න ච මං අභූතෙන අබ්භාචික්ඛෙය්‍ය, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍ය, න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍ය.

තත්‍රා'නන්ද. යෙ තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා. යෙපි තෙ -පෙ- යෙපි තෙ -පෙ- යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා.

තත්‍රා'නන්ද, යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති. තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. යෙපි තෙ -පෙ- යෙපි තෙ -පෙ- යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

එකමිදාහං ආනන්ද, සමයං ඉධෙව රජගහෙ විහරාමි වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛ්වාහං ආනන්ද, පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රජගහං පිණ්ඩාය පාවිසිං. තස්ස මය්හං ආනන්ද එතදහොසි: "අතිප්පගො ඛො තාව රාජගහෙ පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛ්වාහං ආනන්ද, යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං[3] වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං, එකමන්තං නිසින්නං ඛො මං ආනන්ද, තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එතදවොචුං:

1. පටිසංවෙදයන්ති, ස්‍යා. 2. සාරිපුත්තො - මජ්ඣං. 3. සාරණීයං - මජ්ඣං

ඇවැත්නි, එහි කම්වාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙක් දුක තමා විසින් කරණ ලද්දේ ය සි පණවද් ද, ඔහු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් වෙන් ව (දුක්වෙදනා) විඳින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ. කම්වාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙක් දුක මෙරමා විසින් කරණ ලද්ද යි පණවත් ද, ඔහු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් වෙන් ව විඳින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ කම්වාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙක් දුක තමා විසිනුත් මෙරමා විසිනුත් කරණ ලද්ද යි පණවත් ද, ඔහු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් වෙන් ව විඳින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ. කම්වාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙකුත් දුක තමා විසිනුදු මෙරමා විසිනුදු නො කරණ ලද්දේ ඉබේ හට ගත්තේ ය යි පණවත් ද, ඔහු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් වෙන් ව විඳින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ.

ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙමේ ඒ අන්තොටු පිරිවැජ්ජන් සමග ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ මේ කථාසල්ලාපය ඇසුයේ ම ය. ඉක්බිති ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙමේ රජගහනුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙමේ ඒ අන්තොටු පිරිවැජ්ජන් සමග ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ යම් පමණ කථාසල්ලාපයෙක් වී ද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැල කෙළේ ය.

ආනන්ද, මැනවි. මැනවි. ශාරිපුත්‍ර තෙමේ ම පවසන්නේ මොනොවට පවසන්නේ ය. ආනන්ද, දුක ප්‍රත්‍යයෙන් හට ගත්තේ ය යි මා විසින් කියන ලදී. කුමක් ප්‍රත්‍යය කොට ද? ස්පර්ශය ප්‍රත්‍යය කොට ය. මෙසේ කියන්නේ මා විසින් කියන ලද්දක් කියන්නේ වන්නේ ය. මා බොරුවෙන් නො ම අබ්බවා කියන්නේ ය. දහමට ද අනුදහමක් පවසන්නේ ය. කරුණු සහිත කිසියම් වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නො ද පැමිණෙන්නේ ය.

ආනන්ද, එහි කම්වාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙක් දුක තමා විසින් කරණ ලද්දේ යයි පණවද් ද, එ ද ස්පර්ශ ප්‍රත්‍යයෙනි. යම් ඒ . යම් ඒ ... යම් ඒ කම්වාදී වූ මහණ බමුණු කෙනෙකුත් දුක තමා විසිනුදු මෙරමා විසිනුදු නො කරණ ලද්දේ ඉබේ හට ගත්තේ ය යි පණවද් ද, එ ද ස්පර්ශ-ප්‍රත්‍යයෙනි.

ආනන්ද, එහි කම්වාදී වූ යම් මහණ බමුණු කෙනෙකුත් දුක තමා විසින් කරණ ලද්දේ ය යි පවසද් ද, ඔහු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් වෙන් ව විඳින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ. යම් ඒ ... යම් ඒ යම් ඒ කම්වාදී වූ මහණ බමුණු කෙනෙකුත් දුක තමා විසිනු දු මෙරමා විසිනු දු නො කරණ ලද්දේ ඉබේ හට ගත්තේ ය යි පණවත් ද, ඔහු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් වෙන් ව විඳින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ.

ආනන්ද, එක්කලෙක මම මේ රජගහනුවර ම කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වෙසෙමි. ආනන්ද, එකල්හි මම පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ රජගහනුවරට පිඬු පිණිස පිවිසියෙමි. ආනන්ද, ඒ මට රජගහනුවර පිඬු පිණිස හැසිරීමට කල් වැඩි ය, මම අන්තොටු පිරිවැජ්ජන්ගේ අරම කරා එළඹෙන්නෙම් නම් යෙහෙකැ"යි මේ අදහස වි ය. ආනන්ද, එකල්හි මම අන්තොටු පිරිවැජ්ජන්ගේ අරම වෙත එළඹියෙමි. එළඹ ඒ අන්තොටු පිරිවැජ්ජන් සමග සතුටු වීමි. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක හිඳගත්තෙමි. ආනන්ද, එකත්පසෙක හිඳ ගත් මට ඒ අන්තොටු පිරිවැජ්ජෝ මෙය කීහ:

සන්තාවුසො ගොතම, එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති. සන්ති පනාවුසො ගොතම, එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා, පරංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති, සන්තාවුසො ගොතම, එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතඤ්ච පරංකතඤ්ච දුක්ඛං පඤ්ඤපෙන්ති. සන්ති පනාවුසො ගොතම, එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති. ඉධ නො ආයස්මා ගොතමො කිං වාදී? කිමක්ඛායී? කථං බ්‍යාකරමානා ච මයං වුත්තවාදිනො චෙව ආයස්මතො ගොතමස්ස අස්සාම: න ච ආයස්මන්තං ගොතමං අභූතෙන අබ්භාචික්ඛෙය්‍යාම, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍යාම, න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යාති.

එවං වුත්තාහං ආනන්ද, තෙ අඤ්ඤතිත්ථියෙ පරිබ්බාජකෙ එතදවොචං: පටිච්චසමුප්පන්නං ඛො ආවුසො දුක්ඛං වුත්තං මයා. කිං පටිච්ච? ඵස්සං පටිච්ච. ඉති වදං වුත්තවාදී චෙව මෙ අස්ස, න ච මං අභූතෙන අබ්භාචික්ඛෙය්‍ය, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍ය, න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍ය.[1]

තත්‍රා'වුසො යෙ තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා. යෙපි තෙ -පෙ- යෙපි තෙ -පෙ- යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා.

තත්‍රා'වුසො යෙ තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. යෙපි තෙ -පෙ- යෙපි තෙ -පෙ- යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජතීති.

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යත්‍ර හි නාම එකෙන පදෙන සබ්බො අත්ථො වුත්තො භවිස්සති. සියා නු ඛො භන්තෙ එසෙවත්ථො විත්ථාරෙන වුච්චමානො ගම්භීරො චෙව අස්ස, ගම්භීරාවභාසො චාති. තෙනහානන්ද, තඤ්ඤෙවෙත්ථ පටිභාතූති.

සචෙ මං භන්තෙ එවං පුච්ඡෙය්‍යුං, ජරාමරණං ආවුසො ආනන්ද, කිංනිදානං කිංසමුදයං කිඤ්ජාතිකං කිම්පභවන්ති: එවං පුට්ඨොහං[2] භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං, ජරාමරණං ඛො ආවුසො ජාතිනිදානං, ජාතිසමුදයං, ජාති ජාතිකං, ජාතිප්පභවන්ති, එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යං.

1. ආගච්ඡෙය්‍ය. 2. පුට්ඨාහං - සීමු.

ඇවැත්නි ගෞතමයෙනි, කර්මවාදී වූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. ඔහු දුක තමා විසින් කරණ ලදැයි පණවත්. ඇවැත්නි, ගෞතමයෙනි, කර්මවාදී වූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. ඔහු දුක මෙරමා විසින් කරණ ලද සි පණවත්. ඇවැත්නි, ගෞතමයෙනි, කර්මවාදී වූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ ඔහු දුක තමා විසිනුත් මෙරමා විසිනුත් කරණ ලද සි පණවත්. ඇවැත්නි, ගෞතමයෙනි, කර්මවාදී වූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. ඔහු දුක තමා විසිනුත් මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ඉබේ හට ගත්තේ යයි පණවත්. මෙහි ලා අපගේ ආයුෂමත් ගෞතම තෙමේ කිනම් වාද ඇත්තේ ද, කුමක් කියන සුළු ද? කෙසේ විසඳන්නා වූ අපි ආයුෂමත් ගෞතමයන් විසින් කියන ලද්දක් කියන්නෝත් වන්නමෝ ද; ආයුෂමත් ගෞතමයන්ට බොරුවෙන් නො ද අභ්‍යාඛ්‍යාන කියන්නමෝ ද, දහමට අනුදහමක් පවසන්නමෝ ද, කරුණු සහිත කිසියම් වාදනුපාත-යෙක් පැමිණෙන්නේ ද සි.

ආනන්ද, මෙසේ කියන ලද මම ඒ අන්තොටු පිරිවැජ්ජන්ට මේ කීයෙමි. ඇවැත්නි, දුක ප්‍රත්‍යයෙන් හට ගන්නෙකැ යි මා විසින් කියන ලදී. කුමක් ප්‍රත්‍යය කොට ද? ස්පර්ශය ප්‍රත්‍යය කොට ය. මෙසේ කියන්නේ මා විසින් කියන ලද්දක් කියන්නේත් වන්නේ ය. මට බොරුවෙන් නො ද අභ්‍යාඛ්‍යාන කරන්නේය දහමට ද අනුදහමක් පවසන්නේ ය. කරුණු සහිත කිසියම් වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නො ද පැමිණෙන්නේ ය සි.

ඇවැත්නි, එහි කර්මවාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙක් දුක තමා විසින් කරණ ලද සි පණවද් ද, එ ද ස්පර්ශප්‍රත්‍යයෙනි, යම් ඒ ... යම් ඒ ... යම් ඒ කර්මවාදී වූ මහණ බමුණු කෙනෙකුත් දුක තමා විසිනුදු මෙරමා විසිනුදු නො කරණ ලද්දේ ඉබේ හට ගත්තේ ය සි පණවද්ද, එද ස්පර්ශප්‍රත්‍යයෙනි.

ඇවැත්නි, එහි කර්මවාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙක් දුක තමා විසින් කරණ ලද්දේ ය සි පණවද් ද, ඔහු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් වෙන් ව (වෙදනා) විඳින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ. යම් ඒ ... යම් ඒ ... යම් ඒ කර්මවාදී වූ මහණ බමුණු කෙනෙකුත් දුක තමා විසිනුදු මෙරමා විසිනුදු නො කරණ ලද්දේ ඉබේ හට ගත්තේ ය සි පණවද්ද, ඔහු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් වෙන් ව විඳින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ සි.

වහන්ස, ආශ්චර්යයෙකි! වහන්ස, පුදුමයෙකි යම් හෙයෙකින් තම් එක් පදයකින් සියලු අර්ථය කියන ලද්දේ වන්නේ ද, (එහෙයිනි.) වහන්ස, මේ අරුත ම විතර විසින් කියනු ලබන්නේ ගැඹුරු වූයේත් ගැඹුරු වැටහීම් ඇත්තේත් වන්නේ ය, ආනන්ද, එසේ වූ තම් එය ම මෙහි ලා වැටහේ වා.

වහන්ස, ඉදින් මා ඇවැත්නි ආනන්දයෙනි, ජරාමරණ කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් උත්පත්තිහේතු කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද''සි මෙසේ විචාරන්නාහු නම්, වහන්ස, මෙසේ විචාරණ ලද මම මෙසේ විසඳන්නෙමි. ඇවැත්නි, ජරාමරණ ජාතිය නිදාන කොට ඇත්තේ ය. ජාතිය හට ගැණුම් කොට ඇත්තේ ය. ජාතිය ජාති කොට ඇත්තේ ය. ජාතිය ප්‍රභව කොට ඇත්තේ යයි. වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ විසඳන්නෙමි.

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං ජාති පනාවුසො ආනන්ද, කින්නිදානා කිංසමුදයා කිඤ්ජාතිකා කිම්පභවාති, එවං පුට්ඨො'හං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං ජාති ඛො ආවුසො භවනිදානා, භවසමුදයා, භවජාතිකා, භවප්පභවාති, එවං පුට්ඨො'හං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං.

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං භවො පනාවුසො ආනන්ද, කින්නිදානො, කිංසමුදයො, කිඤ්ජාතිකො, කිම්පභවොති, එවං පුට්ඨො'හං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං භවො ඛො ආවුසො උපාදානනිදානො උපාදානසමුදයො උපාදානජාතිකො උපාදානප්පභවොති. එවං පුට්ඨො'හං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං.

සචෙ මං භන්තෙ එවං පුච්ඡෙය්‍යුං. උපාදානං පනාවුසො -පෙ- තණ්හා- පනාවුසො -පෙ- වෙදනා පනාවුසො -පෙ-

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං ඵස්සො පනාවුසො ආනන්ද, කින්නිදානො, කිංසමුදයො, කිඤ්ජාතිකො, කිම්පභවොති, එවං පුට්ඨො'හං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං, ඵස්සො ඛො ආවුසො සළායතනනිදානො සළායතනසමුදයො සළායතනජාතිකො, සළායතනපභවො[1]

ඡන්නං ත්වෙව ආවුසො, ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා ඵස්සනිරොධො. ඵස්සනිරොධා වෙදනානිරොධො. වෙදනානිරොධා තණ්හානිරොධො. තණ්හානිරොධා උපාදානනිරොධො උපාදානනිරොධා. භවනිරොධො භවනිරොධා ජාතිනිරොධො. ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති. එවං පුට්ඨො'හං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යන්ති.

## 1. 3. 5.

## භූමිජසුත්තං

25. සාවත්ථියං-

අථ ඛො ආයස්මා භූමිජො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා භූමිජො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

1, සළායතනප්පභවොති - මජසං.

වහන්ස, ඉදින් මා "ඇවැත්නි, ආනන්දයෙනි, ජාතිය කුමක් නිදාන කොට ඇත්තේ ද? කුමක් සමුදය කොට ඇත්තේ ද? කුමක් ජාතිය කොට ඇත්තේ ද? කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ"යි මෙසේ විචාරන්නාහු නම් වහන්ස,එසේ විචාරණ ලද මම මෙසේ විසඳන්නෙමි. "ඇවැත්නි, ජාතිය භවය නිදාන කොට ඇත්තේ ය. භවය සමුදය කොට ඇත්තේ ය. භවය ජාති කොට ඇත්තේ ය. භවය ප්‍රභව කොට ඇත්තේ ය"යි. වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ විසඳන්නෙමි.

වහන්ස, ඉදින් මා "ඇවැත්නි ආනන්දයෙනි, භවය කුමක් නිදාන කොට ඇත්තේ ද? කුමක් සමුදය කොට ඇත්තේ ද? කුමක් ජාති කොට ඇත්තේ ද? කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ" යි මෙසේ විචාරන්නාහු නම් වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ විසඳන්නෙමි. "ඇවැත්නි, භවය උපාදාන නිදාන කොට ඇත්තේ ය. උපාදාන සමුදය කොට ඇත්තේ ය. උපාදාන ජාති කොට ඇත්තේ ය. උපාදාන ප්‍රභව කොට ඇත්තේ ය"යි. වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ විසඳන්නෙමි.

වහන්ස, ඉදින් මා මෙසේ විචාරන්නාහු නම් "ඇවැත්නි, උපාදාන ... ඇවැත්නි, තෘෂ්ණාව ... ඇවැත්නි, වේදනාව .

වහන්ස, ඉදින් මා "ඇවැත්නි, ආනන්දයෙනි, ස්පර්ශය කුමක් නිදාන කොට ඇත්තේ ද? කුමක් සමුදය කොට ඇත්තේ ද? කුමක් ජාති කොට ඇත්තේ ද? කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ"යි මෙසේ විචාරන්නාහු නම් වහන්ස, එසේ විචාරන ලද මම මෙසේ විසඳන්නෙමි. "ඇවැත්නි, ස්පර්ශය ෂඩායතන නිදාන කොට ඇත්තේ ය, ෂඩායතන සමුදය කොට ඇත්තේ ය, ෂඩායතන ජාති කොට ඇත්තේ ය, ෂඩායතන ප්‍රභව කොට ඇත්තේ ය.

ඇවැත්නි, ස්පර්ශායතන සයෙහි ම නිරවශේෂවිරාගනිරෝධයෙන් ස්පර්ශ නිරෝධය වේ. ස්පර්ශනිරෝධයෙන් වේදනානිරෝධය වේ. වේදනානිරෝධයෙන් තෘෂ්ණානිරෝධය වේ. තෘෂ්ණානිරෝධයෙන් උපාදානනිරෝධය වේ. උපාදානනිරෝධයෙන් භවනිරෝධය වේ. භවනිරෝධයෙන් ජාතිනිරෝධය වේ. ජාතිනිරෝධයෙන් ජරාමරණ සොකපරිදෙව දුක්ඛ දෙමනස්සුපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ ය"යි. වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ විසඳන්නෙමි.

## 1. 3. 5.

## භූමිජසූත්‍රය

25. සැවැත්නුවර-

ඉක්බිති ආයුෂ්මත් භූමිජ ස්ථවිර තෙමේ සවස්කල පටිසල්ලානයෙන් නැගී සිටියේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ කරා එළඹියේය. එළඹ ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු වූ සිහි කටයුතු වූ කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් භූමිජ ස්ථවිර තෙමේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය සැළ කෙළේ ය:

සන්තාවුසො සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති. සන්ති පනාවුසො සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා පරංකතං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති. සන්ති පනාවුසො[1] සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතඤ්ච පරංකතඤ්ච සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති. සන්ති පනාවුසො සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති.

ඉධ නො ආවුසො සාරිපුත්ත භගවා කිං වාදී? කිමක්ඛායී? කථං ව්‍යාකරමානා ච මයං වුත්තවාදිනො චෙව භගවතො අස්සාම? න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛෙය්‍යාම? ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍යාම? න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යාති?

පටිච්චසමුප්පන්නං ඛො ආවුසො සුඛදුක්ඛං වුත්තං භගවතා. කිං පටිච්ච? ඵස්සං පටිච්ච. ඉති වදං වුත්තවාදී චෙව. භගවතො අස්ස, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛෙය්‍ය, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍ය, න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍ය.

තත්‍රා'වුසො යෙ තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා. යෙපි තෙ -පෙ- යෙපි තෙ -පෙ- යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති, තද'පි ඵස්සපච්චයා.

තත්‍රා'වුසො යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. යෙපි තෙ -පෙ- යෙපි තෙ -පෙ- යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

අස්සොසි ඛො ආයස්මා ආනන්දො ආයස්මතො සාරිපුත්තස්ස ආයස්මතා භූමිජෙන සද්ධිං ඉමං කථාසල්ලාපං. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො යාවතකො ආයස්මතො සාරිපුත්තස්ස ආයස්මතා භූමිජෙන සද්ධිං අහොසි කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි

සාධු සාධු ආනන්ද, යථා තං සාරිපුත්තො ච සම්මා ව්‍යාකරමානො ව්‍යාකරෙය්‍ය. පටිච්චසමුප්පන්නං ඛො ආනන්ද සුඛදුක්ඛං වුත්තං මයා, කිං පටිච්ච, ඵස්සං පටිච්ච. ඉති වදං වුත්තවාදී චෙව මෙ අස්ස න ච මං අභූතෙන අබ්භාචික්ඛෙය්‍ය, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍ය, න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍ය.

---

1. සන්තාවුසො මජසං, සත

ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, කම්වාදී වූ ඇතැම් මහණබමුණෝ ඇත්තාහ ඔහු සුවදුක් තමා විසින් කරණලද්දේ යයි පණවත්. ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, කම්වාදී වූ ඇතැම් මහණබමුණෝ ඇත්තාහ ඔහු සුවදුක් මෙරමා විසින් කරණලද්දේ යයි පණවත්. ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, කම්වාදී වූ ඇතැම් මහණබමුණෝ ඇත්තාහ. ඔහු සුවදුක් තමා විසිනුදු මෙරමා විසිනුදු කරණලද්දේ යයි පණවත්. ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, කම්වාදී වූ ඇතැම් මහණබමුණෝ ඇත්තාහ. ඔහු සුවදුක් තමා විසිනුදු මෙරමා විසිනුදු නො කරණලද්දේ ඉබේ හටගත්තකැ යි පණවත්.

ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, මෙහි ලා අපගේ භාග්‍යවතුන් වහන්සේ කිනම් වාද ඇති සේක් ද? කුමක් කියන සුලු සේක් ද? කෙසේ විසඳන්නා වූ අපි භාග්‍යවතුන් වහන්සේ විසින් කියනලද්දක් කියන්නෝත් වන්නමෝ ද? භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් නො ද අබ්බවා කියන්නමෝ ද? දහමට ද අනුදහමක් පවසන්නමෝ ද? කරුණු සහිත කිසියම් වාදනුපාතයෙක් ගැරහියයුතු තැනට නො ද පැමිණෙන්නේ ද? යි.

ඇවැත්නි, සුවදුක් ප්‍රත්‍යයෙන් හටගත්තේ යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. කුමක් ප්‍රත්‍යය කොට ද? ස්පර්ශය ප්‍රත්‍යය කොට ය. මෙසේ කියන්නේ භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නේ වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් නො ද අබ්බවා කියන්නේ ය. දහමට ද අනුදහමක් පවසන්නේ ය. කරුණු සහිත කිසි යම් වාදනුපාතයෙක් ගැරහියයුතු තැනට නො ද පැමිණෙන්නේ ය.

ඇවැත්නි, එහි කම්වාදී වූ යම් ඒ මහණබමුණු කෙනෙක් සුවදුක් තමා විසින් කරණ ලද්දේ යයි පණවත් ද, එ ද ස්පර්ශප්‍රත්‍යයයෙනි. යම් ඒ ... යම් ඒ ... යම් ඒ කම්වාදී වූ මහණබමුණු කෙනෙකුත් සුවදුක් තමා විසිනුදු මෙරමා විසිනුදු නො කරණ ලද්දේ ඉබේ හටගත්තේ යයි පණවද් ද, එ ද ස්පර්ශප්‍රත්‍යයයෙනි.

ඇවැත්නි, එහි කම්වාදී වූ යම් ඒ මහණ බමුණු කෙනෙකුත් සුවදුක් තමා විසින් කරණ ලද්දේ යයි පණවද් ද, ඔහු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් වෙන් ව විඳින්නාහු ය යන මේ කරුණ විද්‍යමාන නො වන්නේ ය. යම් ඒ .. යම් ඒ ... යම් ඒ කම්වාදී වූ මහණබමුණු කෙනෙකුත් සුවදුක් තමා විසිනුදු මෙරමා විසිනුදු නො කරණ ලද්දේ ඉබේ හටගත්තේ යයි පණවද් ද, ඔහු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් වෙන්ව විඳින්නාහු ය යන මේ කරුණ විද්‍යමාන නො වේ.

ආයුෂ්මත් **ආනන්‍දස්ථවිර** තෙමේ ආයුෂ්මත් භූමිජ තෙරුන් සමග පැවැති ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේගේ මේ කථාසල්ලාපය ඇසී ය. ඉක්බිති ආයුෂ්මත් ආනන්‍දස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්‍දස්ථවිර තෙමේ ආයුෂ්මත් භූමිජ තෙරුන් සමග ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේගේ යම් තාක් කථාසල්ලාපයෙක් වී ද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළ කෙළේ ය.

ආනන්‍ද, මැනවි, මැනවි, ශාරීපුත්‍රස්ථවිර තෙමේ ම විසඳන්නේ ඒ තත්වූ පරිදි මොනවට විසඳන්නේ ය. ආනන්‍ද, සුවදුක් ප්‍රත්‍යයයෙන් හටගත්තේ යයි මා විසින් කියන ලදී. කුමක් ප්‍රත්‍යය කොට ද? ස්පර්ශය ප්‍රත්‍යය කොට ය. මෙසේ කියන්නේ මා විසින් කියනලද්දක් කියන ලද්දේත් වන්නේ ය. මට බොරුවෙන් නො ද අබ්බවා කියන්නේ ය. දහමට ද අනුදහමක් පවසන්නේ ය. කරුණු සහිත වූ කිසියම් වාදනුපාතයෙක් ගැරහියයුතු තැනට නො ද පැමිණෙන්නේ ය.

තත්‍රානන්ද යෙ තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා. යෙපි තෙ -පෙ- යෙපි තෙ -පෙ- යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති තදපි ඵස්සපච්චයා.

තත්‍රානන්ද යෙ තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා සයංකතං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති. තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. යෙපි තෙ -පෙ- යෙපි තෙ -පෙ- යෙපි තෙ සමණබ්‍රාහ්මණා කම්මවාදා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති. තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

කායෙ වා හානන්ද සති කායසඤ්චෙතනාහෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, වාචාය[1] වා හානන්ද සති වචීසඤ්චෙතනාහෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, මනෙ වා හානන්ද සති මනොසඤ්චෙතනාහෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං අවිජ්ජාපච්චයා ච[2].

සාමං වා තං ආනන්ද කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති යම්පච්චයාස්ස[3] තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, පරෙ වාස්ස[4] තං ආනන්ද කායසඞ්ඛාරං අභිසඞ්ඛරොන්ති[5] යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, සම්පජානො වා තං ආනන්ද කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති. යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, අසම්පජානො වා තං ආනන්ද කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති.

යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, සාමං වා තං ආනන්ද වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති. යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං[6], පරෙ වාස්ස තං ආනන්ද වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොන්ති. යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, සම්පජානො වා තං ආනන්ද -පෙ- අසම්පජානො වා තං ආනන්ද -පෙ- වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති.

යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, සාමං වා තං ආනන්ද මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. පරෙ වාස්ස තං ආනන්ද මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොන්ති. යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, සම්පජානො වා තං ආනන්ද -පෙ- අසම්පජානො වා තං ආනන්ද මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. ඉමෙසු ආනන්ද ධම්මෙසු අවිජ්ජා අනුපතිතා.

අවිජ්ජායත්වෙව ආනන්ද අසෙසවිරාගනිරොධා සො කායො න හොති. යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. සා වාචා න හොති. යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. සො මනො න හොති යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. ඛෙත්තං තං[7] න හොති. -පෙ- වත්ථු තං[8] න හොති. -පෙ- ආයතනං තං[9] න හොති — අධිකරණං තං[10] න හොති යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛන්ති.

---

1. වාචායං ස්‍යා 2. අවිජ්ජාපච්චයාච - සී. මු ස්‍යා, 3. යම්පච්චයාය ස්‍යා. 4. පරෙවාය තං - ස්‍යා, පරෙවාතං - මජසං, 5. අභිසංඛරොන්ති - ස්‍යා. 6. සුඛදුක්ඛං -පෙ- සී. මු. 7. ඛෙත්තං වා ස්‍යා 8. වත්ථුං වා, ස්‍යා 9. ආයතනං වා ස්‍යා. 10. අධිකරණං වා - ස්‍යා

ආනන්ද, එහි කම්වාදී වූ යම් ඒ මහණබමුණු කෙනෙක් සුවදුක් තමා විසින් කරණ ලද්දේ යයි පණවද් ද, එ ද සපර්ශප්‍රත්‍යයයෙනි. යම් ඒ ... යම් ඒ ... යම් ඒ කම්වාදී වූ මහණබමුණු. කෙනෙකුත් සුවදුක් තමා විසිනුදු මෙරමා විසිනුදු නොකරණ ලද්දේ ඉබේ හටගත්තේ යයි පණවද් ද, එය ද සපර්ශප්‍රත්‍යයෙනි.

ආනන්ද, එහි කම්වාදී වූ යම් ඒ මහණබමුණු කෙනෙක් සුවදුක් තමා විසින් කරණ ලද්දේ යයි පණවද් ද, ඔහු ඒකාන්තයෙන් සපර්ශයෙන් වෙන් ව විඳින්නාහු ය යන මේ කරුණ විද්‍යමාන නොවේ. යම් ඒ .... යම් ඒ .... යම් ඒ කම්වාදී වූ මහණබමුණු කෙනෙකුත් සුවදුක් තමා විසිනුදු මෙරමා විසිනුදු නො කරණ ලද්දේ ඉබේ හටගත්තේ යයි පණවද් ද, ඔහු ඒකාන්තයෙන් සපර්ශයෙන් වෙන් ව විඳින්නාහු ය යන මේ කරුණ විද්‍යමාන නො වේ.

ආනන්ද, කය ඇති කල්හිත් කායසඤ්චෙතනා හේතු කොට තමා පිළිබඳ සුවදුක් උපදී. ආනන්ද, වචනය ඇති කල්හිත් වචීසඤ්චෙතනා හේතු කොට තමා පිළිබඳ සුවදුක් උපදී. ආනන්ද, සිත ඇති කල්හිත් මනොසඤ්චෙතනා හේතු කොට තමා පිළිබඳ සුවදුක් උපදී. අවිද්‍යාප්‍රත්‍යයයෙන් ද (සුවදුක්) උපදී.

යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ආනන්ද, තෙමේත් ඒ කායසංස්කාර රැස් කෙරෙයි. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ආනන්ද, මෙරමාත් ඔහුගේ ඒ කායසංස්කාර රැස් කෙරෙත්. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ආනන්ද, මනා දැනුම් ඇත්තේත් ඒ කායසංස්කාර රැස් කෙරෙයි. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ සුවදුක් උපදී ද, ආනන්ද, මනා දැනුම් නැත්තේත් ඒ කායසංස්කාර රැස් කෙරේ.

යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ආනන්ද, තෙමේත් ඒ වාක්සංස්කාර රැස් කෙරෙයි. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, මෙරමාත් ඔහුගේ ඒ වාක්සංස්කාර රැස් කෙරෙත්. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ආනන්ද මනා දැනුම් ඇත්තේත් ඒ ... ආනන්ද, මනා දැනුම් නැත්තේත් ඒ වාක්සංස්කාර රැස් කෙරෙයි.

යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ආනන්ද, තෙමේත් ඒ මනඃසංස්කාර රැස් කෙරෙයි. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ආනන්ද, මෙරමාත් ඔහුගේ ඒ මනඃසංස්කාර රැස් කෙරෙත්. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ආනන්ද, මනා දැනුම් ඇත්තේත් ඒ ... යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ආනන්ද, මනා දැනුම් නැත්තේත් ඒ මනඃසංස්කාර රැස් කෙරෙයි. ආනන්ද, මේ ධර්මයන්හි අවිද්‍යාව යුක්තවූවා ය.

යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ආනන්ද, අවිද්‍යාවගේ ම නිරවශේෂ විරාගනිරෝධයෙන් ඒ කය නොවේ. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ඒ වචනය නො වේ. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ඒ සිත නො වේ. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ඒ කෙත නො වේ. ... ඒ වාස්තුව නො වේ. .... ඒ ආයතනය නො වේ. යම් ප්‍රත්‍යයකින් ඔහුට තමා පිළිබඳ ඒ සුවදුක් උපදී ද, ඒ අධිකරණය නො වේ.

## 1. 3. 6.

## උපවාණසුත්තං

26. **සාවත්ථියං**-

අථ ඛො ආයස්මා **උපවාණො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උපවාණො භගවන්තං එතදවොච:

සන්ති හි භන්තෙ,[1] එකෙ සමණබ්‍රාහමණා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති. සන්ති හි පන භන්තෙ[2] එකෙ සමණබ්‍රාහමණා පරංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති. සන්ති හි භන්තෙ එකෙ සමණබ්‍රාහමණා සයංකතඤ්ච පරංකතඤ්ච දුක්ඛං පඤ්ඤපෙන්ති. සන්ති හි පන භන්තෙ එකෙ සමණබ්‍රාහමණා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති.

ඉධ නො භන්තෙ භගවා කිං වාදී? කිමක්ඛායී! කථං බ්‍යාකරමානා ච මයං වුත්තවාදිනො චෙව භගවතො අස්සාම? න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛෙය්‍යාම? ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍යාම? න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යාති?

පටිච්චසමුප්පන්නං ඛො උපවාණ දුක්ඛං වුත්තං මයා. කිං පටිච්ච? ඵස්සං පටිච්ච. ඉති වදං වුත්තවාදී චෙව මෙ අස්ස න ච මං අභූතෙන අබ්භාචික්ඛෙය්‍ය ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍ය න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍ය.

තත්‍ර උපවාණ යෙ තෙ සමණබ්‍රාහමණා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති, තදපි ඵස්සපච්චයා. යෙපි තෙ -පෙ- යෙපි තෙ -පෙ- යෙපි තෙ සමණබ්‍රාහමණා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති තදපි ඵස්සපච්චයා.

තත්‍ර උපවාණ[3] යෙ තෙ සමණබ්‍රාහමණා සයංකතං දුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. යෙපි තෙ -පෙ- යෙපි තෙ -පෙ- යෙපි තෙ සමණබ්‍රාහමණා අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං පඤ්ඤපෙන්ති, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජතීති.

---

1. සන්ති පන භන්තෙ - මජ්ඣං - ස්‍යා 2. සන්ති පන භන්තෙ - මජ්ඣං - ස්‍යා.
3. තත්‍රාපවාණ - ස්‍යා

## 1. 3. 6

## උපවාණ සූත්‍රය

26. සැවැත්නුවර-

ඉක්බිති ආයුෂ්මත් **උපවාණස්ථවිර** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් **උපවාණස්ථවිර** තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය:

වහන්ස, ඇතැම් මහණබමුණෝ ඇත්තාහ. (ඔහු) දුක තමා විසින්ම කරණ ලද්ද යි පණවත්. වහන්ස, ඇතැම් මහණබමුණෝ ඇත්තාහ. (ඔහු) දුක මෙරමා විසින් ම කරණ ලද්ද යි පණවත්. වහන්ස, ඇතැම් මහණබමුණෝ ඇත්තාහ. (ඔහු) දුක තමා විසිනුදු මෙරමා විසිනුදු කරණ ලද්දේ ය යි පණවත්. වහන්ස, ඇතැම් මහණබමුණෝ ඇත්තාහ. (ඔහු) දුක තමා විසිනුදු මෙරමා විසිනුදු නොකරණ ලද්දේ හේතුප්‍රත්‍යය රහිතව (ඉබේ) හටගත්තේ ය යි පණවත්,

වහන්ස, මෙහි ලා අපගේ භාග්‍යවතුන් වහන්සේ කිනම් වාද ඇති සේක් ද? කුමක් කියනසුලු සේක් ද? කෙසේ පවසන්නාවූ අපි භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්ද අනුව කියන්නෝ වන්නමෝ ද? භාග්‍යවතුන් වහන්සේ බොරුවෙන් නො ද අබ්බවා කියන්නමෝ ද? දහමට ද අනු-දහමක් පවසන්නමෝ ද? කරුණු සහිත වූ කිසියම් වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නො එන්නේ ද?

උපවාණ, දුක ප්‍රත්‍යයෙන් හටගත්තකැ යි මා විසින් කියන ලදී. කුමක් ප්‍රත්‍යය කොට ද? ස්පර්ශය ප්‍රත්‍යය කොටය මෙසේ කියන්නේ මා විසින් කියන ලද්ද අනු ව කියන්නෙක් වන්නේ ය. බොරුවෙන් මා නො ද අබ්බවා කියන්නේ ය. දහමට ද අනුදහමක් පවසන්නේ ය. කරුණු සහිත වූ කිසියම් වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නොද එන්නේ ය.

උපවාණ, එහි යම් ඒ මහණබමුණෝ දුක තමා විසින් කරණ ලද්ද යි පණවද්ද, එ ද ස්පර්ශප්‍රත්‍යයෙනි. යම් ඒ ... යම් ඒ යම් ඒ මහණබමුණු කෙනෙකුත් දුක තමා විසිනුදු මෙරමා විසිනුදු නොකරණ ලද්දේ ඉබේ හටගත්තේ ය යි පණවද්ද, එ ද ස්පර්ශප්‍රත්‍යයෙනි.

උපවාණ, එහි යම් ඒ මහණබමුණෝ දුක තමා විසින් කරණ ලද්දේ ය යි පණවද්ද, ඒකාන්තයෙන් ඔහු ස්පර්ශයෙන් වෙන් ව (දුක) විඳින්නාහු ය යන මේ කරුණ විද්‍යමාන නො වේ. යම් ඒ ... යම් ඒ යම් ඒ මහණබමුණු කෙනෙකුත් දුක තමා විසිනුදු මෙරමා විසිනුදු නොකරණ ලද්දේ ඉබේ හටගත්තේ ය යි පණවද්ද, ඒකාන්තයෙන් ඔහු ස්පර්ශයෙන් වෙන් ව (දුක) විඳින්නාහු ය යන මේ කරුණ විද්‍යමාන නො වෙයි

## 1. 3. 7

## පච්චයසුත්තං

27. සාවත්ථියං-

අවිජ්ජාපච්චයා භික්ඛවෙ සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

කතමඤ්ච භික්ඛවෙ, ජරාමරණං? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චති ජරා. යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චුමරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස[1] නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො, ඉදං වුච්චති මරණං. ඉති අයඤ්ච ජරා ඉදං ච මරණං ඉදං වුච්චති භික්ඛවෙ ජරාමරණං. ජාතිසමුදයා ජරාමරණසමුදයො, ජාතිනිරොධා ජරාමරණනිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො ජරාමරණනිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

කතමා ච භික්ඛවෙ, ජාති?[2] යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති නිබ්බත්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො, අයං වුච්චති භික්ඛවෙ ජාති. භවසමුදයා ජාතිසමුදයො. භවනිරොධා ජාතිනිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො ජාතිනිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

කතමො ච භික්ඛවෙ, භවො -පෙ- කතමඤ්ච භික්ඛවෙ උපාදානං -පෙ- කතමා ච භික්ඛවෙ තණ්හා -පෙ- කතමා ච භික්ඛවෙ වෙදනා -පෙ- කතමො ච භික්ඛවෙ ඵස්සො -පෙ- කතමං ච භික්ඛවෙ සළායතනං -පෙ- කතමං ච භික්ඛවෙ නාමරූපං -පෙ- කතමං ච භික්ඛවෙ විඤ්ඤාණං -පෙ-* කතමෙ ච භික්ඛවෙ සඞ්ඛාරා තයො මෙ භික්ඛවෙ, සඞ්ඛාරා: කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරො, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, සඞ්ඛාරා. අවිජ්ජාසමුදයා සඞ්ඛාරසමුදයො. අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ඛාරනිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

යතො ඛො භික්ඛවෙ, අරියසාවකො එවං පච්චයං[3] පජානාති, එවං පච්චයසමුදයං පජානාති, එවං පච්චයනිරොධං පජානාති, එවං පච්චයනිරොධගාමිනිං පටිපදං පජානාති, අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො දිට්ඨිසම්පන්නො ඉතිපි, දස්සනසම්පන්නො ඉතිපි, ආගතො ඉමං සද්ධම්මං ඉතිපි, පස්සති ඉමං සද්ධම්මං ඉතිපි, සෙඛෙන[4] ඤාණෙන සමන්නාගතො ඉතිපි, සෙඛාය[5] විජ්ජාය සමන්නාගතො ඉතිපි, ධම්මසොතං සමාපන්නො ඉතිපි, අරියො නිබ්බෙධිකපඤ්ඤො ඉතිපි, අමතද්වාරං ආහච්ච තිට්ඨති ඉතිපීති.

---

1. කලෙවරස්ස - මජ්ඣං, ස්‍යා. 2 කතමා ච භික්ඛවෙ ජාති -පෙ- - මජ්ඣං - ස්‍යා.
3. පච්චයං පත - සීමු. 4. සෙක්ඛෙන - මජ්ඣං - ස්‍යා. 5. සෙක්ඛාය - මජ්ඣං - ස්‍යා.

* “කතමො ච භික්ඛවෙ භවො -පෙ-” ඉච්චාදීසු පෙය්‍යාලමුඛෙන සඞ්ඛිත්තො පච්චයවිභාගො බුද්ධවග්ගෙ විභඞ්ගසුත්තෙ වුත්තනයානුසාරෙන වෙදිතබ්බො. (පි. 4, 6.)

## 1. 3. 7

## පච්චය සූත්‍රය

27. සැවැත්නුවර-

මහණෙනි, අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැන්ම වේ.

මහණෙනි, ජරාමරණ කවරේ ද යත්: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි යම් දිරීමෙක් දිරණ බවෙක් දත් වැටීමෙක් කෙස් පැසීමෙක් ඇඟ රැලි වැටීමෙක් ආයු පිරිහීමෙක් ඉඳුරන්ගේ පැසීමෙක් වේ ද, මේ ජරා ය යි කියනු ලැබේ ඒ ඒ සත්ත්වනිකායෙන් ඒ ඒ සත්ත්වයන්ගේ යම් වෙන් වීමෙක් වෙන් වන බවෙක් බිඳීමෙක් අතුරුදන් වීමෙක් මච්චු නම් වූ මරණයෙක් සම්මුති මරණයෙක් ස්කන්ධයන්ගේ බිඳීමෙක් සිරුර හැර දැමීමෙක් ජීවිතින්ද්‍රියයාගේ සිඳී යෑමෙක් වේ ද, මේ මරණ ය යි කියනු ලැබේ. මෙසේ මේ ජරාව ද මේ මරණය ද මහණෙනි, මේ ජරාමරණ ය යි කියනු ලැබේ. ජාතිසමුදයෙන් ජරාමරණ සමුදය වේ. ජාති නිරෝධයෙන් ජරාමරණ නිරෝධය වේ. මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය ම ජරාමරණ නිරොධගාමිනී ප්‍රතිපදාව ය. එනම්: සම්මාදිට්ඨිය, සම්මාසඞ්කප්පය, සම්මාවාචාය, සම්මා-කම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මාසතිය, සම්මාසමාධිය යි.

මහණෙනි, ජාතිය නම් කවර යත්: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්ව-නිකායෙහි හටගැණීමෙක් පිරිපුන් හටගැණීමෙක් කුසට බැස ගැන්මෙක් ඉපැද්මෙක් වෙසෙස් ඉපැද්මෙක් ස්කන්ධයන්ගේ පහළ වීමෙක් ආයතනයන්ගේ පිළි ලැබීමෙක් වේ ද, මහණෙනි, මේ ජාතිය යි කියනු ලැබේ. භවසමුදයෙන් ජාති සමුදය වේ. භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ. මේ ආර්‍ය්‍ය-අෂ්ටාඞ්ගිකමාර්ගය ම ජාති නිරෝධගාමිනී ප්‍රතිපදාව යි. එනම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි.

මහණෙනි, භවය නම් කවර යත්: ... මහණෙනි, උපාදාන නම් කවර යත්: ... මහණෙනි, තෘෂ්ණා නම් කවර යත්: ... මහණෙනි, වේදනා නම් කවර යත්: ... මහණෙනි, ස්පර්ශය නම් කවර යත්: ... මහණෙනි, ෂඩායතන නම් කවර යත්: ... මහණෙනි, නාම රූප නම් කවර යත්: ... මහණෙනි, විඥාන නම් කවර යත්: ... *මහණෙනි, සංස්කාර නම් කවර යත්: මහණෙනි, මේ සංස්කාර තුණෙකි: කායසංස්කාරය, වාක්සංස්කාරය, චිත්තසංස්කාර ය යි. මහණෙනි, මේ සංස්කාර ය යි කියනු ලැබේ. අවිද්‍යා සමුදයෙන් සංස්කාර සමුදය වේ. අවිද්‍යා නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය ම සංස්කාරනිරොධගාමිනී ප්‍රතිපදාව යි. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි.

මහණෙනි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ ප්‍රත්‍යය දනී ද, මෙසේ ප්‍රත්‍යයසමුදය දනී ද, මෙසේ ප්‍රත්‍යයනිරෝධය දනී ද, මෙසේ ප්‍රත්‍යය නිරෝධගාමිනීප්‍රතිපදාව දනී ද, මහණෙනි, මේ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මාර්ගදෘෂ්ටියෙන් යුක්ත ය යි ද, මාර්ගදර්ශනයෙන් යුක්ත ය යි ද, මේ සදහමට පැමිණියේ ය යි ද, මේ සදහම දකී ය යි ද, ශෛක්‍ෂඥානයෙන් සමන්වාගත ය යි ද, ශෛක්‍ෂවිද්‍යාවෙන් සමන්වාගත ය යි ද, (මාර්ගසඞ්ඛ්‍යාත) ධර්මස්‍රොතසට පැමිණියේ ය යි ද, ආර්‍ය්‍ය වූ නිර්වේධිකප්‍රඥා ඇත්තේ ය යි ද නිවන් දොරට හැනී සිටී ය යි ද කියනු ලැබේයි.

---

* "මහණෙනි, භවය නම් කවරයත්..." ආදියෙහි පෙය්‍යාලමුඛයෙන් සංක්‍ෂිප්ත ප්‍රත්‍යය විභාගය බුද්ධවර්‍ගයෙහි විභඞ්ග සූත්‍රයෙහි කී පලසින් දතයුතු. (පි. 5, 7.)

## 1. 3. 8.

## භික්ඛුසුත්තං

28. සාවත්ථියං-

තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ඉධ භික්ඛවෙ, භික්ඛු ජරමරණං පජානාති, ජරාමරණසමුදයං පජානාති, ජරාමරණනිරොධං පජානාති, ජරමරණ නිරොධගාමිනිං පටිපදං පජානාති. ජාතිං පජානාති -පෙ- භවං පජානාති -පෙ- උපාදානං පජානාති -පෙ- තණ්හං පජානාති -පෙ- වෙදනං පජානාති -පෙ- ඵස්සං පජානාති -පෙ- සළායතනං පජානාති -පෙ- නාමරූපං පජානාති -පෙ- විඤ්ඤාණං පජානාති -පෙ- සඞ්ඛාරෙ පජානාති, සඞ්ඛාරසමුදයං පජානාති, සඞ්ඛාරනිරොධං පජානාති, සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං පජානාති.

කතමං ච භික්ඛවෙ, ජරාමරණං? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චති ජරා. යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චුමරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො, ඉදං වුච්චති මරණං. ඉති අයං ච ජරා ඉදං ච මරණං ඉදං වුච්චති භික්ඛවෙ ජරාමරණං. ජාතිසමුදයා ජරාමරණසමුදයො. ජාතිනිරොධා ජරාමරණනිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො ජරාමරණනිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

කතමා ච භික්ඛවෙ ජාති -පෙ- කතමො ච භික්ඛවෙ භවො -පෙ- කතමං ච භික්ඛවෙ උපාදානං -පෙ- කතමා ච භික්ඛවෙ තණ්හා -පෙ- කතමා ච භික්ඛවෙ වෙදනා -පෙ- කතමො ච භික්ඛවෙ ඵස්සො -පෙ- කතමං ච භික්ඛවෙ සළායතනං -පෙ- කතමං ච භික්ඛවෙ නාමරූපං -පෙ- කතමං ච භික්ඛවෙ විඤ්ඤාණං -පෙ- කතමෙ ච භික්ඛවෙ සඞ්ඛාරා? තයො'මෙ භික්ඛවෙ, සඞ්ඛාරා: කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරො. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ සඞ්ඛාරා. අවිජ්ජාසමුදයා සඞ්ඛාරසමුදයො. අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ඛාරනිරොධගාමිනීපටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

## 1. 3. 8

## භික්ඛු සූත්‍රය

28. **සැවැත්නුවර-**

එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, මෙහි මහණ තෙමේ ජරාමරණ දනී. ජරාමරණ සමුදය දනී. ජරාමරණ නිරෝධය දනී. ජරාමරණ නිරෝධගාමිනී ප්‍රතිපදාව දනී. ජාතිය දනී ... භවය දනී ... උපාදාන දනී ... තෘෂ්ණාව දනී ... වේදනාව දනී ... ස්පර්ශය දනී ... ෂඩායතන දනී ... නාමරූප දනී ... විඥානය දනී ... සංස්කාර දනී. සංස්කාර සමුදයය දනී. සංස්කාර නිරෝධය දනී. සංස්කාරනිරෝධගාමිනී ප්‍රතිපදාව දනී.

මහණෙනි, ජරාමරණ කවරේ ද යත්: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි දිරීමෙක් දිරූම්බවෙක් දත් වැටීමෙක් කෙස් පැසීමෙක් ඇඟ රැළි වැටීමෙක් ආයුපිරිහීමෙක් ඉඳුරන් මේරීමෙක් වේ ද, මේ ජරා ය යි කියනු ලැබේ. ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙන් යම් වෙන් වීමෙක් වෙන්වන බවෙක් අතුරුදන් වීමෙක් මෘත්‍යු නම් වූ මරණයෙක් කළුරිය කිරීමෙක් ස්කන්ධයන්ගේ බිඳීමෙක් සිරුර හැර දැමීමෙක් වේ ද, මේ මරණ ය යි කියනු ලැබේ. මෙසේ මේ ජරාව ද මේ මරණය ද මහණෙනි, මේ ජරා-මරණ ය යි කියනු ලැබේ. ජාතිසමුදයෙන් ජරාමරණ සමුදයය වේ. ජාතිනිරෝධයෙන් ජරාමරණ නිරෝධය වේ. මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය ම ජරාමරණ නිරෝධගාමිනීප්‍රතිපදාව යි. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි.

මහණෙනි, ජාතිය නම් කවර යත්: ... මහණෙනි, භවය නම් කවර යත් ... මහණෙනි, උපාදාන නම් කවර යත් ... මහණෙනි, තණ්හා නම් කවර යත් ... මහණෙනි, වේදනා නම් කවර යත් ... මහණෙනි, ඵස්ස නම් කවර යත් ... මහණෙනි, සළායතන නම් කවර යත් ... මහණෙනි, නාමරූප නම් කවර යත්: මහණෙනි, විඤ්ඤාණ නම් කවර යත් ... මහණෙනි, සඞ්ඛාර නම් කවර යත්: මහණෙනි, සඞ්ඛාර තුනෙකි: කාය සඞ්ඛාරය, වචීසඞ්ඛාරය, චිත්තසඞ්ඛාරය. මහණෙනි, මොහු සඞ්ඛාරයෝ යි කියනු ලැබෙත්. අවිද්‍යාසමුදයෙන් සංස්කාර සමුදය වේ. අවිද්‍යානිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ. මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය ම සංස්කාර නිරෝධ-ගාමිනී ප්‍රතිපදාව යි. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි,

යතො ඛො භික්ඛවෙ, භික්ඛු එවං ජරාමරණං පජානාති, එවං ජරාමරණසමුදයං පජානාති, එවං ජරාමරණනිරොධං පජානාති, එවං ජරාමරණනිරොධගාමිනිං පටිපදං පජානාති -පෙ- එවං ජාතිං පජානාති -පෙ- එවං භවං -පෙ- එවං උපාදානං -පෙ- එවං තණ්හං -පෙ- එවං වෙදනං -පෙ- එවං ඵස්සං -පෙ- එවං සළායතනං -පෙ- එවං නාමරූපං -පෙ- එවං විඤ්ඤාණං -පෙ- එවං සඞ්ඛාරෙ පජානාති, එවං සඞ්ඛාරසමුදයං පජානාති, එවං සඞ්ඛාරනිරොධං පජානාති, එවං සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං පජානාති, අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු දිට්ඨිසම්පන්නො ඉතිපි, දස්සනසම්පන්නො ඉතිපි, ආගතො ඉමං සද්ධම්මං ඉතිපි, පස්සති ඉමං සද්ධම්මං ඉතිපි, සෙඛෙන ඤාණෙන සමන්නාගතො ඉතිපි, සෙඛාය විජ්ජාය සමන්නාගතො ඉතිපි, ධම්මසොතං සමාපන්නො ඉතිපි, අරියො නිබ්බෙධිකපඤ්ඤො ඉතිපි, අමතද්වාරං ආහච්ච තිට්ඨති ඉතිපීති.

## 1. 3. 9.

## සමණබ්‍රාහ්මණසුත්තං

29. සාවත්ථියං-

තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං න පරිජානන්ති, ජරාමරණසමුදයං න පරිජානන්ති, ජරාමරණනිරොධං න පරිජානන්ති ජරාමරණනිරොධගාමිනිං පටිපදං න පරිජානන්ති, -පෙ- ජාතිං න පරිජානන්ති, -පෙ- භවං න පරිජානන්ති -පෙ- උපාදානං න පරිජානන්ති -පෙ- තණ්හං -පෙ- වෙදනං -පෙ- ඵස්සං -පෙ- සළායතනං -පෙ- නාමරූපං -පෙ- විඤ්ඤාණං -පෙ- සඞ්ඛාරෙ න පරිජානන්ති, සඞ්ඛාරසමුදයං න පරිජානන්ති, සඞ්ඛාරනිරොධං න පරිජානන්ති, සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං න පරිජානන්ති, නමෙතෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පනෙතෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං පරිජානන්ති, ජරාමරණසමුදයං පරිජානන්ති, ජරාමරණනිරොධං පරිජානන්ති, ජරාමරණනිරොධගාමිනිං පටිපදං පරිජානන්ති -පෙ- ජාතිං පරිජානන්ති -පෙ- භවං -පෙ- උපාදානං -පෙ- තණ්හං -පෙ- වෙදනං -පෙ- ඵස්සං -පෙ- සළායතනං -පෙ- නාමරූපං -පෙ- විඤ්ඤාණං -පෙ- සඞ්ඛාරෙ පරිජානන්ති, සඞ්ඛාරසමුදයං පරිජානන්ති, සඞ්ඛාරනිරොධං පරිජානන්ති, සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං පරිජානන්ති. තෙ ඛො මෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා, බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා. තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථං ච බ්‍රහ්මඤ්ඤත්ථං ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

මහණෙනි, යම් කලෙක මහණ තෙමේ මෙසේ ජරාමරණ දනී ද, මෙසේ ජරාමරණසමුදය දනී ද, මෙසේ ජරාමරණනිරෝධය දනී ද, මෙසේ ජරාමරණ නිරෝධගාමිනී ප්‍රතිපදාව දනී ද, ... මෙසේ ජාතිය දනී ද, ... මෙසේ භවය දනී ද, ... මෙසේ උපාදාන දනී ද, ... මෙසේ තෘෂ්ණාව ... මෙසේ වේදනාව ... මෙසේ ස්පර්ශය ... මෙසේ ෂඩායතන ... මෙසේ නාමරූප ... මෙසේ විඥානය ... මෙසේ සංස්කාර දනී ද, මෙසේ සංස්කාර සමුදය දනී ද, මෙසේ සංස්කාර නිරෝධය දනී ද, මෙසේ සංස්කාර නිරෝධගාමිනී ප්‍රතිපදාව දනී ද, මහණෙනි, මේ මහණ තෙමේ දෘෂ්ටිසම්පන්න යි ද, දර්ශනසම්පන්න යි ද, මේ සද්ධර්මයට පැමිණියේ යි ද, මේ සද්ධර්මය දකී යි ද, ශෛක්ෂ-ඥානයෙන් සමන්වාගත යි ද, ශෛක්ෂ විද්‍යාවෙන් සමන්වාගත යි ද, ධර්මස්‍රෝතසට පැමිණියේ යි ද, ආර්ය වූ නිර්වේධිකප්‍රඥා ඇත්තේ යි ද, නිවන් දොරට හැපී සිටී යි ද කියනු ලැබේ

## 1. 3. 9.

## සමණබ්‍රාහ්මණ සූත්‍රය.

29. සැවැත්නුවර-

එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ නො දනිත් ද, ජරාමරණ සමුදය නො දනිත් ද, ජරාමරණ නිරෝධය නො දත් ද, ජරාමරණ නිරෝධගාමිනී ප්‍රතිපදාව නො දනිත් ද, ජාතිය නො දනිත් ද ... භවය නො දනිත් ද ... උපාදාන නො දනිත් ද ... තෘෂ්ණාව ... වේදනාව .... ස්පර්ශය ... ෂඩායතන ... නාමරූප ... විඥානය ... සංස්කාර නො දනිත් ද, සංස්කාර සමුදය නො දනිත් ද, සංස්කාර නිරෝධය නො දනිත් ද, සංස්කාර නිරෝධගාමිනී ප්‍රතිපදාව නො දනිත් ද, මහණෙනි, මේ මහණෝ හෝ බමුණෝ හෝ මහණුන් අතර හෝ මහණෝ ය යි හෝ සම්මත නො වෙති, බමුණන් අතර බමුණෝ ය යි හෝ සම්මත නො වෙති. මේ ආයුෂ්මත්හු ශ්‍රමණත්වය පිළිබඳ අර්ථය හෝ බ්‍රාහ්මණත්වය පිළිබඳ අර්ථය හෝ මෙලොවිහි දී ම තෙමේ ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ නො ද වෙසෙත්.

මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ දනිත් ද, ජරාමරණ සමුදය දනිත් ද, ජරාමරණ නිරෝධය දනිත් ද, ජරාමරණ නිරෝධගාමිනී ප්‍රතිපදාව දනිත් ද, ජාතිය දනිත් ද, භවය ... උපාදාන .... තණ්හාව ... වේදනාව ... ඵස්සය ... සළායතනය ... නාමරූප ... විඤ්ඤාණය...සඞ්ඛාර දනිත් ද, සඞ්ඛාර සමුදය දනිත් ද, සඞ්ඛාර නිරෝධය දනිත් ද, සඞ්ඛාරනිරෝධගාමිනී ප්‍රතිපදාව දනිත් ද; මහණෙනි, ඒ මේ මහණෝ ද බමුණෝ ද ශ්‍රමණයන් කෙරෙහිත් ශ්‍රමණ ය යි සම්මතය හ. බ්‍රාහ්මණයන් කෙරෙහිත් බ්‍රාහ්මණ ය යි සම්මත ය හ. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණත්වය පිළිබඳ අර්ථයත් බ්‍රාහ්මණත්වය පිළිබඳ අර්ථයත් මෙලොවිහි දී ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ වෙසෙති යි.

## 1 3. 10

## දුතියසමණබ්‍රාහ්මණසුත්තං

30. සාවත්ථියං-

තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

යෙ හි කෙචි භික්ඛවෙ. සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං නප්පජානන්ති, ජරාමරණසමුදයං නප්පජානන්ති, ජරාමරණනිරොධං නප්පජානන්ති, ජරාමරණනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති, තෙ වත ජරාමරණං සමතික්කම්ම ඨස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

[යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා] ජාතිං නප්පජානන්ති -පෙ- භවං -පෙ- උපාදානං -පෙ- තණ්හං -පෙ- වෙදනං -පෙ- ඵස්සං -පෙ- සළායතනං -පෙ- නාමරූපං -පෙ- විඤ්ඤාණං -පෙ- සඞ්ඛාරෙ නප්පජානන්ති, සඞ්ඛාරසමුදයං නප්පජානන්ති, සඞ්ඛාරනිරොධං නප්පජානන්ති, සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති, තෙ වත සඞ්ඛාරෙ සමතික්කම්ම ඨස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං පජානන්ති, ජරාමරණසමුදයං පජානන්ති, ජරාමරණනිරොධං පජානන්ති, ජරාමරණනිරොධගාමිනිං පටිපදං පජානන්ති, තෙ වත ජරාමරණං සමතික්කම්ම ඨස්සන්තීති ඨානමෙතං විජ්ජති.

[යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මා] ජාතිං පජානන්ති -පෙ- භවං -පෙ- උපාදානං -පෙ- තණ්හං -පෙ- වෙදනං -පෙ- ඵස්සං -පෙ- සළායතනං -පෙ- නාමරූපං -පෙ- විඤ්ඤාණං -පෙ- සඞ්ඛාරෙ පජානන්ති සඞ්ඛාරසමුදයං පජානන්ති, සඞ්ඛාරනිරොධං පජානන්ති සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං පජානන්ති, තෙ වත සඞ්ඛාරෙ සමතික්කම්ම ඨස්සන්තීති ඨානමෙතං විජ්ජතීති.

## දසබලවග්ගො තතියො

තස්සුද්දානං.

ද්වෙ දසබලා උපනිසා ච අඤ්ඤතිත්ථිය භූමිජො,
උපවාණො පච්චයො භික්ඛූ ද්වෙ ච සමණබ්‍රාහ්මණාති.

## 1. 3. 10

## දුතිය සමණබ්‍රාහමණ සූත්‍රය

30. **සැවැත් නුවර-**

එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ නො දනිත් ද, ජරාමරණ සමුදය නො දනිත් ද, ජරාමරණනිරෝධය නොදනිත් ද, ජරාමරණ නිරෝධගාමිනී ප්‍රතිපදාව නො දනිත් ද; ඔහු ඒකාන්තයෙන් ජරාමරණ ඉක්ම සිටින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ.

[මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ] ජාතිය නො දනිත් ද .... භවය ... උපාදාන ... තණ්හාව .... වේදනාව ... ඵස්සය ... සළායතන ... නාමරූප ... විඤ්ඤාණය ... සඞ්ඛාර නො දනිත් ද, සඞ්ඛාරසමුදය නො දනිත් ද, සඞ්ඛාරනිරෝධය නො දනිත් ද, සඞ්ඛාරනිරෝධගාමිනීප්‍රතිපදාව නො දනිත් ද, ඔහු ඒකාන්තයෙන් සංස්කාරයන් ඉක්ම සිටින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ.

මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ දනිත් ද, ජරාමරණ සමුදය දනිත් ද, ජරාමරණ නිරෝධය දනිත් ද, ජරාමරණ නිරෝධගාමිනී ප්‍රතිපදාව දනිත් ද, ඔහු ඒකාන්තයෙන් ජරාමරණ ඉක්ම සිටින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන වේ.

[මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ] ජාතිය දනිත් ද ... භවය ... උපාදාන ... තණ්හාව ... වේදනාව .. ඵස්සය ... සළායතන ... නාමරූප ... විඤ්ඤාණය ... සඞ්ඛාර දනිත් ද, සඞ්ඛාර සමුදය දනිත් ද, සඞ්ඛාර නිරෝධය දනිත් ද, සඞ්ඛාරනිරෝධගාමිනීප්‍රතිපදාව දනිත් ද; ඔහු ඒකාන්තයෙන් සංස්කාරයන් ඉක්ම සිටින්නාහු ය යන මේ කාරණය විද්‍යමාන වෙ යි.

**දශබලවර්ගය තෙවැනි යි.**

එහි උද්දානය:

දසබල සූත්‍ර දෙක ය, උපනිස, අඤ්ඤතිත්ථිය, භූමිජ, උපවාණ, පච්චය, භික්ඛු සූත්‍ර ද, සමණ බ්‍රාහමණ සූත්‍ර දෙකද යි සූත්‍ර දශයෙකි.

# 4. කළාරඛත්තියවග්ගො

## 1. 4. 1.

### භූතසුත්තං

31. සාවත්ථියං-

තත්‍ර ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි. වුත්තමිදං සාරිපුත්ත, පාරායණෙ[1] අජිතපඤ්හෙ:

"යෙ ච සඞ්ඛාත[2]ධම්මාසෙ යෙ ච සෙඛා[3] පුථූ ඉධ,
තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො[4] පබ්රූහි මාරිසා"ති.

ඉමස්ස නු ඛො සාරිපුත්ත, සඞ්ඛිත්තෙන භාසිතස්ස කථං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති. එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො තුණ්හී අහොසි. දුතියම්පි ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි. -පෙ- දුතියම්පි ඛො ආයස්මා සාරිපුත්තො තුණ්හී අහොසි.

තතියම්පි ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි: වුත්තමිදං සාරිපුත්ත පාරායණෙ අජිතපඤ්හෙ:

"යෙ ච සඞ්ඛාතධම්මාසෙ යෙ ච සෙඛා පුථූ ඉධ,
තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්රූහි මාරිසා"ති.

ඉමස්ස නු ඛො සාරිපුත්ත සඞ්ඛිත්තෙන භාසිතස්ස කථං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො?ති. එවං වුත්තෙ තතියම්පි ඛො ආයස්මා සාරිපුත්තො තුණ්හී අහොසි.

භූතමිදන්ති සාරිපුත්ත පස්සසීති. භූතමිදන්ති භන්තෙ යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති.* භූතමිදන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා භූතස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. තදාහාරසම්භවන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. තදාහාරසම්භවන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආහාරසම්භවස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. තදාහාරනිරොධා - යං භූතං තං නිරොධධම්මන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. තදාහාරනිරොධා - යං භූතං තං නිරොධධම්මන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා නිරොධධම්මස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. එවං ඛො භන්තෙ, සෙඛො හොති.

---

1. පාරායනෙ - මජසං, සයා, P.T.S. 2. සඞ්ඛත - සීමු.
3. සෙක්ඛා - මජසං, සයා. 4. පුට්ඨො ච - සයා, පුට්ඨො මෙ - P.T.S.

* "සම්මාපඤ්ඤාය පස්සතොති - සහවිපස්සනාය මග්ගපඤ්ඤාය සම්මා පස්සන්තස්ස" ඉති අට්ඨකථාගතපාඨො විමංසිතබ්බො.

# 4. කළාරඛත්තිය වර්ගය

## 1. 4. 1

### භූත සූත්‍රය

31. **සැවැත්නුවර-**

එහි දී භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් ඇමතූ සේක: ශාරීපුත්‍ර, මෙය පාරායණ වර්ගයෙහි අජිතප්‍රශ්නයෙහි කියන ලදී:

"මේ ශාසනයෙහි දත්තාලද දහම් ඇති යම් රහත්හු වෙද් ද, බොහෝ වූ යම් ශෛක්‍ෂයෝත් වෙද්ද, නිදුකානන් වහන්ස, මා විසින් විචාරණ ලද නුවණැති ඔබ වහන්සේ ඔවුන්ගේ පිළිවෙත වදාරණු මැනැවැ" යි.

ශාරීපුත්‍ර, සැකෙවින් කියන ලද මෙහි විතර විසින් කෙසේ අරුත් දක්ක යුතු ද? මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙමේ නිශ්ශබ්ද විය. දෙවනුත් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් ඇමතූ සේක. ... දෙවනුත් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙමේ නිශ්ශබ්ද විය.

තෙවනුත් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් ඇමතූ සේක: ශාරීපුත්‍ර, මෙය පාරායණ වර්ගයෙහි අජිතප්‍රශ්නයෙහි දී කියන ලදී:

"මේ ශාසනයෙහි දත්තා ලද දහම් ඇති යම් රහත්හු වෙද් ද, බොහෝ වූ යම් ශෛක්‍ෂයෝත් වෙද්ද නිදුකානන් වහන්ස, මා විසින් විචාරණ ලද නුවණැති ඔබ වහන්සේ ඔවුන්ගේ පැවැත්ම වදාරණු මැනවැ" යි.

ශාරීපුත්‍ර, සැකෙවින් කියන ලද මෙහි අරුත් විතර විසින් කෙසේ දක්ක යුතු ද? මෙසේ වදාළ කල්හි තෙවනුත් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙමේ නිශ්ශබ්ද විය.

ශාරීපුත්‍ර, මේ භූතය (හටගත් බැවින් 'භූත' නම් වූ ස්කන්ධපඤ්චකය) යි දක්හි යි වදාළ සේක. වහන්ස, මේ ස්කන්ධපඤ්චක ය යි සම්‍යක්ප්‍රඥාවෙන් තතු සේ දකී. මේ ස්කන්ධපඤ්චකය තතු සේ මනා නුවණින් දැක ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීම පිණිස නො ඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. ඒ ස්කන්ධපඤ්චකය ආහාරයෙන් හටගත්තේ ය යි තතු සේ මනා නුවණින් දකී. එය ආහාරයෙන් හටගත්තේ ය යි තතු සේ මනා නුවණින් දැක ආහාරයෙන් හටගත් ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීම පිණිස නො ඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ. ඒ ආහාර නිරෝධයෙන්-යමක් හටගත්තේ ද එය නිරෝධය සවභාව කොට ඇත්තේ ය යි තතු සේ මනා නුවණින් දකී. ඒ ආහාර නිරෝධයෙන් - යමක් හටගත්තේ ද එය නිරෝධය සවභාව කොට ඇත්තේ ය යි තතු සේ මනා නුවණින් දැක නිරෝධය සවභාව කොට ඇති ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීම පිණිස නො ඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. වහන්ස, මෙසේ ශෛක්‍ෂ වේ. (මෙයින් ශෛක්‍ෂයාගේ පිළිවෙත කියූ.)

කථඤ්ච භන්තෙ, සඞ්ඛාතධම්මො හොති? භූතමිදන්ති භන්තෙ යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. භූතමිදන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා භූතස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති. තදාහාරසම්භවන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. තදාහාරසම්භවන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආහාරසම්භවස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති. තදාහාරනිරොධා - යං භූතං තං නිරොධධම්මන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. තදාහාරනිරොධා යං භූතං තං නිරොධධම්මන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා නිරොධධම්මස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති. එවං ඛො භන්තෙ සඞ්ඛාතධම්මො හොති.

ඉති ඛො භන්තෙ යං තං වුත්තං පාරායණෙ අජිතපඤ්හෙ:

"යෙ ච සඞ්ඛාතධම්මාසෙ යෙ ච සෙඛා පුථූ ඉධ,
තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්‍රූහි මාරිසා"ති

ඉමස්ස ඛ්වාහං භන්තෙ සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති.

සාධු, සාධු, සාරිපුත්ත. භූතමිදන්ති සාරිපුත්ත, යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. භූතමිදන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා භූතස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. තදාහාරසම්භවන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. තදාහාරසම්භවන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආහාරසම්භවස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. තදාහාරනිරොධා - යං භූතං තං නිරොධධම්මන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. තදාහාරනිරොධා- යං භූතං තං නිරොධධම්මන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා නිරොධධම්මස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. එවං ඛො සාරිපුත්ත සෙඛො හොති.

කථඤ්ච සාරිපුත්ත, සඞ්ඛාතධම්මො හොති? භූතමිදන්ති සාරිපුත්ත, යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. භූතමිදන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා භූතස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති. තදාහාර - සම්භවන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. තදාහාරසම්භවන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආහාරසම්භවස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති. තදාහාරනිරොධා - යං භූතං තං නිරොධධම්මන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. තදාහාරනිරොධා- යං භූතං තං නිරොධ-ධම්මන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා නිරොධධම්මස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති. එවං ඛො සාරිපුත්ත, සඞ්ඛාත-ධම්මො හොති.

වහන්ස, කෙසේ නම් දත්තා ලද දහම් ඇත්තේ වේ ද? වහන්ස, මේ ස්කන්ධපඤ්චකය යි තතුසේ මනා නුවණින් දකී. මේ ස්කන්ධපඤ්චකය තතුසේ මනා නුවණින් දැක ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීමෙන් නො ඇලීමෙන් නිරොධයෙන් උපාදාන විසින් නො ගෙණ මිදුනේ වේ තෙල ස්කන්ධ-පඤ්චකය ආහාරයෙන් හටගත්තේ ය යි තතු සේ මනා නුවණින් දකී. එය ආහාරයෙන් හටගත්තේ යයි තතු සේ මනා නුවණින් දැක ආහාරයෙන් හටගත් පඤ්චස්කන්ධය පිළිබඳ කලකිරීමෙන් නො ඇලීමෙන් නිරෝධයෙන් උපාදාන විසින් නො ගෙණ මිදුනේ වේ. ඒ ආහාර නිරෝධයෙන් – යමක් හටගත්තේ ද එය නිරෝධ සවභාව කොට ඇත්තේ ය යි තතු සේ මනා නුවණින් දකී. ඒ ආහාර නිරෝධයෙන් – යමක් හටගත්තේ ද එය නිරෝධ සවභාව කොට ඇත්තේ ය යි තතු සේ මනානුවණින් දැක නිරෝධ සවභාව කොට ඇති ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීමෙන් නො ඇලීමෙන් නිරෝධයෙන් උපාදාන විසින් නො ගෙණ මිදුනේ වේ. වහන්ස, මෙසේ දත්තා ලද දහම් ඇත්තේ වේ. (මෙයින් රහත්හුගේ පිළිවෙත කියූ.)

වහන්ස, මෙසේ පාරායණ වර්ගයෙහි අජිතප්‍රශ්නයෙහි ඒ යමක් කියන ලදද:

"මේ ශාසනයෙහි දත්තා ලද දහම් ඇති යම් රහත්හු වෙද්ද, බොහෝ වූ යම් ශෛක්‍ෂයෝත් වෙද්ද, නිදුකානන් වහන්ස, මා විසින් විචාරණ ලද නුවණැති ඔබ වහන්සේ ඔවුන්ගේ පිළිවෙත වදාරණු මැනැවැ"යි –

වහන්ස, සැකෙවින් කියන ලද මෙහි අරුත් විතර විසින් මෙසේ මම දනිමි යි.

ශාරිපුත්‍ර, මැනැවි, මැනැවි. ශාරිපුත්‍ර, මේ ස්කන්ධපඤ්චක ය යි තතු සේ මනානුවණින් දකී. මේ ස්කන්ධපඤ්චකය තතු සේ මනා නුවණින් දැක ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීම පිණිස නො ඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. එය ආහාරයෙන් හටගත්තේ ය යි තතු සේ මනා නුවණින් දකී. එය ආහාරයෙන් හටගත්තේ ය යි තතු සේ මනා නුවණින් දැක ආහාරයෙන් හටගත් ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීම පිණිස නො ඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. ඒ ආහාර නිරෝධයෙන් – යමක් හටගත්තේ ද එය නිරෝධය සවභාව කොට ඇත්තේ ය යි තතු සේ මනා නුවණින් දකී. ඒ ආහාර නිරෝධයෙන් – යමක් හටගත්තේ ද එය නිරෝධය සවභාව කොට ඇත්තේ ය යි තතු සේ මනා නුවණින් දැක නිරෝධසවභාව කොට ඇති ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීම පිණිස නො ඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. ශාරිපුත්‍ර, මෙසේ ශෛක්‍ෂ වෙයි

ශාරිපුත්‍ර, කෙසේ නම් සඞ්ඛ්‍යාතධර්මී ඇත්තේවේ ද යත්: ශාරිපුත්‍ර, මේ ස්කන්ධපඤ්චක ය යි තතු සේ මනානුවණින් දකී මේ ස්කන්ධපඤ්චක ය යි තතු සේ මනා නුවණින් දැක ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීමෙන් නො ඇලීමෙන් නිරෝධයෙන් උපාදාන විසින් නො ගෙණ මිදුනේ වේ. එය ආහාරයෙන් හටගත්තේ ය යි තතු සේ මනානුවණින් දකී. එය ආහාරයෙන් හටගත්තේ ය යි තතු සේ මනානුවණින් දැක ආහාරයෙන් හටගත් ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීමෙන් නො ඇලීමෙන් නිරෝධයෙන් උපාදාන විසින් නො ගෙණ මිදුනේ වේ. ඒ ආහාර නිරෝධයෙන්– යමක් හටගත්තේ ද එය නිරෝධය සවභාව කොට ඇත්තේ ය යි තතු සේ මනා නුවණින් දකී. ඒ ආහාර නිරෝධයෙන් – යමක් හටගත්තේ ද එය නිරෝධය සවභාව කොට ඇත්තේ ය යි තතු සේ මනා නුවණින් දැක නිරෝධය සවභාව කොට ඇති ස්කන්ධපඤ්චකය පිළිබඳ කලකිරීමෙන් නො ඇලීමෙන් නිරෝධයෙන් උපාදාන විසින් නො ගෙණ මිදුනේ වේ. ශාරිපුත්‍ර, මෙසේ සඞ්ඛ්‍යාතධර්මී ඇත්තේ වේ

ඉති ඛො සාරිපුත්ත, යං තං වුත්තං පාරායණෙ අජිතපඤ්හෙ:

"යෙ ච සඞ්ඛාතධම්මාසෙ යෙ ච සෙඛා පුථූ ඉධ,
තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්‍රූහි මාරිසා"ති.

ඉමස්ස ඛො සාරිපුත්ත, සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

## 1. 4. 2.

## කළාරසුත්තං

32. **සාවත්ථියං**-

අථ ඛො **කළාරඛත්තියො** භික්ඛු යෙනායස්මා **සාරිපුත්තො** තෙනුප-සඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො කළාරඛත්තියො භික්ඛු ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

**මොළියඵග්ගුනො** ආවුසො සාරිපුත්ත, භික්ඛු සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තොති. නහ නූන සො ආයස්මා ඉමස්මිං ධම්මවිනයෙ අස්සාසමලත්ථාති. තෙන හායස්මා සාරිපුත්තො ඉමස්මිං ධම්මවිනයෙ අස්සාසං පත්තොති. "න ඛ්වාහං ආවුසො කඞ්ඛාමී"ති. ආයතිම්පනාවුසොති? "න ඛ්වාහං ආවුසො, විචිකිච්ඡාමී"ති.

අථ ඛො කළාරඛත්තියො භික්ඛු උට්ඨායාසනා යෙන භගවා තෙනුප-සඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො කළාරඛත්තියො භික්ඛු භගවන්තං එතදවොච: ආයස්මතා භන්තෙ, සාරිපුත්තෙන අඤ්ඤා බ්‍යාකතා "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති.

අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: එහි ත්වං භික්ඛු මම වචනෙන සාරිපුත්තං ආමන්තෙහි "සත්ථා තං ආවුසො සාරිපුත්ත ආමන්තෙතී"ති. එවං භන්තෙති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "සත්ථා තා ආවුසො සාරිපුත්ත ආමන්තෙතී"ති. එවමාවුසොති ඛො ආයස්මා සාරිපුත්තො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සාරිපුත්තං භගවා එතදවොච:

ශාරීපුත්‍ර, මෙසේ පාරායණ වර්ගයෙහි අජිතප්‍රශ්නයෙහි දී ඒ යමක් කියන ලද දː

"මේ ශාසනයෙහි දන්නා ලද දහම් ඇති යම් රහත්හු ත් වෙද්ද, බොහෝ වූ යම් ශෛක්ෂයෝත් වෙද්ද, නිදුකානන් වහන්ස, මා විසින් විචාරණ ලද නුවණැති ඔබ වහන්සේ ඔවුන්ගේ විහරණය වදාරණු මැනවැ" යි-

ශාරීපුත්‍ර, සැකෙවින් කියන ලද මෙහි අරුත් විතර විසින් මෙසේ දක්ක යුත්තේ යි.

## 1. 4. 2.

## කළාර සූත්‍රය

32. **සැවැත්නුවර-**

ඉක්බිති කළාරඛත්තිය මහණ තෙමේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වී ය. සතුටු විය යුතු සිහි කට යුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් කළාරඛත්තිය මහණ තෙමේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය සැළ කෙළේ ය.

ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, මොළියඵග්ගුණ මහණ තෙමේ ශික්ෂාව හැර දමා ගිහිබවට පෙරළුනේ ය. ඒ ආයුෂ්මත් තෙමේ ඒකාන්තයෙන් මෙසස්නෙහි පිහිටක් නො ලැබී ය. එහෙත් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසස්නෙහි පිහිට ලැබූ සේක. "ඇවැත්නි, මම සැක නො ම කරමි". ඇවැත්නි, මතු පිළිසඳ කෙසේ ද? "ඇවැත්නි, මම විචිකිච්ඡා නො ම කරමි".

ඉක්බිති කළාරඛත්තිය මහණ තෙමේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්-පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් කළාරඛත්තිය මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසින් 'ජාතිය ක්ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදී. කට යුතු කරණ ලදී. මේ රහත්බව පිණිස අනෙකක් නැතැ' යි මෙසේ රහත්බව පවසන ලදැ" යි තෙල සැළ කෙළේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණකු ඇමතූ සේකː මහණ, එව, තෙපි මාගේ වචනයෙන් "ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, ශාස්තෲන් වහන්සේ තොප අමතන සේකැ" යි සැරියුත් අමතවුයි. ඒ මහණ තෙමේ වහන්ස, එසේ ය යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට "ඇවැත්නි, ශාරීපුත්‍ර යෙනි, ශාස්තෲන් වහන්සේ තොප කැඳවන සේකැ" යි මෙය කී ය. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙමේ ඇවැත්නි, එසේ ය යි ඒ මහණහට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්-පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේකː

සච්චං කිර තයා සාරිපුත්ත, අඤ්ඤා බ්‍යාකතා "ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං. නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති? න බො භන්තෙ, එතෙහි පදෙහි එතෙහි බ්‍යඤ්ජනෙහි. අත්ථො[1] ච වුත්තොති. යෙන කෙනචිපි සාරිපුත්ත, පරියායෙන කුලපුත්තො අඤ්ඤං බ්‍යාකරොති, අථ බො බ්‍යාකතං බ්‍යාකතතො දට්ඨබ්බන්ති. නනු අහම්පි භන්තෙ, එවං වදාමි: "න බො භන්තෙ, එතෙහි පදෙහි එතෙහි බ්‍යඤ්ජනෙහි අත්ථො ච වුත්තො"ති.

සචෙ තං සාරිපුත්ත, එවං පුච්ඡෙය්‍යුං: කථං ජානතා පන තයා ආවුසො සාරිපුත්ත, කථං පස්සතා අඤ්ඤා බ්‍යාකතා "ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං. නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති එවං පුට්ඨො ත්වං සාරිපුත්ත, කින්ති බ්‍යාකරෙය්‍යාසීති?

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං: කථං ජානතා පන තයා ආවුසො සාරිපුත්ත, කථං පස්සතා අඤ්ඤා බ්‍යාකතා, "ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං. නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. එවං පුට්ඨොහමහං භන්තෙ. එවං බ්‍යාකරෙය්‍යං:

"යන්නිදානාවුසො ජාති, තස්ස නිදානස්ස ඛයා ඛීණස්මිං ඛීණම්හීති[2] විදිතං. ඛීණස්මිං ඛීණම්හීති විදිත්වා, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. එවං පුට්ඨොහමහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යන්ති.

සචෙ පන තං සාරිපුත්ත, එවං පුච්ඡෙය්‍යුං: ජාති පනාවුසො සාරිපුත්ත, කිංනිදානා? කිංසමුදයා? කිංජාතිකා? කිම්පභවාති? එවං පුට්ඨො ත්වං සාරිපුත්ත, කින්ති බ්‍යාකරෙය්‍යාසීති?

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං: ජාති පනාවුසො සාරිපුත්ත, කින්නිදානා? කිංසමුදයා? කිංජාතිකා? කිම්පභවාති? එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යං: "ජාති බො ආවුසො, භවනිදානා, භවසමුදයා භවජාතිකා, භවප්පභවාති. එවං පුට්ඨොහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යන්ති.

සචෙ පන තං සාරිපුත්ත, එවං පුච්ඡෙය්‍යුං: භවො පනාවුසො සාරිපුත්ත, කින්නිදානො? කිංසමුදයො? කිංජාතිකො? කිම්පභවොති? එවං පුට්ඨො ත්වං සාරිපුත්ත, කින්ති බ්‍යාකරෙය්‍යාසීති?

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං: භවො පනාවුසො සාරිපුත්ත, කින්නිදානො? කිංසමුදයො? කිංජාතිකො? කිම්පභවො? ති එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යං: භවො බො ආවුසො උපාදානනිදානො, උපාදාන-සමුදයො, උපාදානජාතිකො, උපාදානප්පභවොති. එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යන්ති.

---

1 අත්ථො - මජසං 2. ඛීණම්හීති - මජසං

ශාරිපුත්‍ර, තොප විසින් "ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදී. කට යුතු කරණ ලදී. මේ රහත්බව පිණිස අනෙකක් නැතැයි මෙසේ දනිමි"යි රහත්බව පවසන ලද්දේ සැබෑ ද? වහන්ස, මේ පදවලින් මේ ව්‍යඤ්ජනවලින් තොම කීමි. එහෙත් මා විසින් අර්‍ථය (=රහත්බව) කියන ලදී. ශාරිපුත්‍ර, කුලපුත්තෙමේ යම් කිසි ක්‍රමයකිනුදු රහත්බව පවසයි. වැලිදු පවසන ලද්ද පවසන ලද්ද වශයෙන් දක්ක යුතු ය. වහන්ස, "මේ පදවලින් මේ ව්‍යඤ්ජනවලින් තොම කීමි. එහෙත් මා විසින්අර්‍ථය කියන ලද්දේ ය" යි වහන්ස, මම ද මෙසේ නො කියම් ද?

ශාරිපුත්‍ර, ඉදින් "කෙසේ දන්නා වූ කෙසේ දක්නා වූ තොප විසින් 'ජාතිය ක්‍ෂය වූවා ය, බඹසර වැස නිමවන ලදී, කටයුතු කරණ ලදී, මේ රහත්බව පිණිස අනෙකක් නැතැයි දනිමි'යි රහත්බව පවසන ලදද" යි මෙසේ තොප විචාරන්නාහු නම් ශාරිපුත්‍ර, එසේ විචාරණ ලද තෙපි කුමැ යි ප්‍රකාශ කරවු ද?

වහන්ස, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, කෙසේ දන්නා වූ කෙසේ දක්නා වූ තොප විසින් 'ජාතිය ක්‍ෂය වූවා ය, බඹසර වැස නිමවන ලදී, කටයුතු කරණ ලදී, මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දනිමි' යි රහත් බව පවසන ලදද" යි මෙසේ මා විචාරන්නාහු නම්, වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ ප්‍රකාශ කරන්නෙමි:

"ඇවැත්නි, ජාතිය යමක් නිදාන කොට ඇත්තී ද, ඒ නිදානය ගෙවී යෑමෙන් ක්‍ෂය වූ කල ක්‍ෂය වී යයි දන්නා ලදී. ක්‍ෂය වූ කල ක්‍ෂය වූයේ යයි දැන, ජාතිය ක්‍ෂය වූවා, බඹසර වැස නිමවන ලදී, කට යුතු කරණ ලදී, මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දනිමි" යි වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි.

ශාරිපුත්‍ර, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, ජාතිය කුමක් නිදාන කොට ඇත්තී ද, කුමක් කාරණ කොට ඇත්තී ද, කුමක් ඉපැද්ම කොට ඇත්තී ද, කුමක් ප්‍රභව කොට ඇත්තී ද" යි මෙසේ තොප විචාරන්නාහු නම්, ශාරිපුත්‍ර, එසේ විචාරණ ලද තෙපි කුමැ යි පවසන්නාහු ද?

වහන්ස, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, ජාතිය කුමක් නිදාන කොට, කුමක් කාරණ කොට, කුමක් ජාති කොට, කුමක් ප්‍රභව කොට ඇත්තී ද යි මෙසේ මා විචාරන්නාහු නම්, වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි: ඇවැත්නි, ජාතිය භවය නිදාන කොට, භවය හටගැණීම් කොට, භවය ඉපැද්ම කොට, භවය ප්‍රභව කොට ඇත්තී ය යි වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි.

ශාරිපුත්‍ර, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, භවය කුමක් නිදාන කොට කුමක් හටගැණීම් කොට, කුමක් ඉපැද්ම කොට, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද?" යි මෙසේ තොප විචාරන්නාහු නම්,: ශාරිපුත්‍ර, එසේ විචාරණ ලද තෙපි කුමැ යි ප්‍රකාශ කරන්නාහු ද?

වහන්ස, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, භවය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් හටගැණීම් කොට ඇත්තේ ද, කුමක් ඉපැද්ම කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද"යි මෙසේ මා විචාරන්නාහු නම්, වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි: ඇවැත්නි, භවය උපාදාන නිදාන කොට ඇත්තේ ය, උපාදාන හටගැණීම් කොට ඇත්තේ ය, උපාදාන ඉපැද්ම කොට ඇත්තේ ය, උපාදාන ප්‍රභව කොට ඇත්තේ ය යි. වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි.

සචෙ පන තං සාරිපුත්ත, එවං පුච්ඡෙය්‍යුං· උපාදානං පනාවුසො සාරිපුත්ත, කින්නිදානං? කිංසමුදයං? කිඤ්ජාතිකං? කිම්පභවන්ති? එවං පුට්ඨො ත්වං සාරිපුත්ත, කින්ති බ්‍යාකරෙය්‍යාසීති.

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං: "උපාදානං පනාවුසො සාරිපුත්ත, කින්නිදානං කිංසමුදයං? කිඤ්ජාතිකං? කිම්පභවන්ති?" එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යං: උපාදානං ඛො ආවුසො තණ්හා නිදානං, තණ්හා සමුදයං, තණ්හා ජාතිකං, තණ්හා පභවන්ති. එවං පුට්ඨොහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යන්ති.

සචෙ පන තං සාරිපුත්ත, එවං පුච්ඡෙය්‍යුං: තණ්හා පනාවුසො සාරිපුත්ත කින්නිදානා? කිංසමුදයා? කිංජාතිකා? කිම්පභවාති? එවං පුට්ඨො ත්වං සාරිපුත්ත, කින්ති බ්‍යාකරෙය්‍යාසීති?

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං: තණ්හා පනාවුසො සාරිපුත්ත, කින්නිදානා කිංසමුදයා කිඤ්ජාතිකා කිම්පභවාති? එවං පුට්ඨොහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං: තණ්හා ඛො ආවුසො වෙදනානිදානා, වෙදනාසමුදයා, වෙදනාජාතිකා, වෙදනාපභවාති. එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යන්ති.

සචෙ පන තං සාරිපුත්ත, එවං පුච්ඡෙය්‍යුං, වෙදනා පනාවුසො සාරිපුත්ත, කින්නිදානා? කිංසමුදයා? කිඤ්ජාතිකා? කිම්පභවාති? එවං පුට්ඨො ත්වං සාරිපුත්ත, කින්ති බ්‍යාකරෙය්‍යාසීති?

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං: වෙදනා පනාවුසො සාරිපුත්ත, කින්නිදානා කිංසමුදයා කිඤ්ජාතිකා කිම්පභවාති. එවං පුට්ඨොහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං: වෙදනා ඛො ආවුසො ඵස්සනිදානා ඵස්සසමුදයා ඵස්සජාතිකා ඵස්සප්පභවාති. එවං පුට්ඨොහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යන්ති.

සචෙ පන තං සාරිපුත්ත, එවං පුච්ඡෙය්‍යුං: කථං ජානතො පන තෙ ආවුසො සාරිපුත්ත, කථං පස්සතො යා වෙදනාසු නන්දී සා න උපට්ඨාසීති? එවං පුට්ඨො ත්වං සාරිපුත්ත, කින්ති ව්‍යාකරෙය්‍යාසීති?

සචෙ ම භන්තෙ එවං පුච්ඡෙය්‍යුං: කථං ජානතො පන තෙ ආවුසො සාරිපුත්ත, කථං පස්සතො යා වෙදනාසු නන්දී සා න උපට්ඨාසීති, එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යං: තිස්සො ඛො ඉමා ආවුසො වෙදනා, කතමා තිස්සො? සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා, ඉමා ඛො ආවුසො, තිස්සො වෙදනා අනිච්චා. යදනිච්චං තං දුක්ඛන්ති විදිතං. යා වෙදනාසු නන්දී සා න උපට්ඨාසීති.[1] එවං පුට්ඨොහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යන්ති.

---

1. යා වෙදනාසු න සා නන්දී උපට්ඨාසීති - සීමු.

ශාරිපුත්‍ර, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, උපාදානය කුමක් නිදාන කොට ඇත්ද? කුමක් කාරණ කොට ඇත්ද? කුමක් ජාති කොට ඇත්ද? කුමක් ප්‍රභව කොට ඇත්ද?" මෙසේ තොප විචාරන්නාහු නම් ශාරිපුත්‍රය, මෙසේ විචාරණ ලද තෙපි කුමැයි පවසන්නහු ද?

වහන්ස, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, උපාදානය කුමක් නිදාන කොට කුමක් කාරණ කොට කුමක් ජාති කොට කුමක් ප්‍රභව කොට ඇත්ද? වහන්ස, මෙසේ මා විචාරන්නාහු නම් එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි: ඇවැත්නි, උපාදානය තණ්හාව නිදාන කොට ඇත. තණ්හාව කාරණ කොට ඇත. තණ්හාව ජාති කොට ඇත. තණ්හාව ප්‍රභව කොට ඇතැයි. වහන්ස, මෙසේ විචාරණ ලද්දෙම් මෙසේ පවසන්නෙමි.

ශාරිපුත්‍ර, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, තෘෂ්ණාව කුමක් නිදාන කොට ඇත් ද? කුමක් සමුදය කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද?" යි මෙසේ තොප විචාරන්නාහු නම්, ශාරිපුත්‍ර, මෙසේ විචාරණ ලද තෙපි කුමැ යි පවසන්නහු ද?

වහන්ස, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, තෘෂ්ණාව කුමක් නිදාන කොට ඇත් ද? කුමක් සමුදය කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද?"යි මෙසේ මා විචාරන්නාහු නම්, වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි, ඇවැත්නි, තෘෂ්ණාව වේදනාව නිදාන කොට ඇත. වේදනාව සමුදය කොට ඇත. වේදනාව ජාති කොට ඇත වේදනාව ප්‍රභව කොට ඇතැ යි. වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි.

ශාරිපුත්‍ර, "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, වේදනාව කුමක් නිදාන කොට ඇත් ද? කුමක් සමුදය කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද?" යි මෙසේ තොප විචාරන්නාහු නම්, ශාරිපුත්‍ර, මෙසේ විචාරණ ලද තෙපි කුමැයි ප්‍රකාශ කරන්නහු ද?

වහන්ස, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, වේදනාව කුමක් නිදාන කොට ඇත් ද? කුමක් සමුදය කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද?" යි මෙසේ මා විචාරන්නාහු නම්, වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි: ඇවැත්නි, වේදනාව ස්පර්ශය නිදාන කොට ඇත. ස්පර්ශය කාරණා කොට ඇත. ස්පර්ශය ජාති කොට ඇත්තී ය. ස්පර්ශය ප්‍රභව කොට ඇත්තී ය යි. වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි.

ශාරිපුත්‍ර, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, කෙසේ දන්නා වූ කෙසේ දක්නා වූ තොපට වේදනාවන්හි යම් තෘෂ්ණාවක් වේ නම් එය නො වැටහුනේ ද?" යි මෙසේ තොප විචාරන්නාහු නම්: ශාරිපුත්‍ර, මෙසේ විචාරණ ලද තෙපි කුමැයි පවසන්නහු ද?

වහන්ස, ඉදින් "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, කෙසේ දන්නා වූ කෙසේ දක්නා වූ තොපට වේදනාවන්හි යම් තෘෂ්ණාවක් වේ නම් එය නො වැටහුනේ ද"? යි මෙසේ මා විචාරන්නාහු නම්, වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි: ඇවැත්නි, මේ වේදනා තුනෙකි. කවර තුනෙක් ද යත්: සැප වේදනාව ය, දුක් වේදනාව ය, මැදහත් වේදනාව ය යි. ඇවැත්නි, මේ වේදනාත්‍රිකය අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් ඒ දුකැයි දන්නා ලදී. (එහෙයින්) වේදනාවන්හි යම් තෘෂ්ණායෙක් වේ නම් එය (මා ගුවත) නො සිටියේ ය යි. වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි.

සාධු, සාධු, සාරිපුත්ත. අයම්පි ඛො සාරිපුත්ත, පරියායො එතස්සෙව අත්ථස්ස සඞ්ඛිත්තෙන වෙය්‍යාකරණාය:[1] යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මින්ති.

සචෙ පන තං සාරිපුත්ත, එවං පුච්ඡෙය්‍යුං: කථං විමොක්ඛා පන තයා ආවුසො සාරිපුත්ත, අඤ්ඤා බ්‍යාකතා “ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී”ති. එවං පුට්ඨො ත්වං සාරිපුත්ත කින්ති බ්‍යාකරෙය්‍යාසීති.?

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං: කථං විමොක්ඛා පන තයා ආවුසො සාරිපුත්ත, අඤ්ඤා බ්‍යාකතා “ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී”ති එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යං: අජ්ඣත්තවිමොක්ඛා[2]ඛ්වාහං ආවුසො සබ්බුපාදානක්ඛයා[3] තථා සතො විහරාමි, යථා සතං විහරන්තං ආසවා නානුස්සවන්ති, අත්තානඤ්ච නාවජානාමීති. එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යන්ති.

සාධු සාධු, සාරිපුත්ත. අයම්පි ඛො සාරිපුත්ත, පරියායො එතස්සෙව අත්ථස්ස සඞ්ඛිත්තෙන වෙය්‍යාකරණාය: “යෙ ආසවා සමණෙන වුත්තා, තෙස්වාහං න කඞ්ඛාමි. තෙ මෙ පහීණාති න විචිකිච්ඡාමී”ති. ඉදමවොච භගවා, ඉදං වත්වාන[4] සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො අචිරපක්කන්තස්ස භගවතො භික්ඛූ ආමන්තෙසි: පුබ්බෙ අප්පටිසංවිදිතං මං ආවුසො භගවා පඨමං පඤ්හං අපුච්ඡි. තස්ස මෙ අහොසි දන්ධායිතත්තං. යතො ච ඛො මෙ ආවුසො භගවා පඨමං පඤ්හං අනුමොදි, තස්ස මය්හං ආවුසො එතදහොසි:

“දිවසඤ්චෙපි මං භගවා එතමත්ථං පුච්ඡෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, දිවසම්පහං[5] භගවතො එතමත්ථං බ්‍යාකරෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි.

රත්තිඤ්චෙපි මං භගවා එතමත්ථං පුච්ඡෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, රත්තිම්පහං[6] භගවතො එතමත්ථං බ්‍යාකරෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි.

රත්තින්දිවං චෙපි මං භගවා එතමත්ථං පුච්ඡෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, රත්තින්දිවම්පහං භගවතො එතමත්ථං ව්‍යාකරෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි.

---

1. බ්‍යාකරණාය - සීමු.
2. අජ්ඣත්තං විමොක්ඛා - මජසං, සීමු, P.T.S. සී 1, 2. 3. සඞ්ඛයාය - සීමු.
4. වත්වා - සී 1, 2. 5. දිවසම්පාහං — මජසං. 6. රත්තිම්පාහං — මජසං.

ශාරීපුත්‍ර, මැනැවි. මැනැවි. ශාරීපුත්‍ර, යම් කිසි වේදනාවක් වේ නම් ඒ දුකැයි යන මේ අරුත ම සැකෙවින් පැවසීමට මෙ ද නයෙකි.

ශාරීපුත්‍ර, ඉදින් "ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, තොප විසින් 'ජාතිය ක්‍ෂය වූවා ය බඹසර වැස නිමවන ලදී. කට යුතු කරණ ලදී. මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දනිමි' යි කවර විමොක්‍ෂයකින් අර්හත්වය පවසන ලද්දේ දැ" යි මෙසේ තොප විචාරන්නාහු නම්, ශාරීපුත්‍ර, එසේ විචාරණ ලද තෙපි කුමැයි පවසන්නහු ද?

වහන්ස, ඉදින් "ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, 'ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදී, කට යුතු කරණ ලදී, මේ බව පිණිස අනෙකක් නැතැයි දනිමි'යි කවර විමොක්‍ෂයකින් අර්හත්ත්වය පවසන ලද්දේ දැ?"යි මෙසේ මා විචාරන්නාහු නම්, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි: "ඇවැත්නි, යම් සේ සිහි ඇති ව වෙසෙන මට ආස්‍රවයෝ නො පවතිද්ද, (ප්‍රඥව ප්‍රසන්න බැවින්) තමාට ද අවමන් නො කෙරෙම් ද, ඒ අජ්ඣත්ත-විමොක්ඛයෙන් (=ආධ්‍යාත්මික සංස්කාරයන් පරිග්‍රහණය කොට ලද අර්හත්ත්ව-යෙන් සියලු උපාදානයන් ක්‍ෂය කිරීමෙන් මම එසේ සිහි ඇති ව වෙසෙමි"යි. වහන්ස, එසේ විචාරණ ලද මම මෙසේ පවසන්නෙමි.

ශාරීපුත්‍ර, මැනවි, මැනවි. ශාරීපුත්ත්‍ර, "යම් ආස්‍රව කෙනෙක් බුද්ධශ්‍රමණයන් වහන්සේ විසින් වදාරණ ලද්දාහු ද, මම ඔවුන් කෙරෙහි සැක නොකෙරෙමි. ඒ ආස්‍රවයෝ මට ප්‍රහීණ වූවාහු ය යි විචිකිච්ඡා නො කෙරෙමි"යි යන මේ අරුත ම සැකෙවින් පැවසීමට මෙ ද නයෙකියි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගතයන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැගී වෙහෙරට පිවිසි සේක.

එහි දී ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් භික්‍ෂූන් ඇමතූහ: ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ පෙර මවිසින් නො දන්නා ලද පළමු වන ප්‍රශ්නය මාගෙන් විචාළ සේක. ඒ මට ලැසිබවෙක් වී ය ඇවැත්නි, යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ මවිසින් විසඳන ලද මාගේ පළමු වන ප්‍රශ්නය අනුමෝදන් වූ සේක් ද, ඇවැත්නි, ඒ මට මේ අදහස පහළ විය:

ඉදින් භාග්‍යවතුන් වහන්සේ මුළු දහවලක් ම වෙනස් වෙනස් පෙදෙන් වෙන් වෙන් නයින් මේ අරුත මගෙන් පුළුවුස්නා සේක් නම් මුළු දහවල ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් මම මේ අරුත භාග්‍යවතුන් වහන්සේට පවසන්නෙමි.

ඉදින් භාග්‍යවතුන් වහන්සේ මුළු රැයක් ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් මේ අරුත මගෙන් පුළුවුස්නා සේක් නම් මුළු රැය ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් මම මේ අරුත භාග්‍යවතුන් වහන්සේට පවසන්නෙමි.

ඉදින් භාග්‍යවතුන් වහන්සේ මුළු රෑ දවලක් ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් මේ අරුත මගෙන් පුළුවුස්නා සේක් නම් මුළු රෑදවලම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් මම භාග්‍යවතුන් වහන්සේට මේ අරුත පවසන්නෙමි.

ද්වෙ රත්තින්දිවානි චෙපි මං භගවා එතමත්ථං පුච්ඡෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, ද්වෙ රත්තින්දිවානිපහං භගවතො එතමත්ථං බ්‍යාකරෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි

තීනි රත්තින්දිවානි චෙපි මං භගවා -පෙ- චත්තාරි රත්තින්දිවානි චෙපි මං භගවා -පෙ- පඤ්ච රත්තින්දිවානි චෙපි මං භගවා -පෙ- ඡ රත්තින්දිවානි චෙපි මං භගවා භගවා -පෙ- සත්ත රත්තින්දිවානි චෙපි මං භගවා එතමත්ථං පුච්ඡෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, සත්ත රත්තින්දිවානිපහං භගවතො එතමත්ථං බ්‍යාකරෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහීති.

අථ ඛො කළාරඛත්තියො භික්ඛු උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමි. -පෙ- එකමන්තං නිසින්නො ඛො කළාරඛත්තියො භික්ඛු භගවන්තං එතදවොච:

ආයස්මතා භන්තෙ, සාරිපුත්තෙන සීහනාදො නදිතො: "පුබ්බෙ අප්පටිසංවිදිතං මං ආවුසො, භගවා පඨමං පඤ්හං ආපුච්ඡි.[1] තස්ස මෙ අහොසි දන්ධායිතත්තං. යතො ච ඛො මෙ ආවුසො භගවා පඨමං පඤ්හං අනුමොදි තස්ස මය්හං ආවුසො එතදහොසි:

"දිවසඤ්චෙපි මං භගවා එතමත්ථං පුච්ඡෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, දිවසම්පහං භගවතො එතමත්ථං බ්‍යාකරෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි.

රත්තිඤ්චෙපි[2] මං භගවා එතමත්ථං පුච්ඡෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, රත්තිම්පහං භගවතො එතමත්ථං බ්‍යාකරෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි.

රත්තින්දිවං චෙපි මං භගවා -පෙ- ද්වෙ රත්තින්දිවානි චෙපි මං භගවා -පෙ- තීණි රත්තින්දිවානි චෙපි මං භගවා -පෙ- චත්තාරි රත්තින්දිවානි චෙපි මං භගවා -පෙ- පඤ්ච රත්තින්දිවානි චෙපි මං භගවා -පෙ- ඡ රත්තින්දිවානි චෙපි මං -පෙ- සත්ත රත්තින්දිවානි චෙපි මං භගවා එතමත්ථං පුච්ඡෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, සත්ත රත්තින්දිවානිපහං භගවතො එතමත්ථං බ්‍යාකරෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහී"ති.

සා හි භික්ඛු සාරිපුත්තස්ස ධම්මධාතු සුප්පටිවිද්ධා.[3] යස්සා ධම්මධාතුයා සුප්පටිවිද්ධත්තා දිවසඤ්චෙපහං සාරිපුත්තං එතමත්ථං පුච්ඡෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි. දිවසම්පි[4] මෙ සාරිපුත්තො එතමත්ථං බ්‍යාකරෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි.

1. අපුච්ඡි මජසං, සසා. 2. රත්තිඤ්චාපි - සී 1, 2. 3. සුප්පටිවිද්දිතා - සීමු.
4. දිවසං මෙ පි *ච - සීමු, 5. රත්තින්දිවානි චෙපහං සීමු, PTS

ඉදින් භාග්‍යවතුන් වහන්සේ දෙරුදවාලක් ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් තයින් මේ අරුත මා පුළුවුස්තා සේක් නම් මුළු දෙරු දවාල ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් තයින් මම මේ අරුත භාග්‍යවතුන් වහන්සේට පවසන්නෙමි.

ඉදින් භාග්‍යවතුන් වහන්සේ තුන් රුදුවලක් ම මා .... ඉදින් භාග්‍යවතුන් වහන්සේ සිවු රුදුවලක් ම මා ... ඉදින් භාග්‍යවතුන් වහන්සේ පස් රුදුවලක් ම මා ... ඉදින් භාග්‍යවතුන් වහන්සේ සරු දවාලක් ම මා ... ඉදින් භාග්‍යවතුන් වහන්සේ සත් රුදුවලක් ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් තයින් මේ අරුත මා පුළුවුස්තා සේක් නම් සත් රුදුවල ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් තයින් මම මේ අරුත භාග්‍යවතුන් වහන්සේට පවසන්නෙමි.

ඉක්බිති කළාරඛත්තිය මහණ තෙමේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය .... එකත්පසෙක හුන් කළාරඛත්තිය මහණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය:

වහන්ස, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසින් (මෙසේ) සිංහනාද කරණ ලදී: "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ (මා විසින්) පෙර නො දන්නා ලද පළමු වන ප්‍රශ්නය මා පුළුවුත් සේක. ඒ මට ලැසිබවෙක් විය. ඇවැත්නි, යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ මාගේ පළමු වන ප්‍රශ්නය අනුමෝදන් වූ සේක් ද, ඒ මට මේ අදහස පහළ විය:

"ඉදින් භාග්‍යවතුන් වහන්සේ මුළු දවලක් ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් තයින් මේ අරුත මා පුළුවුස්තා සේක් නම්, මුළු දහවල ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් තයින් මම මේ අරුත භාග්‍යවතුන් වහන්සේට පවසන්නෙමි.

ඉදින් භාග්‍යවතුන් වහන්සේ මුළු රැයක් ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් තයින් මේ අරුත මගෙන් පුළුවුස්නා සේක් නම් මුළු, රැයම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් තයින් මම මේ අරුත භාග්‍යවතුන් වහන්සේට පවසන්නෙමි.

ඉදින් භාග්‍යවතුන් වහන්සේ මුළුරුදුවලක් ම මා ... ඉදින් භාග්‍යවතුන් වහන්සේ දෙරුදුවලක් ම මා .... ඉදින් භාග්‍යවතුන් වහන්සේ තුන් රුදුවලක්ම මා ... ඉදින් භාග්‍යවතුන් වහන්සේ සිවු රුදුවලක් ම මා ... පස් රුදුවලක් ම මා .... ඉදින් භාග්‍යවතුන් වහන්සේ සරුදුවලක් මා ඉදින් භාග්‍යවතුන් වහන්සේ සත්රුදුවලක් ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් තයින් මේ අරුත මා පුළුවුස්තාසේක් නම් සත්රුදුවල ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් තයින් මම මේ අරුත භාග්‍යවතුන් වහන්සේට පවසන්නෙමි" යි.

මහණ, ඉදින් මම මුළු දවාලකුත් එකිනෙකට වෙනස් පෙදෙන් එකිනෙක වෙනස් තයින් මේ අරුත ශාරිපුත්‍රයන් පුළුවුස්නෙම් නම් යම් ධර්මධාතුවක් (ශ්‍රාවක පාරමීඥනයක්) මැනවින් අවබෝධ කරණ ලද බැවින්, ශාරිපුත්‍ර තෙමේ මුළුදවස ම එකිනෙකට වෙනස් පෙදෙන් එකිනෙකට වෙනස් තයින් මේ අරුත මට පවසන්නේතේ ද ඒ. ධර්මධාතු සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයාකාරය දක්නට සමර්ථ ශ්‍රාවකපාරමීඥනය ශාරිපුත්‍රයන් විසින් මැනවින් අවබෝධ කරණ ලද්දේ ම ය.

රත්තිං චෙපහං සාරිපුත්තං එතමත්ථං පුච්ඡෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, රත්තිම්පි මෙ සාරිපුත්තො එතමත්ථං බ්‍යාකරෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි.

රත්තින්දිවං චෙපහං සාරිපුත්තං එතමත්ථං පුච්ඡෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, රත්තින්දිවම්පි මෙ සාරිපුත්තො එතමත්ථං බ්‍යාකරෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි.

ද්වෙ රත්තින්දිවානි චෙපහං සාරිපුත්තං එතමත්ථං පුච්ඡෙය්‍යං අඤ්ඤ-මඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, ද්වෙ රත්තින්දිවානිපි මෙ සාරිපුත්තො එතමත්ථං බ්‍යාකරෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි.

තීණි රත්තින්දිවානි චෙපහං සාරිපුත්තං -පෙ- චත්තාරි රත්තින්දිවානි චෙපහං සාරිපුත්තං -පෙ- පඤ්ච රත්තින්දිවානි චෙපහං සාරිපුත්තං -පෙ- ඡ රත්තින්දිවානි චෙපහං සාරිපුත්තං -පෙ- සත්ත රත්තින්දිවානි චෙපහං සාරිපුත්තං එතමත්ථං පුච්ඡෙය්‍යං අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහි, සත්ත රත්තින්දිවානිපි මෙ සාරිපුත්තො එතමත්ථං බ්‍යාකරෙය්‍ය අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි පරියායෙහීති.

## 1. 4. 3.

## ඤාණවත්ථුසුත්තං

33. සාවත්ථියං-

චතුචත්තාළීසං වො භික්ඛවෙ, ඤාණවත්ථූනි දෙසිස්සාමි. තං සුණාථ -පෙ- කතමානි භික්ඛවෙ, චතුචත්තාළීසං ඤාණවත්ථූනි?

ජරාමරණෙ ඤාණං, ජරාමරණසමුදයෙ ඤාණං, ජරාමරණනිරොධෙ ඤාණං, ජරාමරණනිරොධගාමිනියා පටිපදාය ඤාණං.

ජාතියා ඤාණං, ජාති සමුදයෙ ඤාණං, ජාතිනිරොධෙ ඤාණං, ජාතිනිරොධගාමිනියා පටිපදාය ඤාණං.

භවෙ ඤාණං, භවසමුදයෙ ඤාණං, භවනිරොධෙ ඤාණං, භවනිරොධ-ගාමිනියා පටිපදාය ඤාණං.

උපාදානෙ ඤාණං -පෙ- තණ්හාය ඤාණං -පෙ- වෙදනාය ඤාණං -පෙ- ඵස්සෙ ඤාණං -පෙ- සළායතනෙ ඤාණං -පෙ- නාමරූපෙ ඤාණං -පෙ- විඤ්ඤාණෙ ඤාණං -පෙ- සඞ්ඛාරෙසු ඤාණං, සඞ්ඛාරසමුදයෙ ඤාණං, සඞ්ඛාරනිරොධෙ ඤාණං, සඞ්ඛාරනිරොධගාමිනියා පටිපදාය ඤාණං. ඉමානි වුච්චන්ති භික්ඛවෙ චතුචත්තාළීසං ඤාණවත්ථූනි.*

කතමඤ්ච භික්ඛවෙ, ජරාමරණං? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චති ජරා යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චුමරණං කාලකිරියා ඛන්ධානං භෙදො කළෙබරස්ස නික්ඛෙපො ඉදං වුච්චති මරණං. ඉති අයඤ්ච ජරා, ඉදඤ්ච මරණං, ඉදං වුච්චති භික්ඛවෙ ජරාමරණං.

---

* ජරාමරණාදීනං එකාදසන්නං පච්චයානං එකෙකස්මිං චත්තාරි චත්තාරි කත්වා චතුචත්තාළීස ඤාණවත්ථූනි දට්ඨබ්බානි.

ඉදින් මම මුළු රැයකුදු වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් ශාරීපුත්‍රයන් මේ අරුත පුළුවුස්නෙම් නම් ශාරිපුත්‍ර තෙමේ මුළු රැය ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් මේ අරුත මට පවසන්නේය.

ඉදින් මම මුළු රැදවලකුදු වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් මේ අරුත ශාරීපුත්‍රයන් පුළුවුස් නෙම් නම් ශාරීපුත්‍ර තෙමේ මුළු රැදවල ම වෙනස් වෙනස් පදෙන් වෙනස් වෙනස් නයින් මේ අරුත මට පවසන්නේය.

ඉදින් මම දෙ රැදවලකුදු වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් මේ අරුත ශාරිපුත්‍රයන් පුළුවුස්නෙම් නම් ශාරිපුත්‍ර තෙමේ දෙ රැදවල ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් මේ අරුත මට පවසන්නේය.

ඉදින් මම තුන් රැදවලකුදු ශරිපුත්‍රයන් ... ඉදින් මම සිවු රැදවලකුදු ශාරිපුත්‍රයන් ... ඉදින් මම පස් රැදවලකුදු ශාරිපුත්‍රයන්ගෙන් ... ඉදින් මම සරැදවලකුදු ශාරීපුත්‍රයන්ගෙන් ඉදින් මම සත් රැදවලකුදු වෙනස් වෙනස් පදෙන් වෙනස් වෙනස් නයින් මේ අරුත ශාරිපුත්‍රයන්ගෙන් පුළුවුස්නෙම් නම් ශාරිපුත්‍ර තෙමේ සත්රැදවල ම වෙනස් වෙනස් පෙදෙන් වෙනස් වෙනස් නයින් මේ අරුත මට පවසන්නේ යි.

1. 4. 3.

## ඤාණවත්ථු සූත්‍රය

33. සැවැත්නුවර-

මහණෙනි, තොපට සිවුසාළිස් නුවණවත් දේශනා කරන්නෙමි. එය අසවු .... මහණෙනි, සිවුසාළිස් නුවණවත් කවර යත්:

ජරාමරණ දන්නා නුවණ ය, ජරාමරණ හටගැණීම දන්නා නුවණ ය, ජරාමරණ නැවැත්ම දන්නා නුවණ ය, ජරාමරණ නැවැත්මේ පිළි වෙත දන්නා නුවණ ය

ඉපැදීම දන්නා නුවණ ය, ඉපැදීම හටගැණීම දන්නා නුවණ ය, ඉපැද්මේ නැවැත්ම දන්නා නුවණ ය, ඉපැදීම නැවැත්මේ පිළිවෙත දන්නා නුවණ ය.

භවය දන්නා නුවණ ය, භවයේ හටගැන්ම දන්නා නුවණ ය, භවයේ නැවැත්ම දන්නා නුවණ ය, භවය නැවැත්මේ පිළිවෙත දන්නා නුවණ ය.

උපාදන දන්නා නුවණ ය. ... තෘෂ්ණාව දන්නා නුවණ ය. ... වේදනාව දන්නා නුවණ ය ... ස්පර්ශ දන්නා නුවණ ය ... ෂඩායතන දන්නා නුවණය ... නාමරූප දන්නා නුවණ ය ... විඥාන දන්නා නුවණ ය ... සංස්කාර දන්නා නුවණ ය, සංස්කාර හටගැණීම දන්නා නුවණ ය, සංස්කාර නැවැත්ම දන්නා නුවණ ය. සංස්කාර නැවැත්මේ පිළිවෙත දන්නා නුවණ ය. මහණෙනි, මේ සිවුසාළිස් නුවණවත් ය යි* කියනු ලැබේ

මහණෙනි, ජරාමරණ නම් කවරී? ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි යම් දිරීමෙක් දිරණබවෙක් දත් වැටීමෙක් කෙස් පැසීමෙක් ඇඟ රැළි වැටීමෙක් ආයු පිරිහීමෙක් ඉඳුරන් පැසීමෙක් වේ ද, මේ ජරා යැයි කියනු ලැබේ. ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙන් චෙන් වීමෙක් වෙන් වන බවෙක් බිඳීමෙක් අතුරුදන් වීමෙක් මච්චු නම් වූ මරණයෙක් කාලක්‍රියාවෙක් ස්කන්ධයන්ගේ බිඳීමෙක් සිරුර හැර දැමීමෙක් වේ ද, මේ මරණ ය යි කියනු ලැබේ මෙසේ මේ ජරාව ද, මේ මරණය ද, මහණෙනි, මේ ජරාමරණය යි කියනු ලැබේ

* ජරාමරණාදි එක් එක් ප්‍රත්‍යයෙහි සතර බැගින් ගෙණ එකොළොස් ප්‍රත්‍යයෙහි සිවුසාළිස් නුවණවත් දත්නේය.

ජාතිසමුදයා ජරාමරණසමුදයො, ජාතිනිරොධා ජරාමරණනිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො ජරාමරණනිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

යතො ඛො භික්ඛවෙ, අරියසාවකො එවං ජරාමරණං පජානාති, එවං ජරාමරණසමුදයං පජානාති, එවං ජරාමරණනිරොධං පජානාති, එවං ජරාමරණනිරොධගාමිනිං පටිපදං පජානාති, ඉදමස්ස ධම්මෙ ඤාණං. සො ඉමිනා ධම්මෙන දිට්ඨෙන විදිතෙන අකාලිකෙන පත්තෙන පරියොගාළ්හෙන අතීතානාගතෙ නයං නෙති[1].

යෙ ඛො කෙචි අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං අබ්භඤ්ඤංසු, ජරාමරණසමුදයං අබ්භඤ්ඤංසු, ජරාමරණනිරොධං අබ්භඤ්ඤංසු, ජරාමරණනිරොධගාමිනිං පටිපදං අබ්භඤ්ඤංසු, සබ්බෙ තෙ එවමෙව අබ්භඤ්ඤංසු, සෙය්‍යථාපහං[2] එතරහි. යෙපි හි කෙචි අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං අභිජානිස්සන්ති, ජරාමරණසමුදයං අභිජානිස්සන්ති, ජරාමරණනිරොධං අභිජානිස්සන්ති, ජරාමරණනිරොධගාමිනිං පටිපදං අභිජානිස්සන්ති, සබ්බෙ තෙ එවමෙව අභිජානිස්සන්ති, සෙය්‍යථාපහං එතරහි. ඉදමස්ස අන්වයෙ ඤාණං.

යතො ඛො භික්ඛවෙ අරියසාවකස්ස ඉමානි ද්වෙ ඤාණානි පරිසුද්ධානි හොන්ති පරියොදාතානි ධම්මෙ ඤාණඤ්ච අන්වයෙ ඤාණඤ්ච, අයං වුච්චති භික්ඛවෙ අරියසාවකො දිට්ඨිසම්පන්නො ඉතිපි, දස්සනසම්පන්නො ඉතිපි, ආගතො ඉමං සද්ධම්මං ඉතිපි, පස්සති ඉමං සද්ධම්මං ඉතිපි, සෙඛෙන ඤාණෙන සමන්නාගතො ඉතිපි, සෙඛාය විජ්ජාය සමන්නාගතො ඉතිපි, ධම්මසොතං සමාපන්නො ඉතිපි, අරියො නිබ්බෙධිකපඤ්ඤො ඉතිපි, අමතද්වාරං ආහච්ච තිට්ඨති ඉතිපීති.

කතමා ච භික්ඛවෙ, ජාති? යා තෙසං තෙසං සත්තානං -පෙ- කතමො ච භික්ඛවෙ භවො -පෙ- කතමඤ්ච භික්ඛවෙ උපාදානං -පෙ- කතමා ච භික්ඛවෙ, තණ්හා -පෙ- කතමා ච භික්ඛවෙ වෙදනා -පෙ- කතමො ච භික්ඛවෙ, ඵස්සො -පෙ- කතමඤ්ච භික්ඛවෙ, සළායතනං -පෙ- කතමඤ්ච භික්ඛවෙ නාමරූපං -පෙ- කතමඤ්ච භික්ඛවෙ, විඤ්ඤාණං -පෙ- කතමෙ ච භික්ඛවෙ, සඞ්ඛාරා? තයොමෙ භික්ඛවෙ, සඞ්ඛාරා, කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරො, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ සඞ්ඛාරා.

අවිජ්ජාසමුදයා සඞ්ඛාරසමුදයො, අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ඛාරනිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

යතො ඛො භික්ඛවෙ අරියසාවකො එවං සඞ්ඛාරෙ පජානාති, එවං සඞ්ඛාරසමුදයං පජානාති, එවං සඞ්ඛාරනිරොධං පජානාති, එවං සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං පජානාති, ඉදමස්ස ධම්මෙ ඤාණං. සො ඉමිනා ධම්මෙන දිට්ඨෙන විදිතෙන අකාලිකෙන පත්තෙන පරියොගාළ්හෙන අතීතානාගතෙ නයං නෙති.[1]

1. අතීතානාගතෙනන යං නෙති - මජසං. 2, සෙය්‍යථාපාහං - මජසං.

ජාතිය හටගැනීමෙන් ජරාමරණ හටගැනීම වේ. ජාතිය නැවැත්මෙන් ජරාමරණ නැවැත්ම වේ. මේ අරිඅටගිමග ම ජරාමරණ නැවැත්මේ පිළිවෙත යි. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි.

මහණෙනි, යම් කලෙක ආර්‍යශ්‍රාවක තෙමේ මෙසේ ජරාමරණ දනී ද, මෙසේ ජරාමරණසමුදය දනී ද, මෙසේ ජරාමරණනිරෝධය දනී ද, මෙසේ ජරාමරණනිරෝධගාමිනී ප්‍රතිපදාව දනී ද, මේ ඔහුගේ (සිවුසස්) දහම්හි නුවණ ය. හෙතෙමේ දක්නා ලද දන්නා ලද කල් නො යවා විපාක දෙන පැමිණෙන ලද බැසගන්නා ලද මේ මාර්ගඥානයෙන් (මතු ඇතිවන ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන්) අතීතයෙහිත් අනාගතයෙහිත් දහම් නය පමුණුවයි.

අතීත කාලයෙහි යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ දත්තාහු ද, ජරාමරණසමුදය දත්තාහු ද, ජරාමරණනිරෝධය දත්තාහු ද, ජරාමරණනිරෝධගාමිනී ප්‍රතිපදාව දත්තාහු ද, ඒ සියල්ලෝ දැන් මම යම් සේ දනිම් නම් එසේ ම දත්තාහු ය. අනාගත කාලයෙහි යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ දැන ගන්නාහු ද, ජරාමරණ සමුදයය දැන ගන්නාහුද, ජරාමරණ නිරෝධය දැන ගන්නාහු ද, ජරාමරණ නිරෝධගාමිනී ප්‍රතිපදාව දැන ගන්නාහු ද, ඒ සියල්ලෝ දැන් මම යම් සේ දනිම් නම් එසේ ම දැන ගන්නාහු ය. මේ ඔහුගේ අන්වයෙහි (ධම්මඤාණානුගමනයෙහි ප්‍රත්‍යවේක්ෂා) ඥාන ය යි.

මහණෙනි, යම් කලෙක පටන් ආර්‍යශ්‍රාවකයාගේ මාර්ගඥානයත් ප්‍රත්‍යවේක්ෂාඥානයත් යන මේ දෙනුවණ පිරිසිදු වූයේ ඉතා පිරිසිදු වූයේ වේ ද, මහණෙනි, මේ ආර්‍යශ්‍රාවක තෙමේ දෘෂ්ටිසම්පන්න ය යි ද, දර්ශනසම්පන්න ය යි ද, මේ සද්ධර්මයට පැමිණියේ ය යි ද, මේ සද්ධර්මය දකී ය යි ද, ශෛක්ෂඥානයෙන් සමන්වාගත ය යි ද, ශෛක්ෂවිද්‍යායෙන් සමන්වාගත ය යි ද, ධර්මස්‍රෝතසට පැමිණියේ ය යි ද, ආර්‍ය වූ නිර්වේධිකප්‍රඥා ඇත්තේ ය යි ද, අමාදොරට හැපී සිටී ය යි ද කියනු ලැබේ.

මහණෙනි, ජාතිය නම් කවර යත්: ඒ ඒ සත්ත්වයන්ගේ යම් ... මහණෙනි, භවය නම් කවර යත්: ... මහණෙනි, උපාදාන නම් කවර යත්: ... මහණෙනි, තෘෂ්ණා නම් කවර යත්: . මහණෙනි, වේදනාව නම් කවර යත්. ... මහණෙනි, ස්පර්ශය නම් කවර යත්: . මහණෙනි, ෂඩායතන නම් කවර යත්: මහණෙනි, නාමරූප නම් කවර යත්: ... මහණෙනි, විඥානය නම් කවර යත්:... මහණෙනි, සංස්කාර නම් කවර යත්: මහණෙනි, මේ සංස්කාර තුනෙකි. කායසංස්කාර ය, වාක්සංස්කාර ය, චිත්තසංස්කාර ය යි. මහණෙනි, මොහු සංස්කාරයෝ ය යි කියනු ලැබෙත්.

අවිද්‍යාසමුදයෙන් සංස්කාරසමුදයය වේ. අවිද්‍යානිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ. මේ අරිඅටගිමග ම සංසකාර නිරෝධගාමිනී ප්‍රතිපදාව යි එනම්: සම්මාදිට්ඨිය .. සම්මාසමාධි යි.

මහණෙනි, යම් කලෙක ආර්‍යශ්‍රාවක තෙමේ මෙසේ සංස්කාර දනී ද, මෙසේ සංසකාර සමුදය දනී ද, මෙසේ සංස්කාරනිරොධය දනී ද, මෙසේ සංසකාරනිරොධගාමිනී ප්‍රතිපදාව දනීද, මේ ඔහුගේ මාර්ගඥාන ය යි. හෙතෙමේ දක්නා ලද දන්නා ලද අකාලික වූ පැමිණෙන ලද බැස ගන්නා ලද මේ මාර්ගඥානයෙන් අතීතයෙහිත් අනාගතයෙහිත් නය පමුණුවයි.

යෙ ඛො කෙචි අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා සඞ්ඛාරෙ අබ්භඤ්ඤංසු, සඞ්ඛාරසමුදයං අබ්භඤ්ඤංසු, සඞ්ඛාරනිරොධං අබ්භඤ්ඤංසු, සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං අබ්භඤ්ඤංසු, සබ්බෙ තෙ එවමෙව අබ්භඤ්ඤංසු, සෙය්‍යථාපහං එතරහි. යෙපි හි කෙචි අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා සඞ්ඛාරෙ අභිජානිස්සන්ති, සඞ්ඛාරසමුදයං අභිජානිස්සන්ති, සඞ්ඛාරනිරොධං අභිජා නිස්සන්ති, සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං අභිජානිස්සන්ති, සබ්බෙ තෙ එවමෙව අභිජානිස්සන්ති, සෙය්‍යථාපහං එතරහි. ඉදමස්ස අන්වයෙ ඤාණං.

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමානි ද්වෙ ඤාණානි පරිසුද්ධානි හොන්ති පරියොදාතානි ධම්මෙ ඤාණං ච අන්වයෙ ඤාණං ච. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො දිට්ඨිසම්පන්නො ඉතිපි, දස්සනසම්පන්නො ඉතිපි, ආගතො ඉමං සද්ධම්මං ඉතිපි, පස්සති ඉමං සද්ධම්මං ඉතිපි, සෙඛෙන ඤාණෙන සමන්නාගතො ඉතිපි, සෙඛාය විජ්ජාය සමන්නාගතො ඉතිපි, ධම්මසොතං සමාපන්නො ඉතිපි, අරියො නිබ්බෙධිකපඤ්ඤො ඉතිපි, අමතද්වාරං ආහච්ච තිට්ඨති ඉතිපීති.

## 1. 4. 4.

## දුතියඤාණවත්ථු සුත්තං

34. සාවත්ථියං-

සත්තසත්තරි වො භික්ඛවෙ ඤාණවත්ථූනි දෙසිස්සාමි. තං සුණාථ -පෙ- කතමානි භික්ඛවෙ සත්ත සත්තරි ඤාණවත්ථූනි?

ජාතිපච්චයා ජරාමරණන්ති ඤාණං, අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං, අතීතම්පි අද්ධානං ජාතිපච්චයා ජරාමරණන්ති ඤාණං, අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං, අනාගතම්පි අද්ධානං ජාතිපච්චයා ජරාමරණන්ති ඤාණං, අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං, යම්පිස්ස තං ධම්මට්ඨිති ඤාණං තම්පි ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති ඤාණං.

භවපච්චයා ජාතීති ඤාණං -පෙ- උපාදානපච්චයා භවොති ඤාණං -පෙ- තණ්හාපච්චයා උපාදානන්ති ඤාණං -පෙ- වෙදනා පච්චයා තණ්හාති ඤාණං -පෙ- ඵස්සපච්චයා වෙදනාති ඤාණං -පෙ- සළායතන පච්චයා ඵස්සොති ඤාණං -පෙ- නාමරූපපච්චයා සළායතනන්ති ඤාණං -පෙ- විඤ්ඤාණපච්චයා නාමරූපන්ති ඤාණං -පෙ- සඞ්ඛාරපච්චයා විඤ්ඤාණන්ති ඤාණං -පෙ-

මහණෙනි, අතීතකාලයෙහිත් යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ සංස්කාර දත්තාහු ද සංස්කාර සමුදය දත්තාහු ද සංස්කාරනිරෝධය දත්තාහු ද සංස්කාරනිරෝධගාමිනීප්‍රතිපදාව දත්තාහු ද ඒ සියල්ලෝ දත් මම යම් සේ (දනිම්) ද එසේ ම දත්තාහු ය. අනාගත කාලයෙහිත් යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ සංස්කාරයන් දැන්ගන්නාහු ද සංස්කාරසමුදය දැන ගන්නාහු ද සංස්කාරනිරෝධය දැන ගන්නාහු ද සංස්කාරනිරෝධගාමිනී ප්‍රතිපදාව දැන ගන්නාහු ද, ඒ සියල්ලෝ දත් මම යම් සේ (දනිම්) ද, එසේ ම දැන ගන්නාහු ය. මේ ඔහුගේ අන්වයෙහි (ප්‍රත්‍යවෙක්ෂා)ඥාන ය යි.

මහණෙනි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවකයාගේ මාර්ගඥානයත් ප්‍රත්‍යවේක්ෂා-ඥානයත් මේ දෙනුවන පිරිසිදු වූයේ ඉතා පිරිසිදු වූයේ වේ ද, මහණෙනි, මේ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ දෘෂ්ටිසම්පන්න ය යි ද, දර්ශනසම්පන්න ය යි ද, මේ සද්ධර්මයට පැමිණියේ ය යි ද, මේ සද්ධර්මය දකී ය යි ද, ශෛක්‍ෂඥානයෙන් සමන්නාගත ය යි ද, ශෛක්‍ෂවිද්‍යාවෙන් සමන්නාගත ය යි ද, ධර්මස්‍රොතසට පැමිණියේ ය යි ද, ආර්‍ය්‍ය වූ නිර්වේධිකප්‍රඥා ඇත්තේ ය යි ද, අමාදොරට හැපී සිටී ය යි ද කියනු ලැබේ.

## 1. 4. 4.

## දුතියඤාණවත්ථු සූත්‍රය

34. සැවැත්නුවර-

මහණෙනි, තොපට සත්සැත්තෑ නුවණ දේශනා කරන්නෙමි. එය අසව් ... මහණෙනි, සත්සැත්තෑ නුවණ කවර යත්:

ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ ය යි දන්නා නුවණ ය, ජාතිය නැති කල්හි ජරාමරණ නැතැයි දන්නා නුවණ ය, අතීත කාලයෙහි ද ජාති-ප්‍රත්‍යයෙන් ජරාමරණ වී ය යි දන්නා නුවණ ය, ජාතිය නැති කල්හි ජරමරණ නැතැයි දන්නා නුවණ ය, අනාගත කාලයෙහි ද ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වන්නේ ය යි දන්නා නුවණ ය, ජාතිය නැති කල්හි ජරාමරණ නැතැයි දන්නා නුවණ ය, යම් ඒ (යථොක්ත) ප්‍රත්‍යයාකාර ඥානයක් වන්නේ නම් එ ද ක්‍ෂයස්වභාව ඇත්තේ ය, ව්‍යයස්වභාව ඇත්තේ ය, විරාග ස්වභාව ඇත්තේ ය, නිරොධස්වභාව ඇත්තේ ය යි දන්නා නුවණ ය.

භවප්‍රත්‍යයෙන් ජාතිය වේ ය යි දන්නා නුවණ ය ... උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේ ය යි. දන්නා නුවණ ය ... තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වේ ය යි දන්නා නුවණ ය...වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ ය යි දන්නා නුවණ ය ... ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ ය යි දන්නා නුවණ ය ... ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ ය යි දන්නා නුවණ ය ... නාමරූප-ප්‍රත්‍යයෙන් ෂඩායතන වේ ය යි දන්නා නුවණ ය ... විඥානප්‍රත්‍යයෙන් නාමරූප වේ ය යි දන්නා නුවණ ය ... සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වේ ය යි දන්නා නුවණ ය ...

අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති ඤාණං, අසති අවිජ්ජාය නත්ථි සඞ්ඛාරාති ඤාණං, අතීතම්පි අද්ධානං අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති ඤාණං, අසති අවිජ්ජාය නත්ථි සඞ්ඛාරාති ඤාණං, අනාගතම්පි අද්ධානං අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති ඤාණං, අසති අවිජ්ජාය නත්ථි සඞ්ඛාරාති ඤාණං, යම්පිස්ස තං ධම්මට්ඨිති ඤාණං තම්පි ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති ඤාණං. ඉමානි වුච්චන්ති භික්ඛවෙ සත්තසත්තරි ඤාණවත්ථූනීති. *

## 1. 4. 5

## අවිජ්ජාදිපච්චය දෙසනා සුත්තං

35. **සාවත්ථියං**-

අවිජ්ජාපච්චයා භික්ඛවෙ, සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතීති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු, භගවන්තං එතදවොච. කතමං නු ඛො භන්තෙ, ජරාමරණං? කස්ස ච පනිදං ජරාමරණන්ති? නො කල්ලො පඤ්හොති භගවා අවොච. "කතමං ජරාමරණං? කස්ස ච පනිදං ජරාමරණන්ති?" ඉති වා භික්ඛු යො වදෙය්‍ය, "අඤ්ඤං ජරාමරණං අඤ්ඤස්ස ච පනිදං ජරාමරණන්ති" ඉති වා භික්ඛු යො වදෙය්‍ය, උභයමෙතං එකත්ථං. බ්‍යඤ්ජනමෙව නානං.

"තං ජීවං, තං සරීරන්ති" වා භික්ඛු දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. "අඤ්ඤං ජීවං, අඤ්ඤං සරීරන්ති" වා භික්ඛු දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. එතෙ තෙ භික්ඛු උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති ජාතිපච්චයා ජරාමරණන්ති.

කතමා නු ඛො භන්තෙ, ජාති? කස්ස ච පනායං ජාතීති? නො කල්ලො පඤ්හොති භගවා අවොච "කතමා ජාති? කස්ස ච පනායං ජාතීති?" ඉති වා භික්ඛු යො වදෙය්‍ය, "අඤ්ඤා ජාති, අඤ්ඤස්ස ච පනායං ජාතීති" ඉති වා භික්ඛු යො වදෙය්‍ය, උභයමෙතං එකත්ථං, බ්‍යඤ්ජනමෙව නානං.

"තං ජීවං, තං සරීරන්ති" වා භික්ඛු දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. "අඤ්ඤං ජීවං, අඤ්ඤං සරීරන්ති" වා භික්ඛු දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. එතෙ තෙ භික්ඛු උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති භවපච්චයා ජාතීති.

---

* ජාතිපච්චයාදීනං එකාදසන්නං පච්චයානං එකෙකස්මිං සත්ත සත්ත කත්වා සත්තසත්තරි ඤාණවත්ථූනි දට්ඨබ්බානි

අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති යි දන්නා නුවණ ය, අවිද්‍යාව නැති කල්හි සංස්කාර නැතැ යි දන්නා නුවණ ය, අතීතකාලයෙහිත් අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වූහ යි දන්නා නුවණ ය, අවිද්‍යාව නැති කල්හි සංස්කාර නැතැයි දන්නා නුවණ ය, අනාගතකාලයෙහිත් අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වන්නාහ යි දන්නා නුවණ ය, අවිද්‍යාව නැති කල්හි සංස්කාර නැතැයි දන්නා නුවණ ය, යම් ඒ ප්‍රත්‍යයාකාරඥානයක් වන්නේ නම් එය ක්‍ෂය ස්වභාව ඇත්තේ ය, ව්‍යයස්වභාව ඇත්තේ ය, විරාග ස්වභාව ඇත්තේ ය, නිරෝධ ස්වභාව ඇත්තේ ය යි දන්නා නුවණ ය. මහණෙනි, මේ සත්සැත්තෑනුවණ ය යි කියනු ලැබේයි.*

## 1 4. 5

## අවිජ්ජාදිපච්චය දේශනා සූත්‍රය.

35. සැවැත්නුවර-

මහණෙනි, අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ හට ගැන්ම වෙ යි.

මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: වහන්ස, ජරාමරණ කවරේ ද? මේ ජරාමරණ කවරකුගේ ද? ප්‍රශ්නය නො යෙදේ ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මහණ, යමෙක් "ජරාමරණ කවරේ ද? මේ ජරාමරණ කවරකුගේ ද?" යි මෙසේ හෝ කියන්නේ ද, මහණ, යමෙක් "ජරාමරණ අනෙකක මේ ජරාමරණ අනෙකකුගේ ය" යි මෙසේ හෝ කියන්නේ ද, මේ දෙක ම ඒකාර්ථ ය. ව්‍යඤ්ජන ම වෙනස් ය.

මහණ, "එය ජීව ය, එය ශරීර ය"යි (උච්ඡේද) දෘෂ්ටිය හෝ ඇති කල්හි බ්‍රහ්මචරිය (ආර්‍ය්‍යමාර්ග වාසය) නො වේ. මහණ, "ජීවය අනෙකක, ශරීරය අනෙකකැ"යි (ශාශ්වත) දෘෂ්ටිය හෝ ඇති කල්හි බ්‍රහ්මචරියවාසය නො වේ. මහණ ඒ මේ අන්තදෙකට නො පැමිණ තථාගත තෙමේ "ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ වේ"යි මැදුම්පිළිවෙතින් දහම් දෙසයි.

වහන්ස, "ජාතිය කවරක් ද? මේ ජාතිය කවරකුගේ ද?" ප්‍රශ්නය නො යෙදේ ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මහණ, යමෙක් "ජාතිය කවරක් ද? මේ ජාතිය කවරකුගේ ද" යි මෙසේ හෝ කියන්නේ ද, මහණ, යමෙක් "ජාතිය අනෙකක, මේ ජාතිය අනෙකකුගේ ය" යි මෙසේ හෝ කියන්නේ ද, මේ දෙක ම ඒකාර්ථ ය. ව්‍යඤ්ජන ම වෙනස් ය.

මහණ, "ඒ ජීවය, ඒ ශරීරය" යි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරිය වාසය නො වේ. මහණ, "ජීවය අනෙකක ශරීරය අනෙකෙකැ" යි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරිය වාසය නො වේ. මහණ, මේ අන්ත දෙකට නො පැමිණ තථාගත තෙමේ " භව ප්‍රත්‍යයයෙන් ජාතිය වේ" යි මැදුම් පිළිවෙතින් දහම් දෙසයි.

---

* ජාති ආදි එක් එක් ප්‍රත්‍යයයෙහි සතක් සතක් බැගින් ගෙණ එකොළොස් ප්‍රත්‍යයයෙහි ඥානවස්තු සත් සත්තෑව දතයුතු.

කතමො නු ඛො භන්තෙ, භවො? කස්ස ච පනායං භවොති? නො කල්ලො පඤ්හොති භගවා අවොච. "කතමො භවො, කස්ස ච පනායං භවොති" ඉති වා භික්ඛු, යො වදෙය්‍ය, "අඤ්ඤස්ස භවො" අඤ්ඤො පනායං භවොති" ඉති වා භික්ඛු, යො වදෙය්‍ය, උභයමෙතං එකත්ථං, බ්‍යඤ්ජනමෙව නානං.

"තං ජීවං, තං සරීරන්ති" වා භික්ඛු දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. "අඤ්ඤං ජීවං, අඤ්ඤං සරීරන්ති" වා භික්ඛු, දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. එතෙ තෙ භික්ඛු උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති. උපාදානපච්චයා භවොති -පෙ- තණ්හාපච්චයා උපාදානන්ති -පෙ- වෙදනා පච්චයා තණ්හාති -පෙ- ඵස්සපච්චයා වෙදනාති -පෙ- සළායතනපච්චයා ඵස්සොති -පෙ- නාමරූප පච්චයා සළායතනන්ති -පෙ- විඤ්ඤාණ පච්චයා නාමරූපන්ති -පෙ- සඞ්ඛාරපච්චයා විඤ්ඤාණන්ති.

කතමෙ නු ඛො භන්තෙ, සඞ්ඛාරා? කස්ස ච පනිමෙ සඞ්ඛාරාති? නො කල්ලො පඤ්හොති භගවා අවොච. "කතමෙ සඞ්ඛාරා, කස්ස ච පනිමෙ සඞ්ඛාරාති" ඉති වා භික්ඛු, යො වදෙය්‍ය, "අඤ්ඤෙ සඞ්ඛාරා, අඤ්ඤස්ස පනිමෙ සඞ්ඛාරාති" ඉති වා භික්ඛු, යො වදෙය්‍ය, උභයමෙතං එකත්ථං, බ්‍යඤ්ජනමෙව නානං.

"තං ජීවං, තං සරීරන්ති" වා භික්ඛු, දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. "අඤ්ඤං ජීවං, අඤ්ඤං සරීරන්ති" වා භික්ඛු, දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. එතෙ තෙ භික්ඛු, උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති: අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති.

අවිජ්ජායත්වෙව භික්ඛු, අසෙසවිරාගනිරොධා යානිස්ස තානි විසූකායිකානි[1] විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි "කතමඤ්ච ජරාමරණං? කස්ස ච පනිදං ජරාමරණං? ඉති වා, අඤ්ඤං ජරාමරණං, අඤ්ඤස්ස ච පනිදං ජරාමරණං ඉති වා, තං ජීවං තං සරීරං ඉති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉති වා" සබ්බානිස්ස තානි පහීනානි භවන්ති උච්ඡින්නමූලානි තාලාවත්ථුකතානි අනභාවකතානි ආයතිං අනුප්පාදධම්මානි.

අවිජ්ජායත්වෙව භික්ඛු අසෙසවිරාගනිරොධා යානිස්ස තානි විසූකායිකානි විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි "කතමා ජාති? කස්ස ච පනායං ජාති? ඉති වා, අඤ්ඤා ජාති අඤ්ඤස්ස ච පනායං ජාති ඉති වා, තං ජීවං තං සරීරං ඉති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉති වා" සබ්බානිස්ස තානි පහීනානි භවන්ති උච්ඡින්නමූලානි තාලාවත්ථුකතානි අනභාවකතානි ආයතිං අනුප්පාදධම්මානි.

1. සූකායිකානි සී. මු.

වහන්ස, භවය කවරේ ද? මේ භවය කවරකුගේ ද? ප්‍රශ්නය නො යෙදේ ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මහණ, යමෙක් "භවය කවරේ ද, මේ භවය කවරකුගේ ද" යි මෙසේ හෝ කියන්නේ ද, මහණ, යමෙක් "භවය අනෙකක, මේ භවය අනෙකකුගේ ය" යි මෙසේ හෝ කියන්නේ ද, මේ දෙක ම ඒකාර්ථ ය. ව්‍යඤ්ජන ම වෙනස් ය.

මහණ, "එය ජීවය, එය ශරීර ය" යි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්ම-චරියවාසය නො වේ. මහණ, "ජීවය අනෙකක, ශරීරය අනෙකකැ" යි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරිය වාසය නො වේ. මහණ, ඒ මේ අන්ත දෙකට නො පැමිණ තථාගත තෙමේ උපාදාන ප්‍රත්‍යයයෙන් භවය වේ ය යි මැදුම්පිළිවෙතින් දහම් දෙසයි ... තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදාන වේ ය යි ... වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ ය යි ... ස්පර්ශප්‍රත්‍යයයෙන් වේදනාව වේ ය යි ... ෂඩායතනප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ යයි ... නාමරූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වේ ය යි ... විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූප වේ ය යි ... සංස්කාර-ප්‍රත්‍යයයෙන් විඥානය වේ ය යි මැදුම් පිළිවෙතින් දහම් දෙසයි.

වහන්ස, සංස්කාරයෝ කවරහු ද? මේ සංස්කාර කවරකු ගේ ද? ප්‍රශ්නය නො යෙදේ ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මහණ, යමෙක් "සංස්කාරයෝ කවරහු ද, මේ සංස්කාර කවරකුගේ ද" යි මෙසේ හෝ කියන්නේ ද, මහණ යමෙක් "සංස්කාර අනෙකක, මේ සංස්කාර අනෙකකුගේ ය" යි මෙසේ හෝ කියන්නේ ද, මේ දෙක ම ඒකාර්ථ ය. ව්‍යඤ්ජන ම වෙනස් ය.

මහණ "එය ජීවය, එය ශරීර ය" යි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසය නො වේ. මහණ, "ජීවය අනෙකක, ශරීරය අනෙකකැ" යි හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසය නො වේ. මහණ, ඒ මේ අන්ත දෙකට නො පැමිණ තථාගත තෙමේ අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙත් ය යි මැදුම් පිළිවෙතින් දහම් දෙසයි.

මහණ, "ජරාමරණ කවරේ ද? මේ ජරාමරණ කවරකුගේ ද" යි හෝ "ජරාමරණ අනෙකක, මේ ජරාමරණ අනෙකකුගේ ය" යි හෝ "එය ජීවය, එය ශරීරය" යි හෝ "ජීවය අනෙකක, ශරීරය අනෙකකැ" යි හෝ ඔහුට යම් ඒ (සම්‍යග්දෘෂ්ටියට) හුල් වැනි, විරුද්ධ පැවතුම් ඇති, ඔබමොබ සැලෙන පැවැතුම් ඇති කිසියම් කිසියම් මිථ්‍යාදෘෂ්ටිහු වෙද්ද, ඔහුගේ ඒ සියලු දෘෂ්ටිහු අවිද්‍යාවේ ම නිරවශේෂ විරාග නිරෝධයෙන් ප්‍රහීණ වූවාහු සිඳින ලද මුල් ඇත්තාහු මුදුනසුන් තල්ගසක් මෙන් කරණ ලද්දාහු පිළිවෙළින් අභාවයට පමුණුවන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත්.

මහණ, "ජාතිය කවරක් ද? මේ ජාතිය කවරකු ගේ ද" යි හෝ "ජාතිය අනෙකක, මේ ජාතිය අනෙකකුගේ ය" යි හෝ "එය ජීවය, එය ශරීර ය" යි හෝ "ජීවය අනෙකක, ශරීරය අනෙකකැ" යි හෝ ඔහුට යම් ඒ (සම්‍යග්දෘෂ්ටියට) හුල් වැනි, විරුද්ධ පැවතුම් ඇති, ඔබමොබ සැලෙන පැවැතුම් ඇති කිසියම් කිසියම් මිථ්‍යා දෘෂ්ටිහු වෙද්ද, ඔහුගේ ඒ සියලු දෘෂ්ටිහු අවිද්‍යාවේ ම නිරවශෙෂවිරාග නිරොධයෙන් ප්‍රහීණ වූවාහු සිඳින ලද මුල් ඇත්තාහු මුදුනසුන් තල්ගසක් මෙන් කරණ ලද්දාහු පිළිවෙළින් අභාවයට පමුණු වන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත්.

අවිජ්ජායත්වෙව භික්ඛු අසෙසවිරාගනිරොධා යානි'ස්ස තානි විසූකායිතානි විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි, "කතමො භවො, කස්ස ච පනායං භවො ඉති වා, අඤ්ඤො භවො අඤ්ඤස්ස ච පනායං භවො ඉති වා, තං ජීවං තං සරීරං ඉති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉති වා" සබ්බානි'ස්ස තානි පහීනානි භවන්ති උච්ඡින්නමූලානි තාලාවත්ථුකතානි අනභාවකතානි ආයතිං අනුප්පාදධම්මානි.

අවිජ්ජායත්වෙව භික්ඛු අසෙසවිරාගනිරොධා යානි'ස්ස තානි විසූකායිතානි විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි, "කතමං උපාදානං -පෙ- කතමා තණ්හා -පෙ- කතමා වෙදනා -පෙ- කතමො ඵස්සො -පෙ- කතමං සළායතනං -පෙ- කතමං නාමරූපං -පෙ- කතමං විඤ්ඤාණං -පෙ- අවිජ්ජායත්වෙව භික්ඛු අසෙසවිරාගනිරොධා යානිස්ස තානි විසූකායිතානි විසෙවිතානි විප්ඵන්දිතානි කානි චි කානි චි, "කතමෙ සඞ්ඛාරා, කස්ස ච පනිමෙ සඞ්ඛාරා ඉති වා, අඤ්ඤෙ සඞ්ඛාරා, අඤ්ඤස්ස ච පනිමෙ සඞ්ඛාරා ඉති වා, තං ජීවං තං සරීරං ඉති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉති වා" සබ්බානිස්ස තානි පහීනානි භවන්ති උච්ඡින්නමූලානි තාලාවත්ථුකතානි අනභාවකතානි ආයතිං අනුප්පාදධම්මානීති.

## 1. 4. 6.

## දුතියඅවිජ්ජාපච්චයසුත්තං

36. සාවත්ථියං-

තත්‍ර ඛො භගවා -පෙ- අවිජ්ජාපච්චයා භික්ඛවෙ සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

කතමං ජරාමරණං, කස්ස ච පනිදං ජරාමරණං ඉති වා භික්ඛවෙ, යො වදෙය්‍ය, අඤ්ඤං ජරාමරණං අඤ්ඤස්ස ච පනිදං ජරාමරණං ඉති වා භික්ඛවෙ, යො වදෙය්‍ය, උභයමෙතං එකත්ථං. බ්‍යඤ්ජනමෙව නානං.

තං ජීවං තං සරීරං ඉති වා භික්ඛවෙ දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉති වා භික්ඛවෙ දිට්ඨියා සති බ්‍රහ්මචරිය-වාසො න හොති. එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති: ජාතිපච්චයා ජරාමරණන්ති -පෙ-

කතමා ජාති -පෙ- කතමො භවො -පෙ- කතමං උපාදානං -පෙ- කතමා තණ්හා -පෙ- කතමා වෙදනා -පෙ- කතමො ඵස්සො -පෙ- කතමං සළායතනං -පෙ-, කතමං නාමරූපං -පෙ- කතමං විඤ්ඤාණං -පෙ- කතමෙ සඞ්ඛාරා, කස්ස ච පනිමෙ සඞ්ඛාරා ඉති වා භික්ඛවෙ යො වදෙය්‍ය, අඤ්ඤෙ සඞ්ඛාරා, අඤ්ඤස්ස ච පනිමෙ සඞ්ඛාරා ඉති වා භික්ඛවෙ යො වදෙය්‍ය, උභයමෙතං එකත්ථං. බ්‍යඤ්ජනමෙව නානං.

මහණ, අවිද්‍යාවගේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් "භවය කවරේ ද, මේ භවය කවරකුගේ දැ යි හෝ, භවය අනෙකක, මේ භවය අනෙකකුගේ යයි හෝ, එය ම ජීවය එය ම ශරීරය යි හෝ, ජීවය අනෙකක, ශරීරය අනෙකකැ යි" හෝ ඔහුට යම් ඒ (සම්‍යග්දෘෂ්ටියට) හුල් වැනි විරුද්ධ පැවැතුම් ඇති ඔබමොබ සැලෙන පැවැතුම් ඇති කිසියම් කිසියම් මිථ්‍යාදෘෂ්ටීහු වෙද්ද; ඔහුගේ ඒ සියලු දෘෂ්ටීහු ප්‍රහීණ වූවාහු සිඳින ලද මුල් ඇත්තාහු හිස්සුන් තල්ගසක් මෙන් කරණ ලද්දාහු නැවත නො හටගන්නා බවට පමුණුවන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත්.

මහණ, අවිද්‍යාවගේ ම නිරවශෙෂ විරාගනිරොධයෙන් ඔහුට (සම්‍යග්-දෘෂ්ටියට) හුල් වැනි විරුද්ධ පැවැතුම් ඇති ඔබමොබ සැලෙන පැවැතුම් ඇති යම් ඒ කිසියම් කිසියම් මිථ්‍යාදෘෂ්ටීහු වෙද්ද, .... උපාදන කවරේ ද, ... තෘෂ්ණාව කවර, ... වේදනාව කවර, ... ස්පර්ශය කවරේ ද, ... ෂඩායතන කවරේ ද, ... නාමරූප කවරේ ද, ... විඥනය කවරේ ද,.. මහණ, අවිද්‍යාවගේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් ඔහුට "සංස්කාරයෝ කවරහු ද, මේ සංස්කාර කවරකුගේ දැ යි හෝ, සංස්කාර අනෙකෙක, මේ සංස්කාර අනෙකකුගේ යයි හෝ, එය ම ජීවය, එය ම ශරීර ය යි හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ"යි හෝ (සම්‍යග්දෘෂ්ටියට) හුල් වැනි විරුද්ධ පැවතුම් ඇති ඔබමොබ සැලෙන පැවතුම් ඇති යම් කිසියම් කිසියම් මිථ්‍යාදෘෂ්ටීහු වෙත් ද, ඔහුගේ ඒ සියලු මිථ්‍යාදෘෂ්ටීහු ප්‍රහීණ වූවාහු මුලුසුන් කරණ ලද්දාහු හිස් සුන් තල් ගසක් මෙන් කරණ ලද්දාහු නැවත නො හටගන්නා බවට පමුණුවන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත්.

## 1. 4. 6

## දෙවැනි අවිජ්ජාපච්චය සූත්‍රය

36. සැවැත්නුවර-

එහි දී භාග්‍යවතුන් වහන්සේ ... මහණෙනි, අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්. සංස්කාරප්‍රත්‍යයෙන් විඥන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ යයි වදාළ සේක.

මහණෙනි, යමෙක් "ජරාමරණ කවරේ ද, මේ ජරාමරණ කවරකුගේ දැ" යි හෝ කියන්නේ ද, මහණෙනි, යමෙක් "ජරාමරණ අනෙකක, මේ ජරාමරණ අනෙකකුගේ ය"යි හෝ කියන්නේ ද, මේ දෙක ම ඒකාර්ථය. ව්‍යඤ්ජන ම වෙනස් ය.

මහණෙනි, "එය ජීවය, එය ශරීර ය"යි හෝ දෘෂ්ටිය ඇති කල්හි (මාර්ග) බ්‍රහ්මචරියවාසය නො වේ. මහණෙනි "ජීවය අනෙකක, ශරීරය අනෙකකැ"යි හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසය නො වේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නො පැමිණ තථාගත තෙමේ ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ යයි මැදුම් පිළිවෙතින් දහම් දෙසයි ....

ජාතිය කවර .... භවය කවරේ ද ... උපාදන කවරේ ද ... තෘෂ්ණාව කවර ... වේදනාව කවර ... ස්පර්ශය කවරේ ද ... ෂඩායතන කවරේ ද ... නාමරූප කවරේ ද ... විඥනය කවරේ ද ... මහණෙනි, යමෙක් සංස්කාරයෝ කවරහු ද, මේ සංස්කාර කවරකුගේ දැයි හෝ කියන්නේ ද මහණෙනි, යමෙක් සංස්කාර අනෙකක, මේ සංස්කාර අනෙකකුගේ යයි හෝ කියන්නේ ද මේ දෙක ම ඒකාර්ථ ය. ව්‍යඤ්ජන ම වෙනස් ය.

"තං ජීවං තං සරීරං" ඉති වා භික්ඛවෙ, දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. "අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං" ඉති වා භික්ඛවෙ දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති: අවිජ්ජාපච්චයා සඞ්ඛාරා. -පෙ-

අවිජ්ජායත්වෙව භික්ඛවෙ, අසෙසවිරාගනිරොධා යානිස්ස තානි විසූකායිතානි විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි, "කතමං ජරාමරණං කස්ස ච පනිදං ජරාමරණං ඉති වා, අඤ්ඤං ජරාමරණං අඤ්ඤස්ස ච පනිදං ජරාමරණං ඉති වා, තං ජීවං තං සරීරං ඉති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉති වා" සබ්බානිස්ස තානි පහීනානි භවන්ති උච්ඡින්නමූලානි තාලාවත්ථුකතානි අනභාවකතානි[1] ආයතිං අනුප්පාදධම්මානීති.

අවිජ්ජායත්වෙව භික්ඛවෙ, අසෙසවිරාගනිරොධා යානිස්ස තානි විසූකායිතානි විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි, "කතමා ජාති -පෙ- කතමො භවො -පෙ- කතමං උපාදානං -පෙ- කතමා තණ්හා -පෙ- කතමා වෙදනා -පෙ- කතමො ඵස්සො -පෙ- කතමං සළායතනං -පෙ- කතමං නාමරූපං -පෙ- කතමං විඤ්ඤාණං -පෙ- කතමෙ සඞ්ඛාරා, කස්ස ච පනිමෙ සඞ්ඛාරා ඉති වා, අඤ්ඤෙ සඞ්ඛාරා, අඤ්ඤස්ස ච පනිමෙ සඞ්ඛාරා ඉති වා, තං ජීවං තං සරීරං ඉති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉති වා" සබ්බානිස්ස තානි පහීනානි භවන්ති උච්ඡින්නමූලානි තාලාවත්ථුකතානි අනභාවකතානි[1] ආයතිං අනුප්පාදධම්මානීති.

## 1. 4. 7

## නතුම්හසුත්තං

37. සාවත්ථියං-

නායං භික්ඛවෙ, කායො තුම්හාකං. නාපි[2] අඤ්ඤෙසං. පුරාණමිදං භික්ඛවෙ කම්මං අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං වෙදයිතං[3] දට්ඨබ්බං

තත්‍ර ඛො භික්ඛවෙ, සුතවා අරියසාවකො පටිච්චසමුප්පාදඤ්ඤෙව සාධුකං යොනිසො මනසිකරොති: "ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති, යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

---

1. අනභාවං කතානි - මජසං, සයා - සීමු
2. නපි - මජසං, PTS. 3. වෙදනීයං - මජසං, සයා, PTS.

මහණෙනි, "එය ජීවය, එය ශරීර ය"යි හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසය නො වේ. මහණෙනි, "ජීවය අනෙකක, ශරීරය අනෙකකැ"යි හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසය නො වේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ තථාගත තෙමේ අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති යි මැදුම් පිළිවෙතින් දහම් දෙසයි. ...

මහණෙනි, අවිද්‍යාවේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් ඔහුට "ජරාමරණ කවරේ ද, මේ ජරාමරණ කවරකුගේ දැ යි හෝ, ජරාමරණ අනෙකක, මේ ජරාමරණ අනෙකකුගේ ය යි හෝ, එය ජීවය, එය ශරීර ය යි හෝ, ජීවය අනිකක, ශරීරය අනෙකකැ යි" හෝ (සම්‍යග්දෘෂ්ටියට) හුල් වැනි විරුද්ධ පැවැතුම් ඇති නැලෙන පැවැතුම් ඇති යම් ඒ කිසියම් කිසියම් මිථ්‍යාදෘෂ්ටීහු වෙද් ද ඔහුගේ ඒ සියලු දෘෂ්ටීහු ප්‍රහීණ වූවාහු මුලුසුන් කරණ ලද්දාහු හිස් සුන් තල්ගසක් මෙන් කරණ ලද්දාහු නැවත නො හටගන්නා බවට පමුණුවන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත්.

මහණෙනි, අවිද්‍යාවේ ම නිරවශේෂවිරාග නිරෝධයෙන් ඔහුට "ජාතිය කවර ... භවය කවරේ ද ... උපාදාන කවරේ ද ... තෘෂ්ණාව කවර ... වේදනාව කවර ... ස්පර්ශය කවරේ ද ... ෂඩායතන කවරේ ද ... නාම රූප කවරේ ද ... විඥානය කවරේ ද ... සංස්කාරයෝ කවරහු ද, මේ සංස්කාර කවරකුගේ දැයි හෝ, සංස්කාර අනෙකක, මේ සංස්කාර අනෙකකුගේ යයි හෝ, එය ජීවය, එය ශරීරය යි හෝ, ජීවය අනෙකක, ශරීරය අනෙකකැ යි" හෝ (සම්‍යග්දෘෂ්ටියට) හුල් වැනි විරුද්ධ පැවැතුම් ඇති ඔබමොබ සැලෙන පැවතුම් ඇති යම් ඒ කිසියම් මිථ්‍යාදෘෂ්ටීහු වෙත් ද, ඔහුගේ ඒ සියලු දෘෂ්ටීහු ප්‍රහීණ වූවාහු මුලසුන් කරණ ලද්දාහු හිස්සුන් තල්ගසක් මෙන් කරණ ලද්දාහු නැවත නො හටගන්නා බවට පමුණුවන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත්.

## 1. 4. 7

## නතුම්හ සූත්‍රය

37. **සැවැත්නුවර-**

මහණෙනි, මේ කය තොපගේ නො වේ. අනුන්ගේ ද නො වේ. මහණෙනි, මේ පුරාණ කර්මයෙකි. ප්‍රත්‍යයයෙන් කරණ ලද්දේ ය. චේතනාව මුල් කොට ඇත්තේ ය. වේදනාවට වස්තු වූයේ යයි දතයුතු යි.

මහණෙනි, ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ "අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ. ... මෙසේ මේ හුදුදුක් රැසේ හට ගැණීම වේ. අවිද්‍යාවගේ ම නිරවශේෂ විරාගනිරෝධයෙන සංස්කාරනිරෝධය වේ. සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධය වේ. ... මෙසේ මේ හුදුදුක්රැසේ නිරෝධය වේය යන යමක් ඇද්ද, මෙසේ මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය ඉපදීමෙන් මෙය උපදී. මෙය නැති කල්හි මෙය නො වේ. මෙය නිරුද්ධවීමෙන් මෙය නිරුද්ධ වේ ය" යි පටිච්ච-සමුප්පාදය ම මනා කොට නුවණින් මෙනෙහි කෙරෙයි

## 1. 4. 8.

## චෙතනාසුත්තං

38. සාවත්ථියං-

යඤ්ච භික්ඛවෙ, චෙතෙති යඤ්ච පකප්පෙති, යඤ්ච අනුසෙති, ආරම්මණ-මෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති. තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ ආයතිං පුනබ්භවාභි-නිබ්බත්ති හොති. ආයතිං පුනබ්භවාභිනිබ්බත්තියා සති ආයතිං ජාති ජරා මරණං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

නො චෙ භික්ඛවෙ, චෙතෙති, නො චෙ[1] පකප්පෙති, අථ චෙ අනුසෙති, ආරම්මණමෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති. තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොති. ආයතිං පුනබ්භවාභිනිබ්බත්තියා සති ආයතිං ජාතිජරාමරණං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා සම්භවන්ති. එවමෙ-තස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

යතො ච ඛො භික්ඛවෙ, නො චෙව චෙතෙති, නො ච පකප්පෙති, නො ච අනුසෙති, ආරම්මණමෙතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ අසති පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති. තදප්පතිට්ඨිතෙ විඤ්ඤාණෙ අවිරූළ්හෙ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති න හොති. ආයතිං පුනබ්භවාභිනිබ්බත්තියා අසති ආයතිං ජාතිජරාමරණං සොකපරිදෙව දුක්ඛදෙමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## 1. 4. 9.

## දුතිය චෙතනා සුත්තං

39. සාවත්ථියං.

යඤ්ච භික්ඛවෙ, චෙතෙති, යඤ්ච පකප්පෙති, යඤ්ච අනුසෙති, ආරම්මණ-මෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති. තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ නාමරූපස්ස අවක්කන්ති හොති. නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්ස-පච්චයා වෙදනා -පෙ- තණ්හා -පෙ- උපාදානං -පෙ- භවො -පෙ- ජාති -පෙ- ජරාමරණං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

නො චෙ භික්ඛවෙ, චෙතෙති, නො චෙ පකප්පෙති, අථ චෙ අනුසෙති, ආරම්මණමෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති. තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ නාමරූපස්ස අවක්කන්ති හොති. නාමරූපපච්චයා සළායතනං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

---

1. යතො ච - සී. මු - සතා,

## 1. 4. 8.

## චෙතනාසූත්‍රය

38. **සැවැත්නුවර-**

මහණෙනි, යමකුත් සිතයි ද, යමකුත් කල්පනා කෙරේ ද, යමකුත් පවත්වා ද, මෙය විඥානයේ පැවැත්මට අරමුණ වේ. අරමුණ ඇතිකල්හි විඥානයේ පිහිටීම වේ. ඒ විඥානය පිහිටි කල්හි, වැඩුනු කල්හි මතු පුනර්භවය හටගැණීම වේ. මතු පුනර්භවය හට ගැණීම ඇති කල්හි මතු ජාති ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ හටගණිත්. මෙසේ මේ හුදු දුක් රැසේ හට ගැණීම වේ.

මහණෙනි, ඉදින් නො සිතා ද, ඉදින් කල්පනා නො කෙරේ ද, එහෙත් අනුසයනය කෙරේ ද, මෙය විඥානයේ පැවැත්මට අරමුණ වේ. අරමුණ ඇති කල්හි විඥානයේ පිහිටීම වේ. ඒ විඥානය පිහිටි කල්හි වැඩුනු කල්හි මතු පුනර්භවය හටගැණීම වේ. මතු පුනර්භවය හටගැණීම ඇති කල්හි මතු ජාතිජරාමරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ හටගණිත්. මෙසේ මේ හුදු දුක්රැසේ හට ගැණීම වේ.

මහණෙනි, යම් කලෙක නො ද සිතා ද, නො ද කල්පනා කෙරේ ද, නො ද පවත්වා ද, මෙය විඥානයේ පැවැත්මට අරමුණ නො වේ. අරමුණ නැති කල්හි විඥානයේ පිහිටීම නො වේ. ඒ විඥානය නො පිහිටි කල්හි නො වැඩුනු කල්හි මතු පුනර්භවය හට ගැණීම නොවේ. මතු පුනර්භවය හටගැණීම නැති කල්හි මතු ජාති ජරාමරණ සෝක පරිදෙව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

## 1. 4. 9.

## දෙවැනි චෙතනා සූත්‍රය

39. **සැවැත්නුවර-**

මහණෙනි, යමකුත් සිතා ද, යමකුත් කල්පනා කෙරේ ද, යමකුත් නැවත නැවත පවත්වා ද, මෙය විඥානයේ පැවැත්මට අරමුණ වේ. අරමුණ ඇති කල්හි විඥානයේ පිහිටීම වේ. ඒ විඥානය පිහිටි කල්හි වැඩුනු කල්හි නාමරූපයේ බැස ගැන්ම වේ. නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායතන වේ. ෂඩායතනප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ ස්පර්ශප්‍රත්‍යයයෙන් වේදනාව වේ ... තෘෂ්ණාව ... උපාදාන ... භවය ... ජාතිය ... ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ හට ගණිත්. මෙසේ මේ හුදු දුක් රැසේ හට ගැණීම වේ.

මහණෙනි, ඉදින් නො සිතා ද, ඉදින් කල්පනා නො කෙරේ ද, එහෙත් නැවත නැවත පවත්වා ද, මෙය විඥානයේ පැවැත්මට අරමුණ වේ අරමුණ ඇති කල්හි විඥානයේ පිහිටීම වේ. ඒ විඥානය පිහිටි කල්හි වැඩුනු කල්හි නාමරූපයේ බැස ගැන්ම වේ. නාමරූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වේ. මෙසේ මේ හුදු දුක්රැසේ හට ගැන්ම වේ.

යතො ච ඛො භික්ඛවෙ, නො චෙව චෙතෙති, නො ච පකප්පෙති, නො ච අනුසෙති, ආරම්මණමෙතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ අසති පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති. තදප්පතිට්ඨිතෙ විඤ්ඤාණෙ අවිරූළ්හෙ නාමරූපස්ස අවක්කන්ති න හොති. නාමරූපනිරොධා සළායතනනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## 1. 4. 10.

## තතියචෙතනාසුත්තං

40. සාවත්ථියං:-

යඤ්ච භික්ඛවෙ, චෙතෙති, යඤ්ච පකප්පෙති, යඤ්ච අනුසෙති, ආරම්මණමෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති. තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ නති හොති. නතියා සති ආගතිගති හොති. ආගතිගතියා සති චුතූපපාතො හොති. චුතූපපාතෙ සති ආයතිං ජාතිජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති

නො චෙ භික්ඛවෙ, චෙතෙති, නො චෙ පකප්පෙති, අථ චෙ අනුසෙති ආරම්මණමෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති. තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ නති හොති. නතියා සති ආගතිගති හොති. ආගතිගතියා සති චුතූපපාතො හොති. චුතූපපාතෙ සති ආයතිං ජාතිජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

යතො ච ඛො භික්ඛවෙ, නො චෙව චෙතෙති, නො ච පකප්පෙති, නො ච අනුසෙති, ආරම්මණමෙතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ අසති පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති. තදප්පතිට්ඨිතෙ විඤ්ඤාණෙ අවිරූළ්හෙ නති න හොති. නතියා අසති ආගතිගති න හොති. ආගතිගතියා අසති චුතූපපාතො න හොති. චුතූපපාතෙ අසති ආයතිං ජාතිජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

### කළාරඛත්තියවග්ගො චතුත්ථො

තත්‍රුද්දානං:

භූතමිදං කළාරඤ්ච ද්වෙ ච ඤාණවත්ථූනි,
අවිජ්ජාපච්චයා ච ද්වෙ නතුම්හ චෙතනා තයොති.

මහණෙනි, යම් කලෙක නො ද සිතා ද, නො ද කල්පනා කෙරේ ද, නො ද පවත්වා ද, මෙය විඥානයේ පැවැත්මට අරමුණ නො වේ. අරමුණ නැති කල්හි විඥානයේ පිහිටීම නො වේ. ඒ විඥානය නො පිහිටි කල්හි නො වැඩුනු කල්හි නාමරූපයේ බැස ගැණීම නො වේ. නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

## 1. 4. 10.

## තෙවැනි චේතනා සූත්‍රය

40. සැවැත්නුවර-

මහණෙනි, යමකුත් සිතා ද, යමකුත් කල්පනා කෙරේ ද, යමකුත් නැවැත නැවැත පවත්වා ද, මෙය විඥානයේ පැවැත්මට අරමුණ වේ. අරමුණ ඇති කල්හි විඥානයේ පිහිටීම වේ. ඒ විඥානය පිහිටි කල්හි වැඩුනු කල්හි තෘෂ්ණාව වේ. තෘෂ්ණාව ඇති කල්හි කර්මාදී අරමුණෙහි විඥානය පැවැත්ම වේ. අරමුණෙහි විඥානයේ පැවැත්ම ඇති කල්හි ච්‍යුතිය හා උපපත්තිය වේ. ච්‍යුතිඋපපත්ති ඇති කල්හි මත්තෙහි ජාතිජරාමරණසොක-පරිදෙවදුක්ඛදෙමනස්සඋපායාසයෝ හට ගණිත්. මෙසේ මේ හුදු දුක් රැසේ හට ගැත්ම වේ.

මහණෙනි, ඉදින් නො සිතා ද, ඉදින් කල්පනා නොකෙරේ ද, එහෙත් අනුසයනය කෙරේ ද, මෙය විඥානයාගේ පැවැත්මට අරමුණ වේ. අරමුණ ඇති කල්හි විඥානයේ පිහිටීම වේ. ඒ විඥානය පිහිටි කල්හි වැඩුනු කල්හි තෘෂ්ණා නතිය වේ. තෘෂ්ණාව ඇති කල්හි (කර්මාදි අරමුණුවල විඥානයේ පැවැත්ම) ආගතිය, (කර්ම හෝ කර්මනිමිත්ත හෝ ගතිනිමිති එළඹ සිටි කාල ගතිය (ප්‍රතිසන්ධි වශයෙන් විඥානයාගේ ගමන) වේ ආගතිගති ඇති කල්හි චුතිය හා උපපත්තිය වේ. චුති උපපත්ති ඇති කල්හි මතු ජාතිජරාමරණ-සොකපරිදෙවදුක්ඛදෙමනස්සඋපායාසයෝ හට ගණිත්. මෙසේ මේ හුදු දුක් රැසේ හට හැණීම වේ.

මහණෙනි, යම් කලෙක නො ද සිතා ද, නො ද කල්පනා කෙරේ ද, නො ද පවත්වා ද, මෙය විඥානයේ පැවැත්මට අරමුණ නො වේ. අරමුණ නැති කල්හි විඥානයේ පිහිටීම නො වේ. ඒ විඥානය නොසිටි කල්හි නො වැඩුනු කල්හි තෘෂ්ණාව නො වේ. තෘෂ්ණාව නැති කල්හි කර්මාදි ආගතිගති නො වේ. ආගතිගති නැති කල්හි ච්‍යුතිය හා උපපත්තිය නො වේ. ච්‍යුති උපපත්ති නැති කල්හි මතු ජාතිජරාමරණසොකපරිදෙවදුක්ඛදෙමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේයි.

කළාරඛත්තිය වර්ගය සිවුවැනි යි.

එහි උද්දානය:

භූත සූත්‍ර ය, කළාරඛත්තිය සූත්‍ර ය, ඤාණවත්ථු සූත්‍ර දෙක ය, අවිජ්ජා-පච්චය සූත්‍ර දෙක ය, නතුම්හ සූත්‍ර ය, චේතනා සූත්‍ර තුණය යි සූත්‍ර දශයෙකි.

# 5. ගහපතිවග්ගො.

## 1. 5. 1.

### පඤ්චභයවෙරසුත්තං

41. සාවත්ථියං-

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

යතො ඛො ගහපති, අරියසාවකස්ස පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති, චතූහි ච සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති, අරියො චස්ස ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො, සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය: "ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡාන-යොනියො[1] ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො, සොතාපන්නො-හමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො"ති.

කතමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති?

යං ගහපති, පාණාතිපාතී පාණාතිපාතපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති,[2] පාණාතිපාතා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති.

යං ගහපති, අදින්නාදායී අදින්නාදානපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති, අදින්නාදානා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති.

යං ගහපති, කාමෙසු මිච්ඡාචාරී කාමෙසු මිච්ඡාචාරපච්චයා දිට්ඨ-ධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති.

යං ගහපති, මුසාවාදී මුසාවාදපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටි-සංවෙදයති, මුසාවාදා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති.

---

1. යොනි - මජ්ඣං   2. පටිසංවෙදියති – සී.මු. P.T.S.

# 5. ගහපති වග්ගය.

## 1. 5. 1.

### පඤ්චභයවෙරසූත්‍රය.

41. සැවැත්නුවර-

එකල්හි අනේපිඬු ගෘහපති තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් අනේපිඬු ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

ගෘහපතිය, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවකයාගේ පස්වැදෑරුම් භය හා වෛර චේතනාවෝ සංසිඳුනාහු වෙද්ද, සිව්වැදෑරුම් සෝතාපත්ති අඞ්ගයෙන් යුක්ත වූයේ වේ ද, ආර්‍ය්‍ය (නිර්දෝෂ) වූ න්‍යාය (ප්‍රතීත්‍ය සමුත්පාදය) විදර්ශනා) ප්‍රඥයෙන් මනා ව දක්නා ලද්දේ මැනැවින් අවබොධ කරණ ලද්දේ වේ ද, හෙතෙමේ කැමැති වන්නේ නම් "ක්‍ෂය වූ නිරය ඇත්තෙම් ක්‍ෂය වූ තිරච්ඡාන යොනි ඇත්තෙම් ක්‍ෂය වූ ප්‍රෙතවිෂය ඇත්තෙම් ක්‍ෂය වූ අපාය දුර්ගති විනිපාත ඇත්තෙම් වෙමි. සෝවන් වූයෙම් විවසට පතිතවන සවභාව නැත්තෙම් නියත වූයෙම් සම්බොධිය පිහිට කොට ඇත්තෙම් වෙමි" යි තෙමේ ම තමා ප්‍රකාශ කරන්නේ ය.

කවර පස්වැදෑරුම් භය වෛර චෙතනාවෝ සංසිඳුනාහු වෙත් ද යත්:

ගෘහපතිය, පරපණ නසන සුලු පුද්ගල තෙමේ පරපණ නැසීම් ප්‍රත්‍යයෙන් මෙලොව්හිත් යම් බියක් හා වෙරක් රැස් කෙරේ ද, පරලොව්හිත් යම් බියක් හා වෙරක් රැස් කෙරේ ද, චෙතසික වූත් යම් දුකක් හා දොම්නසක් විඳී ද, පණිවාතින් දුරු වූවහුට මෙසේ ඒ බිය හා වෙර සංසිඳුනේ වේ.

ගෘහපතිය, නුදුන් දෙය ගන්නාසුලු පුහුල් තෙමේ නුදුන් දෙය ගැණීම් හෙතුයෙන් මෙලොව්හිත් යම් බියක් හා වෙරක් රැස් කෙරේ ද, පරලොව්හිත් යම් බියක් හා වෙරක් රැස්කෙරේ ද, චෛතසික වූත් යම් දුකක් දොම්නසක් විඳී ද, නුදුන් දෙය ගැන්මෙන් වෙන්වූ ඔහුට මෙසේ ඒ භය හා වෛර සංසිඳුනේ වේ.

ගෘහපතිය, කාමයෙහි වරදවා හැසිරෙණසුලු පුහුල් තෙමේ කාමයෙහි වරදවා හැසිරීම් පසයෙන් මෙලොව්හිත් යම් බියක් හා වෙරක් රැස් කෙරේද, පරලොව්හිත් යම් බියක් හා වෙරක් රැස් කෙරේ ද, චෛතසිකවූත් යම් දුකක් දොම්නසක් විඳී ද, කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන් වූවහුට මෙසේ ඒ බිය හා වෙර සංසිඳුනේ වේ.

ගෘහපතිය, මුසවා බෙණෙනසුලු පුහුල් තෙමේ මුසවා පසයෙන් මෙලොව්හිත් යම් බියක් හා වෙරක් රැස් කෙරේ ද, පරලොව්හිත් යම් බියක් හා වෙරක් රැස් කෙරේ ද, චෛතසික වූත් යම් දුකක් දොම්නසක් විඳී ද, මුසවායෙන් වෙන් වූවහුට මෙසේ ඒ බිය හා වෙර සංසිඳුනේ වේ.

යං ගහපති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී සුරාමෙරයමජ්ජපමාදට්ඨානපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති.

ඉමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති.

කතමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති?

ඉධ ගහපති, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා අරහං, සම්මාසම්බුද්ධො, විජ්ජාචරණසම්පන්නො, සුගතො, ලොකවිදූ, අනුත්තරො පුරිසදම්මසාරථි, සත්ථා දෙවමනුස්සානං, බුද්ධො, භගවා"ති.

ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ස්වාක්ඛාතො භගවතා ධම්මො, සන්දිට්ඨිකො, අකාලිකො, එහිපස්සිකො, ඔපනයිකො, පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති.

සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "සුපටිපන්නො[1] භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො, - ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති.

අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති: අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤූප්පසත්ථෙහි[2] අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි.

ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති.

කතමො චස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො?

ඉධ ගහපති, අරියසාවකො පටිච්චසමුප්පාදඤ්ඤෙව සාධුකං යොනිසො මනසි කරොති: "ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති, යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයමස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො -

1. සුප්පටිපන්නො - මජසං.
2. විඤ්ඤූපසත්ථෙහි - සයා PTS

ගැහැවිය, මදයට හා පමාවට කරුණු වූ රහමෙර පානය කරණසුලු පුගුල් තෙමේ මදපමාවට කරුණු වූ රහමෙර පානය කිරීම් පසයෙන් මෙලෙව්හිත් යම් බියක් හා වෛරක් රැස් කෙරේ ද, පරලෙව්හිත් යම් බියක් හා වෛරක් රැස් කෙරේ ද, චෛතසික වූත් යම් දුකක් දොම්නසක් විඳී ද, මදයට හා පමාවට කරුණු වූ රහමෙර පානයෙන් වෙන් වූවහුට මෙසේ ඒ බිය හා වෛර සංසිඳුනේ වේ.

මේ පස්වැදෑරුම් බිය හා වෛරසංසිඳුනාහු වෙත්.

කවර සිවුවැදෑරුම් සෝවන් අඞ්ගයන්ගෙන් යුක්තවූයේ වේ ද යත්:

ගැහැවිය, මෙහි ආය්‍ර්‍යශ්‍රාවක තෙමේ "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණෙනුදු අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විද්‍යාචරණසම්පන්නයහ, සුගතයහ, ලොකවිදූ හ, නිරුත්තරපුරිසදම්මසාරථි හ, දෙව් මිනිසුන්ට ශාස්තෘ හ බුද්ධය හ, භාග්‍යවත් හ" යි බුදුරජාතන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි.

"භාග්‍යවතුන් වහන්සේ විසින් (දෙසූ) ධර්‍මය-ස්වාක්ඛාත ය, සන්දිට්ඨික ය, අකාලික ය, එහිපස්සික ය, ඔපනයික ය, නුවණැත්තන් විසින් තම්තමා කෙරෙහි ලා දත යුත්තේ ය" යි ධර්‍මය කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්ත වූයේ වේ.

"භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුපටිපන්නය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ උජුපටිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ ඤායපටිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සාමීචිපටිපන්න ය, යම් මේ පුරුෂයුග සතරෙක් ආය්‍ර්‍යපුද්ගලයෝ අටදෙනෙක් වෙද් ද, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ-ආහුනෙය්‍ය ය, පාහුණෙය්‍ය ය, දක්ඛිණෙය්‍ය ය, අඤ්ජලිකරණීය ය, ලෝවැස්සාට නිරුත්තරපුණ්‍යක්ෂෙත්‍ර ය"යි සඞ්ඝයා කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙයි.

කඩ නො වූ සිදුරු නො වූ සබර නො වූ කල්මාෂ නො වූ නිදහස් වූ නුවණැත්තන් විසින් පසස්නා ලද තෘෂ්ණාදෘෂ්ටීන් අපරාමෘෂ්ට වූ සමාධිය පිණිස පවත්නා වූ ආය්‍ර්‍යකාන්ත ශීලයෙන් යුක්ත වූයේ වේ. මේ සිවුවැදෑරුම් සෝතාපත්ති අඞ්ගයෙන් යුක්ත වූයේ වෙයි.

නිර්දෝෂ වූ කවර න්‍යායයෙක් ඔහු විසින් විදර්ශනාප්‍රඥාවෙන් මැනැවින් දක්නා ලද්දේ අවබොධ කරණ ලද්දේ වේ ද?

ගැහැවිය, මෙහි ආය්‍ර්‍යශ්‍රාවක තෙමේ "අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙත්. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ. විඥානප්‍රත්‍යයයෙන් නාමරූප වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ. අවිද්‍යාවගේ ම නිරවශෙෂ විරාගනිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාරනිරෝධයෙන් විඥාන-නිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක් රැසේ නිරොධය වේ ය යන මේ යමක් ඇද් ද, මෙසේ මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය ඉපදීමෙන් මෙය උපදී. මෙය නැති කල්හි මෙය නො වෙයි මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ ය" යි පටිච්චසමුප්පාදය ම මනා කොට නුවණින් මෙනෙහි කෙරෙයි. නිර්දෝෂ වූ මේ න්‍යාය ඔහු විසින් විදර්ශනාප්‍රඥාවෙන් මැනැවින් දක්නා ලද්දේ මැනැවින් අවබෝධ කරණ ලද්දේ වෙයි.

යතො ඛො ගහපති, අරියසාවකස්ස ඉමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති, ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති, අයමස්ස[1] අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො, සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය: ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො, සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

## 1. 5. 2

## දුතිය පඤ්චභයවෙරසුත්තං

42. සාවත්ථියං-

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා එතදවොච

යතො ච ඛො භික්ඛවෙ අරියසාවකස්ස පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති. චතූහි ච සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති. අරියො චස්ස ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො, සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය. ඛීණනිරයොම්හි -පෙ- අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

කතමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති?

යං භික්ඛවෙ,* පාණාතිපාතී -පෙ- [භයං වෙරං පසවති -පෙ-] අදින්නාදායී -පෙ- කාමෙසු මිච්ඡාචාරී -පෙ- මුසාවාදී -පෙ- යං භික්ඛවෙ සුරාමෙරයමජ්ජපමාදට්ඨායී -පෙ- [භයං වෙරං පසවති -පෙ- දුක්ඛං දොමනස්සං වෙදයති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති ]

ඉමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානිහොන්ති.

කතමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති?

ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ [අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති.] -පෙ- ධම්මෙ -පෙ- සඞ්ඝෙ [අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති.] -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති -පෙ- ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති.

කතමො චස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො?

ඉධ භික්ඛවෙ, අරියසාවකො පටිච්චසමුප්පාදඤ්ඤෙව සාධුකං යොනිසො මනසි කරොති -පෙ- අයමස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො

1 අයඤ්චස්ස - මජසං, PTS 1, 2

* සඞ්ඛාරවති සබ්බං විත්ථාරෙතබ්බං - සිමු, PTS, සී 1, 2.

ගෘහපතිය, යම් කලෙක ආර්‍යශ්‍රාවකයාගේ මේ පස් වැදෑරුම් බිය හා වෛරයෝ සංසිඳුනාහු වෙද් ද, මේ සිවුවැදෑරුම් සෝතාපත්තිඅඞ්ගයන්ගෙන් යුක්තවූයේ වේ ද, නිර්දෝෂ වූ මේ න්‍යාය ඔහු විසින් විදර්ශනා ප්‍රඥාවෙන් මනාව දක්නා ලද්දේ මැනවින් අවබෝධ කරණ ලද්දේ වේ ද, හෙතෙමේ කැමැති වන්නේ නම් "ක්‍ෂය වූ නිරය ඇත්තෙම් ක්‍ෂය වූ තිරිසන්යෝනි ඇත්තෙම් ක්‍ෂය වූ ප්‍රේත විෂය ඇත්තෙම් ක්‍ෂය වූ අපාය දුර්ගති විනිපාත ඇත්තෙම් වෙමි. සෝවන් වූයෙම් විවසව පතිතවන සවභාව නැත්තෙම් නියත වූයෙම් සම්බොධිය පිහිට කොට ඇත්තෙම් වෙමි"යි තෙමේ ම තමා ප්‍රකාශ කරන්නේ ය.

## 1. 5. 2

## දෙවැනි පඤ්චභයවෙර සූත්‍රය

42. **සැවැත්නුවර-**

එකල්හි බොහෝ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹීහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්‍ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක:

මහණෙනි, යම්කලෙක ආර්‍යශ්‍රාවකයාගේ පස් වැදෑරුම් බිය හා වෛර සංසිඳුනාහු වෙද්ද, සිවුවැදෑරුම් සොතාපත්තිඅඞ්ගයන්ගෙන් යුක්තවූයේ වේ ද, ඔහු විසින් නිර්දෝෂ වූ න්‍යායය නුවණින් මනා කොට දක්නා ලද්දේ මැනැවින් අවබෝධ කරණ ලද්දේ වේ ද, හෙතෙමේ කැමති වන්නේ නම් "ක්‍ෂය වූ නිරය ඇත්තෙම් . විවසව පතිතවන සවභාව නැත්තෙම් නියත වූයෙම් සම්බෝධිය පිහිට කොට ඇත්තෙම් වෙමි"යි තෙමේ ම තමා ප්‍රකාශ කරන්නේ ය.

කවර පස්වැදෑරුම් බිය හා වෛර සංසිඳුනාහු වෙද්ද යත්:

මහණෙනි, පරපණ නසනා සුලු පුද්ගල තෙමේ යම් ... භයක් හා වෛරක් රැස්කෙරේද ... නුදුන් දෙය ගන්න පුද්ගල තෙමේ ... කාමයෙහි වරදවා හැසිරෙන පුද්ගල තෙමේ මුසවා බෙණෙනසුලු පුද්ගල තෙමේ ... මහණෙනි, මද්‍යට හා පමාවට කරුණු වූ රහමෙර පානය කරණසුලු පුද්ගල තෙමේ ... යම් භයක් හා වෛරක් රැස්කෙරේද ... දුකක් දොම්නසක් විඳීද, මදපමා කරුණු වූ රහමෙර පානයෙන් වෙන් වූ වහුට මෙසේ ඒ බිය හා වෛර සංසිඳුනේ වේ.

මේ පස්වැදෑරුම් වෛර හා බිය සංසිඳුනාහු වෙත්.

කවර සෝතාපත්තිඅඞ්ග සතරකින් යුක්තවූයේ වේ ද යත්:

මහණෙනි, මෙහි ආර්‍යශ්‍රාවක තෙමේ බුද්ධරජානන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙයි ධර්මය කෙරෙහි ... සඞ්ඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙයි . ආර්‍යකාන්තශීලයෙන් යුක්ත වූයේ වෙයි . මේ සෝවන් අඞ්ග සතරින් යුක්ත වූයේ වෙයි.

ඔහු විසින් නිර්දෝෂ වූ කවර න්‍යායයෙක් නුවණින් මනා කොට දක්නා ලද්දේ මැනවින් අවබෝධ කරණ ලද්දේ වේ ද?

මහණෙනි, මෙහි ආර්‍යශ්‍රාවක තෙමේ පටිච්චසමුප්පාදය ම මැනැවින් නුවණින් මෙනෙහි කෙරෙයි ... ඔහු විසින් මේ නිර්දෝෂ වූ න්‍යාය නුවණින් මනා කොට දක්නා ලද්දේ මැනැවින් අවබෝධ කරණ ලද්දේ වෙයි.

යතො ච ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති, ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති, අයමස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො, සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය: "ඛීණනිරයොම්හි, ඛීණතිරච්ඡානයොනියො, ඛීණපෙත්තිවිසයො, ඛීණාපායදුග්ගතිවිනිපාතො සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො"ති.

## 1. 5. 3.

## දුක්ඛසුත්තං

43. සාවත්ථියං-

දුක්ඛස්ස භික්ඛවෙ, සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච[1] දෙසිස්සාමි. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ දුක්ඛස්ස සමුදයො? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. අයං ඛො භික්ඛවෙ දුක්ඛස්ස සමුදයො

සොතඤ්ච පටිච්ච සද්දෙ ච -පෙ- ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච රසෙ ච -පෙ- කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. අයං ඛො භික්ඛවෙ දුක්ඛස්ස සමුදයො.

කතමො ච භික්ඛවෙ, දුක්ඛස්ස අත්ථඞ්ගමො? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො. භවනිරොධා ජාතිනිරොධො. ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයං ඛො භික්ඛවෙ දුක්ඛස්ස අත්ථඞ්ගමො.

සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං -පෙ- ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං -පෙ- ජිව්හඤ්ච පටිච්ච රසෙ ච -පෙ- කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනො විඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා වෙදනාපච්චයා තණ්හා. තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො. භවනිරොධා ජාතිනිරොධො. ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයං ඛො භික්ඛවෙ. දුක්ඛස්ස අත්ථඞ්ගමොති.

---

1. අත්ථගමං- සී 1, 2

මහණෙනි, යම් කලෙක ආර්‍යශ්‍රාවකයාගේ මේ පස්වැදෑරුම් බිය හා වෛර සංසිඳුනාහු වෙද් ද, මේ සෝවාන් අඞ්ගසතරෙන් යුක්ත වූයේ වේ ද. ඔහු විසින් මේ නිදෙෂ වූ න්‍යාය නුවණින් මනා කොට දක්නා ලද්දේ මැනැවින් අවබෝධ කරණ ලද්දේ වේ ද, හෙතෙමේ කැමැති වන්නේ නම් "ක්ෂීණ වූ නිරය ඇත්තෙම් ක්ෂීණ වූ තිරශ්චීන යෝනි ඇත්තෙම් ක්ෂීණ වූ ප්‍රේතවිෂය ඇත්තෙම්, ක්ෂීණ වූ අපාය දුර්ගති විනිපාත ඇත්තෙම් සෝවාන් වූයෙම් විවස ව පතිත වන සවභාව නැත්තෙම් නියත වූයෙම් සම්බොධිය පිහිට කොට ඇත්තෙම් වෙමි" යි තෙමේ ම තමා ප්‍රකාශ කරන්නේ ය.

## 1. 5. 3

## දුක්ඛ සූත්‍රය

43. සැවැත්නුවර-

මහණෙනි, දුක් හටගැන්ම ද නැතිවීම ද දෙශනා කරන්නෙමි. එය අසවු.

මහණෙනි, දුක් හටගැන්ම කවරේ ද යත්: ඇසත් රූපත් නිසා චක්ෂුර්විඥානය උපදී. මේ දහම් තුණේ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනාව වේ. වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. මහණෙනි, මේ දුක් හටගැන්මයි.

කණත් ශබ්දත් නිසා ... නැහැයත් ගඳත් නිසා ... දිවත් රසත් නිසා ... කයත් ස්ප්‍රෂ්ටව්‍යත් නිසා ... සිතත් දහමුත් නිසා මනෝවිඥානය උපදී. ඒ දහම් තුණේ එක්වීම ස්පර්ශ ය යි. ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනාව වේ වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. මහණෙනි, මේ දුක් හටගැණීම යි.

මහණෙනි, දුක් නැතිවීම කවරේ ද යත්: ඇසත් රූපත් නිසා චක්ෂුර්විඥානය උපදී. ඒ දහම් තුණේ එක්වීම ස්පර්ශ ය යි. ස්පර්ශප්‍රත්‍යය යෙන් වේදනාව වේ. වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. ඒ තෘෂ්ණාවේ ම නිරවශේෂ විරාගනිරෝධයෙන් උපාදානනිරෝධය වේ. උපාදානනිරොධයෙන් භවනිරෝධය වේ. භවනිරෝධයෙන් ජාතිනිරෝධය වේ. ජාතිනිරොධයෙන් ජරාමරණ සොකපරිදෙව දුක්ඛදෞර්මනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක් රැසේ නිරොධය වේ. මහණෙනි, මේ දුක් නැතිවීම යි.

කණත් ශබ්දත් නිසා සොතවිඥානය උපදී ... නැහැයත් ගඳත් නිසා ඝ්‍රාණවිඥානය උපදී ... දිවත් රසත් නිසා ... කයත් ස්ප්‍රෂ්ටව්‍යයත් නිසා ... සිතත් දහමුත් නිසා මනොවිඥානය උපදී. ඒ දහම් තුණේ එක්වීම ස්පර්ශ ය යි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. ඒ තෘෂ්ණාවේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් උපාදානනිරෝධය වේ. උපාදානනිරෝධයෙන් භවනිරෝධය වේ. භවනිරෝධයෙන් ජාතිනිරොධය වේ. ජාතිනිරොධයෙන් ජරාමරණ සෝකපරිදේව දුක්ඛදෞර්මනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේ. මහණෙනි, මේ දුක් නැතිවීම යි.

## 1. 5. 4.

## ලොකසුත්තං

44. සාවත්ථියං-

ලොකස්ස භික්ඛවෙ සමුදයං ච අත්ථඞ්ගමං ච දෙසිස්සාමි තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ, ලොකස්ස සමුදයො? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තණ්හාපච්චයා උපාදානං. උපාදානපච්චයා භවො. භවපච්චයා ජාති. ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. අයං ඛො භික්ඛවෙ, ලොකස්ස සමුදයො.

සොතඤ්ච පටිච්ච සද්දෙ ච -පෙ- ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච රසෙ ච -පෙ- කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා -පෙ- ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. අයං ඛො භික්ඛවෙ ලොකස්ස සමුදයො.

කතමො ච භික්ඛවෙ, ලොකස්ස අත්ථඞ්ගමො? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයං ඛො භික්ඛවෙ ලොකස්ස අත්ථඞ්ගමො

සොතඤ්ච පටිච්ච සද්දෙ ච -පෙ- ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච රසෙ ච -පෙ- කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා වෙදනාපච්චයා තණ්හා. තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයං ඛො භික්ඛවෙ ලොකස්ස අත්ථඞ්ගමොති.

## 1. 5. 5.

## ඤාතිකසුත්තං

45. එවං මෙ සුතං: එකං සමයං භගවා ඤාතිකෙ විහරති ගිඤ්ජකාවසථෙ

අථ ඛො භගවා රහොගතො පටිසල්ලීනො[1] ඉමං ධම්මපරියායං අභාසි:

---

1. පටිසල්ලානො - මජසං

## 1. 5. 4.

## ලෝක සූත්‍රය

44. **සැවැත් නුවර-**

මහණෙනි, ලෝකයේ (පඤ්චස්කන්ධයේ) හටගැණිමත් නැතිවීමත් දේශනා කරන්නෙමි. එය අසවු.

මහණෙනි, පඤ්චස්කන්ධ ලෝකයේ හටගැණිම කවරේ ද යත්: ඇසත් රූපත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. ඒ තුණේ එක්වීම ස්පර්ශ ය යි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ. වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදාන වේ. උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේ. භව-ප්‍රත්‍යයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දොම්නස්ස උපායාසයෝ හටගණිත්. මහණෙනි, මේ ලෝකයේ හට ගැණිම යි.

කණත් ශබ්දත් නිසා ... නැහැයත් ගඳත් නිසා ... දිවත් රසත් නිසා ... කයත් ස්ප්‍රෂ්ටව්‍යත් නිසා .. සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී ඒ තුණේ එක්වීම ස්පර්ශ යයි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ. වේදනා-ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ ... ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දොම්නස්ස උපායාසයෝ හටගණිත්. මහණෙනි, මේ ලෝකයේ හටගැණිම යි.

මහණෙනි, ලෝකයේ නැතිවීම කවරේ ද යත්: ඇසත් රූපත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. ඒ තුණේ එක්වීම ස්පර්ශ යයි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ. වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. ඒ තෘෂ්ණාවේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් උපාදානනිරෝධය වේ. උපාදානනිරෝධයෙන් භවනිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේ. මහණෙනි මේ ලෝකයේනැතිවීම ය

කණත් ශබ්දත් නිසා ... නැහැයත් ගඳත් නිසා ... දිවත් රසත් නිසා ... කයත් ස්ප්‍රෂ්ටව්‍යත් නිසා සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී. ඒ තුණේ එක්වීම ස්පර්ශ ය යි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ. වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ ඒ තෘෂ්ණාවේ ම නිරවශේෂ විරාගනිරෝධයෙන් උපාදානනිරෝධය වේ. උපාදානනිරෝධයෙන් භවනිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේ මහණෙනි, මේ ලෝකයේ නැතිවීම යි.

## 1. 5. 5

## ඤාතික සූත්‍රය

45. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ඤාතික ගම්හි ගඩොලින් කළ පහයෙහි වසන සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එකලාව විවෙකී ව වැඩහුන් සේක් මේ දහම් ක්‍රමය වදාළ සේක:

චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සොතඤ්ච පටිච්ච සද්දෙ ච -පෙ- ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච රසෙ ච -පෙ- කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තණ්හාපච්චයා උපාදානං-පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො-පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

සොතඤ්ච පටිච්ච සද්දෙ ච -පෙ- ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච රසෙ ච -පෙ- කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු භගවතො උපස්සුතිං[1] ඨිතො හොති. අද්දසා ඛො භගවා තං භික්ඛුං උපස්සුතිං ඨිතං. දිස්වාන තං භික්ඛුං එතදවොච: අස්සොසි නො ත්වං භික්ඛු ඉමං ධම්මපරියායන්ති? එවම්භන්තෙති. උග්ගණ්හාහි ත්වං භික්ඛු ඉමං ධම්මපරියායං. පරියාපුණාහි ත්වං භික්ඛු ඉමං ධම්මපරියායං. ධාරෙහි ත්වං භික්ඛු ඉමං ධම්මපරියායං. අත්ථසංහිතොයං භික්ඛු ධම්මපරියායො, ආදිබ්‍රහ්මචරියකොති.

## 1. 5. 6

### අඤ්ඤතර බ්‍රාහ්මණසුත්තං

46. සාවත්ථියං-

අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

කින්නු ඛො භො ගොතම සො කරොති, සො පටිසංවෙදයතීති? "සො කරොති සො පටිසංවෙදයතී"ති ඛො බ්‍රාහ්මණ, අයමෙකො අන්තො.

කිං පන භො ගොතම අඤ්ඤො කරොති, අඤ්ඤො පටිසංවෙදයතීති? "අඤ්ඤො කරොති අඤ්ඤො පටිසංවෙදයතී" ති ඛො බ්‍රාහ්මණ, අයං දුතියො අන්තො.

1 උපස්සුති - මජ්ඣං, සතා.

ඇසත් රූපත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. ඒ තුණේ එක්වීම ස්පර්ශ ය යි. ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වේදනාව වේ. වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදාන වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ හට ගැණීම වේ.

කණත් ශබ්දත් නිසා ... නැහැයත් ගඳත් නිසා ... දිවත් රසත් නිසා ... කයත් ස්ප්‍රෂ්ටව්‍යත් නිසා සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී. ඒ තුණ එක් වීම ස්පර්ශය යි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ. වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හට ගැණීම වේ.

ඇසත් රූපත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. ඒ තුණ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ. වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ. ඒ තෘෂ්ණාවේ ම නිරවශේෂ විරාග නිරොධයෙන් උපාදානනිරෝධය වේ. උපාදාන නිරෝධයෙන් භවනිරෝධය වේ. .... මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේ.

කණත් ශබ්දත් නිසා ... නැහැයත් ගඳත් නිසා ... දිවත් රසත් නිසා ... කයත් ස්ප්‍රෂ්ටව්‍යත් නිසා ... සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී. ඒ තුණ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශප්‍රත්‍යයයෙන් වේදනාව වේ. වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ. ඒතෘෂ්ණාවේ ම නිරවශේෂවිරාගනිරොධයෙන් උපාදාන නිරෝධය වේ. උපාදානනිරොධයෙන් භව නිරොධය වේ .. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ යි (වදාළ සේක.)

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේගේ උපශ්‍රැතියෙහි (=දේශනාව ඇසෙන තන්හි) සිටියේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ උපශ්‍රැති-යෙහි සිටි ඒ මහණ දුටුසේක. දැක ඒ මහණහට මෙය වදාළ සේක: මහණ, තෙපි මේ ධර්මක්‍රමය ඇසුවහු දැ' වහන්ස, එසේ ය. මහණ, තෙපි මේ ධර්මක්‍රමය උගණිවු. මහණ, තෙපි මේ ධර්මක්‍රමය පිරිවහවු. මහණ, තෙපි මෙ ධර්මක්‍රමය දරවු. මහණ, මේ ධර්මක්‍රමය අර්ථ සහිතය, මගබඹසරට මුල් වූයේ ය.

## 1. 5. 6

## අඤ්ඤතරබ්‍රාහ්මණ සූත්‍රය

46. සැවැත්නුවර-

ඉක්බිති එක්තරා බමුණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේ ය. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය:

භවත් ගෞතමයෙනි, කිමෙක් ද, හෙ තෙමේ කෙරේ ද, හෙ තෙමේ විඳී දැ' බමුණ, "හෙ තෙමේ කෙරෙයි. හෙ තෙමේ විඳී" යනු මේ එක් අන්තයෙකි. (=කෙළවරෙකි.)

භවත් ගෞතමයෙනි, කිමෙක් ද අනෙකෙක් කෙරේ ද, අනෙකෙක් විඳී දැ' බමුණ, "අනෙකෙක් කෙරෙයි. අනෙකෙක් විඳී" යනු දෙවන අන්ත යයි.

එතෙ තෙ බ්‍රාහ්මණ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති: "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති.

එවං වුත්තෙ සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 1. 5. 7.

## ජාණුස්සොණිසුත්තං

47. සාවත්ථියං-

අථ ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි -පෙ- එකමන්තං නිසින්නො ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

කින්නු ඛො භො ගොතම සබ්බමත්ථීති? "සබ්බමත්ථී"ති ඛො බ්‍රාහ්මණ අයමෙකො අන්තො.

කිං පන භො ගොතම සබ්බං නත්ථීති? "සබ්බං නත්ථී"ති ඛො බ්‍රාහ්මණ අයං දුතියො අන්තො.

එතෙ තෙ බ්‍රාහ්මණ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති: "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති.

එවං වුත්තෙ ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවන්තං එතදවොච අභික්කන්තං භො ගොතම, -පෙ- [උපාසකං මං භවං ගොතමො ධාරෙතු] අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 1. 5. 8.

## ලොකායතිකසුත්තං.

48. සාවත්ථියං-

අථ ඛො ලොකායතිකො බ්‍රාහ්මණො යෙන භගවා [තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි.] -පෙ- එකමන්තං නිසින්නො ඛො ලොකායතිකො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

බමුණ, ඒ මේ අන්ත දෙකට නොපැමිණ තථාගත තෙමේ "අවිද්‍යා-ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වේ. .... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ. අවිද්‍යාවේ ම නිරවශේෂවිරාග-නිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාරනිරෝධයෙන් විඥාන නිරෝධය වේ.... මෙසේ මේ හුදු දුක්රැසේනිරෝධය වේ" යයි මැදුම් පිළිවෙතින් දහම් දෙසයි.

මෙසේ වදාළ කල්හි ඒ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයෙනි ඉතා මැනව. ... භවත් ගෞතම තෙමේ මා අද පටන් දිවි හිමියෙන් සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා"යි මෙය සැල කෙළේ ය.

## 1. 5. 7.

## ජාණුසොණිසුත්‍රය

47, සැවැත්නුවර-

එකල්හි ජාණුසොණි බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වි ය ... එකත්පසෙක හුන් ජාණුසොණි බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය:

භවත් ගෞතමයෙනි, කිම, සියල්ල ඇත්තේ ද? බමුණ, "සියල්ල ඇත්තේ ය" යනු මේ එක් අන්තයෙකි.

භවත් ගෞතමයෙනි, කිම, සියල්ල නැත්තේ ද? බමුණ, "සියල්ල නැත්තේ ය" යනු මේ දෙවන අන්ත ය යි.

බමුණ, ඒ මේ (ශාශ්වත - උච්ඡේද) අන්ත දෙකට නොපැමිණ තථාගත තෙමේ "අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වේ මෙසේ මේ හුදු දුක් රැසේ හටගැණීම වේ. අවිද්‍යාවේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේ ය" යි මැදුම් පිළිවෙතින් දහම් දෙසයි.

මෙසේ වදාළ කල්හි ජාණුසොණි බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයෙනි, ඉතා මැනව, ... භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා"යි මෙය සැළ කෙළේ ය.

## 1. 5. 8.

## ලෝකායතිකසුත්‍රය.

48. සැවැත්නුවර-

ඉක්බිති ලෝකායතික බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. ... එකත්පසෙක හුන් ලෝකායතික (විතණ්ඩවාදයෙහි පුහුණු වූ) බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය:

කින්නු ඛො භො ගොතම, සබ්බමත්ථීති? 'සබ්බමත්ථී'ති ඛො බ්‍රාහ්මණ ජෙට්ඨමෙතං ලොකායතං.

කිං පන භො ගොතම, සබ්බං නත්ථීති? 'සබ්බං නත්ථී'ති ඛො බ්‍රාහ්මණ දුතියමෙතං ලොකායතං.

කින්නු ඛො භො ගොතම, සබ්බමෙකත්තන්ති? 'සබ්බමෙකත්තන්ති' ඛො බ්‍රාහ්මණ තතියමෙතං ලොකායතං.

කිං පන භො ගොතම, සබ්බං පුථුත්තන්ති? 'සබ්බං පුථුත්තන්ති' ඛො බ්‍රාහ්මණ චතුත්ථමෙතං ලොකායතං.

එතෙ තෙ බ්‍රාහ්මණ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති: "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති.

එවං වුත්තෙ ලොකායතිකො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- [උපාසකං මං භවං ගොතමො ධාරෙතු] අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 1. 5. 9

## පඨම අරියසාවකසුත්තං

49. සාවත්ථියං-

න භික්ඛවෙ සුතවතො අරියසාවකස්ස එවං හොති: "කින්නු ඛො කිස්මිං සති කිං හොති, කිස්සුප්පාදා කිං උප්පජ්ජති, [කිස්මිං සති සඞ්ඛාරා හොන්ති, කිස්මිං සති විඤ්ඤාණං හොති, කිස්මිං සති නාමරූපං හොති, කිස්මිං සති සළායතනං හොති,]* කිස්මිං සති ඵස්සො හොති, කිස්මිං සති වෙදනා හොති, කිස්මිං සති තණ්හා හොති, කිස්මිං සති උපාදානං හොති, කිස්මිං සති භවො හොති, කිස්මිං සති ජාති හොති, කිස්මිං සති ජරාමරණං හොතී"ති,

අථ ඛො භික්ඛවෙ සුතවතො අරියසාවකස්ස අපරප්පච්චයා ඤාණමෙවෙත්ථ හොති: "ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. [අවිජ්ජාය සති සඞ්ඛාරා හොන්ති. සඞ්ඛාරෙසු සති විඤ්ඤාණං හොති.]* විඤ්ඤාණෙ සති නාමරූපං හොති. -පෙ- ජාතියා සති ජරාමරණං හොතී"ති. සො එවං පජානාති "එවං අයං ලොකො සමුදයතී"ති.

---

* [-] ඉමෙසු සඞ්කෙතෙසු අන්තරිත පාඨො සභාමිපොත්ථකෙ ච ලිඛිතසීහලපොත්ථකෙසු ච න දිස්සතෙ.

භවත් ගෞතමයෙනි, කිම, සියල්ල ඇත්තේ ද? බමුණ, 'සියල්ල ඇත්තේ ය' යන මෙය පළමුවන ලෝකායත ය යි.

භවත් ගෞතමයෙනි, සියල්ල නැත්තේ ද? බමුණ, 'සියල්ල නැත්තේ ය' යන මෙය දෙවැනි ලෝකායත ය යි.

භවත් ගෞතමයෙනි, කිම, සියල්ල ඒකස්වභාව ඇත්තේ ද? බමුණ, 'සියල්ල ඒකස්වභාව ඇත්තේ ය' යන මෙය තෙවැනි ලෝකායත ය යි.

භවත් ගෞතමයෙනි, කිම, සියල්ල නානාස්වභාව ඇත්තේ ද? බමුණ, 'සියල්ල නානාස්වභාව ඇත්තේ ය' යන මෙය සිවුවැනි ලෝකායත ය යි.

බමුණ, ඒ මේ අන්ත දෙකට නො පැමිණ, තථාගත තෙමේ "අවිද්‍යා-ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වේ ... මෙසේ මේ හුදු දුක් රැසේ හටගැණීම වේ. අවිද්‍යාවේ ම නිරවශේෂවිරාග-නිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධය වේ. ... මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේ ය"යි මැදුම් පිළිවෙතින් දහම් දෙසයි.

මෙසේ වදාළ කල්හි ලෝකායතික බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයෙනි, ඉතා මැනව. ... මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා" යි මෙය සැල කෙළේ ය.

## 1. 5. 9

## පඨම අරියසාවක සූත්‍රය

49. **සැවැත්නුවර**-

මහණෙනි, ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවකයාහට "කිම, කුමක් ඇති කල්හි කිමෙක් වේ ද, කුමක් ඉපදීමෙන් කිමෙක් උපදී ද, කුමක් ඇති කල්හි සංස්කාරයෝ වෙත් ද, කුමක් ඇති කල්හි විඥානය වේ ද, කුමක් ඇති කල්හි නාමරූප වේ ද, කුමක් ඇති කල්හි ෂඩායතනය වේ ද, කුමක් ඇති කල්හි ස්පර්ශය වේ ද, කුමක් ඇති කල්හි වේදනාව වේ ද, කුමක් ඇති කල්හි තෘෂ්ණාව වේ ද, කුමක් ඇති කල්හි උපාදාන වේ ද, කුමක් ඇති කල්හි භවය වේ ද, කුමක් ඇති කල්හි ජාතිය වේ ද, කුමක් ඇති කල්හි ජරාමරණ වේ දැ"යි මෙබඳු සිතෙක් නො වේ.

වැලිදු මහණෙනි, ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවකයාහට "මෙය ඇති කල්හි මේ වෙයි. මෙය ඉපදීමෙන් මෙය උපදී. අවිද්‍යාව ඇති කල්හි සංස්කාරයෝ වෙති. සංස්කාර ඇති කල්හි විඥානය වේ. විඥානය ඇති කල්හි නාමරූප වේ ... ජාතිය ඇති කල්හි ජරාමරණ වෙයි" යන මෙහි ලා පරප්‍රත්‍යය රහිත (අනුන්ගේ පිහිටක් නැතිව)ම දැනීම වෙයි. හෙතෙමේ "මේ ලෝකය මෙලෙසින් උපදී" ය යි මෙසේ දැනගණී.

න භික්ඛවෙ, සුතවතො අරියසාවකස්ස එවං හොති: "කිං නු බො කිස්මිං අසති කිං න හොති, කිස්ස නිරොධා කිං නිරුජ්ඣති, කිස්මිං අසති සඞ්ඛාරා න හොන්ති, කිස්මිං අසති විඤ්ඤාණං න හොති, කිස්මිං අසති නාමරූපං න හොති, කිස්මිං අසති සළායතනං න හොති, කිස්මිං අසති ඵස්සො න හොති, කිස්මිං අසති වෙදනා න හොති, කිස්මිං අසති තණ්හා න හොති, කිස්මිං අසති උපාදානං න හොති, කිස්මිං අසති භවො න හොති, කිස්මිං අසති ජාති න හොති, කිස්මිං අසති ජරාමරණං න හොතී"ති.

අථ බො භික්ඛවෙ, සුතවතො අරියසාවකස්ස අපරප්පච්චයා ඤාණමෙවෙත්ථ හොති: "ඉමස්මිං අසති ඉදං න හොති. ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති. අවිජ්ජාය අසති සඞ්ඛාරා න හොන්ති. සඞ්ඛාරෙසු අසති විඤ්ඤාණං න හොති. විඤ්ඤාණෙ අසති නාමරූපං න හොති. නාමරූපෙ අසති සළායතනං න හොති. -පෙ- ඵස්සො න හොති. -පෙ- වෙදනා න හොති. -පෙ- තණ්හා න හොති. -පෙ- උපාදානං න හොති. -පෙ- භවො න හොති. -පෙ- ජාති න හොති. ජාතියා අසති ජරාමරණං න හොතී"ති. සො එවං පජානාති "එවං අයං ලොකො නිරුජ්ඣතී"ති.

යතො බො භික්ඛවෙ, අරියසාවකො එවං ලොකස්ස සමුදයං ච අත්ථඞ්ගමං ච යථාභූතං පජානාති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො දිට්ඨිසම්පන්නො ඉතිපි -පෙ- අමතද්වාරං ආහච්ච තිට්ඨති ඉතිපීති.

### 1. 5. 10

### දුතිය අරියසාවකසුත්තං.

50. සාවත්ථියං-

න භික්ඛවෙ, සුතවතො අරියසාවකස්ස එවං හොති: "කිං නු බො කිස්මිං සති කිං හොති, කිස්සුප්පාදා කිං උප්පජ්ජති, කිස්මිං සති සඞ්ඛාරා හොන්ති, කිස්මිං සති විඤ්ඤාණං හොති, කිස්මිං සති නාමරූපං හොති, කිස්මිං සති සළායතනං හොති, කිස්මිං සති ඵස්සො හොති, කිස්මිං සති වෙදනා හොති, කිස්මිං සති තණ්හා හොති, කිස්මිං සති උපාදානං හොති, කිස්මිං 'සති භවො හොති, කිස්මිං සති ජාති හොති, කිස්මිං සති ජරාමරණං හොතී"ති.

අථ බො භික්ඛවෙ, සුතවතො අරියසාවකස්ස අපරප්පච්චයා ඤාණමෙවෙත්ථ හොති: "ඉමස්මිං සති ඉදං හොති. ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. අවිජ්ජාය සති සඞ්ඛාරා හොන්ති. සඞ්ඛාරෙසු සති විඤ්ඤාණං හොති. විඤ්ඤාණෙ සති නාමරූපං හොති. නාමරූපෙ සති සළායතනං හොති. සළායතනෙ සති ඵස්සො හොති. ඵස්සෙ සති වෙදනා හොති. වෙදනාය සති තණ්හා හොති. තණ්හාය සති උපාදානං හොති. උපාදානෙ සති භවො හොති. භවෙ සති ජාති හොති. ජාතියා සති ජරාමරණං හොතී"ති සො එවං පජානාති: "එවමයං ලොකො සමුදයතී"ති.

මහණෙනි, ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට "කිම, කුමක් නැති කල්හි කිමෙක් නො වේ ද, කුමක් නිරුද්ධවීමෙන් කිමෙක් නිරුද්ධ වේ ද, කුමක් නැති කල්හි සංස්කාරයෝ නො වෙද් ද, කුමක් නැති කල්හි විඥනය නො වේ ද, කුමක් නැති කල්හි නාමරූප නො වේ ද, කුමක් නැති කල්හි ෂඩායතන නො වේ ද, කුමක් නැති කල්හි ස්පර්ශය නො වේ ද, කුමක් නැති කල්හි වේදනාව නො වේ ද, කුමක් නැති කල්හි තෘෂ්ණාව නො වේ ද, කුමක් නැති කල්හි උපාදන නො වේ ද, කුමක් නැති කල්හි භවය නො වේ ද, කුමක් නැති කල්හි ජාතිය නො වේ ද, කුමක් නැති කල්හි ජරාමරණ නො වේ දැ"යි මෙබඳු සිතෙක් නො වෙයි.

වැලිදු මහණෙනි, ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට "මෙය නැති කල්හි මෙය නො වෙයි. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ. අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නො වෙති. සංස්කාර නැති කල්හි විඥනය නො වේ. විඥනය නැති කල්හි නාමරූප නො වේ. නාමරූප නැති කල්හි ෂඩායතන නො වේ... ස්පර්ශය නො වේ. ... වේදනාව නො වේ. ... තෘෂ්ණාව නො වේ. ...උපාදන නො වේ. ... භවය නො වේ .... ජාතිය නො වේ. ජාතිය නැති කල්හි ජරාමරණ නො වේ" යි යන මෙහි ලා පරප්‍රත්‍යය රහිතව ම දැනීම වෙයි. හෙතෙමේ "මේ ලෝකය මෙසේ නිරුද්ධ වේ ය"යි මෙසේ දැන ගණී.

මහණෙනි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ ලෝකයේ හටගැණීමත් නැතිවීමත් තතුසේ දැනගණී ද, මහණෙනි, මේ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ දිට්ඨිසම්පන්න යයි ද, ... අමාදෙරට හැපී සිටී යයි ද කියනු ලැබේ.

## 1. 5. 10

## දෙවැනි අරියසාවක සූත්‍රය.

50. **සැවැත්නුවර-**

මහණෙනි, ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට "කිම, කුමක් ඇති කල්හි කිමෙක් වේ ද, කුමක් ඉපදීමෙන් කිමෙක් උපදී ද, කුමක් ඇති කල්හි සංස්කාරයෝ වෙත් ද, කුමක් ඇති කල්හි විඥනය වේ ද, කුමක් ඇති කල්හි නාමරූප වේ ද, කුමක් ඇති කල්හි ෂඩායතන වේ ද, කුමක් ඇති කල්හි ස්පර්ශය වේ ද, කුමක් ඇති කල්හි වේදනාව වේ ද, කුමක් ඇති කල්හි තෘෂ්ණාව වේ ද, කුමක් ඇති කල්හි උපාදන වේ ද, කුමක් ඇති කල්හි භවය වේ ද, කුමක් ඇති කල්හි ජාතිය වේ ද, කුමක් ඇති කල්හි ජරාමරණ වේ දැ"යි මෙබඳු සිතෙක් නො වේ.

වැලිදු මහණෙනි, ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට "මෙය ඇති කල්හි මෙය වේ. මෙය ඉපදීමෙන් මෙය උපදී. අවිද්‍යාව ඇති කල්හි සංස්කාරයෝ වෙති. සංස්කාර ඇති කල්හි විඥනය වේ. විඥනය ඇති කල්හි නාමරූප වේ. නාමරූප ඇති කල්හි ෂඩායතන වේ. ෂඩායතන ඇති කල්හි ස්පර්ශය වේ. ස්පර්ශය ඇති කල්හි වේදනාව වේ. වේදනාව ඇති කල්හි තෘෂ්ණාව වේ. තෘෂ්ණාව ඇති කල්හි උපාදන වේ. උපාදන ඇති කල්හි භවය වේ. භවය ඇති කල්හි ජාතිය වේ. ජාතිය ඇති කල්හි ජරමරණ වෙයි" යන මෙහි ලා පරප්‍රත්‍යය රහිත ව ම දැනීම වෙයි. හෙතෙමේ "මේ ලෝකය මෙලෙසින් හටගණී ය"යි මෙසේ දැන ගණී.

න භික්ඛවෙ, සුතවතො අරියසාවකස්ස එවං හොති: "කින්නු බො කිස්මිං අසති කිං න හොති, කිස්ස නිරොධා කිං නිරුජ්ඣති, කිස්මිං අසති සඞ්ඛාරා න හොන්ති, කිස්මිං අසති විඤ්ඤාණං න හොති -පෙ- කිස්මිං අසති ජරාමරණං න හොතී"ති.

අථ බො භික්ඛවෙ, සුතවතො අරියසාවකස්ස අපරප්පච්චයා ඤාණ-මෙවෙත්ථ හොති: "ඉමස්මිං අසති ඉදං න හොති. ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති. අවිජ්ජාය අසති සඞ්ඛාරා න හොන්ති. සඞ්ඛාරෙසු අසති විඤ්ඤාණං න හොති. විඤ්ඤාණෙ අසති නාමරූපං න හොති -පෙ- ජාතියා අසති ජරාමරණං න හොතී"ති. සො එවං පජානාති: "එවමයං ලොකො නිරුජ්ඣතී"ති.

යතො බො භික්ඛවෙ, අරියසාවකො එවං ලොකස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච යථාභූතං පජානාති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො දිට්ඨි-සම්පන්නො ඉතිපි, දස්සනසම්පන්නො ඉතිපි, ආගතො ඉමං සද්ධම්මං ඉතිපි, පස්සති ඉමං සද්ධම්මං ඉතිපි, සෙඛෙන ඤාණෙන සමන්නාගතො ඉතිපි, සෙඛාය විජ්ජාය සමන්නාගතො ඉතිපි, ධම්මසොතං සමාපන්නො ඉතිපි, අරියො නිබ්බෙධිකපඤ්ඤො ඉතිපි, අමතද්වාරං ආහච්ච තිට්ඨති ඉතිපීති

ගහපතිවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

ද්වෙ පඤ්ච වෙරභයා වුත්තා දුක්ඛං ලොකො ච ඤාතිකං

අඤ්ඤතරං ජාණුස්සොණි ච ලොකායතිකෙන අට්ඨමං

ද්වෙ අරියසාවකා වුත්තා වග්ගො තෙන පවුච්චතීති.

මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට "කිමෙක් ද, කුමක් නැති කල්හි කිමෙක් නො වේ ද, කුමක් නිරුද්ධවීමෙන් කිමෙක් නිරුද්ධ වේ ද, කුමක් නැති කල්හි සංස්කාරයෝ නො වෙත් ද, කුමක් නැති කල්හි විඥානය නො වේ ද, කුමක් නැති කල්හි ජරාමරණ නො වේ දැ"යි මෙබඳු සිතෙක් නො වේ.

මහණෙනි, වැලිදු ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට "මෙය නැති කල්හි මෙය නො වේ. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ. අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නො වෙත්. සංස්කාර නැති කල්හි විඥානය නො වේ. විඥානය නැති කල්හි නාමරූප නො වේ ... ජාතිය නැති කල්හි ජරාමරණ නො වේ"යි යන මෙහි ලා පරප්‍රත්‍යය රහිත ව ම දැනීම වෙයි. හෙතෙමේ "මේ ලෝකය මෙලෙසින් නිරුද්ධ වේ ය" යි මෙසේ දැන ගණී.

මහණෙනි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ ලෝකයේ හටගැණී-මත් නැතිවීමත් තතු සේ දැන ගණී ද, මහණෙනි, මේ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ දෘෂ්ටිසම්පන්නයයි ද, දර්ශනසම්පන්න යයි ද, මේ සද්ධර්මයට පැමිණියේ යයි ද, මේ සද්ධර්මය දකී යයි ද, ශෛක්‍ෂඥානයෙන් සමන්‍වාගත යයි ද, ශෛක්‍ෂවිද්‍යාවෙන් සමන්‍වාගත ය යි ද, ධර්මස්‍රොතසට පැමිණියේ ය යි ද, ආර්‍ය්‍ය වූ නිර්වේධිකප්‍රඥා ඇත්තේ ය යි ද, අමෘතද්වාරයට හැපී සිටී ය යි ද කියනු ලැබේ.

**ගෘහපති වර්ගය පස්වැනි යි.**

එහි උද්දානය:

පඤ්චවෛරභය සූත්‍ර දෙකක් කියන ලදී. දුක්ඛ, ලෝක, ඤාතික, අඤ්ඤතර, ජාණුස්සොණි සූත්‍ර ද, අටවැනි ලොකායතික සූත්‍රය ද, අරියසාවක සූත්‍ර දෙක ද කියන ලදහ. එයින් වර්ග ය කියනු ලැබේ.

# 6. දුක්ඛවග්ගො

## 1. 6. 1

### පරිවීමංසනසුත්තං

51. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර බො[1] භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කිත්තාවතා නු බො භික්ඛවෙ භික්ඛු පරිවීමංසමානො පරිවීමංසෙය්‍ය සබ්බසො සම්මා දුක්ඛක්ඛයායාති? "භගවං මූලකා නො භන්තෙ, ධම්මා. භගවං නෙත්තිකා, භගවං පටිසරණා. සාධු වත භන්තෙ භගවන්තං එව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී"ති.

තෙන හි භික්ඛවෙ,[2] සුණාථ. සාධුකං මනසි කරොථ. භාසිස්සාමීති

එවං භන්තෙති බො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ඉධ භික්ඛවෙ, භික්ඛු පරිවීමංසමානො පරිවීමංසති: "යං බො ඉදං අනෙකවිධං. නානප්පකාරකං[3] දුක්ඛං ලොකෙ උප්පජ්ජති ජරාමරණං. ඉදං නු බො දුක්ඛං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං. කිස්මිං සති ජරාමරණං හොති. කිස්මිං අසති ජරාමරණං න හොතී"ති.

සො පරිවීමංසමානො එවං පජානාති: "යං බො ඉදං අනෙකවිධං නානප්පකාරකං දුක්ඛං ලොකෙ උප්පජ්ජති ජරාමරණං, ඉදං බො දුක්ඛං ජාතිනිදානං ජාතිසමුදයං ජාතිජාතිකං ජාතිප්පභවං. ජාතියා සති ජරාමරණං හොති. ජාතියා අසති ජරාමරණං න හොතී"ති.

සො ජරාමරණඤ්ච පජානාති. ජරාමරණසමුදයඤ්ච පජානාති. ජරාමරණනිරොධඤ්ච පජානාති. යා ච ජරාමරණනිරොධසාරුප්පගාමිනී පටිපදා තං ච පජානාති. තථා පටිපන්නො ච හොති අනුධම්මචාරී.

අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය පටිපන්නො හොති[4] ජරාමරණනිරොධාය.

අථාපරං පරිවීමංසමානො පරිවීමංසති: "ජාතිපනායං කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවා, කිස්මිං සති ජාති හොති, කිස්මිං අසති ජාති න හොතී"ති.*

---

1. 'බො' ඉති නත්ථි - PTS. 2. භික්ඛවෙ නං - PTS, 3. නානප්පකාරං - සිමු.
4. 'හොති' ඉති සබ්බත්ථ නත්ථි. * ජාතිවාරො න දිස්සතෙ - PTS.

# 6. දුක්ඛවග්ගය

## 1. 6. 1

### පරිවීමංසන සූත්‍රය

51. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි ජේතවන නම් වූ **අනේපිඩු** සිටුහුගේ අරමෙහි වැඩ වෙසෙත සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, මහණ තෙමේ හැම අයුරින් මැනැවින් දුක් දුරු කිරීම පිණිස පිරික්සන්නේ කෙතෙකින් පිරික්සාද? "වහන්ස, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නෙතෘ කොට ඇත්තාහ භාග්‍යවතුන් වහන්ස, මැනැවි, මේ භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහ"යි. ඇත්තාහ භාග්‍යවතුන් වහන්ස,

"මහණෙනි, එසේ නම් අසවු. මැනැවින් මෙනෙහි කරවු. කියන්නෙමි" යි. "වහන්ස, එසේ ය" යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, මෙහි මහණ තෙමේ පිරික්සන්නේ "නන් වැදෑරුම් නන් අයුරු දුක් වූ යම් මේ ජරාමරණ ලෝකයෙහි උපදී ද, මේ දුක කිමෙක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කිමෙක් ජාති කොට ඇත්තේ ද, කුමක් පහව කොට ඇත්තේ ද, කුමක් ඇති කල්හි ජරාමරණ වේ ද, කුමක් නැති කල්හි ජරාමරණ නො වේ ද" යි පිරික්සයි.

හෙතෙමේ පිරික්සන්නේ "නන්වැදෑරුම් නන් අයුරු දුක් වූ යම් මේ ජරාමරණ ලෙව්හි උපදී ද, මේ දුක ජාතිය නිදාන කොට ඇත්තේ ය. ජාතිය ජාති කොට ඇත්තේ ය. ජාතිය පහව කොට ඇත්තේ ය. ජාතිය ඇති කල්හි ජරාමරණ වෙයි. ජාතිය නැති කල්හි ජරාමරණ නො වේ" යයි මෙසේ දැන ගණී.

හෙතෙමේ ජරාමරණත් දැන ගණී. ජරමරණ සමුදයයත් දැන ගණී. ජරාමරණ නිරෝධයත් දැන ගණී. ජරාමරණනිරෝධයට සරුප් ව යනසුළු යම් ප්‍රතිපදාවක් වේ නම් එය ද දැන ගණී. එසේ පිළිපන්නේ නිවණට අනුකූල වූ පිළිවෙතෙහි හැසිරෙන්නේ ද වෙයි.

මහණෙනි, මේ මහණ තෙමේ හැම අයුරින් මැනැවින් දුක් ක්‍ෂය කිරීම පිණිස ජරාමරණ නිරෝධය පිණිස පිළිපන්නේ වේ ය යි කියනු ලැබේ.

යළි මතු ද පිරික්සන්නේ "මේ ජාතිය කුමක් නිදාන කොට ඇත්තේ ද, කිමෙක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් පහව කොට ඇත්තේ ද, කුමක් ඇති කල්හි ජාතිය වේ ද, කුමක් නැති කල්හි ජාතිය නො වේ ද යි" පිරික්සයි.

සො පරිවීමංසමානො එවං පජානාති: "ජාති භවනිදානා, භවසමුදයා, භවජාතිකා, භවප්පභවා. භවෙ සති ජාති හොති. භවෙ අසති ජාති න හොතී"ති.

සො ජාතිං ච පජානාති. ජාතිසමුදයං ච පජානාති. ජාතිනිරොධං ච පජානාති. යා ච ජාතිනිරොධසාරුප්පගාමිනී පටිපදා, තං ච පජානාති. තථා පටිපන්නො ච හොති අනුධම්මචාරී.

අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු සබ්බසො දුක්ඛක්ඛයාය පටිපන්නො හොති[1] ජාතිනිරොධාය.

අථාපරං පරිවීමංසමානො පරිවීමංසති: "භවො පනායං කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිම්පභවො, කිස්මිං සති භවො හොති, කිස්මිං අසති භවො න හොතී"ති.

සො පරිවීමංසමානො එවං පජානාති: භවො උපාදානනිදානො. උපාදාන-සමුදයො, උපාදානජාතිකො, උපාදානපභවො. උපාදානෙ සති භවො හොති. උපාදානෙ අසති භවො න හොතීති.

සො භවං ච පජානාති. භවසමුදයං ච පජානාති. භවනිරොධං ච පජානාති. යා ච භවනිරොධසාරුප්පගාමිනී පටිපදා, තං ච පජානාති. තථා පටිපන්නො ච හොති අනුධම්මචාරී.

අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු සබ්බසො දුක්ඛක්ඛයාය පටිපන්නො හොති භවනිරොධාය.

අථාපරං පරිවීමංසමානො පරිවීමංසති: උපාදානං පනිදං කිංනිදානං -පෙ- තණ්හා පනායං කිංනිදානා -පෙ- වෙදනා පනායං කිංනිදානා -පෙ- ඵස්සො පනායං කිංනිදානො -පෙ- සළායතනං පනිදං කිංනිදානං -පෙ- නාමරූපං පනිදං කිංනිදානං -පෙ- විඤ්ඤාණං පනිදං කිංනිදානං -පෙ- සඞ්ඛාරා පනිමෙ කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිම්පභවා, කිස්මිං සති සඞ්ඛාරා හොන්ති, කිස්මිං අසති සඞ්ඛාරා න හොන්තී"ති. සො පරිවීමංසමානො එවං පජානාති: "සඞ්ඛාරා අවිජ්ජානිදානා, අවිජ්ජාසමුදයා, අජ්ජාජාතිකා, අවිජ්ජාපභවා. අවිජ්ජාය සති සඞ්ඛාරා හොන්ති. අවිජ්ජාය අසති සඞ්ඛාරා න හොන්තීති. සො සඞ්ඛාරෙ ච පජානාති. සඞ්ඛාරසමුදයං ච පජානාති. සඞ්ඛාර නිරොධං ච පජානාති. යා ච සඞ්ඛාරනිරොධසාරුප්ප ගාමිනී පටිපදා, තං ච පජානාති. තථා පටිපන්නො ච හොති අනුධම්මචාරී.

අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය පටිපන්නො හොති සඞ්ඛාරනිරොධාය.

1. 'හොති' ඉති නත්ථි-මජසං, සහා, PTS. සී

හෙතෙමේ පිරික්සන්නේ "ජාතිය භවය නිදාන කොට ඇත්තේ ය. භවය සමුදය කොට ඇත්තේ ය. භවය ජාති කොට ඇත්තේ ය. භවය පහව කොට ඇත්තේ ය. භවය ඇති කල්හි ජාතිය වේ. භවය නැති කල්හි ජාතිය නො වේ" ය යි මෙසේ දැන ගණී.

හෙතෙමේ ජාතියත් දැන ගණී. ජාතිසමුදයත් දැන ගණී. ජාති-නිරොධයත් දැන ගණී. ජාතිනිරොධයට සරුප් ව යතහුලු යම් ප්‍රතිපදාවක් වේ නම් එයත් දැන ගණී. එසේ පිළිපන්නේ නිවනට අනුකූල පිළිවෙතෙහි හැසිරෙන්නේ ද වේ.

මහණෙනි, මේ මහණ තෙමේ හැම අයුරින් මැනැවින් දුක් ගෙවීම පිණිස ජාතිනිරොධය පිණිස පිළිපන්නේ වේ යයි කියනු ලැබේ.

යළි මතු ද පිරික්සන්නේ "මේ භවය වනාහි කිමෙක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කිමෙක් ජාති කොට ඇත්තේ ද, කුමක් පහව කොට ඇත්තේ ද, කුමක් ඇති කල්හි භවය වේ ද, කුමක් නැති කල්හි භවය නො වේ ද" යි පිරික්සයි.

හෙතෙමේ පිරික්සන්නේ "භවය උපාදාන නිදාන කොට ඇත්තේ ය. උපාදාන සමුදය කොට ඇත්තේ ය. උපාදාන ජාති කොට ඇත්තේ ය. උපාදාන පහව කොට ඇත්තේ ය. උපාදාන ඇති කල්හි භවය වේ. උපාදාන නැති කල්හි භවය නො වේ" ය යි මෙසේ දැන ගණී.

හෙතෙමේ භවයත් දැන ගණී. භවසමුදයත් දැන ගණී. භවනිරොධයත් දැන ගණී. භවනිරොධයට සරුප් ව යතහුලු යම් ප්‍රතිපදාවක් වේ නම් එයත් දැන ගණී. එසේ පිළිපන්නේ නිවණට අනුකූල පිළිවෙතෙහි පිළිපන්නේ ද වේ.

මහණෙනි, මේ මහණ තෙමේ හැම අයුරින් මැනැවින් දුක් ක්‍ෂය කිරීම පිණිස භවනිරොධය පිණිස පිළිපන්නේ වේ යයි කියනු ලැබේ.

යළි මතු ද පිරික්සන්නේ "මේ උපාදාන කුමක් නිදාන කොට ඇත්තේ ද ... මේ තෘෂ්ණාව කුමක් නිදාන කොට ඇත්තේ ද ... මේ වේදනාව කුමක් නිදාන කොට ඇත්තේ ද ... මේ ස්පර්ශය කුමක්! නිදාන කොට ඇත්තේ ද ... මේ ෂඩායතන කුමක් නිදාන කොට ඇත්තේ ද ... මේ නාමරූප කුමක් නිදාන කොට ඇත්තේ ද ... මේ විඥානය කුමක් නිදාන කොට ඇත්තේ ද ... මේ සංස්කාරයෝ කිමෙක් නිදාන කොට ඇත්තාහු ද, කුමක් සමුදය කොට ඇත්තාහු ද, කිමෙක් ජාති කොට ඇත්තාහු ද, කුමක් පහව කොට ඇත්තාහු ද, කුමක් ඇති කල්හි සංස්කාරයෝ වෙත් ද, කුමක් නැති කල්හි සංස්කාරයෝ නො වෙද්ද" යි පිරික්සයි. හෙතෙමේ පිරික්සන්නේ සංස්කාරයෝ අවිද්‍යාව නිදාන කොට ඇතියහ. අවිද්‍යාව සමුදය කොට ඇතියහ. අවිද්‍යාව ජාති කොට ඇතියහ. අවිද්‍යාව පහව කොට ඇතියහ. අවිද්‍යාව ඇති කල්හි සංස්කාරයෝ වෙත්. අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නො වෙති" යි මෙසේ දැන ගණී. හෙතෙමේ සංස්කාරයනුත් දැන ගණී. සංස්කාරසමුදයත් දැන ගණී. සංස්කාරනිරොධයත් දැන ගණී. සංස්කාරනිරොධයට සරුප් ව යතහුලු යම් ප්‍රතිපදාවක් වේ නම් එයත් දැන ගණී. එසේ පිළිපන්නේ නිවනට අනුකූල පිළිවෙතෙහි හැසිරෙන්නේ ද වේ.

මහණෙනි, මේ මහණ තෙමේ හැම ලෙසින් මැනැවින් දුක් ගෙවීම පිණිස සඞ්ඛාරනිරොධය පිණිස පිළිපන්නේ වේ යයි කියනු ලැබේ.

අවිජ්ජාගතොයං භික්ඛවෙ, පුරිසපුග්ගලො පුඤ්ඤං චෙ සඞ්ඛාරං අභිසඞ්ඛරොති, පුඤ්ඤූපගං හොති විඤ්ඤාණං. අපුඤ්ඤං චෙ සඞ්ඛාරං අභිසඞ්ඛරොති, අපුඤ්ඤූපගං හොති විඤ්ඤාණං. ආනෙඤ්ජං චෙ සඞ්ඛාරං අභිසඞ්ඛරොති, ආනෙඤ්ජූපගං හොති විඤ්ඤාණං.

යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො අවිජ්ජා පහීණා හොති විජ්ජා උප්පන්නා, සො අවිජ්ජාවිරාගා විජ්ජුප්පාදා නෙව පුඤ්ඤාභිසඞ්ඛාරං අභිසඞ්ඛරොති. න අපුඤ්ඤාභිසඞ්ඛාරං අභිසඞ්ඛරොති. න ආනෙඤ්ජාභිසඞ්ඛාරං අභිසඞ්ඛරොති අනභිසඞ්ඛරොන්තො අනභිසඤ්චෙතයන්තො න කිඤ්චි ලොකෙ උපාදියති. අනුපාදියං න පරිතස්සති. අපරිතස්සං පච්චත්තං යෙව[1] පරිනිබ්බායති. 'ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං නාපරං ඉත්ථත්තායා'ති පජානාති.

සො සුඛං චෙ වෙදනං වෙදියති, සා අනිච්චාති පජානාති. අනජ්ඣොසිතාති[2] පජානාති. අනභිනන්දිතාති[3] පජානාති. දුක්ඛං චෙ වෙදනං වෙදියති, සා අනිච්චාති පජානාති. අනජ්ඣොසිතාති[2] පජානාති. අනභිනන්දිතාති[3] පජානාති. අදුක්ඛමසුඛං චෙ වෙදනං වෙදියති, සා අනිච්චාති පජානාති. අනජ්ඣොසිතාති[2] පජානාති. අනභිනන්දිතාති පජානාති

සො සුඛං චෙ වෙදනං වෙදියති, විසඤ්ඤුත්තො නං[4] වෙදනං වෙදියති. දුක්ඛං චෙ වෙදනං වෙදියති, විසඤ්ඤුත්තො නං වෙදනං වෙදියති. අදුක්ඛමසුඛං චෙ වෙදනං වෙදියති, විසඤ්ඤුත්තො නං වෙදනං වෙදියති.

සො කායපරියන්තිකං වෙදනං වෙදයමානො[5] කායපරියන්තිකං වෙදනං වෙදයාමීති[6] පජානාති. ජීවිතපරියන්තිකං වෙදනං වෙදයමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදයාමීති පජානාති. කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතී භවිස්සන්ති. සරීරානි අවසිස්සන්තීති පජානාති.

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො කුම්භකාරපාකා උණ්හං කුම්භං උද්ධරිත්වා සමෙ භූමිභාගෙ පතිට්ඨපෙය්‍ය,[7] තත්‍ර යායං උස්මා සා තත්‍රෙව වූපසමෙය්‍ය. කපල්ලානි අවසිස්සෙය්‍යුං. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු කායපරියන්තිකං වෙදනං වෙදියමානො [කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති.] ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතී භවිස්සන්ති, සරීරානි අවසිස්සන්තීති පජානාති.

---

1. පච්චත්තඤ්ඤෙව - මජසං. 2. න අජ්ඣොසිතා - සීමු. 3. න අභිනන්දිතා - සීමු.
4. විසංයුත්තො නං - සීමු 5 වෙදියමානො - සීමු, PTS, 6 වෙදියාමි - සීමු,
7. පතිසිංසෙය්‍ය - මජසං, පතිට්ඨපෙය්‍ය-සතා, PTS

මහණෙනි, අවිද්‍යාවෙන් යුක්ත මේ පුද්ගල තෙමේ ඉදින් කුශලසංස්කාර රැස් කෙරේ නම් (කම්) විඤ්ඤාණය කුශලසහගත වේ. ඉදින් අකුශලසංස්කාර රැස් කෙරේ නම් (කම්) විඤ්ඤාණය අකුශලසහගත වේ. ඉදින් අරූපාවචර-කුශලසංස්කාර රැස් කරන්නේ නම් විඤ්ඤාණය අරූපාවචරකුශලසහගත වේ.

මහණෙනි, යම්කලෙක පටන් මහණහුගේ අවිද්‍යාව ප්‍රහීණවූවා වේ ද, (එකල අභිනිෂ්ක්‍රමණය) විද්‍යාව උපන්නී වෙයි. හෙතෙමේ අවිද්‍යාව නොරවීමෙන් මාර්ගඥානසංඛ්‍යාත විද්‍යාව ඉපදීමෙන් කුශලසංස්කාර නො ම රැස් කෙරෙයි. අකුශලසංස්කාර නො ම රැස් කෙරෙයි අරූපාවචරකුශලසංස්කාර නො ම රැස් කෙරෙ යි. කම් රැස් නො කරන්නේ සිත නො මෙහෙයවන්නේ ලෝක-යෙහි කිසිවක් (තෘෂ්ණාදි යෙන්) උපාදානය නො කරයි. උපාදානය නො කරන්නේ (තණ්හාපරිතස්සනා භයපරිතස්සනා වසයෙන්) නො තැති ගණී. නො තැති ගන්නේ තෙමේ ම පිරිනිවේ. 'ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදී. කට යුතු කරණ ලදී. මේ රහත් බැව් පිණිස අනෙකක් නැතැ' යි දැන ගණී.

හෙතෙමේ ඉදින් සුඛවේදනාවක් විඳී නම් එය අනිත්‍ය ය යි දැන ගණී. (තෘෂ්ණාවෙන්) නො බැසගන්නා ලද්දු යි දැන ගණී. (අභිනන්දන විසින්) නො පිළිගන්නා ලද්දු යි දැන ගණී. ඉදින් දුක් වේදනාවක් විඳී නම් එය අනිත්‍ය ය යි දැන ගණී. (තෘෂ්ණාවෙන්) නො බැස ගන්නා ලද්දු යි දැන ගණී. නො පිළි-ගන්නා ලද්දු යි දැන ගණී. ඉදින් නො දුක් නො සුව වේදනාවක් විඳී නම් එය අනිත්‍ය ය යි දැන ගණී. නො බැස ගන්නා ලද්දු යි දැන ගණී. නො පිළිගන්නා ලද්දු යි දැන ගණී.

හෙතෙමේ ඉදින් සුඛ වේදනාවක් විඳී නම් නො බැඳුනේ ඒ වේදනාව විඳී. ඉදින් දුක්වේදනාවක් විඳී නම් නො බැඳුනේ ඒ වේදනාව විඳී. ඉදින් මැදහත් වේදනාවක් විඳී නම් නො බැඳුනේ ඒ වේදනාව විඳී.

හෙතෙමේ කය හිම් කොට ඇති (පඤ්චද්වාරික) වේදනාව විඳින්නේ කය හිම් කොට ඇති වේදනාව විඳිමි යි දැන ගණී. දිවි හිම් කොට ඇති (මනොද්වාරික) වේදනාව විඳින්නේ දිවිහිම් කොට ඇති වේදනාව විඳිමි යි දැන ගණී. කය බිඳීමෙන් දිවි කෙළවර වන්නට පෙරාතුව මෙලෙව්හි දී ම සියලු වේදනාවෝ නො පිළිගන්නා ලද්දාහු සිහිල් වන්නාහු (නොපවත්නා සවභාව ඇත්තාහු) ය. ධාතුශරීරයෝ ශේෂ වන්නාහ යි දැන ගණී.

මහණෙනි, යම්සේ පුරුෂයෙක් උණුසුම් කළයක් කුඹල් උදුනෙන් නගා සමබිමෙක තබා ද, එහි යම් ඒ උණුසුමෙක් වේ ද, එය එහි ම සංසිඳෙන්නේ ය. කබල් ශේෂ වන්නේ ය. මහණෙනි, එපරිද්දෙන් ම මහණ තෙමේ කය හිම් කොට ඇති වේදනාව විඳින්නේ කය හිම් කොට ඇති වේදනාව විඳිමි යි, දිවි හිම් කොට ඇති වේදනාව විඳින්නේ දිවි හිම් කොට ඇති වේදනාව විඳිමි යි දැන ගණී. කය බිඳීමෙන් දිවි කෙළවර වීමට පෙරාතුව මෙලෙව්හි දී ම සියලු ම වේදනාවෝ නො පිළිගන්නා ලද්දාහු සිහිල් වන්නාහ. ධාතුශරීරයෝ ශේෂ වන්නාහ යි දැන ගණී.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු ඛො ඛීණාසවො භික්ඛු පුඤ්ඤාභිසඞ්ඛාරං වා අභිසඞ්ඛරෙය්‍ය, අපුඤ්ඤාභිසඞ්ඛාරං වා අභිසඞ්ඛරෙය්‍ය, ආනෙඤ්ජාභිසඞ්ඛාරං වා අභිසඞ්ඛරෙය්‍යාති?

'නො හෙතං භන්තෙ.'

සබ්බසො වා පන සඞ්ඛාරෙසු අසති සඞ්ඛාරනිරොධා අපි නු ඛො විඤ්ඤාණං පඤ්ඤායෙථාති?

'නො හෙතං භන්තෙ.'

සබ්බසො වා පන විඤ්ඤාණෙ අසති විඤ්ඤාණනිරොධා අපි නු ඛො නාමරූපං පඤ්ඤායෙථාති?

'නො හෙතං භන්තෙ.'

සබ්බසො වා පන නාමරූපෙ අසති නාමරූපනිරොධා අපි නු ඛො සළායතනං පඤ්ඤායෙථාති?

'නො හෙතං භන්තෙ.'

'සබ්බසො වා පන සළායතනෙ අසති සළායතනනිරොධා අපි නු ඛො ඵස්සො පඤ්ඤායෙථාති?,

'නො හෙතං භන්තෙ.'

සබ්බසො වා පන ඵස්සෙ අසති ඵස්සනිරොධා අපි නු ඛො වෙදනා පඤ්ඤායෙථාති?

'නො හෙතං භන්තෙ'

සබ්බසො වා පන වෙදනාය අසති වෙදනානිරොධා අපි නු ඛො තණ්හා පඤ්ඤායෙථාති?

'නො හෙතං භන්තෙ'.

සබ්බසො වා පන තණ්හාය අසති තණ්හානිරොධා අපි නු ඛො උපාදානං පඤ්ඤායෙථාති?

'නො හෙතං භන්තෙ.'

සබ්බසො වා පන උපාදානෙ අසති උපාදානනිරොධා අපි නු ඛො භවො පඤ්ඤායෙථාති?

''නො හෙතං භන්තෙ'.

සබ්බසො වා පන භවෙ අසති භවනිරොධා අපි නු ඛො ජාති පඤ්ඤායෙථාති?

''නො හෙතං භන්තෙ.'

සබ්බසො වා පන ජාතියා අසති ජාතිනිරොධා අපි නු ඛො ජරාමරණං පඤ්ඤායෙථාති?

'නො හෙතං භන්තෙ'.

සාධු සාධු ඛො[1] භික්ඛවෙ, එවමෙවෙතං[2] භික්ඛවෙ, නෙතං අඤ්ඤථා සද්දහථ එවමෙවෙතං[3] භික්ඛවෙ, අධිමුච්චථ. නික්කඞ්ඛා එත්ථ හොථ නිබ්බිචිකිච්ඡා. එසෙවන්තො දුක්ඛස්සාති

1. ''ඛො' ඉති නත්ථි - මජසං, සයා, PTS. 2. එවංමෙතං - මජසං.
3. සද්දහථ එමතං - මජසං, PTS. සද්දහථ එවංමෙතං - සයා.

මහණෙනි, ඒ කුමැ යි හඟිහු ද? රහත් මහණ තෙමේ කුශලසංස්කාර හෝ රැස් කරන්නේ ද? අකුශලසංස්කාර හෝ රැස් කරන්නේ ද? අරූපාවචර සංස්කාර හෝ රැස් කරන්නේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

හැම අයුරින් සංස්කාර නැති කල්හි සඞ්ඛාරනිරෝධයෙන් විඤ්ඤාණයෙක් පැණේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණය නැති කල්හි විඤ්ඤාණනිරෝධයෙන් නාමරූප පැණේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

සර්වප්‍රකාරයෙන් නාමරූප නැති කල්හි නාමරූපනිරෝධයෙන් ෂඩායතන පැණේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

නිරවශේෂයෙන් ෂඩායතන නැති කල්හි ෂඩායතනනිරෝධයෙන් ස්පර්ශය පැණේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

නිරවශේෂයෙන් ම ස්පර්ශය නැති කල්හි ස්පර්ශනිරෝධයෙන් වේදනාව පැණේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

නිරවශේෂයෙන් ම වේදනාව නැති කල්හි වේදනානිරෝධයෙන් තණ්හාව පැණේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

නිරවශේෂයෙන් ම තෘෂ්ණාව නැති කල්හි තෘෂ්ණානිරෝධයෙන් උපාදාන පැණේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

නිරවශේෂයෙන් ම උපාදාන නැති කල්හි උපාදානනිරෝධයෙන් භවය පැණේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

නිරවශේෂයෙන් ම භවය නැති කල්හි භවනිරෝධයෙන් ජාතිය පැණේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය'.

නිරවශේෂයෙන් ම ජාතිය නැති කල්හි ජාතිනිරෝධයෙන් ජරාමරණ පැණේ ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

මහණෙනි, මැනැවි, මැනැවි. මහණෙනි, මෙය මෙසේ ම ය. මෙය අන් අයුරකින් නො වේ. මහණෙනි, මෙය මෙසේ ම යයි අදහවු නිශ්චයට පැමිණෙවු. මෙහි සැක නැත්තෝ පහ වූ විචිකිච්ඡා ඇත්තෝ වවු මෙය ම දුක් කෙළවර (නිවන) වේ.

## 1. 6. 2.

## උපාදානසුත්තං

52. සාවත්ථියං-

උපාදානීයෙසු භික්ඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති තණ්හාපච්චයා උපාදානං. උපාදානපච්චයා භවො. භවපච්චයා ජාති. ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, දසන්නං වා කට්ඨවාහානං වීසාය වා කට්ඨවාහානං තිංසාය වා කට්ඨවාහානං චත්තාරීසාය වා කට්ඨවාහානං මහාඅග්ගික්ඛන්ධො ජලෙය්‍ය[1], තත්‍ර පුරිසො කාලෙන කාලං සුක්ඛානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය, සුක්ඛානි ච ගොමයානි පක්ඛිපෙය්‍ය, සුක්ඛානි ච කට්ඨානි පක්ඛිපෙය්‍ය, එවං[2] හි සො භික්ඛවෙ මහාඅග්ගික්ඛන්ධො තදාහාරො තදුපාදානො චිරං දීඝමද්ධානං ජලෙය්‍ය

එවමෙව ඛො භික්ඛවෙ, උපාදානීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

උපාදානීයෙසු භික්ඛවෙ, ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා -පෙ- ජරාමරණං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, දසන්නං වා කට්ඨවාහානං වීසාය වා කට්ඨවාහානං තිංසාය වා කට්ඨවාහානං චත්තාරීසාය වා කට්ඨවාහානං මහාඅග්ගික්ඛන්ධො ජලෙය්‍ය, තත්‍ර පුරිසො න කාලෙන කාලං සුක්ඛානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය. න සුක්ඛානි ච ගොමයානි පක්ඛිපෙය්‍ය, න සුක්ඛානි ච කට්ඨානි පක්ඛිපෙය්‍ය, එවං හි සො භික්ඛවෙ මහාඅග්ගික්ඛන්ධො පුරිමස්ස ච උපාදානස්ස පරියාදානා අඤ්ඤස්ස ච අනුපහාරා අනාහාරො නිබ්බායෙය්‍ය.

එවමෙව ඛො භික්ඛවෙ, උපාදානීයෙසු ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති තණ්හානිරොධා උපාදානනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## 1. 6. 3

## සඤ්ඤොජනසුත්තං

53. සාවත්ථියං-

සඤ්ඤොජනීයෙසු භික්ඛවෙ, ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

---

1. ජාලෙය්‍ය - PTS.　　2. එවඤ්හි - සයා, PTS.

## 1. 6. 2.

## උපාදාන සූත්‍රය

52. සැවැත්නුවර-

මහණෙනි, උපාදානයන්ට ප්‍රත්‍යය වූ ධර්මයන් විෂයෙහි ආස්වාදය අනුව බලමින් වෙසෙන්නහුගේ තෘෂ්ණාව වෙසෙසින් වැඩේ. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදාන වේ. උපාදානප්‍රත්‍යයෙන් භවය වේ. භවප්‍රත්‍යයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දෞර්මනස්‍ය උපායාසයෝ හටගණිත්. මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, යම්සේ දරගැල් දසයක හෝ දරගැල් විස්සෙක හෝ දරගැල් තිසෙක හෝ දරගැල් සාළිසෙක හෝ මහගිනිකදෙක් යම්සේ දිලෙන්නේ ද, පුරුෂයෙක් කලින් කල එහි වියලිතණත් බහා ලන්නේ ද, වියලි ගොමත් බහා ලන්නේ ද, වියලි දරත් බහා ලන්නේ ද, මහණෙනි, මෙසේ ඒ මහගිනිකඳ ඒ ආහාර ඇත්තේ උපාදාන ඇත්තේ ඉතා දිගු කලක් දිලෙන්නේ ය.

මහණෙනි, එසෙයින් ම උපාදානීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දකිමින් වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදාන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, උපාදානීය ධර්මයන්හි දොෂ නැවත නැවත දකිමින් වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වෙයි. තෘෂ්ණානිරොධයෙන් උපාදාන නිරොධය වේ. උපාදානනිරොධයෙන් .. ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දෞර්මනස්‍ය උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක්රැසේ නිරොධය වේ.

මහණෙනි, දරගැල් දසයක හෝ දරගැල් විස්සෙක හෝ දරගැල් තිසෙක හෝ දරගැල් සාළිසෙක හෝ මහගිනිකදෙක් යම්සේ දිලෙන්නේ ද, පුරුෂයෙක් කලින් කල වියලි තණත් එහි නො ලන්නේ ද, වියලි ගොමත් එහි නො ලන්නේ ද, වියලි දරත් එහි නො ලන්නේ ද, මහණෙනි, මෙසේ ඒ මහගිනිකඳ පළමු දර දැවීමෙනුත් අනෙක් දර නො ගැණීමෙනුත් ප්‍රත්‍යය රහිත වූයේ නිවෙන්නේ ය.

මහණෙනි, එසෙයින් ම උපාදානීය ධර්මයන්හි දොෂය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණානිරොධයෙන් උපාදානනිරොධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරොධය වේ.

## 1 6. 3.

## සංයොජනසූත්‍රය

53. සැවැත්නුවර-

මහණෙනි, සංයොජනයන්ට ප්‍රත්‍යය වූ ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩෙයි. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදාන වේ . මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ

සෙය්‍යථාපි භික්ඛවෙ, තෙලං ච පටිච්ච වට්ටිං ච පටිච්ච තෙලප්පදීපො ඣායෙය්‍ය, තත්‍ර පුරිසො කාලෙන කාලං තෙලං ආසිඤ්චෙය්‍ය,[1] වට්ටිං උපසංහරෙය්‍ය,[2] එවං හි සො භික්ඛවෙ තෙලප්පදීපො තදාහාරො තදුපාදානො චිරං දීඝමද්ධානං ජලෙය්‍ය.

එවමෙව ඛො භික්ඛවෙ, සඤ්ඤොජනීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සඤ්ඤොජනීයෙසු භික්ඛවෙ, ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො. -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, තෙලං ච පටිච්ච වට්ටිං ච පටිච්ච තෙලප්පදීපො ඣායෙය්‍ය, තත්‍ර පුරිසො න කාලෙන කාලං තෙලං ආසිඤ්චෙය්‍ය, න වට්ටිං ච.[3] උපසංහරෙය්‍ය, එවං හි සො භික්ඛවෙ තෙලප්පදීපො පුරිමස්ස ච උපාදානස්ස පරියාදානා අඤ්ඤස්ස ච අනුපහාරා අනාහාරො නිබ්බායෙය්‍ය.

එවමෙව ඛො භික්ඛවෙ, සඤ්ඤොජනීයෙසු ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## 1. 6. 4

## දුතිය සඤ්ඤොජනසුත්තං

54. සාවත්ථියං-

සෙය්‍යථාපි භික්ඛවෙ, තෙලං ච පටිච්ච වට්ටිං ච පටිච්ච තෙලප්පදීපො ඣායෙය්‍ය, තත්‍ර පුරිසො කාලෙන කාලං තෙලං ආසිඤ්චෙය්‍ය, වට්ටිං ච උපසංහරෙය්‍ය, එවං හි සො භික්ඛවෙ තෙලප්පදීපො තදාහාරො තදුපාදානො චිරං දීඝමද්ධානං ජලෙය්‍ය.

එවමෙව ඛො භික්ඛවෙ, සඤ්ඤොජනීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, තෙලං ච පටිච්ච වට්ටිං ච පටිච්ච තෙලප්පදීපො ඣායෙය්‍ය, තත්‍ර පුරිසො න කාලෙන කාලං තෙලං ආසිඤ්චෙය්‍ය, න වට්ටිං ච උපසංහරෙය්‍ය, එවං හි සො භික්ඛවෙ තෙලප්පදීපො පුරිමස්ස ච උපාදානස්ස පරියාදානා අඤ්ඤස්ස ච අනුපහාරා[4] අනාහාරො නිබ්බායෙය්‍ය.

එවමෙව ඛො භික්ඛවෙ සඤ්ඤොජනීයෙසු ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

---

1. අභිසිඤ්චෙය්‍ය - සිමු. 2. උපහරෙය්‍ය - සීමු, සී 1, 3. ච, ඉති නත්ථි - සයා, මජසං.
4. අනුපාහාරා - PTS.

මහණෙනි, යම්සේ තෙලත් නිසා වැටියත් නිසා තෙල්පහනෙක් දල් වෙත්තේ ද, පුරුෂයෙක් කලින් කල එහි තෙල් බහන්නේ ද, වැටිය සකස් කරන්නේ ද, මහණෙනි, මෙසේ ඒ තෙල්පහන ඒ ආහාර ඇත්තේ ඒ උපාදන ඇත්තේ බොහෝ දිගුකලක් දිලෙන්නේ ය.

මහණෙනි, එසෙයින් ම සංයෝජනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ.

මහණෙනි, සංයෝජනීය ධර්මයන්හි දෝෂය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදන නිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ

මහණෙනි, යම්සේ තෙලත් නිසා වැටියත් නිසා තෙල්පහනෙක් දල්-වෙත්තේ ද, පුරුෂ තෙමේ කලින් කල එහි තෙල් නො බහන්නේ ද, වැටියත් නො සකස් කරන්නේ ද, මහණෙනි, මෙසේ ඒ තෙල්පහන පළමු තෙල් දැවීමෙනුත් අනෙක් තෙලක් නො ගැනීමෙනුත් ප්‍රත්‍යය රහිත වූයේ නිවෙන්නේ ය.

මහණෙනි, එසෙයින් ම සංයෝජනීය ධර්මයන්හි දෝෂය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වෙයි. තෘෂ්ණා නිරොධයෙන් උපාදන නිරොධය වෙයි ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරොධය වේ.

## 1. 6. 4

## දුතිය සංයොජනසූත්‍රය

54. සැවැත්නුවර-

මහණෙනි, තෙලත් නිසා වැටියත් නිසා තෙල්පහනෙක් යම්සේ දල්-වෙත්තේ ද, පුරුෂයෙක් කලින් කල එහි තෙල් බහන්නේ ද, වැටිය සකස් කරන්නේ ද, මහණෙනි, මෙසේ ඒ තෙල්පහන ඒ ආහාර ඇත්තේ ඒ උපාදන ඇත්තේ බොහෝ දිගුකලක් දිලෙන්නේ ය.

මහණෙනි, එසෙයින් ම සංයෝජනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩෙයි. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ.

මහණෙනි, තෙලත් නිසා වැටියත් නිසා යම්සේ තෙල්පහනෙක් දල්වෙත්තේ ද, පුරුෂයෙක් කලින් කල එහි තෙල් නො බහන්නේ නම් වැටියත් නො සකස් කරන්නේ නම්, මහණෙනි, මෙසේ ඒ තෙල්පහන පළමු තෙල් දවා ලීමෙනුත් අනෙක් තෙලක් නො ගැනීමෙනුත් ප්‍රත්‍යය රහිත වූයේ නිවෙන්නේ ය.

මහණෙනි, එසෙයින් ම සංයෝජනීය ධර්මයන්හි දෝෂය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වෙයි. තෘෂ්ණා නිරොධයෙන් උපාදන නිරොධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරොධය වෙයි.

## 1. 6. 5

### මහාරුක්ඛසුත්තං

55. සාවත්ථියං-

උපාදානීයෙසු භික්ඛවෙ, ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාරුක්ඛො, තස්ස යානි චෙව මූලානි අධොගමානි, යානි ච තිරියංගමානි, සබ්බානි තානි උද්ධං ඔජං අභිහරන්ති. එවං හි සො භික්ඛවෙ මහාරුක්ඛො තදාහාරො තදුපාදානො චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍ය.

එවමෙව ඛො භික්ඛවෙ, උපාදානීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

උපාදානීයෙසු භික්ඛවෙ, ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාරුක්ඛො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං ආදාය. සො තං රුක්ඛං මූලෙ ඡින්දෙය්‍ය. මූලෙ ඡෙත්වා[1] පලිඛණෙය්‍ය[2] පලිඛණිත්වා මූලානි උද්ධරෙය්‍ය අන්තමසො උසීරනාළමත්තානිපි.[3] සො තං රුක්ඛං ඛණ්ඩාඛණ්ඩිකං ඡින්දෙය්‍ය. ඛණ්ඩාඛණ්ඩිකං ඡින්දිත්වා ඵාලෙය්‍ය. ඵාලෙත්වා සකලිකං සකලිකං කරෙය්‍ය. සකලිකං සකලිකං කරිත්වා වාතාතපෙ විසොසෙය්‍ය, වාතාතපෙ විසොසෙත්වා අග්ගිනා ඩහෙය්‍ය. අග්ගිනා ඩහෙත්වා මසිං කරෙය්‍ය. මසිං කරිත්වා මහාවාතෙ වා ඔපුනෙය්‍ය. නදියා වා සීඝසොතාය පවාහෙය්‍ය. එවං හි සො භික්ඛවෙ මහාරුක්ඛො උච්ඡින්නමූලො අස්ස තාලාවත්ථුකතො අනභාවකතො[4] ආයතිං අනුප්පාදධම්මො.

එවමෙව ඛො භික්ඛවෙ, උපාදානීයෙසු ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## 1. 6. 6

### දුතියමහාරුක්ඛසුත්තං

56. සාවත්ථියං-

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාරුක්ඛො, තස්ස යානි චෙව මූලානි අධොගමානි, යානි ච තිරියංගමානි, සබ්බානි තානි උද්ධං ඔජං අභිහරන්ති. එවං හි සො භික්ඛවෙ මහාරුක්ඛො තදාහාරො තදුපාදානො චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍ය.

---

1. මූලං ඡින්දිත්වා - මජසං, මූලෙත ඡෙත්වා - PTS. 2. පලිං - PTS.
3. උසීරනාළ - සීමු. 4. අනභාවංකතො - PTS, සීමු. මජසං, අනභාවංගතො - සතා.

1. 6. 5.

## මහාරුක්ඛසූත්‍රය

55. සැවැත්නුවර-

මහණෙනි, උපාදනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩෙයි. තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදන වෙයි ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, යම්සේ මහරුකෙක් වේ ද, එහි යටට බස්නා යම් මුලුත් වේ ද, සරසට යන යම් මුලුත් වේ ද, ඒ සියල්ල ඕජස උඩට ගෙණ යයි. මහණෙනි, මෙසේ ඒ මහරුක ඒ ආහාර ඇත්තේ ඒ උපාදන ඇත්තේ බොහෝ දිගුකලක් පවත්නේ ය.

මහණෙනි. එපරිද්දෙන් ම උපාදනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩේ තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, උපාදනීය ධර්මයන්හි දෙෂය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදන නිරෝධය වේ. උපාදන නිරෝධයෙන් භවනිරෝධය වේ . මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

මහණෙනි, යම්සේ මහරුකෙක් වේ ද, එකල්හි පුරුෂයෙක් උදැල්ලක් හා පැසක් ගෙණ එන්නේ ය. හෙතෙමේ ඒ රුක මුල සිඳින්නේ ය. මුල සිඳ හාත්පස සාරන්නේ ය. හාත්පස සාරා යටත්පිරිසෙයින් සුවඳහොට මුල් පමණ වුත් මුල් උදුරන්නේ ය. හෙතෙමේ ඒ රුක කඩ කඩ කොට සිඳින්-නේ ය. කඩ කඩ කොට සිඳ පලන්නේ ය පලා කැබැලි කැබැලි කරන්නේ ය කැබැලි කැබැලි කොට අව්සුලෙහි වියලන්නේ ය. අව්සුලෙහි වියලා ගින්නෙන් දවන්නේ ය. ගින්නෙන් දවා හළු කරන්නේ ය. හළු කොට මහ-සුලගෙහි හෝ පොලා හරින්නේ ය. සැඩපහර ඇති ගඟෙහි හෝ පා කොට හරින්නේ ය. මහණෙනි, මෙසේ ඒ මහරුක උපුත් මුල් ඇත්තේ හිස් සුන් තල්ගසක් මෙන් කරණ ලද්දේ, නො වැඩෙන බවට පමුණුවන ලද්දේ මතු නූපදනා සවභාව ඇත්තේ වන්නේ ය.

මහණෙනි, එසෙයින් ම උපාදනීය ධර්මයන්හි දෙෂය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදන නිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ යි

1. 6. 6.

## දුතිය මහාරුක්ඛසූත්‍රය

56 සැවැත්නුවර-

මහණෙනි, යම්සේ මහරුකෙක් වේ ද, එහි යටට බස්නා යම් මුලුත් වේ ද, සරසට යන යම් මුලුත් වේ ද, ඒ සියල්ල ඕජාව උඩට ගෙණ යේ. මහණෙනි, මෙසේ ඒ මහරුක ඒ ආහාර ඇත්තේ ඒ උපාදන ඇත්තේ බොහෝ දිගුකලක් සිටුනේ ය

එවමෙව ඛො භික්ඛවෙ, උපාදානීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාරුක්ඛො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං ආදාය. සො තං රුක්ඛං මූලෙ ඡින්දෙය්‍ය මූලෙ ඡෙත්වා පලිඛණෙය්‍ය. පලිඛණිත්වා මූලානි උද්ධරෙය්‍ය -පෙ- නදියා වා සීඝසොතාය පවාහෙය්‍ය. එවං හි සො භික්ඛවෙ මහාරුක්ඛො උච්ඡින්නමූලො අස්ස තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො

එවමෙව ඛො භික්ඛවෙ, උපාදානීයෙසු ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති

## 1. 6. 7

## තරුණරුක්ඛසුත්තං

57 සාවත්ථියං-

සංයොජනීයෙසු භික්ඛවෙ, ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, තරුණො රුක්ඛො, තස්ස පුරිසො කාලෙන කාලං මූලානි පලිසෙථය්‍ය.[1] කාලෙන කාලං පංසුං දදෙය්‍ය. කාලෙන කාලං උදකං දදෙය්‍ය. එවං හි සො භික්ඛවෙ තරුණො රුක්ඛො තදාහාරො තදුපාදානො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍ය.

එවමෙව ඛො භික්ඛවෙ:, සංයොජනීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සංයොජනීයෙසු භික්ඛවෙ, ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති

සෙය්‍යථාපි භික්ඛවෙ, තරුණො රුක්ඛො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං ආදාය. සො තං රුක්ඛං මූලෙ ඡින්දෙය්‍ය මූලෙ ඡෙත්වා පලිඛණෙය්‍ය. පලිඛණිත්වා මූලානි උද්ධරෙය්‍ය අන්තමසො උසීරනාළමත්තානිපි. සො තං රුක්ඛං ඛණ්ඩාඛණ්ඩිකං ඡින්දෙය්‍ය. ඛණ්ඩාඛණ්ඩිකං ඡෙත්වා ඵාලෙය්‍ය. ඵාලෙත්වා සකලිකං සකලිකං කරෙය්‍ය. සකලිකං සකලිකං කරිත්වා වාතාතපෙ විසොසෙය්‍ය. වාතාතපෙ විසොසෙත්වා අග්ගිනා ඩහෙය්‍ය. අග්ගිනා ඩහෙත්වා මසිං කරෙය්‍ය. මසිං කරිත්වා මහාවාතෙ වා ඔපුනෙය්‍ය, නදියා වා සීඝසොතාය පවාහෙය්‍ය. එවං හි සො භික්ඛවෙ තරුණො රුක්ඛො උච්ඡින්නමූලො අස්ස තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො

1. පලිමජ්ජෙය්‍ය - මජසං, පලිසජ්ජෙය්‍ය - ස්‍යා; PTS. පලිසනෙතාය්‍ය - සී 1 සී මු.

මහණෙනි, උපාදනීය ධර්මයන්හි ආස්වාදය අනුව නැවත නැවත දක්නා-සුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, යම්සේ මහරුකෙක් වේ ද, එකල්හි පුරුෂයෙක් උදැල්ලක් හා පැසක් ගෙණ එන්නේ ය. හෙතෙමේ ඒ රුක මුල් සිඳින්නේ ය. මුල් සිඳ හාත්පස සාරන්නේ ය. හාත්පස සාරා මුල් උදුරන්නේ ය ... සැඩපහර ඇති ගඟෙහි හෝ පා කොට හරින්නේ ය. මහණෙනි, මෙසේ ඒ මහරුක උසුන් මුල් ඇත්තේ මුදුන සුන් තලක් මෙන් කරණ ලද්දේ නැවත නො වැඩෙන බවට පත් කරණ ලද්දේ මතු නො හටගන්නා සවභාව ඇත්තේ වන්නේ ය.

මහණෙනි, එසෙයින් ම උපාදනීය ධර්මයන්හි දොෂ දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වෙයි. තෘෂ්ණා නිරෝධයෙන් උපාදන නිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ යි.

## 1 6. 7

### තරුණරුක්ඛසුත්‍රය

57. සැවැත්නුවර-

මහණෙනි, සංයෝජනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දකිමින් වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩෙයි. තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, යම්සේ තරුණ රුකෙක් වේ ද, පුරුෂයෙක් කලින් කල එහි මුල් සුද්ද කරන්නේ ද, කලින් කල පස් පොහොර දෙන්නේ ද, කලින් කල ජලය දෙන්නේ ද, මහණෙනි, මෙසේ ඒ තරුණ රුක ඒ ආහාර ඇත්තේ ඒ උපාදන ඇත්තේ වැඩීමට හටගත් මුල් ඇති බවට මහත් බවට පැමිණෙන්නේ ය.

මහණෙනි, එසෙයින් ම සංයෝජනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දකිමින් වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, සංයෝජනීය ධර්මයන්හි ආදීනවය නැවත නැවත දක්නා-සුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තණ්හා නිරෝධයෙන් උපාදන නිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

මහණෙනි, යම්සේ තරුණ රුකෙක් වේ ද, එකල්හි පුරුෂයෙක් උදැල්ලක් හා පැසක් ගෙණ එන්නේ ය. හෙතෙමේ ඒ රුක මුල් සිඳින්නේ ය. මුල් සිඳ හාත්පස සාරන්නේ ය. හාත්පස සාරා යටත්පිරිසෙයින් සුවඳහොට මුල් පමණ වූ ද මුල් උදුරන්නේ ය. හෙතෙමේ ඒ රුක කඩ කඩ කොට සිඳින්නේ ය. කඩ කඩ කොට සිඳ පලන්නේ ය. පලා කැබැලි කැබැලි කරන්නේ ය. කැබැලි කැබැලි කොට අවු සුලඟෙහි වියලන්-නේ ය. අවු සුලඟෙහි වියලා ගින්නෙන් දවන්නේ ය. ගින්නෙන් දවා හළු කරන්නේය. හළු කොට මහාසුලඟෙහි හෝ පොලා හරින්නේ ය. සැඩපහර ඇති ගඟෙහි හෝ පා කොට හරින්නේ ය. මහණෙනි, මෙසේ ඒ තරුණ රුක උසුන්මුල් ඇත්තේ හිස්සුන් තල්රුකක් මෙන් කරණ ලද්දේ නැවත නො වැඩෙන බවට පමුණුවන ලද්දේ මතු නූපදනා සවභාව ඇත්තේ වන්නේ ය.

එවමෙව ඛො භික්ඛවෙ, සඤ්ඤොජනීයෙසු ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## 1 6. 8

### නාමරූපසුත්තං

58. සාවත්ථියං-

සඤ්ඤොජනීයෙසු භික්ඛවෙ, ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො නාමරූපස්ස අවක්කන්ති හොති. නාමරූපපච්චයා සළායතනං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාරුක්ඛො, තස්ස යානි චෙව මූලානි අධොගමානි, යානි ච තිරියංගමානි, සබ්බානි තානි උද්ධං ඔජං අභිහරන්ති. එවං හි සො භික්ඛවෙ මහාරුක්ඛො තදාහාරො තදුපාදානො චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍ය.

එවමෙව ඛො භික්ඛවෙ, සඤ්ඤොජනීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො නාමරූපස්ස අවක්කන්ති හොති. නාමරූපපච්චයා සළායතනං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සඤ්ඤොජනීයෙසු භික්ඛවෙ, ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො නාමරූපස්ස අවක්කන්ති න හොති. නාමරූපනිරොධා සළායතනනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාරුක්ඛො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාල-පිටකං ආදාය -පෙ- ආයතිං අනුප්පාදධම්මො.

එවමෙව ඛො භික්ඛවෙ, සඤ්ඤොජනීයෙසු ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො නාමරූපස්ස අවක්කන්ති න හොති. නාමරූපනිරොධා සළායතන-නිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## 1 6. 9

### විඤ්ඤාණසුත්තං

59. සාවත්ථියං-

සඤ්ඤොජනීයෙසු භික්ඛවෙ, ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො විඤ්ඤාණස්ස අවක්කන්ති හොති. විඤ්ඤාණපච්චයා නාමරූපං -පෙ- එවමෙ-තස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාරුක්ඛො, තස්ස යානි චෙව මූලානි [අධොගමානි] -පෙ- [දීඝමද්ධානං තිට්ඨෙය්‍ය.]

එවමෙව ඛො භික්ඛවෙ, සඤ්ඤොජනීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො විඤ්ඤාණස්ස අවක්කන්ති හොති. විඤ්ඤාණපච්චයා නාමරූපං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

මහණෙනි, එසෙයින් ම සංයෝජනීය ධර්මයන්හි ආදීනවය නැවත නැවත දක්නාසුලු ව වසන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ යි.

## 1. 6. 8.

## නාමරූපසූත්‍රය.

58. සැවැත්නුවර-

මහණෙනි, සංයෝජනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දකිමින් වෙසෙන්නහුට නාමරූපයන්ගේ බැසගැණීම වේ. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, යම්සේ මහරුකෙක් වේ ද, එහි යට බස්නා යම් මුලුත් වේ ද, සරස යන යම් මුලුත් වේ ද, ඒ සියල්ල ඔජාව උඩට ගෙණ යේ. මහණෙනි, මෙසේ ඒ මහරුක ඒ ආහාර ඇත්තේ ඒ උපාදාන ඇත්තේ බොහෝ දිගුකලක් සිටුනේ ය.

මහණෙනි, එසෙයින් ම සංයෝජනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දකිමින් වෙසෙන්නහුට නාමරූපයන්ගේ පහළවීම වේ. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතන වේ. මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි, සංයෝජනීය ධර්මයන්හි ආදීනවය නැවත නැවත දකිමින් වෙසෙන්නහුට නාමරූපයන්ගේ පහළවීම නො වේ. නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වේ .. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

මහණෙනි, යම්සේ මහරුකෙක් වේ ද, එකල්හි උදැල්ලක් හා පැසක් ගෙණ පුරුෂයෙක් එන්නේ ය ... මත්තෙහි නූපදනා සවභාව ඇත්තේ වේ.

මහණෙනි, එසෙයින් ම සංයෝජනීය ධර්මයන්හි දෙෂය නැවත නැවත දකිමින් වෙසෙන්නහුට නාමරූපයන්ගේ බැසගැණීම නො වේ. නාමරූප නිරෝධයෙන් සළායතන නිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ යි.

## 1. 6. 9.

## විඤ්ඤාණසූත්‍රය.

59. සැවැත්නුවර-

මහණෙනි, සංයෝජනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුට විඤ්ඤාණයාගේ බැසගැණීම වේ. විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

මහණෙනි. යම්සේ මහරුකෙක් වේ ද, එහි යට බස්නා යම් මුලුත් වේ ද, ... [බොහෝ දිගුකලක් සිටුනේ ය.]

මහණෙනි, එසෙයින් ම සංයෝජනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුට විඤ්ඤාණයාගේ පහළවීම වේ. විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැන්ම වේ.

සඤ්ඤොජනීයෙසු භික්ඛවෙ, ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො විඤ්ඤාණස්ස අවක්කන්ති න හොති. විඤ්ඤාණනිරොධා[1] නාමරූපනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාරුක්ඛො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය -පෙ- ආයතිං අනුප්පාදධම්මො

එවමෙව ඛො භික්ඛවෙ, සඤ්ඤොජනීයෙසු ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො විඤ්ඤාණස්ස අවක්කන්ති න හොති විඤ්ඤාණනිරොධා[1] නාමරූප-නිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## 1 6. 10

## නිදාන [පටිච්චසමුප්පාද] සුත්තං

60. එකං සමයං භගවා කුරූසු විහරති කම්මාසදම්මං[2] නාම කුරූනං නිගමො. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ යාව ගම්භීරො චායං භන්තෙ, පටිච්චසමුප්පාදො ගම්භීරාවභාසො ච, අථ ච පන මෙ උත්තානකුත්තානකො විය ඛායතීති.

මා හෙවං ආනන්ද, මා හෙවං ආනන්ද, ගම්භීරො චායං ආනන්ද, පටිච්චසමුප්පාදො ගම්භීරාවභාසො ච එතස්ස ආනන්ද, ධම්මස්ස අඤ්ඤාණා අනනුබොධා අප්පටිවෙධා එවමයං පජා තන්තාකුලකජාතා ගුලාගුණ්ඨිකා[3] ජාතා මුඤ්ජබබ්බජභූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති.

උපාදානියෙසු ආනන්ද, ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං. උපාදානපච්චයා භවො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සෙය්‍යථාපි ආනන්ද, මහාරුක්ඛො, තස්ස යානි චෙව මූලානි අධොගමානි, යානි ච තිරියංගමානි. සබ්බානි තානි උද්ධං ඔජං අභිහරන්ති. එවං හි සො ආනන්ද මහාරුක්ඛො තදාහාරො තදුපාදානො චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍ය.

එවමෙව ඛො ආනන්ද, උපාදානීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං. උපාදානපච්චයා භවො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

උපාදානීයෙසු ආනන්ද, ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

---

1. විඤ්ඤාණස්ස නිරොධා-මජසං, PTS. 2. කම්මාසධම්මං මජසං, කම්මාසදම්මං, සයා, PTS
3. කුලගණ්ඨිකා-මජසං, ගුළීගුණ්ඨිකා - සයා, ගුම්බගණ්ඨිකා - PTS

මහණෙනි, සංයෝජනීය ධර්මයන්හි දෝෂය නැවත නැවත දකිමින් වෙසෙන්නහුට විඤ්ඤාණයාගේ බැසගැනීම නො වේ. විඤ්ඤාණයාගේ නිරොධයෙන් නාමරූප නිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

මහණෙනි, යම්සේ මහරුකෙක් වේ ද, එකල්හි පුරුෂයෙක් එන්නේ ය මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තේ වේ.

මහණෙනි, එසෙයින් ම සංයෝජනීය ධර්මයන්හි දෝෂය නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුට විඤ්ඤාණයාගේ පහළවීම නො වේ. විඤ්ඤාණ නිරොධයෙන් නාමරූප නිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ යි.

## 1. 6. 10.

## නිදාන [පටිච්චසමුප්පාද] සූත්‍රය

60. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කුරුරට කම්මාසදම්ම නම් කුරුන්ගේ නියම්ගම්හි වැඩවෙසෙන සේක. එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ වහන්ස, ආශ්චර්යයෙකි. වහන්ස, අද්භූතයෙකි. වහන්ස, මේ පටිච්චසමුප්පාදය ඉතා ගැඹුරු ය. ගැඹුරු වූයේ ම දකිනු ද ලැබේ. එහෙත් මට ඉතා ප්‍රකට වූවක් මෙන් වැටහේ ය"යි භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ.

ආනන්ද, එසේ නොකිය, ආනන්ද එසේ නො කිය. ආනන්ද, මේ පටිච්චසමුප්පාදය ඉතා ගැඹුරු ය, ගැඹුරු වූයේ ම ගැඹුරුව පෙණේ. ආනන්ද, මේ දහම නො දැනීමෙන් අවබෝධ නො කිරීමෙන් ප්‍රතිවේධ නො කිරීමෙන් මෙසේ මේ සත්ත්වයෝ අවුල් වූ නූල් පන්දක් මෙන් වූවාහු, පෙහෙරුන්ගේ කැදෙහි නූල් ගුලාවක් හෝ කුරුඑකැදූල්ලක් මෙන් ව්‍යාකුල වූවාහු, මුදුතණ බබුස්තණ මෙන් අවුල් වූවාහු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන සසර නො ඉක්මවත්.

ආනන්ද, උපාදානීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දකිමින් වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදාන වේ. උපාදාන ප්‍රත්‍යයයෙන් භවය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැන්ම වේ.

ආනන්ද, යම්සේ මහරුකෙක් වේ ද, එහි යටට බස්නා යම් මුලුත් වේ ද, සරසට ගමන් ගත් යම් මුලුත් වේ ද, ඒ සියල්ල ඔජස උඩට ගෙණ යේ. ආනන්ද, මෙසේ ඒ මහරුක ඒ ආහාර ඇත්තේ ඒ උපාදාන ඇත්තේ ඉතා දිගුකලක් සිටුනේ ය.

ආනන්ද, එසෙයින් ම උපාදානීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දකිමින් වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදාන වේ. උපාදාන ප්‍රත්‍යයයෙන් භවය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැන්ම වේ.

ආනන්ද, උපාදානීය ධර්මයන්හි ආදීනවය නැවත නැවත දකිමින් වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

සෙය්‍යථාපි ආනන්ද, මහාරුක්ඛො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං ආදාය. සො තං රුක්ඛං මූලෙ ඡින්දෙය්‍ය' මූලෙ ඡෙත්වා පලිඛණෙය්‍ය. පලිඛණිත්වා මූලානි උද්ධරෙය්‍ය. අන්තමසො උසීරනාළමත්තානිපි. සො තං රුක්ඛං ඛණ්ඩාඛණ්ඩිකං ඡින්දෙය්‍ය, ඛණ්ඩාඛණ්ඩිකං ඡෙත්වා ඵාලෙය්‍ය ඵාලෙත්වා සකලිකං සකලිකං කරෙය්‍ය. සකලිකං සකලිකං කරිත්වා වාතාතපෙ විසොසෙය්‍ය. වාතාතපෙ විසොසෙත්වා අග්ගිනා ඩහෙය්‍ය. අග්ගිනා ඩහෙත්වා මසිං කරෙය්‍ය. මසිං කරිත්වා මහාවාතෙ වා ඔපුනෙය්‍ය. නදියා වා සීඝසොතාය පවාහෙය්‍ය. එවං හි සො ආනන්ද මහාරුක්ඛො උච්ඡින්නමූලො අස්ස තාලාවත්ථුකතො අනවභාවකතො ආයතිං අනුප්පාදධම්මො.

එවමෙව ඛො ආනන්ද, උපාදානීයෙසු ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හානිරොධා උපාදානනිරොධො. උපාදාන-නිරොධා භවනිරොධො. භවනිරොධා ජාතිනිරොධො. ජාතිනිරොධා ජරා-මරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## දුක්ඛවග්ගො ඡට්ඨො.

තස්සුද්දානං:

පරිවීමංසනුපාදානං ද්වෙ ච සඤ්ඤොජනානි ච
මහාරුක්ඛෙන ද්වෙ වුත්තා තරුණෙන ච සත්තමං
නාමරූපඤ්ච විඤ්ඤාණං නිදානෙන ච තෙ දසාති.

ආනන්ද, යම්සේ මහරුකෙක් වේ ද, පුරුෂයෙක් උදැල්ලක් හා පැසක් ගෙණ එහි එන්නේ ය. හෙතෙමේ ඒ රුක මුල් සිඳින්නේ ය. මුල් සිඳ හාත්පස කනින්නේ ය. හාත්පස කැන යටත් පිරිසෙයින් සුවඳහොට මුල් පමණවූ ද මුල් උදුරන්නේ ය. හෙතෙමේ ඒ රුක කඩ කඩ කොට සිඳින්නේ ය කඩ කඩ කොට සිඳ පලන්නේ ය. පලා කැබැලි කැබැලි කරන්නේ ය. කැබැලි කැබැලි කොට අව්සුලෙහි වියලන්නේ ය. අව්-සුලෙහි වියලා ගින්නෙන් දවන්නේ ය. ගින්නෙන් දවා හළු කරන්නේ ය හළු කොට මහසුලෙහි හෝ පොලා හරින්නේ ය. සැඩ පහර ඇති ගඟෙහි හෝ පා කොට හරින්නේ ය. ආනන්ද, මෙසේ ඒ මහරුක උසුත් මුල් ඇත්තේ සිඳුනු තලක් මෙන් කරණ ලද්දේ නැවත නො හටගන්නා බවට පමුණුවන ලද්දේ මතු නූපදනා සවභාව ඇත්තේ වන්නේ ය.

ආනන්ද, එසෙයින් ම උපාදානීය ධර්මයන්හි ආදීනවය නැවත නැවත දකිමින් වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණානිරෝධයෙන් උපාදානනිරෝධය වේ. උපාදානනිරෝධයෙන් භවනිරෝධය වේ. භවනිරෝධ-යෙන් ජාතිනිරෝධය වේ. ජාතිනිරෝධයෙන් ජරමරණ සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හු; දුක්රැසේ නිරෝධය වේ යි.

**දුක්ඛවර්ගය සවැණි යි**

**එහි උද්දානය:**

පරිවීමංසන උපාදාන සූත්‍ර දෙක ය, සංයෝජන සූත්‍ර දෙක ය, මහාරුක්ඛ සූත්‍ර දෙක ය, තරුණ රුක්ඛ සූත්‍රය, නාමරූප, විඤ්ඤාණ, නිදාන සූත්‍රය යි සූත්‍ර දශයෙකි.

# 7. මහාවග්ගො

## 1. 7. 1

### අස්සුතවන්තුසුත්තං

61. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර -පෙ- අවොච:

අස්සුතවා භික්ඛවෙ පුථුජ්ජනො ඉමස්මිං චාතුම්මහාභූතිකස්මිං[1] කායස්මිං නිබ්බින්දෙය්‍යා'පි විරජ්ජෙය්‍යා'පි විමුච්චෙය්‍යා'පි. තං කිස්ස හෙතු: දිස්සති භික්ඛවෙ, ඉමස්ස චාතුම්මහාභූතිකස්ස කායස්ස ආචයො'පි අපචයො'පි ආදනම්පි නික්ඛෙපනම්පි[2] තස්මා තත්‍රාස්සුතවා පුථුජ්ජනො නිබ්බින්දෙය්‍යා'පි විරජ්ජෙය්‍යා'පි විමුච්චෙය්‍යා'පි.

යං ච ඛො එතං භික්ඛවෙ, වුච්චති චිත්තං ඉතිපි මනො ඉතිපි විඤ්ඤාණං ඉතිපි, තත්‍රාස්සුතවා පුථුජ්ජනො නාලං නිබ්බින්දිතුං නාලං විරජ්ජිතුං නාලං විමුච්චිතුං. තං කිස්ස හෙතු? දීඝරත්තං හෙතං භික්ඛවෙ, අස්සුතවතො පුථුජ්ජනස්ස අජ්ඣොසිතං මමායිතං පරාමට්ඨං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති. තස්මා තත්‍රාස්සුතවා පුථුජ්ජනො නාලං නිබ්බින්දිතුං නාලං විරජ්ජිතුං නාලං විමුච්චිතුං.

වරං භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො ඉමං චාතුම්මහාභූතිකං කායං අත්තතො උපගච්ඡෙය්‍ය, නත්වෙව චිත්තං. තං කිස්ස හෙතු: දිස්සතායං භික්ඛවෙ, චාතුම්මහාභූතිකො කායො එකම්පි වස්සං තිට්ඨමානො, ද්වෙපි වස්සානි තිට්ඨමානො, තීණිපි වස්සානි තිට්ඨමානො, චත්තාරිපි වස්සානි තිට්ඨමානො, පඤ්චපි වස්සානි තිට්ඨමානො, දසපි වස්සානි තිට්ඨමානො, වීසතිපි වස්සානි තිට්ඨමානො, තිංසම්පි වස්සානි තිට්ඨමානො, චත්තාරීසම්පි වස්සානි තිට්ඨමානො, පඤ්ඤාසම්පි වස්සානි තිට්ඨමානො, වස්සසතම්පි තිට්ඨමානො භිය්‍යො පි තිට්ඨමානො. යඤ්ච ඛො එතං භික්ඛවෙ වුච්චති චිත්තං ඉතිපි මනො ඉතිපි විඤ්ඤාණං ඉතිපි. තං රත්තියා ච දිවසස්ස ච අඤ්ඤදෙව උප්පජ්ජති අඤ්ඤං නිරුජ්ඣති.

සෙය්‍යථාපි භික්ඛවෙ, මක්කටො අරඤ්ඤෙ පවනෙ[3] චරමානො සාඛං ගණ්හාති.[4] තං මුඤ්චිත්වා අඤ්ඤං ගණ්හාති: තං මුඤ්චිත්වා අඤ්ඤං ගණ්හාති: එවමෙව ඛො භික්ඛවෙ යදිදං වුච්චති චිත්තං ඉතිපි මනො ඉතිපි විඤ්ඤාණං ඉතිපි. තං රත්තියා ච දිවසස්ස ච අඤ්ඤදෙව උප්පජ්ජති, අඤ්ඤං නිරුජ්ඣති.

---

1. චාතුමහාභූතිකස්මිං - මජ්ඣං, PTS. 2. නික්ඛෙපම්පි - සීමු, සී 2
3. අරඤ්ඤාපවනෙ - සීමු, සී 1, 2, අරඤ්ඤෙ ච බ්‍රහාවනෙ - ස්‍යා.
4. ගණ්හති - මජ්ඣං.

## මහාවග්ගය

### 1. 7. 1.

### අස්සුතවන්තු සූත්‍රය

61. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩ වෙසෙන සේක. එහි දී ... වදාළ සේක:

මහණෙනි, නූගත් පුහුදුන් තෙමේ සතර මහාභූතයන්ගෙන් හටගත් මේ සිරුරෙහි උකටලී වන්නේත් වෙයි. නො ඇලෙන්නේත් වෙයි. මිදෙනු කැමැත්තේත් වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, සතර මහා-භූතයන්ගෙන් හටගත් මේ ශරීරයෙහි වැඩීමත් පිරිහීමත් හටගැනීමත් බිඳීමත් පෙණෙයි. එහෙයින් නූගත් පුහුදුන් තෙමේ එහි ලා උකටලී වන්නේත් වෙයි. නො ඇලෙන්නේත් වෙයි. මිදෙනු කැමැත්තේත් වෙයි.

මහණෙනි, මේ යමක් සිත යයි ද මනස ය යි ද විඤ්ඤාණ යයි ද කියනු ලැබේ ද, එහි ලා නූගත් පුහුදුන් තෙමේ කලකිරෙන්නට නො සමත් ය, නො ඇලෙන්නට නො සමත් ය, මිදෙන්නට නො සමත් ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, නූගත් පුහුදුන්හු විසින් බොහෝ කලක් මුළුල්ලෙහි 'මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම ය'යි (තෘෂ්ණාදියෙන්) බැස ගන්නා ලදී. මමත්වය කරණ ලදී. පරාමර්ශනය කරණ ලදී. එහෙයින් එහිලා නූගත් පුහුදුන් තෙමේ උකටලී වන්නට නො සමත් ය. නො ඇලෙන්නට නො සමත් ය. මිදෙන්නට නො සමත් ය.

මහණෙනි, ඇසූ පිරූ තැන් නැති පුහුදුන් තෙමේ සතරමහාභූතයන් ගෙන් හටගත් ශරීරය ආත්ම ය යි ගන්නේ නම් උතුම්. සිත (එලෙස ගැණීම) නො ම මැනවි. ඒ කවර හෙයින යත්: මහණෙනි, සතර මහා-භූතයන්ගෙන් හටගත් මේ ශරීරය එක් වසක් සිටුනේ ම, දෙවසක් සිටුනේ ම, තෙවසක් සිටුනේ ම, සිවුවසක් සිටුනේ ම, පස්වසක් සිටුනේ ම, දසවසක් සිටුනේ ම, විසිවසක් සිටුනේ ම, තිස්වසක් සිටුනේ ම, සතළිස් වසක් සිටුනේ ම, පනස් වසක් සිටුනේ ම, සියවසක් සිටුනේ ම, ඉන් වැඩියක් කල් සිටුනේ ම පැණේ. මහණෙනි, යමක් මේ සිත යයි මනස යයි විඤ්ඤාණ යයි කියනු ලැබේ ද, ඒ සිත රෑ ද දහවල් ද අනෙකක් ම උපදී. අනෙකක් ම නිරුද්ධ වේ.

මහණෙනි, වඳුරෙක් මහවෙනෙහි හැසිරෙණුයේ යම්සේ අත්තක් එල්බ ගණී ද, එය මුදා අනිකක් එල්බ ගණී ද, එය මුදා අනිකක් එල්බ ගණී ද, මහණෙනි, එසෙයින් ම මේ යමක් සිත යයි මනස යයි විඤ්ඤාණ යයි කියනු ලැබේ ද, ඒ (සිත) රෑ ද දහවල් ද අනෙකක් ම උපදී. අනෙකක් ම නිරුද්ධ වේ. (සිත අරමුණක් පාසා වෙනස්වන බව කියුයේ ය.)

තත්‍ර භික්ඛවෙ සුතවා අරියසාවකො පටිච්චසමුප්පාදං යෙව සාධුකං යොනිසො මනසි කරොති: ඉති ඉමස්මිං සති ඉදං හොති. ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. ඉමස්මිං අසති ඉදං න හොති. ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති: යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති. වෙදනායපි නිබ්බින්දති. සඤ්ඤායපි නිබ්බින්දති. සඞ්ඛාරෙසුපි නිබ්බින්දති. විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. 'කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතී'ති.

## 1. 7. 2

## දුතිය අස්සුතවන්තසුත්තං

62 සාවත්ථියං-

අස්සුතවා භික්ඛවෙ, පුථුජ්ජනො ඉමස්මිං චාතුම්මහාභූතිකස්මිං කායස්මිං නිබ්බින්දෙය්‍යාපි විරජ්ජෙය්‍යාපි විමුච්චෙය්‍යාපි. තං කිස්ස හෙතු: දිස්සති භික්ඛවෙ ඉමස්ස චාතුම්මහාභූතිකස්ස කායස්ස ආචයොපි අපචයොපි ආදානම්පි නික්ඛෙපනම්පි. තස්මා තත්‍රාස්සුතවා පුථුජ්ජනො නිබ්බින්දෙය්‍යාපි විරජ්ජෙය්‍යාපි විමුච්චෙය්‍යාපි.

යඤ්ච ඛො එතං භික්ඛවෙ වුච්චති චිත්තං ඉතිපි මනො ඉතිපි විඤ්ඤාණං ඉතිපි. තත්‍රාස්සුතවා පුථුජ්ජනො නාලං නිබ්බින්දිතුං නාලං විරජ්ජිතුං නාලං විමුච්චිතුං. තං කිස්ස හෙතු: දීඝරත්තං හෙතං භික්ඛවෙ, අස්සුතවතො පුථුජ්ජනස්ස අජ්ඣොසිතං මමායිතං පරාමට්ඨං "එතං මම එසොහමස්මි එසො මෙ අත්තා"ති. තස්මා තත්‍රාස්සුතවා පුථුජ්ජනො නාලං නිබ්බින්දිතුං නාලං විරජ්ජිතුං නාලං විමුච්චිතුං.

වරං[1] භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො ඉමං චාතුම්මහාභූතිකං කායං අත්තතො උපගච්ඡෙය්‍ය, න ත්වෙව චිත්තං. තං කිස්ස හෙතු: දිස්සතායං භික්ඛවෙ, චාතුම්මහාභූතිකො කායො එකම්පි වස්සං තිට්ඨමානො, ද්වෙපි වස්සානි තිට්ඨමානො, තීණිපි -පෙ- චත්තාරිපි -පෙ- පඤ්චපි -පෙ- දසපි -පෙ- වීසතිපි -පෙ- තිංසම්පි -පෙ- චත්තාරීසම්පි -පෙ- පඤ්ඤාසම්පි -පෙ- වස්සසතම්පි තිට්ඨමානො. භිය්‍යොපි තිට්ඨමානො, යඤ්ච ඛො එතං භික්ඛවෙ වුච්චති චිත්තං ඉතිපි මනො ඉතිපි විඤ්ඤාණං ඉතිපි, තං රත්තියා ච දිවසස්ස ච අඤ්ඤදෙව උප්පජ්ජති. අඤ්ඤං නිරුජ්ඣති

1. වරංපි - සයා

මහණෙනි, එහි ලා ඇසූ පිරූ තැන් ඇති ආර්‍යශ්‍රාවක තෙමේ පටිච්ච-සමුප්පාදය ම මනා කොට නුවණින් මෙනෙහි කෙරේ ද, මෙසේ මේ හේතුව ඇති කල්හි මේ ඵලය වෙයි. මෙය ඇතිවීමෙන් මෙය උපදී. මෙය නැති කල්හි මෙය නො වෙයි. මේ හේතුව නිරුද්ධවීමෙන් මේ ඵලය නිරුද්ධ වේ. ඒ නම් අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වේ. .... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ.

අවිද්‍යාව ම නිරවශේෂයෙන් නිරුද්ධ කිරීමෙන් සංස්කාරනිරෝධය වේ. සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධය වෙ .... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

මහණෙනි, ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙමේ මෙසේ දක්නේ රූපයෙහි ද කලකිරෙයි. වේදනාවෙහි ද කලකිරෙයි. සංඥාවෙහි ද කලකිරෙයි. සංසකාරකායන්හි ද කලකිරෙයි. විඥානයෙහි ද කලකිරෙයි. කලකිරෙණුයේ නො ඇලේ. නො ඇලෙනුයේ මිදෙයි. මිදුනු කල්හි මිදුනේ යයි දැනීම වෙයි. ඉපදීම ක්‍ෂය වී ය. මගබඹසර වැස නිමවන ලදී. කටයුත්ත කරණ ලදී. මේ බැව් පිණිස අනෙකක් නැතැයි දැන ගණියි.

1. 7. 2.

**දුතිය අස්සුතවන්තු සූත්‍රය.**

62. **සැවැත්නුවර-**

මහණෙනි, නූගත් පුහුදුන් තෙමේ සතර මහාභූතයන්ගෙන් හටගත් මේ සිරුරෙහි කලකිරෙන්නේත් නො ඇලෙන්නේත් මිදෙනු කැමැත්තේත් වෙයි. ඒ කවරහෙයින යත්: මහණෙනි, සතර මහාභූතයන්ගෙන් හටගත් මේ සිරුරෙහි වැඩීමත් පිරිහීමත් හටගැණීමත් බිඳීමත් පෙණෙයි. එහෙයින් නූගත් පුහුදුන් තෙමේ එහි කලකිරෙන්නේත් නො ඇලෙන්නේත් මිදෙනු කැමැත්තේත් වෙයි.

මහණෙනි, මේ යමක් සිත යයි දු, මනස ය යි දු, විඥාන යයි දු කියනු ලැබේ ද, එහි නූගත් පුහුදුන් තෙමේ කලකිරෙන්නට නො සමත් ය. නො ඇලෙන්නට නො සමත්ය. මිදෙනු කැමැති වන්නට නො සමත් ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, නූගත් පුහුදුන්හු විසින් දිගුකලක් මුළුල්ලෙහි (මේ සිත) 'මෙය මාගේ ය. මේ මම වෙමි. මේ මාගේ ආත්මය' යි (තෘෂ්ණාවෙන්) බැඳ ගන්නා ලද්දේ ය. මමත්වය කරණ ලද්දේ ය. දෘෂ්ටියෙන් පරාමර්ශනය කරණ ලද්දේ ය. එහෙයින් එහි පුහුදුන් තෙමේ කලකිරෙන්-නට නො සමත් ය. නො ඇලෙන්නට නො සමත් ය. මිදෙනු කැමැති වන්නට නො සමත් ය.

මහණෙනි, නූගත් පුහුදුන් තෙමේ සතර මහාභූතයන්ගෙන් හටගත් මේ කාය ආත්ම වශයෙන් ගන්නේ නම් මැනවි. සිත (ආත්ම වශයෙන් ගන්නේ නම්) නො ම මැනවි. ඒ කවර හෙයින යත්: මහණෙනි, චාතුර්මහාභූතික මේ කය එක්වසකුත් සිටුනේ දෙවසකුත් සිටුනේ තෙවස-කුත් .... සිව්වසකුත් .... පස්වසකුත් .... දසවසකුත් .... විසිවසකුත් ... තිස් වසකුත් ... සාළිස් වසකුත් ... පණස් වසකුත් .... සියවසකුත් සිටුනේ වැඩියකුත් සිටුනේ දක්නා ලැබේ. මහණෙනි, මේ යමක් සිත යයි දු, මනස ය යි දු, විඥාන යයි දු, කියනු ලැබේ නම් එය රැයෙහි දු දහවල්හි දු, අනෙකක් ම උපදී. අනෙකක් ම නිරුද්ධ වේ.

තත්‍ර භික්ඛවෙ, සුතවා අරියසාවකො පටිච්චසමුප්පාදං යෙව සාධුකං යොනිසො මනසි කරොති: ඉති ඉමස්මිං සති ඉදං හොති: ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣතීති. සුඛවෙදනියං භික්ඛවෙ, ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා. තස්සෙව සුඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං සුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා සුඛා වෙදනා සා නිරුජ්ඣති. සා වූපසම්මති.[1] දුක්ඛවෙදනීයං භික්ඛවෙ, ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා[2], තස්සෙව දුක්ඛවෙදනීයස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා දුක්ඛා වෙදනා, සා නිරුජ්ඣති. සා වූපසම්මති. අදුක්ඛමසුඛවෙදනීයං භික්ඛවෙ, ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා, තස්සෙව අදුක්ඛමසුඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා අදුක්ඛමසුඛා වෙදනා සා නිරුජ්ඣති. සා වූපසම්මති.

සෙය්‍යථාපි භික්ඛවෙ, ද්වින්නං කට්ඨානං සඞ්ඝට්ටසමොධානා[3] උස්මා ජායති, තෙජො අභිනිබ්බත්තති. තෙසං යෙව ද්වින්නං කට්ඨානං නානාභාවා විනික්ඛෙපා[4] යා තජ්ජා උස්මා සා නිරුජ්ඣති. සා වූපසම්මති. එවමෙව ඛො භික්ඛවෙ, සුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා[5], තස්සෙව සුඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං සුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා සුඛා වෙදනා, සා නිරුජ්ඣති. සා වූපසම්මති. දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච -පෙ- අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා අදුක්ඛමසුඛා වෙදනා, සා නිරුජ්ඣති. සා වූපසම්මති.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො ඵස්සෙපි නිබ්බින්දති. වෙදනායපි නිබ්බින්දති. සඤ්ඤායපි නිබ්බින්දති. සඞ්ඛාරෙසුපි නිබ්බින්දති. විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. 'ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං. නාපරං ඉත්ථත්තායා'ති පජානාති.

## 1. 7. 8.

## පුත්තමංසසුත්තං

63 සාවත්ථියං-

චත්තාරොමෙ භික්ඛවෙ, ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය. කතමෙ චත්තාරො? කබළීකාරො ආහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය.

---

1. වූපසමති. සයා. 2. දුක්ඛවෙදනා - මජසං, PTS. 3. සඞ්ඝට්ටසමොධානා-සයා.
4. නානාකත විනිබ්භොගා – සයා, මජසං. 5. සුඛවෙදනා-මජසං, PTS.

මහණෙනි, එහි ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ "මෙසේ මෙය ඇති කල්හි මෙය වෙයි මෙය හටගැනීමෙන් මෙය උපදී. මෙය නැති කල්හි මෙය නො වේ. මෙය නිරුද්ධවීමෙන් මෙය නිරුද්ධ වේ" ය යි මනා කොට නුවණින් මෙනෙහි කෙරෙයි. මහණෙනි, සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා සුඛවේදනාව උපදී. සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ඒ ස්පර්ශයේ ම නිරෝධයෙන් ඊට අනුරූප වූ යම් වේදනාවක් වේ නම් සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා උපන් ඒ සුඛවේදනාව නිරුද්ධ වේ. එය සන්සිඳේ. මහණෙනි, දුක් වේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා දුක් වේදනාව උපදී. දුක් වේදනාවට ප්‍රත්‍යය වූ ඒ ස්පර්ශයේ ම නිරෝධයෙන් ඊට අනුරූප වූ යම් වේදනාවක් වේ නම් දුක් වේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා උපන් ඒ දුක් වේදනාව නිරුද්ධ වේ. එය සන්සිඳේ. මහණෙනි, මැදහත් වේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා මැදහත් වේදනාව උපදී. මැදහත් වේදනාවට ප්‍රත්‍යය වූ ඒ ස්පර්ශයේ ම නිරෝධයෙන් ඊට අනුරූප වූ යම් වේදනාවක් වේ නම් මැදහත් වේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා උපන් ඒ මැදහත් වේදනාව නිරුද්ධ වේ. එය සන්සිඳේ.

මහණෙනි, යම්සේ දඬු දෙකක් ගැටුම හා එක්වීමෙන් උණුසුම උපදී ද, උණුසුම හටගණී ද, ඒ දඬු දෙක ම වෙන්වීමෙන් බැහැර ලීමෙන් එයින් හටගත් යම් උණුසුමක් වේ නම් එය නිරුද්ධ වේ. එය සන්සිඳේ. මහණෙනි, එසෙයින් ම සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා සුඛවෙදනාව උපදී. සුඛවේදනාවට ප්‍රත්‍ය වූ ඒ ස්පර්ශයේ ම නිරෝධයෙන් එයට අනුරූප වූ යම් වේදනාවක් වේ නම් සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා උපන් ඒ සුඛවේදනාව නිරුද්ධ වේ. එය සන්සිඳේ. දුක් වේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා .... මහණෙනි, මැදහත් වේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා මැදහත් වේදනාව උපදී. මැදහත් වේදනාවට ප්‍රත්‍යය වූ ඒ ස්පර්ශයේ ම නිරෝධයෙන් ඊට අනුරූප වූ යම් වේදනාවක් වේ නම් මැදහත් වේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා උපන් ඒ මැදහත් වේදනාව නිරුද්ධ වේ. එය සන්සිඳේ.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ස්පර්ශයෙහි ද කලකිරෙයි. වේදනාවෙහි ද කලකිරෙයි. සංඥාවෙහි ද කලකිරෙයි. සංස්කාරයන්හි ද කලකිරෙයි. විඥානයෙහි ද කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේ යයි දැනීම වෙයි. 'ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදී. කටයුතු කරණ ලදී. මේ බැව් පිණිස අනෙකක් නැතැ'යි දැන ගණී.

## 1. 7. 8

## පුත්තමංස සූත්‍රය

63 සැවැත්නුවර-

මහණෙනි, උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස ද ඉපදීම අපෙක්‍ෂා කරණ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිස ද මේ ආහාර සතරෙකි. කවර සතරෙක් ද යත්· ඖදාරික වූ හෝ සුඛුම වූ හෝ කබලීකාර ආහාර ය, දෙවෙනි වූ ස්පර්ශාහාර ය, තෙවෙනි වූ මනොසඤ්චෙතනාහාර ය, සිවුවැනි වූ විඥානාහාර ය යි. මහණෙනි, මේ සිවු ආහාර උපන් සත්ත්වයන්ගේ ස්ථිතිය පිණිසත් ඉපදීම් අපේක්‍ෂා කරන්නවුන්ට අනුග්‍රහ පිණිසත් වේ.

කථඤ්ච භික්ඛවෙ, කබළීකාරො ආහාරො දට්ඨබ්බො? සෙය්‍යථාපි භික්ඛවෙ, ද්වෙ ජයම්පතිකා[1] පරිත්තං සම්බලං ආදාය කන්තාරමග්ගං පටිපජ්ජෙය්‍යුං, තෙසමස්ස එකපුත්තකො පියො මනාපො. අථ ඛො තෙසං භික්ඛවෙ, ද්වින්නං ජයම්පතිකානං කන්තාරගතානං යා පරිත්තා සම්බලමත්තා, සා පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය. සියා ච නෙසං කන්තාරාවසෙසො අනිත්තිණ්ණො.[2] අථ ඛො තෙසං භික්ඛවෙ, ද්වින්නං ජයම්පතිකානං එවමස්ස: අම්හාකං ඛො යා පරිත්තා සම්බලමත්තා, සා පරික්ඛීණා පරියාදින්නා අත්ථි චායං කන්තාරාවසෙසො අනිත්තිණ්ණො. යන්නූන මයං ඉමං එකපුත්තකං පියං මනාපං වධිත්වා වල්ලූරඤ්ච සොණ්ඩිකඤ්ච කරිත්වා පුත්තමංසානි ඛාදන්තා ද්වෙපිමං[3] කන්තාරාවසෙසං නිත්ථරෙය්‍යාම, මා සබ්බෙව තයො විනස්සිම්හාති. අථ ඛො තෙ භික්ඛවෙ, ද්වෙ ජයම්පතිකා තං එකපුත්තකං පියං මනාපං වධිත්වා වල්ලූරඤ්ච සොණ්ඩිකඤ්ච කරිත්වා පුත්තමංසානි ඛාදන්තා එවං තං[4] කන්තාරාවසෙසං නිත්ථරෙය්‍යුං. තෙ පුත්තමංසානි චෙව ඛාදෙය්‍යුං, උරෙ ච පතිපිංසෙය්‍යුං.[5] 'කහං එකපුත්තක, කහං එකපුත්තකා'ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු තෙ දවාය වා ආහාරං ආහරෙය්‍යුං,[6] මදාය වා ආහාරං ආහරෙය්‍යුං,[6] මණ්ඩනාය වා ආහාරං ආහරෙය්‍යුං,[6] විභූසනාය වා ආහාරං ආහරෙය්‍යුං. නො හෙතම්භන්තෙ. නනු තෙ භික්ඛවෙ, යාවදෙව කන්තාරස්ස නිත්ථරණත්ථාය ආහාරං ආහරෙය්‍යුන්ති? එවම්භන්තෙ. එවමෙව ඛ්වාහං භික්ඛවෙ, කබළීකාරො ආහාරො දට්ඨබ්බොති වදාමි.

කබළීකාරෙ භික්ඛවෙ ආහාරෙ පරිඤ්ඤාතෙ පඤ්චකාමගුණිකො රාගො පරිඤ්ඤාතො හොති. පඤ්චකාමගුණිකෙ රාගෙ පරිඤ්ඤාතෙ නත්ථි තං සඤ්ඤොජනං, යෙන සඤ්ඤොජනෙන සංයුත්තො අරියසාවකො පුන ඉමං ලොකං ආගච්ඡෙය්‍ය.

කථඤ්ච භික්ඛවෙ, ඵස්සාහාරො දට්ඨබ්බො? සෙය්‍යථාපි භික්ඛවෙ, ගාවී නිච්චම්මා කුඩ්ඩඤ්චෙ නිස්සාය තිට්ඨෙය්‍ය, යෙ කුඩ්ඩනිස්සිතා පාණා තෙ තං ඛාදෙය්‍යුං. රුක්ඛඤ්චෙ නිස්සාය තිට්ඨෙය්‍ය, යෙ රුක්ඛනිස්සිතා පාණා තෙ තං ඛාදෙය්‍යුං. උදකඤ්චෙ නිස්සාය තිට්ඨෙය්‍ය, යෙ උදකනිස්සිතා පාණා තෙ තං ඛාදෙය්‍යුං. ආකාසඤ්චෙ නිස්සාය තිට්ඨෙය්‍ය, යෙ ආකාසනිස්සිතා පාණා තෙ තං ඛාදෙය්‍යුං. යඤ්ඤදෙව හි සා භික්ඛවෙ ගාවී නිච්චම්මා නිස්සාය තිට්ඨෙය්‍ය, යෙ තන්නිස්සිතා තන්නිස්සිතා පාණා[7] තෙ තං ඛාදෙය්‍යුං. එවමෙව ඛ්වාහං භික්ඛවෙ ඵස්සාහාරො දට්ඨබ්බොති වදාමි

ඵස්සෙ භික්ඛවෙ, ආහාරෙ පරිඤ්ඤාතෙ තිස්සො වෙදනා පරිඤ්ඤාතා හොන්ති. තීසු වෙදනාසු පරිඤ්ඤාතාසු අරියසාවකස්ස නත්ථි කිඤ්චි උත්තරිං[8] කරණීයන්ති වදාමි.

---

1. ජායපතිකා - සයා  2. අනතිණ්ණො -මජසං, අනිතිණ්ණො - PTS
3. ද්වෙපි තං - සයා  4. එවං තං - මජසං, PTS.  5. පටිපිංසෙය්‍යුං - මජසං.
6. ආහාරෙය්‍යුං- මජසං.  7. යෙ තන්නිස්සිතා පාණා -මජසං.  8. උත්තරි මජසං - සයා.

මහණෙනි, කබලීකාර ආහාරය කෙසේ දතයුත්තේ ද යත්: මහණෙනි, යම් සේ අඹුසැමි දෙදෙනෙක් මඳ වූ මාර්ගෝපකරණයක් ගෙණ කතරමගට පිළිපන්නාහු ද, ඔවුන්ට ප්‍රිය මනාප වූ එක් පුතෙක් වන්නේ ය. මහණෙනි, එකල්හි කතරමගට පිළිපන් ඒ දෙමහල්ලන්ගේ මඳ වූ යම් මාර්ගෝපකරණයෙක් වී නම් එය ගෙවීමට නිමාවට යන්නේ ය. ඔවුන් විසින් තරණය නොකරණ ලද කතරමංශේෂයෙක් ද වන්නේ ය. මහණෙනි, එකල්හි ඒ දෙමහල්ලන්ට මෙබඳු අදහසෙක් වන්නේ ය 'අපගේ මඳ වූ යම් මහවියදමෙක් වී නම් එය ගෙවුනේ ය. අවසන් වූයේ ය. තරණය නො කරණ ලද ඉතිරි වූ මේ කතරමගෙක් ද ඇත. අපි ප්‍රිය මනාප වූ මේ එකම පුතු නසා සතම්සුත් කටුමසුත් වෙන් කොට පුතුමස් කමින් අපි දෙදෙන ම ඉතිරි කතරමග එතර කරන්නමෝ නම් යෙහෙකි. (එකල්හි) අපි සියලු තිදෙන ම නො වැනසෙන්නමෝ' යි. මහණෙනි, ඉක්බිති ඒ දෙමහල්ලෝ ප්‍රියමනාප වූ ඒ එක් පුතු නසා සතම්සුත් කටුම්සුත් වෙන් කොට පුතුමස් කමින් මෙසේ ඒ ඉතිරි කතරමග තරණය කරන්නාහ. ඔහු පුතුමස් ද කන්නාහු ය. එක ම පුත කොහි ද? 'එක ම පුත කොහි ද'යි ළෙහි ද පහර දෙන්නාහු ය

මහණෙනි, ඒ කිමැයි හඟිහු ද? ඔහු ක්‍රීඩා පිණිස හෝ ආහාර ගන්නාහු ද? මදය පිණිස හෝ ආහාර ගන්නාහු ද? අලඞ්කාරය පිණිස හෝ ආහාර ගන්නාහු ද? සැරසීම පිණිස හෝ ආහාර ගන්නාහු ද? වහන්ස, මේ නො-වේ ම ය. මහණෙනි, ඔහු කතරමග තරණය කිරීම පිණිස ම ආහාර ගන්නාහු නො වෙද්ද? වහන්ස, එසේ ය. මහණෙනි, කබලීකාර ආහාරය මෙසේ ම දතයුතු යයි මම කියමි.

මහණෙනි, කබලීකාර ආහාරය පිරිසිඳ දත් කල්හි පඤ්චකාමගුණික රාගය පිරිසිඳ දන්නේ වෙයි. පඤ්චකාම ගුණිකරාගය පිරිසිඳ දත් කල්හි යම් සංයෝජනයකින් යුක්ත වූ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ නැවත මෙලොවට එන්නේ නම් ඒ සංයෝජනය නැත්තේ ය.

මහණෙනි, ස්පර්ශාහාරය කෙසේ දතයුත්තේ ද යත්: මහණෙනි, යම්සේ උදුලසම් ඇති දෙනක් ඉදින් භිත්තියක් ඇසුරු කොට සිටින්නී නම් භිත්තිය ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙද්ද, ඔහු ඇය කන්නාහු ය ඉදින් රුකක් ඇසුරු කොට සිටින්නී නම් රුක ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙද්ද, ඔහු ඇය කන්නාහු ය. ඉදින් ජලයක් ඇසුරු කොට සිටින්නී නම් ජලය ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙද්ද, ඔහු ඇය කන්නාහු ය. ඉදින් අහස ඇසුරු කොට සිටින්නී නම් අහස ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙද්ද, ඔහු ඇය කන්නාහු ය. මහණෙනි, උදුලසම් ඇති ඒ දෙන යමක් යමක් ම ඇසුරු කොට සිටින්නී නම් ඒ ඇසුරු කළ ඒ ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙද්ද, ඔහු ඇය කන්නාහු ය. මහණෙනි, ස්පර්ශාහාරය මෙසෙයින් ම දතයුත්තේ යයි මම කියමි.

මහණෙනි, ස්පර්ශාහාරය පරිඥත කල්හි වේදනාත්‍රය පරිඥත වේ. වේදනාත්‍රය පරිඥත කල්හි ආර්‍ය්‍යශ්‍රාවකයාහට මත්තෙහි කටයුතු කිසිවක් නැතැයි කියමි.

කථඤ්ච භික්ඛවෙ, මනොසඤ්චෙතනාහාරො දට්ඨබ්බො? සෙය්‍යථාපි භික්ඛවෙ, අඞ්ගාරකාසු සාධිකපොරිසා පුණ්ණා අඞ්ගාරානං වීතච්චිකානං වීතධූමානං. අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටික්කූලො.[1] තමෙනං ද්වෙ බලවන්තො පුරිසා නානාබාහාසු ගහෙත්වා තං අඞ්ගාරකාසුං උපකඩ්ඪෙය්‍යුං. අථ ඛො භික්ඛවෙ තස්ස පුරිසස්ස ආරකාවස්ස චෙතනා ආරකා පත්ථනා ආරකා පණිධි. තං කිස්ස හෙතු: විදිතං හි[2] භික්ඛවෙ, තස්ස පුරිසස්ස හොති: ඉමඤ්චාහං අඞ්ගාරකාසුං පපතිස්සාමි, තතොනිදානං මරණං වා නිගච්ඡාමි, මරණමත්තං වා දුක්ඛන්ති. එවමෙව ඛ්වාහං භික්ඛවෙ මනොසඤ්චෙතනාහාරො දට්ඨබ්බොති වදාමි.

මනොසඤ්චෙතනාය භික්ඛවෙ, ආහාරෙ පරිඤ්ඤාතෙ තිස්සො තණ්හා පරිඤ්ඤාතා හොන්ති. තීසු තණ්හාසු පරිඤ්ඤාතාසු අරියසාවකස්ස නත්ථි කිඤ්චි උත්තරිං කරණීයන්ති වදාමි.

කථඤ්ච භික්ඛවෙ, විඤ්ඤාණාහාරො දට්ඨබ්බො? සෙය්‍යථාපි භික්ඛවෙ චොරං ආගුචාරිං ගහෙත්වා රඤ්ඤො දස්සෙය්‍යුං, අයං තෙ දෙව චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහීති. තමෙනං රාජා එවං වදෙය්‍ය: ගච්ඡථ, භො, ඉමං පුරිසං පුබ්බණ්හසමයං සත්තිසතෙන හනථාති. තමෙනං පුබ්බණ්හසමයං සත්තිසතෙන හනෙය්‍යුං. අථ රාජා මජ්ඣන්තිකං සමයං එවං වදෙය්‍ය: අම්භො කථං සො පුරිසොති. තථෙව දෙව ජීවතීති. තමෙනං රාජා එවං වදෙය්‍ය: ගච්ඡථ භො, තං පුරිසං මජ්ඣන්තිකසමයං සත්තිසතෙන හනථාති. තමෙනං මජ්ඣන්තිකසමයං සත්තිසතෙන හනෙය්‍යුං. අථ රාජා සායන්හසමයං එවං වදෙය්‍ය: අම්භො කථං සො පුරිසොති. තථෙව දෙව ජීවතීති. තමෙනං රාජා එවං වදෙය්‍ය: ගච්ඡථ භො තං පුරිසං සායන්හසමයං සත්තිසතෙන හනථාති. තමෙනං සායන්හසමයං සත්තිසතෙන හනෙය්‍යුං. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො දිවසං තීහි සත්තිසතෙහි හඤ්ඤමානො තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයෙථාති.[3] එකිස්සාපි භික්ඛවෙ, සත්තියා හඤ්ඤමානො තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයෙථ. කො පන වාදො තීහි සත්තිසතෙහි හඤ්ඤමානොති. එවමෙව ඛ්වාහං භික්ඛවෙ, විඤ්ඤාණාහාරො දට්ඨබ්බොති වදාමි.

විඤ්ඤාණෙ භික්ඛවෙ, ආහාරෙ පරිඤ්ඤාතෙ නාමරූපං පරිඤ්ඤාතං හොති. නාමරූපෙ පරිඤ්ඤාතෙ අරියසාවකස්ස නත්ථි කිඤ්චි උත්තරිං කරණීයන්ති වදාමීති

1. දුක්ඛප්පටිකූලො - මජසං. 2. එවං හි - මජසං, PTS
3. පටිසංවෙදියෙථ - සීමු, මජසං, PTS. සී 1, 2

මහණෙනි, මනෝසඤ්චේතනාහාරය කෙසේ දත යුත්තේ ද යත්: මහණෙනි, යම්සේ පුරුෂප්‍රමාණයට අධික වූ පහ වූ ගිනිසිළු ඇති, පහ වූ දුම් ඇති, අඟුරෙන් පිරුණු අඟුරුවළක් වේ ද, එකල්හි ජීවත්වනු කැමැති නොමැරෙනු කැමැති සුව කැමැති දුකට පිළිකුල් කරණ පුරුෂයෙක් එන්නේ ය. බලවත් පුරුෂයෝ දෙදෙනෙක් ඒ මොහු වෙත වෙත අතින් ගෙණ ඒ අඟුරුවළ කරා අදනාහු ය. මහණෙනි, එකල්හි ඒ පුරුෂයාගේ සිතිවිල්ල. දුර ම වන්නේ ය. පැතුම දුර ම වන්නේ ය. අපේක්‍ෂාව දුර ම වන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, "මම මේ අඟුරුවළට වැටෙන්නෙම් නම් ඒ හේතුවෙන් මරණයට හෝ මරණය පමණ දුකට හෝ පැමිණෙන්නෙමි"යි ඒ පුරුෂයා විසින් දන්නා ලද්දේ ම වෙයි. එහෙයිනි. මහණෙනි, මනෝ-සඤ්චේතනාහාරය මෙසේ ම දතයුත්තේ ය යි මම කියමි.

මහණෙනි, මනෝසඤ්චේතනාහාරය පරිඥාත කල්හි තෘෂ්ණාත්‍රය පරිඥාත වේ තෘෂ්ණාත්‍රය පරිඥාත කල්හි ආර්‍ය්‍යශ්‍රාවකයාට මත්තෙහි කටයුතු කිසිවක් නැතැ යි කියමි.

මහණෙනි, විඥානාහාරය කෙසේ දතයුත්තේ ද යත්: මහණෙනි, යම්සේ වරදකරු වූ සොරකු ගෙණ "දේවයන් වහන්ස, මේ ඔබට වරද කරණ සොරෙකි. යමක් කැමැත්තෙහි නම් ඒ දඬුවම මොහුට පණවනු මැනැවැ" යි රජහට දක්වන්නාහු ද, රජ තෙමේ ඒ මොහුට "පින්වත්නි., යවු, පෙරවරු අඩයටි සියයකින් මේ පුරුෂයා පෙළවු"යි මෙසේ කියන්-නේ ය. පෙරවරු අඩයටි සියයකින් ඒ මොහු පෙළන්නාහු ය. - ඉක්බිති රජ තෙමේ මද්දහනෙහි 'එම්බල, ඒ පුරුෂ තෙමේ කෙසේ දැ' යි මෙසේ කියන්නේ ය. 'දේවයන් වහන්ස, එසේ ම ජීවත් වේ' යයි. රජ තෙමේ, ඒ මොහුට පින්වත්නි, යවු, මද්දහනෙහි අඩයටි සියයකින් ඒ පුරුෂයා පෙළවු ය යි මෙසේ කියන්නේ ය. ඒ මොහු මද්දහනෙහි අඩයටි සියයකින් පෙළන්නාහු ය. ඉක්බිති රජ තෙමේ සවස්හි එම්බල, ඒ පුරුෂ තෙමේ කෙසේ දැ' යි මෙසේ කියන්නේ ය. 'දේවයන් වහන්ස, එසේ ම වේ' ය යි. රජ තෙමේ, ඒ මොහුට එම්බල, පින්වත්නි, යවු, සවස්හි ඒ පුරුෂයා අඩයටි සියයකින් පෙළවු ය යි මෙසේ කියන්නේ ය. ඒ මොහු සවස්හි අඩයටි සියයකින් පෙළන්නාහු ය. මහණෙනි, ඒ කිමැ යි හඟිහු ද? ඒ පුරුෂ තෙමේ දවල් කාලයෙහි අඩයටි තුන්සියයකින් පෙළනු ලබන්නේ ඒ හේතුවෙන් දුකක් දොම්නසක් විඳින්නේ ද? යත්: මහණෙනි, එක් අඩයටියකිනුදු පෙළනු ලබන්නේ ඒ හේතු කොට දුකක් දොම්නසක් විඳින්නේ ය. අඩයටි තුන්සියයකින් පෙළනු ලබන්නේ කියනු ම කවරේ ද? මහණෙනි, විඥානාහාරය මෙසේ ම දතයුත්තේ ය යි මම කියමි.

මහණෙනි, විඥානාහාරය පරිඥාත කල්හි නාමරූප පරිඥාත වේ. නාමරූප පරිඥාත කල්හි ආර්‍ය්‍යශ්‍රාවකයාට මත්තෙහි කටයුතු කිසිවක් නැතැ යි කියමි.

## 1. 7. 4

## අත්ථිරාගසුත්තං

64. **සාවත්ථියං-**

චත්තාරොමෙ භික්ඛවෙ, ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය. කතමෙ චත්තාරො? කබලීකාරො[1] ආහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො අහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය.

කබලීකාරෙ චෙ භික්ඛවෙ, ආහාරෙ අත්ථි රාගො අත්ථි නන්දි අත්ථි තණ්හා. පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං. යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළ්හං අත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති. යත්ථ අත්ථි නාමරූපස්ස අවක්කන්ති, අත්ථි තත්ථ සංඛාරානං වුද්ධි. යත්ථ අත්ථි සංඛාරානං වුද්ධි, අත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, අත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං. යත්ථ අත්ථි ආයතිං ජාතිජරාමරණං, සසොකං තං භික්ඛවෙ සදරං[2] සඋපායාසන්ති වදාමි.

ඵස්සෙ චෙ භික්ඛවෙ, ආහාරෙ -පෙ- මනොසඤ්චෙතනාය චෙ භික්ඛවෙ ආහාරෙ -පෙ- විඤ්ඤාණෙ චෙ භික්ඛවෙ, ආහාරෙ අත්ථි රාගො අත්ථි නන්දි අත්ථි තණ්හා. පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං. යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළ්හං, අත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති. යත්ථ අත්ථි නාමරූපස්ස අවක්කන්ති, අත්ථි තත්ථ සංඛාරානං වුද්ධි. යත්ථ අත්ථි සංඛාරානං වුද්ධි, අත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. අත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං, යත්ථ අත්ථි ආයතිං ජාතිජරාමරණං, සසොකං තං භික්ඛවෙ සදරං සඋපායාසන්ති වදාමි.

සෙය්‍යථාපි භික්ඛවෙ, රජකො වා චිත්තකාරො[3] වා සති රජනාය වා ලාඛාය වා හලිද්දියා වා නීලියා වා මඤ්ජිට්ඨාය[4] වා සුමට්ඨෙ වා[5] ඵලකෙ වා භිත්තියා වා දුස්සපටෙ[6] වා ඉත්ථිරූපං වා පුරිසරූපං වා අභිනිම්මිණෙය්‍ය සබ්බඞ්ගපච්චඞ්ගං. එවමෙව ඛො භික්ඛවෙ, කබලීකාරෙ චෙ ආහාරෙ අත්ථි රාගො අත්ථි නන්දි අත්ථි තණ්හා: පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං. යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළ්හං, අත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති. යත්ථ අත්ථි නාමරූපස්ස අවක්කන්ති, අත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි. යත්ථ අත්ථි සඞ්ඛාරානං වුද්ධි, අත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, අත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං. යත්ථ අත්ථි ආයතිං ජාතිජරාමරණං සසොකං තං භික්ඛවෙ සදරං සඋපායාසන්ති වදාමි.

---

1 කබලිඞ්කාරෙ - සිමු, PTS. 2. සරජං - සිමු, සයා. 3. චිත්තකාරකො - මජසං සයා.
4. මඤ්ජෙට්ඨෙ - සිමු. මඤ්ජෙට්ඨාය - PTS 5. සුපරිමට්ඨෙ වා - මජසං.;
6: දුස්සපට්ටෙ - මජසං, PTS

## 1. 7. 4

## අත්ථිරාගසූත්‍රය.

64. සැවැත්නුවර-

මහණෙනි, උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස හා ඉපදීම අපේක්‍ෂා කරණ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිස ද මේ ආහාර සතරෙකි. කවර සතරෙක් ද? යත්: ඖදාරික වූ හෝ සූක්‍ෂ්ම වූ හෝ කබලීකාර ආහාර ය, දෙවෙනි වූ ඵස්සාහාර ය, තෙවෙනි වූ මනෝසඤ්චේතනාහාර ය, සිවුවැනි වූ විඤ්ඤාණාහාර ය යි. මහණෙනි, උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසත් ඉපදීම අපේක්‍ෂා කරණ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසත් මේ ආහාර සතර වේ.

මහණෙනි, ඉදින් කබලීකාර ආහාරයෙහි රාගය ඇත්තේ නම් ඇල්ම ඇත්තේ නම් එහි තෘෂ්ණාව ඇත්තේ නම් විඤ්ඤාණය පිහිටියේ ද වැඩුනේ ද වේ. යම් තැනෙක විඤ්ඤාණය පිහිටියේ ද, වැඩුනේ ද, එහි නාමරූපයාගේ බැස ගැන්ම ඇත්තේ ය. යම් තැනෙක නාමරූපයාගේ බැස ගැන්ම ඇත්තේ ද, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේ ය. යම් තැනෙක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේ ද, එහි මතු නැවත භවගැණීම ඇත්තේ ය යම් තැනෙක මතු නැවත භවගැණීම ඇත්තේ ද, එහි මතු ජාතිජරාමරණ ඇත්තේ ය. යම් තැනෙක මතු ජාතිජරාමරණ ඇත්තේ ද, මහණෙනි, එය ශෝකසහිත ය. (කෙලෙස්) පීඩාසහිත ය. දුක් ආයාසසහිත ය යි කියමි.

මහණෙනි, ඉදින් ස්පර්ශාහාරයෙහි ... මහණෙනි, ඉදින් මනෝසඤ්චේතනාහාරයෙහි ... මහණෙනි, ඉදින් විඤ්ඤාණාහාරයෙහි රාගය ඇත්තේ නම් ඇල්ම ඇත්තේ නම් තණ්හාව ඇත්තේ නම් එහි විඤ්ඤාණය පිහිටියේ ද වැඩුනේ ද වෙයි. යම් තැනෙක විඤ්ඤාණය පිහිටියේත් වැඩුනේත් වේ ද, එහි නාමරූපයේ බැස ගැන්ම ඇත්තේ ය. යම් තැනෙක නාමරූපයේ බැස ගැන්ම ඇත්තේ ද, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේ ය. යම් තැනෙක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේ ද, එහි මතු නැවත ඉපදීම ඇත්තේ ය. යම් තැනෙක මතු නැවත ඉපදීම ඇත්තේ ද, එහි මතු ජාතිජරාමරණ ඇත්තේ ය. යම් තැනෙක මතු ජාතිජරාමරණ ඇත්තේ ද, මහණෙනි, එය ශෝකසහිත ය. පීඩාසහිත ය. දුක් ආයාස සහිත ය යි කියමි.

මහණෙනි, යම්සේ රදයෙක් හෝ සිත්තරෙක් හෝ රදන් හෝ ලාකඩ හෝ කහපාට හෝ නිල්පාට හෝ මදටියපාට හෝ ඇති කල්හි මැනවින් මට වූ පුවරුවෙක හෝ බිතෙක හෝ රෙදිපටෙක හෝ සියලු අඟපසඟ ඇති ඉතිරි රුවක් හෝ පුරුෂ රුවක් හෝ මවන්නේ ද, මහණෙනි, එසෙයින් ම ඉදින් කබලීකාර ආහාරයෙහි රාගය ඇත්තේ නම් ඇල්ම ඇත්තේ නම් තණ්හාව ඇත්තේ නම් එහි විඤ්ඤාණය පිහිටියේ ද වැඩුනේ ද වේ. යම් තැනෙක විඤ්ඤාණය පිහිටියේත් වැඩුනේත් වේ නම් එහි නාමරූපයේ බැස ගැන්ම ඇත්තේ ය. යම් තැනෙක නාමරූපයේ බැස ගැන්ම ඇත්තේ නම් එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේ ය. යම් තැනෙක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේ නම් එහි මතු නැවත ඉපදීම ඇත්තේ ය. යම් තැනෙක මතු නැවත ඉපදීම ඇත්තේ නම් එහි මතු ජාතිජරාමරණ ඇත්තේ ය. යම් තැනෙක මතු ජාතිජරාමරණ ඇත්තේ නම් මහණෙනි, එය ශෝක සහිත ය. පීඩා සහිත ය. දුක් ආයාස සහිත ය යි කියමි.

එසෙසු වෙ භික්ඛවෙ, ආහාරෙ -පෙ- මනොසඤ්චෙතනාය වෙ භික්ඛවෙ ආහාරෙ -පෙ- විඤ්ඤාණෙ වෙ භික්ඛවෙ ආහාරෙ අත්ථි රාගො අත්ථි නන්දි අත්ථි තණ්හා, පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං, යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළ්හං අත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති. යත්ථ අත්ථි නාමරූපස්ස අවක්කන්ති, අත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි. යත්ථ අත්ථි සඞ්ඛාරානං වුද්ධි, අත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, අත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං. යත්ථ අත්ථි ආයතිං ජාතිජරාමරණං, සසොකං තං භික්ඛවෙ සදරං සඋපායාසන්ති වදාමි.

කබලීකාරෙ වෙ භික්ඛවෙ ආහාරෙ නත්ථි රාගො නත්ථි නන්දි නත්ථි තණ්හා. අප්පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං අවිරූළ්හං යත්ථ අප්පතිට්ඨිතං විඤ්ඤාණං අවිරූළ්හං, නත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති. යත්ථ නත්ථි නාමරූපස්ස අවක්කන්ති, නත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි. යත්ථ නත්ථි සඞ්ඛාරානං වුද්ධි, නත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ නත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, නත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං. යත්ථ නත්ථි ආයතිං ජාතිජරාමරණං, අසොකං තං භික්ඛවෙ අදරං අනුපායාසන්ති වදාමි.

එසෙසු වෙ භික්ඛවෙ ආහාරෙ -පෙ- [අනුපායාසන්ති] වදාමි. මනොසඤ්චෙතනාය වෙ භික්ඛවෙ ආහාරෙ -පෙ- [අනුපායාසන්ති] වදාමි. විඤ්ඤාණෙ වෙ භික්ඛවෙ ආහාරෙ නත්ථි රාගො නත්ථි නන්දි නත්ථි තණ්හා, අප්පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං අවිරූළ්හං, යත්ථ අප්පතිට්ඨිතං විඤ්ඤාණං අවිරූළ්හං, නත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති. යත්ථ නත්ථි නාමරූපස්ස අවක්කන්ති, නත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි. යත්ථ නත්ථි සඞ්ඛාරානං වුද්ධි, නත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ නත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, නත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං. යත්ථ නත්ථි ආයතිං ජාතිජරාමරණං, අසොකං තං භික්ඛවෙ අදරං අනුපායාසන්ති වදාමි.

සෙය්‍යථාපි භික්ඛවෙ, කූටාගාරං වා කූටාගාරසාලා වා උත්තරාය වා දක්ඛිණාය වා පාචීනාය වා වාතපානා[1] සූරියෙ උග්ගච්ඡන්තෙ වාතපානෙන රස්මි පවිසිත්වා ක්වාස්ස පතිට්ඨිතාති. පච්ඡිමාය භිත්තියං. පච්ඡිමා වෙ භික්ඛවෙ, භිත්ති නාස්ස, ක්වාස්ස පතිට්ඨිතාති? පඨවියං භන්තෙති පඨවි වෙ භික්ඛවෙ, නාස්ස, ක්වාස්ස පතිට්ඨිතාති? ආපස්මිං භන්තෙති ආපො වෙ භික්ඛවෙ, නාස්ස ක්වාස්ස, පතිට්ඨිතාති? අප්පතිට්ඨිතා භන්තෙති.

එවමෙව ඛො භික්ඛවෙ, කබලීකාරෙ වෙ ආහාරෙ නත්ථි රාගො නත්ථි නන්දි නත්ථි තණ්හා -පෙ- [අනුපායාසන්ති] වදාමි. එසෙසු වෙ භික්ඛවෙ ආහාරෙ -පෙ- [අනුපායාසන්ති] වදාමි. මනොසඤ්චෙතනාය වෙ භික්ඛවෙ ආහාරෙ -පෙ- [අනුපායාසන්ති] වදාමි.

---
1. පාචීනවාතපානා - සීමු, සතා.

මහණෙනි, ඉදින් ඵස්සාහාරයෙහි ... මහණෙනි, ඉදින් මනෝසඤ්චේතනාහාරයෙහි ... මහණෙනි, ඉදින් විඤ්ඤාණාහාරයෙහි රාගය ඇත්තේ නම් ඇල්ම ඇත්තේ නම් තණ්හාව ඇත්තේ නම් එහි විඤ්ඤාණය පිහිටියේ ද වැඩුනේ ද වෙයි. යම් තැනෙක විඤ්ඤාණය පිහිටියේත් වැඩුනේත් වේ නම් එහි නාමරූපයේ බැස ගැන්ම ඇත්තේ ය. යම් තැනෙක නාමරූපයේ බැස ගැන්ම ඇත්තේ නම් එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේ ය. යම් තැනෙක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේ නම් එහි මතු නැවත ඉපදීම ඇත්තේ ය. යම් තැනෙක මතු නැවත ඉපදීම ඇත්තේ ද, එහි මතු ජාතිජරාමරණ ඇත්තේ ය. යම් තැනෙක මතු ජාතිජරාමරණ ඇත්තේ ද, මහණෙනි, එය ශෝක සහිත ය. පීඩා සහිත ය. දුඃඛ ආයාස සහිත ය යි කියමි.

මහණෙනි, ඉදින් කබලීකාර ආහාරයෙහි රාගය නැත්තේ නම් ඇල්ම නැත්තේ නම් තණ්හාව නැත්තේ නම් එහි විඤ්ඤාණය නො පිහිටියේ ද නො වැඩුනේ ද වේ. යම් තැනෙක විඤ්ඤාණය නො පිටිහියේත් නො වැඩුනේත් වේ නම් එහි නාමරූපයේ බැස ගැන්ම නැත්තේ ය. යම් තැනෙක නාමරූපයේ බැස ගැන්ම නැත්තේ නම් එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේ ය. යම් තැනෙක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේ නම් එහි මතු නැවත ඉපදීම නැත්තේ ය. යම් තැනෙක මතු නැවත ඉපදීම නැත්තේ ද, එහි මතු ජාතිජරාමරණ නැත්තේ ය. යම් තැනෙක මතු ජාතිජරාමරණ නැත්තේ නම් මහණෙනි, එය ශෝක රහිත ය. පීඩා රහිත ය. දුඃඛ ආයාස රහිත ය යි කියමි.

මහණෙනි, ඉදින් ඵස්සාහාරයෙහි [දුඃඛ ආයාස රහිත ය යි] කියමි. මහණෙනි, ඉදින් මනෝසඤ්චේතනාහාරයෙහි [දුඃඛ ආයාස රහිත ය යි] කියමි. මහණෙනි, ඉදින් විඤ්ඤාණාහාරයෙහි රාගය නැත්තේ නම් ඇල්ම නැත්තේ නම් තණ්හාව නැත්තේ නම් එහි විඤ්ඤාණය නො පිහිටියේ ද නො වැඩුනේ ද වෙයි. යම් තැනෙක විඤ්ඤාණය නො පිහිටියේත් නො වැඩුනේත් වේ නම් එහි නාමරූපයේ බැස ගැන්ම නැත්තේ ය. යම් තැනෙක නාමරූපයේ බැස ගැන්ම නැත්තේ නම් එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේ ය. යම් තැනෙක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේ නම් එහි මතු නැවත ඉපදීම නැත්තේ ය. යම් තැනෙක මතු නැවත ඉපදීම නැත්තේ නම් එහි මතු ජාතිජරාමරණ නැත්තේ ය. යම් තැනෙක මතු ජාතිජරාමරණ නැත්තේ නම් මහණෙනි, එය ශෝක රහිත ය පීඩා රහිත ය. දුඃඛ ආයාස රහිත ය යි කියමි.

මහණෙනි, යම් සේ කුළුගෙයක් හෝ කුළුගේහලක් හෝ වේ ද, එහි උතුරුදිග හෝ දකුණුදිග හෝ පෙරදිග හෝ වාකවුළු වෙද්ද, හිරු නගින කල්හි වාකවුළුවෙන් රැස් පිවිස කොහි පිහිටියේ වන්නේ ද? වහන්ස, බටහිර බිතෙහි ය. මහණෙනි, බටහිරබිත නො වන්නේ නම් කොහි පිහිටියේ වන්නේ ද? වහන්ස, පොළොවෙහි ය මහණෙනි, ඉදින් පොළොව නොවන්නේ නම් කොහි පිහිටියේ වන්නේ ද? වහන්ස, දියෙහි ය. මහණෙනි, ඉදින් දිය නො වන්නේ නම් කොහි පිහිටියේ වන්නේ ද? වහන්ස, නො පිහිටියේ ය.

මහණෙනි, එසෙයින් ම ඉදින් කබලීකාර ආහාරයෙහි රාගය නැත්තේ නම් ඇල්ම නැත්තේ නම් තෘෂ්ණාව නැත්තේ නම්...'[දුඃඛ ආයාස රහිත ය යි] කියමි. මහණෙනි, ඉදින් ස්පර්ශාහාරයෙහි ... [දුඃඛ ආයාස රහිත ය යි] කියමි. මහණෙනි, ඉදින් මනෝසඤ්චේතනාහාරයෙහි ... [දුඃඛ ආයාස රහිත ය යි] කියමි.

විඤ්ඤාණෙ චෙ භික්ඛවෙ, ආහාරෙ නත්ථි රාගො නත්ථි නන්දී නත්ථි තණ්හා අප්පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං අවිරූළ්හං. යත්ථ අප්පතිට්ඨිතං විඤ්ඤාණං අවිරූළ්හං, නත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති. යත්ථ නත්ථි නාමරූපස්ස අවක්කන්ති, නත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි. යත්ථ නත්ථි සඞ්ඛාරානං වුද්ධි, නත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ නත්ථි ආයතිං පුනබ්භවාභි-නිබ්බත්ති, නත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං. යත්ථ නත්ථි ආයතිං ජාතිජරා-මරණං, අසොකං තං භික්ඛවෙ අදරං අනුපායාසන්ති වදාමීති.

## 1. 7. 5

## නගරසුත්තං

65. සාවත්ථියං-

පුබ්බෙව මෙ[1] භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: "කිච්ඡං[2] වතායං ලොකො ආපන්නො ජායති ච ජීයති ච මීයති ච චවති ච උපපජ්ජති ච[3]. අථ ච පනිමස්ස දුක්ඛස්ස නිස්සරණං න පජානාති ජරාමරණස්ස. කුදාස්සු නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සා"ති. තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "කිම්හි නු ඛො සති ජරාමරණං හොති, කිංපච්චයා ජරාමරණන්ති." තස්ස මය්හං භික්ඛවෙ, යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො "ජාතියා ඛො සති ජරාමරණං හොති. ජාතිපච්චයා ජරාමරණ"න්ති.

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "කිම්හි නු ඛො සති ජාති හොති -පෙ- භවො හොති -පෙ- උපාදානං හොති -පෙ- තණ්හා හොති -පෙ- වෙදනා හොති -පෙ- ඵස්සො හොති -පෙ- සළායතනං හොති -පෙ- කිම්හි නු ඛො සති නාමරූපං හොති, කිම්පච්චයා නාමරූප"න්ති. තස්ස මය්හං භික්ඛවෙ, යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "විඤ්ඤාණෙ ඛො සති නාමරූපං හොති. විඤ්ඤාණපච්චයා නාමරූප"න්ති.

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "කිම්හි නු ඛො සති විඤ්ඤාණං හොති, කිම්පච්චයා විඤ්ඤාණ"න්ති. තස්ස මය්හං භික්ඛවෙ, යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "නාමරූපෙ ඛො සති විඤ්ඤාණං හොති, නාමරූප-පච්චයා විඤ්ඤාණ"න්ති.

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "පච්චුදාවත්තති ඛො ඉදං විඤ්ඤාණං, නාමරූපම්හා න පරං[4] ගච්ඡති. එත්තාවතා ජායෙථ වා ජීයෙථ වා මීයෙථ වා චවෙථ වා උපපජ්ජෙථ වා යදිදං නාමරූපපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ-පච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතී"ති. -

1. පුබ්බ මෙ - මජ්සං. 2 කිච්ඡා - මජ්සං. 3. උපපජ්ජති ච - සීමු.
4 නාපරං - සීමු, PTS.

මහණෙනි, ඉදින් විඥානාහාරයෙහි රාගය නැත්තේ නම් ඇල්ම නැත්තේ නම් තෘෂ්ණාව නැත්තේ නම් එහි විඥානය නො පිහිටියේ නො වැඩුනේ වේ. යම් තැනෙක විඥානය නො පිහිටියේ නො වැඩුනේ වේ නම් එහි නාමරූපයාගේ බැස ගැන්ම නැත්තේ ය. යම් තැනෙක නාමරූපයාගේ බැස ගැන්ම නැත්තේ නම් එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේ ය. යම් තැනෙක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේ නම් එහි මතු නැවත ඉපදීම නැත්තේ ය. යම් තැනෙක මතු නැවත ඉපදීම නැත්තේ නම් එහි මතු ජාතිජරාමරණ නැත්තේ ය. යම් තැනෙක මතු ජාතිජරා-මරණ නැත්තේ නම් මහණෙනි, එය ශෝක රහිත ය. පීඩා රහිත ය. දුක් ආයාස රහිත ය යි කියමි යි.

## 1 7 5

## නගර සූත්‍රය.

65 සැවැත්නුවර-

මහණෙනි, සම්බෝධියෙන් පෙර බුදු නො වූ බෝසත් වූම මට මේ සිත විය: "මේ ලෝකයා ඒකාන්තයෙන් දුකට පැමිණියේ ය. උපදී. දිරයි. මියෙයි. ච්‍යුත ද වෙයි. (අන් භවයකට ද) පැමිණෙයි. එහෙත් මේ ජරාමරණ දුක දුරලීම නො දනී. කවදා නම් මේ ජරාමරණදුකේ දුරලීම පෙණෙන්නේ ද" යි. මහණෙනි, ඒ මට "කුමක් ඇති කල්හි ජරාමරණ වේ ද, කවර ප්‍රත්‍යයකින් ජරාමරණ වේ ද"යි. මේ සිත පහළ විය. මහණෙනි, ඒ මට නුවණින් මෙනෙහි කිරීමෙන් "ජාතිය ඇති කල්හි ජරාමරණ වෙයි. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වේ ය"යි ප්‍රඥායෙන් අවබෝධ විය.

මහණෙනි, ඒ මට "කුමක් ඇති කල්හි ජාතිය වේ ද .... භවය වේ ද ... උපාදාන වේ ද .. තෘෂ්ණාව වේ ද .... වේදනාව වේ ද ... ස්පර්ශය වේ ද ... සළායතන වේ ද .. කුමක් ඇති කල්හි නාමරූප වේ ද කවර ප්‍රත්‍යයකින් නාමරූප වේ ද" යි. මේ සිත පහළ විය. මහණෙනි, ඒ මට නුවණින් මෙනෙහි කිරීමෙන් "විඥානය ඇති කල්හි නාමරූප වෙයි. විඥානප්‍රත්‍යයෙන් නාමරූප වේ ය" යි ප්‍රඥායෙන් අවබෝධ විය.

මහණෙනි, ඒ මට "කුමක් ඇති කල්හි විඥානය වේ ද, කවර ප්‍රත්‍යයකින් විඥානය වේ ද"යි. මේ සිත විය. මහණෙනි, ඒ මට නුවණින් මෙනෙහි කිරීමෙන් "නාමරූප ඇති කල්හි විඥානය වෙයි. නාමරූප ප්‍රත්‍යයෙන් විඥානය වේ ය" යි ප්‍රඥායෙන් අවබෝධ විය.

මහණෙනි, ඒ මට "මේ විඥානය වූ කලී එහි නවතියි. නාමරූප දෙකෙන් ඔබ්බට නො යේ. මේ ක්‍රමයෙන් උපදින්නේ හෝ වෙයි. දිරන්නේ හෝ වෙයි. මියෙන්නේ හෝ වෙයි. ච්‍යුත වන්නේ හෝ වෙයි. (අන් භවයකට) පැමිණෙන්නේ හෝ වෙයි. එනම්: නාමරූපප්‍රත්‍යයෙන් විඥානය වේ. විඥානප්‍රත්‍යයෙන් නාමරූප වේ. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතන වේ. ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ. ... මෙසේ මේ හුදු දුක්රැසේ හට ගැණීම වේ" යි මේ සිත පහළ වි ය.

"සමුදයො සමුදයො"ති ඛො මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "කිම්හි නු ඛො අසති ජරාමරණං න හොති, කිස්ස නිරොධා ජරාමරණනිරොධො"ති. තස්ස මය්හං භික්ඛවෙ, යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "ජාතියා ඛො අසති ජරාමරණං න හොති, ජාතිනිරොධා ජරාමරණනිරොධො"ති.

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි "කිම්හි නු ඛො අසති ජාති න හොති -පෙ- භවො න හොති -පෙ- උපාදානං න හොති -පෙ- තණ්හා න හොති -පෙ- වෙදනා න හොති -පෙ- ඵස්සො න හොති -පෙ- සළායතනං න හොති -පෙ- නාමරූපං න හොති, කිස්ස නිරොධා නාමරූපනිරොධො"ති? තස්ස මය්හං භික්ඛවෙ, යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "විඤ්ඤාණෙ ඛො අසති නාමරූපං න හොති. විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො"ති.

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "කිම්හි නු ඛො අසති විඤ්ඤාණං න හොති, කිස්ස නිරොධා විඤ්ඤාණනිරොධො"ති තස්ස මය්හං භික්ඛවෙ, යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "නාමරූපෙ ඛො අසති විඤ්ඤාණං න හොති, නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො"ති.

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "අධිගතො ඛො ම්‍යායං මග්ගො බොධාය යදිදං නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො නාමරූපනිරොධා සළායතනනිරොධො සළායතන-නිරොධා ඵස්සනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති

"නිරොධො නිරොධො"ති ඛො මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො අරඤ්ඤෙ පවනෙ චරමානො පස්සෙය්‍ය පුරාණං මග්ගං පුරාණඤ්ජසං පුබ්බකෙහි මනුස්සෙහි අනුයාතං. සො තමනුගච්ඡෙය්‍ය, තමනුගච්ඡන්තො පස්සෙය්‍ය පුරාණං නගරං, පුරාණං රාජධානිං පුබ්බකෙහි මනුස්සෙහි අජ්ඣාවුත්ථං[1] ආරාමසම්පන්නං වනසම්පන්නං පොක්ඛරණීසම්පන්නං උද්ධාපං[2] රමණීයං. අථ ඛො සො භික්ඛවෙ, පුරිසො රඤ්ඤො වා රාජමහාමත්තස්ස වා ආරොචෙය්‍ය: "යග්ඝෙ භන්තෙ, ජානෙය්‍යාසි අහං අද්දසං අරඤ්ඤෙ පවනෙ චරමානො පුරාණං මග්ගං පුරාණඤ්ජසං පුබ්බකෙහි මනුස්සෙහි අනුයාතං. තමනුගච්ඡිං. තමනුගච්ඡන්තො අද්දසං පුරාණං නගරං, පුරාණං රාජධානිං පුබ්බකෙහි මනුස්සෙහි අජ්ඣාවුත්ථං ආරාමසම්පන්නං වනසම්පන්නං පොක්ඛරණීසම්පන්නං උද්ධාපං[2] රමණීයං. තං භන්තෙ නගරං මාපෙහී"ති.

1. අජ්ඣාවුට්ඨං -මජසං. 2. උද්ධාපවන්තං -මජසං, සභා, PTS, සී 1, 2.

මහණෙනි, "සමුදය සමුදය" යි පෙර නො ඇසූ විරූ දහම්හි මට නුවණැස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

මහණෙනි, ඒ මට "කුමක් නැති කල්හි ජරාමරණ නො වේ ද, කුමක් නිරුද්ධ වීමෙන් ජරාමරණනිරෝධය වේ දැ"යි. මේ සිත විය. මහණෙනි, ඒ මට නුවණින් මෙනෙහි කිරීමෙන් 'ජාතිය නැති කල්හි ජරාමරණ නො වේ. ජාතිනිරෝධයෙන් ජරාමරණනිරෝධය වේ ය" යි ප්‍රඥයෙන් අවබෝධ විය.

මහණෙනි, ඒ මට "කුමක් නැති කල්හි ජාතිය නො වේ ද ... භවය නො වේ ද ... උපාදාන නො වේ ද ... තණ්හාව නො වේ ද ... වේදනාව නො වේ ද ... ස්පර්ශය නො වේ ද ... ෂඩායතන නො වේ ද ... නාමරූප නො වේ ද ... කුමක නිරොධයෙන් නාමරූප නිරොධය වේ දැ" යි. මේ සිත විය. මහණෙනි, ඒ මට නුවණින් මෙනෙහි කිරීමෙන් "විඤ්ඤාණය නැති කල්හි නාමරූප නො වේ. විඤ්ඤාණනිරොධයෙන් නාමරූපනිරොධය වේ ය" යි ප්‍රඥයෙන් අවබෝධ විය.

මහණෙනි, ඒ මට "කුමක් නැති කල්හි විඤ්ඤාණය නො වේ ද, කුමක නිරෝධයෙන් විඤ්ඤාණනිරෝධය වේ දැ" යි. මේ සිත විය. මහණෙනි, ඒ මට නුවණින් මෙනෙහි කිරීමෙන් 'නාමරූප නැති කල්හි විඤ්ඤාණය නො වේ. නාමරූපනිරෝධයෙන් විඤ්ඤාණනිරෝධය වේ ය" යි ප්‍රඥයෙන් අවබෝධ විය.

මහණෙනි, ඒ මට "නාමරූපනිරෝධයෙන් විඤ්ඤාණනිරෝධය වේ. විඤ්ඤාණනිරෝධයෙන් නාමරූපනිරෝධය වේ. නාමරූපනිරෝධයෙන් සළායතනනිරෝධය වේ. සළායතනනිරෝධයෙන් ඵස්සනිරෝධය වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ ය" යි මේ යමෙක් වේ ද, සම්බෝධිය පිණිස වූ මේ මාර්ගය මා විසින් අවබෝධ කරණ ලද්දේ ම ය යි මේ සිත පහළ විය.

මහණෙනි, "නිරෝධය නිරෝධය" යි පෙර නො ඇසූ විරූ දහම්හි මට නුවණැස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

මහණෙනි, යම් සේ පුරුෂයෙක් අරණෙහි මහවෙනෙහි හැසිරෙන්නේ පෙර වුසූ මිනිසුන් විසින් අනුගමනය කරණ ලද පැරණි මඟක්, පැරණි මාවතක් දක්නේ ද, හෙතෙමේ එය අනු ව යන්නේ ය. එය අනු ව යන්නේ පෙර මිනිසුන් වුසූ මල් උයනින් යුත්, වන උයනින් යුත්, පොකුණින් යුත් පවුරු ඇති සිත්කලු වූ පැරණි නුවරක්, පැරණි රාජධානියක් දක්නේ ය. මහණෙනි, ඉක්බිති ඒ පුරිස් තෙමේ රජුට හෝ රජමහඇමතිහට හෝ "පින්වත් හිමියනි, දන්නෙහි ය. මම අරණෙහි මහවෙනෙහි හැසිරෙන්නෙම් පෙර වුසූ මිනිසුන් විසින් අනුගමනය කරණ ලද පැරණි මඟක් පැරණි මාවතක් දුටිමි. එය අනුගමනය කෙළෙමි. එය අනුගමනය කරන්නෙම් පෙර මිනිසුන් වුසූ, මල් උයනින් යුත් වන උයනින් යුත් පොකුණින් යුත්, පවුරු සහිත වූ සිත්කලු පැරණි නුවරක් පැරණි රාජධානියක් දුටිමි. හිමියනි, එය නගරයක් කරණු මැනවැ" යි සැළ කරන්නේ ය.

අථ ඛො, භික්ඛවෙ, රාජා වා රාජමහාමත්තො වා තං නගරං මාපෙය්‍ය, තදස්ස නගරං අපරෙන සමයෙන ඉද්ධඤ්චෙව ඵීතඤ්ච බාහුජඤ්ඤං[1] ආකිණ්ණමනුස්සං වුද්ධිං වෙපුල්ලප්පත්තං. එවමෙව ඛ්වාහං භික්ඛවෙ අද්දසං පුරාණං මග්ගං පුරාණඤ්ජසං පුබ්බකෙහි සම්මාසම්බුද්ධෙහි අනුයාතං.

කතමො ච සො, භික්ඛවෙ, පුරාණමග්ගො පුරාණඤ්ජසො පුබ්බකෙහි සම්මාසම්බුද්ධෙහි අනුයාතො? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො සො භික්ඛවෙ පුරාණමග්ගො පුරාණඤ්ජසො පුබ්බකෙහි සම්මාසම්බුද්ධෙහි අනුයාතො.

තමනුගච්ඡිං, තමනුගච්ඡන්තො ජරාමරණං අබ්භඤ්ඤාසිං, ජරාමරණසමුදයං අබ්භඤ්ඤාසිං, ජරාමරණනිරොධං අබ්භඤ්ඤාසිං, ජරාමරණනිරොධගාමිනීපටිපදං අබ්භඤ්ඤාසිං. තමනුගච්ඡිං, තමනුගච්ඡන්තො ජාතිං අබ්භඤ්ඤාසිං -පෙ- භවං අබ්භඤ්ඤාසිං -පෙ- උපාදානං අබ්භඤ්ඤාසිං -පෙ- තණ්හං අබ්භඤ්ඤාසිං -පෙ- වෙදනං අබ්භඤ්ඤාසිං -පෙ- ඵස්සං අබ්භඤ්ඤාසිං -පෙ- සළායතනං අබ්භඤ්ඤාසිං -පෙ- නාමරූපං අබ්භඤ්ඤාසිං -පෙ- විඤ්ඤාණං අබ්භඤ්ඤාසිං -පෙ- විඤ්ඤාණනිරොධගාමිනීපටිපදං අබ්භඤ්ඤාසිං, තමනුගච්ඡිං. තමනුගච්ඡන්තො සඞ්ඛාරෙ අබ්භඤ්ඤාසිං, සඞ්ඛාරසමුදයං අබ්භඤ්ඤාසිං, සඞ්ඛාරනිරොධං අබ්භඤ්ඤාසිං, සඞ්ඛාරනිරොධගාමිනීපටිපදං අබ්භඤ්ඤාසිං.

තදභිඤ්ඤා ආචික්ඛිං භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං. තයිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං[1] පුථුභූතං යාවදෙව මනුස්සෙහි සුප්පකාසිතන්ති.

## 1. 7. 6.

### සම්මසනසුත්තං*

66. එවං මෙ සුතං: එකං සමයං භගවා **කුරූසු** විහරති **කම්මාසදම්මං** නාම කුරූනං නිගමො. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සම්මසථ නො තුම්හෙ භික්ඛවෙ අන්තරා සම්මසනන්ති?[2] එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: අහං ඛො භන්තෙ, සම්මසාමි අන්තරා සම්මසනන්ති. යථා කථං පන ත්වං භික්ඛු සම්මසසි අන්තරා සම්මසනන්ති? අථ ඛො සො භික්ඛු ව්‍යාකාසි. යථා සො භික්ඛු ව්‍යාකාසි, න සො භික්ඛු භගවතො චිත්තං ආරාධෙසි.

1. බහුජනං - PTS., බහුජඤ්ඤං - සයා.
* සම්මස සුත්තං - මජසං. 2. අන්තරං සම්මසන්ති - මජසං., PTS.

මහණෙනි, ඉක්බිති රජ හෝ රජමහඇමති හෝ එය නගරයක් කරන්නේ ය. ඒ නුවර පසුකලෙක සමෘද්ධ වූයේ ද, සියලු සම්පතින් පිරුණේ ද, බොහෝ දෙනා විසින් දත යුතු වූයේ නොහොත් බොහෝ දෙනාට හිත වූයේ ද, මිනිසුන් විසින් ගැවසී ගත්තේ ද, වැඩීමට විපුලබවට පැමිණියේ ද වන්නේ ය. මහණෙනි, එසෙයින් ම මම පෙර වුසූ සම්මා-සම්බුදුවරයන් විසින් අනුගමනය කරණ ලද පැරණි මග, පැරණි මාවත දුටිමි.

මහණෙනි, පෙර වුසූ සම්මාසම්බුදුවරයන් විසින් අනුගමනය කරණ ලද පැරණි මග, පැරණි මාවත කවරේ ද යත්: මේ අරිඅටගි මග ම ය. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි, ඒ මේ පැරණි මග, පැරණි මාවත පෙර වුසූ සම්මාසම්බුදුවරයන් විසින් අනුගමනය කරණ ලද්දේ ය.

(මම) එය අනුගමනය කෙළෙමි. එය අනුගමනය කරණුයෙම් ජරාමරණ දැන ගත්තෙමි. ජරාමරණ සමුදය දැන ගත්තෙමි. ජරාමරණනිරොධය දැන ගත්තෙමි. ජරාමරණ නිරෝධගාමිනී පටිපදාව දැන ගත්තෙමි. එය අනුගමනය කෙළෙමි. එය අනුගමනය කරණුයෙම් ජාතිය දැන ගත්තෙමි භවය දැන ගත්තෙමි ... උපාදාන දැන ගත්තෙමි ... තණ්හාව දැන ගත්තෙමි වේදනාව දැන ගත්තෙමි ... ඵස්සය දැන ගත්තෙමි ... සළායතන දැන ගත්තෙමි ... නාමරූප දැන ගත්තෙමි ... විඤ්ඤාණය දැන ගත්තෙමි ... විඤ්ඤාණනිරෝධගාමිනී පටිපදාව දැනගත්තෙමි. එය අනුගමනය කෙළෙමි. එය අනුගමනය කරණුයෙම් සඞ්ඛාර දැන ගත්තෙමි. සඞ්ඛාරසමුදය දැන ගත්තෙමි. සඞ්ඛාරනිරොධය දැන ගත්තෙමි. සඞ්ඛාර-නිරොධගාමිනී පටිපදාව දැන ගත්තෙමි.

එය මැනවින් දැන ගෙණ මහණුන්ට ද මෙහෙණින්ට ද උවසුන්ට ද උවැසියන්ට ද ප්‍රකාශ කෙළෙමි. මහණෙනි, ඒ මේ බඹසර සමෘද්ධ වූයේ ද, සියල්ලෙන් පිරුණේ ද පැතුරුණේ ද, බොහෝ දෙනා විසින් දත යුතු වූයේ ද, හැම අයුරින් පුළුල් බවට පැමිණියේ ද, ඇති තාක් නුවණැති මිනිසුන් විසින් ප්‍රකාශ කරණ ලද්දේ ද වේ යි.

## 1. 7. 6.

### සම්මසනසූත්‍රය.

66. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ කුරු දනව්වෙහි කල්මාසදම්‍ය නම් කුරුන්ගේ නියම්ගම්හි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "පින්වතුන් වහන්සැ" යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, තෙපි අභ්‍යන්තරප්‍රත්‍යය සම්මර්ශනය කරන්නහු ද යි මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, මම අභ්‍යන්තරප්‍රත්‍යය සම්මර්ශනය කෙරෙමි" යි මෙය සැල කෙළේ ය. මහණ, තෙපි ඒ කෙසේ නම් අභ්‍යන්තරප්‍රත්‍යය සම්මර්ශනය කරවූ දැ යි. එකල්හි ඒ මහණ තෙමේ ප්‍රකාශ කෙළේ ය. යම් සේ ඒ මහණ පැවසී ද, ඒ මහණ තොමේ භාග්‍යවතුන් වහන්සේගේ සිත සතුටු නො කෙළේ ය.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා අන්තරා සම්මසනං භාසෙය්‍ය, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී"ති. තෙනහානන්ද සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මසමානො සම්මසති අන්තරා සම්මසනං. යං ඛො ඉදං අනෙකවිධං නානප්පකාරකං දුක්ඛං ලොකෙ උප්පජ්ජති ජරාමරණං ඉදං නු ඛො[1] දුක්ඛං කින්නිදානං කිංසමුදයං කිඤ්ජාතිකං කිම්පභවං, කිස්මිං සති ජරාමරණං හොති, කිස්මිං අසති ජරාමරණං න හොතීති. සො සම්මසමානො එවං පජානාති: යං ඛො ඉදං අනෙකවිධං නානප්පකාරකං දුක්ඛං ලොකෙ උප්පජ්ජති ජරාමරණං, ඉදං ඛො දුක්ඛං උපධිනිදානං උපධිසමුදයං උපධිජාතිකං උපධිපභවං, උපධිස්මිං සති ජරාමරණං හොති, උපධිස්මිං අසති ජරාමරණං න හොතීති. සො ජරාමරණඤ්ච පජානාති, ජරාමරණසමුදයඤ්ච පජානාති, ජරාමරණනිරොධඤ්ච පජානාති. යා ච ජරාමරණනිරොධසාරුප්පගාමිනී පටිපදා, තඤ්ච පජානාති. තථා පටිපන්නො ච හොති අනුධම්මචාරී. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය පටිපන්නො ජරාමරණනිරොධාය.

අථාපරං සම්මසමානො සම්මසති අන්තරා සම්මසනං. උපධි පනායං කින්නිදානො කිංසමුදයො කිඤ්ජාතිකො කිම්පභවො, කිස්මිං සති උපධි හොති, කිස්මිං අසති උපධි න හොතීති. සො සම්මසමානො එවං පජානාති උපධි තණ්හානිදානො තණ්හාසමුදයො තණ්හාජාතිකො තණ්හාපභවො, තණ්හාය සති උපධි හොති, තණ්හාය අසති උපධි න හොතීති. සො උපධිඤ්ච පජානාති, උපධිසමුදයඤ්ච පජානාති, උපධිනිරොධඤ්ච පජානාති, යා ච උපධිනිරොධසාරුප්පගාමිනී පටිපදා, තඤ්ච පජානාති. තථා පටිපන්නො ච හොති අනුධම්මචාරී. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය පටිපන්නො උපධිනිරොධාය.

අථාපරං සම්මසමානො සම්මසති අන්තරා සම්මසනං, තණ්හා පනායං කත්ථ උප්පජ්ජමානා උප්පජ්ජති, කත්ථ නිවිසමානා නිවිසතීති. සො සම්මසමානො එවං පජානාති:[2] යං ඛො කිඤ්චි ලොකෙ[3] පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං? චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

---

1. ඉදං ඛො - මජසං, PTS. 2. ජානාති - මජසං, සහා.
3. යං ඛො ලොකෙ - මජසං, සහා.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ: "භාග්‍යවතුන් වහන්සේ යම් අභ්‍යන්තරප්‍රත්‍යය සම්මර්ශනයක් වදාරණ සේක් නම්: භාග්‍යවතුන් වහන්ස, මේ ඊට කාලය යි. සුගතයන් වහන්ස, මේ ඊට කාලය යි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහ" යි. ආනන්ද, එසේ නම් අසව්, මැනවින් මෙනෙහි කරව්. කියන්නෙමි යි. වහන්ස, එසේ ය යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, මෙහි මහණ තෙමේ සම්මර්ශනය කරන්නේ නන් වැදෑරුම් වූ නන් අයුරු වූ යම් ඒ ජරාමරණ දුකෙක් ලොව උපදී ද, මේ දුක කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් හටගැණීම් කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද, කුමක් ඇති කල්හි ජරාමරණ වේ ද. කුමක් නැති කල්හි ජරාමරණ නො වේ දැ යි අභ්‍යන්තර ප්‍රත්‍යය සම්මර්ශනය කෙරෙයි. හෙතෙමේ සම්මර්ශනය කරන්නේ නන් වැදෑරුම් වූ නන් අයුරු වූ යම් මේ ජරාමරණ දුකෙක් ලොව උපදී ද, මේ දුක උපධි නිදාන කොට ඇත්තේ ය. උපධි සමුදය කොට ඇත්තේ ය. උපධි ජාති කොට ඇත්තේ ය. උපධි ප්‍රභව කොට ඇත්තේ ය උපධි ඇති කල්හි ජරාමරණ වෙයි. උපධි නැති කල්හි ජරාමරණ නො වේ ය යි මෙසේ දැන ගණී. හෙතෙමේ ජරාමරණත් දැන ගණී. ජරාමරණ සමුදයත් දැන ගණී. ජරාමරණනිරෝධයත් දැන ගණී. ජරාමරණ නිරෝධයට සරූප ව යනසුලු යම් ප්‍රතිපදාවක් වේ නම් එයත් දැන ගණී එසේ පිළිපන්නේ දහම් අනු ව හැසිරෙණ සුලු වූයේ ද වේ. මහණෙනි, මේ මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් මැනැවින් දුක් ගෙවීම පිණිස ජරාමරණ නිරොධය පිණිස පිළිපන්නේ ය යි කියනු ලැබේ.

යලි මතු ද සම්මර්ශනය කරන්නේ මේ උපධිය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදයය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද, කුමක් ඇති කල්හි උපධි වේ ද කුමක් නැති කල්හි උපධි නො වේ දැ යි අභ්‍යන්තරප්‍රත්‍යය සම්මර්ශනය කෙරෙයි. හෙතෙමේ සම්මර්ශනය කරන්නේ 'උපධිය තෘෂ්ණාව නිදාන කොට ඇත්තේ ය. තෘෂ්ණාව සමුදය කොට ඇත්තේ ය. තෘෂ්ණාව ජාති කොට ඇත්තේ ය. තෘෂ්ණාව ප්‍රභව කොට ඇත්තේ ය. තෘෂ්ණාව ඇති කල්හි උපධි වෙයි. තෘෂ්ණාව නැති කල්හි උපධි නො වේයයි මෙසේ දැන ගණී. හෙ තෙමේ උපධියත් දැන ගණී. උපධිසමුදයයත් දැන ගණී උපධිනිරොධයත් දැන ගණී. උපධිනිරොධයට සරූප ව යනසුලු යම් පිළිවෙතෙක් වේ නම් එයත් දැන ගණී. එසේ පිළිපන්නේ දහම් අනු ව හැසිරෙන්නේ ද වේ. මහණෙනි, මේ මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් මැනවින් දුක් ගෙවීම පිණිස උපධිනිරොධය පිණිස පිළිපන්නේ ය යි කියනු ලැබේ

යලි මතු ද සම්මර්ශනය කරන්නේ මේ තෘෂ්ණාව කොහි උපදනේ උපදී ද, කොහි පවත්නේ පවතී දැ යි. අභ්‍යන්තරප්‍රත්‍යය සම්මර්ශනය කෙරෙයි හෙතෙමේ සම්මර්ශනය කරන්නේ 'ලොව පියසැහැවි ඇති මිහිරිසැහැවි ඇති යම් කිසිවෙක් වේ ද, මෙහි මේ තෘෂ්ණාව උපදනේ උපදී. මෙහි පුනපුනා පැවතුම් විසින් පිහිටනුයේ පිහිටයි. ලොව කිමෙක් පියසැහැවි ඇත්තේ ද, මිහිරිසැහැවි ඇත්තේ ද? ලොව ඇස පියසැහැවි ඇත්තෙකි. මිහිරිසැහැවි ඇත්තෙකි. මෙහි මේ තෘෂ්ණාව උපදනේ උපදී. මෙහි පිහිටනුයේ පිහිටයි

සොතං ලොකෙ පියරූපං සාතරූපං -පෙ- ඝානං ලොකෙ පියරූපං සාතරූපං -පෙ- ජිව්හා ලොකෙ පියරූපං සාතරූපං -පෙ- කායො ලොකෙ පියරූපං සාතරූපං -පෙ- මනො ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

යෙ හි කෙ චි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං නිච්චතො අද්දක්ඛුං, සුඛතො අද්දක්ඛුං, අත්තතො අද්දක්ඛුං, ආරොග්‍යතො අද්දක්ඛුං, ඛෙමතො අද්දක්ඛුං, තෙ තණ්හං වඩ්ඪෙසුං. යෙ තණ්හං වඩ්ඪෙසුං, තෙ උපධිං වඩ්ඪෙසුං. යෙ උපධිං වඩ්ඪෙසුං, තෙ දුක්ඛං වඩ්ඪෙසුං. යෙ දුක්ඛං වඩ්ඪෙසුං, තෙ න පරිමුච්චිංසු ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, න පරිමුච්චිංසු දුක්ඛස්මාති වදාමි.

යෙපි හි කෙ චි[1] භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං නිච්චතො දක්ඛින්ති[2], සුඛතො දක්ඛින්ති. අත්තතො දක්ඛින්ති; ආරොග්‍යතො දක්ඛින්ති, ඛෙමතො දක්ඛින්ති, තෙ තණ්හං වඩ්ඪෙස්සන්ති.[3] යෙ තණ්හං වඩ්ඪෙස්සන්ති, තෙ දුක්ඛං වඩ්ඪෙස්සන්ති. යෙ දුක්ඛං වඩ්ඪෙස්සන්ති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. න පරිමුච්චිස්සන්ති දුක්ඛස්මාති වදාමි.

යෙපි හි කෙචි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහ්මණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං නිච්චතො පස්සන්ති, සුඛතො පස්සන්ති, අත්තතො පස්සන්ති, ආරොග්‍යතො පස්සන්ති, ඛෙමතො පස්සන්ති, තෙ තණ්හං වඩ්ඪෙන්ති, යෙ තණ්හං වඩ්ඪෙන්ති, තෙ උපධිං වඩ්ඪෙන්ති. යෙ උපධිං වඩ්ඪෙන්ති, තෙ දුක්ඛං වඩ්ඪෙන්ති. යෙ දුක්ඛං වඩ්ඪෙන්ති, තෙ න පරිමුච්චන්ති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. න පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි.

සෙය්‍යථාපි භික්ඛවෙ, ආපානීයකංසො[4] වණ්ණසම්පන්නො ගන්ධසම්පන්නො රසසම්පන්නො, සො ච ඛො විසෙන සංසට්ඨො. අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො. තමෙනං එවං වදෙය්‍යුං: "අයං තෙ අම්භො පුරිස, ආපානීයකංසො වණ්ණසම්පන්නො ගන්ධසම්පන්නො රසසම්පන්නො, සො ච ඛො විසෙන සංසට්ඨො, සචෙ ආකඞ්ඛසි පිව.[5] පිවතො හි ඛො තං ඡාදිස්සති[6] වණ්ණෙනපි ගන්ධෙනපි රසෙනපි. පිත්වා[7] ච පන තතොනිදානං මරණං වා නිගච්ඡසි මරණමත්තං වා දුක්ඛ"න්ති. සො තං පානීයකංසං සහසා අප්පටිසඞ්ඛා පිවෙය්‍ය, න පටිනිස්සජ්ජෙය්‍ය සො තතොනිදානං මරණං වා නිගච්ඡෙය්‍ය, මරණමත්තං වා දුක්ඛං.

1. යෙ හි කෙ චි - සීමු. 2 දක්ඛිස්සන්ති - මජසං සයා. 3. වඩ්ඪිස්සන්ති - මජසං
4. ආපානියකංසො - සයා, PTS 5. පිවසි - සීමු, පිබෙය්‍යාසි - සී 2.
6. ඡාදෙස්සති, සීමු, මජසං. 7 පිවිත්වා - සීමු. මජසං, සයා, සී 2.

ලෙව්හි කණ පියසැහැවි ඇත්තෙකි. මිහිරිසැහැවි ඇත්තෙකි .... ලොව නැහැය පියසැහැවි ඇත්තෙකි. මිහිරිසැහැවි ඇත්තෙකි .... ලොව දිව පිය සැහැවි ඇත්තෙකි. මිහිරිසැහැවි ඇත්තෙකි. ... ලොව කය පියසැහැවි ඇත්තෙකි. මිහිරිසැහැවි ඇත්තෙකි. ... ලොව සිත පියසැහැවි ඇත්තෙකි. මිහිරිසැහැවි ඇත්තෙකි. මෙහි මේ තෘෂ්ණාව උපදනේ උපදී. මෙහි පිහිටනුයේ පිහිටයි.

මහණෙනි, අතීතකාලයෙහි යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් පියසැහැවි මිහිරිසැහැවි ඇත්තේ නම් එය නිත්‍යවශයෙන් දුක්කාහු ද, සුඛවශයෙන් දුක්කාහු ද, ආත්ම වශයෙන් දුක්කාහු ද, නීරොගභාව වශයෙන් දුක්කාහු ද, නිර්භයවශයෙන් දුක්කාහු ද, ඔහු තෘෂ්ණාව වැඩූහ. යම් කෙනෙක් තෘෂ්ණාව වැඩූහු ද ඔහු උපධි (=පඤ්චස්කන්ධය) වැඩූහ. යම් කෙනෙක් උපධි වැඩූහු ද, ඔහු දුක වැඩූහ. යම් කෙනෙක් දුක වැඩූහු ද, ඔහු ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් පරිදේවයෙන් දුකඛයෙන් දෞමනස්සයෙන් උපායාසයෙන් නො මිදුනහ. (සියලු) දුකෙන් නො මිදුනහ යි කියමි.

මහණෙනි, අනාගතකාලයෙහි යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් පියසැහැවි මිහිරිසැහැවි ඇත්තේ නම් එය නිත්‍ය වශයෙන් දක්නාහු ද, සුඛ වශයෙන් දක්නාහු ද, ආත්ම වශයෙන් දක්නාහු ද, ආරොග්‍ය වශයෙන් දක්නාහු ද, නිර්භය වශයෙන් දක්නාහු ද, ඔහු තෘෂ්ණාව වඩන්නාහු ය. යම් කෙනෙක් තෘෂ්ණාව වඩන්නාහු ද, ඔහු උපධි වඩන්නාහු ය. යම් කෙනෙක් උපධි වඩන්නාහු ද, ඔහු දුක වඩන්නාහු ය. යම් කෙනෙක් දුක වඩන්නාහු ද, ඔහු ජාතියෙන් ජරාමරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් දුකඛයෙන් දෞමනස්සයෙන් උපායාසයෙන් නො මිදෙන්නාහු ය. සියලු දුකෙන් නො මිදෙන්නාහු ය යි කියමි!

මහණෙනි, දැනුදු යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් සැයැහැවි මිහිරිසැහැවි ඇත්තේ නම් එය නිත්‍ය වශයෙන් දකිත් ද, සුඛ වශයෙන් දකිත් ද, ආත්ම වශයෙන් දකිත් ද, ආරෝග්‍ය වශයෙන් දකිත් ද, ක්ෂේම වශයෙන් දකිත් ද, ඔහු තෘෂ්ණාව වඩත්. යම් කෙනෙක් තෘෂ්ණාව වඩද්ද, ඔහු උපධි වඩත්. යම් කෙනෙක් උපධි වඩද්ද, ඔහු දුක වඩත්. යම් කෙනෙක් දුක වඩද්ද, ඔහු ජාතියෙන් ජරමරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් දුකඛයෙන් දෞමනස්සයෙන් උපායාසයෙන් නො මිදෙත්. සියලු දුකෙන් නො මිදෙති යි කියමි.

මහණෙනි, යම් සේ පැහැයෙන් යුත් සුවඳින් යුත් රසවත් වූ ඔබමෙක් වේ ද, හෙ ද විසෙන් මුසු වූයේ ය. එකල්හි ගිමෙන් නැවුනු ගිමෙන් පෙළුනු කලානත වූ හටගත් පවස් ඇති බොනු කැමැති වූ පුරුෂයෙක් එන්නේ ය. ඒ මොහුට මෙසේ කියන්නාහු ය: එම්බල පුරුෂය, තොපගේ මේ ඔබම (රා බඳුන) වර්ණවත් ය, සුවඳවත් ය, රසවත් ය, හෙ ද විසෙන් මුසු ය. ඉදින් කැමැත්තෙහි නම් බොව්. බොන්නහුට එය පැහැයෙන් ද සුවඳින් ද රසයෙන් ද රුස්නේ ය. එහෙත් බී ඒ හේතුවෙන් මරණයට හෝ මරණය පමණ දුකට හෝ පැමිණෙහී ය. හෙතෙමේ ඒ ඔබම වහා නො විමසා බොන්නේ ය. නො බැහැර ලන්නේ ය. හෙතෙමේ ඒ හේතුවෙන් මරණයට හෝ මරණය පමණ දුකට හෝ පැමිණෙන්නේ ය.

එවමෙව ඛො භික්ඛවෙ, යෙ හි කෙ චි අතීතමද්ධානං සමණා වා බ්‍රාහමණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං නිච්චතො අද්දක්ඛුං, සුඛතො අද්දක්ඛුං, අත්තතො අද්දක්ඛුං, ආරොග්‍යතො අද්දක්ඛුං, ඛෙමතො අද්දක්ඛුං. තෙ තණ්හං වඩ්ඪෙසුං. යෙ තණ්හං -පෙ- යෙ දුක්ඛං වඩ්ඪෙසුං. තෙ න පරිමුච්චිංසු ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. න පරිමුච්චිංසු දුක්ඛස්මාති වදාමි.

යෙ හි කෙ චි භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහමණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං නිච්චතො දක්ඛින්ති, සුඛතො -පෙ- අත්තතො -පෙ- ආරොග්‍යතො -පෙ- ඛෙමතො දක්ඛින්ති, තෙ තණ්හං වඩ්ඪෙස්සන්ති. යෙ තණ්හං -පෙ- යෙ දුක්ඛං වඩ්ඪෙස්සන්ති. තෙ -පෙ- න පරිමුච්චිස්සන්ති දුක්ඛස්මාති වදාමි.

යෙ හි කෙ චි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහමණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං නිච්චතො පස්සන්ති, සුඛතො පස්සන්ති, අත්තතො පස්සන්ති, ආරොග්‍යතො පස්සන්ති, ඛෙමතො පස්සන්ති. තෙ තණ්හං වඩ්ඪෙන්ති. යෙ තණ්හං [වඩ්ඪෙන්ති.] -පෙ- තෙ න පරිමුච්චන්ති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. න පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි.

යෙ ච ඛො කෙ චි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහමණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං අනිච්චතො අද්දක්ඛුං, දුක්ඛතො අද්දක්ඛුං, අනත්තතො අද්දක්ඛුං, රොගතො අද්දක්ඛුං, භයතො අද්දක්ඛුං. තෙ තණ්හං පජහිංසු. යෙ තණ්හං පජහිංසු, තෙ උපධිං පජහිංසු. යෙ උපධිං පජහිංසු, තෙ දුක්ඛං පජහිංසු. යෙ දුක්ඛං පජහිංසු, තෙ පරිමුච්චිංසු ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චිංසු දුක්ඛස්මාති වදාමි.

යෙපි හි කෙ චි භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහමණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං අනිච්චතො දක්ඛින්ති, දුක්ඛතො දක්ඛින්ති, අනත්තතො දක්ඛින්ති, රොගතො දක්ඛින්ති, භයතො දක්ඛින්ති. තෙ තණ්හං පජහිස්සන්ති. යෙ තණ්හං පජහිස්සන්ති, තෙ -පෙ- පරිමුච්චිස්සන්ති[1] දුක්ඛස්මාති වදාමි.

යෙපි හි කෙ චි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහමණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං අනිච්චතො පස්සන්ති, දුක්ඛතො පස්සන්ති, අනත්තතො පස්සන්ති, රොගතො පස්සන්ති, භයතො පස්සන්ති. තෙ තණ්හං පජහන්ති. යෙ තණ්හං පජහන්ති, තෙ උපධිං පජහන්ති. යෙ උපධිං පජහන්ති, තෙ දුක්ඛං පජහන්ති. යෙ දුක්ඛං පජහන්ති, තෙ පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි.

---

1. පරිමුච්චන්ති - සීමු. සතා.

මහණෙනි, එසෙයින් ම අතීතකාලයෙහි යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් ප්‍රියස්වභාව මධුරස්වභාව ඇත්තේ නම් එය නිත්‍යවශයෙන් දුටුහු ද, සුඛ වශයෙන් දුටුහු ද, ආත්ම වශයෙන් දුටුහු ද, ආරෝග්‍ය වශයෙන් දුටුහු ද, ක්‍ෂෙම වශයෙන් දුටුහු ද, ඔහු තෘෂ්ණාව වැඩූහ. යම් කෙනෙක් තෘෂ්ණාව . යම් කෙනෙක් දුක වැඩූහු ද, ඔහු ජාතියෙන් ජරාමරණයෙන් සොකයෙන් පරිදෙවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් නො මිදුනහ. දුකින් නො මිදුනහ යි කියමි.

මහණෙනි, අනාගත කාලයෙහි යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් ප්‍රියස්වභාව මධුරස්වභාව ඇත්තේ නම් එය නිත්‍ය වශයෙන් දක්නාහු ද, සුඛ වශයෙන් ... ආත්ම වශයෙන් ... ආරෝග්‍ය වශයෙන් .. ක්‍ෂෙම වශයෙන් දක්නාහුද, ඔහු තෘෂ්ණාව වඩන්නාහු ය යම් කෙනෙක් තෘෂ්ණාව ... යම් කෙනෙක් දුක වඩන්නාහු ද, ඔහු . . (සියලු) දුකින් නො මිදෙන්නාහ යි කියමි.

මහණෙනි, දැන් යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් පියසැහැවි මිහිරිසැහැවි ඇත්තේ ද, එය නිත්‍ය වශයෙන් දකිද්ද, සුඛ වශයෙන් දකිද්ද, ආත්ම වශයෙන් දකිද්ද, ආරොග්‍ය වශයෙන් දකිද්ද, ක්‍ෂෙම වශයෙන් දකිද්ද, ඔහු තෘෂ්ණාව වඩත්. යම් කෙනෙක් තෘෂ්ණාව [වඩත් ද,] ... ඔහු ජාතියෙන් ජරාමරණයෙන් සොකයෙන් පරිදෙවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් නො මිදෙත්. දුකින් නො මිදෙති යි කියමි.

මහණෙනි, අතීත කාලයෙහි යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් ප්‍රියස්වභාව මධුරස්වභාව ඇත්තේ නම් එය අනිත්‍ය වශයෙන් දුටුහු ද, දුක් වශයෙන් දුටුහු ද, අනාත්ම වශයෙන් දුටුහු ද, රොග වශයෙන් දුටුහු ද, භය වශයෙන් දුටුහු ද, ඔහු තෘෂ්ණාව හළහ. යම් කෙනෙක් තෘෂ්ණාව හළහු ද, ඔහු උපධි හළහ. යම් කෙනෙක් උපධි හළහු ද, ඔහු දුක හළහ. යම් කෙනෙක් දුක හළහු ද, ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් මිදුනහ (සියලු) දුකින් මිදුනහ යි කියමි.

මහණෙනි, අනාගත කාලයෙහිදු යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් ප්‍රියස්වභාව මධුරස්වභාව ඇත්තේ නම් එය අනිත්‍ය වශයෙන් දක්නාහු ද, දුක් වශයෙන් දක්නාහු ද, අනාත්ම වශයෙන් දක්නාහු ද, රෝග වශයෙන් දක්නාහු ද, භය වශයෙන් දක්නාහු ද, ඔහු තෘෂ්ණාව දුරු කරන්නාහ. යම් කෙනෙක් තෘෂ්ණාව දුරු කරන්නාහු ද, ඔහු දුකෙන් මිදෙන්නාහ යි කියමි.

මහණෙනි, දැනුදු යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් පියසැහැවි මිහිරිසැහැවි ඇත්තේ ද, එය අනිත්‍ය වශයෙන් දකිත් ද, දුක් වශයෙන් දකිද් ද, අනාත්ම වශයෙන් දකිත් ද, රෝග වශයෙන් දකිත් ද, භය වශයෙන් දකිත් ද, ඔහු තෘෂ්ණාව දුරු කෙරෙත්. යම් කෙනෙක් තෘෂ්ණාව දුරු කෙරෙත් ද, ඔහු උපධි දුරු කෙරෙත්. යම් කෙනෙක් උපධි දුරු කෙරෙත් ද, ඔහු දුක දුරු කෙරෙත්. යම් කෙනෙක් දුක දුරු කෙරෙත් ද, ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් මිදෙත්. දුකෙන් මිදෙති යි කියමි.

සෙය්‍යථාපි භික්ඛවෙ, ආපානීයකංසො වණ්ණසම්පන්නො ගන්ධසම්පන්නො රසසම්පන්නො, සො ච ඛො විසෙන සංසට්ඨො. අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො. තමෙනං එවං වදෙය්‍යුං: "අයං තෙ අම්භො පුරිස, ආපානීයකංසො වණ්ණසම්පන්නො ගන්ධසම්පන්නො රසසම්පන්නො, සො ච ඛො විසෙන සංසට්ඨො සචෙ ආකඞ්ඛසි පිව, පිවතො හි ඛො තං ඡාදිස්සති වණ්ණෙනපි ගන්ධෙනපි රසෙනපි. පිත්වා ච පන තතොනිදානං මරණං වා නිගච්ඡසි, මරණමත්තං වා දුක්ඛ"න්ති. අථ ඛො භික්ඛවෙ, තස්ස පුරිසස්ස එවමස්ස: "සක්කා ඛො මෙ අයං සුරාපිපාසිතා පානීයෙන වා විනෙතුං, දධිමණ්ඩකෙන වා විනෙතුං, මත්ථලොණිකාය[1] වා විනෙතුං, ලොණසොවීරකෙන වා විනෙතුං. න ත්වෙවාහං තං පිවෙය්‍යං, යං මම අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛායා"ති. සො තං ආපානීයකංසං පටිසඞ්ඛා න පිවෙය්‍ය, පටිනිස්සජ්ජෙය්‍ය. සො තතොනිදානං න මරණං වා නිගච්ඡෙය්‍ය, මරණමත්තං වා දුක්ඛං.

එවමෙව ඛො භික්ඛවෙ, යෙ හි කෙ චි අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං අනිච්චතො අද්දක්ඛුං, දුක්ඛතො අද්දක්ඛුං, අනත්තතො අද්දක්ඛුං, රොගතො අද්දක්ඛුං, භයතො අද්දක්ඛුං. තෙ තණ්හං පජහිංසු. යෙ තණ්හං පජහිංසු. තෙ උපධිං පජහිංසු යෙ උපධිං පජහිංසු, තෙ දුක්ඛං පජහිංසු. යෙ දුක්ඛං පජහිංසු, තෙ පරිමුච්චිංසු ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි පරිමුච්චිංසු දුක්ඛස්මාති වදාමි.

යෙපි හි කෙ චි භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං අනිච්චතො දක්ඛින්ති -පෙ- තෙ පරිමුච්චිස්සන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, පරිමුච්චිස්සන්ති දුක්ඛස්මාති වදාමි.

යෙපි හි කෙචි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහ්මණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං අනිච්චතො පස්සන්ති, දුක්ඛතො පස්සන්ති, අනත්තතො පස්සන්ති, රොගතො පස්සන්ති, භයතො පස්සන්ති තෙ තණ්හං පජහන්ති. යෙ තණ්හං පජහන්ති, තෙ උපධිං පජහන්ති. යෙ උපධිං පජහන්ති, තෙ දුක්ඛං පජහන්ති. යෙ දුක්ඛං පජහන්ති, තෙ පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමීති

1. භට්ඨලොණිකාය - මජසං, මට්ඨලොණිකාය - ස්‍යා, PTS.

මහණෙනි, යම් සේ පැහැයෙන් යුත් සුවඳවත් රසවත් ඔබමෙක් වේ ද, හෙ ද විෂයෙන් මුසු වූයේ ය. එකල්හි ගිමෙන් තැවුනු ගිමෙන් පෙළුනු ක්ලාන්ත වූ හටගත් පවස් ඇති බොනු කැමති පුරුෂයෙක් එන්නේ ය. ඒ මොහුට මෙසේ කියන්නාහු ය: "එම්බල, පුරුෂය, තොපගේ මේ ඔබම වර්ණවත් ය, සුගන්ධවත් ය, රසවත් ය, හෙ ද විසෙන් මුසු ය, ඉදින් කැමැත්තෙහි තම් බොව. බොන්නහුට එය පැහැයෙනුදු සුවඳිනුදු රසිනුදු රුස්නේ ය. පානය කොට (සිටියේ) ඒ හේතුවෙන් මරණයට හෝ මරණය පමණ දුකට හෝ පැමිණෙහි" යි. මහණෙනි, එකල්හි ඒ පුරිසහට මෙසේ අදහස් වන්නේ ය: "මාගේ මේ සුරපවස පැනින් හෝ දුරු කළ හෙයි. දීපෙරලිදියෙන් හෝ දුරු කළ හෙයි. ලුණු සහිත අත්සුණු දියෙන් හෝ දුරු කළ හෙයි. ලුණුකාඩි දියෙන් හෝ දුරු කළ හෙයි. යමෙක් මට දිගුකලක් මුළුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේ නම් එය මම නො ම බොන්නෙමි" යි. හෙතෙමේ ඒ ඔබම විමසා නො බොන්නේ ය, බැහැර ලන්නේ ය. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ මරණයට හෝ මරණය පමණ දුකට හෝ නො පැමිණෙන්නේ ය.

මහණෙනි, එසෙයින් ම අතීත කාලයෙහි යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් ප්‍රියසවභාව මධුරසවභාව ඇත්තේ ද, එය අනිත්‍ය වශයෙන් දුක්කාහු ද, දුක් වශයෙන් දුක්කාහු ද, අනාත්ම වශයෙන් දුක්කාහු ද, රෝග වශයෙන් දුක්කාහු ද, බිය වශයෙන් දුක්කාහු ද, ඔහු තෘෂ්ණාව දුරු කළහ. යම් කෙනෙක් තෘෂ්ණාව දුරු කළාහු ද, ඔහු උපධි දුරු කළහ. යම් කෙනෙක් උපධි දුරු කළාහු ද, ඔහු දුක දුරු කළාහු ය. යම් කෙනෙක් දුක දුරු කළාහු ද, ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් දුකෙන් දොම්නසෙන් උපායාසයෙන් මිදුනාහු ය. දුකෙන් මිදුනාහු ය යි කියමි.

මහණෙනි, අනාගත කාලයෙහි දු යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් පියසැහැවි මිහිරිසැහැවි ඇත්තේ ද එය අනිත්‍ය වශයෙන් දක්නාහු ද .... ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් මිදෙන්නාහු ය. දුකෙන් මිදෙන්නාහු ය යි කියමි.

මහණෙනි, දැනුදු යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලොව යමෙක් ප්‍රියසවභාව මධුර සවභාව ඇත්තේ ද එය අනිත්‍ය වශයෙන් දකිද්ද, දුක් වශයෙන් දකිද්ද, අනාත්ම වශයෙන් දකිද්ද, රෝග වශයෙන් දකිද්ද, භය වශයෙන් දකිද්ද, ඔහු තෘෂ්ණාව දුරු කෙරෙත්. යම් කෙනෙක් තෘෂ්ණාව දුරු කෙරෙද්ද, ඔහු උපධි දුරු කෙරෙත්. යම් කෙනෙක් උපධි දුරු කෙරෙද්ද, ඔහු දුක දුරු කෙරෙත්. යම් කෙනෙක් දුක දුරු කෙරෙද්ද, ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් මිදෙත්. දුකෙන් මිදෙති යි කියමි යි.

## 1. 7. 7.

## නළකලාපසුත්තං

67. එකං සමයං ආයස්මා ච **සාරිපුත්තො** ආයස්මා ච **මහාකොට්ඨිතො** **බාරාණසියං** විහරන්ති **ඉසිපතනෙ මිගදායෙ** අථ ඛො ආයස්මා මහාකොට්ඨිතො සායණ්හසමයං පතිසල්ලාණා වුට්ඨිතො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසංකමි. උපසංකමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි.

එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "කින්නු ඛො ආවුසො සාරිපුත්ත, සයංකතං ජරාමරණං, පරකතං[1] ජරාමරණං, සයංකතඤ්ච පරකතඤ්ච ජරාමරණං, උදහු අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං ජරාමරණ"න්ති?

න ඛො ආවුසො කොට්ඨිත, සයංකතං ජරාමරණං. න පරකතං ජරාමරණං. න සයංකතඤ්ච පරකතඤ්ච ජරාමරණං. නාපි අසයංකාරං. අපරංකාරං අධිච්ච සමුප්පන්නං ජරාමරණං. අපි ච ජාතිපච්චයා ජරාමරණන්ති.

කින්නු ඛො ආවුසො සාරිපුත්ත, සයංකතා ජාති, පරකතා[1] ජාති, සයංකතා ච පරකතා ච ජාති, උදහු අසයංකාරා[2] අපරංකාරා[2] අධිච්චසමුප්පන්නා ජාතීති?

න ඛො ආවුසො කොට්ඨිත. සයංකතා ජාති. න පරකතා ජාති, න සයංකතා ච පරකතා ච ජාති. නාපි අසයංකාරා[2] අපරංකාරා[2] අධිච්චසමුප්පන්නා ජාති. අපි ච භවපච්චයා ජාතීති.

කින්නු ඛො ආවුසො සාරිපුත්ත, සයංකතො භවො, පරකතො භවො, සයංකතො ච පරකතො ච භවො, උදහු අසයංකාරො අපරංකාරො අධිච්චසමුප්පන්නො භවොති ?

න ඛො ආවුසො කොට්ඨිත, සයංකතො භවො න පරකතො භවො. න සයංකතො ච පරකතො ච භවො. නාපි අසයංකාරො අපරංකාරො අධිච්චසමුප්පන්නො භවො අපි ච උපාදානපච්චයා භවොති.

1 පරංකතං - මජසං, PTS. 2. කාරං - ස[illegible]

## 1. 7. 7.

## නලකලාපසුත්‍රය.

67. එක්කලෙක ආයුෂ්මත් **ශාරිපුත්‍ර තෙරණුවෝත්** ආයුෂ්මත් **මහාකොට්ඨිත තෙරණුවෝත්** බරණැස සමීපයෙහි **ඉසිපතන** නම් වූ **මුවවෙනෙහි** වැඩවෙසෙත්. එකල්හි ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ සවස්වේලෙහි පලසමවතින් නැඟී සිටි සේක් ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කට යුතු කථාව කොට නිමවා එකත්පසෙක වැඩ හුන්හ.

එකත්පසෙක වැඩ හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන්ට මෙය කීහ: "ඇවැත්නි ශරිපුත්‍රයෙනි, කිමෙක් ද, ජරාමරණ තමා විසින් කරණ ලද්දේ ද, ජරාමරණ මෙරමා විසින් කරණ ලද්දේ ද, ජරාමරණ තමා විසින් කරණ ලද්දේත් මෙරමා විසින් කරණ ලද්දේත් වේ ද, නොහොත් ජරාමරණ තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ආකස්මික ව –ඉබේ හටගත්තේ දැ" යි.

ඇවැත්නි කොට්ඨිතයෙනි, ජරාමරණ තමා විසින් කරණ ලද්දේ නො වේ. ජරාමරණ මෙරමා විසිනුත් කරණ ලද්දේ නො වේ. ජරාමරණ තමා විසිනුත් කරණ ලද්දේ මෙරමා විසිනුත් කරණ ලද්දේ නො වේ. ජරාමරණ තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ඉබේ හටගත්තේත් නො වේ. වැලි දු ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ වේ යි.

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කිමෙක් ද, ජාතිය තමා විසින් කරණ ලද ද, ජාතිය මෙරමා විසින් කරණ ලද ද, ජාතිය තමා විසින් කරණ ලද්දීත් මෙරමා විසින් කරණ ලද්දීත් වේ ද, නොහොත් ජාතිය තමා විසිනුත් නො කරණ ලද්දී මෙරමා විසිනුත් නො කරණ ලද්දී ඉබේ හටගත්තී දැ යි.

ඇවැත්නි කොට්ඨිතයෙනි, ජාතිය තමා විසින් කරණ ලද්දී නො වේ. ජාතිය මෙරමා විසින් කරණ ලද්දී නො වේ. ජාතිය තමා විසින් කරණ ලද්දීත් මෙරමා විසින් කරණ ලද්දීත් නො වේ. ජාතිය තමා විසිනුත් නො කරණ ලද්දී මෙරමා විසිනුත් නො කරණ ලද්දී ඉබේ හටගත්තී ද නො වේ. වැලි දු භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ යි.

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කිමෙක් ද, භවය තමා විසින් කරණ ලද්දේ ද, භවය මෙරමා විසින් කරණ ලද්දේ ද, භවය තමා විසින් කරණ ලද්දේත් මෙරමා විසින් කරණ ලද්දේත් වේ ද, නොහොත් භවය තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ඉබේ හටගත්තේ දැයි.

ඇවැත්නි කොට්ඨිතයෙනි, භවය තමා විසින් කරණ ලද්දේ නො වේ භවය මෙරමා විසින් කරණ ලද්දේ නො වේ. භවය තමා විසින් කරණ ලද්දේත් මෙරමා විසින් කරණ ලද්දේත් නො වේ භවය තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ඉබේ හටගත්තේ ද නො වේ. වැලි දු උපාදාන ප්‍රත්‍යයයෙන් භවය වේ යි.

කින්නු ඛො ආවුසො සාරිපුත්ත, සයංකතං උපාදානං -පෙ- සයංකතා තණ්හා -පෙ- සයංකතා වෙදනා -පෙ- සයංකතො ඵස්සො -පෙ- සයංකතං සළායතනං -පෙ- සයංකතං නාමරූපං, පරකතං නාමරූපං, සයංකතඤ්ච පරකතඤ්ච නාමරූපං, උදාහු අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං නාමරූපන්ති?

න ඛො ආවුසො කොට්ඨිත, සයංකතං නාමරූපං. න පරකතං නාමරූපං. න සයංකතඤ්ච පරකතඤ්ච නාමරූපං. නාපි අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං නාමරූපං. අපි ච විඤ්ඤාණපච්චයා නාම-රූපන්ති.

කින්නු ඛො ආවුසො සාරිපුත්ත, සයංකතං විඤ්ඤාණං, පරකතං විඤ්ඤාණං, සයංකතඤ්ච පරකතඤ්ච විඤ්ඤාණං, උදාහු අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං විඤ්ඤාණන්ති?

න ඛො ආවුසො කොට්ඨිත, සයංකතං විඤ්ඤාණං. පරකතං විඤ්ඤාණං, න සයංකතඤ්ච පරකතඤ්ච විඤ්ඤාණං. නාපි අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං විඤ්ඤාණං අපි ච නාමරූපපච්චයා විඤ්ඤාණන්ති.

ඉදානෙව ඛො මයං ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං එවං ආජානාම: "න ඛො ආවුසො කොට්ඨිත, සයංකතං නාමරූපං, න පරකතං නාමරූපං, න සයංකතඤ්ච පරකතඤ්ච නාමරූපං, නාපි අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං නාමරූපං. අපි ච විඤ්ඤාණපච්චයා නාමරූප"න්ති.

ඉදානෙව ච පන මයං ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං එවං ආජානාම: "න ඛො ආවුසො කොට්ඨිත, සයංකතං විඤ්ඤාණං, න පරකතං විඤ්ඤාණං, න සයංකතඤ්ච පරකතඤ්ච විඤ්ඤාණං, නාපි අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං විඤ්ඤාණං. අපි ච නාමරූපපච්චයා විඤ්ඤාණ"න්ති.

යථා කථම්පනාවුසො සාරිපුත්ත, ඉමස්ස භාසිතස්ස අත්ථො දට්ඨබ්බොති? තෙන හාවුසො උපමං තෙ කරිස්සාමි. උපමායපිධෙකච්චෙ විඤ්ඤූ[1] පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති.

1 උපමායපි ඉධෙකච්චෙ - සිමු.

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කිමෙක් ද, උපාදාන තමා විසින් කරණ ලද්දේ ද ... තෘෂ්ණාව තමා විසින් කරණ ලද්දී ද ... වෙදනාව තමා විසින් කරණ ලද්දී ද ... ස්පර්ශය තමා විසින් කරණ ලද්දේ ද .... ෂඩායතන තමා විසින් කරණ ලද්දේ ද ... නාමරූප තමා විසින් කරණ ලද්දේ ද, නාමරූප මෙරමා විසින් කරණ ලද්දේ ද, නාමරූප තමා විසින් කරණ ලද්දේත් මෙරමා විසින් කරණ ලද්දේත් වේ ද, නොහොත් නාමරූප තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ඉබේ හටගත්තේ ද යි?

ඇවැත්නි කොට්ඨිතයෙනි, නාමරූප තමා විසින් කරණ ලද්දේ නො වේ. නාමරූප මෙරමා විසින් කරණ ලද්දේ නො වේ. නාමරූප තමා විසින් කරණ ලද්දේත් මෙරමා විසින් කරණ ලද්දේත් නො වේ. නාමරූප තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ඉබේ හටගත්තේත් නො වේ. වැලි දු විඥානප්‍රත්‍යයෙන් නාම රූප වේ යි.

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කිමෙක් ද, විඥානය තමා විසින් කරණ ලද්දේ ද, විඥානය මෙරමා විසින් කරණ ලද්දේ ද, විඥානය තමා විසින් කරණ ලද්දේත් මෙරමා විසින් කරණ ලද්දේත් වේ ද, නොහොත් විඥානය තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ඉබේ හටගත්තේ ද යි?

ඇවැත්නි කොට්ඨිතයෙනි, විඥානය තමා විසින් කරණ ලද්දේ නො වේ. විඥානය මෙරමා විසින් කරණ ලද්දේ නො වේ. විඥානය තමා විසින් කරණ ලද්දේත් මෙරමා විසින් කරණ ලද්දේත් නො වේ. විඥානය තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ඉබේ හටගත්තේ ද නො වේ. වැලි දු නාමරූපප්‍රත්‍යයෙන් විඥානය වේ යි.

දැන් වූ කලි අපි ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ භාෂිතය මෙසේ දනිමු: "ඇවැත්නි, කොට්ඨිතයෙනි, නාමරූප තමා විසින් කරණ ලද්දේ නො වේ. නාමරූප මෙරමා විසින් කරණ ලද්දේ නො වේ. නාමරූප තමා විසින් කරණ ලද්දේත් මෙරමා විසින් කරණ ලද්දේත් නො වේ. නාමරූප තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ඉබේ හටගත්තේ ද නො වේ. වැලි දු විඥානප්‍රත්‍යයෙන් නාමරූප වේ" යි.

දැන් වූ කලි අපි ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ භාෂිතය මෙසේ දනිමු. "ඇවැත්නි කොට්ඨිතයෙනි, විඥානය තමා විසින් කරණ ලද්දේ නො වේ. විඥානය මෙරමා විසින් කරණ ලද්දේ නො වේ. විඥානය තමා විසින් කරණ ලද්දේත් මෙරමා විසින් කරණ ලද්දේත් නො වේ. විඥානය තමා විසිනුත් නො කරණ ලද්දේ මෙරමා විසිනුත් නො කරණ ලද්දේ ඉබේ හටගත්තේත් නො වේ. වැලි දු නාමරූපප්‍රත්‍යයෙන් විඥානය වේ" යි.

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කෙසේ නම් මේ භාෂිතයේ අර්ථය දත යුතු ද? ඇවැත්නි, එසේ නම් තොපට උපමාවක් කරන්නෙමි. මෙහි ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙන් ද භාෂිතයේ අර්ථය දැන ගණිත්.

සෙය්‍යථාපි ආවුසො, ද්වෙ නළකලාපියො අඤ්ඤමඤ්ඤං නිස්සාය තිට්ඨෙය්‍යුං, එවමෙව ඛො ආවුසො, නාමරූපපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. තාසඤ්චෙ ආවුසො, නළකලාපීනං එකං අපකඩ්ඪෙය්‍ය, එකා පපතෙය්‍ය, අපරඤ්චෙ අපකඩ්ඪෙය්‍ය, අපරා පපතෙය්‍ය. එවමෙව ඛො ආවුසො, නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

අච්ඡරියං ආවුසො සාරිපුත්ත, අබ්භුතං ආවුසො සාරිපුත්ත, යාව සුභාසිතඤ්චිදං ආයස්මතා සාරිපුත්තෙන. ඉදං ච පන මයං ආයස්මතො සාරිපුත්තස්ස සුභාසිතං ඉමෙහි ඡත්තිංසාය වත්ථූහි අනුමොදම.

ජරාමරණස්ස චෙ ආවුසො, භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති, 'ධම්මකථිකො භික්ඛූ'ති අලං වචනාය. ජරාමරණස්ස චෙ ආවුසො, භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති, 'ධම්මානුධම්මපටිපන්නො භික්ඛූ'ති අලං වචනාය. ජරාමරණස්ස චෙ ආවුසො, භික්ඛු නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති, 'දිට්ඨධම්මනිබ්බානප්පත්තො භික්ඛූ'ති අලං වචනාය.

ජාතියා චෙ ආවුසො, භික්ඛු -පෙ- භවස්ස චෙ -පෙ- උපාදානස්ස චෙ -පෙ- තණ්හාය චෙ -පෙ- වෙදනාය චෙ -පෙ- ඵස්සස්ස චෙ -පෙ- සළායතනස්ස චෙ -පෙ- නාමරූපස්ස චෙ -පෙ- විඤ්ඤාණස්ස චෙ -පෙ- සඞ්ඛාරානං චෙ [නිබ්බිදාය] -පෙ- 'දිට්ඨධම්මනිබ්බානප්පත්තො භික්ඛූ'ති අලං වචනාය.

අවිජ්ජාය චෙ ආවුසො, භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති, 'ධම්මකථිකො භික්ඛූ'ති අලං වචනාය. අවිජ්ජාය චෙ ආවුසො, භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති, 'ධම්මානුධම්මපටිපන්නො භික්ඛූ'ති අලං වචනාය. අවිජ්ජාය චෙ ආවුසො, භික්ඛු නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති, 'දිට්ඨධම්මනිබ්බානප්පත්තො භික්ඛූ'ති අලං වචනායාති.

## 1. 7. 8.

## කොසම්බිසුත්තං.

68. එකං සමයං ආයස්මා ච **මූසිලො** ආයස්මා ච **සවිට්ඨො**[1] ආයස්මා ච **නාරදො** ආයස්මා ච **ආනන්දො** **කොසම්බියං** විහරන්ති **ඝොසිතාරාමෙ**.

අථ ඛො ආයස්මා සවිට්ඨො ආයස්මන්තං ඛො මූසිලං එතදවොච: "අඤ්ඤත්‍රෙව ආවුසො මූසිල, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අත්ථායස්මතො මූසිලස්ස පච්චත්තමෙව ඤාණං ජාතිපච්චයා ජරාමරණන්ති? අඤ්ඤත්‍රෙව ආවුසො සවිට්ඨ සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අහමෙතං ජානාමි අහමෙතං පස්සාමි ජාතිපච්චයා ජරාමරණ"න්ති.

1. පවිට්ඨො - මජසං, ස්‍යා.

ඇවැත්නි, යම් සේ නළකලප් දෙකෙක් ඔවුනොවුන් ඇසුරු කොට සිටුනේ ද, ඇවැත්නි, එසෙයින් ම නාමරූපප්‍රත්‍යයෙන් විඤ්ඤාණය වේ. විඤ්ඤාණප්‍රත්‍යයෙන් නාමරූප වේ. නාමරූපප්‍රත්‍යයෙන් සළායතන වේ. සළායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ .... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැණීම වේ. ඇවැත්නි, ඒ නළකලප් දෙකින් එකක් ඉවත් කරන්නේ නම් එකෙක් වැටෙන්නේ ය. අනෙක ඉවත් කරන්නේ නම් අනෙක වැටෙන්නේ ය. ඇවැත්නි, එසෙයින් ම නාමරූපනිරෝධයෙන් විඤ්ඤාණ-නිරෝධය වේ. විඤ්ඤාණනිරෝධයෙන් නාමරූපනිරෝධය වේ. නාමරූප-නිරෝධයෙන් සළායතනනිරෝධය වේ. සළායතනනිරෝධයෙන් ඵස්ස-නිරෝධය වේ .... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ යි.

ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, ආශ්චර්‍ය්‍යයෙකි. ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, අද්භුතයෙකි. ආයුෂ්මත් ශාරීපුත්‍රයන් විසින් මෙය සුභාෂිත (මැනැවින් කියන ලද) ම ය. අපි ආයුෂ්මත් ශාරීපුත්‍රයන්ගේ සුභාෂිතය මේ සතිස්කරුණින්* අනුමෝදන් වම්හ.

ඇවැත්නි, ඉදින් මහණ තෙමේ ජරාමරණයේ නිර්වේදය විරාගය නිරෝධය පිණිස දහම් දෙසා ද, (හෙතෙමේ) "ධර්මකථික මහණෙකැ" යි කියන්නට සුදුසු ය. ඇවැත්නි, ඉදින් මහණ තෙමේ ජරාමරණයෙහි නිර්වේදය විරාගය නිරෝධය පිණිස පිළිපන්නේ වේ ද, හේ "දහම් අනුදහම් පිළිවෙත්හි පිළිපන් මහණෙකැ" යි කියන්නට සුදුසු ය. ඇවැත්නි, ඉදින් මහණ තෙමේ ජරා-මරණයෙහි නිර්වේදයෙන් විරාගයෙන් නිරෝධයෙන් උපාදාන රහිත ව මිදුනේ වේ ද, හේ "දිට්ඨධම්මයෙහි නිවන් පැමිණි මහණෙකැ" යි කියන්නට සුදුසු ය.

ඇවැත්නි, මහණ තෙමේ ඉදින් ජාතියේ ... ඉදින් භවයේ ... ඉදින් උපාදානයේ ... ඉදින් තෘෂ්ණාවේ ... ඉදින් වේදනාවේ ... ඉදින් ඵස්සයේ ... ඉදින් සළායතනයේ ... ඉදින් නාමරූපයේ ... ඉදින් විඤ්ඤාණයේ ... ඉදින් සඞ්ඛාරයන්ගේ [නිර්වේදයෙන්] ... "දිට්ඨධම්මයෙහි නිවන් පැමිණි මහණෙකැ" යි කියන්නට සුදුසු ය.

ඇවැත්නි, ඉදින් මහණ තෙමේ අවිද්‍යාවේ නිර්වේදය විරාගය නිරෝධය පිණිස දහම් දෙසා ද, "ධර්මකථික මහණෙකැ" යි කියන්නට සුදුසු ය, ඇවැත්නි, මහණ තෙමේ ඉදින් අවිද්‍යාවේ නිර්වේදය විරාගය නිරෝධය පිණිස පිළිපන්නේ වේ ද, "දහම් අනුදහම් පිළිවෙත්හි පිළිපන් මහණෙකැ" යි කියන්නට සුදුසු ය: ඇවැත්නි, මහණ තෙමේ ඉදින් අවිද්‍යාවේ නිර්වේදයෙන් විරාගයෙන් නිරෝධයෙන් උපාදාන රහිත ව මිදුනේ වේ ද, "දිට්ඨධම්මයෙහි නිවන් පැමිණි මහණෙකැ" යි කියන්නට සුදුසු ය යි.

## 1. 7. 8.

## කොසම්බිසූත්‍රය

68. එක්කලෙක ආයුෂ්මත් මූසිල තෙරණුවෝ ද ආයුෂ්මත් සවිට්ඨ තෙරණුවෝ ද ආයුෂ්මත් නාරද තෙරණුවෝ ද ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ද කොසඹෑනුවර සමීපයෙහි ඝෝෂිතාරාමයෙහි වැඩවෙසෙති.

එකල්හි ආයුෂ්මත් සවිට්ඨ තෙරණුවෝ ආයුෂ්මත් මූසිල තෙරුන්ට මෙය කීහ: ඇවැත්නි මූසිලයෙනි, ඇදහීමෙන් තොර ව ම, රුචියෙන් තොර ව ම, පරම්පරාකථායෙන් තොර ව ම, ආකාරවිකල්පනයෙන් තොර ව ම, දෘෂ්ටියට අනු ව වැටහීමෙන් තොර ව ම ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ ය යි ප්‍රත්‍යවේක්ෂාවෙන් තමා කෙරෙහි ම වූ දැනීමෙක් ආයුෂ්මත් මූසිලහට ඇත්තේ ද? ඇවැත්නි සවිට්ඨයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාර-විකල්පනයෙන් තොර ව ම දෘෂ්ටියට අනු ව වැටහීමෙන් තොර ව ම 'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ ය' යන මෙය මම දනිමි. මෙය මම දකිමි.

---

*ජරාමරණාදි දොළොස් පද - ධර්මකථික මහණ, පිළිපන්මහණ, නිවන් පැමිණි මහණ යන තුන් පදයන් හා යෙදීමෙන් කරුණු සතිසෙක් වේ.

අඤ්ඤත්‍රෙව ආවුසො මූසිල සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, අත්ථායස්මතො මූසිලස්ස පච්චත්තමෙව ඤාණං භවපච්චයා ජාතීති -පෙ- උපාදානපච්චයා භවොති -පෙ- තණ්හාපච්චයා උපාදානන්ති -පෙ- වෙදනාපච්චයා තණ්හාති -පෙ- ඵස්සපච්චයා වෙදනාති -පෙ- සළායතනපච්චයා ඵස්සොති -පෙ- නාමරූපපච්චයා සළායතනන්ති -පෙ- විඤ්ඤාණපච්චයා නාමරූපන්ති -පෙ- සඞ්ඛාරපච්චයා විඤ්ඤාණන්ති -පෙ- අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති? අඤ්ඤත්‍රෙව ආවුසො සවිට්ඨ, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති.

අඤ්ඤත්‍රෙව ආවුසො මූසිල, සද්ධාය -පෙ- අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, අත්ථායස්මතො මූසිලස්ස පච්චත්තමෙව ඤාණං ජාතිනිරොධා ජරාමරණනිරොධොති? අඤ්ඤත්‍රෙව ආවුසො සවිට්ඨ, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා, අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි, ජාතිනිරොධා ජරාමරණනිරොධොති අඤ්ඤත්‍රෙව ආවුසො මූසිල, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අත්ථායස්මතො මූසිලස්ස පච්චත්තමෙව ඤාණං භවනිරොධා ජාතිනිරොධොති. -පෙ- උපාදානනිරොධා භවනිරොධොති -පෙ- තණ්හානිරොධා උපාදානනිරොධොති -පෙ- වෙදනානිරොධා තණ්හානිරොධොති-පෙ-ඵස්සනිරොධා වෙදනානිරොධොති -පෙ- සළායතනනිරොධා ඵස්සනිරොධොති -පෙ- නාමරූපනිරොධා සළායතනනිරොධොති -පෙ- විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධොති -පෙ- සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධොති -පෙ- අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති? අඤ්ඤත්‍රෙව ආවුසො සවිට්ඨ, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති.

අඤ්ඤත්‍රෙව ආවුසො මූසිල, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අත්ථායස්මතො මූසිලස්ස පච්චත්තමෙව ඤාණං භවනිරොධො නිබ්බානන්ති? අඤ්ඤත්‍රෙව ආවුසො සවිට්ඨ, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි භවනිරොධො නිබ්බානන්ති. තෙන හායස්මා මූසිලො අරහං ඛීණාසවොති. එවං වුත්තෙ ආයස්මා මූසිලො තුණ්හී අහොසි.

ඇවැත්නි මූසිලයෙනි, ඇදහීමෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ ය යි ... උපාදානප්‍රත්‍යයයෙන් භවය වේ ය යි ... තණ්හාප්‍රත්‍යයයෙන් උපාදාන වේ ය යි ... වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ ය යි ... ඵස්සප්‍රත්‍යයයෙන් වෙදනාව වේ ය යි ... සළායතනප්‍රත්‍යයයෙන් ඵස්සය වේ ය යි ... නාමරූප ප්‍රත්‍යයයෙන් සළායතන වේ ය යි ... විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වේ ය යි සඞ්ඛාර ප්‍රත්‍යයයෙන් විඤ්ඤාණය වේ ය යි ... අවිද්‍යාප්‍රත්‍යයයෙන් සඞ්ඛාර වේ ය යි තමන් ම ඇති කර ගත් දැනීමෙක් ආයුෂ්මත් මූසිලහට ඇත්තේ ද? ඇවැත්නි සවිට්ඨයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාර සැලකීමෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම 'අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාර වේ ය' යන මෙය මම දනිමි, මෙය මම දකිමි.

ඇවැත්නි මූසිලයෙනි, ඇදහීමෙන් තොර ව ම ... දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම ජාතිනිරොධයෙන් ජරාමරණනිරොධය වේ ය යි තමන් ම ඇති කර ගත් දැනීමෙක් ආයුෂ්මත් මූසිලහට ඇත්තේ ද? ඇවැත්නි සවිට්ඨයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාර සැලකීමෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම 'ජාතිනිරෝධයෙන් ජරාමරණනිරෝධය වේ ය' යන මෙය මම දනිමි, මෙය මම දකිමි. ඇවැත්නි, මූසිලයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාර පරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම භවනිරෝධයෙන් ජාතිනිරෝධය වේ ය යි...උපාදානනිරෝධයෙන් භවනිරෝධය වේ ය යි ... තණ්හානිරෝධයෙන් උපාදානනිරොධය වේ ය යි ... වෙදනානිරොධයෙන් තණ්හානිරොධය වේ ය යි ... ඵස්සනිරෝධයෙන් වෙදනානිරෝධය වේ ය යි ... සළායතනනිරෝධයෙන් ඵස්සනිරෝධය වේ ය යි ... නාමරූපනිරෝධයෙන් සළායතනනිරොධය වේ ය යි විඤ්ඤාණනිරෝධයෙන් නාමරූපනිරෝධය වේ ය යි ... සඞ්ඛාරනිරෝධයෙන් විඤ්ඤාණනිරොධය වේ ය යි ... අවිජ්ජානිරෝධයෙන් සඞ්ඛාරනිරොධය වේ ය යි තමන් ම ඇති කර ගත් දැනීමෙක් ආයුෂ්මත් මූසිලහට ඇත්තේ ද? ඇවැත්නි සවිට්ඨයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොරව ම 'අවිජ්ජානිරෝධයෙන් සඞ්ඛාරනිරොධය වේ ය' යන මෙය මම දනිමි. මෙය මම දකිමි.

ඇවැත්නි මූසිලයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාර පරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ච ම භවනිරොධය නිවණ ය යි තමන් ම ඇති කර ගත් දැනීමෙක් ආයුෂ්මත් මූසිල තෙරුන්ට ඇත්තේ ද? ඇවැත්නි සවිට්ඨයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම භවනිරෝධය නිර්වාණය යි මෙය මම දනිමි, මෙය මම දකිමි. එසේ නම් ආයුෂ්මත් මූසිල තෙරණුවෝ ක්ෂීණාස්‍රව වූ රහත් කෙනෙකි යි. මෙසේ කී කල්හි ආයුෂ්මත් මූසිල තෙරණුවෝ නිශ්ශබ්ද වූහ.

අථ ඛො ආයස්මා නාරදො ආයස්මන්තං සවිට්ඨං එතදවොච: සාධාවුසො සවිට්ඨ, අහමෙතං පඤ්හං ලභෙය්‍යං, මමෙතං[1] පඤ්හං පුච්ඡ. අහං තෙ එතං පඤ්හං ව්‍යාකරිස්සාමීති. ලභතායස්මා[2] නාරදො එතං පඤ්හං. පුච්ඡාමහං ආයස්මන්තං නාරදං එතං පඤ්හං. බ්‍යාකරොතු ච මෙ ආයස්මා නාරදො එතං පඤ්හං.

අඤ්ඤත්‍රෙව ආවුසො නාරද, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා ආයස්මතො නාරදස්ස පච්චත්තමෙව ඤාණං ජාතිපච්චයා ජරාමරණන්ති? අඤ්ඤත්‍රෙව ආවුසො සවිට්ඨ, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි ජාතිපච්චයා ජරාමරණන්ති. අඤ්ඤත්‍රෙව ආවුසො නාරද, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා ආයස්මතො නාරදස්ස පච්චත්තමෙව ඤාණං භවපච්චයා ජාතීති -පෙ- අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති? අඤ්ඤත්‍රෙව ආවුසො සවිට්ඨ, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි, අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති.

අඤ්ඤත්‍රෙව ආවුසො නාරද, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා ආයස්මතො නාරදස්ස පච්චත්තමෙව ඤාණං ජාතිනිරොධා ජරාමරණනිරොධොති? අඤ්ඤත්‍රෙව ආවුසො සවිට්ඨ, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි ජාතිනිරොධා ජරාමරණනිරොධොති. අඤ්ඤත්‍රෙව ආවුසො නාරද, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා ආයස්මතො නාරදස්ස පච්චත්තමෙව ඤාණං භවනිරොධා ජාතිනිරොධොති -පෙ- අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති? අඤ්ඤත්‍රෙව ආවුසො සවිට්ඨ, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි අවිජ්ජා නිරොධා සඞ්ඛාරනිරොධොති.

1. මමෙවං - ස්‍යා. 2. ලභති ආයස්මා - ස්‍යා.

ඉක්බිති ආයුෂ්මත් නාරද තෙරණුවෝ ආයුෂ්මත් සවිට්ඨ තෙරණුවන්ට මෙය කීහ: "ඇවැත්නි සවිට්ඨයෙනි, මම මේ පැණය ලබන්නෙම් නම් මැනවි. මාගෙන් මේ පැණය විචාරණු මැනවි. මම ඔබට මේ පැණය විසඳන්නෙමි" යි. ආයුෂ්මත් නාරද තෙරණුවෝ මේ පැණය ලබත්වා, ආයුෂ්මත් නාරද තෙරුන්ගෙන් මම මේ පැණය විචාරමි. ආයුෂ්මත් නාරද තෙරණුවෝ මේ පැණය මට විසඳත්වා.

ඇවැත්නි නාරදයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම 'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ ය' යන තමන් ම ඇති කර ගත් දැනීමෙක් ආයුෂ්මත් නාරද තෙරුන්ට ඇත්තේ ද? ඇවැත්නි, සවිට්ඨයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම 'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ ය, යන මෙය මම දනිමි. මෙය මම දකිමි. ඇවැත්නි නාරදයෙනි, ශ්‍රද්ධාවෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම භවප්‍රත්‍යයෙන් ජාතිය වේ ය යි .... අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාර වේ ය යි තමන් ම ඇති කර ගත් දැනීමෙක් ආයුෂ්මත් නාරදහට ඇත්තේ ද? ඇවැත්නි සවිට්ඨයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම 'අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාර වේ ය' යි මම මෙය දනිමි, මම මෙය දකිමි.

ඇවැත්නි නාරදයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොරව ම 'ජාතිනිරෝධයෙන් ජරාමරණනිරෝධය වේ ය' යි තමන් ම ඇති කර ගත් දැනීමෙක් ආයුෂ්මත් නාරදහට ඇත්තේ ද? ඇවැත්නි සවිට්ඨයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම 'ජාතිනිරෝධයෙන් ජරාමරණනිරෝධය වේ ය' යන මෙය මම දනිමි, මෙය මම දකිමි. ඇවැත්නි නාරදයෙනි, ඇදහීමෙන් තොර ව ම රිසියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම 'භවනිරොධයෙන් ජාතිනිරොධය වේ ය' යි ... 'අවිද්‍යානිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ ය'යි තමන් විසින් ම ඇති කර ගත් දැනීමෙක් ආයුෂ්මත් නාරද තෙරුන්ට ඇත්තේ ද? ඇවැත්නි සවිට්ඨයෙනි, ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම 'අවිද්‍යානිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ ය' යන මෙය මම දනිමි, මෙය මම දකිමි.

අඤ්ඤත්‍රෙව ආවුසො නාරද, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අත්ථායස්මතො නාරදස්ස පච්චත්තමෙව ඤාණං භවනිරොධො නිබ්බාණන්ති? අඤ්ඤත්‍රෙව ආවුසො සවිට්ඨ, සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි භවනිරොධො නිබ්බාණන්ති.

තෙන හායස්මා නාරදො අරහං ඛීණාසවොති? භවනිරොධො නිබ්බාණන්ති ඛො මෙ ආවුසො සම්මප්පඤ්ඤාය සුදිට්ඨං, න චම්හි අරහං ඛීණාසවො. සෙය්‍යථාපි ආවුසො, කන්තාරමග්ගෙ උදපානො, තත්‍ර නෙවස්ස රජ්ජු න උදකවාරකො. අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො. සො තං උදපානං ඔලොකෙය්‍ය, තස්ස උදකන්ති හි ඛො ඤාණං අස්ස, න ච කායෙන ඵුසිත්වා විහරෙය්‍ය. එවමෙව ඛො ආවුසො, භවනිරොධො නිබ්බාණන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං, න චම්හි අරහං ඛීණාසවොති. එවං වුත්තෙ ආයස්මා ආනන්දො ආයස්මන්තං සවිට්ඨං එතදවොච: එවංවාදී ත්වං ආවුසො සවිට්ඨ, ආයස්මන්තං නාරදං කිං වදෙසීති? එවංවාදාහං ආවුසො ආනන්ද, ආයස්මන්තං නාරදං න කිඤ්චි වදාමි අඤ්ඤත්‍ර කල්‍යාණා, අඤ්ඤත්‍ර කුසලාති.

### 1. 7. 9.

### උපයන්තිසුත්තං

69. සාවත්ථියං-

මහාසමුද්දො භික්ඛවෙ, උපයන්තො මහානදියො උපයාපෙති මහානදියො උපයන්තියො කුන්නදියො උපයාපෙන්ති. කුන්නදියො උපයාපෙන්තියො මහාසොබ්භෙ උපයාපෙන්ති. මහාසොබ්භා උපයන්තා කුසොබ්භෙ[1] උපයාපෙන්ති. එවමෙව ඛො භික්ඛවෙ, අවිජ්ජා උපයන්තී සඞ්ඛාරෙ උපයාපෙති. සඞ්ඛාරා උපයන්තා විඤ්ඤාණං උපයාපෙන්ති. විඤ්ඤාණං උපයන්තං නාමරූපං උපයාපෙති. නාමරූපං උපයන්තං සළායතනං උපයාපෙති. සළායතනං උපයන්තං ඵස්සං උපයාපෙති. ඵස්සො උපයන්තො වෙදනං උපයාපෙති. වෙදනා උපයන්තී තණ්හං උපයාපෙති. තණ්හා උපයන්තී උපාදානං උපයාපෙති. උපාදානං උපයන්තං භවං උපයාපෙති. භවො උපයන්තො ජාතිං උපයාපෙති. ජාති උපයන්තී ජරාමරණං උපයාපෙති.

මහාසමුද්දො භික්ඛවෙ, අපයන්තො මහානදියො අපයාපෙති. මහානදියො අපයන්තියො කුන්නදියො අපයාපෙන්ති. කුන්නදියො අපයන්තියො මහාසොබ්භෙ අපයාපෙන්ති. මහාසොබ්භා අපයන්තා කුසොබ්භෙ අපයාපෙන්ති. එවමෙව ඛො භික්ඛවෙ, අවිජ්ජා අපයන්තී සඞ්ඛාරෙ අපයාපෙති. සඞ්ඛාරා අපයන්තා විඤ්ඤාණං අපයාපෙන්ති. විඤ්ඤාණං අපයන්තං නාමරූපං අපයාපෙති. නාමරූපං අපයන්තං සළායතනං අපයාපෙති. සළායතනං අපයන්තං ඵස්සං අපයාපෙති. ඵස්සො අපයන්තො වෙදනං අපයාපෙති. වෙදනා අපයන්තී තණ්හං අපයාපෙති. තණ්හා අපයන්තී උපාදානං අපයාපෙති. උපාදානං අපයන්තං භවං අපයාපෙති. භවො අපයන්තො ජාතිං අපයාපෙති. ජාති අපයන්තී ජරාමරණං අපයාපෙතීති.

---

1. කුසොබ්භෙ - මජසං, කුසුබ්භෙ - සීමු.

ඇවැත්නි නාරදයෙනි, ඇදහීමෙන් තොර ව ම රිසියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම භවනිරෝධය නිවණ ය යි තමන් විසින් ම ඇති කර ගත් දැනීමෙක් ආයුෂ්මත් නාරදහට ඇත්තේ ද? ඇවැත්නි සවිට්ඨයෙනි, ඇදහීමෙන් තොර ව ම රිසියෙන් තොර ව ම අනුශ්‍රැතියෙන් තොර ව ම ආකාරපරිවිතර්කයෙන් තොර ව ම දිට්ඨිනිජ්ඣානක්ඛන්තියෙන් තොර ව ම 'භවනිරොධය නිවණ' ය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.

එසේ නම් ආයුෂ්මත් නාරද තෙරණුවෝ ක්ෂීණාස්‍රව වූ රහත් කෙනෙකි යි. ඇවැත්නි, භවනිරොධය නිවණ ය යි මවිසින් සම්‍යක් ප්‍රඥාවෙන් මැනවින් දක්නා ලදි. ක්ෂීණාස්‍රව වූ රහතෙක් නො ද වෙමි. ඇවැත්නි, යම් සේ කතරමඟෙක ලිඳෙක් වේ ද, එහි රැහැණෙක් නො ම වන්නේ ය. බඳුනෙක් නො ම වන්නේ ය. එකල්හි ගිමෙන් තැවුනු ගිමෙන් පෙළුනු කලාන්ත වූ හටගත් පවස් ඇති බොනු කැමැති පුරුෂයෙක් එන්නේ ය. හෙතෙමේ ඒ ලිඳ බලන්නේ ය. ඔහුට ජලය ය යි දැනීම වන්නේ ය. කයින් පැහැස නො ද වෙසෙන්නේ ය. ඇවැත්නි, එසෙයින් ම භවනිරොධය නිවණ ය යි මනා නුවණින් තතු සේ දක්නා ලදී. ක්ෂීණාස්‍රව වූ රහතෙක් නො ද වෙමි. මෙසේ කී කල ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂමත් සවිට්ඨ තෙරුන්ට "ඇවැත්නි සවිට්ඨයෙනි, මෙසේ කියන ඔබ ආයුෂමත් නාරද තෙරුන්ට කුමක් කියහි ද"යි මෙය කීහ. ඇවැත්නි ආනන්දයෙනි, මෙසේ කියන මම ආයුෂමත් නාරද තෙරුන්ට යහපතින් තොර කුසලින් තොර කිසිවක් නො කියමි යි.

## 1. 7. 9.

## උපයන්තිසූත්‍රය

69. **සැවැත්නුවර-**

මහණෙනි, මහමුහුද ගලන්නේ මහාගඞ්ගාවන් පුරවයි. මහාගඞ්ගා ගලන්නාහු කුඩා ගඞ්ගාවන් පුරවත්.කුඩා ගඞ්ගා ගලන්නාහු මහහෙප් පුරවත්. මහහෙප් ගලන්නාහු කුඩා හෙප් පුරවත්. මහණෙනි, එසෙයින් ම අවිද්‍යාව වැඩෙන්නී සංසකාර වඩයි. සංසකාරයෝ වැඩෙන්නාහු විඥඤාණය වඩත්. විඥඤාණය වැඩෙන්නේ නාමරූප වඩයි. නාමරූප වැඩෙන්නේ සළායතන වඩයි. සළායතන වැඩෙන්නේ ඵස්සය වඩයි. ඵස්සය වැඩෙන්නේ වෙදනාව වඩයි. වෙදනාව වැඩෙන්නී තණ්හාව වඩයි. තණ්හාව වැඩෙන්නී උපාදන වඩයි. උපාදන වැඩෙන්නේ භවය වඩයි. භවය වැඩෙන්නේ ජාතිය වඩයි. ජාතිය වැඩෙන්නී ජරාමරණ වඩයි.

මහණෙනි, මහමුහුද බැස යන්නේ මහාගඞ්ගා බස්වයි. මහාගඞ්ගා බැස යන්නාහු කුඩා ගඞ්ගා බස්වත්. කුඩා ගඞ්ගා බැස යන්නාහු මහහෙබ් බස්වත්. මහහෙබ් බැස යන්නාහු කුඩා හෙබ් බස්වත්. මහණෙනි, එසෙයින් ම අවිද්‍යාව පහ ව යන්නී සංසකාර පහ කෙරෙයි. සංසකාරයෝ පහ ව යන්නාහු විඥානය පහ කෙරෙත් විඥානය පහ ව යන්නේ නාමරූප පහ කෙරෙයි. නාමරූප පහ ව යන්නේ ෂඩායතන පහ කෙරෙයි. ෂඩායතන පහ ව යන්නේ ස්පර්ශය පහ කෙරෙයි. ස්පර්ශය පහ ව යන්නේ වේදනාව පහ කෙරෙයි. වේදනාව පහ ව යන්නී තෘෂ්ණාව පහ කෙරෙයි. තෘෂ්ණාව පහ ව යන්නී උපාදන පහ කෙරෙයි. උපාදන පහ ව යන්නේ භවය පහ කෙරෙයි. භවය පහ ව යන්නේ ජාතිය පහ කෙරෙයි. ජාතිය පහ ව යන්නී ජරාමරණ පහ කෙරේ යි.

## 1. 7. 10

### සුසීමසුත්තං[1]

70. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ.** තෙන ඛො පන සමයෙන භගවා සක්කතො හොති ගරුකතො මානිතො පූජිතො අපචිතො ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය[2]භෙසජ්ජපරික්ඛාරානං. භික්ඛුසඞ්ඝොපි සක්කතො හොති ගරුකතො මානිතො පූජිතො අපචිතො ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අඤ්ඤතිත්ථියා පන පරිබ්බාජකා අසක්කතා හොන්ති අගරුකතා අමානිතා අපූජිතා අනපචිතා න ලාභිනො[3] චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං.

තෙන ඛො පන සමයෙන සුසීමො පරිබ්බාජකො රාජගහෙ පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං. අථ ඛො සුසීමස්ස පරිබ්බාජකස්ස පරිසා සුසීමං පරිබ්බාජකං එතදවොචුං: එහි ත්වං ආවුසො සුසීම, සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං චර. ත්වං ධම්මං පරියාපුණිත්වා අම්හෙ වාචෙය්‍යාසි. තං මයං ධම්මං පරියාපුණිත්වා ගිහීනං භාසිස්සාම. එවං මයම්පි සක්කතා භවිස්සාම ගරුකතා මානිතා පූජිතා අපචිතා ලාභිනො චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති. එවමාවුසොති ඛො සුසීමො පරිබ්බාජකො සකාය පරිසාය පටිස්සුත්වා[4] යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුසීමො පරිබ්බාජකො ආයස්මන්තං ආනන්දං එතදවොච: ඉච්ඡාමහං ආවුසො ආනන්ද, ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මචරියං චරිතුන්ති.

අථ ඛො ආයස්මා ආනන්දො සුසීමං පරිබ්බාජකං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: අයං භන්තෙ සුසීමො පරිබ්බාජකො එවමාහ: "ඉච්ඡාමහං ආවුසො ආනන්ද, ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මචරියං චරිතු"න්ති. තෙන හානන්ද සුසීමං පබ්බාජෙථාති. අලත්ථ ඛො සුසීමො පරිබ්බාජකො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං.[5]

තෙන ඛො පන සමයෙන සම්බහුලෙහි භික්ඛූහි භගවතො සන්තිකෙ අඤ්ඤා ව්‍යාකතා හොති "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමා"ති. අස්සොසි ඛො ආයස්මා සුසීමො සම්බහුලෙහි කිර භික්ඛූහි භගවතො සන්තිකෙ අඤ්ඤා බ්‍යාකතා, "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමා"ති.

---

1. සුසිම - මජසං, සතා. 2. ගිලානප්පච්චය - මජසං, සිමු. 3. අලාභිනො - සතා
4. පටිස්සුණිත්වා - මජසං, පටිසුණිත්වා - PTS. 5. අලත්ථුපසම්පදං - සිමු, සතා.

## 1. 7. 10.

## සුසීමසූත්‍රය

70. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වෙළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සත්කාර කරණ ලද සේක් ගරුකාර කරණ ලද සේක් බුහුමන් කරණ ලද සේක් පුදන ලද සේක් යටත් පහත් පැවතුම් දක්වන ලද සේක් සිවුරු පිඩු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබනසුලු සේක් වෙති. භික්සඝයා ද සත්කාර කරණ ලද්දේ ගරුකාර කරණ ලද්දේ බුහුමන් කරණ ලද්දේ පුදන ලද්දේ යටත් පහත් පැවතුම් දක්වන ලද්දේ සිවුරු පිඩු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබනසුලු වෙයි. අන්තොටු පිරිවැජ්ජෝ වනාහි සත්කාර නො කරණ ලද්දාහු ගරුකාර නො කරණ ලද්දාහු බුහුමන් නො කරණ ලද්දාහු නො පුදන ලද්දාහු යටත් පහත් පැවතුම් නො දක්වන ලද්දාහු සිවුරු පිඩු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර නො ලබන්නෝ වෙති.

එකල්හි සුසීම පිරිවැජි තෙමේ මහත් පිරිවැජි පිරිස සමග රජගහ නුවර වෙසෙයි. ඉක්බිති සුසීම පිරිවැජ්ජාගේ පිරිස සුසීම පිරිවැජ්ජාට මෙය කීහ: ඇවැත්නි, සුසීමයෙනි, එනු මැනව, ඔබ මහණ ගොයුම් කෙරෙහි බඹසර හැසිරෙණු මැනව. ඔබ දහම් පිරිවහා අපට කියවනු මැනව. අපි ඒ දහම් පිරිවහා ගිහියනට කියන්නෙමු. මෙසේ අපි ද සත්කාර කරණ ලද්දමෝ ගරුකාර කරණ ලද්දමෝ බුහුමන් කරණ ලද්දමෝ පුදන ලද්දමෝ යටත් පහත් පැවතුම් දක්වන ලද්දමෝ සිවුරු පිඩු සෙනසුන් බෙහෙත් පිරිකර ලබන සුල්ලමෝ වන්නෙමු යි. ඇවැත්නි, එසේ ය යි සුසීම පිරිවැජි තෙමේ සිය පිරිසට පිළිතුරු දී ආයුෂමත් අනද තෙරුන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂමත් අනද තෙරුන් සමග සතුටු වී ය. සතුටු විය යුතු සිහි කට යුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් සුසීම පිරිවැජි තෙමේ ආයුෂමත් අනද තෙරුන්ට "ඇවැත්නි, ආනන්දයෙනි, මේ සස්නෙහි බඹසර හැසිරෙන්නට මම කැමැත්තෙමි" යි මෙය කී ය.

එකල්හි ආයුෂමත් අනද තෙරණුවෝ සුසීම පිරිවැජ්ජා කැඳවා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹුනහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂමත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට 'වහන්ස, මේ සුසීම පිරිවැජි තෙමේ ඇවැත්නි, ආනන්දයෙනි, මේ සස්නෙහි බඹසර හැසිරෙන්නට මම කැමැත්තෙමි යි මෙසේ කියා"යි මෙය සැළකළහ. ආනන්ද, එසේ නම් සුසීම පැවිදි කරවු යි. සුසීම පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලදි. උපසපුව ලදි.

එකල්හි බොහෝ භික්ෂූන් විසින් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි "ජාතිය ක්‍ෂය වූවා ය, බඹසර වැස නිමවන ලදි. කට යුතු කරණ ලදි. මේ බැව් පිණිස අනෙකෙක් නැතැ යි දන්මහ"යි අර්හත්වය ප්‍රකාශ කරණ ලද්දේ වෙයි. ආයුෂමත් සුසීම තෙමේ බොහෝ භික්ෂූන් විසින් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි "ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදි. කට යුතු කරණ ලදි. මේ බැව් පිණිස අනෙකෙක් නැතැයි දනුම්හ'යි අර්හත්වය ප්‍රකාශ කරණ ලද්දේ ය යි ඇසී ය.

අථ ඛො ආයස්මා සුසීමො යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙහි භික්ඛූහි සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සුසීමො තෙ භික්ඛූ එතදවොච: සච්චං කිර ආයස්මන්තෙහි භගවතො සන්තිකෙ අඤ්ඤා බ්‍යාකතා "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමා"ති. එවමාවුසොති.

අපි නු තුම්හෙ[1] ආයස්මන්තො එවං ජානන්තා එවං පස්සන්තා අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොථ? එකොපි හුත්වා බහුධා හොථ. බහුධාපි හුත්වා එකො හොථ. ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානා ගච්ඡථ සෙය්‍යථාපි ආකාසෙ. පථවියාපි උම්මුජ්ජනිමුජ්ජං[2] කරොථ සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභෙජ්ජමානෙ[3] ගච්ඡථ සෙය්‍යථාපි පථවියං. ආකාසෙපි පල්ලඞ්කෙන කමථ සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසුරියෙ එවම්මහිද්ධිකෙ එවම්මහානුභාවෙ පාණිනා පරාමසථ[4] පරිමජ්ජථ. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙථාති? නො හෙතං ආවුසො.

අපි නු තුම්හෙ ආයස්මන්තො එවං ජානන්තා එවං පස්සන්තා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසකාය[5] උභො සද්දෙ සුණාථ දිබ්බෙ ච මානුසෙ ච, යෙ දූරෙ සන්තිකෙ චාති? නො හෙතං ආවුසො.

අපි නු තුම්හෙ ආයස්මන්තො, එවං ජානන්තා එවං පස්සන්තා පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාථ?[6] සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාථ, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාථ, සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාථ, වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාථ, සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාථ, වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාථ, සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාථ, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාථ, මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාථ, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාථ, සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාථ, අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාථ, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාථ, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාථ, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාථ, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාථාති.? නො හෙතං ආවුසො.

---

1. අපි පන තුම්හෙ - මජසං, PTS. 2. නිම්මුජ්ජං - සසා, PTS.
3. අභිජ්ජමානෙ - සසා, PTS, මජසං. අභෙජ්ජමානා - සීමු.
4. පරිමසථ - මජසං, සසා, PTS. 5. මානුසිකාය - මජසං, සසා.
6. ජානාථ - සීමු, සසා.

ඉක්බිති ආයුෂ්මත් සුසීම තෙමේ ඒ භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ඒ භික්ෂූන් සමග සතුටු වී ය. සතුටු විය යුතු සිහි කට යුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් සුසීම තෙමේ ඒ භික්ෂූන්ට ආයුෂ්මතුන් විසින් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි "ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදි. කට යුතු කරණ ලදි. මේ බැව් පිණිස අනෙකෙක් නැතැයි දනුම්හ" යි අර්හත්වය ප්‍රකාශ කරණ ලද්දේ තැබැ දැයි මෙ ය කී ය. ඇවැත්නි, එසේ ය යි.

ආයුෂ්මත්නි, මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ තෙපි නන්වැදෑරුම් ඍද්ධි කොටස් විඳිවූ දැ? (කෙසේ ද යත්:) එකෙක් වීත් බොහෝ අයුරු වවූ ද, බොහෝ අ යුරු වීත් එකෙක් වවූ ද, පැණෙන බවත් නො පැණෙන බවත් කරවූ ද, අහසෙහි මෙන් බිතු සරස පවුරු සරස නො ගැටෙමින් යවූ ද, දියෙහි මෙන් පොළොවෙහිත් කිමිදීම් මතුවීම් කරවූ ද, පොළොවෙහි මෙන් නො බිඳෙන දියෙහිත් යවූ ද, පියාපත් ඇති පක්‍ෂියකු මෙන් අහසෙහිත් පළඟින් හැසිරෙවූ ද, මෙසේ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳහිරු දෙදෙනාත් අතින් පරාමර්ශනය කරවූ ද, පිරිමදි වූ ද, බඹලොව තෙක් කයින් වශයෙහි පවත්වවූ දැ යි? ඇවැත්නි, මෙය නො වේ මැ යි.

ආයුෂ්මත්නි, මෙසේ දන්නා මෙසේ දක්නා තෙපි පිරිසිදු වූ මිනිස් බැව් ඉක්ම පැවති දිව්‍යමය වූ ශ්‍රොත්‍රධාතුවෙන් දෙවියන් පිළිබඳ වූත් මිනිසුන් පිළිබඳ වූත් දුර වූත් ලඟ වූත් දෙවැදෑරුම් ශබ්ද අසවූ දැයි? ඇවැත්නි, මේ නො වේ ම ය.

ආයුෂ්මත්නි, තෙපි මෙසේ දන්නාහු මෙසේ දක්නාහු තම සිතින් අන් සතුන්ගේ අන්පුගුලන්ගේ සිත පිරිසිඳ දනිවූ දැ? (කෙසේ ද යත්:) සරාග සිතත් සරාග සිත ය යි දනිවූ ද, වීතරාග සිතත් වීතරාග සිත ය යි දනිවූ ද, සදෙස සිතත් සදෙස සිත ය යි දනිවූ ද, වීතදෙස සිතත් වීතදෙස සිත ය යි දනිවූ ද, සමෝහ සිතත් සමෝහ සිත ය යි දනිවූ ද, වීතමෝහ සිතත් වීතමෝහ සිත ය යි දනිවූ ද, සඞ්ඛිත්ත සිතත් සඞ්ඛිත්ත සිත ය යි දනිවූ ද, වික්ඛිත්ත සිතත් වික්ඛිත්ත සිත ය යි දනිවූ ද, මහග්ගත සිතත් මහග්ගත සිත ය යි දනිවූ ද, අමහග්ගත සිතත් අමහග්ගත සිත ය යි දනිවූ ද, සඋත්තර සිතත් සඋත්තර සිත ය යි දනිවූ ද, අනුත්තර සිතත් අනුත්තර සිත ය යි දනිවූ ද, සමාහිත සිතත් සමාහිත සිත ය යි දනිවූ ද, අසමාහිත සිතත් අසමාහිත සිත ය යි දනිවූ ද, විමුත්ත සිතත් විමුත්ත සිත ය යි දනිවූ ද, අවිමුත්ත සිතත් අවිමුත්ත සිත ය යි දනිවූ දැ යි? ඇවැත්නි, මෙය නො වේ ම ය

අපි නු තුම්හෙ ආයස්මන්තො, එවං ජානන්තා එවං පස්සන්තා අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරථ? සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, 'අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං.[1] තත්‍රාපාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරථාති? නො හෙතං ආවුසො.

අපි නු තුම්හෙ ආයස්මන්තො, එවං ජානන්තා එවං පස්සන්තා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සථ චවමානෙ උපපජ්ජමානෙ.[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාථ? ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සථ චවමානෙ උපපජ්ජමානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාථාති? නො හෙතං ආවුසො.

අපි නු තුම්හෙ ආයස්මන්තො, එවං ජානන්තා එවං පස්සන්තා යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා, තෙ කායෙන ඵුසිත්වා විහරථාති?. නො හෙතං ආවුසො. එත්ථදානි ආයස්මන්තො, ඉදඤ්ච වෙය්‍යාකරණං ඉමෙසඤ්ච ධම්මානං අසමාපත්ති. ඉදං නො ආවුසො කථන්ති? පඤ්ඤාවිමුත්තා ඛො මයං ආවුසො සුසීමාති. න ඛ්වාහං ඉමස්ස ආයස්මන්තානං සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාමි. සාධු මෙ ආයස්මන්තො තථා භාසන්තු, යථාහං ඉමස්ස ආයස්මන්තානං සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යන්ති. ආජානෙය්‍යාසි වා ත්වං ආවුසො සුසීම, න වා[3] ත්වං ආජානෙය්‍යාසි. අථ ඛො පඤ්ඤාවිමුත්තා මයන්ති.

---

1. උපපාදිං - සීමු, සී 1, 2. 2 උපපජ්ජමානෙ - මජ්ඣං, සනා, PTS.
3. මා වා - සීමු.

ආයුෂ්මත්නි, තෙපි මෙසේ දන්නාහු මෙසේ දක්නාහු නන් අයුරු වූ පෙර විසූ කඳපිළිවෙළ සිහි කරවු ද? කෙසේ ද යත්: එක් ජාතියකුත්, ජාති දෙකකුත්, ජාති තුනකුත්, ජාති සතරකුත්, ජාති පසකුත්, ජාති දසයකුත්, ජාති විස්සකුත්, ජාති තිසකුත්, ජාති සාළිසකුත්, ජාති පණසකුත්, ජාති සියකුත්, ජාති දහසකුත්, ජාති ලක්‍ෂයකුත්, නොයෙක් වැනසෙන කල්පයනුත්, නොයෙක් වැඩෙන කල්පයනුත්, නොයෙක් වැනසෙන වැඩෙන කල්පයනුත් (සිහි කරවු ද?) 'අසුවල් තැන මෙබඳු නම් ඇත්තෙම්, මෙබඳු ගොත්‍ර ඇත්තෙම්, මෙබඳු වර්ණ ඇත්තෙම්, මෙසේ සුවදුක් විඳිනසුලු වූයෙම්, මෙසේ ආයු කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් ච්‍යුත වූයෙම් අසුවල් තැන පහළ වූයෙමි. එහි දු මෙබඳු නම් ඇත්තෙම්, මෙබඳු ගෝත්‍ර ඇත්තෙම්, මෙබඳු වර්ණ ඇත්තෙම්, මෙබඳු ආහාර ඇත්තෙම්, මෙසේ සුවදුක් විඳිනසුලු වූයෙම් මෙසේ ආයු කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් ච්‍යුත වූයෙම් මෙහි උපන්මි' යි මෙසේ ආකාර සහිත උද්දෙස සහිත නන් අයුරු වූ පෙර විසූ කඳපිළිවෙළ සිහි කරවු ද? 'ඇවැත්නි, මෙය නො වේ ම ය.'

ආයුෂ්මත්නි, තෙපි මෙසේ දන්නාහු මෙසේ දක්නාහු පිරිසිදු වූ මිනිසැස ඉක්ම පවත්නා දිවැසින් ච්‍යුත වන්නා වූ ද උපදින්නා වූ ද සත්ත්වයන් දකිවු ද? හීන වූ ද ප්‍රණීත වූ ද සුවර්ණ වූ ද දුර්වර්ණ වූ ද යහපත් ගති ඇත්තා වූ ද නපුරු ගති ඇත්තා වූ ද කම් වූ පරිදි පැමිණියා වූ ද සත්ත්වයන් දනි වූ ද, "මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තයහ. වාග්දුශ්චරිත යෙන් යුක්තයහ. මනෝ දුශ්චරිතයෙන් යුක්තයහ. ආර්‍ය්‍යයන්ට උපවාද කරන්නහු ය. මිසදිටු ගත්තහ. මිසදිටුකම් සමාදන් වූවහුය. ඔහු කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවශ ව පතිත වන නිරයට පැමිණියහ මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තයහ. වාක්සුචරිතයෙන් යුක්තයහ. මනඃසුචරිතයෙන් යුක්තයහ. ආර්‍ය්‍යයන්ට උපවාද නො කරන්නහු ය. සම්‍යග්දෘෂ්ටි ගත්තහ. සම්‍යග්දෘෂ්ටිකම් සමාදන් වූවහු ය. ඔහු කාබුන් මරණින් මතු මනා ගති ඇති ස්වර්ගලෝකයට පැමිණියහ"යි මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් ච්‍යුත වන්නා වූ ද උපදින්නා වූ ද සත්ත්වයන් දකිවු ද, හීන වූ ද ප්‍රණීත වූ ද සුවර්ණ වූ ද දුර්වර්ණ වූ ද මනා ගති ඇත්තා වූ ද නපුරු ගති ඇත්තා වූ ද කම් වූ පරිදි පැමිණියා වූ ද සත්ත්වයන් දනිවු ද? 'ඇවැත්නි, මෙය නො වේ ම ය.'

ආයුෂ්මත්නි, තෙපි මෙසේ දන්නාහු මෙසේ දක්නාහු රූපයන් ඉක්ම සිටි යම් ඒ ශාන්ත අරූප විමොක්‍ෂයෝ වෙත් නම් ඔවුන් කයින් පැහැස වෙසෙවු ද? 'ඇවැත්නි, මෙය නො වේ ම ය.' ආයුෂ්මත්නි, දැන් මෙහි මේ ප්‍රකාශය ද මේ ධර්මයන්ට නො පැමිණීම ය. ඇවැත්නි, මෙය කෙසේ වේ ද? 'ඇවැත් සුසීම, අපි (ශුෂ්ක විදර්ශකයමෝ විදර්ශනා) ප්‍රඥායෙන් ම මිදුනමෝ වම්හ' යි. ආයුෂ්මතුන් විසින් සැකෙවින් කියන ලද මෙහි අරුත විතර විසින් මම නො ම දනිමි. යම් සේ ආයුෂ්මතුන් විසින් සැකෙවින් කියන ලද මෙහි අරුත විතර විසින් මම දැන ගනනෙම් ද, ආයුෂ්මත්හු මට එසේ කියත්වා යි අයදිමි. 'ඇවැත් සුසීම, තෝ දැන ගත්තෙහි හෝ නො දැන ගත්තෙහි හෝ (වේවා.) අපි වූ කලී ප්‍රඥාමාත්‍රයෙන් ම මිදුනමෝ වම්හ' යි.

අථ ඛො ආයස්මා සුසීමො උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සුසීමො යාවතකො තෙහි භික්ඛූහි සද්ධිං අහොසි කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි.

"පුබ්බෙ ඛො සුසීම, ධම්මට්ඨිතිඤාණං, පච්ඡා නිබ්බානෙ ඤාණන්ති."

න ඛ්වාහං භන්තෙ, ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාමි. සාධු මෙ භන්තෙ, භගවා තථා භාසතු, යථාහං ඉමස්ස භගවතා[1] සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යන්ති.

"ආජානෙය්‍යාසි වා ත්වං සුසීම, න වා ත්වං ආජානෙය්‍යාසි, අථ ඛො ධම්මට්ඨිති ඤාණං පුබ්බෙ, පච්ඡා නිබ්බානෙ ඤාණං."

තඞ්කිම්මඤ්ඤසි සුසීම, රූපං නිච්චං වා අනිච්චං වාති? 'අනිච්චං භන්තෙ.' යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? 'දුක්ඛං භන්තෙ.' යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං, "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? 'නො හෙතං භන්තෙ.' වෙදනා නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ'-පෙ-සඤ්ඤා නිච්චා වා අනිච්චා වා ති? 'අනිච්චා භන්තෙ'-පෙ-සඞ්ඛාරා නිච්චා වා අනිච්චා වා ති? 'අනිච්චා භන්තෙ' -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? 'අනිච්චං භන්තෙ' යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? 'දුක්ඛං භන්තෙ.' යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම එසො'හමස්මි, එසො මෙ අත්තාති?" 'නො හෙතං භන්තෙ.'

තස්මාතිහ සුසීම, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතංසම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා අතීතානාගත පච්චුප්පන්නා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තා වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යෙ දූරෙ සන්තිකෙ වා, සබ්බෙ සඞ්ඛාරා "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං සුසීම සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති.

1. භගවන්තා -

ඉක්බිති ආයුෂ්මත් සුසීම තෙමේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් සුසීම තෙමේ ඒ භික්ෂූන් සමග යම් පමණ කථාසල්ලාපයෙක් වී ද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළකෙළේ ය.

"සුසීම, පළමු ම විදර්ශනාඥානය වේ. පසු ව මාර්ගඥානය උපදී."

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාරණ ලද මෙහි අරුත විතර විසින් මම නො ම දනිමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාරණ ලද මෙහි අරුත විතර විසින් මම යම්සේ දැන ගන්නෙම් ද, භාග්‍යවතුන් වහන්සේ මට එසේ වදාරණ සේක්වායි අයදිමි.

'සුසීම, තෝ දැන ගන්නෙහි හෝ නො දැන ගන්නෙහි හෝ (වේවා.) විදසුන් නුවණ වූ කලී පළමු ම උපදී. මඟනුවණ පසු ව උපදී.

සුසීම, ඒ කිමැ යි හඟිහි ද, රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද? 'වහන්ස, අනිත්‍ය ය.' යමක් අනිත්‍ය නම් ඒ දුක් හෝ සැප හෝ වේ ද? 'වහන්ස, දුක් ය.' යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරලෙන සුලු නම් එය "මෙය මා ගේ ය. මේ මම වෙමි. මේ මාගේ ආත්මය"යි දක්නට සුදුසු වේ ද? 'වහන්ස, මෙය නො වේ ම ය.' වෙදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද? 'වහන්ස, අනිත්‍ය ය.' ... සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ ද? 'වහන්ස, අනිත්‍ය ය' ... සංස්කාරයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද? 'වහන්ස, අනිත්‍යහ' ... විඥානය, නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද? 'වහන්ස, අනිත්‍ය ය.' යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේ ද? 'වහන්ස. දුක් ය.' යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරලෙන සුලු නම්, "එය මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම ය" යි දක්නට සුදුසු ද? 'වහන්ස, මෙය නො වේ ම ය.'

සුසීම, එහෙයින් මෙහි ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ, ඖදාරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ, හීන වූ හෝ ප්‍රණීත වූ හෝ, දුර වූ හෝ ළඟ වූ හෝ, අතීතානාගතප්‍රත්‍යුත්පන්න යම් කිසි රූපයෙක් වේ නම් ඒ සියලු රූපය "මෙය මාගේ නො වේ. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේ ය" යි මෙසේ මෙය තතු සේ මනා නුවණින් දක්ක යුතු යි. අතීතානාගත-ප්‍රත්‍යුත්පන්න වූ යම් කිසි වෙදනාවක් වේ ද ... යම් කිසි සංඥාවක් වේ ද ... ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ, ඖදාරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ, හීන වූ හෝ ප්‍රණීත වූ හෝ, දුර වූ හෝ ළඟ වූ හෝ, අතීතානාගතප්‍රත්‍යුත්පන්න යම් කිසි සංස්කාරයෝ වෙත් නම් ඒ සියලු සංස්කාරයෝ "මෙය මාගේ නො වේ. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේ ය"යි මෙසේ තතු සේ මනා නුවණින් දක්ක යුතු යි. ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ, ඖදාරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ, හීන වූ හෝ ප්‍රණීත වූ හෝ, දුර වූ හෝ ළඟ වූ හෝ යම් කිසි අතීතානාගතප්‍රත්‍යුත්පන්න විඥානයෙක් වේ නම් ඒ සියලු විඥානය "මෙය මාගේ නො වේ. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේ ය"යි මෙසේ මෙය තතු සේ මනා නුවණින් දක්ක යුතු යි.

සුසීම, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ දක්නේ රූපයෙහි ද කලකිරෙයි. වෙදනාවෙහි ද කලකිරෙයි. සංඥාවෙහි ද කලකිරෙයි. සංස්කාර-යන්හි ද කලකිරෙයි. විඥානයෙහි ද කලකිරෙයි. කලකිරෙණුයේ නො ඇලෙයි. නො ඇල්මෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේ ය යි දැන්ම වෙයි. 'ජාතිය ක්ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදි. කට යුතු කරණ ලදි මේ බැව් පිණිස අනෙකෙක් නැතැ' යි දැන ගණී.

ජාතිපච්චයා ජරාමරණන්ති සුසීම, පස්සසීති? 'එවං භන්තෙ' භවපච්චයා ජාතීති සුසීම, පස්සසීති? 'එවං භන්තෙ.' උපාදානපච්චයා භවොති සුසීම, පස්සසීති? 'එවං භන්තෙ.' තණ්හාපච්චයා උපාදානන්ති සුසීම, පස්සසීති? 'එවං භන්තෙ.' වෙදනාපච්චයා තණ්හාති -පෙ- ඵස්සපච්චයා වෙදනාති -පෙ- සළායතනපච්චයා ඵස්සොති පෙ නාමරූපපච්චයා සළායතනන්ති -පෙ- විඤ්ඤාණපච්චයා නාමරූපන්ති -පෙ- සඞ්ඛාරපච්චයා විඤ්ඤාණන්ති -පෙ- අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති සුසීම, පස්සසීති? 'එවං භන්තෙ'

ජාතිනිරොධා ජරාමරණනිරොධොති සුසීම, පස්සසීති? 'එවං භන්තෙ.' භවනිරොධා ජාතිනිරොධොති සුසීම, පස්සසීති? 'එවං භන්තෙ.' උපාදානනිරොධා භවනිරොධොති -පෙ- තණ්හානිරොධා උපාදානනිරොධොති -පෙ- වෙදනානිරොධා තණ්හානිරොධොති -පෙ- ඵස්සනිරොධා වෙදනානිරොධොති -පෙ- සළායතනනිරොධා ඵස්සනිරොධොති -පෙ- නාමරූපනිරොධා සළායතනනිරොධොති -පෙ- විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධොති -පෙ- සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධොති -පෙ- අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති සුසීම, පස්සසීති? 'එවං භන්තෙ'

අපි නු ත්වං සුසීම, එවං ජානන්තො එවං පස්සන්තො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොසි? – එකොපි හුත්වා බහුධා හොසි, බහුධාපි හුත්වා එකො හොසි, ආවිභාවං තිරොභාවං, තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡසි සෙය්‍යථාපි ආකාසෙ, පඨවියම්පි උම්මුජ්ජනිමුජ්ජං කරොසි සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභෙජ්ජමානෙ ගච්ඡසි සෙය්‍යථාපි පඨවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමසි සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිම සුරියෙ එවම්මහිද්ධිකෙ එවම්මහානුභාවෙ පාණිනා පරාමසසි පරිමජ්ජසි, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙසීති? 'නො හෙතං භන්තෙ.'

අපි නු ත්වං සුසීම, එවං ජානන්තො එවං පස්සන්තො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසකාය උභො සද්දෙ සුණාසි දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ චාති? 'නො හෙතං භන්තෙ'

අපි නු ත්වං සුසීම, එවං ජානන්තො එවං පස්සන්තො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාසි: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාසි -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාසීති? 'නො හෙතං භන්තෙ'

අපි නු ත්වං සුසීම, එවං ජානන්තො එවං පස්සන්තො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරසි: සෙය්‍යථීදං– එකම්පි ජාතිං -පෙ ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරසීති? 'නො හෙතං භන්තෙ.'

සුසීම, ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ වේ ය යි දකිහි ද? 'වහන්ස, එසේ ය.' සුසීම, භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ ය යි දකිහි ද? 'වහන්ස, එසේ ය.' සුසීම, උපාදානප්‍රත්‍යයයෙන් භවය වේ ය යි දකිහි ද? 'වහන්ස, එසේ ය.' සුසීම, තණ්හාප්‍රත්‍යයයෙන් උපාදාන වේ ය යි දකිහි ද? 'වහන්ස, එසේ ය.' වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ ය යි ... ස්පර්ශප්‍රත්‍යයයෙන් වේදනාව වේ ය යි ... ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ ය යි...නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායතන වේ ය යි ... විඥානප්‍රත්‍යයයෙන් නාමරූප වේ ය යි ... සංස්කාර-ප්‍රත්‍යයයෙන් විඥානය වේ ය යි. ... සුසීම, අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාර වේ ය යි දකිහි ද? 'වහන්ස, එසේ ය.'

සුසීම, ජාතිනිරොධයෙන් ජරාමරණ නිරොධය වේ ය යි දකිහි ද? 'වහන්ස, එසේ ය.' සුසීම, භවනිරෝධයෙන් ජාතිනිරොධය වේ ය යි දකිහි ද? 'වහන්ස, එසේ ය.' .. උපාදාන නිරෝධයෙන් භවනිරෝධය වේ ය යි ... තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධය වේ ය යි ... වෙදනා නිරෝධයෙන් තෘෂ්ණා නිරෝධය වේ ය යි ... ස්පර්ශ නිරෝධයෙන් වේදනා නිරෝධය වේ ය යි ... ෂඩායතන නිරෝධයෙන් ස්පර්ශනිරෝධය වේ ය යි ... නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වේ ය යි ... විඥාන නිරෝධයෙන් නාම රූප නිරෝධය වේ ය යි ... සංස්කාර නිරෝධයෙන් විඥාන නිරෝධය වේ ය යි ... සුසීම, අවිද්‍යා නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ ය යි දකිහි ද? 'වහන්ස, එසේ ය.'

සුසීම, තෝ මෙසේ දන්නෙහි මෙසේ දක්නෙහි නන් අයුරු වූ සෘද්ධි කොටස් විඳිහි ද? (එනම්:) එකෙක් ව බොහෝ අයුරුත් වෙහි ද, බොහෝ අයුරු ව එකෙකුත් වෙහි ද, පැණෙන බවත් නො පැණෙන බවත් (කෙරෙහි ද), අහසෙහි මෙන් බිතුසරස, පවුරුසරස, පව්සරස නො ගැටෙමින් යෙහි ද, දියෙහි මෙන් පොළොවෙහිත් මතුවීම් කිමිදුම් කෙරෙහි ද, පොළොවෙහි මෙන් නො බිඳෙන දියෙහිත් යෙහි ද, පියාපත් ඇති පක්ෂියෙකු මෙන් අහසෙහිත් පලඟින් යෙහි ද, මෙබඳු මහත් සෘද්ධි ඇති මෙබඳු මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙනත් අතින් පරාමර්ශනය කෙරෙහි ද, පිරිමදිහි ද, බඹලොව තෙක් ද කයින් වශයෙහි පවත්වහි ද? 'වහන්ස, මෙය නො වේ ම ය.'

සුසීම, තෝ මෙසේ දන්නෙහි මෙසේ දක්නෙහි පිරිසිදු වූ මිනිස් බැව් ඉක්ම සිටි දිව්‍යමය වූ ශ්‍රෝත්‍රධාතුවෙන් දෙවියන් පිළිබඳ වූත් මිනිසුන් පිළිබඳ වූත් දුර වූත් ළඟ වූත් දෙවැදෑරුම් ශබ්ද අසහි ද? 'වහන්ස, මෙය නො වේ ම ය.'

සුසීම, තෝ මෙසේ දන්නෙහි මෙසේ දක්නෙහි තම සිතින් අන් සතුන්ගේ අන් පුඟුලන්ගේ සිත පිරිසිඳ දනිහි ද? සරාග වූ හෝ සිත සරාගසිත ය යි දනිහි ද ... විමුක්ත වූ හෝ සිත විමුක්ත සිත ය යි දනිහි ද? 'වහන්ස, මෙය නො වේ ම ය.'

සුසීම, තෝ මෙසේ දන්නෙහි මෙසේ දක්නෙහි නන් අයුරු වූ පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙහි ද? කෙසේ ද යත්: එක් ජාතියකුත් ... මෙසේ ආකාර සහිත උද්දෙස සහිත නන් අයුරු වූ පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙහි ද? 'වහන්ස, මෙය නො වේ ම ය.'

අපි නු ත්වං සුසීම, එවං ජානන්තො එවං පස්සන්තො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සසි චවමානෙ උපපජ්ජමානෙ -පෙ- යථා කම්මූපගෙ සත්තෙ පජානාසීති? ‘නො හෙතං භන්තෙ.’

අපි නු ත්වං සුසීම, එවං ජානන්තො එවං පස්සන්තො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ කායෙන ඵුසිත්වා විහරසීති? ‘නො හෙතං භන්තෙ.’

එත්ථදානි සුසීම, ඉදඤ්ච වෙය්‍යාකරණං ඉමෙසඤ්ච ධම්මානං අසමාපත්ති. ඉදං නො සුසීම, කථන්ති?

අථ ඛො ආයස්මා සුසීමො භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: “අච්චයො මං භන්තෙ, අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං, යො’හං[1] එවං ස්වක්ඛාතෙ ධම්මවිනයෙ ධම්මත්ථෙනකො පබ්බජිතො. තස්ස මෙ භන්තෙ, භගවා අච්චයං අච්චයතො පතිගණ්හාතු ආයතිං සංවරායා”ති.

තග්ඝ ත්වං සුසීම, අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං, යො ත්වං එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ ධම්මත්ථෙනකො පබ්බජිතො. සෙය්‍යථාපි සුසීම, චොරං ආගුචාරිං ගහෙත්වා රඤ්ඤො දස්සෙය්‍යුං ‘අයං තෙ දෙව චොරො ආගුචාරී. ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහී’ති. තමෙනං රාජා එවං වදෙය්‍ය: “ගච්ඡථ භො ඉමං පුරිසං දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩකං[2] කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දථා”ති. තමෙනං රඤ්ඤො පුරිසා දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩකං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දෙය්‍යුං.

තං කිං මඤ්ඤසි සුසීම අපි නු සො පුරිසො තතොනිදානං දුක්ඛං දොමනස්සං[3] පටිසංවෙදයෙථාති? ‘එවං භන්තෙ.’

යං ඛො සො සුසීම, පුරිසො තතො නිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයෙථ,[4] යා ච එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ ධම්මත්ථෙනකස්ස පබ්බජ්ජා, අයං තතො දුක්ඛවිපාකතරා ච කටුකවිපාකතරා ච. අපි ච විනිපාතාය සංවත්තති. යතො ච ඛො ත්වං සුසීම, අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොසි, තං තෙ මයං පටිගණ්හාම. වුද්ධි හෙසා සුසීම, අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති, ආයතිඤ්ච සංවරං ආපජ්ජතීති.

### මහාවග්ගො සත්තමො

**තත්‍රුද්දානං:**

ද්වෙ අස්සුතවතා වුත්තා පුත්තමංසෙන චාපරං,
අත්ථිරාගො ච නගරං සම්මසනනළකලාපියං,
කොසම්බි උපයන්ති ච දසමො වුත්තො සුසීමෙනාති.*

1. යොහං - මජස. 2. ඛුරමුණ්ඩං - මජසං; සයා, PTS. 3. දුක්ඛදොමනස්සං - සයා.
4. පටිසංවෙදියෙථ - මජසං, සීමු, PTS 5. යාව - සයා

* “මක්ඛාවො අකරණීපුත්තො සාලං නාගරක සම්මසං,
නළකලාපං උදපානං සමුද්දෙ සුසීමෙන චා”ති.
ඉති ලිඛිත පොත්ථකෙසු.

සුසීම, තෝ මෙසේ දන්නෙහි මෙසේ දක්නෙහි පිරිසිදු වූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් ච්‍යුත වන්නා වූ ද උපදින්නා වූ ද සත්ත්වයන් දකිහි ද... කම් වූ පරිදි පැමිණි සත්ත්වයන් දනිහි ද? 'වහන්ස, මෙය නො වේ ම ය.'

සුසීම, තෝ මෙසේ දන්නෙහි මෙසේ දක්නෙහි රූපයන් ඉක්මවා සිටි යම් ඒ ශාන්ත අරූප විමොක්ෂයෝ වෙත් නම් ඔවුන් කයින් පැහැස වෙසෙහි ද? 'වහන්ස, මෙය නො වේ මැ යි.'

සුසීම, දැන් මෙහි මේ ප්‍රකාශය ද මේ ධර්මයන්ට නො පැමිණීම ය. සුසීම, මෙය කෙසේ වේ ද?

එකල්හි ආයුෂ්මත් සුසීම තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පා ලඟ හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: වහන්ස, "යම්බඳු මම මෙසේ ස්වාඛ්‍යාත වූ ශාසනයෙහි දහම්සොරෙකුව පැවිදි වූයෙම් ද, බාලයකු මෙන් මෝඩයෙකු මෙන් අදක්ෂයකු මෙන් වරද ඒ මා ඉක්ම ගියේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඒ මාගේ වරද ආයති සංවරය පිණිස වරද වශයෙන් පිළිගන්නා සේක් වා" යි.

සුසීම, යම්බඳු තෝ මෙසේ ස්වාඛ්‍යාත වූ ශාසනයෙහි දහම්සොරෙකු ව පැවිදි වූයෙහි ද, බාලයකු මෙන් මෝඩයෙකු මෙන් අදක්ෂයකු මෙන් වරද ඒකාන්තයෙන් තා ඉක්ම ගියේ ය.

සුසීම, යම් සේ අපරාධකාරී සොරකු ගෙණ "දේවයන් වහන්ස, මේ ඔබ වහන්සේට අපරාධ කළ සොරෙකි. මොහුට යම් දණ්ඩනයක් රිසියෙහි නම් පණවනු මැනවැ"යි රජුට දක්වන්නාහු ද, රජ තෙමේ ඒ ඔහුට මෙසේ කියන්නේ ය: "පින්වත්නි, යවු. මේ පුරුෂයා දැඩිරැහැණින් පිටිතල හයා දැඩි බැම්මෙන් බැඳ ක්ෂුරයෙන් හිස මුඩු කොට රළු හඬැති පණාබෙරින් වීදියෙන් වීදියට සිවුමංසලින් සිවුමංසලට පමුණුවා දකුණු දෙරින් නික්මවා නුවර දකුණු පසෙහි දී හිස ගසා ලවු"යි. රාජපුරුෂයෝ ඒ ඔහු දැඩි රැහැණින් පිටිතල හයා දැඩි බැම්මෙන් බැඳ ක්ෂුරයෙන් හිස මුඩු කොට රළුහඬ ඇති පණාබෙරින් වීදියෙන් වීදියට සිවුමංසලින් සිවුමංසලට පමුණුවා දකුණු දෙරින් නික්මවා නුවර දකුණු පසෙහි දී හිස සිඳින්නාහු ය.

සුසීම, ඒ කිමැයි හඟිහි ද, ඒ පුරුෂ තෙමේ ඒ හේතු කොට දුකක් දොම්නසක් විඳින්නේ දැයි? 'වහන්ස, එසේ ය.'

සුසීම, ඒ පුරුෂ තෙමේ ඒ හේතුවෙන් යම්බඳු දුකක් දොම්නසක් විඳින්නේ ද, මෙසේ ස්වාඛ්‍යාත වූ ශාසනයෙහි දහම්සොරකුගේ යම් පැවිද්දක් වේ ද, මේ පැවිද්ද ඒ දුකට වඩා අතිශයින් දුක්විපාක ඇත්තේ ද, අතිශයින් කටුක විපාක ඇත්තේ ද වෙයි. වැලිදු නිරය පිණිස ද පවතී. සුසීම, යම් හෙයකින් තෝ වරද වරද වශයෙන් දැක දහම් වූ පරිදි පිළියම් කෙරෙහි ද, තාගේ ඒ වරද අපි පිළිගණුම්හ. සුසීම, යමෙක් වරද වරද වශයෙන් දැක දහම් වූ පරිදි පිළියම් කෙරේ නම් ආයති සංවරයටත් පැමිණේ නම් ආර්‍ය්‍යවිනයෙහි මේ වැඩීමෙක් ම ය.

**මහාවර්ගය සත් වැනි යි.**

එහි උද්දානය:

අසුතවන්තු සූත්‍ර දෙක ද, පුත්තමංස, අත්ථිරාග, නගර, සම්මසන, නළකලාපි, කොසම්බි, උපයන්ති, සුසීම, සූත්‍ර ද යි සූත්‍ර දශයෙකි.

# 8. සමණබ්‍රාහමණවග්ගො

## 1. 8. 1.

### ජරාමරණසුත්තං

71. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තත්‍ර ඛො භගවා -පෙ- එතදවොච:

යෙ හි කෙ චි භික්ඛවෙ, සමණා වා බ්‍රාහමණා වා ජරාමරණං නප්පජානන්ති, ජරාමරණසමුදයං නප්පජානන්ති, ජරාමරණනිරොධං නප්පජානන්ති, ජරාමරණනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති. න මෙතෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහමණා වා සමණෙසු වා සමණ සම්මතා, බ්‍රාහමණෙසු වා බ්‍රාහමණසම්මතා, න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහමඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහමණා වා ජරාමරණං පජානන්ති, ජරාමරණසමුදයං පජානන්ති, ජරාමරණනිරොධං පජානන්ති, ජරාමරණනිරොධගාමිනිං පටිපදං පජානන්ති. තෙ ඛොමෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහමණා වා සමණෙසු චෙව සමණසම්මතා, බ්‍රාහමණෙසු ච බ්‍රාහමණසම්මතා. තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහමඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 1. 8. 2.

### ජාතිසුත්තං

72. [යෙ හි කෙචි -පෙ-] ජාතිං නප්පජානන්ති -පෙ- [යෙ ච ඛො කෙචි -පෙ- ජාතිං පජානන්ති -පෙ-]

## 1. 8. 3.

### භවසුත්තං

73 [යෙ හි කෙචි -පෙ-] භවං නප්පජානන්ති -පෙ- [යෙ ච ඛො කෙචි -පෙ- භවං පජානන්ති -පෙ-]

## 1. 8. 4.

### උපාදානසුත්තං

74 [යෙ හි කෙචි -පෙ-] උපාදානං නප්පජානන්ති -පෙ- [යෙ ච ඛො කෙචි -පෙ- උපාදානං පජානන්ති -පෙ-]

## 1. 8. 5.

### තණ්හාසුත්තං

75. [යෙ හි කෙචි -පෙ-] තණ්හං නප්පජානන්ති -පෙ- [යෙ ච ඛො කෙචි -පෙ- තණ්හං පජානන්ති -පෙ-]

# 8. සමණබ්‍රාහමණවර්ගය

## 1. 8. 1

## ජරාමරණ සූත්‍රය

71. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩවසන සේක එහි දී භාග්‍යවතුන් වහන්සේ ... මෙය වදාළ සේක:

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ නො දනිත් ද, ජරාමරණ සමුදය නො දනිත් ද, ජරාමරණ නිරෝධය නො දනිත් ද, ජරාමරණ නිරෝධගාමිනී ප්‍රතිපදාව නො දනිත් ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහමණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි දු ශ්‍රමණයෝ ය යි සම්මත නො වෙති. බ්‍රාහමණයන් කෙරෙහි දු බ්‍රාහමණයෝ ය යි සම්මත නො වෙති. ඒ ආයුෂ්මත්හු මහණ දමෙහි ඵලය හෝ බමුණු දමෙහි ඵලය හෝ මේ අත්බැව්හි තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ඊට පැමිණ වාසය නො කෙරෙති.

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ දනිත් ද, ජරාමරණසමුදය දනිත් ද, ජරාමරණනිරෝධය දනිත් ද, ජරාමරණනිරෝධගාමිනීප්‍රතිපදාව දනිත් ද, මහණෙනි, ඒ මහණෝ හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහි දු මහණෝ ය යි සම්මත වෙති. බමුණන් කෙරෙහි දු බමුණෝ ය යි සම්මත වෙති. ඒ ආයුෂ්මත්හු මහණදමේ ඵලයත් බමුණු දමෙහි ඵලයත් මේ අත්බැව්හි තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ඊට පැමිණ වෙසෙති යි.

## 1. 8. 2.

## ජාති සූත්‍රය

72. යම් කිසි ... කෙනෙක් ජාතිය නො දනිද්ද ... යම් කිසි ... කෙනෙක් ජාතිය දනිත්ද..

## 1. 8. 3

## භව සූත්‍රය

73. යම් කිසි ... කෙනෙක් භවය නො දනිද්ද ... යම් කිසි ... කෙනෙක් භවය දනිද්ද ...

## 1. 8. 4

## උපාදාන සූත්‍රය

74. යම් කිසි ... කෙනෙක් උපාදානය නො දනිද්ද ... යම් කිසි ... කෙනෙක් උපාදානය දනිද්ද

## 1. 8. 5

## තණ්හා සූත්‍රය

75. යම් කිසි ... කෙනෙක් තණ්හාව නො දනිද්ද ... යම් කිසි ... කෙනෙක් තණ්හාව දනිද්ද ...

## 1. 8. 6.

### වෙදනාසුත්තං

76. [යෙ හි කෙචි -පෙ-] වෙදනං නප්පජානන්ති -පෙ- [යෙ ච ඛො කෙචි -පෙ- වෙදනං පජානන්ති -පෙ-]

## 1. 8. 7.

### ඵස්සසුත්තං

77. [යෙ හි කෙචි -පෙ-] ඵස්සං නප්පජානන්ති -පෙ- [යෙ ච ඛො කෙචි -පෙ- ඵස්සං පජානන්ති -පෙ-]

## 1. 8. 8.

### සළායතනසුත්තං

78. [යෙ හි කෙචි -පෙ-] සළායතනං නප්පජානන්ති -පෙ- [යෙ ච ඛො කෙචි -පෙ- සළායතනං පජානන්ති -පෙ-]

## 1. 8. 9.

### නාමරූපසුත්තං

79. [යෙ හි කෙචි -පෙ-] නාමරූපං නප්පජානන්ති -පෙ- [යෙ ච ඛො කෙචි -පෙ- නාමරූපං පජානන්ති -පෙ-]

## 1. 8. 10.

### විඤ්ඤාණසුත්තං

80. [යෙ හි කෙචි -පෙ-] විඤ්ඤාණං නප්පජානන්ති -පෙ- [යෙ ච ඛො කෙචි -පෙ- විඤ්ඤාණං පජානන්ති -පෙ-]

## 1. 8. 11.

### සඞ්ඛාරසුත්තං

81. [යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා] සඞ්ඛාරෙ නප්පජානන්ති, සඞ්ඛාරසමුදයං නප්පජානන්ති, සඞ්ඛාරනිරොධං නප්ප-ජානන්ති, සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති -පෙ- [න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ] සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

[යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සඞ්ඛාරෙ පජානන්ති -පෙ- තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති]

**සමණබ්‍රාහ්මණවග්ගො අට්ඨමො.**

**තත්‍රුද්දානං:**

පච්චයෙකාදස වුත්තා චතුසච්චවිභජ්ජනා,
සමණබ්‍රාහ්මණවග්ගො අභිසමයෙහවත්තට්ඨමො [1]

---

1 නිදානෙ භවති අට්ඨමං සී. - මජ්ඣං. නිදානං - සනා. අට්ඨමං - සනා, PTS

## 1. 8. 6

### වේදනා සූත්‍රය

76. යම් කිසි ... කෙනෙක් වේදනාව නො දනිද්ද ... යම් කිසි ... කෙනෙක් වේදනාව දනිද් ද ...

## 1. 8. 7

### ඵස්ස සූත්‍රය

77. යම් කිසි ... කෙනෙක් ඵස්සය නො දනිද්ද ... යම් කිසි ... කෙනෙක් ඵස්සය දනිද් ද ...

## 1: 8. 8

### සළායතන සූත්‍රය

78. යම් කිසි ... කෙනෙක් සළායතන නො දනිද්ද ... යම් කිසි ... කෙනෙක් සළායතන දනිද් ද ...

## 1. 8. 9

### නාමරූප සූත්‍රය

79. යම් කිසි .. කෙනෙක් නාමරූප නො දනිද්ද ... යම් කිසි කෙනෙක් නාමරූප දනිද් ද ...

## 1. 8. 10

### විඤ්ඤාණ සූත්‍රය

80. යම් කිසි ... කෙනෙක් විඤ්ඤාණය නො දනිද්ද ... යම් කිසි ... කෙනෙක් විඤ්ඤාණය දනිද් ද ...

## 1. 8. 11

### සඞ්ඛාර සූත්‍රය

81. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ සඞ්ඛාර නො දනිද්ද, සඞ්ඛාරසමුදය නො දනිද්ද, සඞ්ඛාරනිරෝධය නො දනිද්ද .... සඞ්ඛාරනිරෝධගාමිනී ප්‍රතිපදාව නො දනිද්ද ... ඒ ආයුෂමත්හු මහණදම්හි ඵලය හෝ බමුණුදම්හි ඵලය හෝ මේ අත්බැව්හි තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ඊට පැමිණ වාසය නො කෙරෙති.

මහණෙනි, යම් කිසි මහණකෙනෙක් හෝ බමුණුකෙනෙක් හෝ සඞ්ඛාර දනිද් ද, ... ඒ ආයුෂමත්හු මහණදම්හි ඵලයත් බමුණුදම්හි ඵලයත් මේ අත්බැව්හි තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ඊට පැමිණ වෙසෙති යි.

**සමණබ්‍රාහමණවර්ගය අටවැනි යි.**

**එහි උද්දානය:**

සිවුසස් බෙදීමෙන් (ජරාමරණාදි) පච්චය සූත්‍ර එකොළොසෙක් වදාරණ ලදි. අභිසමයසංයුත්තයෙහි සමණබ්‍රාහමණවර්ගය අටවැන්න වන්නේ යි.

# 9. අන්තරපෙය්‍යාලො

## 1. සත්ථුවග්ගො

### 1. 9. 1. 1

### ජරාමරණසුත්තං

82. සාවත්ථියං-

ජරාමරණං භික්ඛවෙ, අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය සත්ථා පරියෙසිතබ්බො. ජරාමරණසමුදයං අජානතා අපස්සතා යථාභූතං ජරාමරණසමුදයෙ යථාභූතංඤාණාය සත්ථා පරියෙසිතබ්බො. ජරාමරණනිරොධං අජානතා අපස්සතා යථාභූතං ජරාමරණනිරොධෙ යථාභූතංඤාණාය සත්ථා පරියෙසිතබ්බො ජරාමරණනිරොධගාමිනිං පටිපදං අජානතා අපස්සතා යථාභූතං ජරාමරණනිරොධගාමිනියා පටිපදාය යථාභූතංඤාණාය සත්ථා පරියෙසිතබ්බොති.

(සබ්බෙසං පෙය්‍යාලො එවං විත්ථාරෙතබ්බොති)

### 1. 9. 1. 2

### ජාතිසුත්තං

83. ජාතිං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං -පෙ- [යථාභූතංඤාණාය] සත්ථා පරියෙසිතබ්බොති

### 1. 9. 1. 3

### භවසුත්තං

84. භවං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං -පෙ- [යථාභූතංඤාණාය] සත්ථා පරියෙසිතබ්බොති.

### 1. 9. 1. 4

### උපාදානසුත්තං

85. උපාදානං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං -පෙ- [යථාභූතංඤාණාය] සත්ථා පරියෙසිතබ්බොති.

### 1 9 1 5

### තණ්හාසුත්තං

86. තණ්හං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං -පෙ- [යථාභූතංඤාණාය] සත්ථා පරියෙසිතබ්බොති.

# 9. අන්තරපෙය්‍යාලය

## 1. සත්‍ථු වර්ගය

### 1. 9. 1. 1

### ජරාමරණ සූත්‍රය

82. **සැවැත්නුවර-**

මහණෙනි, ජරාමරණ තතු සේ නො දන්නහු විසින් නො දක්නහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස (මාර්ගඥතදයි) ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ ය. ජරාමරණසමුදය තතු සේ නො දන්නහු විසින් නො දක්නහු විසින් ජරාමරණසමුදයෙහි තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ ය. ජරාමරණ නිරෝධය තතු සේ නො දන්නහු විසින් නො දක්නහු විසින් ජරාමරණ නිරෝධයෙහි තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ ය. ජරාමරණ නිරෝධගාමිනීප්‍රතිපදාව තතු සේ නො දන්නහු විසින් නො දක්නහු විසින් ජරාමරණනිරෝධගාමිනීප්‍රතිපදාවෙහි තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි.

(සියල්ල පිළිබඳ පෙය්‍යාලය මෙසේ විස්තර කට යුතු.)

### 1. 9. 1. 2

### ජාති සූත්‍රය

83. මහණෙනි, ජාතිය තතු සේ නො දන්නහු විසින් නො දක්නහු විසින් ... තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි.

### 1. 9. 1. 3

### භව සූත්‍රය

84. මහණෙනි, භවය තතු සේ නො දන්නහු විසින් නො දක්නහු විසින් ... තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි.

### 1. 9. 1. 4

### උපාදාන සූත්‍රය

85. මහණෙනි, උපාදාන තතු සේ නො දන්නහු විසින් නො දක්නහු විසින් ... තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි.

### 1. 9. 1. 5

### තණ්හා සූත්‍රය

86. මහණෙනි, තණ්හාව තතු සේ නො දන්නහු විසින් නො දක්නහු විසින් ... තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි.

### 1. 9. 1. 6

### වෙදනාසුත්තං

87. වෙදනං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං -පෙ- [යථාභූතං-ඤාණාය] සත්ථා පරියෙසිතබ්බොති.

### 1. 9. 1. 7

### ඵස්සසුත්තං

88. ඵස්සං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං -පෙ- [යථාභූතං-ඤාණාය] සත්ථා පරියෙසිතබ්බොති.

### 1. 9. 1. 8

### සළායතනසුත්තං

89 සළායතනං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං-පෙ-[යථාභූතං-ඤාණාය] සත්ථා පරියෙසිතබ්බොති.

### 1. 9. 1. 9

### නාමරූපසුත්තං

90. නාමරූපං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං-පෙ-[යථාභූතං-ඤාණාය] සත්ථා පරියෙසිතබ්බොති.

### 1. 9. 1. 10

### විඤ්ඤාණසුත්තං

91. විඤ්ඤාණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං-පෙ-[යථාභූතං-ඤාණාය] සත්ථා පරියෙසිතබ්බොති.

### සඞ්ඛාරසුත්තං

### 1. 9. 1. 11

92. සඞ්ඛාරෙ භික්ඛවෙ, අජානතා අපස්සතා යථාභූතං සඞ්ඛාරෙසු යථාභූතංඤාණාය සත්ථා පරියෙසිතබ්බො. සඞ්ඛාරසමුදයං අජානතා අපස්සතා යථාභූතං සඞ්ඛාරසමුදයෙ යථාභූතංඤාණාය සත්ථා පරියෙසිතබ්බො. සඞ්ඛාරනිරොධං අජානතා අපස්සතා යථාභූතං සඞ්ඛාරනිරොධෙ යථාභූතං-ඤාණාය සත්ථා පරියෙසිතබ්බො. සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං අජානතා අපස්සතා යථාභූතං සඞ්ඛාරනිරොධගාමිනියා පටිපදාය යථාභූතංඤාණාය සත්ථා පරියෙසිතබ්බොති.

(සබ්බෙසං චතුසච්චිකං කාතබ්බං.)

## 1. 9. 1. 6

### වේදනා සූත්‍රය

87. මහණෙනි, වේදනාව තතු සේ නො දත්තහු විසින් නො දක්නහු විසින් ... තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි.

## 1. 9. 1. 7

### ඵස්ස සූත්‍රය

88 මහණෙනි, ඵස්සය තතු සේ නො දත්තහු විසින් නො දක්නහු විසින් ... තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි.

## 1. 9. 1. 8

### සළායතන සූත්‍රය

89. මහණෙනි, සළායතන තතු සේ නො දත්තහු විසින් නො දක්නහු විසින් ... තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි.

## 1. 9. 1. 9

### නාමරූප සූත්‍රය

90 මහණෙනි, නාමරූප තතු සේ නො දත්තහු විසින් නො දක්නහු විසින් ... තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි.

## 1. 9. 1. 10

### විඤ්ඤාණ සූත්‍රය

91. මහණෙනි, විඤ්ඤාණය තතු සේ නො දත්තහු විසින් නො දක්නහු විසින් ... තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි.

## 1. 9. 1. 11

### සඞ්ඛාර සූත්‍රය

92. මහණෙනි, සංස්කාරයන් තතු සේ නො දත්තහු විසින් නො දක්නහු විසින් සංස්කාරයන්හි තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ ය. සංස්කාරසමුදය තතු සේ නො දත්තහු විසින් නො දක්නහු විසින් සංස්කාරසමුදයෙහි තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ ය. සංස්කාර නිරෝධය තතු සේ නො දත්තහු විසින් නො දක්නහු විසින් සංස්කාර නිරෝධයෙහි තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ ය. සංස්කාර නිරෝධගාමිනී ප්‍රතිපදාව තතු සේ නො දත්තහු විසින් නො දක්නහු විසින් සංස්කාරනිරෝධගාමිනී ප්‍රතිපදාවෙහි තතු සේ දැනීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේ යි

(සියල්ල චතුස්සත්‍යයෙන් යුක්ත කට යුතු යි.)

## 2 සික්ඛාවග්ගො

### 1. 9. 2. 1 - 11.

### ජරාමරණාදිසුත්තානි

93 - 103. ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය සික්ඛා කරණීයාති. ( පෙය්‍යාලො.)

(චතුසච්චිකං කාතබ්බං.)

## 3. යොගවග්ගො

### 1. 9. 3. 1-11

### ජරාමරණාදිසුත්තානි

104 - 114. [ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය] යොගො කරණීයොති.

## 4. ඡන්දවග්ගො

### 1. 9. 4. 1-11.

### ජරාමරණාදිසුත්තානි

115 - 125. [ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය] ඡන්දො කරණීයොති

## 5. උස්සොළ්හිවග්ගො

### 1. 9. 5. 1-11.

### ජරාමරණාදිසුත්තානි

126 - 136. [ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය] උස්සොළ්හී කරණීයාති:

## 6. අප්පටිවානිවග්ගො

### 1. 9. 6. 1-11.

### ජරාමරණාදිසුත්තානි

137 - 147. [ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය] අප්පටිවානී කරණීයාති

## 7. ආතප්පවග්ගො

### 1. 9. 7. 1-11.

### ජරාමරණාදිසුත්තානි

148 - 158. [ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය] ආතප්පං කරණීයන්ති.

## 2. සික්ඛා වර්ගය

### 1. 9. 2. 1-11

### ජරාමරණාදි සූත්‍ර

93-103 මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස (ත්‍රිවිධ) ශික්ෂාව කට යුතු සි. (පෙය්‍යාල සි.)

(චතුස්සත්‍යයෙන් යුක්ත කට යුතු සි.)

## 3. යොග වර්ගය

### 1 9. 3. 1-11

### ජරාමරණාදි සූත්‍ර

104-114. [මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස] යෙදීම කට යුතු සි

## 4. ඡන්ද වර්ගය

### 1. 9. 4. 1-11

### ජරාමරණාදි සූත්‍ර

115-125. [මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස] කත්තුකම්‍යතා කුසලච්ඡන්දය කට යුතු සි.

## 5. උස්සොළ්හි වර්ගය

### 1. 9. 5. 1-11

### ජරාමරණාදි සූත්‍ර

126-136. [මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස] අධිමාත්‍ර වීර්‍ය්‍යය කට යුතු සි.

## 6. අප්පටිවානි වර්ගය

### 1. 9. 6 1-11

### ජරාමරණාදි සූත්‍ර

137-147. මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස] නො පසු බස්නා වීර්‍ය්‍යය කට යුතු සි.

## 7. ආතප්ප වර්ගය

### 1. 9. 7. 1-11

### ජරාමරණාදි සූත්‍ර

148-158. [මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස] කෙලෙස් තවන වීර්‍ය්‍යය කට යුතු සි

### 8. විරියවග්ගො

### 1. 9. 8. 1-11.

### ජරාමරණාදිසුත්තානි

159 – 169. [ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය] විරියං කරණීයන්ති.

### 9. සාතච්චවග්ගො

### 1. 9. 9. 1-11.

### ජරාමරණාදිසුත්තානි

170 – 180. [ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය] සාතච්චං කරණීයන්ති.

### 10. සතිවග්ගො

### 1. 9. 10. 1-11.

### ජරාමරණාදිසුත්තානි

181 – 191. [ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය] සති කරණීයාති.

### 11. සම්පජඤ්ඤවග්ගො

### 1. 9. 11. 1-11.

### ජරාමරණාදිසුත්තානි

192 – 202. [ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය] සම්පජඤ්ඤං කරණීයන්ති.

### 12. අප්පමාදවග්ගො

### 1. 9. 12. 1-11

### ජරාමරණාදිසුත්තානි

203 – 213. [ජරාමරණං භික්ඛවෙ අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතංඤාණාය] අප්පමාදො කරණීයොති.

**අන්තරපෙය්‍යාලො නවමො.**

**තත්‍ර වග්ගුද්දානං:**

සත්ථා සික්ඛා ච යොගො ච ඡන්දො උස්සොළ්හි පඤ්චමී,
අප්පටිවානී ආතප්පං විරියං සාතච්චමුච්චති.
සති ච සම්පජඤ්ඤඤ්ච අප්පමාදෙන ද්වාදසාති.*

**සුත්තන්තා අන්තරපෙය්‍යාලං නිට්ඨිතා.**

වග්ගා තෙ ද්වාදස හොන්ති සුත්තා ද්වත්තිංස සතානි ච,
චතුසච්චෙන තෙ වුත්තා පෙය්‍යාලෙ අන්තරම්හි යෙති

---

* තෙසු ද්වාදසසුපි වග්ගෙසු එකාදස එකාදස සුත්තන්තා භවන්ති. තෙ ජරාමරණ ජාති භව උපාදන තණ්හා වෙදනා ඵස්ස සළායතන නාමරූප විඤ්ඤාණ සඞ්ඛාර නාමෙහෙව ගහෙතබ්බා. "පච්චයෙකාදස වුත්තා චතුසච්චවිභජ්ජනා" ඉති සබ්බත්ථ යථාරූපං උද්ධතං කාතබ්බන්ති.

## 8. විරිය වග්ගය

### 1. 9. 8. 1–11

### ජරාමරණාදි සූත්‍ර

159–169. [මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස වීර්‍ය්‍යය කට යුතු යි.

## 9. සාතච්ච වග්ගය

### 1. 9. 9. 1–11

### ජරාමරණාදි සූත්‍ර

170–180 [මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස සතතක්‍රියා කට යුතු යි.

## 10. සති වග්ගය

### 1. 9. 10. 1–11

### ජරාමරණාදි සූත්‍ර

181–191. [මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස (චතුස්සත්‍යපරිග්‍රාහක) සිහිය කට යුතු යි.

## 11. සම්පජඤ්ඤ වග්ගය

### 1. 9. 11. 1–11

### ජරාමරණාදි සූත්‍ර

192–202. [මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස (චතුස්සත්‍යපරිග්‍රාහක) ඥානය කට යුතු යි.

## 12. අප්පමාද වග්ගය

### 1 9. 12 1 11

### ජරාමරණාදි සූත්‍ර

203–213. [මහණෙනි, ජරාමරණ තතු සේ නො දත්තහු විසින් නො දක්තහු විසින් ජරාමරණයෙහි තතු සේ දැනීම පිණිස (සත්‍යභාවනායෙහි) අප්‍රමාදය කට යුතු යි.

**අන්තර පෙය්‍යාලය නව වැනි යි.**

**එහි වග්ග නාමාවලිය:**

සත්ථු, සික්ඛා, යොග, ඡන්ද, උසොළ්හි, අප්පටිවානී, ආතප්ප, විරිය, සාතච්ච, සති, සම්පජඤ්ඤ, අප්පමාද යි (පෙය්‍යාල වග්ග) දොළොසෙකි යි.*

**අන්තරපෙය්‍යාල සූත්‍රාන්තයෝ නිමියහ.**

ඔහු වග්ග දොළොසෙකි. සූත්‍ර එක්සිය දෙතිසෙක් වේ. අන්තර පෙය්‍යාලයෙහි යම් සූත්‍රයෝ වෙද්ද, ඔහු චතුස්සත්‍ය විභාගයෙන් කියන ලදහ යි.

---

* ඒ වග්ග දොළොසෙහි ම සූත්‍ර එකොළොස බැගින් වේ. ඔහු ජරාමරණ, ජාති, භව, උපාදාන, තණ්හා, වෙදනා, ඵස්ස, සළායතන, නාමරූප, විඤ්ඤාණ, සඞ්ඛාර යන නම්වලින් ම ගත යුතුහ. "සිවුසස් බෙදීමෙන් (ජරාමරණාදි) පච්චය සූත්‍ර එකොළොසෙක් වදරණ ලදී" යි. සියලු තැන්හි සුදුසු පරිදි උදෘතය කට යුතු ය.

# 10. අභිසමයවග්ගො

## 1. 10. 1

## නඛසිඛාසුත්තං

214. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො භගවා පරිත්තං නඛසිඛායං පංසුං ආරොපෙත්වා භික්ඛූ ආමන්තෙසි: තඞ්කිම්මඤ්ඤථ භික්ඛවෙ, කතමන්නු ඛො බහුතරං යො වායං මයා[1] පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො, අයං වා මහාපඨවීති.?

එතදෙව භන්තෙ බහුතරං යදිදං මහාපඨවි, අප්පමත්තකො නඛසිඛායං භගවතා පරිත්තො පංසු ආරොපිතො. නෙව සතිමං කලං උපෙති, න සහස්සිමං කලං උපෙති, න සතසහස්සිමං කලං උපෙති, 'මහාපඨවිං උපනිධාය භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතොති.

එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස අභිසමෙතාවිනො එතදෙව බහුතරං දුක්ඛං යදිදං පරික්ඛීණං පරියාදින්නං, අප්පමත්තකං අවසිට්ඨං. නෙව සතිමං කලං උපෙති, න සහස්සිමං කලං උපෙති, න සතසහස්සිමං කලං උපෙති, පුරිමං දුක්ඛක්ඛන්ධං පරික්ඛීණං පරියාදින්නං උපනිධාය යදිදං සත්තක්ඛත්තුං පරමතා.[2]

එවං මහත්ථියො ඛො භික්ඛවෙ ධම්මාභිසමයො, එවං මහත්ථියො[3] ධම්මචක්ඛුපටිලාභොති.

## 1. 10. 2.

## පොක්ඛරණීසුත්තං

215. **සාවත්ථියං-**

සෙය්‍යථාපි භික්ඛවෙ, පොක්ඛරණී පඤ්ඤාසයොජනානි ආයාමෙන පඤ්ඤාසයොජනානි විත්ථාරෙන පඤ්ඤාසයොජනානි උබ්බෙධෙන පුණ්ණා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා. තතො පුරිසො කුසග්ගෙන උදකං උද්ධරෙය්‍ය, තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛො බහුතරං යං වා කුසග්ගෙන උදකං උබ්භතං, යං වා පොක්ඛරණියා උදකන්ති.?

එතදෙව භන්තෙ බහුතරං යදිදං පොක්ඛරණියා උදකං. අප්පමත්තකං කුසග්ගෙන උදකං උබ්භතං. නෙව සතිමං කලං උපෙති, න සහස්සිමං කලං උපෙති, න සතසහස්සිමං කලං උපෙති, පොක්ඛරණියා උදකං උපනිධාය කුසග්ගෙන උදකං උබ්භතන්ති.

---

1. යොවායං - සීමු, PTS, සයා. 2. සත්තක්ඛත්තුපරමතා - සයා. 3. මහිද්ධියො - සීමු.

# 10. අභිසමයවග්ගය

## 1. 10. 1.

### නඛසිඛාසූත්‍රය

214. මා විසින් මෙසේ අසන ලදි: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ නියසිළෙහි පස් බුදක් තගා භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද, කිමෙක් ඉබොහෝ ද, මා විසින් නියසිළෙහි තගන ලද යම් මේ පස් බුද හෝ මේ මහපොළොව හෝ දැ? යි.

වහන්ස, යම් මේ මහපොළොව වේ ද, මෙය ම ඉබොහෝ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් නියසිළෙහි තගන ලද පස්බුද ඉමද ය. මහපොළොව හා සැසඳීමෙහි දී භාග්‍යවතුන් වහන්සේ විසින් නියසිළෙහි තගන ලද පස්බුද සිය වන කලාවටත් නො ම පැමිණේ. දහස්වන කලාවටත් නො ම පැමිණෙයි. සියදහස්වන කලාවටත් නො ම පැමිණේ.

මහණෙනි, එපරිද්දෙන් ම සිවුසස් අවබෝධ කළ දෘෂ්ටිසම්පන්න ආර්‍ය්‍ය-ශ්‍රාවක පුද්ගලයා විසින් යම් මේ දුකෙක් ක්‍ෂය කරණ ලද ද, අවසන් කරණ ලද ද, මෙය ම ඉබොහෝ ය. ඉතිරි වූ දුක ඉමද ය. සත්වරක් ඉපදීම තිම් කොට ඇති යම් මේ දුකෙක් වේ ද, එය ක්‍ෂය කරණ ලද අවසන් කරණ ලද පළමු දුක්රැස හා සැසඳීමෙහි දී සිය වන කලාවටත් නො ම පැමිණේ. දහස් වන කලාවටත් නො ම පැමිණේ. සියදහස් වන කලාවටත් නො ම පැමිණෙ යි.

මහණෙනි, ධර්මාවබෝධය මෙසේ මහදර්‍ථයක් නිපදවන්නේ ය, දහම් ඇස (සෝවන්පෙල) පිළිලැබීම මෙසේ මහදර්‍ථයක් නිපදවන්නේ වේ යි.

## 1. 10. 2.

### පොක්ඛරණීසූත්‍රය

215. සැවැත්නුවර-

මහණෙනි, යම් සේ අයමින් පණස්යොදනක් ඇති විතරින් පණස් යොදනක් ඇති ගැඹරින් පණස්යොදනක් ඇති දියෙන් පිරුණු මුවවට සම වූ කවුඩන් විසින් පිය හැකි පොකුණක් වේ ද, පුරුෂයෙක් තෙමේ ඒ පොකුණෙන් කුසතණ අගින් දිය තගන්නේ ය. මහණෙනි, ඒ කිමැයි හඟිවූ ද, කිමෙක් ඉබොහෝ ද, කුසතණඅගින් තගන ලද යම් දියෙක් හෝ පොකුණෙහි වූ යම් දියෙක් හෝ දැ යි?

වහන්ස, පොකුණෙහි වූ යම් මේ දියෙක් වේ ද, මෙය ම ඉබොහෝ ය. කුසතණ අගින් තගන ලද දිය ඉමද ය. පොකුණෙහි දිය හා සැසඳී-මෙහි දී කුසතණ අගින් තගන ලද දිය සියවන කලාවටත් නො ම පැමිණෙ යි. දහස්වන කලාවටත් නො ම පැමිණෙ යි. සියදහස්වන කලාවටත් නො ම පැමිණේ.

එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස අභිසමෙතාවිනො එතදෙව බහුතරං දුක්ඛං යදිදං පරික්ඛීණං පරියාදින්නං, අප්පමත්තකං අවසිට්ඨං. නෙව සතිමං කලං උපෙති, න සහස්සිමං කලං උපෙති, න සතසහස්සිමං කලං උපෙති, පුරිමං දුක්ඛක්ඛන්ධං පරික්ඛීණං පරියාදින්නං උපනිධාය යදිදං සත්තක්ඛත්තුං පරමතා.

එවං මහත්ථියො ඛො භික්ඛවෙ, ධම්මාභිසමයො, එවං මහත්ථියො ධම්මචක්ඛුපටිලාභොති.

## 1. 10. 3.

## සම්භෙජ්ජඋදකසුත්තං

216. සාවත්ථියං-

සෙය්‍යථාපි භික්ඛවෙ, යත්ථිමා මහානදියො සංසන්දන්ති සමෙන්ති, සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී. තතො පුරිසො ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උද්ධරෙය්‍ය. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛො බහුතරං යානි වා ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උබ්භතානි, යං වා සම්භෙජ්ජ උදකන්ති.?

එතදෙව භන්තෙ, බහුතරං යදිදං සම්භෙජ්ජ උදකං. අප්පමත්තකානි ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උබ්භතානි. නෙව සතිමං කලං උපෙන්ති, න සහස්සිමං කලං උපෙන්ති, න සතසහස්සිමං කලං උපෙන්ති, සම්භෙජ්ජ උදකං උපනිධාය ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උබ්භතානීති. එවමෙව ඛො භික්ඛවෙ, -පෙ- මහත්ථියො ධම්මචක්ඛුපටිලාභොති.

## 1. 10 4.

## දුතිය සම්භෙජ්ජඋදකසුත්තං

217. සාවත්ථියං-

සෙය්‍යථාපි භික්ඛවෙ, යත්ථිමා මහානදියො සංසන්දන්ති සමෙන්ති, සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී. තං උදකං පරික්ඛයං පරියාදනං ගච්ඡෙය්‍ය ඨපෙත්වා ද්වෙ වා තීණිවා උදකඵුසිතානි. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛො බහුතරං යං වා සම්භෙජ්ජ උදකං පරික්ඛීණං පරියාදින්නං. යානි වා ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානීති.?

එතදෙව භන්තෙ, බහුතරං සම්භෙජ්ජ උදකං යදිදං පරික්ඛීණං පරියාදින්නං. අප්පමත්තකානි ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානි. නෙව සතිමං කලං උපෙන්ති, න සහස්සිමං කලං උපෙන්ති, න සතසහස්සිමං කලං උපෙන්ති, සම්භෙජ්ජ උදකං පරික්ඛීණං පරියාදින්නං උපනිධාය ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානීති. එවමෙව ඛො භික්ඛවෙ, -පෙ- මහත්ථියො ධම්මචක්ඛුපටිලාභොති.

මහණෙනි, එපරිද්දෙන් ම ධර්මය අවබෝධ කළ දෘෂ්ටිසම්පන්න ආර්යශ්‍රාවක පුද්ගලයා විසින් ක්ෂය කරණ ලද අවසන් කරණ ලද යම් මේ දුකෙක් වේ ද, මෙය ම ඉබොහෝ ය. ඉතිරි වූ දුක ඉමඳ ය. සත්වරක් ඉපදීම පරම කොට ඇති යම් මේ දුකෙක් වේ ද, එය ක්ෂය කරණ ලද අවසන් කරණ ලද පළමු දුක්රැස හා සැසඳීමේ දී සියවැනි කලාවටත් නො ම පැමිණෙයි. දහස්වන කලාවටත් නො ම පැමිණෙයි. සියදහස්වන කලාවටත් නො ම පැමිණේ. මහණෙනි, ධර්මාවබෝධය මෙසේ මහදර්ථයක් නිපදවන්නේ ය. දහම්ඇස පිළිලැබීම මෙසේ මහදර්ථයක් නිපදවන්නේ වේ යි.

## 1. 10. 3.

### සම්භෙජ්ජඋදක සූත්‍රය

216. **සැවැත්නුවර-**

මහණෙනි, යම් සේ යම් තැනෙක්හි මේ මහානදීහු එක් ව ගලා බසිද්ද, එකට මුසු වෙද්ද, ඒ කවර නදීහු ද යත්: **ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ මහී** යන මොහු යි. පුරුෂයෙක් තෙමේ එයින් දෙකක් හෝ තුණක් හෝ දියබිඳු නගන්නේ ය. මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, කිමෙක් ඉබොහෝ ද, නගන ලද යම් දියබිඳු දෙක තුන හෝ ගඞ්ගා එක් වූ තැන යම් දියෙක් හෝ දැ යි?

වහන්ස, ගඞ්ගා එක් වූ තැන යම් මේ දියෙක් වේ ද, මෙය ම ඉතා බොහෝ ය. නගන ලද දෙකක් හෝ තුණක් හෝ වූ දියබිඳු ඉතා මඳ ය. ගඞ්ගා එක් වූ තැන දිය හා සැසඳීමෙහි දී නගන ලද දෙකක් හෝ තුණක් හෝ වූ දියබිඳු සියවන කලාවටත් නො ම පැමිණේ. දහස්වන කලාවටත් නො ම පැමිණේ. සියදහස් වන කලාවටත් නො ම පැමිණෙයි. මහණෙනි, එසෙයින් ම .. දහම් ඇස පිළිලැබීම මහදර්ථයක් නිපදවන්නේ වේ යි

## 1 10. 4.

### දෙවන සම්භෙජ්ජඋදක සූත්‍රය

217. **සැවැත්නුවර-**

මහණෙනි, යම් සේ යම් තැනෙක මේ මහානදීහු එක් ව ගලා බසිද්ද, එක් වෙද්ද, ඒ කවර නදීහු ද යත්: **ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහී** යන මොහු යි. දියබිඳු දෙකක් හෝ තුනක් හෝ තබා ඒ දිය ක්ෂය වීමට අවසන් වීමට යන්නේ ය මහණෙනි, ඒ කිමැ යි හඟිහු ද, කිමෙක් ඉතා වැඩි ද, ක්ෂය වූ අවසන් වූ ගඞ්ගා එක් වූ තැන වූ යම් දිය හෝ ඉතිරි වූ දෙකෙක් හෝ තුනෙක් හෝ වූ යම් දියබිඳු හෝ දැ යි?

වහන්ස, ක්ෂය වූ අවසන් වූ ගඞ්ගා එක් වූ තැන යම් දියෙක් වේ ද, මෙය ම ඉතා බොහෝ ය. ඉතිරි වූ දෙකෙක් හෝ තුනෙක් හෝ වූ දියබිඳු ඉතා මඳ ය. ක්ෂය වූ අවසන් වූ ගඞ්ගා එක් වූ තැන වූ දිය හා සැසඳීමෙහි දී ඉතිරි වූ දෙකෙක් හෝ තුනෙක් හෝ වූ දියබිඳු සියවන කලාවටත් නො ම පැමිණේ. දහස්වන කලාවටත් නොම පැමිණේ. සියදහස් වන කලාවටත් නො ම පැමිණෙයි. මහණෙනි, එපරිද්දෙන් ම ආර්යශ්‍රාවකයා විසින් ... දහම් ඇස පිළිලැබීම මහදර්ථයක් නිපදවන්නේ වේ යි.

## 1. 10. 5.

### පඨවිසුත්තං

218. සාවත්ථියං-

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො මහාපඨවියා සත්තකොලට්ඨිමත්තියො ගුළිකා උපනික්ඛිපෙය්‍ය. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමං නු ඛො බහුතරං යා වා සත්තකොලට්ඨිමත්තියො ගුළිකා උපනික්ඛිත්තා. යා වා මහාපඨවීති?

එතදෙව භන්තෙ, බහුතරං යදිදං මහාපඨවි. අප්පමත්තිකා සත්ත-කොලට්ඨිමත්තියො ගුළිකා උපනික්ඛිත්තා. නෙව සතිමං කලං උපෙන්ති, න සහස්සිමං කලං උපෙන්ති, න සතසහස්සිමං කලං උපෙන්ති, මහාපඨවිං උපනිධාය සත්තකොලට්ඨිමත්තියො ගුළිකා උපනික්ඛිත්තාති. එවමෙව ඛො භික්ඛවෙ -පෙ- මහත්ථියො ධම්මචක්ඛුපටිලාභොති.

## 1. 10. 6

### දුතියපඨවිසුත්තං

219. සාවත්ථියං-

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාපඨවි පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය ඨපෙත්වා සත්තකොලට්ඨිමත්තියො ගුළිකා. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, කතමන්නු ඛො බහුතරං යං වා මහාපඨවියා පරික්ඛීණං පරියාදිණ්ණං, යා වා සත්ත-කොලට්ඨිමත්තියො ගුළිකා අවසිට්ඨාති?

එතදෙව භන්තෙ බහුතරං මහාපඨවියා යදිදං පරික්ඛීණං පරියාදින්නං. අප්පමත්තිකා සත්තකොලට්ඨිමත්තියො ගුළිකා අවසිට්ඨා. නෙව සතිමං කලං උපෙන්ති, න සහස්සිමං කලං උපෙන්ති, න සතසහස්සිමං කලං උපෙන්ති, මහාපඨවියා පරික්ඛීණං පරියාදිණ්ණං උපනිධාය සත්තකොලට්ඨිමත්තියො ගුළිකා අවසිට්ඨාති. එවමෙව ඛො භික්ඛවෙ -පෙ- මහත්ථියො ධම්මචක්ඛු-පටිලාභොති.

## 1. 10. 7.

### සමුද්දසුත්තං

220. සාවත්ථියං-

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො මහාසමුද්දතො[1] ද්වෙ වා තීණි වා උදක-ඵුසිතානි උද්ධරෙය්‍ය, තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං යානි වා ද්වෙ වා තීණිවා උදකඵුසිතානි උබ්භතානි, යං වා මහාසමුද්දෙ උදකන්ති.?

එතදෙව භන්තෙ, බහුතරං යදිදං මහාසමුද්දෙ උදකං. අප්පමත්තකානි ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උබ්භතානි. නෙව සතිමං කලං උපෙන්ති, න සහස්සිමං කලං උපෙන්ති, න සතසහස්සිමං කලං උපෙන්ති. මහාසමුද්දෙ උදකං උපනිධාය ද්වෙ වා, තීණි වා උදකඵුසිතානි උබ්භතානීති. එවමෙව ඛො භික්ඛවෙ -පෙ- මහත්ථියො ධම්මචක්ඛුපටිලාභොති

1. මහාසමුද්දා - සයා.

1. 10. 5.

## පඨවිසුත්‍රය

218 **සැවැත්නුවර**-

මහණෙනි, යම් සේ පුරුෂයෙක් මහපොළොවෙන් ඩෙබර ඇට සතක් පමණ වූ මැටි ගුලි ගෙණ තබන්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, කිමෙක් ඉතා බොහෝ ද, ගෙණ තබන ලද ඩෙබර ඇට සතක් පමණ වූ යම් මැටිගුලි හෝ යම් මහපොළොව හෝ දැයි?

වහන්ස, යම් මේ මහපොළොව වේ ද, මෙය ම ඉතා බොහෝ ය. තබන ලද ඩෙබර ඇට සතක් පමණ වූ මැටි ගුලි ඉතා මඳ ය. මහපොළොව හා සැසඳීමෙහි දී තබන ලද ඩෙබර ඇට සතක් පමණ වූ මැටිගුලි සියවන කලාවටත් නො ම පැමිණේ. දහස්වන කලාවවත් නො ම පැමිණේ. සියදහස් වන කලාවටත් නො ම පැමිණෙයි. මහණෙනි, එසෙයින් ම ... දහම් ඇස පිළිලැබීම මහඳර්‍ථයක් නිපදවන්නේ වේ යි.

1. 10. 6.

## දෙවන පඨවි සූත්‍රය

219 **සැවැත්නුවර**-

මහණෙනි, යම් සේ ඩෙබර ඇට සතක් පමණ මැටිගුලි තිබ්ය දී මහපොළොව ක්‍ෂය වීමට අවසන් වීමට යන්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, කිමෙක් ඉබොහෝ ද, මහපොළොවෙහි යම් ගෙවුනු අවසන් වූ කොටස හෝ ඉතිරි වූ ඩෙබර ඇට සතක් පමණ වූ යම් මැටිගුලි හෝ දැයි?

වහන්ස, මහපොළොවෙහි ගෙවුනු අවසන් වූ යම් කොටසෙක් වේ නම් මෙය ම ඉතා බොහෝ ය. ඉතිරි වූ ඩෙබර ඇට සතක් පමණ වූ මැටිගුලි ඉතා මඳ ය. මහාපොළොවෙහි ක්‍ෂය වූ අවසන් වූ කොටස හා සැසඳීමෙහි දී ඉතිරි වූ ඩෙබරඇට සතක් පමණ වූ මැටිගුලි සියවන කලාවටත් නො ම පැමිණේ. දහස්වන කලාවටත් නො ම පැමිණේ. සියදහස් වන කලාවටත් නො ම පැමිණේ. මහණෙනි, එසෙයින් ම ... දහම් ඇස පිළිලැබීම මහඳර්‍ථයක් නිපදවන්නේ වේ යි.

1. 10. 7.

## සමුද්ද සූත්‍රය

220 **සැවැත්නුවර**-

මහණෙනි, යම් සේ පුරුෂයෙක් මහසමුදුරෙන් දියබිඳු දෙකක් හෝ තුනක් හෝ නගා ලන්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, කිමෙක් ඉතා බොහෝ ද, නගන ලද යම් දියබිඳු දෙක හෝ තුන හෝ ද, මහසමුදුරෙහි යම් දිය හෝ දැයි?

වහන්ස, යම් මේ මහසමුදුරෙහි දිය වේ ද, මෙය ම ඉතා බොහෝ ය. නගන ලද දියබිඳු දෙක හෝ තුන හෝ ඉතා මඳ ය. මහසමුදුරෙහි දිය හා සැසඳීමෙහි දී නගන ලද දියබිඳු දෙක හෝ තුන හෝ සියවන කලාවටත් නො ම පැමිණේ. දහස්වන කලාවටත් නො ම පැමිණේ. සියදහස්වන කලාවටත් නො ම පැමිණේ. මහණෙනි, එසෙයින් ම ... දහම් ඇස පිළිලැබීම මහඳර්‍ථයක් නිපදවන්නේ වේ යි.

## 1. 10. 8.

## දුතිය සමුද්දසුත්තං

221. **සාවත්ථියං–**

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාසමුද්දො පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය, ඨපෙත්වා ද්වෙ වා තීණි වා උදකඵුසිතානි. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යං වා මහාසමුද්දෙ උදකං පරික්ඛීණං පරියාදින්නං, යානි වා ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානීති?

එතදෙව භන්තෙ, බහුතරං මහාසමුද්දෙ උදකං යදිදං පරික්ඛීණං පරියාදින්නං. අප්පමත්තානි ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානි. නෙව සතිමං කලං උපෙන්ති, න සහස්සිමං කලං උපෙන්ති, න සතසහස්සිමං කලං උපෙන්ති, මහාසමුද්දෙ උදකං පරික්ඛීණං පරියාදින්නං උපනිධාය ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානීති එවමෙව ඛො භික්ඛවෙ -පෙ- මහත්ථියො ධම්මචක්ඛුපටිලාභො හොති.

## 1. 10. 9

## පබ්බතූපමසුත්තං

222. **සාවත්ථියං–**

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො හිමවතො පබ්බතරාජස්ස සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිපෙය්‍ය තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛො බහුතරං යා වා සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තා, යො වා හිමවා පබ්බතරාජාති.

එතදෙව භන්තෙ, බහුතරං යදිදං හිමවා පබ්බතරාජා. අප්පමත්තිකා සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තා. නෙව සතිමං කලං උපෙන්ති, න සහස්සිමං කලං උපෙන්ති, න සතසහස්සිමං කලං උපෙන්ති, හිමවන්තං පබ්බතරාජං උපනිධාය සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තාති. එවමෙව ඛො භික්ඛවෙ -පෙ- මහත්ථියො ධම්මචක්ඛුපටිලාභො හොති.

## 1. 10. 10

## දුතිය පබ්බතූපමසුත්තං

223. **සාවත්ථියං–**

සෙය්‍යථාපි භික්ඛවෙ, හිමවා පබ්බතරාජා පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය ඨපෙත්වා සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛො බහුතරං, යං වා හිමවතො පබ්බතරාජස්ස පරික්ඛීණං පරියාදින්නං, යා වා සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා අවසිට්ඨාති?

## 1 10 8.

### දෙවන සමුද්‍ර සූත්‍රය

221. සැවැත්නුවර-

මහණෙනි, යම් සේ දියබිඳු දෙකක් හෝ තුනක් තිබිය දී මහමුහුද ක්‍ෂය වීමට අවසන් වීමට යන්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, කිමෙක් ඉතා වැඩි ද, මහමුහුදෙහි ක්‍ෂය වූ අවසන් වූ යම් දිය හෝ ඉතිරි වූ දෙකෙක් හෝ තුනෙක් හෝ වූ යම් දියබිඳු හෝ ද යි?

වහන්ස, මහමුහුදෙහි ක්‍ෂය වූ අවසන් වූ යම් මේ දියෙක් වේ ද, මෙය ම ඉතා වැඩි ය. ඉතිරි වූ දෙකෙක් හෝ තුනෙක් හෝ වූ දියබිඳු ඉතා මඳ ය. මහමුහුදෙහි ක්‍ෂය වූ අවසන් වූ දිය හා සැසඳීමෙහි දී ඉතිරි වූ දෙකෙක් හෝ තුනෙක් හෝ වූ දියබිඳු සියවන කලාවටත් නො ම පැමිණේ. දහස්වන කලාවටත් නො ම පැමිණේ. සියදහස් වන කලාවටත් නො ම පැමිණෙයි. මහණෙනි, එසෙයින් ම ... දහම් ඇස පිළිලැබීම මහදර්‍ථයක් නිපදන්නේ වේ යි.

## 1 10. 9.

### පබ්බතූපම සූත්‍රය

222. සැවැත්නුවර-

මහණෙනි, යම් සේ පුරුෂයෙක් හිමවත් පවුරජුගේ අබඇට සතක් පමණ වූ ගල්කැට පසෙක තබන්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, කිමෙක් ඉතා බොහෝ ද, පසෙක තබන ලද අබැට සතක් පමණ වූ යම් ගල්කැට හෝ යම් හිමවත් පවුරජ හෝ ද යි?

වහන්ස, යම් මේ හිමවත් පවුරජෙක් වේ ද, මෙය ම ඉතා බොහෝ ය. පසෙක තබන ලද අබැට සතක් පමණ වූ ගල්කැට ඉතා මඳ ය. හිමවත් පවුරජු හා සැසඳීමේ දී පසෙක තබන ලද අබැට සතක් පමණ වූ ගල්කැට සියවන කලාවටත් නො ම පැමිණේ. දහස්වන කලාවටත් නො ම පැමිණේ. සියදහස්වන කලාවටත් නො ම පැමිණේ. මහණෙනි, එසෙයින් ම දහම් ඇස පිළිලැබීම මහදර්‍ථයක් නිපදන්නේ වේ යි.

## 1. 10. 10

### දෙවන පබ්බතූපම සූත්‍රය

223. සැවැත්නුවර-

මහණෙනි, යම් සේ අබැට සතක් පමණ වූ ගල්කැට තිබිය දී හිමවත් පවුරජ ක්‍ෂය වීමට අවසන් වීමට යන්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟිහු ද, කිමෙක් ඉතා වැඩි ද, හිමවත් පවුරජුගේ යම් ක්‍ෂය වූ අවසන් වූ කොටස හෝ ඉතිරි වූ අබැට සතක් පමණ වූ යම් ගල්කැට හෝ ද යි?

එතදෙව භන්තෙ, බහුතරං හිමවතො පබ්බතරාජස්ස යදිදං පරික්ඛීණං පරියාදින්නං. අප්පමත්තිකා සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා අවසිට්ඨා. නෙව සතිමං කලං උපෙන්ති, න සහස්සිමං කලං උපෙන්ති, න සතසහස්සිමං කලං උපෙන්ති, හිමවතො පබ්බතරාජස්ස පරික්ඛීණං පරියාදින්නං උපනිධාය සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා අවසිට්ඨාති.

එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස අභිසමෙතාවිනො එතදෙව බහුතරං දුක්ඛං යදිදං පරික්ඛීණං පරියාදින්නං, අප්පමත්තකං අවසිට්ඨං. නෙව සතිමං කලං උපෙති, න සහස්සිමං කලං උපෙති, න සතසහස්සිමං කලං ඊපෙති, පුරිමං දුක්ඛක්ඛන්ධං පරික්ඛීණං පරියාදින්නං උපනිධාය යදිදං සත්තක්ඛත්තුං පරමතා. එවං මහත්ථියො ඛො භික්ඛවෙ ධම්මාභිසමයො, එවං මහත්ථියො ධම්මචක්ඛුපටිලාභොති.

### 1. 10. 11

### තතියපබ්බතූපමසුත්තං

224 **සාවත්ථියං-**

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො සිනෙරුස්ස පබ්බතරාජස්ස සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිපෙය්‍ය. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමං නු ඛො බහුතරං යා වා සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තා, යො වා සිනෙරු පබ්බතරාජාති

එතදෙව භන්තෙ, බහුතරං යදිදං සිනෙරු පබ්බතරාජා. අප්පමත්තිකා සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තා. නෙව සතිමං කලං උපෙන්ති, න සහස්සිමං කලං උපෙන්ති, න සතසහස්සිමං කලං උපෙන්ති, සිනෙරුං පබ්බතරාජානං උපනිධාය සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තාති.

එවමෙව ඛො භික්ඛවෙ අරියසාවකස්ස දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස අධිගමං උපනිධාය අඤ්ඤතිත්ථියසමණබ්‍රාහ්මණපරිබ්බාජකානං අධිගමො නෙව සතිමං කලං උපෙති, න සහස්සිමං කලං උපෙති, න සතසහස්සිමං කලං උපෙති. එවං මහාධිගමො භික්ඛවෙ දිට්ඨිසම්පන්නො පුග්ගලො එවං මහාභිඤ්ඤොති.

**අභිසමයවග්ගො දසමො.**

**තත්‍රුද්දානං:**

නඛසිඛා පොක්ඛරණී චෙව සම්භෙජ්ජ උදකෙ දුවෙ,
ද්වෙ පඨවී ද්වෙ සමුද්දා තයො ච පබ්බතූපමාති.

## අභිසමයසංයුත්තං සමත්තං.

**තත්‍ර වග්ගුද්දානං:**

බුද්ධො ආහාරො දසබලො කළාරො ගහපති පඤ්චමො,
දුක්ඛවග්ගො මහාවග්ගො අට්ඨමො සමණබ්‍රාහ්මණො,
නවමො'න්තරපෙය්‍යාලො දසමො'භිසමයො භවෙති

වහන්ස, හිමවත් පවුරජුගේ යම් මේ ක්‍ෂය වූ අවසන් වූ කොටසෙක් වේ ද, මෙය ම ඉතා වැඩි ය. ඉතිරි වූ අබැට සතක් පමණ වූ ගල්කැට ඉතා මඳ ය. හිමවත් පවුරජුගේ ක්‍ෂය වූ, අවසන් වූ කොටස හා සැසඳීමෙහි දී ඉතිරි වූ අබැට සතක් පමණ වූ ගල්කැට සියවන කලාවටත් නො ම පැමිණේ දහස් වන කලාවටත් නො ම පැමිණේ. සියදහස්වන කලාවටත් නො ම පැමිණේ.

මහණෙනි, එසෙයින් ම දහම් අවබෝධ කළ දෘෂ්ටිසම්පන්න ආර්‍යශ්‍රාවක පුද්ගලයාගේ ක්‍ෂය වූ අවසන් වූ යම් මේ දුකෙක් වේ ද, එය ම ඉතා වැඩි ය. ඉතිරි වූ දුක ඉතා මඳ ය. ක්‍ෂය වූ අවසන් වූ පළමු දුක් රැස හා සැසඳීමේ දී සත්වරක් ඉපදීම හිම් කොට ඇති යම් මේ දුකෙක් වේ නම් එය සියවන කලාවටත් නො ම පැමිණේ දහස්වන කලාවටත් නො ම පැමිණේ. සියදහස්වන කලාවටත් නො ම පැමිණේ. මහණෙනි, ධර්‍මාවබොධය එසේ මහත් වැඩ ඇත්තෙකි. දහම් ඇස පිළිලැබීම එසේ මහත් වැඩ ඇත්තෙකි යි.

## 1. 10. 11

## තෙවන පබ්බතූපම සූත්‍රය

224. **සැවැත්නුවර-**

මහණෙනි, යම් සේ පුරුෂයෙක් සිනේරු පවුරජුගේ මුංඇට සතක් පමණ වූ ගල්කැට පසෙක තබන්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, කිමෙක් ඉබොහෝ ද, පසෙක තබන ලද මුංඇට සතක් පමණ වූ යම් ගල්කැට හෝ යම් සිනේරු පවුරජ හෝ දැ යි?

වහන්ස, යම් මේ සිනේරු පවුරජෙක් වේ ද, මෙය ම ඉබොහෝ ය. පසෙක තබන ලද මුංඇට සතක් පමණ වූ ගල්කැට ඉමඳ ය. සිනේරු පවුරජු හා සැසඳීමේ දී පසෙක තබනලද මුංඇට සතක් පමණ වූ ගල්කැට සිය වන කලාවටත් නො ම පැමිණේ. දහස් වන කලාවටත් නො ම පැමිණේ. සියදහස් වන කලාවටත් නො පැමිණේ.

මහණෙනි, එසෙයින් ම දෘෂ්ටිසම්පන්න ආර්‍යශ්‍රාවක පුද්ගලයාගේ අධිගමය හා සැසඳීමේ දී අන්තොටු මහණ බමුණු පිරිවැජ්ජන්ගේ අධිගමය සිය වන කලාවටත් නො ම පැමිණෙයි. දහස් වන කලාවටත් නො ම පැමිණෙයි. සියදහස් වන කලාවටත් නො ම පැමිණෙයි. මහණෙනි, දෘෂ්ටිසම්පන්න පුද්ගල තෙමේ එසේ මහත් අධිගම ඇත්තෙකි. එසේ මහත් අභිඥ ඇත්තෙකි යි.

**අභිසමයවර්‍ගය දසවැනි යි.**

**එහි උද්දානය:**

තඛසිඛා පොක්ඛරණී සූත්‍ර දෙක ය, සම්භෙජ්ජඋදක සූත්‍ර දෙක ය, පඨවි සූත්‍ර දෙක ය, සමුද්‍ර සූත්‍ර දෙක ය, පබ්බතූපම සූත්‍ර තුණ යැ යි සූත්‍ර එකොළොසෙකි යි.

# අභිසමයසංයුත්තය නිමියේ ය.

**එහි වර්‍ගනාමාවලිය:**

බුද්ධ, ආහාර, දසබල, කළාරඛත්තිය යි වර්‍ග සතරෙකි. ගහපතිවර්‍ගය පස්වැන්න ය, දුක්ඛවර්‍ගය, මහාවර්‍ගය යි දෙකෙකි. සමණබ්‍රාහමණ වර්‍ගය අටවැන්න ය. අනතර පෙය්‍යාලවර්‍ගය නවවැන්න ය. අභිසමයවර්‍ගය දසවැන්න වෙ යි.

# 2. ධාතුසංයුත්තං

## 1. නානත්තවග්ගො

### 2. 1. 1

### ධාතුනානත්තසුත්තං

225. **සාවත්ථියං-**

ධාතුනානත්තං වො භික්ඛවෙ දෙසිස්සාමි,[1] තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච.

කතමඤ්ච භික්ඛවෙ ධාතුනානත්තං? චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු, ඝාණධාතු ගන්ධධාතු ඝාණවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු, මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු. ඉදං වුච්චති භික්ඛවෙ ධාතුනානත්තන්ති.

### 2. 1. 2

### ඵස්සනානත්තසුත්තං

226. **සාවත්ථියං-**

ධාතුනානත්තං භික්ඛවෙ පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං. කතමඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං? චක්ඛුධාතු සොතධාතු ඝාණධාතු ජිව්හාධාතු කායධාතු මනොධාතු. ඉදං වුච්චති භික්ඛවෙ ධාතුනානත්තං

කථඤ්ච[2] භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං? චක්ඛුධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති චක්ඛුසම්ඵස්සො, සොතධාතුං පටිච්ච උප්පජ්ජති සොතසම්ඵස්සො, ඝාණධාතුං පටිච්ච උප්පජ්ජති ඝාණසම්ඵස්සො, ජිව්හාධාතුං පටිච්ච උප්පජ්ජති ජිව්හාසම්ඵස්සො, කායධාතුං පටිච්ච උප්පජ්ජති කායසම්ඵස්සො, මනොධාතුං පටිච්ච උප්පජ්ජති මනොසම්ඵස්සො. එවං ඛො භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තන්ති.

### 2. 1. 3

### නො ඵස්සනානත්තසුත්තං

227. **සාවත්ථියං-**

ධාතුනානත්තං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, නො ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තං.

කතමඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං? චක්ඛුධාතු -පෙ- මනොධාතු ඉදං වුච්චති භික්ඛවෙ ධාතුනානත්තං.

කථඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, නො ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තං? චක්ඛුධාතුං භික්ඛවෙ පටිච්ච උප්පජ්ජති චක්ඛුසම්ඵස්සො, නො චක්ඛුසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති චක්ඛුධාතු -පෙ- මනොධාතුං පටිච්ච උප්පජ්ජති මනොසම්ඵස්සො. නො මනොසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති මනොධාතු. එවං ඛො භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං. නො ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තන්ති.

---

1. දෙසෙස්සාමි - මජසං, 2. කතමඤ්ච - සතා.

# 2. ධාතුසංයුත්තය

## 1. නානත්තවර්ගය.

### 2. 1. 1
### ධාතුනානත්ත සූත්‍රය

225. **සැවැත්නුවර-**

මහණෙනි, තොපට ධාතුනානාත්වය දේශනා කරන්නෙමි. එය අසවු, මැනවින් මෙනෙහි කරවු. දේශනා කරන්නෙමි යි ඒ භික්ෂූහු "වහන්ස එසේ ය" යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක:

මහණෙනි, ධාතුනානාත්වය කිමෙක යත්: චක්ඛුධාතු ය, රූපධාතු ය, චක්ඛුවිඤ්ඤාණධාතු ය, සෝතධාතු ය, සද්දධාතු ය, සෝතවිඤ්ඤාණධාතු ය, ඝාණධාතු ය, ගන්ධධාතු ය, ඝාණවිඤ්ඤාණධාතු ය, ජිව්හාධාතු ය, රසධාතු ය, ජිව්හාවිඤ්ඤාණධාතු ය, කායධාතු ය, ඵොට්ඨබ්බධාතු ය, කායවිඤ්ඤාණධාතු ය, මනෝධාතු ය, ධම්මධාතු ය, මනෝවිඤ්ඤාණධාතු ය යි. මහණෙනි, මේ ධාතුනානාත්වය යි කියනු ලැබේ යි.

### 2. 1. 2
### ඵස්සනානත්ත සූත්‍රය

226. **සැවැත්නුවර-**

මහණෙනි, ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී. මහණෙනි, ධාතුනානාත්වය කවරේ ද යත්: චක්ඛුධාතු ය, සෝතධාතු ය, ඝාණධාතු ය, ජිව්හාධාතු ය, කායධාතු ය, මනොධාතු ය යි. මහණෙනි, මෙය ධාතුනානාත්ව ය යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී ද? මහණෙනි, චක්ඛුධාතුව නිසා චක්ඛුසම්ඵස්සය උපදී. සෝතධාතුව නිසා සෝතසම්ඵස්සය උපදී. ඝාණධාතුව නිසා ඝාණසම්ඵස්සය උපදී. ජිව්හාධාතුව නිසා ජිව්හාසම්ඵස්සය උපදී. කායධාතුව නිසා කායසම්ඵස්සය උපදී. මනෝධාතුව නිසා මනෝසම්ඵස්සය උපදී. මහණෙනි, මෙසෙයින් ධාතු නානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී යි

### 2. 1. 3
### නො ඵස්සනානත්ත සූත්‍රය

227. **සැවැත්නුවර-**

මහණෙනි, ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී. ඵස්සනානාත්වය නිසා ධාතුනානාත්වය නූපදී.

මහණෙනි, ධාතුනානාත්වය කවරේ ද යත්: චක්ඛුධාතු ය ... මනොධාතු ය යි. මහණෙනි, මේ ධාතුනානාත්වය යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී ද? ඵස්සනානාත්වය නිසා ධාතුනානාත්වය නූපදී ද? මහණෙනි, චක්ඛුධාතුව නිසා චක්ඛුසම්ඵස්සය උපදී. චක්ඛුසම්ඵස්සය නිසා චක්ඛුධාතුව නූපදී ... මනෝ ධාතුව නිසා මනෝසම්ඵස්සය උපදී. මනෝසම්ඵස්සය නිසා මනෝධාතුව නූපදී. මහණෙනි, මෙසේ ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී. ඵස්සනානාත්වය නිසා ධාතුනානාත්වය නූපදී යි.

## 2. 1. 4

## වෙදනානානත්තසුත්තං

228. සාවත්ථියං-

ධාතුනානත්තං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං. ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තං.

කතමඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං? චක්ඛුධාතු -පෙ- මනොධාතු. ඉදං වුච්චති භික්ඛවෙ ධාතුනානත්තං

කථඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තං? චක්ඛුධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති චක්ඛුසම්ඵස්සො. චක්ඛුසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති චක්ඛුසම්ඵස්සජා වෙදනා -පෙ- මනොධාතුං පටිච්ච උප්පජ්ජති මනොසම්ඵස්සො. මනොසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති මනොසම්ඵස්සජා වෙදනා. එවං ඛො භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං. ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තන්ති

## 2. 1. 5

## නොවෙදනානානත්තසුත්තං

229. සාවත්ථියං-

ධාතුනානත්තං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තං, නො වෙදනානානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං. නො ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තං.

කතමඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං? චක්ඛුධාතු -පෙ- මනොධාතු. ඉදං වුච්චති භික්ඛවෙ ධාතුනානත්තං.

කථඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං. ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තං, නො වෙදනානානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, නො ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තං? චක්ඛුධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති චක්ඛුසම්ඵස්සො, චක්ඛුසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති චක්ඛුසම්ඵස්සජා වෙදනා. නො චක්ඛුසම්ඵස්සජං වෙදනං පටිච්ච උප්පජ්ජති චක්ඛුසම්ඵස්සො. නො චක්ඛුසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති චක්ඛුධාතු -පෙ- මනොධාතුං පටිච්ච උප්පජ්ජති මනොසම්ඵස්සො. මනොසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති මනොසම්ඵස්සජා වෙදනා. නො මනොසම්ඵස්සජං වෙදනං පටිච්ච උප්පජ්ජති මනොසම්ඵස්සො. නො මනොසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති මනොධාතු

එවං ඛො භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං. ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තං. නො වෙදනානානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං. නො ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තන්ති.

## 2. 1. 4

## වේදනාසූත්‍රය

228. **සැවැත්නුවර-**

මහණෙනි, ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී. ඵස්සනානාත්වය නිසා වේදනානානාත්වය උපදී.

මහණෙනි, ධාතුනානාත්වය කවරේ ද යත්: චක්ඛුධාතු ය ... මනෝධාතු යි. මහණෙනි, මේ ධාතුනානාත්වය යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී ද? ඵස්සනානාත්වය නිසා වේදනානානාත්වය උපදී ද? මහණෙනි, චක්ඛුධාතුව නිසා චක්ඛුසම්ඵස්සය උපදී. චක්ඛුසම්ඵස්සය නිසා චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වේදනාව උපදී ... මනෝධාතුව නිසා මනෝසම්ඵස්සය උපදී. මනෝසම්ඵස්සය නිසා මනෝසම්ඵස්සයෙන් උපන් වේදනාව උපදී. මහණෙනි, මෙසේ ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී. ඵස්සනානාත්වය නිසා වේදනානානාත්වය උපදී යි

## 2. 1. 5

## නොවේදනාසූත්‍රය

229 **සැවැත්නුවර-**

මහණෙනි, ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී. ඵස්සනානාත්වය නිසා වේදනානානාත්වය උපදී. වේදනානානාත්වය නිසා ඵස්සනානාත්වය නූපදී. ඵස්සනානාත්වය නිසා ධතුනානාත්වය නූපදී.

මහණෙනි, ධාතුනානාත්වය කවරේ ද යත්: චක්ඛුධාතු ය ... මනෝධාතු යි. මහණෙනි, මේ ධාතුනානාත්වය යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී ද? ඵස්සනානාත්වය නිසා වේදනානානාත්වය උපදී ද? වේදනානානාත්වය නිසා ඵස්සනානාත්වය නූපදී ද? ඵස්සනානාත්වය නිසා ධතුනානාත්වය නූපදී ද? මහණෙනි, චක්ඛුධාතුව නිසා චක්ඛුසම්ඵස්සය උපදී. චක්ඛුසම්ඵස්සය නිසා චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වේදනාව උපදී. චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වෙදනාව නිසා චක්ඛුසම්ඵස්සය නූපදී. චක්ඛුසම්ඵස්සය නිසා චක්ඛුධාතුව නූපදී .... මනෝධාතුව නිසා මනෝසම්ඵස්සය උපදී. මනෝසම්ඵස්සය නිසා මනෝසම්ඵස්සයෙන් හටගත් වේදනාව උපදී. මනෝසම්ඵස්සයෙන් හටගත් වේදනාව නිසා මනෝසම්ඵස්සය නූපදී මනෝසම්ඵස්සය නිසා මනෝධාතුව නූපදී.

මහණෙනි, මෙසේ ධාතුනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී ඵස්සනානාත්වය නිසා වේදනානානාත්වය උපදී. වේදනානානාත්වය නිසා ඵස්සනානාත්වය නූපදී. ඵස්සනානාත්වය නිසා ධාතුනානාත්වය නූපදී යි

## 2. 1. 6

## බාහිරධාතුනානත්තසුත්තං

230. සාවත්ථියං-

ධාතුනානත්තං බො භික්ඛවෙ, දෙසෙස්සාමි තං සුණාථ -පෙ- භාසිස්සාමි. කතමඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං? රූපධාතු සද්දධාතු ගන්ධධාතු රසධාතු ඵොට්ඨබ්බධාතු ධම්මධාතු. ඉදං වුච්චති භික්ඛවෙ, ධාතුනානත්තන්ති.

## 2. 1. 7

## පරියෙසනානානත්තසුත්තං

231. සාවත්ථියං-

ධාතුනානත්තං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං. සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති සඞ්කප්පනානත්තං. සඞ්කප්පනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං. ඡන්දනානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති පරියෙසනානානත්තං

කතමඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං? රූපධාතු -පෙ- ධම්මධාතු. ඉදං වුච්චති භික්ඛවෙ ධාතුනානත්තං.

කථඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං, සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති සඞ්කප්පනාන ත්තං, සඞ්කප්පනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං, ඡන්දනානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං, පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති පරියෙසනානානත්තං?

රූපධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති රූපසඤ්ඤා. රූපසඤ්ඤං පටිච්ච උප්පජ්ජති රූපසංකප්පො. රූපසංකප්පං පටිච්ච උප්පජ්ජති රූපච්ඡන්දො. රූපච්ඡන්දං පටිච්ච උප්පජ්ජති රූපපරිළාහො. රූපපරිළාහං පටිච්ච උප්පජ්ජති රූපපරියෙසනා. [සද්දධාතුං භික්ඛවෙ, පටිච්ච] -පෙ- ධම්මධාතුං භික්ඛවෙ පටිච්ච උප්පජ්ජති ධම්මසඤ්ඤා. ධම්මසඤ්ඤං පටිච්ච උප්පජ්ජති ධම්මසංකප්පො. ධම්මසංකප්පං පටිච්ච උප්පජ්ජති ධම්මච්ඡන්දො. ධම්මච්ඡන්දං පටිච්ච උප්පජ්ජති ධම්මපරිළාහො. ධම්මපරිළාහං පටිච්ච උප්පජ්ජති ධම්මපරියෙසනා.

එවං බො භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති සංකප්පනානත්තං. සංකප්පනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං. ඡන්දනානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං. පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති පරියෙසනානානත්තන්ති.

## 2. 1. 6

## බාහිරධාතුනානත්ත සූත්‍රය

230. **සැවැත්නුවර-**

**මහණෙනි, තොපට ධාතුනානාත්වය දේශනා කරන්නෙමි. එය අසවු දේශනා කරන්නෙමි. මහණෙනි. ධාතුනානාත්වය කවරේ ද යත්: රූපධාතු ය, සද්දධාතු ය, ගන්ධධාතු ය, රසධාතු ය, ඵොට්ඨබ්බධාතු ය, ධම්මධාතු යි. මහණෙනි, මෙය ධාතුනානාත්වය යි කියනු ලැබේ.**

## 2. 1. 7

## පරියෙසනානානත්ත සූත්‍රය

231. **සැවැත්නුවර-**

මහණෙනි, ධාතුනානාත්වය නිසා සංඥානානාත්වය උපදී. සංඥානානාත්වය නිසා සංකල්පනානාත්වය උපදී. සංකල්පනානාත්වය නිසා ඡන්දනානාත්වය උපදී. ඡන්දනානාත්වය නිසා පරිදාහනානාත්වය උපදී. පරිදාහනානාත්වය නිසා පයෙර්ෂණනානාත්වය උපදී.

මහණෙනි, ධාතුනානාත්වය කවරේ ද යත්: රූපධාතු ය ධම්මධාතු යි. මහණෙනි, මේ ධාතුනානාත්වය යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් ධාතුනානාත්වය නිසා සංඥානානාත්වය උපදී ද, සංඥානානාත්වය නිසා සංකල්පනානාත්වය උපදී ද, සංකල්පනානාත්වය නිසා ඡන්දනානාත්වය උපදී ද, ඡන්දනානාත්වය නිසා පරිදාහනානාත්වය උපදී ද, පරිදාහනානාත්වය නිසා පයෙර්ෂණනානාත්වය උපදී ද?

මහණෙනි, රූපධාතුව නිසා රූපසංඥාව උපදී. රූපසංඥාව නිසා රූපසංකල්පය උපදී. රූපසංකල්පය නිසා රූපච්ඡන්දය උපදී. රූපච්ඡන්දය නිසා රූපපරිදාහය උපදී. රූපපරිදාහය නිසා රූපපයෙර්ෂණාව උපදී. මහණෙනි, සද්දධාතුව නිසා ... මහණෙනි, ධර්මධාතුව නිසා ධර්මසංඥාව උපදී. ධර්මසංඥාව නිසා ධර්මසඞ්කල්පය උපදී. ධර්මසඞ්කල්පය නිසා ධර්මච්ඡන්දය උපදී. ධර්මච්ඡන්දය නිසා ධර්මපරිදාහය උපදී. ධර්මපරිදාහය නිසා ධර්මපයෙර්ෂණාව උපදී.

මහණෙනි, මෙසේ ධාතුනානාත්වය නිසා සංඥානානාත්වය උපදී. සංඥානානාත්වය නිසා සඞ්කල්පනානාත්වය උපදී සඞ්කල්පනානාත්වය නිසා ඡන්දනානාත්වය උපදී. ඡන්දනානාත්වය නිසා පරිදාහනානාත්වය උපදී. පරිදාහනානාත්වය නිසා පයෙර්ෂණනානාත්වය උපදී යි.

## 2. 1. 8

## නොපරියෙසනානානත්තසුත්තං

232. **සාවත්ථියං-**

ධාතුනානත්තං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං. සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති සංකප්පනානත්තං. සංකප්පනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං. ඡන්දනානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං. පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති පරියෙසනානානත්තං. නො පරියෙසනානානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං නො පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං. නො ඡන්දනානානත්තං පටිච්ච උප්පජ්ජති සංකප්පනානත්තං. නො සංකප්පනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං. නො සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තං.

කතමඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං? රූපධාතු -පෙ- ධම්මධාතු. ඉදං වුච්චති භික්ඛවෙ, ධාතුනානත්තං.

කථඤ්ච භික්ඛවෙ ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං, සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති -පෙ- පරියෙසනානානත්තං, නො පරියෙසනානානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං, නො පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං, නො ඡන්දනානත්තං පටිච්ච උප්පජ්ජති සංකප්පනානත්තං, නො සංකප්පනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං, නො සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තං?

රූපධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති රූපසඤ්ඤා. රූපසඤ්ඤං පටිච්ච උප්පජ්ජති රූපසංකප්පො. රූපසංකප්පං පටිච්ච උප්පජ්ජති රූපච්ඡන්දො. රූපච්ඡන්දං පටිච්ච උප්පජ්ජති රූපපරිළාහො. රූපපරිළාහං පටිච්ච උප්පජ්ජති රූපපරියෙසනා. නො රූපපරියෙසනං පටිච්ච උප්පජ්ජති රූපපරිළාහො. නො රූපපරිළාහං පටිච්ච උප්පජ්ජති රූපච්ඡන්දො. නො රූපච්ඡන්දං පටිච්ච උප්පජ්ජති රූපසංකප්පො. නො රූපසංකප්පං පටිච්ච උප්පජ්ජති රූපසඤ්ඤා. නො රූපසඤ්ඤං පටිච්ච උප්පජ්ජති රූපධාතු.

සද්දධාතුං භික්ඛවෙ, පටිච්ච -පෙ- ධම්මධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති ධම්මසඤ්ඤා. ධම්මසඤ්ඤං පටිච්ච උප්පජ්ජති ධම්මසංකප්පො. ධම්මසංකප්පං පටිච්ච උප්පජ්ජති ධම්මච්ඡන්දො, ධම්මච්ඡන්දං පටිච්ච උප්පජ්ජති ධම්මපරිළාහො. නො ධම්මපරිළාහං පටිච්ච උප්පජ්ජති ධම්මපරියෙසනා. නො ධම්මපරියෙසනං පටිච්ච උප්පජ්ජති ධම්මපරිළාහො. නො ධම්මපරිළාහං පටිච්ච උප්පජ්ජති ධම්මච්ඡන්දො. නො ධම්මච්ඡන්දං පටිච්ච උප්පජ්ජති ධම්මසංකප්පො. නො ධම්මසංකප්පං පටිච්ච උප්පජ්ජති ධම්මසඤ්ඤා. නො ධම්මසඤ්ඤං පටිච්ච උප්පජ්ජති ධම්මධාතු.

එවං ඛො භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං. සඤ්ඤානානත්තං පටිච්ච -පෙ- උප්පජ්ජති පරියෙසනානානත්තං. නොපරියෙසනානානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං නො පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං. නො ඡන්දනානත්තං පටිච්ච උප්පජ්ජති සංකප්පනානත්තං. නො සංකප්පනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං. නො සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තන්ති.

## 2. 1. 8.

## නො පරියෙසනානානත්ත සූත්‍රය

232. **සැවැත්නුවර**-

මහණෙනි, ධාතුනානාත්වය නිසා සංඥානානාත්වය උපදී. සංඥානානාත්වය නිසා සඞ්කල්පනානාත්වය උපදී සඞ්කල්පනානාත්වය නිසා ඡන්දනානාත්වය උපදී. ඡන්දනානාත්වය නිසා පරිදාහනානාත්වය උපදී. පරිදාහනානාත්වය නිසා පයෙර්‍ෂණනානාත්වය උපදී. පයෙර්‍ෂණනානාත්වය නිසා පරිදාහනානාත්වය නූපදී. පරිදාහනානාත්වය නිසා ඡන්දනානාත්වය නූපදී ඡන්දනානාත්වය නිසා සඞ්කල්පනානාත්වය නූපදී. සඞ්කල්පනානාත්වය නිසා සංඥානානාත්වය නූපදී සංඥානානාත්වය නිසා ධාතුනානාත්වය නූපදී.

මහණෙනි, ධාතුනානාත්වය කවරේ ද යත්: රූපධාතුය ... ධර්මධාතු යි. මහණෙනි, මේ ධාතුනානාත්වය යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් ධාතුනානාත්වය නිසා සංඥානානාත්වය උපදී ද, සංඥානානාත්වය නිසා පයෙර්‍ෂණනානාත්වය උපදී ද, පයෙර්‍ෂණ-නානාත්වය නිසා පරිදාහනානාත්වය නූපදී ද, පරිදාහනානාත්වය නිසා ඡන්දනානාත්වය නූපදී ද, ඡන්දනානාත්වය නිසා සඞ්කල්පනානාත්වය නූපදී ද, සඞ්කල්පනානාත්වය නිසා සංඥානානාත්වය නූපදී ද, සංඥානානාත්වය නිසා ධාතුනානාත්වය නූපදී ද?

මහණෙනි, රූපධාතුව නිසා රූපසඤ්ඤාව උපදී. රූපසඤ්ඤාව නිසා රූපසඞ්කප්පය උපදී. රූපසඞ්කප්පය නිසා රූපච්ඡන්දය උපදී. රූපච්ඡන්දය නිසා රූපපරිළාහය උපදී. රූපපරිළාහය නිසා රූපපරියෙසනාව උපදී. රූපපරියෙසනාව නිසා රූපපරිළාහය නූපදී. රූපපරිළාහය නිසා රූපච්ඡන්දය නූපදී. රූපච්ඡන්දය නිසා රූපසඞ්කප්පය නූපදී. රූපසඞ්කප්පය නිසා රූපසඤ්ඤාව නූපදී. රූපසඤ්ඤාව නිසා රූපධාතුව නූපදී.

මහණෙනි, සද්දධාතුව නිසා ... මහණෙනි, ධම්මධාතුව නිසා ධර්මසංඥාව උපදී. ධර්මසංඥාව නිසා ධර්මසඞ්කල්පය උපදී. ධර්මසඞ්කල්පය නිසා ධර්මච්ඡන්දය උපදී ධර්මච්ඡන්දය නිසා ධර්මපරිදාහය උපදී. ධර්මපරිදාහය නිසා ධර්ම පයෙර්‍ෂණාව උපදී. ධර්මපයෙර්‍ෂණාව නිසා ධර්මපරිදාහය නූපදී. ධර්මපරිදාහය නිසා ධර්මච්ඡන්දය නූපදී. ධර්මච්ඡන්දය නිසා ධර්මසඞ්කල්පය නූපදී. ධර්මසඞ්කල්පය නිසා ධර්මසංඥාව නූපදී. ධර්මසංඥාව නිසා ධර්මධාතුව නූපදී.

මහණෙනි, මෙසේ ධාතුනානාත්වය නිසා සංඥානානාත්වය උපදී. සංඥානානාත්වය නිසා ... පයෙර්‍ෂණනානාත්වය උපදී. පයෙර්‍ෂණනානාත්වය නිසා පරිදාහනානාත්වය නූපදී. පරිදාහනානාත්වය නිසා ඡන්දනානාත්වය නූපදී. ඡන්දනානාත්වය නිසා සඞ්කල්පනානාත්වය නූපදී. සඞ්කල්පනානාත්වය නිසා සංඥානානාත්වය නූපදී. සංඥානානාත්වය නිසා ධාතුනානාත්වය නූපදී යි.

## 2. 1. 9.

## ලාභනානත්තසුත්තං

233. **සාවත්ථියං-**

ධාතුනානත්තං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං. සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති සංකප්පනානත්තං. සංකප්පනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං. ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තං. වෙදනානානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං. ඡන්දනානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං. පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති පරියෙසනානානත්තං. පරියෙසනානානත්තං පටිච්ච උප්පජ්ජති ලාභනානත්තං.

කතමඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං? රූපධාතු -පෙ- ධම්මධාතු, ඉදං වුච්චති භික්ඛවෙ, ධාතුනානත්තං

කථඤ්ච භික්ඛවෙ. ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං, සඤ්ඤානානත්තං පටිච්ච -පෙ- උප්පජ්ජති ලාභනානත්තං?

රූපධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති රූපසඤ්ඤා. රූපසඤ්ඤං පටිච්ච උප්පජ්ජති රූපසංකප්පො. රූපසංකප්පං පටිච්ච උප්පජ්ජති රූපසම්ඵස්සො. රූපසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති රූපසම්ඵස්සජා වෙදනා. රූපසම්ඵස්සජං වෙදනං පටිච්ච උප්පජ්ජති රූපච්ඡන්දො, රූපච්ඡන්දං පටිච්ච උප්පජ්ජති රූපපරිළාහො. රූපපරිළාහං පටිච්ච උප්පජ්ජති රූපපරියෙසනා. රූප-පරියෙසනං පටිච්ච උප්පජ්ජති රූපලාභො.

සද්දධාතුං භික්ඛවෙ, පටිච්ච -පෙ- ධම්මධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති ධම්මසඤ්ඤා ධම්මසඤ්ඤං පටිච්ච උප්පජ්ජති ධම්මසංකප්පො. ධම්මසංකප්පං පටිච්ච උප්පජ්ජති ධම්ම-සම්ඵස්සො. ධම්මසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති ධම්මසම්ඵස්සජා වෙදනා. ධම්මසම්ඵස්සජං වෙදනං පටිච්ච උප්පජ්ජති ධම්මච්ඡන්දො. ධම්මච්ඡන්දං පටිච්ච උප්පජ්ජති ධම්මපරිළාහො. ධම්මපරිළාහං පටිච්ච උප්පජ්ජති ධම්මපරියෙසනා. ධම්මපරියෙසනං පටිච්ච උප්පජ්ජති ධම්මලාභො.

එවං ඛො භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං, සඤ්ඤානානත්තං පටිච්ච -පෙ- උප්පජ්ජති ලාභනානත්තන්ති.

## 3. 1. 10

## නොලාභනානත්තසුත්තං

234. **සාවත්ථියං-**

ධාතුනානත්තං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං සඤ්ඤා-නානත්තං පටිච්ච උප්පජ්ජති සංකප්පනානත්තං ඵස්ස -පෙ- වෙදනා -පෙ- ඡන්ද -පෙ- පරිළාහ -පෙ- පරියෙසනානානත්තං. පරියෙසනානානත්තං පටිච්ච උප්පජ්ජති ලාභනානත්තං. නො ලාභනානත්තං පටිච්ච උප්පජ්ජති පරියෙසනානානත්තං. නො පරියෙසනානානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං නො පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති -පෙ- ඡන්ද -පෙ- වෙදනා -පෙ- ඵස්ස -පෙ- සංකප්ප -පෙ- සඤ්ඤානානත්තං -පෙ- නො සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තං.

## 2 1. 9

## ලාභනානත්ත සූත්‍රය

233. **සැවැත්නුවර-**

මහණෙනි, ධාතුනානාත්වය නිසා සංඥානානාත්වය උපදී. සංඥානානාත්වය නිසා සඞ්කල්පනානාත්වය උපදී. සඞ්කල්පනානාත්වය නිසා ඵස්සනානාත්වය උපදී. ඵස්සනානාත්වය නිසා වෙදනානානාත්වය උපදී. වෙදනානානාත්වය නිසා ඡන්දනානාත්වය උපදී. ඡන්දනානාත්වය නිසා පරිදාහනානාත්වය උපදී. පරිදාහනානාත්වය නිසා පර්‍යෙෂණානානාත්වය උපදි. පර්‍යෙෂණානානාත්වය නිසා ලාභනානාත්වය උපදී.

මහණෙනි, ධාතුනානාත්වය කවරේ ද යත්: රූපධාතු ය ධම්මධාතු යි. මහණෙනි, මේ ධාතුනානාත්වය යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් ධාතුනානාත්වය නිසා සංඥානානාත්වය උපදී ද, සංඥානානාත්වය නිසා ... ලාභනානාත්වය උපදී ද?

මහණෙනි, රූපධාතුව නිසා රූපසංඥාව උපදී. රූපසංඥාව නිසා රූපසඞ්කල්පය උපදී. රූපසඞ්කල්පය නිසා රූපසම්ඵස්සය උපදී. රූපසම්ඵස්සය නිසා රූපසම්ඵස්සයෙන් හටගත් වෙදනාව උපදී. රූපසම්ඵස්සයෙන් හටගත් වෙදනාව නිසා රූපච්ඡන්දය උපදී. රූපච්ඡන්දය නිසා රූපපරිදාහය උපදී. රූපපරිදාහය නිසා රූපපර්‍යෙෂණාව උපදී. රූපපර්‍යෙෂණාව නිසා රූපලාභය උපදී

මහණෙනි, සද්දධාතුව නිසා...මහණෙනි, ධම්මධාතුව නිසා ධම්මසඤ්ඤාව උපදී. ධම්මසඤ්ඤාව නිසා ධම්මසඞ්කප්පය උපදී. ධම්මසඞ්කප්පය නිසා ධම්මසම්ඵස්සය උපදී. ධම්මසම්ඵස්සය නිසා ධම්මසම්ඵස්සයෙන් හටගත් වෙදනාව උපදී. ධම්මසම්ඵස්සයෙන් හටගත් වෙදනාව නිසා ධම්මච්ඡන්දය උපදී. ධම්මච්ඡන්දය නිසා ධම්මපරිළාහය උපදී. ධම්මපරිළාහය නිසා ධම්මපරියෙසනාව උපදී. ධම්මපරියෙසනාව නිසා ධම්මලාභය උපදී.

මහණෙනි, මෙසේ ධාතුනානාත්වය නිසා සංඥානානාත්වය උපදී. සංඥානානාත්වය නිසා .. ලාභනානාත්වය උපදී යි

## 2. 1 10

## නොලාභනානත්ත සූත්‍රය

234. **සැවැත්නුවර-**

මහණෙනි, ධාතුනානාත්වය නිසා සංඥානානාත්වය උපදී. සංඥානානාත්වය නිසා සඞ්කල්පනානාත්වය උපදී. ස්පර්ශ ... වෙදනා ... ඡන්ද පරිදාහ ... පර්‍යෙෂණානානාත්වය උපදී. පර්‍යෙෂණානානාත්වය නිසා ලාභනානාත්වය උපදී ලාභනානාත්වය නිසා පර්‍යෙෂණානානාත්වය නූපදී. පර්‍යෙෂණානානාත්වය නිසා පරිදාහනානාත්වය නූපදී. පරිදාහනානාත්වය නිසා ඡන්ද . වෙදනා ස්පර්ශ සංකල්ප සංඥානානාත්වය ... සංඥානානාත්වය නිසා ධාතුනානාත්වය නූපදී.

කතමඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං? රූපධාතු -පෙ- ධම්මධාතු, ඉදං වුච්චති භික්ඛවෙ, ධාතුනානත්තං.

කථඤ්ච භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං, සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති සංකප්පනානත්තං -පෙ- ඵස්ස -පෙ- වෙදනා -පෙ- ඡන්ද -පෙ- පරිළාහ -පෙ- පරියෙසනා -පෙ- ලාභ -පෙ- නො ලාභනානත්තං පටිපච්ච උප්පජ්ජති පරියෙසනානානත්තං, නො පරියෙසනානානත්තං පච්චිච්ච උප්පජ්ජති පරිළාහනානානත්තං -පෙ- ඡන්ද -පෙ- වෙදනා -පෙ- ඵස්ස -පෙ- නො සංකප්පනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං, නො සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තං?

රූපධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති රූපසඤ්ඤා -පෙ- සද්දධාතුං-පෙ- ගන්ධධාතුං -පෙ- රසධාතුං -පෙ- ඵොට්ඨබ්බධාතුං -පෙ- ධම්මධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති ධම්මසඤ්ඤා. ධම්මසඤ්ඤං පටිච්ච -පෙ- උප්පජ්ජති ධම්මපරියෙසනා. ධම්මපරියෙසනං පටිච්ච උප්පජ්ජති ධම්මලාභො. නො ධම්මලාභං පටිච්ච උප්පජ්ජති ධම්මපරියෙසනා. නො ධම්මපරියෙසනං පටිච්ච උප්පජ්ජති ධම්මපරිළාහො. නො ධම්මපරිළාහං පටිච්ච උප්පජ්ජති ධම්මච්ඡන්දො, නො ධම්මච්ඡන්දං පටිච්ච උප්පජ්ජති ධම්මසම්ඵස්සජා වෙදනා, නො ධම්මසම්ඵස්සජංවෙදනං පටිච්ච උප්පජ්ජති ධම්මසම්ඵස්සො, නො ධම්මසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති ධම්මසංකප්පො. නො ධම්මසංකප්පං පටිච්ච උප්පජ්ජති ධම්මසඤ්ඤා නො ධම්මසඤ්ඤං පටිච්ච උප්පජ්ජති ධම්මධාතු.

එවං ඛො භික්ඛවෙ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං. සඤ්ඤානානත්තං පටිච්ච -පෙ- සංකප්ප -පෙ- ඵස්ස -පෙ- වෙදනා -පෙ- ඡන්ද -පෙ-පරිළාහ -පෙ- පරියෙසනා -පෙ- ලාභ -පෙ- නො ලාභනානත්තං පටිච්ච උප්පජ්ජති පරියෙසනානානත්තං. නො පරියෙසනානානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං. නො පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං. නො ඡන්දනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තං. නො වෙදනානානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං. නො ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති සංකප්පනානත්තං. නො සංකප්පනානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං. නො සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තන්ති.

නානත්තවග්ගො පඨමො.

**තත්‍රුද්දානං:**

ධාතුසම්ඵස්සං නො චෙතං වෙදනා අපරෙ දුවෙ,
එතං අජ්ඣත්තපඤ්චකං ධාතුසඤ්ඤා ච නො චෙතං,
ඵස්සෙන අපරෙ දුවෙ එතං බාහිරපඤ්චකන්ති.*

* උද්දෙන සුත්තනාමානං විසදිසතා දිස්සතෙ.

මහණෙනි, ධාතුනානාත්වය කවරේ ද යත්: රූපධාතු ය ධම්මධාතු යි. මහණෙනි, මේ ධාතුනානාත්වය යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් ධාතුනානාත්වය නිසා සංඥනානාත්වය උපදී ද, සංඥනානාත්වය නිසා සඞ්කල්පනානාත්වය උපදී ද, ස්පර්ශ ... වේදනා ... ඡන්ද ... පරිදාහ පර්යේෂණා ලාභ ලාභනානාත්වය නිසා පර්යේෂණානානාත්වය නූපදී ද, පර්යේෂණානානාත්වය නිසා පරිදාහනානාත්වය නූපදී ද, ඡන්ද ... වේදනා ... ස්පර්ශ ... සඞ්කල්පනානාත්වය නිසා සංඥනානාත්වය නූපදී ද, සංඥනානාත්වය නිසා ධාතුනානාත්වය නූපදී ද?

මහණෙනි, රූපධාතුව නිසා රූපසංඥව උපදී ... ශබ්දධාතුව ... ගන්ධධාතුව රසධාතුව ස්ප්‍රෂ්ටබ්බධාතුව මහණෙනි, ධර්මධාතුව නිසා ධර්මසංඥව උපදී. ධර්මසංඥව නිසා ... ධර්මපර්යේෂණාව උපදී. ධර්මපර්යේෂණාව නිසා ධර්මලාභය උපදී. ධර්මලාභය නිසා ධර්මපර්යේෂණාව නූපදී. ධර්මපර්යේෂණාව නිසා ධර්මපරිදාහය නූපදී. ධර්මපරිදාහය නිසා ධර්මච්ඡන්දය නූපදී. ධර්මච්ඡන්දය නිසා ධර්මස්පර්ශයෙන් හටගත් වේදනාව නූපදී. ධර්මස්පර්ශයෙන් හටගත් වේදනාව නිසා ධර්මස්පර්ශය නූපදී. ධර්මස්පර්ශය නිසා ධර්මසඞ්කල්පය නූපදී ධර්මසඞ්කල්පය නිසා ධර්මසංඥව නූපදී. ධර්මසංඥව නිසා ධර්මධාතුව නූපදී.

මහණෙනි, මෙසේ ධාතුනානාත්වය නිසා සංඥනානාත්වය උපදී. සංඥනානාත්වය නිසා සඞ්කල්ප ස්පර්ශ . වේදනා .. ඡන්ද... පරිදාහ පර්යේෂණා . ලාභ ... ලාභනානාත්වය නිසා පර්යේෂණානානාත්වය නූපදී. පර්යේෂණානානාත්වය නිසා පරිදාහනානාත්වය නූපදී. පරිදාහනානාත්වය නිසා ඡන්දනානාත්වය නූපදී. ඡන්දනානාත්වය නිසා වෙදනානානාත්වය නූපදී. වෙදනානානාත්වය නිසා ස්පර්ශනානාත්වය නූපදී ස්පර්ශනානාත්වය නිසා සඞ්කල්පනානාත්වය නූපදී. සඞ්කල්පනානාත්වය නිසා සංඥනානාත්වය නූපදී. සංඥනානාත්වය නිසා ධාතුනානාත්වය නූපදී යි.

**නානත්තවර්ගය පළමුවැනි යි.**

එහි උද්දානය:

ධාතු, සමඵස්ස, නොසමඵස්ස, වෙදනා, නොවෙදනා යි මේ අජ්ඣත්ත පඤ්චකය ද. ධාතු, සඤ්ඤා, නොසඤ්ඤා, ඵස්ස, නොඵස්ස යි මේ බාහිර පඤ්චකය ද යි සූත්‍ර දශයෙකි යි.*

* උද්දානයෙහි සූත්‍රනාම වෙනස් ව පෙණේ.

# 2. සත්තධාතුවග්ගො

## 2. 2. 1

## සත්තධාතුසුත්තං

235. සාවත්ථියං-

සත්තිමා භික්ඛවෙ, ධාතුයො. කතමා සත්ත? ආභාධාතු, සුභධාතු,[1] ආකාසානඤ්චායතනධාතු, විඤ්ඤාණඤ්චායතනධාතු, ආකිඤ්චඤ්ඤායතනධාතු, නෙවසඤ්ඤානාසඤ්ඤායතනධාතු, සඤ්ඤාවෙදයිතනිරොධධාතු. ඉමා ඛො භික්ඛවෙ, සත්තධාතුයොති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: යාචායං භන්තෙ, ආභාධාතු, යා ච සුභධාතු, යා ච ආකාසානඤ්චායතනධාතු, යා ච විඤ්ඤාණඤ්චායතනධාතු, යා ච ආකිඤ්චඤ්ඤායතනධාතු, යා ච නෙවසඤ්ඤානාසඤ්ඤායතනධාතු, යා ච සඤ්ඤාවෙදයිතනිරොධධාතු, ඉමා නු ඛො භන්තෙ, ධාතුයො කිං පටිච්ච පඤ්ඤායන්තීති?

යායං භික්ඛු, ආභාධාතු, අයං ධාතු අන්ධකාරං පටිච්ච පඤ්ඤායති. යායං භික්ඛු, සුභධාතු, අයං ධාතු අසුභං පටිච්ච පඤ්ඤායති. යායං භික්ඛු, ආකාසානඤ්චායතනධාතු, අයං ධාතු රූපං පටිච්ච පඤ්ඤායති. යායං භික්ඛු, විඤ්ඤාණඤ්චායතනධාතු, අයං ධාතු ආකාසානඤ්චායතනං පටිච්ච පඤ්ඤායති. යායං භික්ඛු, ආකිඤ්චඤ්ඤායතනධාතු, අයං ධාතු විඤ්ඤාණඤ්චායතනං පටිච්ච පඤ්ඤායති. යායං භික්ඛු, නෙවසඤ්ඤානාසඤ්ඤායතනධාතු, අයං ධාතු ආකිඤ්චඤ්ඤායතනං පටිච්ච පඤ්ඤායති. යායං භික්ඛු, සඤ්ඤාවෙදයිතනිරොධධාතු, අයං ධාතු නිරොධං පටිච්ච පඤ්ඤායතීති.

යා චායං භන්තෙ, ආභාධාතු යා ච සුභධාතු, යා ච ආකාසානඤ්චායතනධාතු, යා ච විඤ්ඤාණඤ්චායතනධාතු, යා ච ආකිඤ්චඤ්ඤායතනධාතු, යා ච නෙවසඤ්ඤානාසඤ්ඤායතනධාතු, යා ච සඤ්ඤාවෙදයිතනිරොධධාතු, ඉමා නු ඛො භන්තෙ, ධාතුයො කථං සමාපත්ති පත්තබ්බාති?

යා චායං භික්ඛු, ආභාධාතු, යා ච සුභධාතු, යා ච ආකාසානඤ්චායතනධාතු, යා ච විඤ්ඤාණඤ්චායතනධාතු, යා ච ආකිඤ්චඤ්ඤායතනධාතු, ඉමා ධාතුයො සඤ්ඤාසමාපත්ති පත්තබ්බා. යායං භික්ඛු, නෙවසඤ්ඤානාසඤ්ඤායතනධාතු, අයං ධාතු සංඛාරාවසෙසා සමාපත්ති පත්තබ්බා. යායං භික්ඛු, සඤ්ඤාවෙදයිතනිරොධධාතු, අයං ධාතු නිරොධසමාපත්ති පත්තබ්බාති.

1. සුභාධාතු - බහූසු.

# 2. සත්තධාතු වර්ගය

## 2. 2. 1

### සත්තධාතු සූත්‍රය

235. සැවැත්නුවර-

මහණෙනි, මේ ධාතූහු සත් දෙනෙකි. කවර සත් දෙනෙක යත්: ආලෝකධාතු ය, සුභධාතු ය, ආකාසානඤ්චායතනධාතු ය, විඤ්ඤාණඤ්චායතනධාතු ය, ආකිඤ්චඤ්ඤායතනධාතු ය, නේවසඤ්ඤානාසඤ්ඤායතන ධාතු ය, සඤ්ඤාවෙදයිතනිරොධ ධාතු යි. මහණෙනි, මොහු සප්තධාතූහු වෙති යි.

මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේ ය: වහන්ස, යම් මේ ආලෝකධාතුවකුත් යම් සුභධාතුවකුත් යම් ආකාසානඤ්චායතනධාතුවකුත් යම් විඤ්ඤාණඤ්චායතනධාතුවකුත් යම් ආකිඤ්චඤ්ඤායතනධාතුවකුත් යම් නේවසඤ්ඤානාසඤ්ඤායතන ධාතුවකුත් යම් සඤ්ඤාවෙදයිතනිරොධධාතුවකුත් වේ ද. වහන්ස, මේ ධාතූහු කුමක් නිසා පැණෙද්ද.?

මහණ, යම් මේ ආලෝකධාතුවක් වේ ද, මේ ධාතුව අඳුර නිසා පැණේ. මහණ, යම් මේ සුභධාතුවක් වේ ද, මේ ධාතුව අසුභය නිසා පැණේ. මහණ, යම් මේ ආකාසානඤ්චායතනධාතුවක් වේ ද, මේ ධාතුව රූපය නිසා පැණේ. මහණ, යම් මේ විඤ්ඤාණඤ්චායතනධාතුවක් වේ ද, මේ ධාතුව ආකාසානඤ්චායතනය නිසා පැණේ. මහණ, යම් මේ ආකිඤ්චඤ්ඤායතන-ධාතුවක් වේ ද, මේ ධාතුව විඤ්ඤාණඤ්චායතනය නිසා පැණේ. මහණ, යම් මේ නේවසඤ්ඤානාසඤ්ඤායතනධාතුවක් වේ ද, මේ ධාතුව ආකිඤ්චඤ්ඤායතනය නිසා පැණේ. මහණ, යම් මේ සඤ්ඤාවෙදයිතනිරොධ-ධාතුවක් වේ ද, මේ ධාතුව (නාමස්කන්ධ) නිරෝධය නිසා පැණේ යි.

වහන්ස, යම් මේ ආලෝකධාතුවකුත් යම් සුභධාතුවකුත් යම් ආකාසානඤ්චායතනධාතුවකුත් යම් විඤ්ඤාණඤ්චායතනධාතුවකුත් යම් ආකිඤ්චඤ්ඤායතනධාතුවකුත් යම් නේවසඤ්ඤානාසඤ්ඤායතනධාතුවකුත් යම් සඤ්ඤාවෙදයිතනිරෝධධාතුවකුත් වේ ද, වහන්ස, මේ ධාතූහු කෙබඳු සමාපත්ති නම් ව පැමිණිය යුත්තෝ වෙද්ද?

මහණ, යම් මේ ආලොකධාතුවකුත් යම් සුභධාතුවකුත් යම් ආකාසානඤ්චායතනධාතුවකුත් යම් විඤ්ඤාණඤ්චායතනධාතුවකුත් යම් ආකිඤ්චඤ්ඤායතනධාතුවකුත් වේ ද, මේ ධාතූහු සංඥාසමාපත්ති නම් ව පැමිණිය යුත්තා හ. මහණ, යම් මේ නේවසඤ්ඤානාසඤ්ඤායතනධාතුවක් වේ ද, මේ ධාතුව සංස්කාරාවශේෂසමාපත්ති නම් ව පැමිණිය යුත්තී ය. මහණ, යම් මේ සඤ්ඤාවෙදයිතනිරෝධධාතුවක් වේ ද, මේ ධාතුව නිරොධ-සමාපත්ති නම් ව පැමිණිය යුත්තී යි.

## 2. 2. 2.

## සනිදානසුත්තං

236. **සාවත්ථියං-**

සනිදානං භික්ඛවෙ, උප්පජ්ජති කාමවිතක්කො නො අනිදානං, සනිදානං උප්පජ්ජති ව්‍යාපාදවිතක්කො නො අනිදානං, සනිදානං උප්පජ්ජති විහිංසාවිතක්කො නො අනිදානං.

කථඤ්ච භික්ඛවෙ, සනිදානං උප්පජ්ජති කාමවිතක්කො නො අනිදානං, සනිදානං උප්පජ්ජති ව්‍යාපාදවිතක්කො නො අනිදානං, සනිදානං උප්පජ්ජති විහිංසාවිතක්කො නො අනිදානං?

කාමධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති කාමසඤ්ඤා. කාමසඤ්ඤං පටිච්ච උප්පජ්ජති කාමසංකප්පො. කාමසංකප්පං පටිච්ච උප්පජ්ජති කාමච්ඡන්දො. කාමච්ඡන්දං පටිච්ච උප්පජ්ජති කාමපරිළාහො. කාමපරිළාහං පටිච්ච උප්පජ්ජති කාමපරියෙසනා. කාමපරියෙසනං භික්ඛවෙ පරියෙසමානො අස්සුතවා පුථුජ්ජනො තීහි ඨානෙහි මිච්ඡා පටිපජ්ජති: කායෙන වාචාය මනසා.

ව්‍යාපාදධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති ව්‍යාපාදසඤ්ඤා. ව්‍යාපාදසඤ්ඤං පටිච්ච උප්පජ්ජති ව්‍යාපාදසංකප්පො. ව්‍යාපාදසංකප්පං පටිච්ච උප්පජ්ජති ව්‍යාපාදච්ඡන්දො. ව්‍යාපාදච්ඡන්දං පටිච්ච උප්පජ්ජති ව්‍යාපාදපරිළාහො. ව්‍යාපාදපරිළාහං පටිච්ච උප්පජ්ජති ව්‍යාපාදපරියෙසනා. ව්‍යාපාදපරියෙසනං භික්ඛවෙ, පරියෙසමානො අස්සුතවා පුථුජ්ජනො තීහි ඨානෙහි මිච්ඡා පටිපජ්ජති: කායෙන වාචාය මනසා.

විහිංසාධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති විහිංසාසඤ්ඤා -පෙ- විහිංසාසංකප්පො -පෙ- විහිංසාඡන්දො -පෙ- විහිංසාපරිළාහො -පෙ- විහිංසාපරියෙසනා -පෙ- විහිංසාපරියෙසනං භික්ඛවෙ, පරියෙසමානො අස්සුතවා පුථුජ්ජනො තීහි ඨානෙහි මිච්ඡා පටිපජ්ජති: කායෙන වාචාය මනසා.

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො ආදිත්තං තිණුක්කං සුක්ඛෙ තිණදායෙ නික්ඛිපෙය්‍ය,[1] නො චෙ හත්ථෙහි ච පාදෙහි ච ඛිප්පමෙව නිබ්බාපෙය්‍ය, එවං හි භික්ඛවෙ, යෙ තිණකට්ඨනිස්සිතා පාණා, තෙ අනයව්‍යසනං ආපජ්ජෙය්‍යුං.

එවමෙව ඛො භික්ඛවෙ, යො හි කොචි සමණො වා බ්‍රාහ්මණො වා උප්පන්නං විසමගතං අකුසලසඤ්ඤං[2] න ඛිප්පමෙව පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, සො දිට්ඨෙ චෙව[3] ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සඋපායාසං සපරිළාහං. කායස්ස ච භෙදා[4] පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා.

සනිදානං භික්ඛවෙ, උප්පජ්ජති නෙක්ඛම්මවිතක්කො නො අනිදානං. සනිදානං උප්පජ්ජති අව්‍යාපාදවිතක්කො නො අනිදානං. සනිදානං උප්පජ්ජති අවිහිංසාවිතක්කො නො අනිදානං.

---

1. නික්ඛිපෙය්‍ය - සතා. 2. විසමගතං සඤ්ඤං - මජ්සං, PST.
3. දිට්ඨෙව ධම්මෙ - සීමු, සතා. 4. කායස්ස භෙදා - සීමු, සතා.

2. 2. 2.

## සනිදාන සූත්‍රය

236. සැවැත්නුවර-

මහණෙනි, කාමවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී. ප්‍රත්‍යය රහිත ව නූපදී. ව්‍යාපාදවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී. ප්‍රත්‍යය රහිත ව නූපදී. විහිංසාවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී ප්‍රත්‍යය රහිත ව නූපදී.

මහණෙනි, කෙසේ නම් කාමවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී ද, ප්‍රත්‍යය රහිත ව නූපදී ද, ව්‍යාපාදවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී ද, ප්‍රත්‍යය රහිත ව නූපදී ද, විහිංසාවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී ද, ප්‍රත්‍යය රහිත ව නූපදී ද?

මහණෙනි, කාමධාතුව නිසා කාමසංඥාව උපදී. කාමසංඥාව නිසා කාමසඞ්කල්පය උපදී. කාමසඞ්කල්පය නිසා කාමච්ඡන්දය උපදී. කාමච්ඡන්දය නිසා කාමපරිදාහය උපදී. කාමපරිදාහය නිසා කාමපර්යේෂණාව උපදී. මහණෙනි, කාමපර්යේෂණය සොයන නුගත් පුහුදුන් තෙමේ කයින් වචනයෙන් සිතින් යන තුන් කරුණින් වරදවා පිළිපදී.

මහණෙනි, ව්‍යාපාදධාතුව නිසා ව්‍යාපාදසංඥාව උපදී. ව්‍යාපාදසංඥාව නිසා ව්‍යාපාදසඞ්කල්පය උපදී. ව්‍යාපාදසඞ්කල්පය නිසා ව්‍යාපාදච්ඡන්දය උපදී. ව්‍යාපාදච්ඡන්දය නිසා ව්‍යාපාදපරිදාහය උපදී. ව්‍යාපාදපරිදාහය නිසා ව්‍යාපාදපර්යේෂණාව උපදී. මහණෙනි, ව්‍යාපාදපර්යේෂණය සොයන නුගත් පුහුදුන් තෙමේ කයින් වචනයෙන් සිතින් යන තුන් කරුණින් වරදවා පිළිපදී

මහණෙනි, විහිංසාධාතුව නිසා විහිංසා සංඥාව උපදී ... විහිංසා-සංකල්පය .. විහිංසාඡන්දය ... විහිංසාපරිදාහය .... විහිංසාපර්යේෂණාව ... මහණෙනි, විහිංසාපර්යේෂණය සොයන නුගත් පුහුදුන් තෙමේ කයින් වචනයෙන් සිතින් යන තුන් කරුණෙන් වරදවා පිළිපදී.

මහණෙනි, යම් සේ පුරුෂයෙක් ඇවිලගත් තණ හුලක් වියලි තණලැහැබෙක හෙලන්නේ ද, ඉදින් අතින් පයින් වහා නො නිවන්නේ නම් මහණෙනි, මෙසේ තණ හා දව ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙත් ද, ඔහු විනාශයට පැමිණෙන්නාහු ය.

මහණෙනි, එසෙයින් ම යම් කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ උපන්නා වූ විෂම බවට පැමිණි අකුශල සංඥාව වහා ම දුරු නො කෙරේ ද, බැහැර නො කෙරේ ද, අවසන් නො කෙරේ ද, අනුක්‍රමයෙන් නො ඉපැද්මට නො පමුණුවා ද, හෙතෙමේ මේ අත්බැව්හිත් පීඩා සහිත ව උපායාස සහිත ව පරිදාහ සහිත ව දුකයේ වෙසෙයි. කාබුන් මරණින් මතුත් දුගතිය කැමති විය යුතු යි.

මහණෙනි, නෛෂ්ක්‍රම්‍යවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී. ප්‍රත්‍යය රහිත ව නූපදී. අව්‍යාපාදවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී. ප්‍රත්‍යය රහිත ව නූපදී. අවිහිංසාවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී. ප්‍රත්‍යය රහිත ව නූපදී.

කථඤ්ච භික්ඛවෙ, සනිදානං උප්පජ්ජති නෙක්ඛම්මවිතක්කො නො අනිදානං, සනිදානං උප්පජ්ජති අබ්‍යාපාදවිතක්කො නො අනිදානං, සනිදානං උප්පජ්ජති අවිහිංසාවිතක්කො නො අනිදානං?

නෙක්ඛම්මධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති නෙක්ඛම්මසඤ්ඤා. නෙක්ඛම්මසඤ්ඤං පටිච්ච උප්පජ්ජති නෙක්ඛම්මසංකප්පො. නෙක්ඛම්මසංකප්පං පටිච්ච උප්පජ්ජති නෙක්ඛම්මච්ඡන්දො. නෙක්ඛම්මච්ඡන්දං පටිච්ච උප්පජ්ජති නෙක්ඛම්මපරිළාහො. නෙක්ඛම්මපරිළාහං පටිච්ච උප්පජ්ජති නෙක්ඛම්මපරියෙසනා. නෙක්ඛම්මපරියෙසනං භික්ඛවෙ, පරියෙසමානො සුතවා අරියසාවකො තීහි ඨානෙහි සම්මා පටිපජ්ජති: කායෙන වාචාය මනසා.

අබ්‍යාපාදධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති අබ්‍යාපාදසඤ්ඤා -පෙ- අබ්‍යාපාදසංකප්පො -පෙ- අබ්‍යාපාදච්ඡන්දො -පෙ- අබ්‍යාපාදපරිළාහො -පෙ- අබ්‍යාපාදපරියෙසනා -පෙ- අබ්‍යාපාදපරියෙසනං භික්ඛවෙ, පරියෙසමානො සුතවා අරියසාවකො තීහි ඨානෙහි සම්මා පටිපජ්ජති: කායෙන වාචාය මනසා.

අවිහිංසාධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති අවිහිංසාසඤ්ඤා. අවිහිංසාසඤ්ඤං පටිච්ච උප්පජ්ජති අවිහිංසාසංකප්පො. අවිහිංසාසංකප්පං පටිච්ච උප්පජ්ජති අවිහිංසාච්ඡන්දො. අවිහිංසාච්ඡන්දං පටිච්ච උප්පජ්ජති අවිහිංසාපරිළාහො. අවිහිංසාපරිළාහං පටිච්ච උප්පජ්ජති අවිහිංසාපරියෙසනා. අවිහිංසාපරියෙසනං භික්ඛවෙ, පරියෙසමානො සුතවා අරියසාවකො තීහි ඨානෙහි සම්මා පටිපජ්ජති: කායෙන වාචාය මනසා.

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො ආදිත්තං තිණුක්කං සුක්ඛෙ තිණදායෙ නික්ඛිපෙය්‍ය, තමෙනං හත්ථෙහි ච පාදෙහි ච ඛිප්පමෙව නිබ්බාපෙය්‍ය, එවං හි භික්ඛවෙ, යෙ තිණකට්ඨනිස්සිතා පාණා, තෙ න අනයව්‍යසනං ආපජ්ජෙය්‍යුං.

එවමෙව ඛො භික්ඛවෙ, යො හි කොචි සමණො වා බ්‍රාහ්මණො වා උප්පන්නං විසමගතං අකුසලසඤ්ඤං ඛිප්පමෙව පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, සො දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං. කායස්ස ච භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛාති.

## 2. 2. 3.

## ගිඤ්ජකාවසථසුත්තං

237. එකං සමයං භගවා ඤාතිකෙ[1] විහරති ගිඤ්ජකාවසථෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච:

ධාතුං භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති සඤ්ඤා, උප්පජ්ජති දිට්ඨි, උප්පජ්ජති විතක්කොති.

එවං වුත්තෙ, ආයස්මා කච්චානො[2] භගවන්තං එතදවොච: "යායං භන්තෙ, දිට්ඨි අසම්මාසම්බුද්ධෙසු සම්මාසම්බුද්ධාති. අයං නු ඛො භන්තෙ දිට්ඨි කිං පටිච්ච පඤ්ඤායතී"ති.?

---

1. ඤාතිකෙසු-PTS. 2. සන්ධො සච්චායනො - PTS. සන්ධා කච්චායනො - සී 1, 2

මහණෙනි, කෙසේ නම් නෛෂ්ක්‍රම්‍යවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී ද, ප්‍රත්‍යය රහිත ව නූපදී ද, අව්‍යාපාදවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී ද, ප්‍රත්‍යය රහිත ව නූපදී ද, අවිහිංසාවිතර්කය ප්‍රත්‍යය සහිත ව උපදී ද, ප්‍රත්‍යය රහිත ව නූපදී ද?

මහණෙනි, නෛෂ්ක්‍රම්‍යධාතුව නිසා නෛෂ්ක්‍රම්‍යසංඥාව උපදී. නෛෂ්ක්‍රම්‍යසංඥාව නිසා නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පය උපදී. නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පය නිසා නෛෂ්ක්‍රම්‍යච්ඡන්දය උපදී. නෛෂ්ක්‍රම්‍යච්ඡන්දය නිසා නෛෂ්ක්‍රම්‍ය-පරිදාහය උපදී නෛෂ්ක්‍රම්‍ය පරිදාහය නිසා නෛෂ්ක්‍රම්‍යපර්‍යෙෂණාව උපදී. නෛෂ්ක්‍රම්‍යපර්‍යෙෂණය කරණ ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවක තෙමේ කයින් වචනයෙන් මනසින් යන තුන් කරුණින් මනා සේ පිළිපදී.

මහණෙනි, අව්‍යාපාදධාතුව නිසා අව්‍යාපාදසංඥාව උපදී ... අව්‍යාපාද-සංකල්පය .. අව්‍යාපාදච්ඡන්දය.. අව්‍යාපාදපරිදාහය...අව්‍යාපාදප ර්‍යෙෂණාව . මහණෙනි. අව්‍යාපාදපර්‍යෙෂණය කරණ ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවක තෙමේ කයින් වචනයෙන් සිතින් යන තුන් කරුණින් මැනවින් පිළිපදී.

මහණෙනි, අවිහිංසාධාතුව නිසා අවිහිංසාසංඥාව උපදී. අවිහිංසාසංඥාව නිසා අවිහිංසාසඞ්කල්පය උපදී, අවිහිංසාසඞ්කල්පය නිසා අවිහිංසාඡන්දය උපදී. අවිහිංසාඡන්දය නිසා අවිහිංසාපරිදාහය උපදී. අවිහිංසාපරිදාහය නිසා අවිහිංසාපර්‍යෙෂණය උපදී. මහණෙනි, අවිහිංසාපර්‍යෙෂණය කරණ ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවක තෙමේ කයින් වචනයෙන් සිතින් යන තුන් කරුණින් මැනවින් පිළිපදී.

මහණෙනි, යම් සේ පුරුෂයෙක් ගිනි ගත් තණහුලක් වියලිතණ-ලැහැබෙක බහා ලන්නේ ද, ඒ මේ තණහුල අතින් පයින් වහා ම නිවන්නේ ද, මහණෙනි, මෙසේ තෘණ හා දුව ඇසුරු කළ යම් ප්‍රාණීහු වෙද්ද, ඔහු විනාශයට නො පැමිණෙන්නාහු ය.

මහණෙනි, එසෙයින් ම යම් කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ විෂම-බවට පැමිණි උපන් අකුශලසංඥාව වහා ම දුරු කෙරේ ද, බැහැර කෙරේ ද, මුලුසුන් කෙරේ ද, නැවත නො හටගන්නා බවට පමුණුවා ද, හෙතෙමේ මේ අත්බැව්හි ද පීඩා රහිත ව ආයාස රහිත ව පරිදාහ රහිතව සුවසේ වෙසෙයි කාබුන් මරණින් මතු ද සුගතිය කැමති විය යුතු යි.

2. 2. 3.

### ගිඤ්ජකාවසථ සූත්‍රය

237. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ඤාතික ගම්හි ගිඤ්ජ-කාවසථයෙහි (=ගඩොලින් කළ ගෙහි) වැඩ වසන සේක එහි දී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’ යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, ධාතු (අධ්‍යාශය) නිසා සංඥාව උපදී, දෘෂ්ටිය උපදී, විතර්කය උපදී යි

මෙසේ වදාළ කල්හි ආයුෂමත් කච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: වහන්ස, සම්මාසම්බුද්ධ නො වන්නවුන් කෙරෙහි ‘සම්මාසම්බුද්ධහ’ යන යම් මේ දෘෂ්ටියෙක් වේ ද, වහන්ස, මේ දෘෂ්ටිය කුමක් නිසා පැණේ ද යි?

මහති බො එසා කච්චාන ධාතු යදිදං අවිජ්ජාධාතු. හීනං කච්චාන, ධාතුං පටිච්ච උප්පජ්ජති හීනා සඤ්ඤා, හීනා දිට්ඨි, හීනො විතක්කො, හීනා චෙතනා, හීනා පත්ථනා, හීනො පණිධි, හීනො පුග්ගලො, හීනා වාචා. හීනං ආචික්ඛති, දෙසෙති, පඤ්ඤපෙති, පට්ඨපෙති, විවරති, විභජති, උත්තානී-කරොති. හීනා තස්ස උප්පත්තීති[1] වදාමි.

මජ්ඣිමං කච්චාන, ධාතුං පටිච්ච උප්පජ්ජති මජ්ඣිමා සඤ්ඤා, මජ්ඣිමා දිට්ඨි, මජ්ඣිමො විතක්කො, මජ්ඣිමා චෙතනා, මජ්ඣිමා පත්ථනා, මජ්ඣිමො පණිධි, මජ්ඣිමො පුග්ගලො, මජ්ඣිමා වාචා. මජ්ඣිමං ආචික්ඛති, දෙසෙති, පඤ්ඤපෙති, පට්ඨපෙති, විවරති, විභජති, උත්තානීකරොති. මජ්ඣිමා තස්ස උප්පත්තීති වදාමි.

පණීතං කච්චාන, ධාතුං පටිච්ච උප්පජ්ජති පණීතා සඤ්ඤා, පණීතා දිට්ඨි, පණීතො විතක්කො, පණීතා චෙතනා, පණීතා පත්ථනා, පණීතො පණිධි, පණීතො පුග්ගලො, පණීතා වාචා පණීතං ආචික්ඛති, දෙසෙති, පඤ්ඤපෙති, පට්ඨපෙති, විවරති, විභජති, උත්තානීකරොති පණීතා තස්ස උප්පත්තීති වදාමීති

## 2. 2. 4.

## හීනාධිමුත්තික සුත්තං

238. සාවත්ථියං-

ධාතුසොව[2] භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

අතීතම්පි[3] භික්ඛවෙ, අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිංසු සමිංසු. හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු. කල්‍යාණාධි-මුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු.

අනාගතම්පි[4] භික්ඛවෙ, අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිස්සන්ති සමෙස්සන්ති, හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමෙස්සන්ති. කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමෙස්සන්ති.

එතරහි[5] භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති: හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති.

---

1. උප්පත්තීති - මජ්ඣං, සතා. 2. ධාතුසො - සක්ඛ්ව. 3. අතීතම්පි බො -මජ්ඣං.
4. අනාගතම්පි බො - මජ්ඣං. 5. එතරහි බො - මජ්ඣං.

කච්චාන, යම් මේ අවිද්‍යාධාතුවෙක් වේ ද, මේ ධාතුව මහත් ය කච්චාන, හීනාධ්‍යාශය නිසා හීන සංඥාව උපදී. හීන දෘෂ්ටිය, හීන විතර්කය හීන චේතනාව, හීන ප්‍රාර්ථනාව, හීන ප්‍රණිධිය, හීන පුද්ගලයා, හීන වචන උපදී. හීන වූවක් කියයි, දේශනා කෙරෙයි, පණවයි, පිහිටුවයි, විවෘත කෙරෙයි, බෙදයි, උඩුහුරු කෙරෙයි. ඔහුගේ ඉපැද්ම හීන ය යි කියමි.

කච්චාන, මධ්‍යම අධ්‍යාශය නිසා මධ්‍යම සංඥාව උපදී, මධ්‍යම දෘෂ්ටිය, මධ්‍යම විතර්කය, මධ්‍යම චේතනාව මධ්‍යම ප්‍රාර්ථනාව, මධ්‍යම ප්‍රණිධිය, මධ්‍යම පුද්ගලයා, මධ්‍යම වචන උපදී. මධ්‍යම වූවක් කියයි, දෙශනා කරයි, පණවයි, පිහිටුවයි, විවෘත කෙරෙයි බෙදයි, උඩුහුරු කෙරෙයි. ඔහුගේ ඉපැද්ම මධ්‍යම ය යි කියමි.

කච්චාන ප්‍රණීතාධ්‍යාශය නිසා ප්‍රණීත සංඥාව උපදී. ප්‍රණීත දෘෂ්ටිය, ප්‍රණීත විතර්කය, ප්‍රණීත චේතනාව ප්‍රණීත ප්‍රාර්ථනාව, ප්‍රණීත ප්‍රණිධිය ප්‍රණීත පුද්ගලයා, ප්‍රණීත වචන උපදී. ප්‍රණීත වූවක් කියයි, දේශනා කෙරෙයි, පණවයි, පිහිටුවයි, විවෘත කෙරෙයි, බෙදයි, උඩුහුරු කෙරෙයි. ඔහුගේ ඉපැද්ම ප්‍රණීත ය යි කියමි යි.

## 2. 2. 4.

## හීනාධිමුත්තික සූත්‍රය

238. **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත් ලාමක අදහස් ඇති සත්ත්වයෝ ලාමක අදහස් ඇත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්.

මහණෙනි, ඉකුත් කාලයෙහි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳුනහ, එකතු වූහ: ලාමක අදහස් ඇත්තෝ ලාමක අදහස් ඇත්තවුන් සමග සැසැඳුනහ, එකතු වූහ. කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳුනහ, එකතු වූහ.

මහණෙනි, මතු කාලයෙහි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙන්නාහ, එකතු වන්නාහ: ලාමක අදහස් ඇත්තෝ ලාමක අදහස් ඇත්තවුන් සමග සැසැඳෙන්නාහ, එකතු වන්නාහ. කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳෙන්නාහ, එකතු වන්නාහ.

මහණෙනි, දැන් පවත්නා කල්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: ලාමක අදහස් ඇත්තෝ ලාමක අදහස් ඇත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති යි.

2. 2. 5. ධාතු

## චඞ්කමසුත්තං

239. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා[1] සාරිපුත්තො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං භගවතො අවිදූරෙ චඞ්කමති. ආයස්මාපි ඛො මහාමොග්ගල්ලානො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං භගවතො අවිදූරෙ චඞ්කමති. ආයස්මාපි ඛො මහාකස්සපො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං භගවතො අවිදූරෙ චඞ්කමති. ආයස්මාපි ඛො අනුරුද්ධො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං භගවතො අවිදූරෙ චඞ්කමති. ආයස්මාපි ඛො පුණ්ණො මන්තාණිපුත්තො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං භගවතො අවිදූරෙ චඞ්කමති. ආයස්මාපි ඛො උපාලි සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං භගවතො අවිදූරෙ චඞ්කමති. ආයස්මාපි ඛො ආනන්දො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං භගවතො අවිදූරෙ චඞ්කමති. දෙවදත්තොපි ඛො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං භගවතො අවිදූරෙ චඞ්කමති.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, සාරිපුත්තං සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං චඞ්කමන්තන්ති? 'එවං භන්තෙ' සබ්බෙ ඛො එතෙ භික්ඛවෙ, භික්ඛූ මහාපඤ්ඤා.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, මොග්ගල්ලානං[2] සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං චඞ්කමන්තන්ති? 'එවං භන්තෙ' සබ්බෙ ඛො[3] එතෙ භික්ඛවෙ, භික්ඛූ මහිද්ධිකා.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, කස්සපං[4] සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං චඞ්කමන්තන්ති? 'එවං භන්තෙ' සබ්බෙ ඛො එතෙ භික්ඛවෙ, භික්ඛූ ධුතවාදා.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, අනුරුද්ධං සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං චඞ්කමන්තන්ති? 'එවං භන්තෙ' සබ්බෙ ඛො එතෙ භික්ඛවෙ, භික්ඛූ දිබ්බචක්ඛුකා.

පස්සථ නො භික්ඛවෙ, පුණ්ණං මන්තාණිපුත්තං සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං චඞ්කමන්තන්ති? 'එවං භන්තෙ' සබ්බෙ ඛො එතෙ භික්ඛවෙ, භික්ඛූ ධම්මකථිකා.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, උපාලිං සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං චඞ්කමන්තන්ති? 'එවං භන්තෙ' සබ්බෙ ඛො එතෙ භික්ඛවෙ, භික්ඛූ විනයධරා.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, ආනන්දං සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං චඞ්කමන්තන්ති? 'එවං භන්තෙ' සබ්බෙ ඛො එතෙ භික්ඛවෙ, භික්ඛූ බහුස්සුතා.

---

1 ආයස්මාපි ඛො - PTS, ස්‍යා, සී 2. 2. මහාමොග්ගල්ලානං. සීමු. 3. සබ්බෙපි ඛො - සී. 1, 2, PTS. 4 මහාකස්සපං සීමු. 1

## 2. 2. 5.

### චඞ්කම සූත්‍රය

239. **එක්කලෙක** භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** **සමීපයෙහි** **ගිජ්ඣකූටපව්වයෙහි** වැඩ වසන සේක. එකල්හි ආයුෂමත් **සැරියුත්** තෙරණුවෝ බොහෝ මහණුන් සමග භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සක්මන් කෙරෙති. ආයුෂමත් **මහමුගලන්** තෙරණුවෝ ද බොහෝ මහණුන් සමග භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සක්මන් කෙරෙති. ආයුෂමත් **මහකසුප්** තෙරණුවෝ ද බොහෝ මහණුන් සමග භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සක්මන් කෙරෙති. ආයුෂමත් **අනුරුද්ධ** තෙරණුවෝ ද බොහෝ මහණුන් සමග භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සක්මන් කෙරෙති. ආයුෂමත් **මන්තානිපුත් පුණ්ණ** තෙරණුවෝ ද බොහෝ මහණුන් සමග භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සක්මන් කෙරෙති. ආයුෂමත් **උපාලි** තෙරණුවෝ ද බොහෝ මහණුන් සමග භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සක්මන් කෙරෙති. ආයුෂමත් **ආනන්ද** තෙරණුවෝ ද බොහෝ මහණුන් සමග භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සක්මන් කෙරෙති. **දෙව්දත්** තෙමේ ද බොහෝ මහණුන් සමග භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සක්මන් කෙරෙයි

එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, තෙපි බොහෝ මහණුන් සමග සක්මන් කරණ සැරියුත් දකිවු ද? වහන්ස, එසේ ය. මහණෙනි, මේ සියලු භික්ෂූහු මහපැණැත්තහ.

මහණෙනි, තෙපි බොහෝ භික්ෂූන් සමග සක්මන් කරණ මුගලන් දකිවු ද? වහන්ස, එසේ ය මහණෙනි, මේ සියලු භික්ෂූහු මහත් සෘද්ධි ඇත්තහ.

මහණෙනි, තෙපි බොහෝ මහණුන් සමග සක්මන් කරණ කසුප් දකිවු ද? වහන්ස, එසේ ය. මහණෙනි, මේ සියලු භික්ෂූහු ධුතවාදීහු ය.

මහණෙනි, තෙපි බොහෝ භික්ෂූන් සමග සක්මන් කරණ අනුරුද්ධ දකිවු ද? වහන්ස, එසේ ය. මහණෙනි, මේ සියලු භික්ෂූහු දිවැස් ඇත්තහ.

මහණෙනි, තෙපි බොහෝ මහණුන් සමග සක්මන් කරණ මන්තානීපුත් පුණ්ණ දකිවු ද? වහන්ස, එසේ ය මහණෙනි, මේ සියලු භික්ෂූහු ධර්මකථිකයහ.

මහණෙනි, තෙපි බොහෝ මහණුන් සමග සක්මන් කරණ උපාලි දකිවු ද? වහන්ස, එසේ ය. මහණෙනි, මේ සියලු භික්ෂූහු විනයධරයහ.

මහණෙනි, තෙපි බොහෝ මහණුන් සමග සක්මන් කරණ අනඳ දකිවු ද? වහන්ස, එසේ ය. මහණෙනි, මේ සියලු භික්ෂූහු බහුශ්‍රැතයහ.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, දෙවදත්තං සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං චඞ්කමන්තන්ති? 'එවං භන්තෙ' සබ්බෙ ඛො එතෙ භික්ඛවෙ, භික්ඛූ පාපිච්ඡා.

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

අතීතම්පි භික්ඛවෙ, අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිංසු සමිංසු: හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු.

අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිස්සන්ති සමෙස්සන්ති: හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමෙස්සන්ති. කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමෙස්සන්ති.

එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති: හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති.

## 2. 2. 6

### සගාථසුත්තං

240. **සාවත්ථියං-**

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිංසු සමිංසු: හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු. අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිස්සන්ති සමෙස්සන්ති: හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමෙස්සන්ති. එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ, ගුථො ගුථෙන සංසන්දති සමෙති. මුත්තං මුත්තෙන සංසන්දති සමෙති. ඛෙළො ඛෙළෙන සංසන්දති සමෙති. පුබ්බො පුබ්බෙන සංසන්දති සමෙති. ලොහිතං ලොහිතෙන සංසන්දති සමෙති. එවමෙව ඛො භික්ඛවෙ, ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති -පෙ- අතීතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති: හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

මහණෙනි, තෙපි බොහෝ මහණුන් සමග සක්මන් කරණ දෙව්දතු දකිවු ද? වහන්ස, එසේ ය. මහණෙනි, මේ සියලු භික්ෂූහු පාපිච්ඡයහ.

මහණෙනි, සත්‍වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: ලාමක අදහස් ඇත්තෝ ලාමක අදහස් ඇත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්.

මහණෙනි, අතීත කාලයෙහි ද සත්‍වයෝ අදහස් වශයෙන් ම සැසැඳුනහ එක් වූහ: ලාමක අදහස් ඇත්තෝ ලාමක අදහස් ඇත්තවුන් සමග සැසැඳුනහ, එක් වූහ. කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳුනහ. එක් වූහ.

මහණෙනි, මතු කාලයෙහි ද අදහස් වශයෙන් ම සත්‍වයෝ සැසැඳෙන්නාහු ය, එක් වන්නාහු ය: ලාමක අදහස් ඇත්තෝ ලාමක අදහස් ඇත්තවුන් සමග සැසැඳෙන්නාහු ය, එක් වන්නාහු ය. කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳෙන්නාහ, එකතු වන්නාහ.

මහණෙනි, දැන් පවත්නා කල්හි ද අදහස් වශයෙන් ම සත්‍වයෝ සැසැඳෙති, එකතු වෙති: ලාමක අදහස් ඇත්තෝ ලාමක අදහස් ඇත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති. කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති යි.

## 2. 2. 6

## සගාථසූත්‍රය

240. **සැවැත්නුවර-**

මහණෙනි, අදහස් වශයෙන් ම සත්‍වයෝ සැසැඳෙති, එකතු වෙති: ලමු අදහස් ඇත්තෝ ලමු අදහස් ඇත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති. මහණෙනි, ඉකුත් කාලයෙහි ද සත්‍වයෝ අදහස් වශයෙන් ම සැසැඳුනහ. එකතු වූහ: ලමු අදහස් ඇත්තෝ ලමු අදහස් ඇත්තවුන් සමග සැසැඳුනහ, එකතු වූහ. මහණෙනි, මතු කාලයෙහි ද සත්‍වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙන්නාහ, එකතු වන්නාහ: ලමු අදහස් ඇත්තෝ ලමු අදහස් ඇත්තවුන් සමග සැසැඳෙන්නාහ, එකතු වන්නාහ. මහණෙනි, දැන් වත්මන්හි ද සත්‍වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙති. එකතු වෙති: ලමු අදහස් ඇත්තෝ ලමු අදහස් ඇත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති.

මහණෙනි, යම් සේ මල මල සමග සැසැදේ ද, එකතු වේ ද; මූත්‍ර මූත්‍ර සමග සැසැදේ ද, එකතු වේ ද; කෙල කෙල සමග සැසැදේ ද, එකතු වේ ද; පූයාව පූයාව සමග සැසැදේ ද, එකතු වේ ද; ලේ ලේ සමග සැසැදේ ද, එකතු වේ ද; මහණෙනි, එසෙයින් ම සත්‍වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙති, එකතු වෙති. ... මහණෙනි, අයු කල්හි ද .. මහණෙනි, මතු කාලයෙහි ද ... මහණෙනි, දැන් වත්මන් කල්හි ද සත්‍වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: ලමු අදහස් ඇත්තෝ ලමු අදහස් ඇත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති.

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිංසු සමිංසු: කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු. අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති: කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ, ඛීරං ඛීරෙන සංසන්දති සමෙති. තෙලං තෙලෙන සංසන්දති සමෙති. සප්පි සප්පිනා සංසන්දති සමෙති. මධු මධුනා සංසන්දති සමෙති. ඵාණිතං ඵාණිතෙන සංසන්දති සමෙති. එවමෙව ඛො භික්ඛවෙ, ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති: කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධි-මුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති: කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

සංසග්ගා වනථො ජාතො අසංසග්ගෙන ඡිජ්ජති,
පරිත්තං දාරුමාරුය්හ යථා සීදෙ මහණ්ණවෙ.
එවං කුසීතමාගම්ම සාධුජීවිපි සීදති,
තස්මා තං පරිවජ්ජෙය්‍ය කුසීතං හීනවීරියං,
පවිවිත්තෙහි අරියෙහි පහිතත්තෙහි ඣායිහි,
නිච්චං ආරද්ධවිරියෙහි පණ්ඩිතෙහි සහා වසෙ'ති.

## 2. 2. 7.

### අස්සද්ධසුත්තං[1]

241. සාවත්ථියං-

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අහිරිකා අහිරිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අනොත්තාපිනො අනොත්තාපීහි[2] සද්ධිං සංසන්දන්ති සමෙන්ති අප්පස්සුතා අප්පස්සුතෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. කුසීතා කුසීතෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.*

1 අස්සද්ධ සංසන්දන සුත්ත - මජසං. 2 අනොත්තප්පිනො අනොත්තප්පීහි - මජසං.

* "සද්ධා සද්ධෙහි සද්ධිං සංසන්දන්ති, සමෙන්ති, හිරිමනා හිරිමනෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති, ඔත්තාපිනො ඔත්තාපීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති, බහුස්සුතා බහුස්සුතෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති, ආරද්ධවිරියා ආරද්ධවිරියෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති උපට්ඨිතසතිනො උපට්ඨිතසතීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති". දිස්සන්තෙත්ථාසම්බන්ධො පාඨො PTS පොත්ථකෙ

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති. මහණෙනි, ඉකුත් කල්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳුනහ, එකතු වූහ: කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳුනහ, එකතු වූහ මහණෙනි, මතු කල්හි ද ... මහණෙනි, දැන් වත්මන් කල්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙති, එකතු වෙති: කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමන සැසැඳෙති, එකතු වෙති.

මහණෙනි, යම් සේ කිරි කිරි සමග සැසැඳේ ද, එකතු වේ ද, තෙල් තෙල් සමග සැසැඳේ ද, එකතු වේ ද; ගිතෙල් ගිතෙල් සමග සැසැඳේ ද, එකතු වේ ද; මී මී සමග සැසැඳේ ද; එකතු වේ ද, පැණි පැණි සමග සැසැඳේ ද, එකතු වේ ද, මහණෙනි, එසෙයින් ම සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙති, එකතු වෙති. කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති. මහණෙනි, ඉකුත් කල්හි ද... මහණෙනි, මතු කල්හි ද ..මහණෙනි, දැන් වත්මන් කල්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙති, එකතු වෙති. කලණ අදහස් ඇත්තෝ කලණ අදහස් ඇත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා යළි මතු ද මෙය වදාළ සේක:

ඇල්මෙන් කෙලෙස්වනය හටගන්නේ ය, නො ඇල්මෙන් සිඳෙයි. කුඩා දරකඩකට නැගී (සිටියහු) මහමුහුදෙහි යම් සේ කිඳෙන්නේ ද,

එසෙයින් ම පිරිසුදු දිවි ඇත්තේ ද මැලි පුහුලා වෙත පැමිණ කිඳෙයි. (පිරිහෙයි.) එහෙයින් වීර්‍ය්‍යය නැති ඒ මැලි පුහුලා දුරු කරන්නේ ය.

ප්‍රකර්ෂ විවේක ඇති ආර්‍ය්‍ය වූ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති පටන් ගත් වීර්‍ය්‍යය ඇති ධ්‍යාන කරණසුලු පණ්ඩිතයන් සමග නිරතුරු එක් ව වෙසෙන්නේ සි.

## 2. 2. 7.

## අස්සද්ධ සූත්‍රය

241. **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙති, එකතු වෙති: සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග සැසැඳෙත් එකතු වෙත්. නූගත්තු නූගතුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. කුසීතයෝ කුසීතයන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මුළාසිහි ඇත්තෝ මුළාසිහි ඇත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්.

අතීතම්පි භික්ඛවෙ, අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිංසු සමිංසු: අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු අහිරිකා අහිරිකෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු අනොත්තප්පිනො අනොත්තප්පීහි සද්ධිං සංසන්දිංසු සමිංසු. අප්පස්සුතා අප්පස්සුතෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු. කුසීතා කුසීතෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු. මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි සද්ධිං සංසන්දිංසු සමිංසු. දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු.

අනාගතම්පි භික්ඛවෙ අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිස්සන්ති සමෙස්සන්ති: අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමෙස්සන්ති. අහිරිකා අහිරිකෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමෙස්සන්ති අනොත්තප්පිනො අනොත්තප්පීහි සද්ධිං -පෙ- අප්පස්සුතා අප්පස්සුතෙහි සද්ධිං -පෙ- කුසීතා කුසීතෙහි සද්ධිං -පෙ- මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමෙස්සන්ති.

එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති: අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අහිරිකා අහිරිකෙහි සද්ධිං -පෙ අනොත්තප්පිනො අනොත්තප්පීහි සද්ධිං -පෙ- අප්පස්සුතා අප්පස්සුතෙහි සද්ධිං -පෙ- කුසීතා කුසීතෙහි සද්ධිං -පෙ- මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: සද්ධා සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. හිරිමනා හිරිමනෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. ඔත්තප්පිනො ඔත්තප්පීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. බහුස්සුතා බහුස්සුතෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. ආරද්ධවිරියා ආරද්ධවිරියෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. උපට්ඨිතස්සතිනො උපට්ඨිතස්සතීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

අතීතම්පි භික්ඛවෙ අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ පච්චුප්පන්නං අද්ධානං ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති: සද්ධා සද්ධෙහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති

## 2. 2. 8.

## අස්සද්ධමූලකතිකපඤ්චකසුත්තං

242. සාවත්ථියං-

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අහිරිකා අහිරිකෙහි සද්ධිං [සංසන්දන්ති සමෙන්ති.] දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං [සංසන්දන්ති සමෙන්ති.] සද්ධා සද්ධෙහි සද්ධිං [සංසන්දන්ති සමෙන්ති.] හිරිමනා හිරිමනෙහි සද්ධිං [සංසන්දන්ති සමෙන්ති.] පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

මහණෙනි, අශු කල්හි ද අදහස් වශයෙන් ම සත්ත්වයෝ සැසැඳුනහ, එකතු වූහ: සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැඳුනහ, එකතු වූහ. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග සැසැඳුනහ, එකතු වූහ පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග සැසැඳුනහ, එකතු වූහ. නූගත්තු නූගතුන් සමග සැසැඳුනහ, එකතු වූහ කුසීතයෝ කුසීතයන් සමග සැසැඳුනහ, එකතු වූහ. මුළා සිහි ඇත්තෝ මුළා සිහි ඇත්තවුන් සමග සැසැඳුනහ, එකතු වූහ. නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග සැසැඳුනහ, එකතු වූහ

මහණෙනි, මතු කල්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැදෙන්නාහ, එකතු වන්නාහ: සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැදෙන්නාහ, එකතු වන්නාහ. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග සැසැදෙන්නාහ, එකතු වන්නාහ, පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග ... නූගත්තු නූගතුන් සමග ... කුසීතයෝ කුසීතයන් සමග.... මුළාසිහි ඇත්තෝ මුළාසිහි ඇත්තවුන් සමග... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග සැසැදෙන්නාහ, එකතු වන්නාහ.

මහණෙනි, දැන් වත්මන් කල්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැදෙති, එකතු වෙති: සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැදෙති, එකතු වෙති. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග ... පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග ... නූගත්තු නූගතුන් සමග ... කුසීතයෝ කුසීතයන් සමග ... මුළා සිහි ඇත්තෝ මුළා සිහි ඇත්තවුන් සමග...නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්.

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැදෙත්, එකතු වෙත්: සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. උගත්තු උගතුන් සමග සැසැදෙත්, එකතු වෙත්. පිරිපුන් වියවීය ඇත්තෝ පිරිපුන් වියවීය ඇත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. නුවණැත්තෝ නුවණැත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්.

මහණෙනි, අශු කල්හි ද ... මහණෙනි, මතු කල්හි ද ... මහණෙනි, දැන් පවත්නා කල්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැදෙත්, එකතු වෙත්. සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග ... නුවණැත්තෝ නුවණැත්තවුන් සමග සැසැදෙති, එකතු වෙති යි.

### 3. 2. 8.

## අශ්‍රද්ධමූලකතීකපඤ්චක සූත්‍රය

242. **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැදෙත්, එකතු වෙත්: සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග සැසැදෙත් එකතු වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. නුවණැත්තෝ නුවණැත්තවුන් සමග සැසදෙත්, එකතු වෙත්.

අතීතම්පි භික්ඛවෙ, අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිංසු සමිංසු -පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං ධාතුසොව සත්තා සංසන්දිස්සන්ති සමෙන්ති. -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති. අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං -පෙ- අහිරිකා අහිරිකෙහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- සද්ධා සද්ධෙහි සද්ධිං -පෙ- හිරිමන්තා හිරිමන්තෙහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. (**පඨමතන්තිකං.**)

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: අස්සද්ධා අස්සද්ධෙහි -පෙ- අනොත්තාපිනො අනොත්තාපීහි -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි -පෙ- සද්ධා සද්ධෙහි -පෙ- ඔත්තාපිනො ඔත්තාපීහි -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං [ධාතුසොව සත්තා සංසන්දන්ති] සමෙන්ති: [අස්සධං අස්සද්ධෙහි -පෙ- අනොත්තාපිනො අනොත්තාපීහි -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි -පෙ- සද්ධා සද්ධෙහි -පෙ- ඔත්තාපිනො ඔත්තාපීහි -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති, සමෙන්ති.] (**දුතියතන්තිකං.**)

[ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති:] අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අප්පස්සුතා අප්පස්සුතෙහි -පෙ- දුප්පඤ්ඤ දුප්පඤ්ඤෙහි -පෙ- සද්ධා සද්ධෙහි -පෙ- බහුස්සුතා බහුස්සුතෙහි -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ පච්චුප්පන්නං අද්ධානං -පෙ- [අස්සද්ධා අස්සද්ධෙහි-පෙ-අප්පස්සුතා අප්පස්සුතෙහි -පෙ- දුප්පඤ්ඤ දුප්පඤ්ඤෙහි -පෙ- සද්ධා සද්ධෙහි -පෙ- බහුස්සුතා බහස්සුතෙහි -පෙ- පඤ්ඤවන්තෙ පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති] සමෙන්ති. (**තතියතන්තිකං.**)

[ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති:] අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. කුසීතා කුසීතෙහි -පෙ- දුප්පඤ්ඤ දුප්පඤ්ඤෙහි -පෙ- සද්ධා සද්ධෙහි -පෙ- ආරද්ධවිරියා ආරද්ධවිරියෙහි -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ පච්චුප්පන්නං අද්ධානං -පෙ- [අස්සද්ධා -පෙ- කුසීතා -පෙ- දුප්පඤ්ඤ -පෙ- සද්ධා -පෙ- ආරද්ධවිරියා -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්තීති සමෙන්ති.] (**චතුත්ථතන්තිකං.**)

මහණෙනි, අයු කල්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳුනහ, එකතු වූහ ... මහණෙනි, මතු කල්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙන්නාහ, එකතු වන්නාහ. මහණෙනි, දැන් වත්මන්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග ... ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග ... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග ... සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග ... ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තවුන් සමග ... නුවණැත්තෝ නුවණැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. (**පළමුවන ත්‍රිකය යි**.)

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්. සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග ... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග ... සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග ... පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තවුන් සමග ... නුවණැත්තෝ නුවණැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මහණෙනි, අයු කල්හි ද ... මහණෙනි, අනා කල්හි ද ... මහණෙනි, දැන් වත්මන්හි ද සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්. සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග ... පවටබිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග ... නුවණනැත්තෝ නුවණ නැත්තවුන් සමග ... සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග ... පවට බියැත්තෝ පවට බියැත්තවුන් සමග ... නුවණැත්තෝ නුවණැත්තවුන් සමග සැසැඳෙත් එකතු වෙත්. (**දෙවන ත්‍රිකය යි**.)

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. නූගත්තු නූගතුන් සමග ... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග ... සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග ... උගත්තු උගතුන් සමග ... නුවණැත්තෝ නුවණැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මහණෙනි, ඉකුත් කල්හි ද ... මහණෙනි, මතු කල්හි ද ... මහණෙනි, දැන් වත්මන් කල්හි ද ... සැදැහැත්තෝ සැදැහැතියන් සමග ...නූගත්තු නූගතුන් සමග... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග ... සැදැහැතියෝ සැදැහැතියන් සමග ... උගත්තු උගතුන් සමග ... නුවණැත්තෝ නුවණැතියන් සමග සැසැඳෙත්, එකතු වෙත්. (**තෙවන ත්‍රිකය යි**)

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. කුසීතයෝ කුසීතයන් සමග ... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග ... සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග ... පිරිපුන් වෙර ඇත්තෝ පිරිපුන් වෙර ඇත්තවුන් සමග ... නුවණැත්තෝ නුවණැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මහණෙනි, අයු කල්හි ද ... මහණෙනි, අනා කල්හි ද ... මහණෙනි, දැන් වත්මන්හි ද : සැදැහැනැතියෝ ... කුසීතයෝ ... නුවණ නැත්තෝ ... සැදැහැතියෝ ... පිරිපුන් වෙර ඇතියෝ ... නුවණැත්තෝ නුවණැතියන් සමග සැසැඳෙත්, එකතු වෙත්. (**සිවුවන ත්‍රිකය යි**.)

[ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති.] අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි -පෙ- සද්ධා සද්ධෙහි -පෙ- උපට්ඨිතස්සතිනො උපට්ඨිතස්සතීහි -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං -පෙ- [අස්සද්ධා -පෙ- මුට්ඨස්සතිනො -පෙ- දුප්පඤ්ඤා -පෙ- සද්ධා -පෙ- උපට්ඨිතස්සතිනො -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති.] (**පඤ්චමත්තිකං**)

## 2. 2. 9.

## අහිරිකමූලකතිකවත්ථුකසුත්තං

243. **සාවත්ථියං-**

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: අහිරිකා අහිරිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අනොත්තාපිනො අනොත්තාපීහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- හිරිමන්තා හිරිමන්තෙහි සද්ධිං -පෙ- ඔත්තාපිනො ඔත්තාපීහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි [භික්ඛවෙ, අද්ධානං] -පෙ- අනාගතම්පි [භික්ඛවෙ, අද්ධානං] -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං -පෙ- අහිරිකා -පෙ- අනොත්තාපිනො -පෙ- දුප්පඤ්ඤා -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති (**පඨමත්තිකං**)

[ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති:] අහිරිකා අහිරිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අප්පස්සුතා අප්පස්සුතෙහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- හිරිමන්තා හිරිමන්තෙහි සද්ධිං -පෙ- බහුස්සුතා බහුස්සුතෙහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං -පෙ- [අහිරිකා -පෙ- අප්පස්සුතා -පෙ- දුප්පඤ්ඤා -පෙ- හිරිමන්තා -පෙ- බහුස්සුතා -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. (**දුතියත්තිකං.**)

[ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති:] අහිරිකා අහිරිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. කුසීතා කුසීතෙහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- හිරිමන්තා හිරිමන්තෙහි සද්ධිං -පෙ- ආරද්ධවිරියා ආරද්ධවිරියෙහි සද්ධිං-පෙ-පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං -පෙ- [අහිරිකා -පෙ- කුසීතා -පෙ- දුප්පඤ්ඤා -පෙ- හිරිමන්තා -පෙ- ආරද්ධවිරියා -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.] (**තතියත්තිකං.**)

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්. සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මුළා සිහි ඇත්තෝ මුළා සිහි ඇත්තවුන් සමග ... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග ... සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග ... එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තවුන් සමග ... පැණැත්තෝ පැණැත්තවුන් සමග සැසඳෙත්, එකතු වෙත්. මහණෙනි, අයු කල්හි ද... මහණෙනි, අනා කල්හි ද...මහණෙනි, දැන් වත්මන්හි ද ..සැදැහැනැත්තෝ... මුළා සිහි ඇත්තෝ ... නුවණ නැත්තෝ සැදැහැත්තෝ ... එළඹි සිහි ඇත්තෝ ... පැණැත්තෝ පැණැත්තන් සමග සැසැඳෙති එකතු වෙති යි. (**පස්වන නිකය යි.**)

## 2. 2. 9.

## අහිරිකමූලකතිකචතුක්ක සූත්‍රය

243. **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග ... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග ... ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තවුන් සමග ... පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තවුන් සමග ... පැණැත්තෝ පැණැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මහණෙනි, අයු කල්හි ද ... මහණෙනි, අනාකල්හි ද ... මහණෙනි, දැන් වත්මන් කල්හි ද ... [ලජ්ජා නැතියෝ ... පවට බිය නැතියෝ ... නුවණ නැතියෝ ... ලජ්ජා ඇතියෝ ... පවට බිය ඇතියෝ... පැණැතියෝ පැණැත්තන් සමග සැසැඳෙත්, එකතු වෙත්.] (**පළමුවන තිකය යි.**)

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. නූගත්තු නූගතුන් සමග ... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග ... ලජ්ජා අත්තෝ ලජ්ජා ඇත්තවුන් සමග ... උගත්තු උගතුන් සමග ... පැණැත්තෝ පැණැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මහණෙනි, අයුකල්හි ද ... මහණෙනි, අනාගතයෙහි ද ... මහණෙනි, දැන් වත්මන් කල්හි ද ... [ලජ්ජා නැතියෝ ... නූගත්තෝ ... නුවණ නැතියෝ...ලජ්ජා ඇතියෝ ... උගත්තෝ ... පැණැතියෝ පැණැත්තන් සමග සැසැඳෙත්, එකතු වෙත්. (**දෙවන තිකය යි.**)

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. කුසීතයෝ කුසීතයන් සමග ... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග ... ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තවුන් සමග ... පිරිපුන් වැර ඇත්තෝ පිරිපුන් වෙර ඇත්තවුන් සමග ... පැණැත්තෝ පැණැත්තවුන් සමග ... සැසැඳෙත්, එකතු වෙත්. මහණෙනි, අයුකල්හි ද ... මහණෙනි, අනාකල්හි ද ... මහණෙනි, දැන් වත්මන් කල්හි ද ... [ලජ්ජා නැතියෝ කුසීතයෝ ... නුවණ නැතියෝ ... ලජ්ජා ඇතියෝ ... පරිපුන් වැර ඇතියෝ ... පැණැතියෝ පැණැත්තන් සමග සැසැඳෙත්, එකතු වෙත් (**තෙවන තිකය යි.**)

[ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති:] අහිරිකා අහිරිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- හිරිමනා හිරිමනෙහි සද්ධිං -පෙ- උපට්ඨිතස්සතිනො උපට්ඨිතස්සතීහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං-පෙ-එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං -පෙ- අහිරිකා -පෙ- මුට්ඨස්සතිනො -පෙ- දුප්පඤ්ඤා -පෙ- හිරිමනා -පෙ- උපට්ඨිතස්සතිනො -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. ( **චතුත්ථතිකං** )

## 3. 2. 10

## අනොත්තාපමූලකතිකත්තයසුත්තං

244. **සාවත්ථියං**-

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති, අනොත්තාපිනො අනොත්තාපීහි සද්ධිං -පෙ- අප්පස්සුතා අප්පස්සුතෙහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- ඔත්තාපිනො ඔත්තාපීහි සද්ධිං -පෙ- බහුස්සුතා බහුස්සුතෙහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං-පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං [අනොත්තාපිනො -පෙ- අප්පස්සුතා -පෙ- දුප්පඤ්ඤා -පෙ- ඔත්තාපිනො -පෙ- බහුස්සුතා -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති (**පඨමතිකං**.)

[ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති, සමෙන්ති:] අනොත්තාපිනො අනොත්තාපීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. කුසීතා කුසීතෙහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- ඔත්තාපිනො ඔත්තාපීහි සද්ධිං -පෙ- ආරද්ධවිරියා ආරද්ධවිරියෙහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං -පෙ- අනොත්තාපිනො -පෙ- කුසීතා -පෙ- දුප්පඤ්ඤා -පෙ- ඔත්තාපිනො -පෙ- ආරද්ධවිරියා -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති (**දුතියතිකං**.)

[ධාතුසොව භික්ඛවෙ සත්තා සංසන්දන්ති සමෙන්ති:] අනොත්තාපිනො අනොත්තාපීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- ඔත්තාපිනො ඔත්තාපීහි සද්ධිං -පෙ- උපට්ඨිතස්සතිනො උපට්ඨිතස්සතීහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං [අනොත්තාපිනො -පෙ- මුට්ඨස්සතිනො -පෙ- දුප්පඤ්ඤා -පෙ- ඔත්තාපිනො -පෙ- උපට්ඨිතස්සතිනො -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. (**තතියතිකං**.)

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මුළා සිහි ඇත්තෝ මුළා සිහි ඇත්තවුන් සමග ... දුෂ්ප්‍රාඥයෝ දුෂ්ප්‍රාඥයන් සමග ... ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තවුන් සමග ... එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තවුන් සමග ... පැණැත්තෝ පැණැත්තවුන් සමග ... සැසැඳෙති, එකතු වෙති: මහණෙනි, අයුකල්හි දු ... මහණෙනි, අනාකල්හි දු ... මහණෙනි, දැන් වත්මන් කල්හි දු ... [ලජ්ජා නැතියෝ... සිහි නැතියෝ ... නුවණ නැතියෝ ... ලජ්ජා ඇතියෝ ... සිහි ඇතියෝ ... පැණැත්තෝ පැණැත්යවුන් සමග සැසැඳෙති, එකතු වෙති යි. (**සිවුවන තිකය යි**.)

## 2. 2. 10.

## අනොත්තප්පමූලකතිකත්තය සූත්‍රය

244. **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග ... අල්පශ්‍රුතයෝ අල්පශ්‍රුතයන් සමග ... දුෂ්ප්‍රාඥයෝ දුෂ්ප්‍රාඥයන් සමග ... පාපභීරුකයෝ පාපභීරුකයන් සමග ... බහුශ්‍රුතයෝ බහුශ්‍රුතයන් සමග ... ප්‍රාඥයෝ ප්‍රඥයන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මහණෙනි, අයුකල්හි දු... මහණෙනි, අනාකල්හි දු ...මහණෙනි, දැන් වත්මන් කල්හි දු ... පවට බිය නැතියෝ ... අල්පශ්‍රුතයෝ ... දුෂ්ප්‍රාඥයෝ ... පවට බිය ඇතියෝ ... බහුශ්‍රුතයෝ ... නුවණැත්තෝ නුවණැත්තන් සමග සැසැඳෙත්, එකතු වෙත්. (**පළමුවන තිකය යි**.)

මහණෙනි, සත්ත්වයෝ අදහස් වසින් ම සැසැඳෙත්, එකතු වෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. කුසීතයෝ කුසීතයන් සමග ... දුෂ්ප්‍රාඥයෝ දුෂ්ප්‍රාඥයන් සමග... පාපභීරුකයෝ පාපභීරුකයන් සමග ... පිරිපුන් වැර ඇත්තෝ පිරිපුන් වෙර ඇත්තවුන් සමග ... ප්‍රාඥයෝ ප්‍රාඥයන් සමග සැසඳෙත්, එකතු වෙත්. මහණෙනි, අයුකල්හි දු ... මහණෙනි, අනාකල්හි දු ... මහණෙනි, දැන් වත්මන් කල්හි දු ... පවට බිය නැතියෝ ... කුසීතයෝ දුෂ්ප්‍රාඥයෝ... පාපභිරුකයෝ ... පිරිපුන් වැර ඇතියෝ ... ප්‍රාඥයෝ ප්‍රාඥයන් සමග සැසැඳෙත්. එකතු වෙත්. (**දෙවන තිකය යි**.)

මහණෙනි, සත්ත්වයෝ අදහස් විසින් ම සැසැඳෙත්, එකතු වෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති. මුළා සිහි ඇත්තෝ මුළා සිහි ඇත්තවුන් සමග ... දුෂ්ප්‍රාඥයෝ දුෂ්ප්‍රාඥයන් සමග ... පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තවුන් සමග... එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තවුන් සමග ... පැණැත්තෝ පැණැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මහණෙනි, අයුකල්හි දු ... මහණෙනි, අනාකල්හි දු ... මහණෙනි, දැන් වත්මන් කල්හි දු . පවට බිය නැතියෝ ... සිහි නැතියෝ ... දුෂ්ප්‍රාඥයෝ ... පවට බිය ඇතියෝ ... සිහි ඇතියෝ ... ප්‍රාඥයෝ ප්‍රාඥයන් සමග සැසැඳෙති, එකතු වෙති යි. (**තෙවන තිකය යි**.)

3. 2. 11.

## අප්පස්සුතමූලකතිකද්වයසුත්තං

245. සාවත්ථියං:-

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: අප්පස්සුතා අප්පස්සුතෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති කුසීතා කුසීතෙහි සද්ධිං-පෙ-දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- බහුස්සුතා බහුස්සුතෙහි සද්ධිං -පෙ- ආරද්ධවිරියා ආරද්ධවිරියෙහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං-පෙ-අනාගතම්පිභික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං -පෙ- අප්පස්සුතා -පෙ- කුසීතා-පෙ-දුප්පඤ්ඤා-පෙ-බහුස්සුතා-පෙ-ආරද්ධවිරියා -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. (පඨමතතිකං.)

[ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති:] අප්පස්සුතා අප්පස්සුතෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- බහුස්සුතා බහුස්සුතෙහි සද්ධිං -පෙ- උපට්ඨිතසතිනො උපට්ඨිතසතීහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං -පෙ- අප්පස්සුතා -පෙ- මුට්ඨස්සතිනො -පෙ- දුප්පඤ්ඤා -පෙ- බහුස්සුතා -පෙ- උපට්ඨිතසතිනො -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති (දුතියතතිකං.)

3. 2. 12.

## කුසීතමූලකතිකසුත්තං

346: සාවත්ථියං-

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: කුසීතා කුසීතෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං -පෙ- ආරද්ධවිරියා ආරද්ධවිරියෙහි සද්ධිං -පෙ- උපට්ඨිතසතිනො උපට්ඨිතසතීහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අතීතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- අනාගතම්පි භික්ඛවෙ, අද්ධානං -පෙ- එතරහිපි භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං -පෙ- කුසීතා . . මුට්ඨස්සතිනො .... දුප්පඤ්ඤා .... ආරද්ධවිරියා ... උපට්ඨිතසතිනො .... පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති.

### සත්තධාතුවග්ගො දුතියො.

තත්‍රුද්දානං:

සත්තධාතු සනිදානං ගිඤ්ජකාවසථෙන ච,
හීනාධිමුත්ති චඞ්කමං සගාථාසද්ධ[1] සත්තමං.
අස්සද්ධමූලකා පඤ්ච චත්තාරි අහිරිකමූලකා,
අනොත්තාපමූලකා තීණි ද්වෙ අප්පස්සුතෙන ච
කුසීතං එකකං වුත්තං සුත්තන්තා තීණි පඤ්චකාති.

---

1. සගාථඤ්චාති. සිමු.

## 2. 2. 11.

## අප්පස්සුතමූලකතිකද්වය සූත්‍රය

345. **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැදෙත්, එකතු වෙත්: අල්පශ්‍රැතයෝ අල්පශ්‍රැතයන් සමග සැසැදෙත්. එකතු වෙත්. කුසීතයෝ කුසීතයන් සමග ... දුෂ්ප්‍රාඥයෝ දුෂ්ප්‍රාඥයන් සමග ... බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් සමග ... පිරිපුන් වැර ඇත්තෝ පිරිපුන් වැර ඇත්තවුන් සමග ... ප්‍රාඥයෝ ප්‍රාඥයන් සමග ... සැසැදෙත්, එකතු වෙත්. මහණෙනි, අතීතයෙහි ද .. මහණෙනි, අනාගතයෙහි ද ... මහණෙනි, දැන් වත්මන්හි ද ... අල්පශ්‍රැතයෝ ... කුසීතයෝ ... දුෂ්ප්‍රාඥයෝ ... බහුශ්‍රැතයෝ ... වැර ඇතියෝ...ප්‍රාඥයෝ ප්‍රාඥයන් සමග සැසැදෙත්, එකතු වෙත් (**පළමුවන තිකය යි**.)

මහණෙනි, සත්ත්වයෝ අදහස් විසින් ම සැසැදෙත්, එකතු වෙත්. අල්පශ්‍රැතයෝ අල්පශ්‍රැතයන් සමග සැසැදෙත්. එකතු වෙත්. මුළා සිහි ඇත්තෝ මුළා සිහි ඇත්තවුන් සමග ... දුෂ්ප්‍රාඥයෝ දුෂ්ප්‍රාඥයන් සමග බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් සමග ... එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තවුන් සමග ප්‍රාඥයෝ ප්‍රාඥයන් සමග සැසදෙත්. එකතු වෙත්, මහණෙනි, අතීතයෙහි ද ... මහණෙනි, අනාගතයෙහි ද ... මහණෙනි. දැන් වත්මන් කල්හි ද අල්පශ්‍රැතයෝ ... සිහි නැතියෝ ... දුෂ්ප්‍රාඥයෝ... බහුශ්‍රැතයෝ ... සිහි ඇතියෝ ... පැණැත්තෝ පැණැත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙති යි. (**දෙවන තිකය යි**.)

## 2 2. 12.

## කුසීතමූලකතිකෙක සූත්‍රය

246. **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැදෙත්, එකතු වෙත්: කුසීතයෝ කුසීතයන් සමග සැසැදෙත්. එකතු වෙත්. මුළා සිහි ඇත්තෝ මුළා සිහි ඇත්තවුන් සමග ... නුවණ නැත්තෝ නුවණ නැත්තවුන් සමග ... පිරිපුන් වැර ඇත්තෝ පිරිපුන් වැර ඇත්තවුන් සමග ... එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තවුන් සමග ... පැණැතියෝ පැණැත්තවුන් සමග සැසැදෙති, එකතු වෙති. මහණෙනි, අතීතයෙහි ද ... මහණෙනි, අනාගතයෙහි ද ... මහණෙනි, දැන් වත්මන්හි ද ... කුසීතයෝ .... සිහි නැතියෝ .... නුවණ නැතියෝ .. පිරිපුන් වැර ඇතියෝ .... සිහි ඇතියෝ ... පැණැතියෝ පැණැත්තන් සමග සැසැදෙති, එකතු වෙති යි.

## සත්තධාතු වර්ගය දෙවෙනි යි

**එහි උද්දානය:**

සත්තධාතු, සනිදාන සූත්‍ර සහ ගිඤ්ජකාවසථ, හීනාධිමුත්ති, චඞ්කම, සගාථ සූත්‍ර ද, සත්වැනි අස්සද්ධ සූත්‍රය ද, අස්සද්ධමූලකතික පස ද, අහිරිකමූලකතික සතර ද, අනොත්තප්පමූලකතික තුණ ද, අප්පස්සුතමූල-කතික දෙක ද, කුසීතමූලකතික එක ද යන තික දැක්වෙන සූත්‍ර පස ද යි මෙසේ සූත්‍රාන්ත (දෙළොසෙක්) ද, තික පසළොසෙක් ද වදරණ ලදී.

## 3. කම්මපථවග්ගො

### 2. 3. 1.

### අසමාහිතසුත්තං

247. සාවත්ථියං-

ධාතුසොව භික්ඛවෙ සත්තා සංසන්දන්ති සමෙන්ති: අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අහිරිකා අහිරිකෙහි සද්ධිං සංසන්දන්ති. සමෙන්ති. අනොත්තාපිනො අනොත්තාපීහි සද්ධිං -පෙ- අසමාහිතා අසමාහිතෙහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

සද්ධා සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. හිරිමන්තා හිරිමන්තෙහි සද්ධිං -පෙ- ඔත්තාපිනො ඔත්තාපීහි සද්ධිං -පෙ- සමාහිතා සමාහිතෙහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති.

### 2. 3. 2.

### දුස්සීලසුත්තං

248 සාවත්ථියං-

ධාතුසොව භික්ඛවෙ සත්තා සංසන්දන්ති සමෙන්ති: අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අහිරිකා අහිරිකෙහි සද්ධිං -පෙ- අනොත්තා-පිනො අනොත්තාපීහි සද්ධිං -පෙ- දුස්සීලා දුස්සීලෙහි සද්ධිං -පෙ- දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

සද්ධා සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. හිරිමන්තා හිරිමන්තෙහි සද්ධිං -පෙ- ඔත්තාපිනො ඔත්තාපීහි සද්ධිං -පෙ- සීලවන්තො සීලවන්තෙහි සද්ධිං -පෙ- පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති

### 2. 3. 3.

### පඤ්චසික්ඛාපදසුත්තං

249. සාවත්ථියං-

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: පාණාතිපාතිනො පාණාතිපාතීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අදින්නාදායිනො අදින්නාදායීහි සද්ධිං -පෙ- කාමෙසු මිච්ඡාචාරයො කාමෙසු මිච්ඡාචාරීහි සද්ධිං -පෙ- මුසාවාදිනො මුසාවාදීහි සද්ධිං -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨායිනො සුරාමෙරයමජ්ජපමාදට්ඨායීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

පාණාතිපාතා පටිවිරතා පාණාතිපාතා පටිවිරතෙහි සද්ධිං සංසන්දන්ති, සමෙන්ති. අදින්නාදානා පටිවිරතා අදින්නාදානා පටිවිරතෙහි සද්ධිං -පෙ- කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතෙහි සද්ධිං -පෙ- මුසාවාදා පටිවිරතා මුසාවාදා පටිවිරතෙහි සද්ධිං -පෙ- සුරාමෙරයමජ්ජපමා-දට්ඨානා පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතෙහි සද්ධිං සංසන්දන්ති, සමෙන්තීති.

# 3. කම්මපථවග්ගය

2. 3. 1.

## අසමාහිත සූත්‍රය

247. සැවැත්නුවර-

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත් ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග...අසමාහිත (උපචාර-අර්පණා සමාධි රහිත)යෝ අසමාහිතයන් සමග ... දුෂ්ප්‍රාඥයෝ දුෂ්ප්‍රාඥයන් සමග සැසැඳෙත්, එකතු වෙත්.

සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තවුන් සමග... පාපභීරුකයෝ පාපභීරුකයන් සමග... සමාහිතයෝ සමාහිතයන් සමග ... පැණැත්තෝ පැණැත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති යි.

2. 3. 2.

## දුස්සීල සූත්‍රය

248. සැවැත්නුවර-

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: සැදැහැ නැත්තෝ සැදැහැ නැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තවුන් සමග ... පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමග...දුස්සීලයෝ දුස්සීලයන් සමග...දුෂ්ප්‍රාඥයෝ දුෂ්ප්‍රාඥයන් සමග සැසැඳෙත්, එකතු වෙත්.

සැදැහැත්තෝ සැදැහැත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තවුන් සමග ... පාපභීරුකයෝ පාපභීරුකයන් සමග...සිල්වත්තු සිල්වතුන් සමග ... පැණැත්තෝ පැණැත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති යි

2. 3. 3

## පඤ්චසික්ඛාපද සූත්‍රය

249. සැවැත්නුවර-

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: පරපණ නසන්නෝ පරපණ නසන්නවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. අන්සතු දෑ ගන්නෝ අන්සතු දෑ ගන්නවුන් සමග ... කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නවුන් සමග ... මුසවා බණන්නෝ මුසවා බණන්නවුන් සමග ... පමාවට කරුණු වූ රහමෙර මත්පැන් පානය කරන්නෝ පමාවට කරුණු වූ රහමෙර මත්පැන් පානය කරන්නවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්.

පණිවායෙන් වෙන් වූවෝ පණිවායෙන් වෙන් වූවන් සමග සැසැඳෙත්, එකතු වෙත්. අන්සතු දෑ ගැන්මෙන් වෙන් වූවෝ අන්සතු දෑ ගැන්මෙන් වෙන් වූවන් සමග ... කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන් වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන් වූවන් සමග ... මුසවා බිණුමෙන් වෙන් වූවෝ මුසවා බිණුමෙන් වෙන් වූවන් සමග ... පමාවට කරුණු වූ රහමෙර මත්පැන් පානය කිරීමෙන් වෙන් වූවෝ පමාවට කරුණු වූ රහමෙර මත්පැන් පානය කිරීමෙන් වෙන් වූවන් සමග සැසැඳෙති, එකතු වෙති යි.

2. 3. 4.

## 4. සත්තකම්මපථසුත්තං

250. සාවත්ථියං-

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: පාණාතිපාතිනො පාණාතිපාතීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අදින්නාදායිනො අදින්නාදායීහි සද්ධිං -පෙ- කාමෙසු මිච්ඡාචාරිනො කාමෙසු මිච්ඡාචාරීහි සද්ධිං -පෙ- මුසාවාදිනො මුසාවාදීහි සද්ධිං -පෙ- පිසුණවාචා පිසුණවාචෙහි සද්ධිං -පෙ- ඵරුසවාචා ඵරුසවාචෙහි සද්ධිං -පෙ- සම්ඵප්පලාපිනො සම්ඵප්පලාපීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

පාණාතිපාතා පටිවිරතා -පෙ- අදින්නාදානා පටිවිරතා -පෙ- කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා -පෙ- මුසාවාදා පටිවිරතා -පෙ- පිසුණාය වාචාය[1] පටිවිරතා -පෙ- ඵරුසාය වාචාය[2] පටිවිරතා -පෙ- සම්ඵප්පලාපා පටිවිරතා සම්ඵප්පලාපා පටිවිරතෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති.

2. 3. 5.

## දසකම්මපථසුත්තං

251. සාවත්ථියං-

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: පාණාතිපාතිනො පාණාතිපාතීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අදින්නාදායිනො -පෙ- කාමෙසු මිච්ඡාචාරිනො -පෙ- මුසාවාදිනො -පෙ- පිසුණවාචා -පෙ- ඵරුසවාචා -පෙ- සම්ඵප්පලාපිනො -පෙ- අභිජ්ඣාලූනො අභිජ්ඣාලූහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති බ්‍යාපන්නචිත්තා බ්‍යාපන්නචිත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

පාණාතිපාතා පටිවිරතා පාණාතිපාතා පටිවිරතෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අදින්නාදානා පටිවිරතා -පෙ- කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා -පෙ- මුසාවාදා පටිවිරතා -පෙ- පිසුණාය වාචාය පටිවිරතා -පෙ- ඵරුසාය වාචාය පටිවිරතා -පෙ- සම්ඵප්පලාපා පටිවිරතා -පෙ- අනභිජ්ඣාලූනො අනභිජ්ඣාලූහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. අබ්‍යාපන්නචිත්තා අබ්‍යාපන්නචිත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති

1. පිසුණාවාචා - සීමු. සී 1, 2, පිසුණවාචාය - PTS.
2. ඵරුසාවාචා - සීමු, සී 1, 2, ඵරුසවාචාය - PTS.

## 2. 3. 4.

## සත්තකම්මපථ සූත්‍රය

250 **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැදෙත්, එකතු වෙත්: පරපණ නසන්නෝ පරපණ නසන්නවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. අන්සතු දෑ ගන්නෝ අන්සතු දෑ ගන්නවුන් සමග .. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නවුන් සමග ... මුසවා බණන්නෝ මුසවා බණන්නවුන් සමග ... පිසුණුබස් බණන්නෝ පිසුණුබස් බණන්නවුන් සමග ... පරොස්බස් බණන්නෝ පරොස්බස් බණන්නවුන් සමග ... හිස්බස් බණන්නෝ හිස්බස් බණන්නවුන් සමග සැසැදෙත්, එකතු වෙත්.

පණිවායෙන් වෙන් වූවෝ ... අසිනාදනින් වෙන් වූවෝ ... කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන් වූවෝ ... මුසවායෙන් වෙන් වූවෝ ... පිසුණුබසින් වෙන් වූවෝ ... පරොස්බසින් වෙන් වූවෝ... හිස්බස් බිණුමෙන් වෙන් වූවෝ හිස්බස් බිණුමෙන් වෙන් වූවන් සමග සැසැදෙත්. එකතු වෙති යි.

## 2. 3. 5.

## දසකම්මපථ සූත්‍රය

251. **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැදෙත්, එකතු වෙත්: පරපණ නසන්නෝ පරපණ නසන්නවුන් සමග සැසදෙත්, එකතු වෙත්. මෙරමා සතු දෑ ගන්නෝ ... කාමයන්හි වරදවා හැසිරෙන්නෝ ... මුසවා බණන්නෝ ... පිසුණුබස් බණන්නෝ ... පරොස්බස් බණන්නෝ ... හිස්බස් බණන්නෝ ... දැඩිලොබ බහුල කොට ඇත්තෝ දැඩිලොබ බහුල කොට ඇත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. ව්‍යාපාදයට පැමිණි සිතැත්තෝ ව්‍යාපාදයට පැමිණි සිතැත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත් මිසදිටුවෝ මිසදිටුවන් සමග සැසැදෙත්, එකතු වෙත්.

පණිවායෙන් වෙන් වූවෝ පණිවායෙන් වෙන් වූවන් සමග සැසැදෙත්, එකතු වෙත්. අසිනාදනින් වෙන් වූවෝ ... කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන් වූවෝ .. මුසවායෙන් වෙන් වූවෝ ... පිසුණුබසින් වෙන් වූවෝ ... පරොස්බසින් වෙන් වූවෝ ... හිස්බස් බිණුමෙන් වෙන් වූවෝ අභිධ්‍යාව බහුල කොට නැත්තෝ අභිධ්‍යාව බහුල කොට නැත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත් ව්‍යාපාදයට නො පැමිණි සිතැත්තෝ ව්‍යාපාදයට නො පැමිණි සිතැත්තවුන් සමග සැසැදෙත්, එකතු වෙත්. සම්දිටුවෝ සම්දිටුවන් සමග සැසැදෙති, එකතු වෙති යි

## 2. 3 6.

### අට්ඨඞ්ගිකසුත්තං

252. **සාවත්ථියං-**

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. මිච්ඡාසංකප්පා-පෙ-මිච්ඡාවාචා -පෙ-මිච්ඡාකම්මන්තා -පෙ- මිච්ඡාආජීවා -පෙ- මිච්ඡාවායාමා -පෙ- මිච්ඡාසතිනො -පෙ- මිච්ඡාසමාධිනො මිච්ඡාසමාධීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. සම්මාසංකප්පා -පෙ- සම්මාවාචා -පෙ- සම්මාකම්මන්තා -පෙ- සම්මාආජීවා -පෙ- සම්මාවායාමා -පෙ- සම්මාසතිනො -පෙ- සම්මාසමාධිනො සම්මාසමාධීහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති.

## 2. 3 7.

### දසඞ්ගිකසුත්තං

253. **සාවත්ථියං-**

ධාතුසොව භික්ඛවෙ, සත්තා සංසන්දන්ති සමෙන්ති: මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. මිච්ඡාසංකප්පා -පෙ- මිච්ඡාවාචා -පෙ- මිච්ඡාකම්මන්තා -පෙ- මිච්ඡාආජීවා -පෙ- මිච්ඡාවායාමා -පෙ- මිච්ඡාසතිනො -පෙ- මිච්ඡාසමාධිනො -පෙ- මිච්ඡාඤාණිනො මිච්ඡාඤාණීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. මිච්ඡාවිමුත්තිනො[1] මිච්ඡාවිමුත්තීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. සම්මාසංකප්පා -පෙ- සම්මාවාචා -පෙ- සම්මාකම්මන්තා -පෙ- සම්මාආජීවා -පෙ- සම්මාවායාමා -පෙ- සම්මාසතිනො -පෙ- සම්මාසමාධිනො -පෙ- සම්මාඤාණිනො සම්මාඤාණීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. සම්මාවිමුත්තිනො[1] සම්මාවිමුත්තීහි සද්ධිං සංසන්දන්ති සමෙන්තීති.

(සබ්බත්ථ අතීතානාගත පච්චුප්පන්නං කාතබ්බං.)

**සත්තන්නං සුත්තානං උද්දානං:**

අසමාහිතං දුස්සීලං පඤ්චසික්ඛාපදානි ච,
සත්තකම්මපථං වුත්තා දසකම්මපථෙන ච,
ඡට්ඨං අට්ඨඞ්ගිකං වුත්තං දසඞ්ගිකෙන[2] සත්තමන්ති.

**කම්මපථවග්ගො තතියො.**

---

1. විමුත්තිකා - සීමු.
2. දසඞ්ගෙහි - සීමු 1, 2., දසහි අඞ්ගෙහි ච - සයා.

## 2. 3. 6.

## අවස්ඛඞ්ගික සූත්‍රය

252. **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්: මිථ්‍යා දෘෂ්ටි ඇත්තෝ මිථ්‍යා දෘෂ්ටි ඇත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. මිථ්‍යා සංකල්ප ඇත්තෝ ... මිථ්‍යා වචන ඇත්තෝ ... මිථ්‍යා කර්මාන්ත ඇත්තෝ ... මිථ්‍යා ආජීව ඇත්තෝ ... මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ ... මිථ්‍යා සමෘති ඇත්තෝ ... මිථ්‍යා සමාධි ඇත්තෝ මිථ්‍යා සමාධි ඇත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්.

සම්‍යග්දෘෂ්ටි ඇත්තෝ සම්‍යග්දෘෂ්ටි ඇත්තවුන් සමග සැසැඳෙත්, එකතු වෙත්. සම්‍යක් සඞ්කල්ප ඇත්තෝ ... සම්‍යක් වචන ඇත්තෝ .... සම්‍යක් කර්මාන්ත ඇත්තෝ සම්‍යගාජීව ඇත්තෝ ... සම්‍යග්ව්‍යායාම ඇත්තෝ ... සම්‍යක් සමෘති ඇත්තෝ...සම්‍යක් සමාධි ඇත්තෝ සම්‍යක් සමාධි ඇත්තවුන් සමග සැසැඳෙති, එකතුවෙතියි.

## 2. 3. 7.

## දසඞ්ගික සූත්‍රය

253. **සැවැත්නුවර-**

මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්, එකතු වෙත්. මිථ්‍යා දෘෂ්ටි ඇත්තෝ මිථ්‍යාදෘෂ්ටි ඇත්තවුන් සමග සැසැඳෙත් එකතු වෙත්. මිථ්‍යා සඞ්කල්ප ඇත්තෝ ... මිථ්‍යා වචන ඇත්තෝ ... මිථ්‍යා කර්මාන්ත ඇත්තෝ ... මිථ්‍යා ආජීව ඇත්තෝ ... මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ ... මිථ්‍යා සමෘති ඇත්තෝ ... මිථ්‍යා සමාධි ඇත්තෝ... මිථ්‍යා ඥාන ඇත්තෝ මිථ්‍යා ඥාන ඇත්තවුන් සමග සැසැඳෙත් එකතු වෙත්. මිථ්‍යා විමුක්ති ඇත්තෝ මිථ්‍යා විමුක්ති ඇත්තවුන් සමග සැසඳෙත්, එකතු වෙත්.

සම්‍යග් දෘෂ්ටි ඇත්තෝ සම්‍යග් දෘෂ්ටි ඇත්තවුන් සමග සැසැඳෙත්. එකතු වෙත්. සම්‍යක් සඞ්කල්ප ඇත්තෝ ... සම්‍යග් වචන ඇත්තෝ ... සම්‍යක් කර්මාන්ත ඇත්තෝ ... සම්‍යගාජීව ඇත්තෝ ... සම්‍යග් ව්‍යායාම ඇත්තෝ ... සම්‍යක් සමෘති ඇත්තෝ... සම්‍යක් සමාධි ඇත්තෝ... සම්‍යග් ඥාන ඇත්තෝ සම්‍යග් ඥාන ඇත්තවුන් සමග සැසඳෙත්, එකතු වෙත්. සම්‍යග් විමුක්ති ඇත්තෝ සම්‍යග් විමුක්ති ඇත්තවුන් සමග සැසැඳෙති, එකතු වෙති.

(සියලු තැන්හි අතීතානාගතපච්චුප්පන්න කළ යුතු යි.)

**සූත්‍ර සත පිළිබඳ උද්දානය:**

අසමාහිත, දුස්සීල, පඤ්චසික්ඛාපද, සත්තකම්මපථ, දසකම්මපථ අට්ඨඞ්ගික යන සූත්‍ර හා දසඞ්ගික සූත්‍රය ද යි සූත්‍ර සතෙකි.

**කම්මපථවර්ගය තුන්වැනි යි.**

# 4. චතුධාතුවග්ගො

## 2. 4. 1.

### චතුධාතුසුත්තං

254. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ -පෙ-

**චතස්සො ඉමා භික්ඛවෙ ධාතුයො. කතමා චතස්සො? පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු. ඉමා ඛො භික්ඛවෙ චතස්සො ධාතුයොති.**

## 2. 4. 2.

### පුබ්බසුත්තං

255. **සාවත්ථියං**-

**පුබ්බෙව මෙ භික්ඛවෙ, සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: කො නු ඛො පඨවිධාතුයා අස්සාදො කො ආදීනවො කිං නිස්සරණං? කො ආපොධාතුයා අස්සාදො කො ආදීනවො කිං නිස්සරණං? කො තෙජොධාතුයා අස්සාදො කො ආදීනවො කිං නිස්සරණං? කො වායොධාතුයා අස්සාදො කො ආදීනවො කිං නිස්සරණන්ති?**

**තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: යං ඛො පඨවිධාතුං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං පඨවිධාතුයා අස්සාදො, යං පඨවිධාතු[1] අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා, අයං පඨවිධාතුයා ආදීනවො. යො පඨවිධාතුයා ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහාණං, ඉදං පඨවිධාතුයා නිස්සරණං. යං ආපොධාතුං පටිච්ච -පෙ- යං තෙජොධාතුං පටිච්ච -පෙ- යං වායොධාතුං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං වායොධාතුයා අස්සාදො. යං වායොධාතු[2] අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා, අයං වායොධාතුයා ආදීනවො. යො වායොධාතුයා ඡන්දවිරාගවිනයො ඡන්දරාගප්පහාණං, ඉදං වායොධාතුයා නිස්සරණං.**

**යාවකීවඤ්චාහං භික්ඛවෙ, ඉමාසං චතුන්නං ධාතූනං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤාසිං, නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං.[3]**

---

1 යා පඨවිධාතු - සීමු, යා පඨවිධාතුයා - සී 1, 2. 2. යා වායොධාතු - සීමු, යා වායොධාතුයා - සී 1, 2. 3. අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං - මජසං.

# 4. චතුධාතු වර්ගය

## 2. 4. 1.

## චතුධාතු සූත්‍රය

254. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු සිටුහුගේ** අරම්හි වැඩවසන සේක ...

**මහණෙනි,** මේ ධාතු සතරෙකි. කවර සතරෙක යත්: පඨවිධාතු ය, ආපෝධාතු ය, තේජෝධාතු ය, වායෝධාතු යි. මහණෙනි, මේ ධාතු සතර යි.

## 2. 4. 2

## පුබ්බ සූත්‍රය

255. **සැවැත්නුවර**-

**මහණෙනි,** සම්බෝධියෙන් පෙර ම සම්මාසම්බුද්ධ නො වූ බෝසත් වූ ම මට මේ අදහස විය. පඨවිධාතුහුගේ ආස්වාදය කවරේ ද? ආදීනවය කවරේ ද? නිස්සරණය කවරේ ද? ආපොධාතුහුගේ ආස්වාදය කවරේ ද? ආදීනවය කවරේ ද? නිස්සරණය කවරේ ද? තෙජොධාතුහුගේ ආස්වාදය කවරේ ද? ආදීනවය කවරේ ද? නිස්සරණය කවරේ ද? වායෝධාතුහුගේ ආස්වාදය කවරේ ද? ආදීනවය කවරේ ද? නිස්සරණය කවරේ ද? යි.

මහණෙනි, ඒ මට මේ අදහස විය: පඨවිධාතුව නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ පඨවිධාතුවේ ආස්වාදය යි. යම් හෙයෙකින් පඨවිධාතුව අනිත්‍ය ද, දුක් ද, පෙරලෙන සවභාව ඇත්තේ ද, මේ පඨවිධාතුහුගේ ආදීනවය යි පඨවිධාතුවෙහි දූඹිරාගය පිළිබඳ යම් දුරලීමෙක් වේ ද, දූඹිරාගය පිළිබඳ යම් ප්‍රහාණයෙක් වේ ද, මේ පඨවිධාතුහුගේ නිස්සරණ ය යි. ආපොධාතුව නිසා යම් ... තේජෝධාතුව නිසා යම් ... වායොධාතුව නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ වායොධාතුවෙහි ආස්වාදය යි. යම් හෙයෙකින් වායෝධාතුව අනිත්‍ය ද, දුක් ද, පෙරලෙනසුලු ද, මේ වායෝධාතුවෙහි ආදීනවය යි. වායෝධාතුවෙහි දූඹිරාගය පිළිබඳ යම් දුරලීමෙක් වේ ද, දූඹිරාගය පිළිබඳ යම් ප්‍රහාණයෙක් වේ ද, මේ වායොධාතුවෙහි නිස්සරණය යි.

මහණෙනි, මම යම්තාක් මේ චතුධාතුන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් මෙසේ තතු සේ අවබෝධ නො කෙළෙම් ද, මහණෙනි, ඒතාක් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි, මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාවෙහි අනුත්තර සම්මාසම්බෝධිය මැනවින් අවබෝධ කෙළෙමැ යි නො ම පිළිණ කෙළෙම්.

යතො ච ඛොහං භික්ඛවෙ, ඉමාසං චතුන්නං ධාතූනං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: "අකුප්පා මෙ චෙතොවිමුත්ති[1]. අයමන්තිමා ජාති. නත්ථිදානි පුනබ්භවො"ති.

## 2. 4. 3.

## අස්සාදපරියෙසනසුත්තං*

256. **සාවත්ථියං-**

පඨවිධාතුයාහං භික්ඛවෙ, අස්සාදපරියෙසනං අචරිං. යො පඨවිධාතුයා අස්සාදො, තදජ්ඣගමං. යාවතා පඨවිධාතුයා අස්සාදො, පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. පඨවිධාතුයාහං භික්ඛවෙ, ආදීනවපරියෙසනං අචරිං. යො පඨවිධාතුයා ආදීනවො, තදජ්ඣගමං. යාවතා පඨවිධාතුයා ආදීනවො, පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. පඨවිධාතුයාහං භික්ඛවෙ, නිස්සරණපරියෙසනං අචරිං. යං පඨවිධාතුයා නිස්සරණං, තදජ්ඣගමං. යාවතා පඨවිධාතුයා නිස්සරණං, පඤ්ඤාය මෙ තං සුදිට්ඨං.

ආපොධාතුයාහං භික්ඛවෙ -පෙ- මෙ තං සුදිට්ඨං. තෙජොධාතුයාහං භික්ඛවෙ පෙ- මෙ තං සුදිට්ඨං. වායොධාතුයාහං භික්ඛවෙ, අස්සාදපරියෙසනං අචරිං. යො වායොධාතුයා අස්සාදො, තදජ්ඣගමං. යාවතා වායොධාතුයා අස්සාදො, පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. වායොධාතුයාහං භික්ඛවෙ, ආදීනවපරියෙසනං අචරිං. යො වායොධාතුයා ආදීනවො, තදජ්ඣගමං. යාවතා වායොධාතුයා ආදීනවො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. වායොධාතුයාහං භික්ඛවෙ, නිස්සරණපරියෙසනං අචරිං. යං වායොධාතුයා නිස්සරණං. තදජ්ඣගමං. යාවතා වායොධාතුයා නිස්සරණං, පඤ්ඤාය මෙ තං සුදිට්ඨං.

යාවකීවඤ්චාහං භික්ඛවෙ, ඉමාසං චතුන්නං ධාතූනං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤාසිං, නෙව තාවාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං.

1. අකුප්පා මෙ විමුත්ති - මජ්ඣං, සං. සී. 2.
* අචරිංසුත්තං - මජ්ඣං., PTS

මහණෙනි, මම යම් කලෙක මේ චතුධාතූන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් මෙසේ තතු සේ අවබෝධ කෙළෙම් ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි, මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාවෙහි අනුත්තර සම්මාසම්බෝධිය මැනවින් අවබෝධ කෙළෙමැ යි පිළිණ කෙළෙම්. "මාගේ අර්හත් ඵලවිමුක්තිය අකොප්‍ය ය (නිශ්චලය). මේ අන්තිම ජාතිය යි. දැන් පුනර්භවයෙක් නැතැ"යි ඥානදර්ශනය ද (=පස්විකුම් නුවණද) මට පහළ වී ය

## 2. 4. 3.

## අස්සාදපරියෙසන සූත්‍රය

256. **සැවැත්නුවර-**

මහණෙනි, මම පඨවිධාතුවෙහි ආස්වාදපර්යේෂණය කෙළෙම්. පඨවිධාතුවෙහි යම් ආස්වාදයෙක් වේ නම්, එය අවබෝධ කෙළෙම්. පඨවිධාතුවෙහි ආස්වාදය යම් පමණ වේ නම් එය මා විසින් නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම පඨවිධාතුවෙහි ආදීනවපර්යේෂණය කෙළෙම්. පඨවිධාතුවෙහි යම් ආදීනවයෙක් වේ නම්, එය අවබෝධ කෙළෙම්. පඨවිධාතුවෙහි ආදීනවය යම් පමණ වේ නම්, එය මා විසින් නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම පඨවිධාතුවෙහි නිස්සරණපර්යේෂණය කෙළෙම්. පඨවිධාතුවෙහි යම් නිස්සරණයෙක් වේ නම්, එය අවබෝධ කෙළෙම්. පඨවිධාතුවෙහි නිස්සරණය යම් පමණ වේ නම්, එය මා විසින් නුවණින් මැනවින් දක්නා ලද්දේ ය.

මහණෙනි, මම ආපොධාතුවෙහි ... එය මා විසින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම තෙජොධාතුවෙහි ... එය මා විසින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම වායොධාතුවෙහි ආස්වාද පර්යේෂණය කෙළෙම්. වායොධාතුවෙහි යම් ආස්වාදයෙක් වේ නම්, එය අවබෝධ කෙළෙම්. වායොධාතුවෙහි ආස්වාදය යම් පමණ වේ නම්, එය මා විසින් නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම වායොධාතුවෙහි ආදීනව පර්යේෂණය කෙළෙම්. වායොධාතුවෙහි යම් ආදීනවයෙක් වේ නම්, එය අවබෝධ කෙළෙම්. වායොධාතුවෙහි ආදීනවය යම් පමණ වේ නම්, එය මා විසින් නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම වායොධාතුවෙහි නිස්සරණ පර්යේෂණය කෙළෙම්. වායොධාතුවෙහි යම් නිස්සරණයෙක් වේ නම්, එය අවබෝධ කෙළෙම්. වායොධාතුවෙහි නිස්සරණය යම් පමණ වේ නම්, එය මා විසින් නුවණින් මැනවින් දක්නා ලද්දේ ය.

මහණෙනි, මම යම්තාක් මේ චතුධාතූන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත්, ආදීනවය ආදීනව වශයෙනුත්, නිස්සරණය නිස්සරණ වශයෙනුත් තතු සේ අවබෝධ නො කෙළෙම් ද, මහණෙනි, ඒතාක් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි, මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාවෙහි අනුත්තර සම්මාසම්බෝධිය අවබෝධ කෙළෙමැ යි නො ම පිළිණ කෙළෙම්.

යතො ච ඛොහං භික්ඛවෙ, ඉමාසං චතුන්නං ධාතූනං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: "අකුප්පා මෙ චෙතොවිමුත්ති. අයමන්තිමා ජාති. නත්ථිදානි පුනබ්භවො"ති.

## 2. 4. 4

## නොචෙදංසුත්තං

357. **සාවත්ථියං-**

නො චෙදං භික්ඛවෙ, පඨවීධාතුයා අස්සාදෙ අභවිස්ස, නයිදං සත්තා පඨවීධාතුයා සාරජ්ජෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි පඨවීධාතුයා අස්සාදෙ, තස්මා සත්තා පඨවීධාතුයා සාරජ්ජන්ති. නො චෙදං භික්ඛවෙ, පඨවීධාතුයා ආදීනවො අභවිස්ස, නයිදං සත්තා පඨවීධාතුයා නිබ්බින්දෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ, අත්ථි පඨවීධාතුයා ආදීනවො, තස්මා සත්තා පඨවීධාතුයා නිබ්බින්දන්ති. නො චෙදං භික්ඛවෙ, පඨවීධාතුයා නිස්සරණං අභවිස්ස, නයිදං සත්තා පඨවීධාතුයා නිස්සරෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි පඨවීධාතුයා නිස්සරණං, තස්මා සත්තා පඨවීධාතුයා නිස්සරන්ති

නො චෙදං භික්ඛවෙ, ආපොධාතුයා අස්සාදෙ අභවිස්ස -පෙ- නිස්සරන්ති. නො චෙදං භික්ඛවෙ, තෙජොධාතුයා අස්සාදෙ අභවිස්ස -පෙ- නිස්සරන්ති. නො චෙදං භික්ඛවෙ වායොධාතුයා අස්සාදෙ අභවිස්ස, නයිදං සත්තා වායොධාතුයා සාරජ්ජෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි වායොධාතුයා අස්සාදෙ, තස්මා සත්තා වායොධාතුයා සාරජ්ජන්ති. නො චෙදං භික්ඛවෙ, වායොධාතුයා ආදීනවො අභවිස්ස, නයිදං සත්තා වායොධාතුයා නිබ්බින්දෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි වායොධාතුයා ආදීනවො, තස්මා සත්තා වායොධාතුයා නිබ්බින්දන්ති. නො චෙදං භික්ඛවෙ, වායොධාතුයා නිස්සරණං අභවිස්ස, නයිදං සත්තා වායොධාතුයා නිස්සරෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි වායොධාතුයා නිස්සරණං, තස්මා සත්තා වායොධාතුයා නිස්සරන්ති.

මහණෙනි, මම යම් කලෙක මේ චතුධාතූන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත්, නිස්සරණය නිස්සරණ වශයෙනුත්, තතු සේ අවබෝධ කෙළෙම් ද, මහණෙනි. එකල්හි මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි, මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාවෙහි අනුත්තර වූ සම්මාසම්බෝධිය අවබෝධ කෙළෙමැ යි පිළිණ කෙළෙමි. "මාගේ අර්හත්ඵලවිමුක්තිය අකොප්‍ය ය. මේ අන්තිම ජාතිය යි. දැන් පුනර්භවයෙක් නැතැ" යි ඥානදර්ශනයද මට පහළ විය.

## 2. 4. 4

## නොචෙදං සූත්‍රය

257. සැවැත්නුවර-

මහණෙනි, ඉදින් මේ පඨවිධාතුයෙහි ආස්වාදයෙක් නො වී නම් සත්ත්වයෝ පඨවිධාතුවෙහි නො ඇලෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් පඨවිධාතුවෙහි ආස්වාදයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ පඨවිධාතුයෙහි ඇලෙත්. මහණෙනි, ඉදින් මේ පඨවිධාතුවෙහි ආදීනවයෙක් නො වී නම් සත්ත්වයෝ පඨවිධාතුවෙහි නො කළකිරෙන්නාහු ය. මහණෙනි, යම් හෙයකින් පඨවිධාතුවෙහි ආදීනවයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ පඨවිධාතුයෙහි කළකිරෙත්. මහණෙනි, ඉදින් පඨවිධාතුවෙන් නිස්සරණයෙක් නො වී නම්, සත්ත්වයෝ පඨවිධාතුයෙන් නො නික්මෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් පඨවිධාතුවෙන් නික්මීමෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ පඨවිධාතුයෙන් නික්මෙති.

මහණෙනි, ඉදින් මේ ආපෝධාතුවෙහි ආස්වාදයෙක් නො වී නම් ... නික්මෙති. මහණෙනි, ඉදින් මේ තේජෝධාතුවෙහි ආස්වාදයෙක් නො වී නම් ... නික්මෙති මහණෙනි, ඉදින් මේ වායෝධාතුවෙහි ආස්වාදයෙක් නො වී නම්, සත්ත්වයෝ වායෝධාතුවෙහි නො ඇලෙන්නාහු ය. මහණෙනි, යම් හෙයෙකින් වායෝධාතුයෙහි ආස්වාදයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ වායෝධාතුවෙහි ඇලෙති. මහණෙනි, ඉදින් වායෝධාතුවෙහි ආදීනවයෙක් නො වී නම්, සත්ත්වයෝ වායෝධාතුවෙහි නො කළකිරෙන්නාහු ය. මහණෙනි, යම් හෙයෙකින් වායෝධාතුවෙහි ආදීනවයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ වායෝධාතුවෙහි කළකිරෙති මහණෙනි, ඉදින් වායොධාතුවෙන් නිස්සරණයෙක් නො වී නම්, සත්ත්වයෝ වායොධාතුයෙන් නො නික්මෙන්නාහු ය. මහණෙනි, යම් හෙයකින් වායොධාතුවෙන් නික්මීමෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ වායෝධාතුවෙන් නික්මෙති.

යාවකීවඤ්ච භික්ඛවෙ, සත්තා ඉමාසං චතුන්නං ධාතූනං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤඤ්ඤාසුං[1], නෙව තාවිමෙ භික්ඛවෙ, සත්තා සදෙවකා ලොකා සමාරකා සබ්‍රහ්මකා, සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා[2] නිස්සටා විසඤ්ඤුත්තා විප්පමුත්තා විමරියාදිකතෙන චෙතසා විහරිංසු.

යතො ච ඛො භික්ඛවෙ, සත්තා ඉමාසං චතුන්නං ධාතූනං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤඤ්ඤංසු, අථ භික්ඛවෙ සත්තා සදෙවකා ලොකා සමාරකා සබ්‍රහ්මකා, සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා[2] නිස්සටා විසඤ්ඤුත්තා විප්පමුත්තා විමරියාදිකතෙන චෙතසා විහරන්තීති.

## 2 4 5

## දුක්ඛලක්ඛණසුත්තං

258. සාවත්ථියං-

පථවීධාතු ච[3] හිදං භික්ඛවෙ, එකන්තදුක්ඛා අභවිස්ස දුක්ඛානුපතිතා දුක්ඛාවක්කන්තා අනවක්කන්තා සුඛෙන, නයිදං සත්තා පථවීධාතුයා සාරජ්ජෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ, පථවීධාතු සුඛා සුඛානුපතිතා සුඛාවක්කන්තා අනවක්කන්තා දුක්ඛෙන, තස්මා සත්තා පථවීධාතුයා සාරජ්ජන්ති. ආපොධාතු ච හිදං භික්ඛවෙ -පෙ- තෙජෙධාතු ච හිදං භික්ඛවෙ -පෙ- වායොධාතු ච හිදං භික්ඛවෙ, එකන්තදුක්ඛා අභවිස්ස දුක්ඛානුපතිතා දුක්ඛාවක්කන්තා, අනවක්කන්තා සුඛෙන, නයිදං සත්තා වායොධාතුයා සාරජ්ජෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ, වායොධාතු සුඛා සුඛානුපතිතා සුඛාවක්කන්තා අනවක්කන්තා දුක්ඛෙන, තස්මා සත්තා වායොධාතුයා සාරජ්ජන්ති

පථවීධාතු ච හිදං භික්ඛවෙ, එකන්තසුඛා අභවිස්ස සුඛානුපතිතා සුඛාවක්කන්තා අනවක්කන්තා දුක්ඛෙන, නයිදං සත්තා පථවීධාතුයා නිබ්බින්දෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ පථවීධාතු දුක්ඛා දුක්ඛානුපතිතා. දුක්ඛාවක්කන්තා අනවක්කන්තා සුඛෙන, තස්මා සත්තා පථවීධාතුයා නිබ්බින්දන්ති. ආපොධාතු ච හිදං භික්ඛවෙ, -පෙ- තෙජොධාතු ච හිදං භික්ඛවෙ -පෙ- වායොධාතු ච හිදං භික්ඛවෙ, එකන්තසුඛා අභවිස්ස සුඛානුපතිතා සුඛාවක්කන්තා අනවක්කන්තා දුක්ඛෙන, නයිදං සත්තා වායොධාතුයා නිබ්බින්දෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ වායොධාතු දුක්ඛා දුක්ඛානුපතිතා දුක්ඛාවක්කන්තා අනවක්කන්තා සුඛෙන, තස්මා සත්තා වායොධාතුයා නිබ්බින්දන්තීති.

---

1. නාබ්භඤ්ඤංසු - සයා, මජසං, PTS. 2. සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය. මජසං, PTS, සී 1, 2. 3. චෙ - මජසං, PTS. ධාතුඤ්ච - සයා.

මහණෙනි, සත්ත්වයෝ යම්තාක් මේ චතුධාතූන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත්, ආදීනවය ආදීනව වශයෙනුත්, නිස්සරණය නිස්සරණ වශයෙනුත් තතු සේ අවබෝධ නො කළාහු ද, මහණෙනි, ඒ තාක් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි සත්ත්වයෝ, මහණබමුණන් සහිත දෙවි-මිනිසුන් සහිත ප්‍රජාවෝ නික්මුනාහු, වෙන් වූවාහු, මිදුනාහු, ඉක්මවූ කෙලෙස් සීමා ඇති සිතින් යුක්ත ව නො ම විසූහ.

මහණෙනි, යම් කලෙක සත්ත්වයෝ මේ චතුධාතූන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් තතු සේ අවබෝධ කළාහු ද, මහණෙනි, එකල්හි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි සත්ත්වයෝ, මහණ බමුණන් සහිත දෙවි-මිනිසුන් සහිත ප්‍රජාවෝ නික්මුනාහු, වෙන් වූවාහු, මිදුනාහු ඉක්මවූ කෙලෙස් සීමා ඇති සිතින් යුතු ව වෙසෙති යි.

### 2. 4. 5.

### දුක්ඛලක්ඛණ සූත්‍රය

258. **සැවැත්නුවර**-

මහණෙනි, මේ පඨවිධාතුව ද ඒකාන්තයෙන් ම දුක් වූවක්, දුකෙහි පතිත වූවක්, දුකෙහි වැද ගත්තක්, සුවයෙහි නො වැද ගත්තක් වී නම්, මේ සත්ත්වයෝ පඨවිධාතුවෙහි නො ඇලෙන්නාහු ය. මහණෙනි, යම් හෙයෙකින් පඨවිධාතුව සුඛ (හෙතු) ද, සුඛයෙන් යුක්ත ද, සුඛාවතීර්ණ ද, දුඃඛාවතීර්ණ නො වේ ද, එහෙයින් සත්ත්වයෝ පඨවිධාතුවෙහි ඇලෙති. මහණෙනි, මේ ආපෝධාතුව ද ... මහණෙනි, මේ තේජෝධාතුව ද ... මහණෙනි, මේ වායෝධාතුව ද ඒකාන්තයෙන් දුක් වූවක්, දුකෙන් යුක්ත වූවක්, දුකෙන් අවතීර්ණ වූවක්, සුවයෙන් අවතීර්ණ නො වූවක් වී නම්, මේ සත්ත්වයෝ වායෝධාතුවෙහි නො ඇලෙන්නාහු ය. මහණෙනි, යම් හෙයෙකින් වායෝධාතුව සුඛ ද, සුඛයෙන් යුක්ත ද, සුඛයෙන් අවතීර්ණ ද, දුඃඛයෙන් අවතීර්ණ නො නොවේ ද, එහෙයින් සත්ත්වයෝ වායොධාතුවෙහි ඇලෙත්.

මහණෙනි, මේ පඨවිධාතුව ද එකාන්තයෙන් සුව වූවක්, සුවයෙන් යුක්ත වූවක්, සුවයෙහි පිවිසගත්තක්, දුකෙහි නො පිවිසගත්තක් වී නම්, මේ සත්ත්වයෝ පඨවිධාතුයෙහි නො කලකිරෙන්නාහු ය. මහණෙනි, යම් හෙයෙකින් පඨවිධාතුවත් දුක් ද, දුකෙන් යුක්ත ද, දුකෙහි පිවිසගත්තී ද, සුවයෙහි නො පිවිසගත්තී ද, එහෙයින් සත්ත්වයෝ පඨවිධාතුවෙහි කලකිරෙත්. මහණෙනි, මේ ආපෝධාතුව ද ... මහණෙනි, මේ තෙජෝ-ධාතුවද මහණෙනි, මේ වායෝධාතුවද එකාන්තයෙන් සුව වූවක්, සුවයෙන් යුක්ත වූවක්, සුවයෙහි පිවිසගත්තක්, දුකෙහි නො පිවිසගත්තක්වී නම් මේ සත්ත්වයෝ වායොධාතුයෙහි නො කලකිරෙන්නාහු ය. මහණෙනි, යම් හෙයෙකින් වායොධාතුවත් දුක් ද, දුකෙන් යුක්ත ද, දුකෙහි පිවිසගත්තී ද, සුවයෙහි නො පිවිසගත්තී ද, එහෙයින් සත්ත්වයෝ වායො-ධාතුයෙහි කලකිරෙති යි.

## 2. 4. 6.

## අභිනන්දනසුත්තං

259. **සාවත්ථියං-**

යො භික්ඛවෙ, පඨවීධාතුං අභිනන්දති, දුක්ඛං සො අභිනන්දති. යො දුක්ඛං අභිනන්දති, අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො ආපොධාතුං අභිනන්දති -පෙ- යො තෙජොධාතුං අභිනන්දති -පෙ- යො වායොධාතුං අභිනන්දති, දුක්ඛං සො අභිනන්දති. යො දුක්ඛං අභිනන්දති, අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි.

යො ච ඛො භික්ඛවෙ, පඨවීධාතුං නාභිනන්දති, දුක්ඛං සො නාභිනන්දති යො දුක්ඛං නාභිනන්දති, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි යො ආපොධාතුං -පෙ- යො තෙජොධාතුං -පෙ- යො වායොධාතුං නාභිනන්දති, දුක්ඛං සො නාභිනන්දති, යො දුක්ඛං නාභිනන්දති, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමීති.

## 2. 4. 7.

## උප්පාදසුත්තං

260. **සාවත්ථියං-**

යො භික්ඛවෙ, පඨවීධාතුයා උප්පාදො, ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො, රොගානං ඨිති, ජරාමරණස්ස පාතුභාවො. යො ආපොධාතුයා -පෙ- යො තෙජොධාතුයා -පෙ- යො වායොධාතුයා උප්පාදො, ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො, රොගානං ඨිති, ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ, පඨවීධාතුයා නිරොධො වූපසමො අත්ථඞ්ගමො[1] දුක්ඛස්සෙසො නිරොධො, රොගානං වූපසමො, ජරාමරණස්ස අත්ථඞ්ගමො. යො ආපොධාතුයා -පෙ- යො තෙජොධාතුයා -පෙ- යො වායොධාතුයා නිරොධො වූපසමො අත්ථඞ්ගමො, දුක්ඛස්සෙසො නිරොධො, රොගානං වූපසමො, ජරාමරණස්ස අත්ථඞ්ගමොති.

## 2. 4. 8.

## සමණබ්‍රාහ්මණසුත්තං

261 **සාවත්ථියං-**

චතස්සො ඉමා භික්ඛවෙ, ධාතුයො. කතමා චතස්සො? පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමාසං චතුන්නං ධාතූනං අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති, න මෙතෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

---

1 අත්ථගමො - සී 1, 2, PTS.

## 2. 4. 6.

## අභිනන්දන සූත්‍රය

259. **සැවැත්නුවර-**

මහණෙනි, යමෙක් පඨවිධාතුව පතා ද, හෙතෙමේ දුක පතයි. යමෙක් දුක පතා ද, හෙතෙමේ දුකින් නො මිදුනේ ය යි කියමි. යමෙක් ආපෝධාතුව පතා ද ... යමෙක් තේජෝධාතුව පතා ද .... යමෙක් වායොධාතුව පතා ද, හෙතෙමේ දුක පතයි. යමෙක් දුක පතා ද, හෙතෙමේ දුකින් නො මිදුනේ ය යි කියමි.

මහණෙනි, යමෙකුත් පඨවිධාතුව නො පතා ද, හෙතෙමේ දුක නො පතයි. යමෙක් දුක නො පතා ද, හෙ තෙමේ දුකින් මිදුනේ ය යි කියමි. යමෙක් ආපෝධාතුව ... යමෙක් තේජෝධාතුව ... යමෙක් වායෝධාතුව නො පතා ද, හෙතෙමේ දුක නො පතයි යමෙක් දුක නො පතා ද, හෙතෙමේ දුකින් මිදුනේ ය යි කියමි යි

## 2. 4. 7.

## උප්පාද සූත්‍රය

260. **සැවැත්නුවර-**

මහණෙනි, පඨවිධාතුවෙහි යම් ඉපැද්මෙක් පැවැත්මෙක් නිපැද්මෙක් පහළ වීමෙක් වේ ද, මේ දුක්හුගේ ඉපැද්ම ය, රෝගයන්ගේ පැවැත්ම ය, ජරාමරණයාගේ පහළ වීම ය. ආපෝධාතුවෙහි යම් ... තේජෝධාතුවෙහි යම් ... වායෝධාතුවෙහි යම් ඉපැද්මෙක් පැවැත්මෙක් නිපැද්මෙක් පහළ වීමෙක් වේ ද, මේ දුක්හුගේ ඉපැද්ම ය, රෝගයන්ගේ පැවැත්ම ය. ජරාමරණයේ පහළ වීම ය.

මහණෙනි, පඨවිධාතුවෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් අස්තඞ්ගමයෙක් වේ ද, මේ දුක්හුගේ නිරොධය යි. රෝගයන්ගේ ව්‍යුපශමය යි. ජරාමරණයේ අස්තඞ්ගමය යි. ආපෝධාතුවෙහි යම් ... තේජෝධාතුවෙහි යම් ... වායෝධාතුවෙහි යම් නිරොධයෙක් ව්‍යුපශමයෙක් අස්තඞ්ගමයෙක් වේ ද, මේ දුක්හුගේ නිරෝධය යි රෝගයන්ගේ ව්‍යුපශමය යි. ජරාමරණයේ අස්තඞ්ගමය යි.

## 2. 4. 8.

## සමණබ්‍රාහ්මණ සූත්‍රය

261. **සැවැත්නුවර-**

මහණෙනි, මේ ධාතු සතරෙකි. කවර සතරෙක යත්: පඨවිධාතු ය, ආපෝධාතු ය, තේජෝධාතු ය, වායෝධාතු යි.

මහණෙනි, යම් කිසි මහණ කෙණෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ සිවුධාතූන්ගේ ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනිද්ද, මහණෙනි, ඒ මේ මහණෝ හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහි හෝ මහණහ යි සම්මත නො වෙති. බමුණන් කෙරෙහි හෝ බමුණහ යි සම්මත නො වෙති. ඒ ආයුෂ්මත්හු මහණබැව්හි අරුත (සිවුමග) හෝ බමුණුබැව්හි අරුත (සිවුපල) හෝ මේ අත්බැව්හි ම තුමූ ම දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ නො ම වෙසෙති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමාසං චතුන්නං ධාතූනං අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානන්ති, තෙ ච ඛො මෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව[1] සමණසම්මතා බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා. තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 2. 4. 9.

## දුතියසමණබ්‍රාහ්මණසුත්තං

262. **සාවත්ථියං-**

චතස්සො ඉමා භික්ඛවෙ, ධාතුයො. කතමා චතස්සො? පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු. යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමාසං චතුන්නං ධාතූනං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති -පෙ- යථාභූතං පජානන්ති, තෙ -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 2. 4. 10.

## තතියසමණබ්‍රාහ්මණසුත්තං.

263. **සාවත්ථියං-**

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා පඨවීධාතුං නප්පජානන්ති, පඨවීධාතුසමුදයං නප්පජානන්ති, පඨවීධාතුනිරොධං නප්පජානන්ති, පඨවීධාතුනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති -පෙ- ආපොධාතුං නප්පජානන්ති -පෙ- තෙජොධාතුං නප්පජානන්ති -පෙ- වායොධාතුං නප්පජානන්ති, වායොධාතුසමුදයං නප්පජානන්ති, වායොධාතුනිරොධං නප්පජානන්ති, වායොධාතුනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති, න මෙතෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා පඨවීධාතුං පජානන්ති, පඨවීධාතුසමුදයං පජානන්ති පඨවීධාතුනිරොධං පජානන්ති, පඨවීධාතුනිරොධගාමිනිං පටිපදං පජානන්ති -පෙ- ආපොධාතුං -පෙ- තෙජොධාතුං-පෙ- වායොධාතුං පජානන්ති, වායොධාතුසමුදයං පජානන්ති, වායොධාතුනිරොධං පජානන්ති, වායොධාතුනිරොධගාමිනිං පටිපදං පජානන්ති, තෙ ච ඛො මෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව[1] සමණසම්මතා බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා. තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

**චතුධාතුවග්ගො චතුත්ථො.**

**තස්සුද්දානං:**

චතුධාතුපුබ්බඅස්සාද[2] තො වෙදං ච දුක්ඛත ච,
අභිනන්දනඤ්ච උප්පාදං තයො සමණබ්‍රාහ්මණාති.

**ධාතුසංයුත්තං සමත්තං.**

---

1. ච- සී මු   2. චතස්සො පුබ්බෙ අචරිං - සබ්බත්ථ

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ චතුධාතුන්ගේ ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දනිද්ද, මහණෙනි, ඒ මේ මහණෝ හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහිත් මහණය යි සම්මතයහ. බමුණන් කෙරෙහිත් බමුණන යි සම්මතයහ ඒ ආයුෂ්මත්හු ද මහණ බැව්හි පලයත්, බමුණු බැව්හි පලයත් මේ අත්බැව්හි ම තුමූ දැන ඊට එළඹ වෙසෙති යි.

## 2. 4 9.

## දෙවන සමණබ්‍රාහ්මණ සූත්‍රය

262. සැවැත්නුවර-

මහණෙනි, මේ ධාතු සතරෙකි. කවර සතරෙකයත් පඨවිධාතුය, ආපෝධාතුය, තේජෝධාතුය, වායෝධාතුය යි. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ සිවුධාතුන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනිද්ද ... තතු සේ දනිද්ද, ඒ මහණෝ හෝ බමුණෝ ... දැමූ වෙසෙසිත් දැන පසක් කොට ඊට පැමිණ වෙසෙති යි.

## 2 4 10.

## තෙවන සමණබ්‍රාහ්මණ සූත්‍රය

263. සැවැත්නුවර-

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ පඨවිධාතුව නො දනිද්ද, පඨවිධාතු සමුදය නො දනිද්ද, පඨවිධාතු නිරෝධය නො දනිද්ද, පඨවිධාතු නිරෝධගාමිනී පටිපදාව නො දනිද්ද ... ආපෝධාතුව නො දනිද්ද ... තේජෝධාතුව නො දනිද්ද ... වායෝධාතුව නො දනිද්ද, වායෝධාතුසමුදය නො දනිද්ද, වායෝධාතුනිරෝධය නො දනිද්ද, වායෝධාතු නිරෝධගාමිනී පටිපදාව නො දනිද්ද, මහණෙනි; ඒ මේ මහණහු හෝ බමුණහු හෝ මහණුන් කෙරෙහි හෝ මහණය යි සම්මත නො වෙති. බමුණන් කෙරෙහි හෝ බමුණය යි සම්මත නො වෙති. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ භාවාර්ථය හෝ බ්‍රාහ්මණභාවාර්ථය හෝ මේ අත්බැව්හි ම තුමූ දැන පසක් කොට (එයට) පැමිණ නො ද වෙසෙති.

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ පඨවිධාතුව දනිද්ද, පඨවිධාතුසමුදය දනිද්ද, පඨවිධාතුනිරෝධය දනිද්ද, පඨවිධාතුනිරෝධගාමිනීපටිපදාව දනිද්ද . ආපෝධාතුව ... තේජෝධාතුව . වායෝධාතුව දනිද්ද, වායොධාතුසමුදය දනිද්ද, වායොධාතුනිරෝධය දනිද්ද, වායොධාතුනිරෝධගාමිනීපටිපදාව දනිද්ද, මහණෙනි, ඒ මේ මහණහු හෝ බමුණහු හෝ මහණුන් කෙරෙහිත් මහණහ යි සම්මත වෙති. බමුණන් කෙරෙහිත් බමුණහ යි සම්මත වෙති. ඒ ආයුෂ්මත්හු ද ශ්‍රමණ භාවාර්ථය හෝ බ්‍රාහ්මණභාවාර්ථය හෝ මේ අත්බැව්හි ම තුමූ දැන පසක් කොට එයට පැමිණ වෙසෙති යි.

**චතුධාතු වර්ගය සිවුවැනි යි.**

එහි උද්දානය:

චතුධාතු, පුබ්බ, අස්සාද, නොවෙදං, දුක්ඛ, අභිනන්දන, උප්පාද යන සූත්‍ර හා සමණබ්‍රාහ්මණ සූත්‍ර තුණ ද යි සූත්‍ර දශයෙකි.

**ධාතුසංයුත්තය නිමියේ ය.**

# 3. අනමතග්ගසංයුත්තං

## 1. තිණකට්ඨවග්ගො

### 3. 1. 1.

### තිණකට්ඨසුත්තං

364. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො, පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො යං ඉමස්මිං ජම්බුදීපෙ තිණකට්ඨසාඛාපලාසං, තං ඡෙත්වා[1] එකජ්ඣං සංහරෙය්‍ය, එකජ්ඣං සංහරිත්වා චතුරඞ්ගුලං චතුරඞ්ගුලං ඝටිකං කරිත්වා[2] නික්ඛිපෙය්‍ය, අයං මෙ මාතා, තස්සා මෙ මාතු අයං මාතාති. අපරියාදින්නාව භික්ඛවෙ, තස්ස පුරිසස්ස මාතු මාතරො අස්සු. අථ ඉමස්මිං ජම්බුදීපෙ තිණකට්ඨසාඛාපලාසං පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො, පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං.

එවං දීඝරත්තං වො[3] භික්ඛවෙ දුක්ඛං පච්චනුභූතං, තිබ්බං පච්චනුභූතං, ව්‍යසනං පච්චනුභූතං, කටසී[4] වඩ්ඪිතා. යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුන්ති.

### 3. 1. 2

### පඨවිසුත්තං

365. සාවත්ථියං-

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො, පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො ඉමං මහාපඨවිං කොලට්ඨිකමත්තං[5] කොලට්ඨිකමත්තං ගුළිකං[6] කරිත්වා නික්ඛිපෙය්‍ය, අයං මෙ[7] පිතා, තස්ස මෙ පිතු අයං පිතාති. අපරියාදින්නාව ඛො භික්ඛවෙ[8] තස්ස පුරිසස්ස පිතු පිතරො අස්සු. අථායං මහාපඨවී පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො, පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං

---

1. තච්ඡෙත්වා - සීමු. PTS, ගහෙත්වා - සී 1, 2. 2. කත්වා - මජ්ඣං.
3. දීඝරත්තං ඛො - ස්‍යා. 4. කටසී - මජ්ඣං. 5. කොලට්ඨිමත්තං -මජ්ඣං.
6. මත්තිකා ගුටිකං - මජ්ඣං, මත්තිකා ගුළිකං - ස්‍යා, PTS 7. අයං ඛො මෙ-PTS.
8 අපරියාදින්නා ච භික්ඛවෙ - මජ්ඣං, අපරියාදින්නා ච භික්ඛවෙ - ස්‍යා, අපරියාදින්නා භික්ඛවෙ - PTS.

# 3. අනමතග්ගසංයුත්තය

## 1. තිණකට්ඨවග්ගය

### 3. 1. 1.

### තිණකට්ඨ සූත්‍රය

264. **සැවැත්නුවර-**

මා විසින් මෙසේ අසන ලදී: එක් කාලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු සිටුහුගේ** අරම්හි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'වහන්ස' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, මේ සසර අනුව ගොසිනුදු නොපිරිසුන් අග ඇති. එහෙයින් අවිද්‍යානීවරණයෙන් ඇවුරුණු තෘෂ්ණාසංයෝජනයෙන් බැඳුනු දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ පූර්වකෝටිය (පූර්වාන්තය) නො පැණේ. මහණෙනි, යම්සේ පුරුෂයෙක් මේ දඹදිව යම් තාක් තණ දඬු අතු කොළ වේ නම්, එය සිඳ එක් රැස් කරන්නේද, එක් රැස් කොට සතරඟුල් සතරඟුල් කඩ කොට "මෝ මාගේ මව ය, මෝ මාගේ ඒ මවගේ මව ය" යි තබන්නේ ද, මහණෙනි, ඒ පුරුෂයාගේ මවගේ මවුහු නො පිරිසිඳුනාහු ම වන්නාහ. වැලි, මේ දඹදිව තණ දඬු අතු කොළ ක්‍ෂය වීමට අවසන් වීමට යන්නේය. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ සසර අනවරාග්‍ර (අපරාන්ත රහිත) ය. එහෙයින් අවිද්‍යාවෙන් වැසුනු තෘෂ්ණාවෙන් බැඳුනු (එහි) දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ පූර්වාන්තය නො පෙණේ.

මහණෙනි, මෙසේ තොප විසින් දිගුකලක් දුක්විඳින ලදී. තියුණු දුක් විඳින ලදී. (ඥාතිව්‍යසනාදි) ව්‍යසන විඳින ලදී. සොහොන තොහොත් පොළොව වඩන ලදී. මහණෙනි, එහෙයින් සියලු සංස්කාරයන්හි කලකිරෙන්නට නිසි ම ය, නො ඇලෙන්නට නිසි ම ය, මිදෙන්නට නිසි මැ යි.

### 3. 1. 2.

### පඨවි සූත්‍රය

265. **සැවැත්නුවර-**

මහණෙනි, මේ සසර අමතවූ - නොදත් අග් ඇතියේයි. අවිද්‍යා නීවරණයෙන් ඇවුරුණු තෘෂ්ණාසංයෝජනයෙන් බැඳුනු දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ මුල නො පැණේ. මහණෙනි, යම් සේ පුරුෂයෙක් මේ මහපොළොව ඩෙබර ඇට පමණ ඩෙබර ඇට පමණ ගුලි කොට "මේ මාගේ පියා ය, මේ මාගේ ඒ පියාගේ පියා ය" යි තබන්නේ ද, මහණෙනි, ඒ පුරුෂයාගේ පියාගේ පියහු නො පිරිසිඳින ලද්දාහු ම වන්නාහ වැලි, මේ මහපොළොව ගෙවීමට අවසන් වීමට යන්නේ ය. ඒ කුම් හෙයින? යත්: මහණෙනි, මේ සසර අවිදිත වූ අග ඇතියේ යි. අවිද්‍යා නීවරණයෙන් ඇවුරුණු තෘෂ්ණාසංයෝජනයෙන් බැඳුනු දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ මුල නො පෙණේ. (එහෙයිනි.)

එවං දීඝරත්තං වො භික්ඛවෙ, දුක්ඛං පච්චනුභූතං, තිබ්බං පච්චනුභූතං, ව්‍යසනං පච්චනුභූතං, කටසි වඩ්ඪිතා. යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුන්ති

## 3. 1. 3.

## අස්සුසුත්තං

266. **සාවත්ථියං-**

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො. පුබ්බාකොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. "දීඝරත්තං වො භික්ඛවෙ, දුක්ඛං පච්චනුභූතං".[1] තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛො බහුතරං යං වා ඛො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං අමනාපසම්පයොගා මනාපවිප්පයොගා කන්දන්තානං රුදන්තානං[2] අස්සු පස්සන්නං[3] පඝරිතං, යං වා චතුසු මහාසමුද්දෙසු උදකන්ති?

"යථා ඛො මයං භන්තෙ, භගවතා ධම්මං දෙසිතං ආජානාම, එතදෙව භන්තෙ, බහුතරං යං නො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං අමනාපසම්පයොගා මනාපවිප්පයොගා කන්දන්තානං රුදන්තානං අස්සු පස්සන්නං[3] පඝරිතං, න ත්වෙව චතුසු මහාසමුද්දෙසු උදක"න්ති.

සාධු සාධු භික්ඛවෙ, සාධු ඛො මෙ තුම්හෙ භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං ආජානාථ. එතදෙව භික්ඛවෙ, බහුතරං යං වො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං අමනාපසම්පයොගා මනාපවිප්පයොගා කන්දන්තානං රුදන්තානං අස්සු පස්සන්නං පඝරිතං, න ත්වෙව චතුසු මහාසමුද්දෙසු උදකං. දීඝරත්තං වො භික්ඛවෙ, මාතුමරණං පච්චනුභූතං. [එතදෙව භික්ඛවෙ බහුතරං යං] තෙසං වො මාතුමරණං පච්චනුභොන්තානං අමනාපසම්පයොගා මනාපවිප්පයොගා කන්දන්තානං රුදන්තානං අස්සු පස්සන්නං, පඝරිතං. න ත්වෙව චතුසු මහාසමුද්දෙසු උදකං. දීඝරත්තං වො භික්ඛවෙ පි පිතුමරණං පච්චනුභූතං -පෙ- භාතුමරණං පච්චනුභූතං -පෙ- භගිනිමරණං පච්චනුභූතං -පෙ- පුත්තමරණං පච්චනුභූතං -පෙ- ධීතුමරණං පච්චනුභූතං -පෙ- ඤාතිව්‍යසනං පච්චනුභූතං -පෙ- භොගව්‍යසනං පච්චනුභූතං -පෙ- රොගව්‍යසනං පච්චනුභූතං -පෙ- තෙසං වො රොගව්‍යසනං පච්චනුභොන්තානං අමනාපසම්පයොගා මනාපවිප්පයොගා කන්දන්තානං රුදන්තානං අස්සු පස්සන්නං පඝරිතං. න ත්වෙව චතුසු මහාසමුද්දෙසු උදකං. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො -පෙ- යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුන්ති.

---

1. "න" දිස්සතෙය අනන්තරිකපාඨො, මජසං, සයා, PTS. 2. රොදන්තානං-මජසං PTS.
3 පසන්දං = සිමු, පසන්දන්තිං සන්දිතං, අට්ඨකථා - සිමු. පසන්දං - සයා.

මහණෙනි, මෙසේ තොප විසින් දිගුකලක් ම දුක් විඳින ලදි, තියුණු දුක් විඳින ලදි, ව්‍යසන විඳින ලදි, සොහොන හෝ පොළොව වඩන ලදි. මහණෙනි, එහෙයින් සියලු සංස්කාරයන්හි කලකිරෙන්නට නිසි ම ය, නො ඇලෙන්නට නිසි ම ය, මිදෙන්නට නිසි මැ යි.

## 3. 1. 3.

## අස්සු සූත්‍රය

266. සැවැත්නුවර-

මහණෙනි, මේසසර අපරිච්ඡින්න වූ පශ්චිම සීමා ඇතියේ යි. එහෙයින් අවිද්‍යාවෙන් වැසුනු තෘෂ්ණාවෙන් බැඳුනු (එහි) ධාවත් සංසරත් සත්ත්වයන්ගේ පූර්වසීමා නො පෙණේ. මහණෙනි, තොප විසින් දිගුකලක් දුක් විඳින ලදි. ඒ කිමැ යි හඟිවු ද, මේ දිගුකල දිවෙන සැරිසරණ, අමනාපයන් හා එක් වීමෙන් මනාපයන්ගෙන් වෙන් වීමෙන් හඬන වැලපෙන තොපගේ වැහුනු වැගුරුණු යම් කඳුලෙක් වේ ද, සිවුමහසමුදුරෙහි යම් ජලයෙක් වේ ද, (මෙයින්) කිමෙක් ඉතා වැඩි දැ යි?

"වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය යම් සේ දනිමු නම්, මේ දිගුකල දිවෙන්. දිවෙන සැරිසරණ, අමනාපයන් හා එක් වීමෙන් මනාපයන්ගෙන් වෙන් වීමෙන් හඬන වැලපෙන අපගේ වැහුනු වැගුරුණු යම් කඳුලෙක් වී ද, වහන්ස, මෙය ම ඉතා වැඩි ය. සිවුමහසමුදුරෙහි ජලය නො ම වැඩි ය."

මහණෙනි, මැනවි, මැනවි. මහණෙනි, තෙපි මා විසින් දේශනා කරණ ලද ධර්මය මෙසේ දනිවු නම් මැනවි. මහණෙනි, මේ දිගුකල දිවෙන සැරිසරණ අමනාපයන් හා එක් වීමෙන් මනාපයන්ගෙන් වෙන්වීමෙන් හඬන වැලපෙන තොපගේ වැහුනු වැගුරුණු යම් කඳුලෙක් වී නම් මෙය ම ඉතා වැඩි ය. සිවුමහසමුදුරෙහි ජලය නො ම වැඩි ය. මහණෙනි, තොප විසින් දිගුකලක් මවු මළ දුක විඳිනලදි. මහණෙනි, මවු මළ දුක විඳින අමනාපයන් හා එක් වීමෙන් මනාපයන්ගෙන් වෙන් වීමෙන් හඬන වැලපෙන ඒ තොපගේ වැහුනු වැගුරුණු යම් කඳුලෙක් වී නම් එය ඉබොහෝමය. සිවුමහසමුදුරෙහි දිය නොබොහෝමය. මහණෙනි, තොප විසින් දිගුකලක් පියා මළ දුක විඳිනලදි ... බෑයා මළ දුක විඳින ලදි ... බුහුන මළ දුක විඳින ලදි ... පුතු මළ දුක විඳින ලදි. ... දූ මළ දුක විඳින ලදි ... ඥතිව්‍යසන විඳින ලදි ...භෝගව්‍යසන විඳින ලදි ... රෝගව්‍යසන විඳින ලදි ... රෝගව්‍යසන විඳින්නා වූ අමනාපයන් හා එක් වීමෙන් මනාපයන්ගෙන් වෙන් වීමෙන් හඬන වැලපෙන ඒ තොපගේ වැහුනු වැගුරුණු කඳුලු ඉතා වැඩි ය. සිවුමහසයුරෙහි දිය නො ම වැඩිය. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ සසර නො පිරිසුන් කෙළවර ඇතියේ ය ... මහණෙනි, එහෙයින් සියලු සංස්කාරයන්හි කලකිරෙන්නට නිසි ම ය, නො ඇලෙන්නට නිසි ම ය, මිදෙන්නට නිසි මැ යි.

3. 1. 4.

## මාතුථඤ්ඤසුත්තං

267. සාවත්ථියං-

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරෙ. පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමන්නු බො බහුතරං යං වා වො[1] ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං මාතුථඤ්ඤං පීතං, යං වා චතුසු මහා-සමුද්දෙසු උදකන්ති.?

"යථා බො මයං භන්තෙ, භගවතා ධම්මං දෙසිතං ආජානාම, එතදෙව භන්තෙ, බහුතරං යං නො[2] ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං මාතුථඤ්ඤං පීතං, නත්වෙව චතුසු මහාසමුද්දෙසු උදක"න්ති.

සාධු සාධු භික්ඛවෙ, සාධු බො මෙ තුම්හෙ භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං ආජානාථ. එතදෙව භික්ඛවෙ, බහුතරං යං වො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං මාතුථඤ්ඤං පීතං, නත්වෙව චතුසු මහාසමුද්දෙසු උදකං. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරෙ -පෙ- අලං විමුච්චිතුන්ති.

3. 1. 5.

## පබ්බතසුත්තං

268. සාවත්ථියං-

අථ බො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා -පෙ- එකමන්තං නිසින්නො බො සො භික්ඛු භගවන්තං එතදවොච: "කීවදීඝො[2] නු බො භන්තෙ, කප්පො"ති?

දීඝො බො භික්ඛු කප්පො. සො න සුකරො සඞ්ඛාතුං එත්තකානි වස්සානි ඉති වා, එත්තකානි වස්සසතානි ඉති වා, එත්තකානි වස්සසහස්සානි ඉති වා, එත්තකානි වස්සසතසහස්සානි ඉති වාති. සක්කා පන භන්තෙ, උපමං කාතුන්ති? සක්කා භික්ඛූති භගවා අවොච. සෙය්‍යථාපි භික්ඛු මහාසෙලො පබ්බතො යොජනං ආයාමෙන, යොජනං විත්ථාරෙන, යොජනං උබ්බෙධෙන, අච්ඡිද්දො අසුසිරො එකඝනො, තමෙනං පුරිසො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන කාසිකෙන වත්ථෙන සකිං සකිං පරිමජ්ජෙය්‍ය, ඛිප්පතරං බො සො භික්ඛු මහාසෙලො පබ්බතො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය, න ත්වෙව කප්පො.

එවං දීඝො බො භික්ඛු, කප්පො. එවං දීඝානං බො භික්ඛු, කප්පානං නෙකො කප්පො සංසිතො නෙකං කප්පසතං සංසිතං, නෙකං කප්ප-සහස්සං සංසිතං, නෙකං කප්පසතසහස්සං සංසිතං. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛු සංසාරෙ -පෙ- අලං විමුච්චිතුන්ති.

---

1. බො - සී 1, 2. 2. යං බො - සීමු, සී 2.
2. කීවං දීඝො - PTS.

## 3. 1. 4.

## මාතුථඤ්ඤ සූත්‍රය

267. **සැවැත්නුවර-**

මහණෙනි, මේ සසර නො පිරිසුන් අග ඇතියේ ය, අවිද්‍යාවෙන් ඇවුරුණු තෘෂ්ණාවෙන් බැඳුනු දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ මුල් කෙළවර නො පෙණේ. මහණෙනි, ඒ කිමැ යි හඟිව්හු ද? මේ දිගුකල දිවෙන සැරිසරණ තොප විසින් (එක්තම් ඇති මිනිස්) මවකගේ යම් කිරක් පූ ද, සිවුමහ සමුද්‍රරෙහි යම් ජලයෙක් වේ ද, (මෙයින්) කිමෙක් ඉතා වැඩි ද?

"වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය අපි යම් සේ දනිමු නම්, මේ දිගුකල් දිවෙන සැරිසරණ අප විසින් යම් මවුකිරෙක් බොන ලද ද, වහන්ස, මෙය ම ඉතා වැඩි ය. සිවු මහසමුද්‍රරෙහි දිය නො වැඩි ය.

මහණෙනි, මැනවි, මැනවි. මහණෙනි, මා විසින් දේශනා කරණ ලද ධර්මය තෙපි මෙසේ දනිව්හු තම් මැනවි. මහණෙනි, මේ දිගුකල් දිවෙන සැරිසරණ තොප විසින් යම් මවුකිරෙක් පූ තම්, එය ම ඉතා වැඩි ය. සිවුමහසමුද්‍රරෙහි දිය නො වැඩි ය. ඒ කුම් හෙයින යත්: මහණෙනි, මෙසසර නො දන්නා ලද කෙළවර ඇතියේ ය ... මිදෙන්නට සුදුසුමැ යි.

## 3. 1. 5.

## පබ්බත සූත්‍රය

268. **සැවැත්නුවර-**

ඉක්බිති එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ ... එකත්පසෙක හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: "වහන්ස, කල්පය කෙතෙක් දිගු දැ"යි.

මහණ, කල්පය දිග ය. එය මෙතෙක් වසැයි හෝ මෙතෙක් වස් සියයෙකැ යි හෝ මෙතෙක් වස් දහසෙකැ යි හෝ මෙතෙක් වස් සියදහසෙකැ යි හෝ ගිණීමට සුකර නො වේ. වහන්ස, උපමාවක් කරනට හැකි ද? මහණ, හැකි ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මහණ, යම් සේ අයමින් යොදුනක් වූ, විතරින් යොදුනක් වූ උසින් යොදුනක් වූ සිදුරු රහිත විවර රහිත ගනබොල් මහසෙල් මුවා පව්වෙක් වේ ද, එය පුරුෂයෙක් සියවසක් සියවසක් ඇවැමෙන් කසීසළුවෙකින් වරින්වර පිරිමදනේ ද, මහණ, මේ උපක්‍රමයෙන් ඒ මහසෙල් මුවා පව්ව වහා ගෙවීමට අවසන් වීමට යන්නේ ය. කල්පය (එතෙක්) අවසනට නො යන්නේ ය.

මහණ, මෙසේ කල්පය දීඝ ය. මහණ, මෙසේ දීඝ වූ කල්පයන් අතුරෙන් ප්‍රසන්නවූයේ - ගෙවීගියේ එක්කපෙක් නො වෙයි ගෙවීගියේ කප්සියෙක් නො වෙයි. ගෙවීගියේ කප්දහසෙක් නො වෙයි ගෙවීගියේ කප්සියදහසෙක් නො වෙයි. ඒ කවර හෙයින යත්: මහණ, මෙසසර අනවරාග්‍ර වෙයි ... (එයින්) මිදෙන්නට නිසි මැ යි.

## 3. 1. 6.

## සාසපසුත්තං

269. සාවත්ථියං-

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: "කීවදීඝො නු ඛො භන්තෙ, කප්පො"ති?

දීඝො ඛො භික්ඛු කප්පො. සො න සුකරො සංඛාතුං එත්තකානි වස්සානීති වා -පෙ- එත්තකානි වස්සසතසහස්සානීති වාති. සක්කා පන භන්තෙ, උපමං කාතුන්ති? සක්කා භික්ඛූති භගවා අවොච. සෙය්‍යථාපි භික්ඛු ආයසං නගරං යොජනං ආයාමෙන යොජනං විත්ථාරෙන යොජනං උබ්බෙධෙන පුණ්ණං සාසපානං චූලිකාබද්ධං, තතො පුරිසො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන එකමෙකං සාසපං උද්ධරෙය්‍ය. ඛිප්පතරං ඛො සො භික්ඛු මහාසාසපරාසි ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය, න ත්වෙව කප්පො.

එවං දීඝො ඛො භික්ඛු, කප්පො එවං දීඝානං ඛො භික්ඛු, කප්පානං නෙකො කප්පො සංසිතො. නෙකං කප්පසතං සංසිතං, නෙකං කප්පසහස්සං සංසිතං. නෙකං කප්පසතසහස්සං සංසිතං. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛු සංසාරො -පෙ- අලං විමුච්චිතුන්ති.

## 3. 1. 7.

## සාවකසුත්තං

270. සාවත්ථියං-

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. -පෙ- එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං "කීවබහුකා නු ඛො භන්තෙ, කප්පා අබ්භතීතා අතික්කන්තා"ති?

බහුකා ඛො භික්ඛවෙ, කප්පා අබ්භතීතා අතික්කන්තා. තෙ න සුකරා සඞ්ඛාතුං එත්තකා කප්පා ඉති වා, එත්තකානි කප්පසතානි ඉති වා එත්තකානි කප්පසහස්සානි ඉති වා, එත්තකානි කප්පසතසහස්සානි ඉති වාති. සක්කා පන භන්තෙ, උපමං කාතුන්ති? සක්කා භික්ඛවොති භගවා අවොච. ඉධස්සු භික්ඛවෙ, චත්තාරො සාවකා වස්සසතායුකා වස්සසතජීවිනො. තෙ දිවසෙ දිවසෙ කප්පසතසහස්සං කප්පසතසහස්සං අනුස්සරෙය්‍යුං[1]. අනනුස්සරිතාව[2] භික්ඛවෙ, තෙහි කප්පා අස්සු. අථ ඛො තෙ චත්තාරො සාවකා වස්සසතායුකා වස්සසතජීවිනො වස්සසතස්ස අච්චයෙන කාලං කරෙය්‍යුං.

එවං බහුකා ඛො භික්ඛවෙ, කප්පා අබ්භතීතා අතික්කන්තා. තෙ න සුකරා සඞ්ඛාතුං එත්තකා කප්පා ඉති වා, එත්තකානි කප්පසතානි ඉති වා, එත්තකානි කප්පසහස්සානි ඉති වා, එත්තකානි කප්පසතසහස්සානි ඉති වා. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො -පෙ- අලං විමුච්චිතුන්ති.

---

1. කප්පසතසහස්ස] අනුස්සරෙය්‍යුං - සී 1, 2, PPS. 2. අනුස්සරිතාව - PTS.

## 3. 1. 6.

### සාසප සූත්‍රය

269 සැවැත්නුවර-

ඉක්බිති එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය ... එකත්පසෙක හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: වහන්ස, "කල්පය කොතෙක් දිග ද?

මහණ, කල්පය දිග ය. එය මෙතෙක් වසැ යි හෝ ... මෙතෙක් වස් සියදහසැයි හෝ ගණනට සුකර නො වේ වහන්ස, උපමාවක් කරනට හැකි ද? මහණ, හැකි ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මහණ, යම් සේ දිගින් යොදුනක් වූ පුළුලින් යොදුනක් වූ උසින් යොදුනක් වූ අබැටින් සිළු බැඳ පිරුණු යපවුරෙන් පිරිකෙවූ නුවරෙක් වේ ද, පුරුෂයෙක් සියවස් සියවස් ඇවෑමෙන් එයින් එක් එක් අබැටක් උදුරන්නේ ද, මහණ, ඒ මහත් අබැටරැස මේ උපක්‍රමයෙන් ඉතා වහා ගෙවීමට නිමාවට යන්නේ ය. කල්පය (එසේ ගෙවීමට ) නො ම යන්නේ ය.

මහණ, මෙසේ කල්පය දිග ය. මහණ, මෙසේ දික් වූ කල්පයන් අතුරෙන් ගෙවුනේ එක් කපෙක් නො වෙයි. ගෙවුනේ කප්සියෙක් නො වෙයි. ගෙවුනේ කප් දහසෙක් නො වෙයි. ගෙවුනේ කප් සියදහසෙක් නො වේ. ඒ කවර හෙයින යත්: මහණ, මෙසසර අනවරාග්‍රය ... එයින් මිදෙන්නට නිසි මැ යි.

## 3. 1. 7.

### සාවකසූත්‍රය

270 සැවැත්නුවර-

එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ: "වහන්ස, කොතෙක් බොහෝ කල්පයෝ ගත වූවාහු ද, ඉක්මුතා ද"

මහණෙනි, අතීත වූ කල්පයෝ බොහෝ ය. මෙතෙක් කපැ යි හෝ මෙතෙක් කප් සියෙකැ යි හෝ මෙතෙක් කප්දහසැ යි හෝ මෙතෙක් කප් සියදහසැ යි හෝ එය ගිණුමට සුකර නො වෙයි වහන්ස, උපමාවක් කරනට හැකි දැයි? මහණෙනි, හැකි ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මහණෙනි, මෙහි සියවස් ආයු ඇති සියවස් ජීවත් වන සුළු සව්වෝ සිවුදෙනෙක් වෙත් නම්, ඔහුත් දිනපතා කප් සියදහසක් කප් සියදහසක් සිහි කෙරෙත් නම්, මහණෙනි, ඔවුන් විසින් කල්පයෝ සිහි නො කළාහු ම වෙත්. වැලි දු සියවස් ආයු ඇති සියවස් ජීවත්වන සුළු ඒ සිවුසව්වෝ සියවස් සියවස්හුගේ ඇවෑමෙන් කළුරිය කරන්නාහු ය.

මහණෙනි, මෙසේ ගෙවී ගියා වූ ඉක්ම ගියා වූ කල්පයෝ බොහෝ ය. ඔහු මෙතෙක් කපැ යි හෝ, මෙතෙක් කප් සියෙකැයි හෝ, මෙතෙක් කප් දහසැයි හෝ, මෙතෙක් කප් සියදහසැයි හෝ ගිණීමට සුකර නො වෙත්. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙසසර අපරිමාණ ය ... එයින් මිදෙන්නට නිසි මැ යි.

3. 1. 8.

**ගඞ්ගාසුත්තං**

271. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ**. අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. කිවබහුකා නු ඛො භො ගොතම, කප්පා අබ්භතීතා අතික්කන්තාති.

බහුකා ඛො බ්‍රාහ්මණ, කප්පා අබ්භතීතා අතික්කන්තා. තෙ න සුකරා සඞ්ඛාතුං එත්තකා කප්පා ඉති වා, එත්තකානි කප්පසතානි ඉති වා, එත්තකානි කප්පසහස්සානි ඉති වා, එත්තකානි කප්පසතසහස්සානි ඉති වාති. සක්කා පන භො ගොතම උපමං කාතුන්ති? සක්කා බ්‍රාහ්මණාති භගවා අවොච. සෙය්‍යථාපි බ්‍රාහ්මණ යතො චායං ගඞ්ගානදී පභොති[1], යත්ථ ච මහාසමුද්දං අප්පෙති, යා එතස්මිං[2] අන්තරෙ වාලිකා, එසා න සුකරා සඞ්ඛාතුං එත්තකා වාලිකා ඉති වා, එත්තකානි වාලිකාසතානි ඉති වා, එත්තකානි වාලිකාසහස්සානි ඉති වා, එත්තකානි වාලිකා සතසහස්සානි ඉති වා.

තතො බහුතරං ඛො බ්‍රාහ්මණ, කප්පා අබ්භතීතා අතික්කන්තා. තෙ න සුකරා සඞ්ඛාතුං එත්තකා කප්පා ඉති වා, එත්තකානි කප්පසතානි ඉති වා, එත්තකානි කප්පසහස්සානි ඉති වා, එත්තකානි කප්පසතසහස්සානි ඉති වා. තං කිස්ස හෙතු? අනමතග්ගොයං බ්‍රාහ්මණ, සංසාරො -පෙ- අලං විමුච්චිතුන්ති.

එවං වුත්තෙ සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත"න්ති.

3. 1. 9.

**දණ්ඩසුත්තං**

272. **සාවත්ථියං**-

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො. පුබ්බාකොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. සෙය්‍යථාපි භික්ඛවෙ, දණ්ඩො උපරිවෙහාසං ඛිත්තො සකිම්පි මූලෙන නිපතති, සකිම්පි මජ්ඣෙන නිපතති, සකිම්පි අග්ගෙන[3] නිපතති, එවමෙව ඛො භික්ඛවෙ අවිජ්ජානීවරණා සත්තා තණ්හාසංයොජනා සන්ධාවන්තා සංසරන්තා සකිම්පි අස්මා ලොකා පරං ලොකං ගච්ඡන්ති. සකිම්පි පරස්මා ලොකා ඉමං ලොකං ආගච්ඡන්ති. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො -පෙ- අලං විමුච්චිතුන්ති.

---

1. පහවති - මජසං. 2 යා ච තස්මිං - PTS. 3 අන්තෙන - මජසං.

## 3. 1. 8.

## ගඞ්ගාසූත්‍රය

271 එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර සමීපයෙහි **කලන්‍දකනිවාප** නම් වූ **වේළුවනාරාමයෙහි** වැඩ වසන සේක. එකල්හි එක්තරා බමුණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පසෙක හුන් ඒ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: භවත් ගෞතමයෙනි, කෙතෙක් බොහෝ කල්පයෝ ගත වූවාහු ඉක්මුනාහු දැ? යි.

බමුණ, බොහෝ කල්පයෝ ගත වූහ. ඉක්මුනාහු ය. ඔහු මෙතෙක් කපැයි හෝ මෙතෙක් කප් සියකැයි හෝ මෙතෙක් කප් දහසැ යි හෝ මෙතෙක් කප් සියදහසැ යි හෝ ගිණීමට සුකර නො වෙති. භවත් ගෞතම-යෙනි, උපමාවක් කරන්නට හැකි දැ යි? බමුණ, හැකි ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. බමුණ, යම් සේ මේ ගඞ්ගා නදිය යම් තැනෙකින් හට ගණී ද, යම් තැනෙක මහසමුදුරට පිවිසේ ද, මේ අතර යම් වැල්ලෙක් වේ ද, එය මෙතෙක් වැලි ය යි හෝ මෙතෙක් වැලි සියකැ යි හෝ මෙතෙක් වැලි දහසැයි හෝ මෙතෙක් වැලි සියදහසැයි හෝ ගිණීමට සුකර නො වේ.

බමුණ, එයට වැඩි ඉතා බොහෝ කල්පයෝ ගත වූවාහු ඉක්ම ගියහ. ඔහු මෙතෙක් කපැයි හෝ මෙතෙක් කප් සියකැයි හෝ මෙතෙක් කප් දහසැයි හෝ මෙතෙක් කප් සියදහසැයි හෝ ගිණීමට සුකර නො වෙති. ඒ කවර හෙයින යත්: බමුණ, මෙසසර අනාදිමත්ය. ... එයින් මිදෙන්නට නිසි මැ යි.

මෙසේ වදාළ කල්හි ඒ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේ ය: "භවත් ගෞතමයෙනි, ඉතා මැනවි, භවත් ගෞතමයෙනි, ඉතා මැනවි ... භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවි හිමියෙන් සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා"යි.

## 3. 1. 9.

## දණ්ඩසූත්‍රය

272 **සැවැත්නුවර**-

මහණෙනි, මෙ සසර නො දත් අග ඇතියේ වෙයි. අවිද්‍යාවෙන් ඇවුරුණු තෘෂ්ණාවෙන් බැඳුනු දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ පූර්ව කෙළවර නො පෙණේ. මහණෙනි, යම් සේ උඩ අහසෙහි දමූ දඬෙක් වරක් මුලින්නුදු වැටෙයි. වරක් මැදිනුදු වැටෙයි. වරක් අගිනුදු වැටෙයි. මහණෙනි, එසෙයින් ම අවිද්‍යාවෙන් වැසුනු තෘෂ්ණාවෙන් බැඳුනු (ඒ මේ අත) දිවෙන සැරිසරණ සත්ත්වයෝ වරක් මෙලොවින් පරලොවට යෙති. වරක් පරලොවින් මෙලොවට එති. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙසසර නො පිරිසුන් අග්මුල් ඇත්තේ ය ... එයින් මිදෙන්නට නිසි මැ යි.

### 3. 1. 10.

### එකපුග්ගලසුත්තං

273. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තත්‍ර ඛො -පෙ- එතදවොච:

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො -පෙ- එකපුග්ගලස්ස භික්ඛවෙ, කප්පං සන්ධාවතො සංසරතො සියා එවං මහාඅට්ඨිකඞ්කලො අට්ඨිපුඤ්ජො අට්ඨිරාසි යථායං වෙපුල්ලො පබ්බතො, සචෙ සංහාරකො අස්ස, සම්භතඤ්ච න විනස්සෙය්‍ය. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො. -පෙ- අලං විමුච්චිතුන්ති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

එකස්සෙකෙන කප්පෙන පුග්ගලස්සට්ඨිසඤ්චයො,
සියා පබ්බතසමො රාසි ඉති වුත්තං මහෙසිනා

සො ඛො පනායං අක්ඛාතො වෙපුල්ලො පබ්බතො මහා,
උත්තරො ගිජ්ඣකූටස්ස මගධානං ගිරිබ්බජෙ.

යතො ච[1] අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති:
දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං,
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

ස සත්තක්ඛත්තුං පරමං සන්ධාවිත්වාන පුග්ගලො,
දුක්ඛස්සන්තකරො හොති සබ්බසංයොජනක්ඛයාති.

තිණකට්ඨවග්ගො පඨමො.

තස්සුද්දානං:

තිණකට්ඨඤ්ච පඨවී අස්සු ඛීරඤ්ච පබ්බතං,
සාසපො සාවකො ගඞ්ගා දණ්ඩො ච පුග්ගලෙන චාති.

---

1. යතො - සීමු, PTS.

## 3. 1. 10.

## ඒකපුග්ගල සූත්‍රය

273. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි ගිජුකුළු පව්වෙහි වැඩවසන සේක. එහි දී ... මෙය වදාළ සේක.

මහණෙනි, මෙසසර නැවත නැවත බලයි ද නොපිරිසුන් කෙළවර ඇතියේ යි. මහණෙනි, කපක් මුළුල්ලෙහි දිවෙන සැරිසරණ එක් පුගුලකුගේ ඇටසැකිල්ල ඇටගොඩ ඇටරැස ඉදින් රැස් කරන්නෙක් වන්නේ නම්, රැස් කරණ ලදුයේත් නො වැනසේ නම්, මේ වෙපුල්ල පර්වතය යම් සේ ද, එසේ මහත් වන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙසසර නො දන්නා ලද කෙළවර ඇතියේ ය...එසින් මිදෙන්නට නිසි මැ යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාරා සුගත වූ ශාස්තෘන් වහන්සේ යළි මතුදු මෙය වදාළ සේක:

එක් කපෙකින් එක් පුගුලකුගේ ඇට රැස (වෙපුල්ල) පර්වතය බඳු රැසෙක් වන්නේ ය යි මහර්ෂි වූ බුදුරජානන් වහන්සේ විසින් වදාරණ ලදි.

ඒ මේ මහත් වෙපුල්ල පර්වතය මගධජනපදයෙහි ගිරිව්‍රජයෙහි (පර්වත පරික්ෂෙපයෙහි) ගිජුකුළු පව්වට උතුරුදික්හි (පිහිටියේ) ය යි කියන ලදි.

යම් කලෙක දුක, දුක හට ගැණීම, දුක ඉක්මීම, දුක ඉක්මීමට යන අරිඅටඟිමඟ යන ආර්‍ය්‍ය සත්‍යයන් මනා නුවණින් දකී ද,

ඒ (සෝවන්) පුද්ගල තෙමේ සත්වරක් පරම කොට සැරිසරා සියලු සංයෝජනයන් ක්‍ෂය කිරීමෙන් දුක් කෙළවර කරන්නෙක් වේ යි.

**තිණකට්ඨවර්ගය පළමුවැනි යි.**

එහි උද්දානය:

තිණකට්ඨ, පඨවි, අස්සු, ඛීර, පබ්බත, සාසප, සාවක, ගඞ්ගා, දණ්ඩ, පුග්ගල ය යි සූත්‍ර දශයෙකි යි.

# 2. දුග්ගතවග්ගො

## 3. 2. 1.

### දුග්ගතසුත්තං

274. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො -පෙ- එතදවොච:

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො. පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. යං භික්ඛවෙ, පස්සෙය්‍යාථ දුග්ගතං දුරූපෙතං,[1] නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අම්හෙහිපි එවරූපං පච්චනුභූතං ඉමිනා දීඝෙන අද්ධුනා'ති'. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො -පෙ- අලං විමුච්චිතුන්ති.

## 3. 2. 2.

### සුඛිතසුත්තං

275. **සාවත්ථියං**-

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො -පෙ- යං භික්ඛවෙ, පස්සෙය්‍යාථ සුඛිතං **සජ්ජිතං**, නිට්ඨමෙත්ථ ගන්තබ්බං "අම්හෙහිපි එවරූපං පච්චනුභූතං ඉමිනා දීඝෙන අද්ධුනා"ති. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො -පෙ- අලං විමුච්චිතුන්ති

## 3. 2. 3.

### තිංසමත්තසුත්තං

276. **රාජගහෙ**-

අථ ඛො තිංසමත්තා පාවෙය්‍යකා[2] භික්ඛූ, සබ්බෙ ආරඤ්ඤකා සබ්බෙ පිණ්ඩපාතිකා සබ්බෙ පංසුකූලිකා සබ්බෙ තෙචීවරිකා[3] සබ්බෙ සසංයොජනා[4] යෙන භගවා තෙනුපසංකමිංසු. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

අථ ඛො භගවතො එතදහොසි: "ඉමෙ ඛො තිංසමත්තා පාවෙය්‍යකා භික්ඛූ සබ්බෙ ආරඤ්ඤකා, සබ්බෙ පිණ්ඩපාතිකා, සබ්බෙ පංසුකූලිකා, සබ්බෙ තෙචීවරිකා, සබ්බෙ සසංයොජනා.[4] යන්නූනාහං ඉමෙසං තථා ධම්මං දෙසෙය්‍යං යථා තෙසං[5] ඉමස්මිං යෙව ආසනෙ අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චෙය්‍යු"න්ති.[6]

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති, 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච: අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො. පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමන්නු ඛො බහුතරං, යං වා වො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං, යං වා චතූසු මහාසමුද්දෙසු උදකන්ති?

---

1 දුරූපෙතං - මජ්ඣ, PTS, සී 1.
2. පාඨෙය්‍යකා - සී.2   3. තිචීවරිකා, සී 1, 2.   4. සසඤ්ඤොජනා - ස්‍යා.
5. ඉමෙසං - සිමු, සී 1,2   6. චිත්තං විමුච්චිය්‍යාති - සී 1, 2, චිත්තානි විමුච්චෙය්‍යුන්ති - PTS.

# 2. දුග්ගතවග්ගය

### 3. 2. 1.

### දුග්ගත සූත්‍රය

274. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **අනේපිඬු** සිටුහුගේ දෙව්රම්හි වැඩවසන සේක. එහි දී ... මෙය වදාළ සේක:

"මහණෙනි, මෙසසර නො පිරිසුන් අග ඇතියේ ය. අවිද්‍යානීවරණයෙන් වැසුනු තෘෂ්ණාසංයොජනයෙන් බැඳුනු දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ පූකෙළ (පූර්වාන්තය) නො පෙණේ. මහණෙනි, දිළිඳු වූ විරූප වූ යමකු දක්නහු නම්, මෙහි දී "අප විසිනු දු මේ දීර්ඝකාලයෙහි මෙබඳුවක් විඳින ලද්දේ"යි නිමාවට (නිශ්චයට) යා යුතු යි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙසසර නො පිරිසුන් අග ඇතියේ යි ... මෙයිනුදු ... මිදෙන්නට නිසි මැ යි.

### 3. 2. 2

### සුඛිත සූත්‍රය

275. **සැවැත්නුවර**-

මහණෙනි, මෙසසර නො පිරිසුන් අග ඇතියේ ය ... මහණෙනි, සුවපත් අලඞ්කාරයෙන් සැදුනු යමකු දක්නහු නම්, මෙහි දී "මේ දිගුකල අප විසිනුදු මෙබඳුවක් විඳින ලද්දේ" යි නිමාවට යා යුතු යි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙසසර නො පිරිසුන් අග ඇතියේ ය ... මෙයිනුදු මිදෙන්නට නිසි මැ යි.

### 3. 2. 3.

### තිංසමත්ත සූත්‍රය

276 **රජගහනුවර**-

එකල්හි සියල්ලෝ ම ආරණ්‍යක වූ පිණ්ඩපාතික වූ පාංශුකූලික වූ තෙචීවරික වූ, සියල්ලෝ ම සංයෝජන සහිත වූ, **පාවානුවර** වැසි තිස්නමක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳ ගත්හ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේට "පාවානුවර වැසි මේ තිස්නමක් පමණ වූ භික්ෂූහු සියල්ලෝ ම ආරණ්‍යකහ. පිණ්ඩපාතිකහ. පාංශුකූලිකහ. තෙචීවරිකහ. සියල්ලෝ ම සංයෝජන සහිතහ. ඉදින්, මේ අසුන්හි දී ම ඔවුන්ගේ සිත් උපාදාන රහිත ව ආස්‍රවයන්ගෙන් යම් සේ මිදේ නම් එසේ මම මොවුනට දහම් දෙසන්නෙම් නම් මැනැවැ"යි මේ සිත විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූසේක. 'වහන්සැ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: මහණෙනි, මෙසසර අවිදිතාග්‍ර ඇතියේ ය. අවිද්‍යාවෙන් වැසුනු තෘෂ්ණාවෙන් බැඳුනු දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ පූර්වකෝටිය නො පෙණේ. මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, මේ දිගුකල දිවෙන සැරිසරණ තිය සුත් තොපගේ වැහුනු වැගුරුණු යම් පමණ ලෙයෙක් වේ ද, සිවුමහසමුදුරෙහි යම් පමණ ජලයෙක් වේ ද, (මෙයින්) කිමෙක් ඉතා වැඩි දැ යි?

"යථා බො මයං භන්තෙ භගවතා ධම්මං දෙසිතං ආජානාම: එතදෙව භන්තෙ, බහුතරං යං නො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං, න ත්වෙව චතූසු මහාසමුද්දෙසු උදක"න්ති.

සාධු සාධු භික්ඛවෙ, සාධු බො මෙ තුම්හෙ භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං ආජානාථ: එතදෙව භික්ඛවෙ, බහුතරං යං වො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං, න ත්වෙව චතූසු මහාසමුද්දෙසු උදකං. දීඝරත්තං වො භික්ඛවෙ, ගුන්නං සතං ගොභූතානං සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං, -පෙ- න ත්වෙව චතූසු මහාසමුද්දෙසු උදකං. දීඝරත්තං වො භික්ඛවෙ, මහිසානං[1] සතං මහිසභූතානං සීසච්ඡින්නානං -පෙ- අජානං සතං අජභූතානං -පෙ- උරබ්භානං සතං උරබ්භභූතානං -පෙ- මිගානං සතං මිගභූතානං -පෙ- සූකරානං සතං සූකරභූතානං -පෙ- කුක්කුටානං සතං කුක්කුටභූතානං -පෙ- දීඝරත්තං වො භික්ඛවෙ, චොරා ගාමඝාතකාති[2] ගහෙත්වා සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං -පෙ- දීඝරත්තං වො භික්ඛවෙ, චොරා පරිපන්ථකාති[3] ගහෙත්වා -පෙ- චොරා පාරදාරිකාති ගහෙත්වා සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං -පෙ- න ත්වෙව චතූසු මහාසමුද්දෙසු උදකං. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො -පෙ- [යාවඤ්චිදං භික්ඛවෙ -පෙ-] අලං විමුච්චිතුන්ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති. ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ තිංසමත්තානං පාවෙය්‍යකානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසූති.

## 3 2. 4.

## මාතුසුත්තං

277 සාවත්ථියං-

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො -පෙ- න සො භික්ඛවෙ, සත්තො සුලභරූපො යො න මාතාභූතපුබ්බො ඉමිනා දීඝෙන අද්ධුනා. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො. -පෙ- [එවං දීඝරත්තං වො භික්ඛවෙ, දුක්ඛං පච්චනුභූතං-පෙ- යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං.] අලං විමුච්චිතුන්ති.

## 3 2. 5.

## පිතුසුත්තං

278. සාවත්ථියං-

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො -පෙ- න සො භික්ඛවෙ, සත්තො සුලභරූපො යො න පිතාභූතපුබ්බො [ඉමිනා දීඝෙන අද්ධුනා. තං කිස්ස හෙතු? අනමතග්ගො යං භික්ඛවෙ සංසාරො -පෙ- යාවඤ්චිදං භික්ඛවෙ] -පෙ- අලං විමුච්චිතුන්ති.

1. මහිංසානං - මජ්ඣං 2. ගාමඝාතාති - මජ්ඣං, PTS.
3. පාරිපන්ථිකාති, මජ්ඣං.

"වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය යම් සේ දනිමු නම්, මේ දිගුකල දිවෙන සැරිසරණ භික්ෂූන් අපගේ වැහුනු වැගුරුණු යම් ලෙයෙක් වේ ද, ඒ ලෙය ම ඉතා වැඩි ය. සිවුමහ සමුද්‍රරෙහි ජලය නො ම වැඩි ය."

මහණෙනි, මැනවි, මැනවි. මහණෙනි, තෙපි මා විසින් දෙශනා කරණ ලද ධර්මය මෙසේ දනිවූ නම් මැනවි: මහණෙනි, මේ දිගුකල දිවෙන සැරිසරණ භික්ෂූන් තොපගේ වැහුනු වැගුරුණු යම් ලෙයක් වේ නම් මෙය ම ඉතා වැඩි ය. සිවුමහසයුරෙහි ජලය නො ම වැඩි ය. මහණෙනි, දිගුකලක් මුළුල්ලෙහි ගොජාතීයෙහි ම ගොණුන් ව උපන් භික්ෂූන් තොපගේ වැහුනු වැගුරුණු ලෙය ම (ඉතා වැඩි ය.) සිවුමහසයුරෙහි ජලය නො ම වැඩි ය. මහණෙනි, දිගුකලක් මුළුල්ලෙහි මහිෂ ජාතියෙහි ම මිහි ව උපන් භික්ෂූන් තොපගේ ... එළු ජාතියෙහි ම එළු ව උපන් ... තිරෙළු ජාතියෙහි ම තිරෙළු ව උපන් ... මුව ජාතියෙහි ම මුව ව උපන් ... හූරු ජාතියෙහි ම හූරු ව උපන් ... කුකුළු ජාතියෙහි කුකුළු ව උපන් ... මහණෙනි, දිගුකලක් මුළුල්ලෙහි ගම්පහරණ සොරු යි ගෙණ භික්ෂූන් තොපගේ වැහුනු වැගුරුණු ලෙය ... මහණෙනි, දිගුකලක් මුළුල්ලෙහි මං පහරණ සොරු යි ගෙණ ... පරඹුන් සෙවුනා සොරු යි ගෙණ භික්ෂූන් තොපගේ වැහුනු වැගුරුණු ලෙය ම (ඉතා වැඩි ය.) සිවුමහසමුද්‍රරෙහි ජලය නො ම වැඩි ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙසසර නො පිරිසුන් කෙළවර ඇත්තේ ය ... මෙසිතුදු මහණෙනි ... මිදෙන්නට නිසි මැ යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ. මේ ධර්මවිභාගය වදාරණු ලබන කල්හි තිස් නමක් පමණ පාවෙය්‍යක භික්ෂූන්ගේ සිත් උපාදාන රහිත ව ආස්‍රවයන්ගෙන් මිදුනේ ය.

### 3. 2. 4.

### මාතු සූත්‍රය

277. **සැවැත්නුවර-**

මහණෙනි, මෙසසර නො දන්නා ලද අවධි ඇතියේ ය ... මහණෙනි, මේ දිගුකල යම් සතෙක් එක් සතක්හු මවු නො වූ විරූ ද, එබඳු සතෙක් සුලබ නො වේ ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙ සසර නො දන්නා ලද අවධි ඇතියේ ය ... මහණෙනි, මෙසේ දීර්ඝකාලයක් තොප විසින් දුක් විඳින ලදි .. මහණෙනි, එහෙයින් සියලු සංසකාරයන් කෙරෙහි කළකිරෙන්නට නිසිය. නො ඇලෙන්නට නිසිය. මිදෙන්නට නිසි ම ය.

### 3. 2. 5.

### පිතු සූත්‍රය

278. **සැවැත්නුවර-**

මහණෙනි, මෙසසර අවිදිතාග්‍රය ... මහණෙනි, මේ දිගුකල යම් සතෙක් එක්සතක්හු පිය නො වූ විරූ ද, එබඳු සතෙක් සුලබ නො වේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙසසර අවිදිතාග්‍රය ... මහණෙනි, එහෙයින් ... මිදෙන්නට නිසි ම ය. මිදෙන්නට සුදුසු මැ යි.

## 3. 2. 6.

## භාතුසුත්තං

279 **සාවත්ථියං-**

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො ... න සො භික්ඛවෙ, සත්තො සුලභරූපො යො න භාතාභූතපුබ්බො [ඉමිනා දීඝෙන අද්ධුනා.] -පෙ- [යාවඤ්චිදං භික්ඛවෙ -පෙ-] අලං විමුච්චිතුන්ති.

## 3. 2. 7.

## භගිනිසුත්තං

280 **සාවත්ථියං-**

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො ... න සො භික්ඛවෙ, සත්තො සුලභරූපො යො න භගිනීභූතපුබ්බො [ඉමිනා දීඝෙන අද්ධුනා] -පෙ- [යාවඤ්චිදං භික්ඛවෙ -පෙ-] අලං විමුච්චිතුන්ති.

## 3. 2. 8

## පුත්තසුත්තං

281 **සාවත්ථියං-**

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො ... න සො භික්ඛවෙ, සත්තො සුලභරූපො යො න පුත්තාභූතපුබ්බො[1] [ඉමිනා දීඝෙන අද්ධුනා] -පෙ- [යාවඤ්චිදං භික්ඛවෙ -පෙ-] අලං විමුච්චිතුන්ති.

## 3. 2. 9.

## ධීතුසුත්තං

282. **සාවත්ථියං-**

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො. පුබ්බාකොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. න සො භික්ඛවෙ, සත්තො සුලභරූපො යො න ධීතාභූතපුබ්බො ඉමිනා දීඝෙන අද්ධුනා. තං කිස්ස හෙතු? අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො පුබ්බාකොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හා-සංයොජනානං සන්ධාවතං සංසරතං. එවං දීඝරත්තං වො භික්ඛවෙ, දුක්ඛං පච්චනුභූතං, තිබ්බං පච්චනුභූතං, ව්‍යසනං පච්චනුභූතං, කටසී වඩ්ඪිතා, යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුන්ති.

## 3. 2. 10.

## වෙපුල්ලපබ්බතසුත්තං

283 එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ගිජ්ඣකූටෙ** පබ්බතෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි -පෙ- භගවා එතදවොච: අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො, පුබ්බාකොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං.

---

1. පුත්තො භූතපුබ්බො - සීමු, සයා, සී. 1, 2,

## 3. 2. 6.

### භාතු සූත්‍රය

279. **සැවැත්නුවර-**

මහණෙනි, මේ සසර අවිදිතාග්‍ර ඇතියේ ය මහණෙනි, මේ දීර්ඝකාලයෙහි යමෙක් බෑයා නො වූ විරූ ද, එබඳු සතෙක් සුලබ නො වේ ... මෙසිතුදු මහණෙනි ... මිදෙන්නට නිසි මැ යි.

## 3. 2. 7.

### භගිනි සූත්‍රය

280. **සැවැත්නුවර-**

මහණෙනි, මේ සසර අවිදිතාග්‍ර ඇතියේ ය...මහණෙනි, මේ දීර්ඝකාලයෙහි යමෙක් බුහුන නො වූ විරූ ද, එබඳු සතෙක් සුලබ නො වේ. ... මෙසිතුදු මහණෙනි ... මිදෙන්නට නිසි මැ යි.

## 3. 2. 8

### පුත්ත සූත්‍රය

281. **සැවැත්නුවර-**

මහණෙනි, මේ සසර අවිදිතාග්‍ර ඇතියේ ය මහණෙනි, මේ දීර්ඝකාලයෙහි යමෙක් පුතු නො වූ විරූ ද, එබඳු සතෙක් සුලබ නො වෙයි ... මෙසිතුදු මහණෙනි...මිදෙන්නට නිසි මැ යි.

## 3. 2. 9.

### ධීතු සූත්‍රය

282. **සැවැත්නුවර-**

මහණෙනි, මෙසසර නො දන්නා ලද අග ඇතියේ ය. අවිද්‍යාවෙන් ඇවුරුණු තෘෂ්ණාවෙන් බැඳුනු දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ පූකෙළ-(පූර්වාන්තය) නො පෙණෙයි. මහණෙනි, මේ දීර්ඝකාලයෙහි දූ නො වූ විරූ නම් එබඳු සතෙක් සුලබ නො වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙසසර නො දන්නා ලද අග ඇතියේ ය අවිද්‍යාවෙන් බැඳුනු තෘෂ්ණාවෙන් ඇවුරුණු දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ පූර්වාන්තය නො පෙණෙයි. මහණෙනි. මෙසේ තොප විසින් දිගුකලක් දුක් විඳින ලදි. තියුණු දුක් විඳින ලදි. ව්‍යසන විඳින ලදි. සොහොන හෝ පොළොව වඩනලදි. මෙසිතුදු මහණෙනි, සියලු සංසකාරයන්හි කළකිරෙන්නට නිසි ම ය. නො ඇලෙන්නට නිසි ම ය. මිදෙන්නට නිසි මැ යි.

## 3. 2. 10

### වෙපුල්ලපබ්බත සූත්‍රය

283. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **ගිජුකුළු පව්වෙහි** වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක .. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මහණෙනි, මෙසසර නො පිරිසුන් අග ඇත්තේ ය අවිද්‍යාවෙන් වැසුනු තෘෂ්ණාවෙන් බැඳුනු දිවෙන සැරිසරණ සත්ත්වයන්ගේ පූර්වකොටිය නො පැණේ.

භූතපුබ්බං භික්ඛවෙ, ඉමස්ස **වෙපුල්ලස්ස** පබ්බතස්ස **පාචීනවංසො**ත්වෙව සමඤ්ඤා උදපාදි. තෙන ඛො පන භික්ඛවෙ, සමයෙන මනුස්සානං **තිවරා** ත්වෙව සමඤ්ඤා උදපාදි. තිවරානං භික්ඛවෙ, මනුස්සානං චත්තාළීස වස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. තිවරා භික්ඛවෙ, මනුස්සා පාචීනවංසං පබ්බතං චතුහෙන[1] ආරොහන්ති, චතුහෙන ඔරොහන්ති.

තෙන ඛො පන සමයෙන **කකුසන්ධො**[2] භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො හොති. කකුසන්ධස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස **විධුර-සඤ්ජීවං** නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. පස්සථ භික්ඛවෙ, සා චෙවිමස්ස පබ්බතස්ස සමඤ්ඤා අන්තරහිතා. තෙ ච මනුස්සා කාලකතා. සො ච භගවා පරිනිබ්බුතො. එවං අනිච්චා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අද්ධුවා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අනස්සාසිකා භික්ඛවෙ සඞ්ඛාරා. යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං.

භූතපුබ්බං භික්ඛවෙ, ඉමස්ස වෙපුල්ලස්ස පබ්බතස්ස **වඞ්කකො**[3] ත්වෙව සමඤ්ඤා උදපාදි. තෙන ඛො පන භික්ඛවෙ, සමයෙන මනුස්සානං **රොහිතස්සා** ත්වෙව සමඤ්ඤා උදපාදි. රොහිතස්සානං භික්ඛවෙ, මනුස්සානං තිංසවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. රොහිතස්සා භික්ඛවෙ, මනුස්සා වඞ්කකං පබ්බතං තීහෙන ආරොහන්ති, තීහෙන ඔරොහන්ති.

තෙන ඛො පන භික්ඛවෙ, සමයෙන **කොණාගමනො**[4] භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො හොති. කොණාගමනස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස **භිය්‍යො සුත්තරං** නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. පස්සථ භික්ඛවෙ, සා චෙවිමස්ස පබ්බතස්ස සමඤ්ඤා අන්තරහිතා. තෙ ච මනුස්සා කාලකතා? සො ච භගවා පරිනිබ්බුතො. එවං අනිච්චා, භික්ඛවෙ, සඞ්ඛාරා -පෙ- අලං විමුච්චිතුං.

භූතපුබ්බං භික්ඛවෙ, ඉමස්ස වෙපුල්ලස්ස පබ්බතස්ස **සුඵස්සො** ත්වෙව[5] සමඤ්ඤා උදපාදි. තෙන ඛො පන භික්ඛවෙ, සමයෙන මනුස්සානං **සුප්පියා**.[6] ත්වෙව සමඤ්ඤා උදපාදි. සුප්පියානං භික්ඛවෙ, මනුස්සානං **වීසතිවස්සසහස්සානි** ආයුප්පමාණං අහොසි. සුප්පියා භික්ඛවෙ, මනුස්සා සුඵස්සං පබ්බතං ද්වීහෙන ආරොහන්ති ද්වීහෙන ඔරොහන්ති.

තෙන ඛො පන භික්ඛවෙ, සමයෙන **කස්සපො** භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො හොති. කස්සපස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස **තිස්ස-භාරද්වාජං** නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. පස්සථ භික්ඛවෙ, සා චෙවිමස්ස පබ්බතස්ස සමඤ්ඤා අන්තරහිතා තෙ ච මනුස්සා කාලකතා. සො ච භගවා පරිනිබ්බුතො. එවං අනිච්චා, භික්ඛවෙ, සඞ්ඛාරා -පෙ- අලං විමුච්චිතුං.

1. චතූහෙන - මජසං.
2. කකුච්ඡන්ද බෞද්ධ සංස්කෘත.
3. වඞ්කතො - සයා,
4. කොණාගමිණො, අට්ඨකථා සීමු, කොනාකාමුනි - කනකාමුනි, බෞද්ධ සංස්කෘත.
5. සුපස්සො - මජසං, සයා, PTS.
6. අප්පියා - සීමු,

මහණෙනි, පෙර වූවක් කියමි: මේ **වෙපුල්ල** පර්වතයට **පාචීනවංස** ම ය යි නම් විය. මහණෙනි, එකල්හි මිනිසුන්ට **තිවර** යන නාමය විය. මහණෙනි, තිවර මිනිසුන්ට දහස්වසෙක් ආයුඃප්‍රමාණය විය. මහණෙනි, තිවර මිනිස්සු පාචීනවංස පර්වතයට සිව් දිනකින් නගිත්, සිව් දිනකින් බසිත්.

එකල්හි අතීත් සම්‍යක්සම්බුද්ධ වූ **කකුසඳ** භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සේක. අතීත් සම්‍යක්සම්බුද්ධ වූ කකුසඳ භාග්‍යවතුන් වහන්සේට උතුම් සොඳුරු යුවලක් වූ **විධුර**, **සඤ්ජීව** නම් සව් යුවලෙක් විය. මහණෙනි, බලවූ: මේ පර්වතයේ ඒ නාමය ද අතුරුදන් විය. ඒ මිනිස්සු ද කලුරිය කළහ. ඒ භාග්‍යවතුන් වහන්සේ ද පිරිණිවුනහ. මහණෙනි, මෙසේ සංස්කාරයෝ අනිත්‍යයහ. මහණෙනි, මෙසේ සංසකාරයෝ අද්‍රුවයහ. මෙසේ සංසකාරයෝ අනස්සාසික (=අස්වැසිලි රහිත) ය හ. මහණෙනි, මෙපිනුදු සියලු සංසකාරයන්හි කලකිරෙන්නට නිසි ම ය. නො ඇලෙන්නට නිසි ම ය. මිදෙන්නට නිසි මැ යි

මහණෙනි, පෙර වූවක් කියමි: මේ වෙපුල්ල පර්වතයට **වඞ්කක** යන නාමය ම වි ය. මහණෙනි, එකල්හි මිනිසුන්ට **රෝහිතස්ස** යන නාමය ම විය. මහණෙනි, රෝහිතස්ස මිනිසුන්ගේ ආයුඃප්‍රමාණය තිස්වස්දහසෙක් විය. මහණෙනි, රෝහිතස්ස මිනිස්සු වඞ්කක පර්වතයට තෙදිනකින් නගිත්. තෙදිනකින් බසිත්.

මහණෙනි, එකල්හි අතීත් සම්‍යක්සම්බුද්ධ වූ **කෝනාගමන** භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සේක. මහණෙනි, අතීත් සම්‍යක්සම්බුද්ධ වූ කෝනාගමන භාග්‍යවතුන් වහන්සේට අග්‍රභද්‍ර යුගයක් වූ **භිය්‍යො**, **සුත්තර** නම් සව් යුගයෙක් විය. මහණෙනි, බලවූ: මේ පර්වතයාගේ ඒ නාමයත් අතුරුදන් විය. ඒ මිනිස්සුත් කලුරිය කළහ. ඒ භාග්‍යවතුන් වහන්සේත් පිරිණිවියහ. මහණෙනි, සංසකාරයෝ මෙසේ අනිත්‍යහ ... මිදෙන්නට නිසි මැ යි.

මහණෙනි, පෙර වූවක් කියමි: මේ වෙපුල්ල පර්වතයට **සුඵස්ස** යන නාමය ම විය. මහණෙනි, එකල්හි මිනිසුන්ට **සුප්පිය** යන නාමය විය. මහණෙනි, සුප්පිය මිනිසුන්ගේ ආයුඃප්‍රමාණය විසිවස්දහසෙක් විය. මහණෙනි, සුප්පිය මිනිස්සු සුඵස්ස පර්වතයට දෙදිනකින් නගිත්, දෙදිනකින් බසිත්.

මහණෙනි, එසමයෙහි අතීත් සම්‍යක්සම්බුද්ධ වූ **කාශ්‍යප** භාග්‍යවතුන් වහන්සේ ලෝකයෙහි පහළ වූ සේක. මහණෙනි, අතීත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට අග්‍රභද්‍ර යුගයෙක් වූ **තිස්ස**, **භාරද්වාජ** නම් ශ්‍රාවක යුගයෙක් විය. මහණෙනි, බලවූ: මේ පර්වතයාගේ ඒ නමත් අතුරුදන් විය. ඒ මිනිස්සුත් කලුරිය කළහ. ඒ භාග්‍යවතුන් වහන්සේත් පිරිණිවියහ. මහණෙනි, සංසකාරයෝ මෙසේ අනිත්‍යහ ... මිදෙන්නට නිසි මැ යි.

එතරහි ඛො පන භික්ඛවෙ, ඉමස්ස වෙපුල්ලස්ස පබ්බතස්ස වෙපුල්ලො ත්වෙව සමඤ්ඤා උදපාදි. එතරහි ඛො පන භික්ඛවෙ, ඉමෙසං මනුස්සානං මාගධකා ත්වෙව සමඤ්ඤා උදපාදි. මාගධකානං භික්ඛවෙ, මනුස්සානං අප්පකං ආයුප්පමාණං පරිත්තං ලහුකං.[1] යො චිරං ජීවති, සො වස්සසතං, අප්පං වා භිය්‍යො. මාගධකා භික්ඛවෙ, මනුස්සා වෙපුල්ලං පබ්බතං මුහුත්තෙන ආරොහන්ති, මුහුත්තෙන ඔරොහන්ති.

එතරහි ඛො පනාහං භික්ඛවෙ, අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො. මය්හං ඛො පන භික්ඛවෙ, සාරිපුත්තමොග්ගල්ලානං නාම සාවකයුගං අග්ගං භද්දයුගං. භවිස්සති භික්ඛවෙ, සො සමයො, යං අයඤ්චිමස්ස පබ්බතස්ස සමඤ්ඤා අන්තරධායිස්සති. ඉමෙ ච මනුස්සා කාලං කරිස්සන්ති. අහඤ්ච පරිනිබ්බායිස්සාමි. එවං අනිච්චා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අද්ධුවා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අනස්සාසිකා භික්ඛවෙ සඞ්ඛාරා. යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුන්ති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

පාචිනවංසො තිවරානං රොහිතස්සාන වඞ්කකො,
සුප්පියානං සුපස්සොති මාගධානඤ්ච වෙපුල්ලො.

අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛොති,

දුග්ගතවග්ගො දුතියො.

තස්සුද්දානං:

දුග්ගතං සුඛිතඤ්චෙව තිංස මාතාපිතෙන ච
භාතා භගිනී පුත්තො ච ධීතා වෙපුල්ලපබ්බතං.[2]

අනමතග්ගසංයුත්තං සමත්තං.

1. ලහුසං - සීමු, සී 1, 2. 2 වෙපුල්ලපබ්බතන්ති - සීමු.

මහණෙනි, දැන් මේ වෙපුල්ලපර්වතයට **වෙපුල්ල** යන නාමය ම වෙයි. මහණෙනි, දැන් මේ මිනිසුන්ට **මාගධක** යන නාමය ම වෙයි. මහණෙනි, මාගධක මිනිසුන්ගේ ආයුඃප්‍රමාණය ඉතා ස්වල්ප ය, මඳ ය, ඉතා සුළුය යමෙක් බොහෝ කලක් ජීවත් වේ නම් හෙතෙමේ සියවසක් හෝ, ඉන් මදක් (දස-විසිවසක්) වැඩියෙන් හෝ ජීවත් වෙයි. මහණෙනි, මගධරට වැසි මිනිස්සු වෙපුල්ල පර්වතයට මොහොතකින් නගිත්. මොහොතකින් බසිත්.

මහණෙනි, දැන් වූ කලි අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ මම ලොකයෙහි උපන්මි. මහණෙනි, මට අගසොඳුරු යුවල වූ **සැරියුත්, මුගලන් නම්** සවු යුවල වේ. මහණෙනි, මේ පර්වතයාගේ යම් මේ නාමයක් වේ ද, එය අතුරුදන් වන්නේ නම් ඒ කාලය වන්නේ ය. මේ මිනිස්සුත් කලුරිය කරන්නාහු ය. මමත් පිරිනිවෙන්නෙමි. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍ය. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනාශ්වාසිකයහ. මහණෙනි, මෙසිතුදු සියලු සංස්කාරයන්හි කලකිරෙන්නට නිසි ම ය. නො ඇලෙන්නට නිසි ම ය. මිදෙන්නට නිසි මැ යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා වැලි අන් අයුරිනුදු මෙය වදාළ සේක:

තිවරයන්ට පාචීනවංස විය. රොහිතස්සයන්ට වඞ්කක විය. සුප්පියයන්ට සුඵස්ස විය. මාගධයන්ට වෙපුල්ල විය.

සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍යහ. ඉපැද නැතිවන ස්වභාව ඇතියහ. ඉපැද නිරුද්ධ වෙති. ඔවුන්ගේ සංසිඳීම සුව යි.

**දුග්ගතවර්ගය දෙවෙනි යි.**

**එහි උද්දානය:**

දුග්ගත, සුඛිත, තිංස (මත්ත), මාතු, පිතු, භාතු, භගිනී, පුත්ත, ධීතු, වෙපුල්ල පබ්බත ය යි සූත්‍ර දශයෙකි යි.

**අනමතග්ගසංයුත්තය නිමියේ ය.**

# 4. කස්සපසංයුත්තං

## 1. කස්සපවග්ගො

### 4. 1. 1.

### සන්තුට්ඨසුත්තං

284. **සාවත්ථියං-**

සන්තුට්ඨොයං භික්ඛවෙ, කස්සපො ඉතරීතරෙන චීවරෙන, ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච චීවරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච චීවරං න පරිතස්සති. ලද්ධා ච චීවරං අගධිතො[1] අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති.

සන්තුට්ඨොයං භික්ඛවෙ, කස්සපො ඉතරීතරෙන පිණ්ඩපාතෙන, ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදී. න ච පිණ්ඩපාතහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච පිණ්ඩපාතං න පරිතස්සති. ලද්ධා ච පිණ්ඩපාතං අගධිතො[1] අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති.

සන්තුට්ඨොයං භික්ඛවෙ, කස්සපො ඉතරීතරෙන සෙනාසනෙන, ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච සෙනාසන හෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති අලද්ධා ච සෙනාසනං න පරිතස්සති ලද්ධා ච සෙනාසනං අගධිතො[1] අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනව දස්සාවී නිස්සරණ පඤ්ඤො පරිභුඤ්ජති

සන්තුට්ඨොයං භික්ඛවෙ, කස්සපො ඉතරීතරෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, ඉතරීතරගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරසන්තුට්ඨිය ච වණ්ණවාදී, න ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති. අලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං න පරිතස්සති. ලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අගධිතො, අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං, සන්තුට්ඨා භවිස්සාම ඉතරීතරෙන චීවරෙන, ඉතරීතරචීවරසන්තුට්ඨියා වණ්ණවාදිනො. න ච චීවරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජිස්සාම. අලද්ධා ච චීවරං න පරිතස්සිස්සාමං[2] ලද්ධා ච චීවරං අගධිතා අමුච්ඡිතා අනජ්ඣාපන්නා ආදීනවදස්සාවිනො නිස්සරණපඤ්ඤා පරිභුඤ්ජිස්සාම. (එවං සබ්බං කත්තබ්බං)* සන්තුට්ඨා භවිස්සාම ඉතරීතරෙන පිණ්ඩපාතෙන -පෙ- සන්තුට්ඨා භවිස්සාම ඉතරීතරෙන සෙනාසනෙන -පෙ- සන්තුට්ඨා භවිස්සාම ඉතරීතරෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, ඉතරීතරගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරසන්තුට්ඨියා ච වණ්ණවාදිනො. න ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජිස්සාම. අලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං න පරිතස්සිස්සාම. ලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අගධිතා අමුච්ඡිතා අනජ්ඣාපන්නා ආදීනවදස්සාවිනො නිස්සරණපඤ්ඤා පරිභුඤ්ජිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

කස්සපෙන වා හි වො, භික්ඛවෙ, ඔවදිස්සාමි, යො වා පනස්ස[3] කස්සපසදිසො ඔවදිතෙහි ච පන වො තථත්තාය පටිපජ්ජිතබ්බන්ති.

---

1. අගථිතො - සීමු, සී1, 2. 2 න ච පරිතස්සිස්සාම - මජසං)
* දීඝත්තෙන අනන්තරිතපාඨො සබ්බත්ථ. තථාපි න යුජ්ජති විය ඛායති 3. යො වා පන - සීමු.

# 4. කස්සපසංයුත්තය

## 1. කස්සපවග්ගය

### 4. 1 1

### සන්තුට්ඨ සූත්‍රය

284 **සැවැත්නුවර-**

**මහණෙනි, මේ කාශ්‍යප තෙමේ ඉතරීතර චීවරයෙන් (රූක්‍ෂප්‍රණීතාදීන් ලද පරිදි යම් කිසි සිවුරකින්) සන්තුෂ්ට - සතුටු වූයේ වෙයි** ඉතරීතරචීවර සන්තොසයෙහි ගුණ කියනසුලු වූයේ, සිවුරු හේතුවෙන් අයුතු සෙවුමට නුසුදුසු පිළිවෙතට නො ද පැමිණෙයි. සිවුරු නො ලැබ නො ද තැවෙයි. සිවුරු ලැබ ද ගිජු නො වූයේ, මූසපත් නො වූයේ, තෘෂ්ණායෙන් නො වළඳනා ලදුයේ දෙස් දක්නාසුලු වූයේ, ප්‍රත්‍යවෙක්‍ෂාඥාන ඇතියේ පරිභෝග කෙරෙයි.

මහණෙනි, මේ කාශ්‍යප තෙමේ ඉතරීතර පිණ්ඩපාතයෙන් සතුටු වූයේ ඉතරීතර පිණ්ඩපාත සංතුෂ්ටියෙහි ගුණ කියනසුලු වූයේ, පිණ්ඩපාත හේතුවෙන් අනුලොම් නොවූ අයුරු සෙවුමට නො ද පැමිණෙයි. පිණ්ඩපාතය නො ලැබ ද නො තැවෙයි. පිණ්ඩපාතය ලැබ ද ගිජු නුවූයේ, මූසපත් නුවූයේ, තෘෂ්ණාවෙන් යටපත් නො වූයේ එහි දෙස් දක්න සුලු වූයේ ප්‍රත්‍යවෙක්‍ෂාඥාන ඇතියේ පරිභෝග කෙරෙයි.

මහණෙනි, මේ කාශ්‍යප තෙමේ යම් කිසි සෙනසුනකින් සතුටු වූයේ, යම්කිසි සෙනසුනකින් සතුටු වීමෙහි ගුණ කියනසුලු වූයේ, සෙනසුන් හේතුවෙන් නුසුදුසු සෙවුමට නො ද පැමිණෙයි. සෙනසුන නො ලැබ ද නො තැවෙයි. සෙනසුන ලැබ ද ගිජු නො වූයේ, මූසපත් නො වූයේ, තෘෂ්ණාවෙන් නො මැඩුනේ එහි දෙස් දක්නාසුලු වූයේ, පස්විකුම් නුවණ ඇතියේ පරිභෝග කෙරෙයි

මහණෙනි, මේ කාශ්‍යප තෙමේ ලද යම් කිසි ගිලන්පස බෙහෙසත් පිරිකරකින් සතුටු වූයේ, යම් කිසි ගිලන්පස බෙහෙසත් පිරිකරකින් සතුටු වීමෙහි ගුණ කියනසුලු වූයේ, ගිලන්පස බෙහෙසත් පිරිකර හේතුවෙන් නුසුදුසු අයුක්තාන්වෙෂණයට නො ද පැමිණෙයි. ගිලන්පස බෙහෙසත් පිරිකර නො ලැබ ද නො තැවෙයි. ගිලන්පස බෙහෙසත් පිරිකර ලැබ ද ගිජු නො වූයේ, මූසපත් නොවූයේ තෘෂ්ණායෙන් නො වෙළුනේ, එහි දෙස් දක්නාසුලු වූයේ, නිඃසරණප්‍රඥා ඇතියේ පරිභොග කෙරෙයි

එහෙයින් මහණෙනි, මෙහි මෙසේ හික්මිය යුතු. ඉතරෙතර චීවරයෙන් සතුටු වන්නමෝ ඉතරෙතර චීවරසංතුෂ්ටියෙහි ගුණ කියන්නමෝ වන්නෙමු. සිවුරු හේතු කොට අප්‍රතිරූප අයුක්තාන්වෙෂණයට නො ද පැමිණෙන්නෙමු. සිවුරු නො ලැබ ද නො තැවෙන්නෙමු. සිවුරු ලැබ ද ගිජු නො වන්නමෝ, මූසපත් නො වූවමෝ, තෘෂ්ණායෙන් නොමැඩුනමෝ, දෙස් දක්නාසුලු වූවමෝ, නිඃසරණප්‍රඥා ඇත්තමෝ පරිභෝග කරන්නෙමු. යම් කිසි පිණ්ඩපාතයකින් සතුටු වන්නෙමු ... යම් කිසි සෙනසුනකින් සතුටු වූවමෝ වන්නෙමු ... යම් කිසි ගිලන්පස බෙහෙසත් පිරිකරකින් සතුටු වූවමෝ, යම් කිසි ගිලන්පස බෙහෙසත් පිරිකරකින් සතුටු වීමෙහි ගුණ කියනසුල්ලමෝ වන්නෙමු. ගිලන්පස බෙහෙසත් පිරිකර හේතු කොට නුසුදුසු අයුතු අන්වෙෂණයට නො ද පැමිණෙන්නෙමු. ගිලන්පස බෙහෙසත් පිරිකර ලැබ ද ගිජු නො වූවමෝ, මූසපත් නො වූවමෝ තෘෂ්ණාවෙන් නො වැළඳුනමෝ, දෙස් දක්නාසුලු වූවමෝ, නිඃසරණප්‍රඥා ඇත්තමෝ පරිභෝග කරන්නෙමු යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

මහණෙනි, කාශ්‍යප හා සම වන්නට තොද යමෙක් කාශ්‍යප හා සම වන්නේ නම් (එබන්දකු වන්නට) හෝ තොපට අවවාද කරමි අවවාද කරණ ලද තොප විසිනුදු ඒ පිණිස පිළිපැදිය යුතු යි.

## 4. 1. 2.

## අනොත්තාපීසුත්තං

285. එවං මෙ සුතං, එකං සමයං ආයස්මා ච මහාකස්සපො ආයස්මා ච සාරිපුත්තො බාරාණසියං විහරන්ති ඉසිපතනෙ මිගදායෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාකස්සපො තෙනුපසංකමි. උපසඞ්කමිත්වා ආයස්මතා මහාකස්සපෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකස්සපං එතදවොච:

"වුච්චති හිදං ආවුසො කස්සප, අනාතාපී අනොත්තාපී;[1] අභබ්බො සම්බොධාය, අභබ්බො නිබ්බානාය, අභබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය, ආතාපී ච ඔත්තාපී ච භබ්බො සම්බොධාය, භබ්බො නිබ්බානාය, භබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමායා"ති.

"කිත්තාවතා නු ඛො ආවුසො, අනාතාපී හොති අනොත්තාපී[1] අභබ්බො සම්බොධාය, අභබ්බො නිබ්බානාය, අභබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය? කිත්තාවතා ච පනාවුසො, ආතාපී හොති ඔත්තාපී භබ්බො සම්බොධාය, භබ්බො නිබ්බානාය, භබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමායා"ති?

ඉධාවුසො, භික්ඛු අනුප්පන්නා මෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති න ආතප්පං කරොති. උප්පන්නා මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීයමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති න ආතප්පං කරොති. අනුප්පන්නා මෙ කුසලා ධම්මා නුප්පජ්ජමානා[2] අනත්ථාය සංවත්තෙය්‍යුන්ති න ආතප්පං කරොති. උප්පන්නා මෙ කුසලා ධම්මා නිරුජ්ඣමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති න ආතප්පං කරොති. එවං ඛො ආවුසො, අනාතාපී හොති.

කථඤ්චාවුසො, අනොත්තාපී[1] හොති?

ඉධාවුසො, භික්ඛු අනුප්පන්නා මෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති න ඔත්තප්පති.[3] උප්පන්නා මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීයමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති න ඔත්තප්පති.[3] අනුප්පන්නා මෙ කුසලා ධම්මා නුප්පජ්ජමානා[2] අනත්ථාය සංවත්තෙය්‍යුන්ති න ඔත්තප්පති[3] උප්පන්නා මෙ කුසලා ධම්මා නිරුජ්ඣමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති න ඔත්තප්පති[3] එවං ඛො ආවුසො අනොත්තාපී[1] හොති.

එවං ඛො ආවුසො, අනාතාපී අනොත්තාපී[1] අභබ්බො සම්බොධාය, අභබ්බො නිබ්බානාය, අභබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය.

---

1. අනොත්තප්පී-මජසං 2. අනුප්පජ්ජමානා-සයා, සී 2. 3. ඔත්තප්පති-මජසං. PTS.

## 4 1 2

## අනොත්තාපී සූත්‍රය

285. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක ආයුෂ්මත් මහසුප් තෙරණුවෝ ද ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, බරණැස් නුවර සමීපයෙහි මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස්කලැ පලසමවතින් නැගී සිටි සේක් ආයුසමත් මහසුප් තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් මහසුප් සමග සතුටු වියෙ. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක වැඩ හුන්හ. එකත්පසෙක වැඩහුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහසුප් තෙරණුවන්ට මෙය කීහ:

"ඇවැත්නි, කාශ්‍යපයෙනි, කෙලෙස් තවන වැර නැත්තේ පවට බිය නැත්තේ සම්බෝධිය පිණිස නො නිසි ය. නිවන පිණිස නො නිසි ය. අනුත්තර වූ අභීත්‍යාව්‍ය පිණිස නො නිසි ය. කෙලෙස් තවන වීය්‍යීය ඇත්තේ ම පවට බිය ඇත්තේ ම සම්බොධිය පිණිස නිසි ය. නිවන පිණිස නිසි ය. අනුත්තර අභීත්‍යාව්‍ය ලැබීම පිණිස නිසි ය"යි මෙය කියනු ලැබෙයි.

"ඇවැත්නි, කොපමණෙකින් කෙලෙස් තවන වැර නැත්තේ පවට බිය නැත්තේ සම්බොධිය පිණිස නො නිසි වේ ද, නිවන පිණිස නො නිසි වේද, අනුත්තර අභීත්‍යාව්‍ය ලැබීම පිණිස නො නිසි වේ ද? ඇවැත්නි,කොපමණකින් කෙලෙස් තවන වැර ඇත්තේ පවට බිය ඇත්තේ සම්බොධිය පිණිස නිසි වේ ද, නිවන පිණිස නිසි වේ ද, අනුත්තර අභීත්‍යාව්‍ය ලැබීම පිණිස නිසි වේ දැ" යි?

ඇවැත්නි, මෙහි මහණ තෙමේ නූපන් ලාමක අකුශලධර්මයෝ උපදනාහු මට අනර්ථය පිණිස පවතින්නාහ යි වීය්‍යීය නො කෙරේ ද, උපන් ලාමක අකුශල ධර්මයෝ ප්‍රහීණ නො වන්නාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි වීය්‍යීය නො කෙරේ ද, නූපන් කුශල ධර්මයෝ නූපදනාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි වීය්‍යීය නො කෙරේ ද, උපන් කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි වීය්‍යීය නො කෙරේ ද, ඇවැත්නි, මෙසේ කෙලෙස් තවන වීය්‍යීය නැත්තේ වේ.

ඇවැත්නි, කෙසේ නම් පවට බිය නැත්තේ වේ ද?

ඇවැත්නි, මෙහි මහණ තෙමේ නූපන් ලාමක අකුශලධර්මයෝ උපදනාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි බියපත් නො වේ ද, උපන් ලාමක අකුශලධර්මයෝ ප්‍රහීණ නො වන්නාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි බියපත් නො වේ ද, නූපන් කුශලධර්මයෝ නූපදනාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි බියපත් නො වේ ද, උපන් කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි බියපත් නො වේ ද, ඇවැත්නි, මෙසේ පවට බිය නැත්තේ වේ

ඇවැත්නි, මෙසේ කෙලෙස් තවන වැර නැත්තේ, පවට බිය නැත්තේ, සම්බොධිය පිණිස නොනිසි වේ, නිවන පිණිස නො නිසි වේ. අනුත්තර අභීත්‍යාව්‍ය ලැබීම පිණිස නො නිසි වේ.

කථඤ්චාවුසො, ආතාපි හොති?

ඉධාවුසො භික්ඛු අනුප්පන්නා මෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති ආතප්පං කරොති. උප්පන්නා මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීයමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති ආතප්පං කරොති අනුප්පන්නා මෙ කුසලා ධම්මා නුප්පජ්ජමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති ආතප්පං කරොති. උප්පන්නා මෙ කුසලා ධම්මා නිරුජ්ඣමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති ආතප්පං කරොති. එවං ඛො ආවුසො, ආතාපි හොති.

කථඤ්චාවුසො, ඔත්තාපී[1] හොති?

ඉධාවුසො, භික්ඛු අනුප්පන්නා මෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති ඔත්තප්පති උප්පන්නා මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීයමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති ඔත්තප්පති. අනුප්පන්නා මෙ කුසලා ධම්මා නුප්පජ්ජමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති ඔත්තප්පති. උප්පන්නා මෙ කුසලා ධම්මා නිරුජ්ඣමානා අනත්ථාය සංවත්තෙය්‍යුන්ති ඔත්තප්පති. එවං ඛො ආවුසො, ඔත්තාපී[1] හොති

එවං ඛො ආවුසො, ආතාපි ඔත්තාපී[1] භබ්බො සම්බොධාය, භබ්බො නිබ්බානාය, භබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමායාති

4. 1. 3.

## චන්දූපමසුත්තං

286. සාවත්ථියං -

චන්දූපමා භික්ඛවෙ, කුලානි උපසඞ්කමථ අපකස්සෙව කායං, අපකස්ස[2] චිත්තං, නිච්චනවකා කුලෙසු[3] අප්පගබ්භා සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො ජරුදපානං වා ඔලොකෙය්‍ය පබ්බතවිසමං වා නදීවිදුග්ගං වා අපකස්සෙව කායං, අපකස්ස චිත්තං, එවමෙව ඛො භික්ඛවෙ, චන්දූපමා කුලානි උපසඞ්කමථ අපකස්සෙව කායං අපකස්ස[2] චිත්තං, නිච්චනවකා කුලෙසු අප්පගබ්භා. කස්සපො භික්ඛවෙ, චන්දූපමො කුලානි උපසඞ්කමති අපකස්සෙව කායං අපකස්ස[2] චිත්තං, නිච්චනවකො කුලෙසු අප්පගබ්භො

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, කථංරූපො භික්ඛු අරහති කුලානි උපසඞ්කමිතුන්ති?

"භගවම්මූලකා නො භන්තෙ ධම්මා, භගවන්නෙත්තිකා, භගවම්පටිසරණා. සාධු වත භන්තෙ, භගවන්තඤ්ඤෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛු ධාරෙස්සන්තී"ති.

1 ඔත්තප්පී - මජසං, 2. අපකස්සෙව - සීමු, 3. නිච්චං නවකා කුලෙසු - සී 2.

ඇවැත්නි, කෙසේ කෙලෙස් තවන වැර ඇත්තේ වේ ද?

ඇවැත්නි මෙහි මහණ තෙමේ නූපන් ලාමක අකුශලධර්මයෝ උපදනාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි වීර්‍යය කෙරේ ද, උපන් ලාමක අකුශල-ධර්මයෝ ප්‍රහීණ නො වන්නාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි වීර්‍යය කෙරේ ද, නූපන් කුශලධර්මයෝ නූපදනාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි වීර්‍යය කෙරේ ද, උපන් කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි වීර්‍යය කෙරේ ද; ඇවැත්නි, මෙසේ කෙලෙස් තවන වැර ඇත්තේ වේ.

ඇවැත්නි, කෙසේ පවට බිය ඇත්තේ වේ ද?

ඇවැත්නි, මෙහි මහණ තෙමේ නූපන් ලාමක අකුශලධර්මයෝ උපදනාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි බයි ද, උපන් ලාමක අකුශලධර්මයෝ ප්‍රහීණ නො වන්නාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි බයි ද, නූපන් කුශල ධර්මයෝ නූපදනාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි බයි ද, උපන් කුශලධර්මයෝ නිරුද්ධවන්නාහු මට අනර්ථය පිණිස පවත්නාහ යි බයි ද, ඇවැත්නි, මෙසේ පවට බිය ඇත්තේ වෙයි.

ඇවැත්නි, මෙසේ කෙලෙස් තවන වැර ඇත්තේ පවට බිය ඇත්තේ සම්බෝධිය පිණිස නිසි වේ. නිවන පිණිස නිසි වේ. අනුත්තර අර්හත්වය ලැබීම පිණිස නිසි වේ යි.

## 4 1 3

## චන්දූපම සූත්‍රය

286. සැවැත්නුවර-

මහණෙනි, (කිසිවකු කෙරෙහි නො ඇලෙමින් අඳුර නසන) චන්ද්‍රයා වැනිව සඞ්චාදියෙන්) කය ඉවත් කොට ම සිත ඉවත් කොට ම නිති (ආගන්තුකයකු මෙන්) අලුත් ව කුලයන්හි ප්‍රගල්භ (ගැටීම්) රහිතව කුලයන් වෙත එළඹෙවු. මහණෙනි, යම් සේ පුරුෂයෙක් ගරුවැටුනු ළිඳක් හෝ කඳුබෑවුමක් හෝ ගංඉවුරු බුන් තැනක් හෝ කය ඉවත් කොට ම සිත ඉවත් කොට ම බලන්නේ ද, මහණෙනි එසෙයින් ම චන්ද්‍රයා වැනි ව කය ඉවත් කොට ම සිත ඉවත් කොට ම නිතර අලුත් ව, කුලයන්හි නො ගැටී කුලයන් වෙත එළඹෙවු. මහණෙනි, කසුප් තෙමේ සඳ වැනි ව කය ඉවත් කොට ම සිත ඉවත් කොට ම නිතර අලුත් ව කුලයන්හි නො ගැටී කුලයන් වෙත එළඹෙයි.

මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, කෙබඳු මහණෙක් කුලයන් වෙත එළඹෙන්නට නිසි දැ යි? "වහන්ස, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නේතෘ කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිට කොට ඇත්තාහ. වහන්ස, මේ භාෂිතයෙහි අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා, මැනවි. (ඒ අර්ථය) භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහ" යි.

අථ ඛො භගවා ආකාසෙ පාණිං චාලෙසි සෙය්‍යථාපි භික්ඛවෙ, අයං ආකාසෙ පාණි න සජ්ජති, න ගය්හති, න බජ්ඣති, එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුනො කුලානි උපසඞ්කමතො කුලෙසු චිත්තං න සජ්ජති, න ගය්හති න බජ්ඣති "ලභන්තු ලාභකාමා, පුඤ්ඤකාමා කරොන්තු පන පුඤ්ඤානී"ති. යථා සකෙන ලාභෙන අත්තමනො හොති සුමනො, එවං පරෙසං ලාභෙන අත්තමනො හොති සුමනො. එවරූපො ඛො භික්ඛවෙ, භික්ඛු අරහති කුලානි උපසඞ්කමිතුං. කස්සපස්ස භික්ඛවෙ කුලානි උපසඞ්කමතො කුලෙසු චිත්තං න සජ්ජති, න ගය්හති, න බජ්ඣති "ලභන්තු ලාභකාමා, පුඤ්ඤකාමා කරොන්තු පන පුඤ්ඤානී"ති. යථා සකෙන ලාභෙන අත්තමනො හොති සුමනො, එවං පරෙසං ලාභෙන අත්තමනො හොති සුමනො. එවරූපො ඛො භික්ඛවෙ, භික්ඛු අරහති කුලානි උපසඞ්කමිතුං.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කථංරූපස්ස භික්ඛුනො අපරිසුද්ධා ධම්මදෙසනා හොති, කථංරූපස්ස භික්ඛුනො පරිසුද්ධා ධම්මදෙසනා හොතීති? "භගවම්මූලකා නො භන්තෙ ධම්මා, භගවංනෙත්තිකා භගවම්පටිසරණා. සාධු වත භන්තෙ, භගවන්තඤ්ඤෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී"ති.

තෙන හි භික්ඛවෙ සුණාථ, සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

යො හි කොචි භික්ඛවෙ, භික්ඛු එවංචිත්තො පරෙසං ධම්මං දෙසෙති: "අහො වත මෙ ධම්මං සුණෙය්‍යුං, සුත්වා ච පන ධම්මං පසීදෙය්‍යුං, පසන්නා ච පන මෙ පසන්නාකාරං කරෙය්‍යු"න්ති. එවරූපස්ස ඛො භික්ඛවෙ, භික්ඛුනො අපරිසුද්ධා ධම්මදෙසනා හොති.

යො ච ඛො භික්ඛවෙ, භික්ඛු එවංචිත්තො පරෙසං ධම්මං දෙසෙති: "ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. අහො වත මෙ ධම්මං සුණෙය්‍යුං, සුත්වා ච පන ධම්මං ආජානෙය්‍යුං, ආජානිත්වා ච පන තථත්තාය පටිපජ්ජෙය්‍යු"න්ති. ඉති ධම්මසුධම්මතං පටිච්ච පරෙසං ධම්මං දෙසෙති. කාරුඤ්ඤං පටිච්ච පරෙසං ධම්මං දෙසෙති අනුද්දයං පටිච්ච පරෙසං ධම්මං දෙසෙති අනුකම්පං උපාදාය පරෙසං ධම්මං දෙසෙති. එවරූපස්ස ඛො භික්ඛවෙ, භික්ඛුනො පරිසුද්ධා ධම්මදෙසනා හොති.

කස්සපො භික්ඛවෙ, එවංචිත්තො පරෙසං ධම්මං දෙසෙති: "ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. අහොවත මෙ ධම්මං සුණෙය්‍යුං, සුත්වා ච පන ධම්මං ආජානෙය්‍යුං, ආජානිත්වා ච පන තථත්තාය පටිපජ්ජෙය්‍යු"න්ති. ඉති ධම්මසුධම්මතං පටිච්ච පරෙසං ධම්මං දෙසෙති. කාරුඤ්ඤං පටිච්ච පරෙසං ධම්මං දෙසෙති. අනුද්දයං පටිච්ච පරෙසං ධම්මං දෙසෙති. අනුකම්පං උපාදාය පරෙසං ධම්මං දෙසෙති.[1]

කස්සපෙන වා හි වො භික්ඛවෙ, ඔවදිස්සාමි, යො වා පනස්ස කස්සපසදිසො. ඔවදිතෙහි ච පන වො තථත්තාය පටිපජ්ජිතබ්බන්ති.

---

1. කාරුඤ්ඤං පටිච්ච අනුද්දයං පටිච්ච අනුකම්පං උපාදාය පරෙසං ධම්මං දෙසෙති - මජසං.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අහසෙහි අත සැලූහ. මහණෙනි, යම් සේ මේ අත අහසෙහි නො ඇලේ ද, නො ගැණේ ද, නො බැඳේ ද, මහණෙනි, එසෙයින් ම කුලයන් වෙත එළඹෙන යම් කිසි මහණකුගේ සිත “ලබනු කැමැත්තෝ ලබත්වා. පින් කැමැත්තෝ පින් කෙරෙත්වා”යි කුලයන්හි නො ඇලේ ද, නො ගැණේ ද, නො බැඳේ ද, තමහට ලැබීමෙන් යම් සේ සතුටු සිත් ඇත්තේ මනා සිත් ඇත්තේ වේ නම් එසේ ම මෙරමාහට ලැබීමෙනුත් සතුටු සිත් ඇත්තේ මනා සිත් ඇත්තේ වේ ද, මහණෙනි, මෙබඳු මහණ තෙමේ කුලයන් වෙත එළඹෙන්නට නිසි ය. මහණෙනි, කුලයන් වෙත එළඹෙන කසුප්හුගේ සිත “ලබනු කැමැත්තෝ ලබත්වා, පින් කැමැත්තෝ පින් කෙරෙත්වා”යි කුලයන්හි නො ඇලෙයි. නො ගැණෙයි. නො බැඳෙයි. තමහට ලැබීමෙන් යම් සේ සතුටු සිත් ඇත්තේ මනා සිත් ඇත්තේ වේ නම් මෙරමාහට ලැබීමෙනුත් සතුටු සිත් ඇත්තේ මනා සිත් ඇත්තේ වෙයි. මහණෙනි, මෙබඳු මහණ තෙමේ කුලයන් වෙත එළඹෙන්නට නිසි ය.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද, කෙබඳු මහණහුගේ දම්දෙසුම අපිරිසිදු ද, කෙබඳු මහණහුගේ දම්දෙසුම පිරිසිදු ද යි? “වහන්ස, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නේතෘ කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. වහන්ස, මේ දේශනාවෙහි අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා, මැනවි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහ”යි.

මහණෙනි, එසේ නම් අසවු, මැනවින් මෙනෙහි කරවු, කියන්නෙමි යි. වහන්ස, එසේ ය යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, යම් කිසි මහණෙක් “මගේ දහම් අසන්නාහු නම්, අසාත් පහන් වන්නාහු නම්, පහන් වූවාහුත් මට පහන් අයුරු (ප්‍රකාශ) කරන්නාහු නම් ඉතා මැනැවැ”යි මෙබඳු සිත් ඇත්තේ මෙරමාහට දහම් දෙසා ද, මහණෙනි, මෙබඳු මහණහුගේ දම් දෙසුම අපිරිසිදු වෙයි.

මහණෙනි, යම් කිසි මහණෙක් මෙබඳු සිත් ඇත්තේ මෙරමාහට දහම් දෙසා ද- “භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාක්ඛ්‍යාත ය, සාන්දෘෂ්ටික ය, අකාලික ය, ඒහිපස්සික ය, ඕපනයික ය, විඥයන් විසින් තමන් තමන් විසින් ම දත යුතු යි. මාගේ ධර්මය අසන්නාහු නම්, අසාත් ධර්මය අවබෝධ කරන්නාහු නම්, අවබෝධ කොටත් ඒ පිණිස පිළිපදනාහු නම් ඉතා මැනැවැ”යි මෙසේ ධර්මසුධර්මත්වය නිසා මෙරමාහට දහම් දෙසා ද, කරුණාව නිසා මෙරමාහට දහම් දෙසා ද, අනුද්දයාව නිසා මෙරමාහට දහම් දෙසා ද, අනුකම්පාව නිසා මෙරමාහට දහම් දෙසා ද, මහණෙනි, මෙබඳු මහණහුගේ දම්දෙසුම පිරිසිදු වේ.

මහණෙනි, කාශ්‍යප තෙමේ මෙබඳු සිත් ඇත්තේ මෙරමාහට දහම් දෙසයි: “භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාක්ඛ්‍යාත ය, සාන්දෘෂ්ටික ය, අකාලිකය, ඒහිපස්සික ය, ඕපනයික ය, විඥයන් විසින් තමතමා කෙරෙහි ලා දත යුතු යි. මාගේ ධර්මය අසන්නාහු නම්, අසාත් ධර්මය අවබෝධ කරන්නාහු නම්, අවබෝධ කොටත් ඒ පිණිසපිළිපදනාහු නම් ඉතා මැනැවැ”යි. මෙසේ ධර්මසුධර්මත්වය නිසා මෙරමාහට දහම් දෙසයි. කරුණාව නිසා මෙරමාහට දහම් දෙසයි අනුද්දයාව නිසා මෙරමාහට දහම් දෙසයි. අනුකම්පාව නිසා මෙරමාහට දහම් දෙසයි.

මහණෙනි, ඒ කාශ්‍යප හා සමාන වන්නට හෝ යමෙක් කාශ්‍යප බඳු වන්නේ නම් (එබන්දකු වන්නට හෝ ) ඒ තොපට අවවාද කරමි. අවවාද කරණ ලද්දෘ වූ ද තොප විසින් ඒ පිණිස පිළිපැදිය යුතු යි.

## 4. 1. 4.

## කුලූපගසුත්තං

287. සාවත්ථියං-

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කථංරූපො භික්ඛු අරහති කුලූපගො හොතුං, කථංරූපො භික්ඛු අරහති න කුලූපගො[1] හොතුන්ති? "භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ- භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී"ති -පෙ- භගවා එතදවොච:

යො හි කොචි භික්ඛවෙ, භික්ඛු එවංචිත්තො කුලානි උපසඞ්කමති "දෙන්තුයෙව මෙ, මා නාදංසු.[2] බහුඤ්ඤෙව[3] මෙ දෙන්තු මා ථොකං. පණීතඤ්ඤෙව මෙ දෙන්තු මා ලූඛං. සීඝඤ්ඤෙව මෙ දෙන්තු මා දන්ධං. සක්කච්චඤ්ඤෙව මෙ දෙන්තු මා අසක්කච්ච"න්ති. තස්ස චෙ භික්ඛවෙ, භික්ඛුනො එවංචිත්තස්ස කුලානි උපසඞ්කමතො න දෙන්ති, තෙන භික්ඛු සන්දීයති. සො තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. ථොකං දෙන්ති නො බහුකං, තෙන භික්ඛු සන්දීයති. සො තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. ලූඛං දෙන්ති නො පණීතං, තෙන භික්ඛු සන්දීයති. සො තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. දන්ධං දෙන්ති නො සීඝං, තෙන භික්ඛු සන්දීයති. සො තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. අසක්කච්චං දෙන්ති නො සක්කච්චං. තෙන භික්ඛු සන්දීයති. සො තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. එවරූපො ඛො භික්ඛවෙ භික්ඛු න අරහති කුලූපගො හොතුං.

යො ච ඛො භික්ඛවෙ, භික්ඛු එවංචිත්තො කුලානි උපසඞ්කමති "තං කුතෙත්ථ ලබ්භා පරකුලෙසු-දෙන්තුයෙව මෙ, මා නාදංසු. බහුඤ්ඤෙව මෙ දෙන්තු මා ථොකං. පණීතඤ්ඤෙව මෙ දෙන්තු මා ලූඛං. සීඝඤ්ඤෙව මෙ දෙන්තු මා දන්ධං. සක්කච්චඤ්ඤෙව මෙ දෙන්තු මා අසක්කච්ච"න්ති. තස්ස චෙ භික්ඛවෙ, භික්ඛුනො එවංචිත්තස්ස කුලානි උපසඞ්කමතො න දෙන්ති, තෙන භික්ඛු න සන්දීයති සො න තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. ථොකං දෙන්ති නො බහුකං, තෙන භික්ඛු න සන්දීයති. සො න තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. ලූඛං දෙන්ති නො පණීතං, තෙන භික්ඛු න සන්දීයති. සො න තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. දන්ධං දෙන්ති නො සීඝං, තෙන භික්ඛු න සන්දීයති. සො න තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. අසක්කච්චං දෙන්ති නො සක්කච්චං, තෙන භික්ඛු න සන්දීයති. සො න තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. එවරූපො ඛො භික්ඛවෙ භික්ඛු අරහති කුලූපගො හොතුං.

කස්සපො භික්ඛවෙ, එවංචිත්තො කුලානි උපසඞ්කමති: "තං කුතෙත්ථ ලබ්භා පරකුලෙසු – දෙන්තුයෙව මෙ, මා නාදංසු, බහුඤ්ඤෙව මෙ දෙන්තු මා ථොකං, පණීතඤ්ඤෙව මෙ දෙන්තු, මා ලූඛං, සීඝඤ්ඤෙව මෙ දෙන්තු මා දන්ධං, සක්කච්චඤ්ඤෙව මෙ දෙන්තු," මා අසක්කච්චන්ති.

---

1 කුලූපකො - මජසං, සයා  2 මා අදංසු - සීමු, සී 1, 2

3 පුබ්බඤ්ඤෙව - සී 1, 2. බහුකඤ්ඤෙව - මජසං, සයා, PTS

## 4. 1. 4

### කුලූපග සූත්‍රය

287. **සැවැත්නුවර-**

මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද, කෙබඳු මහණ තෙමේ කුලූපග වන්නට නිසි ද, කෙබඳු මහණ තෙමේ කුලූපග වන්නට නො නිසි දැ යි? වහන්ස, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ ... "භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහුය" ... භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, යම් කිසි මහණෙක් "මට එකැතින් ම දෙත්වා, නො ම නො දෙත්වා. මට බොහෝවක් ම දෙත්වා, සවල්පයක් නො දෙත්වා. මට පිණී වූවක් ම දෙත්වා, කුළු වූවක් නො දෙත්වා. මට වහා ම දෙත්වා, ලස් ව නො දෙත්වා. මට සකසා ම දෙත්වා, නො සකසා නො දෙත්වා"යි මෙබඳු සිත් ඇත්තේ කුලයන් වෙත එළඹේ ද, මහණෙනි, මෙබඳු සිත් ඇති ව කුලයන් වෙත එළඹෙන ඒ මහණහට ඉදින් නො දෙද්ද, එයින් මහණ තෙමේ පෙළෙයි. ඒ හේතු කොට ගෙණ හෙතෙමේ දුකක් දොම්නසක් විඳියි. ඉදින් ටිකක් දෙද්ද, බොහෝවක් නො දෙද්ද, එයින් මහණ තෙමේ පෙළෙයි. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් විඳියි. ඉදින් කුළු වවක් දෙද්ද, පිණී වූවක් නො දෙද්ද. එයින් මහණ තෙමේ පෙළෙයි. හෙතෙමේ ඒ හෙතු කොට ගෙණ දුකක් දොම්නසක් විඳියි. ඉදින් ලස් ව දෙද්ද, වහා නො දෙද්ද, එයින් මහණ තෙමේ පෙළෙයි. හෙතෙමේ ඒ හෙතු කොට ගෙණ දුකක් දොම්නසක් විඳියි. ඉදින් නො සකසා දෙද්ද, සකසා නො දෙද්ද, එයින් මහණ තෙමේ පෙළෙයි හෙතෙමේ ඒ හෙතු කොට ගෙණ දුකක් දොම්නසක් විඳියි. මහණෙනි, මෙබඳු මහණ තෙමේ කුලූපග වන්නට නො නිසි ය.

මහණෙනි, යම් කිසි මහණෙක් "මට එකැතින් ම දෙත්වා, නො ම නො දෙත්වා. මට බොහෝවක් ම දෙත්වා, ටිකක් නො දෙත්වා. මට පිණී වූවක් ම දෙත්වා, කුළු වූවක් නො දෙත්වා. මට වහා ම දෙත්වා, ලස් ව නො දෙත්වා. මට සකසා ම දෙත්වා, නො සකසා නො දෙත්වායි-මෙය මෙහි අනුන්ගේ කුලයන්හි කොයින් ලැබිය හැකි දැ" යි මෙබඳු සිත් ඇත්තේ කුලයන් කරා එළඹේ ද, මහණෙනි, මෙබඳු සිත් ඇති ව කුලයන් කරා එළඹෙන ඒ මහණහට ඉදින් නො දෙද්ද, එයින් මහණ තෙමේ නො පෙළෙයි හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් නො විඳියි. ඉදින් මඳක් දෙද්ද, බොහෝවක් නො දෙද්ද, එයින් මහණ තෙමේ නො පෙළෙයි. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් නො විඳියි. ඉදින් කුළු වූවක් දෙද්ද, පිණී වූවක් නො දෙද්ද, එයින් මහණ තෙමේ නො පෙළෙයි. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් නො විඳියි. ඉදින් ලස් ව දෙද්ද, වහා නො දෙද්ද, එයින් මහණ තෙමේ නො පෙළෙයි. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් නො විඳියි ඉදින් නො සකසා දෙද්ද, සකසා නො දෙද්ද, එයින් මහණ තෙමේ නො පෙළෙයි. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් නො විඳියි. මහණෙනි, මෙබඳු මහණ තෙමේ කුලූපග වන්නට නිසි ය.

මහණෙනි, කාශ්‍යප තෙමේ "මට එකැතින් ම දෙත්වා, නො ම නො දෙත්වා. මට බොහෝවක් ම දෙත්වා, මඳක් නො දෙත්වා. මට පිණී වූවක් ම දෙත්වා, කුළු වූවක් නො දෙත්වා, මට වහා ම දෙත්වා, ලස් ව නො දෙත්වා. මට සකසා ම දෙත්වා, නො සකසා නො දෙත්වා"යි-මෙය මෙහි අනුන්ගේකුලයන්හි කොයින් ලැබිය හැකි දැ" යි මෙබඳු සිත් ඇත්තේ කුලයන් වෙත එළඹෙයි.

තස්ස වෙ භික්ඛවෙ, කස්සපස්ස එවංචිත්තස්ස කුලානි උපසඞ්කමතො න දෙන්ති, තෙන කස්සපො න සන්දීයති. සො න තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. ථොකං දෙන්ති නො බහුකං, තෙන කස්සපො න සන්දීයති. සො න තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. ලූඛං දෙන්ති නො පණීතං, තෙන කස්සපො න සන්දීයති. සො න තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. දන්ධං දෙන්ති නො සීඝං, තෙන කස්සපො න සන්දීයති. සො න තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති. අසක්කච්චං දෙන්ති නො සක්කච්චං, තෙන කස්සපො න සන්දීයති. සො න තතොනිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදයති.

කස්සපෙන වා හි වො, තෙ භික්ඛවෙ, ඔවදිස්සාමි, යො වා පනස්ස කස්සපසදිසො. ඔවදිතෙහි ච පන තෙ තථත්තාය පටිපජ්ජිතබ්බන්ති.

## 4 1 5.

## ජිණ්ණසුත්තං

288. එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ.

අථ ඛො ආයස්මා මහාකස්සපො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං මහාකස්සපං භගවා එතදවොච: ජිණ්ණොසි දානි ත්වං කස්සප. ගරුකානි ඛො තෙ[1] ඉමානි සාණානි පංසුකූලානි නිබ්බසනානි. තස්මාතිහ ත්වං කස්සප, ගහපතිකානි චෙව චීවරානි ධාරෙහි, නිමන්තනානෙසු[2] ච භුඤ්ජාහි, මමඤ්ච සන්තිකෙ විහරාහීති.

අහං ඛො භන්තෙ, දීඝරත්තං ආරඤ්ඤකො චෙව ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදී, පිණ්ඩපාතිකො චෙව පිණ්ඩපාතිකත්තස්ස ච වණ්ණවාදී, පංසුකූලිකො චෙව පංසුකූලිකත්තස්ස ච වණ්ණවාදී, තෙචීවරිකො චෙව තෙචීවරිකත්තස්ස ච වණ්ණවාදී, අප්පිච්ඡො චෙව අප්පිච්ඡතාය ච වණ්ණවාදී, සන්තුට්ඨො චෙව සන්තුට්ඨියා ච වණ්ණවාදී, පවිවිත්තො චෙව පවිවෙකස්ස ච වණ්ණවාදී, අසංසට්ඨො චෙව අසංසග්ගස්ස ච වණ්ණවාදී, ආරද්ධවිරියො චෙව විරියාරම්භස්ස ච වණ්ණවාදී.

කිම්පන ත්වං කස්සප, අත්ථවසං සම්පස්සමානො දීඝරත්තං ආරඤ්ඤකො චෙව ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදී, (එවං පෙය්‍යාලො.) පිණ්ඩපාතිකො චෙව -පෙ- පංසුකූලිකො චෙව -පෙ- තෙචීවරිකො චෙව -පෙ- අප්පිච්ඡො චෙව -පෙ- සන්තුට්ඨො චෙව -පෙ- පවිවිත්තො චෙව -පෙ- අසංසට්ඨො චෙව -පෙ- ආරද්ධවිරියො චෙව විරියාරම්භස්ස ච වණ්ණවාදීති?

---

1. ගරුකානි ච තෙ - මජසං, සභා, PTS,
2. නිමන්තනානි - මජසං, සභා, PTS.

මහණෙනි, මේ බඳු සිත් ඇති ව කුලයන් වෙත එළඹෙන ඒ කසුප්හට ඉදින් නො දෙද්ද, එයින් කසුප් තෙමේ නො පෙළෙයි. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් නො විඳියි. ඉදින් මදක් දෙද්ද, බොහෝවක් නො දෙද්ද, එයින් කසුප් තෙමේ නො පෙළෙයි. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් නො විඳියි. ඉදින් කුළු වූවක් දෙද්ද, පිණී වූවක් නො දෙද්ද, එයින් කසුප් තෙමේ නො පෙළෙයි. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් නො විඳියි. ඉදින් ලස් ව දෙද්ද, වහා නො දෙද්ද, එයින් කසුප් තෙමේ නො පෙළෙයි. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් නො විඳියි. ඉදින් නො සකසා දෙද්ද, සකසා නො දෙද්ද, එයින් කසුප් තෙමේ නො පෙළෙයි. හෙතෙමේ ඒ හේතු කොට ගෙණ දුකක් දොම්නසක් නො විඳියි.

මහණෙනි, කාශ්‍යපයන් හා සමාන වන්නට හෝ යමෙක් කසුප් බඳු වන්නේ නම් (එබන්දකු වන්නට හෝ) ඒ තොපට අවවාද කරමි. අවවාද කරණ ලද්දා වූ තොප විසින් ද ඒ පිණිස පිළිපැදිය යුතු යි.

## 4. 1. 5.

## ජිණ්ණ සූත්‍රය

288. මා විසින් මෙසේ අසන ලදි: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්‍දක නිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩ වසන සේක.

එකල්හි ආයුෂ්මත් මහකසුප් තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂමත් මහකසුප්හට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. කාශ්‍යප, දුන් තෙපි මහලු වහු. හණපිලියෙන් කළ (භාග්‍යවතුන් විසින් පලමු පොරොවා හල බැවින්) නිබඳසන වූ (නැවත නැවත කළ ගෙත්තම් ඇති) මේ පවුල් සිවුරු (දුරීම) තොපට බර ය. කස්සප, එහෙයින් දුන් තෙපි (පාංශුකූලිකාඞ්ගාදිය හැර) ගැහැවි සිවුරු ද දරවු. ලහබත් ආදි නිමන්ත්‍රණයන්හි ද වළඳවු, මා ලඟ ද වෙසෙවු.

වහන්ස, මම දිගුකලක් ආරණ්‍යක ද, ආරණ්‍යක බැව්හි ගුණ බණනුයෙ ද, පිණ්ඩපාතික ද, පිණ්ඩපාතික බැව්හි ගුණකියනුයේ ද, පංසුකූලික ද, පංසුකූලික බැව්හි ගුණ කියනුයේ ද, තෙචීවරික ද, තෙචීවරික බැව්හි ගුණ කියනුයේ ද, අල්පෙච්ඡ ද, අල්පෙච්ඡ බැව්හි ගුණ කියනුයේ ද, සන්තුෂ්ට ද, සන්තුෂ්ට බැව්හි ගුණ කියනුයේ ද, ප්‍රවිවික්ත ද, ප්‍රවිවෙකයෙහි ගුණ කියනුයේ ද, අසංසෘෂ්ටද, අසංසර්ගයෙහි ගුණ කියනුයේ ද, ආරබ්ධවීර්‍ය්‍යද, වීර්‍ය්‍යාරම්භයෙහි ගුණ කියනුයේ ද වෙමි.

කාශ්‍යප, තෙපි කිනම් ප්‍රයෝජනයක් දක්නහු දිගුකලක් ආරණ්‍යක ද, ආරණ්‍යක බැව්හි ගුණ කියනුයේ ද? පිණ්ඩපාතික ද ... පංසුකූලික ද ... තෙචීවරිකද ... අල්පෙච්ඡ ද ... සන්තුෂ්ට ද ... ප්‍රවිවිකත ද ... අසංසෘෂ්ට ද... ආරබ්ධවීර්‍ය්‍යද වීර්‍ය්‍යාරම්භයෙහි ගුණ කියනුයේ ද යි?

“ද්වෙ ඛොහං භන්තෙ, අත්ථවසෙ සම්පස්සමානො දීඝරත්තං ආරඤ්ඤකො චෙව ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදී -පෙ- පිණ්ඩපාතිකො චෙව -පෙ- පංසුකූලිකො චෙව -පෙ- තෙචීවරිකො චෙව -පෙ- අප්පිච්ඡො චෙව -පෙ- සන්තුට්ඨො චෙව -පෙ- පවිවිත්තො චෙව -පෙ- අසංසට්ඨො චෙව -පෙ- ආරද්ධවිරියො චෙව විරියාරම්භස්ස ච වණ්ණවාදී: අත්තනො ච දිට්ඨධම්මසුඛවිහාරං සම්පස්සමානො - පච්ඡිමඤ්ච ජනතං අනුකම්පමානො ‘අප්පෙව නාම පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍ය.[1] යෙ කිර තෙ අහෙසුං බුද්ධානුබුද්ධසාවකා, තෙ දීඝරත්තං ආරඤ්ඤකා චෙව අහෙසුං ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදිනො පිණ්ඩපාතිකා චෙව අහෙසුං -පෙ- පංසුකූලිකා චෙව අහෙසුං -පෙ- තෙචීවරිකා චෙව අහෙසුං -පෙ- අප්පිච්ඡා චෙව අහෙසුං -පෙ- සන්තුට්ඨා චෙව අහෙසුං -පෙ- පවිවිත්තා චෙව අහෙසුං -පෙ- අසංසට්ඨා චෙව අහෙසුං -පෙ- ආරද්ධවිරියා චෙව අහෙසුං විරියාරම්භස්ස ච වණ්ණවාදිනොති. තෙ තථත්තාය පටිපජ්ජිස්සන්ති. තෙසං තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛාය.”

ඉමෙ ඛොහං භන්තෙ, ද්වෙ අත්ථවසෙ සම්පස්සමානො දීඝරත්තං ආරඤ්ඤකො චෙව ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදී, පිණ්ඩපාතිකො චෙව -පෙ- පංසුකූලිකො චෙව-පෙ-තෙචීවරිකො චෙව-පෙ අප්පිච්ඡො චෙව -පෙ- සන්තුට්ඨො චෙව -පෙ- පවිවිත්තො චෙව -පෙ- අසංසට්ඨො චෙව -පෙ- ආරද්ධවිරියො චෙව විරියාරම්භස්ස ච වණ්ණවාදීති.

සාධු, සාධු, කස්සප, බහුජනහිතාය කිර ත්වං කස්සප, පටිපන්නො බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. තස්මාතිහ ත්වං කස්සප, සාණානි චෙව පංසුකූලානි ධාරෙහි නිබ්බසනානි, පිණ්ඩාය ච චරාහි, අරඤ්ඤෙ ච විහරාහීති.

## 4 1 6

## ඔවාදසුත්තං

289. **රාජගහෙ-**

අථ ඛො ආයස්මා **මහාකස්සපො** යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං මහාකස්සපං භගවා එතදවොච: ඔවද කස්සප භික්ඛූ. කරොහි කස්සප භික්ඛූනං ධම්මිං කථං. අහං වා කස්සප, භික්ඛූ ඔවදෙය්‍යං ත්වං වා, අහං වා භික්ඛූනං ධම්මිං කථං කරෙය්‍යං ත්වං වාති.

දුබ්බචා ඛො භන්තෙ භගවා, එතරහි භික්ඛූ දොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතා, අක්ඛමා, අප්පදක්ඛිණග්ගාහිනො අනුසාසනිං. ඉධාහං භන්තෙ, අද්දසං **භණ්ඩඤ්ච** නාම භික්ඛුං **ආනන්දස්ස** සද්ධිවිහාරිං, **ආභිඤ්ජිකඤ්ච** නාම භික්ඛුං **අනුරුද්ධස්ස** සද්ධිවිහාරිං, අඤ්ඤමඤ්ඤං සුතෙන අච්චාවදන්තෙ “එහි භික්ඛු, කො බහුතරං භාසිස්සති, කො සුන්දරතරං භාසිස්සති, කො චිරතරං භාසිස්සතී”ති

---

1 ආපජ්ජෙය්‍යුං - මජ්ඣං'

වහන්ස, මම ප්‍රයෝජන දෙකක් දකිමින් දිගුකලක් ආරණ්‍යක ද ආරණ්‍යක බැව්හි ගුණ කියනුයේ ද වෙමි පිණ්ඩපාතික ද... පාංශුකූලික ද තෙචීවරිකද ... අල්පෙච්ඡ ද ... සන්තුෂ්ටද ... ප්‍රවිවිත්තද ... අසංසෘෂ්ට ද ... ආරබ්ධවීර්‍ය්‍ය ද වීර්‍ය්‍යාරම්භයෙහි ගුණ කියනුයේ ද වෙමි: තමාගේ මෙලොව් සැපවිහරණය දකිමිනුත් "පශ්චිම ජනතාව දෘෂ්ටානුගතියට පැමිණෙන්නේ නම් මැනවැ"යි පශ්චිම ජනතාවට අනුකම්පා කරමිනුත් ය. යම් ඒ බුදු අනුබුදු සව්වෝ වූහු ද ඔහු දිගුකලක් ආරණ්‍යක ද ආරණ්‍යක බැව්හි ගුණ කියනුවෝ ද වූහ පිණ්ඩපාතික ද ... වූහ. පාංශුකූලික ද ... වූහ. තෙචීවරක ද ... වූහ අල්පෙච්ඡ ද ... වූහ සන්තුෂ්ට ද ... වූහ ප්‍රවිවිත්ත ද... වූහ අසංසෘෂ්ට ද ... වූහ. ආරබ්ධවීර්‍ය්‍ය ද වීර්‍ය්‍යාරම්භයෙහි ගුණ කියනුවෝ ද වූහ. ඔහු ඒ පිණිස පිළිපන්නාහ. ඔවුනට එය දිගුකලක් හිත පිණිස සැප පිණිස වන්නේ ය. වහන්ස, මම මේ ප්‍රයෝජන දෙක දකිමින් දිගුකලක් ආරණ්‍යක ද ආරණ්‍යක බැව්හි ගුණ කියනුයේ ද ... පිණ්ඩපාතික ද ... පාංශුකූලික ද ... තෙචීවරික ද ... අල්පෙච්ඡ ද ... සන්තුෂ්ට ද ... ප්‍රවිවිත්ත ද ... අසංසෘෂ්ට ද ... ආරබ්ධවීර්‍ය්‍ය ද වීර්‍ය්‍යාරම්භයෙහි ගුණ කියනුයේ ද වෙමි

කාශ්‍යප, මැනවි, මැනවි. කාශ්‍යප, තෙපි බොහෝ ජනයාට හිත පිණිස, බොහෝ ජනයාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ට හිත වැඩ පිණිස පිළිපන්නහු ය. කාශ්‍යප, එහෙයින් තෙපි හණපිලියෙන් කළ පරිභෝගයෙන් මාලු වූ පවුල්සිවුරුම දරව්. පිඬු පිණිසත් හැසිරෙව් වෙනෙහිත් වෙසෙව් යි

## 4. 1. 6.

### ඔවාද සූත්‍රය

389. **රජගහනුවර**-

එකල්හි ආයුෂ්මත් මහසුප් තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් මහසුප්හට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: "කස්සප, භික්ෂූන්ට අවවාද කරව. කස්සප, භික්ෂූන්ට දහැමි කතා කරව. කස්සප, මම හෝ භික්ෂූන්ට අවවාද කරන්නෙමි. තෙපි හෝ (අවවාද කරව්.) මම හෝ භික්ෂූන්ට දහැමි කථා කරන්නෙමි. තෙපි හෝ (කරව්)" යි.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දැන් භික්ෂූහු නො කීකරුහ. නො කීකරු බව කරණ දුසිත් යුක්තයහ. නො ඉවසන්නෝ ය, අනුශාසනාව නුහුරට ගන්නෝ ය. වහන්ස, මෙහි මම ආනන්දගේ සද්ධිවිහාරික වූ භණ්ඩු නම් මහණ ද, අනුරුද්ධගේ සද්ධිවිහාරික වූ ආභිඤ්ජික නම් මහණ ද "මහණ, එව, කවරෙක් (ධර්මකථාවෙහි) ඉතා වැඩියක් කියන්නේ ද, කවරෙක් ඉතා සොඳුරු කොට කියන්නේද, කවරෙක් බොහෝ වේලාවක් කියන්නේ ද"යි උගත්කමින් ඔවුනොවුන් ඉක්මවා කියනුවන් දිටිමි යි.

අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: “එහි ත්වං භික්ඛු, මම වචනෙන භණ්ඩඤ්ච භික්ඛුං ආනන්දස්ස සද්ධිවිහාරිං, ආභිඤ්ජිකඤ්ච භික්ඛුං අනුරුද්ධස්ස සද්ධිවිහාරිං ආමන්තෙහි සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී”ති. එවං භන්තෙති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: “සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී”ති. ‘එවමාවුසො’ති ඛො තෙ භික්ඛූ තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො පන තෙ භික්ඛූ භගවා එතදවොච: සච්චං කිර තුම්හෙ භික්ඛවෙ, අඤ්ඤමඤ්ඤං සුතෙන අච්චාවදථ, “එහි භික්ඛු කො බහුතරං භාසිස්සති, කො සුන්දරතරං භාසිස්සති, කො චිරතරං භාසිස්සතී”ති එවං භන්තෙති.

කින්නු මෙ තුම්හෙ භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං ආජානාථ? “එථ තුම්හෙ භික්ඛවෙ, අඤ්ඤමඤ්ඤං සුතෙන අච්චාවදථ: ‘එහි භික්ඛු, කො බහුතරං භාසිස්සති, කො සුන්දරතරං භාසිස්සති, කො චිරතරං භාසිස්සතී”ති. ‘නො හෙතං භන්තෙ, නො චෙ කිර තුම්හෙ භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං අජානාථ, අථ කිඤ්චරහි තුම්හෙ මොඝපුරිසා, කිං ජානන්තා කිං පස්සන්තා එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතා සමානා අඤ්ඤමඤ්ඤං සුතෙන අච්චාවදථ: “එහි භික්ඛු කො බහුතරං භාසිස්සති, කො සුන්දරතරං භාසිස්සති, කො චිරතරං භාසිස්සතී”ති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොචුං: අච්චයො නො භන්තෙ, අච්චගමා, යථා බාලෙ, යථා මූළ්හෙ, යථා අකුසලෙ යෙ මයං එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතා සමානා අඤ්ඤමඤ්ඤං සුතෙන අච්චාවදිම්හා “එහි භික්ඛු කො බහුතරං භාසිස්සති, කො සුන්දරතරං භාසිස්සති, කො චිරතරං භාසිස්සතී”ති. තෙසං නො භන්තෙ, භගවා අච්චයං අච්චයතො පතිගණ්හාතු ආයතිං සංවරායාති.

තග්ඝ තුම්හෙ භික්ඛවෙ, අච්චයො අච්චගමා, යථා බාලෙ යථා මූළ්හෙ යථා අකුසලෙ, යෙ[1] තුම්හෙ එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතා සමානා අඤ්ඤමඤ්ඤං සුතෙන අච්චාවදිත්ථ: “එහි භික්ඛු, කො බහුතරං භාසිස්සති, කො සුන්දරතරං භාසිස්සති, කො චිරතරං භාසිස්සතී”ති. යතො ච ඛො තුම්හෙ භික්ඛවෙ, අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොථ, තං වො මයං අච්චයං පටිගණ්හාම.[2] වුද්ධි හෙසා භික්ඛවෙ, අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති, ආයතිඤ්ච සංවරං ආපජ්ජතීති.

---

1 යං - සී 1 2 පටිග්ගණ්හාම - මජසං

එකල්හි භාග්‍යවතුන් වහන්සේ, මහණ, එව, තෝ මාගේ වචනයෙන් "ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවන සේක"යි ආනන්දගේ සද්ධිවිහාරික වූ භණ්ඩු නම් මහණ ද, අනුරුද්ධගේ සද්ධිවිහාරික වූ ආභිඤ්ජික නම් මහණ ද කැඳව" යි එක්තරා මහණකු ඇමතූ සේක. වහන්ස, එසේ යයි ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී ඒ භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ඒ භික්ෂූන්ට "ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් අමතන සේක"යි මෙය කීය. "ඇවැත්නි, එසේ ය" යි ඒ භික්ෂූහු ඒ මහණහට පිළිතුරුදී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: "මහණෙනි, සැබෑ ද තෙපි "මහණ, එව කවරෙක් ඉතා වැඩියක් කියන්නේ ද, කවරෙක් ඉතා සොඳුරු (මිහිරි) කොට කියන්නේ ද, කවරෙක් බොහෝ වේලාවක් කියන්නේ ද"යි උගත්කමින් ඔවුනොවුන් ඉක්මවා කියවු ද? වහන්ස, එසේ ය යි.

මහණෙනි, "තෙපි එවු, 'මහණ එව කවරෙක් ඉතා වැඩියක් බණන්නේ ද, කවරෙක් ඉතා සොඳුරු කොට, බණන්නේ ද, කවරෙක් බොහෝ වේලාවක් බණන්නේ ද' යි උගත්කමින් ඔවුනොවුන් ඉක්මවා කියවු"යි මවිසින් එසේ දෙසූ දහමක් කිම, තෙපි දන්නහු ද? වහන්ස, මෙය නො වේ ම ය. මහණෙනි, තෙපි මා විසින් "මෙසේ දහම් දෙසන ලදැ"යි ඉදින් නො දන්නාහු නම් එසේ කල්හි, මොඝ (හිස්) පුරුෂයෙනි, තෙපි දූන් කුමක් හෙයින් කුමක් දන්නාහු, කුමක් දක්නාහු මෙසේ ස්වාක්ඛ්‍යාත ධර්මවිනයෙහි - ශාසනයෙහි පැවිදි වූවාහු, "මහණ, එව, කවරෙක් ඉතා වැඩියක් බණන්නේ ද, කවරෙක් ඉතා සොඳුරු කොට බණන්නේ ද, කවරෙක් බොහෝ වේලාවක් බණන්නේ දැ"යි ශ්‍රැතයෙන් ඔවුනොවුන් ඉක්මවා කියවු ද?

ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ පාහි හිසින් වැටී, "වහන්ස, යම් බඳු අපි මෙසේ ස්වාඛ්‍යාත වූ ශාසනයෙහි පැවිදි වූවාහු ම "මහණ එව, කවරෙක් ඉතා වැඩියක් බණන්නේ ද, කවරෙක් ඉතා සොඳුරු කොට බණන්නේ ද, කවරෙක් බොහෝ වේලාවක් බණන්නේ දැ"යි ශ්‍රැතයෙන් ඔවුනොවුන් ඉක්මවා කීම්හ, අපගේ වරද බාලයන් සේ මෝඩයන් සේ අදක්ෂයන් සේ ඒ අප ඉක්මවා ගියේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඒ අපගේ වරද ආයති සංවරය පිණිස වරද වශයෙන් පිළිගන්නා සේක්වා" යි. යාචඤා කළහ.

මහණෙනි, යම් බඳු තෙපි මෙසේ ස්වාක්ඛ්‍යාත වූ සසුනෙහි පැවිදි වූවාහු ම 'මහණ, එව, කවරෙක් ඉතා වැඩියක් කියන්නේ ද, කවරෙක් සොඳුරු කොට කියන්නේ ද, කවරෙක් බොහෝ වෙලාවක් කියන්නේ දැ" යි ශ්‍රැතයෙන් ඔවුනොවුන් ඉක්මවා කීවහු ද, බාලයන් සේ මෝඩයන් සේ අදක්ෂයන් සේ ඒකාන්තයෙන් වරද ඒ තොප ඉක්ම ගියේ ය. මහණෙනි, යම් හෙයකින් තෙපි වරද වරද වශයෙන් දැක දහම් වූ පරිදි පිළියම් කරවු ද, තොපගේ ඒ වරද අපි පිළිගණිමු මහණෙනි, යමෙක් වරද වරද වශයෙන් දැක දහම් වූ පරිදි පිළියම් කෙරේ ද, මතු සංවරයට පැමිණේ ද, ආර්‍යශාසනයෙහි මේ වැඩීමෙකි යි.

## 4. 1. 7.

## දුතියඔවාදසුත්තං

290. **සාවත්ථියං**-[1]

අථ ඛො ආයස්මා **මහාකස්සපො** යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං මහාකස්සපං භගවා එතදවොච: ඔවද කස්සප භික්ඛූ, කරොහි කස්සප භික්ඛූනං ධම්මිං කථං. අහං වා කස්සප භික්ඛූ ඔවදෙය්‍යං, ත්වං වා. අහං වා භික්ඛූනං ධම්මිං කථං කරෙය්‍යං, ත්වං වාති.

දුබ්බචා ඛො භන්තෙ, භගවා එතරහි භික්ඛූ දොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතා අක්ඛමා අප්පදක්ඛිණග්ගාහිනො අනුසාසනිං. යස්ස කස්සචි භන්තෙ,[2] සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි[3] නත්ථි කුසලෙසු ධම්මෙසු, ඔත්තප්පං නත්ථි කුසලෙසු ධම්මෙසු, විරියං නත්ථි කුසලෙසු ධම්මෙසු, පඤ්ඤා නත්ථි කුසලෙසු ධම්මෙසු, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති[4], හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි.

සෙය්‍යථාපි භන්තෙ කාළපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හායතෙව වණ්ණෙන, හායති මණ්ඩලෙන, හායති ආභාය, හායති ආරොහපරිණාහෙන. එවමෙව ඛො භන්තෙ, යස්ස කස්සචි සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි නත්ථි -පෙ- ඔත්තප්පං නත්ථි -පෙ- විරියං නත්ථි -පෙ- පඤ්ඤා නත්ථි කුසලෙසු ධම්මෙසු, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි

අස්සද්ධො පුරිසපුග්ගලොති භන්තෙ, පරිහානමෙතං. අහිරිකො පුරිසපුග්ගලොති භන්තෙ, පරිහානමෙතං අනොත්තප්පී පුරිසපුග්ගලොති භන්තෙ, පරිහානමෙතං. කුසීතො පුරිසපුග්ගලොති භන්තෙ, පරිහානමෙතං. දුප්පඤ්ඤො පුරිසපුග්ගලොති භන්තෙ පරිහානමෙතං. කොධනො පුරිසපුග්ගලොති භන්තෙ, පරිහානමෙතං. උපනාහී පුරිසපුග්ගලොති භන්තෙ, පරිහානමෙතං න සන්ති භික්ඛූ ඔවාදකාති භන්තෙ, පරිහානමෙතං.

යස්ස කස්සචි භන්තෙ, සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි අත්ථි කුසලෙසු ධම්මෙසු, ඔත්තප්පං අත්ථි කුසලෙසු ධම්මෙසු, විරියං අත්ථි කුසලෙසු ධම්මෙසු, පඤ්ඤා අත්ථි කුසලෙසු ධම්මෙසු, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි.

සෙය්‍යථාපි භන්තෙ, ජුණ්හපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වඩ්ඪතෙව වණ්ණෙන, වඩ්ඪති මණ්ඩලෙන, වඩ්ඪති ආභාය, වඩ්ඪති ආරොහපරිණාහෙන. එවමෙව ඛො භන්තෙ යස්ස කස්සචි සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි අත්ථි -පෙ- ඔත්තප්පං අත්ථි -පෙ- විරියං අත්ථි -පෙ- පඤ්ඤා අත්ථි කුසලෙසු ධම්මෙසු, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි.

---

1 රාජගහෙ 2. භන්තෙ භික්ඛුනො සී 1, 3] හිරී - මජසං. 4. ආගච්ඡන්ති - සීමු. විහරති වෙළුවනෙ, මජසං - සතා.

## 4. 1. 7

## දෙවන ඔවාද සූත්‍රය

290. **සැවැත්නුවර-**

එකල්හි ආයුෂ්මත් මහසුප් තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පසෙක හුන් ආයුෂ්මත් මහසුප්හට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක කස්සප, භික්ෂූන්ට අවවාද කරවු කස්සප, භික්ෂූන්ට දහම්කතා කරවු. කස්සප, මම හෝ භික්ෂූන්හට අවවාද කරන්නෙමි. තෙපි හෝ (අවවාද කරවු.) කස්සප, මම හෝ භික්ෂූන්ට දහම් කතා කරන්නෙමි. තෙපි හෝ (දහම් කතා කරවු යි.)

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දැන් භික්ෂූහු දුර්වච ය. දුර්වචබැව් කරණ දහමින් සමන්විතය නො ඉවසන්නෝ ය. අනුශාසනාව නුහුරට ගන්නෝ ය. වහන්ස, යම් කිසිවකුට කුසල් දහම්හි සැදැහැ නැද්ද, කුසල්දහම්හි හිරි නැද්ද, කුසල්දහම්හි ඔතප් නැද්ද, කුසල්දහම්හි වැර නැද්ද, කුසල්දහම්හි නුවණ නැද්ද, ඔහුට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ නම් කුසල්-දහම්හි පිරිහීම ම කැමති විය යුතු. වැඩීම කැමති විය නොහේ.

වහන්ස, යම් සේ කලුවරපස සඳට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ නම් සඳ පැහැයෙන් පිරිහේ ම ය, මඬලින් පිරිහේ ම ය, දීප්තියෙන් පිරිහේ ම ය, උසමහතින් පිරිහේ ම ය. වහන්ස, එසෙයින් ම යම් කිසිවකුහට කුසල්දහම්හි සැදැහැ නැද්ද, ... හිරි නැද්ද ... ඔතප් නැද්ද,... වැර නැද්ද, කුසල්දහම්හි නුවණ නැද්ද. ඔහුට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ නම් කුසල්දහම්හි පිරිහීම ම කැමති විය යුතු. වැඩීම කැමති විය නොහේ.

වහන්ස, 'සැදැහැ නැති පුරුෂපුද්ගලයා' යන මෙය පිරිහීමෙකි වහන්ස, 'හිරි නැති පුරුෂපුද්ගලයා' යන මෙය පිරිහීමෙකි. වහන්ස, 'ඔතප් නැති පුරුෂපුද්ගලයා' යන මෙය පිරිහීමෙකි. වහන්ස, 'කුසීත පුරුෂපුද්ගලයා, යන මෙය පිරිහීමෙකි. වහන්ස, 'දුෂ්ප්‍රාඥ පුරුෂපුද්ගලයා' යන මෙය පිරිහීමෙකි. වහන්ස, 'ක්‍රෝධනසුලු පුරුෂපුද්ගලයා' යන මෙය පිරිහීමෙකි. වහන්ස, 'බද්ධවෛර ඇති පුරුෂපුද්ගලයා' යන මෙය පිරිහී-මෙකි වහන්ස, 'අවවාද කරණ භික්ෂූහු නැත්නාහ යන' මෙය පිරිහීමෙකි

වහන්ස, යම් කිසිවකුට කුසල්දහම්හි සැදැහැ ඇද්ද, කුසල්දහම්හි හිරි ඇද්ද, කුසල්දහම්හි ඔතප් ඇද්ද, කුසල්දහම්හි වැර ඇද්ද, කුසල්දහම්හි නුවණ ඇද්ද, ඔහුට යම් රැයෙක් හෝ දවාලෙක් පැමිණේ නම් කුසල්දහම්හි වැඩීම ම කැමති විය යුතු. පිරිහීම කැමති විය නොහේ.

මහණෙනි, පුරපස සඳට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ නම් පැහැයෙන් වැඩේ ම ය. මඬලින් වැඩේ ම ය. දීප්තියෙන් වැඩේ ම ය. උසමහතින් වැඩේ ම ය. වහන්ස, එසෙයින් ම යම් කිසිවකුට කුසල්දහම්හි සැදැහැ ඇද්ද ... හිරි ඇද්ද .... ඔතප් ඇද්ද ... වැර ඇද්ද, කුසල්දහම්හි නුවණ ඇද්ද, ඔහුට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ නම් කුසල්-දහම්හි වැඩීම ම කැමති විය යුතු. පිරිහීම කැමති විය නොහේ

සද්ධො පුරිසපුග්ගලොති භන්තෙ, අපරිහානමෙතං. හිරිමා පුරිස-පුග්ගලොති භන්තෙ, අපරිහානමෙතං. ඔත්තාපී පුරිසපුග්ගලොති භන්තෙ, අපරිහානමෙතං. ආරද්ධවිරියො පුරිසපුග්ගලොති භන්තෙ, අපරිහානමෙතං. පඤ්ඤවා පුරිසපුග්ගලොති භන්තෙ, අපරිහානමෙතං. අක්කොධනො පුරිස-පුග්ගලොති භන්තෙ, අපරිහානමෙතං. අනුපනාහී පුරිසපුග්ගලොති භන්තෙ, අපරිහානමෙතං. සන්ති භික්ඛූ ඔවාදකාති භන්තෙ, අපරිහානමෙතන්ති.

සාධු සාධු කස්සප, යස්ස කස්සචි කස්සප, සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි නත්ථි -පෙ- ඔත්තප්පං නත්ථි -පෙ- විරියං නත්ථි -පෙ- පඤ්ඤා නත්ථි කුසලෙසු ධම්මෙසු, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි.

සෙය්‍යථාපි කස්සප, කාලපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හායතෙව වණ්ණෙන, හායති මණ්ඩලෙන, හායති ආභාය, හායති ආරොහපරිණාහෙන, එවමෙව ඛො කස්සප, යස්ස කස්සචි සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි නත්ථි -පෙ- ඔත්තප්පං නත්ථි -පෙ- විරියං නත්ථි -පෙ- පඤ්ඤා නත්ථි කුසලෙසු ධම්මෙසු, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි

අස්සද්ධො පුරිසපුග්ගලොති කස්සප, පරිහානමෙතං. අහිරිකො -පෙ- අනොත්තාපී -පෙ- කුසීතො -පෙ- දුප්පඤ්ඤො -පෙ- කොධනො -පෙ- උපනාහී පුරිසපුග්ගලොති කස්සප, පරිහානමෙතං. න සන්ති භික්ඛූ ඔවාදකාති කස්සප, පරිහානමෙතං.

යස්ස කස්සචි කස්සප, සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු. හිරි -පෙ- ඔත්තප්පං -පෙ- විරියං -පෙ- පඤ්ඤා, අත්ථි කුසලෙසු ධම්මෙසු, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි

සෙය්‍යථාපි කස්සප, ජුණ්හපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වඩ්ඪතෙව වණ්ණෙන, වඩ්ඪති මණ්ඩලෙන, වඩ්ඪති ආභාය, වඩ්ඪති ආරොහපරිණාහෙන. එවමෙව ඛො කස්සප, යස්ස කස්සචි සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි අත්ථි -පෙ- ඔත්තප්පං අත්ථි -පෙ- විරියං අත්ථි -පෙ- පඤ්ඤා අත්ථි කුසලෙසු ධම්මෙසු, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි

සද්ධො පුරිසපුග්ගලොති කස්සප, අපරිහානමෙතං. හිරිමා -පෙ- ඔත්තාපී -පෙ- ආරද්ධවිරියො -පෙ- පඤ්ඤවා -පෙ- අක්කොධනො -පෙ- අනුපනාහී පුරිසපුග්ගලොති කස්සප, අපරිහානමෙතං. සන්ති භික්ඛූ ඔවාද-කාති කස්සප, අපරිහානමෙතන්ති.

වහන්ස, 'සැදැහැති පුරුෂපුද්ගලයා' යන මෙය නො පිරිහීමෙකි. වහන්ස, 'හිරි ඇති පුරුෂපුද්ගලයා' යන මෙය නො පිරිහීමෙකි. වහන්ස, 'ඔතප් ඇති පුරුෂපුද්ගලයා' යන මෙය නො පිරිහීමෙකි. වහන්ස, 'ඇරඹූ වැර ඇති පුරුෂපුද්ගලයා යන මෙය නො පිරිහීමෙකි. වහන්ස, 'නුවණැති පුරුෂපුද්ගලයා' යන මෙය නො පිරිහීමෙකි. වහන්ස, 'නො කිපෙනසුලු පුරුෂපුද්ගලයා' යන මෙය නො පිරිහීමෙකි. වහන්ස, 'බද්ධවෛර නැති පුරුෂපුද්ගලයා' යන මෙය නො පිරිහීමෙකි. වහන්ස, 'අවවාද කරණ භික්ෂූහු ඇත්තාහ' යන මෙය නො පිරිහීමෙකි.

කස්සප, මැනවි, මැනවි. කස්සප, යම් කිසිවකුට කුසල්දහම්හි සැදැහැ නැද්ද ... හිරි නැද්ද ... ඔතප් නැද්ද ... වැර නැද්ද, කුසල් දහම්හි නුවණ නැද්ද, ඔහුට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ නම් කුසල්දහම්හි හානිය ම කැමති විය යුතු. වැඩීම කැමති විය නො හේ.

කස්සප, යම් සේ කලුවරපස සඳට යම් රැයෙක් දවාලෙක් හෝ හෝ පැමිණේ නම් පැහැයෙන් පිරිහේ ම ය. මඬලින් පිරිහේම ය. දීප්තියෙන් පිරිහේ ම ය. උසමහතින් පිරිහේ ම ය. කස්සප, එසෙයින් ම යම් කිසිවකුහට කුසල් දහම්හි සැදැහැ නැද්ද ... හිරි නැද්ද ... ඔතප් නැද්ද .. වැර නැද්ද, කුසල්දහම්හි නුවණ නැද්ද, ඔහුට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ නම් කුසල්දහම්හි පිරිහීම ම කැමති විය යුතු. වැඩීම කැමති විය නොහේ.

කස්සප, 'සැදැහැ නැති පුරුෂපුද්ගලයා' යන මෙය පිරිහීමෙකි. හිරි නැති ... ඔතප් නැති ... කුසිත ... නුවණ නැති ... කිපෙනසුලු ... කස්සප, 'බද්ධවෛර ඇති පුරුෂපුද්ගලයා' යන මෙය පිරිහීමෙකි. කස්සප, 'අවවාද කරණ භික්ෂූහු නැත්තාහ' යන මෙය පිරිහීමෙකි.

කස්සප, යම් කිසිවකුහට කුසල්දහම්හි සැදැහැ ඇද්ද, හිරි ... ඔතප් ... වැර ... කුසල්දහම්හි නුවණ ඇද්ද, ඔහුට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ නම් කුසල්දහම්හි වැඩීම ම කැමති විය යුතු ය. පිරිහීම කැමති නො විය යුතු යි.

කස්සප, යම් සේ පුරපස සඳට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ නම් පැහැයෙන් වැඩේ ම ය. මඬලින් වැඩේ ම ය. දීප්තියෙන් වැඩේ ම ය. උසමහතින් වැඩේ ම ය. කස්සප, එසෙයින් ම යම් කිසිවකුහට කුසල්දහම්හි සැදැහැ ඇද්ද ... හිරි ඇද්ද .. ඔතප් ඇද්ද ... වැර ඇද්ද, කුසල්දහම්හි නුවණ ඇද්ද, ඔහුට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ නම් කුසල්දහම්හි වැඩීම ම කැමති විය යුතු. පිරිහීම කැමති නො විය යුතු යි.

කස්සප, 'සැදැහැති පුරුෂපුද්ගලයා' යන මෙය නො පිරිහීමෙකි. හිරි ඇති .. ඔතප් ඇති ... ඇරඹූ වෙර ඇති ... නුවණ ඇති ... නො කිපෙන සුලු ... 'බද්ධවෛර නැති පුරුෂපුද්ගලයා' යන මෙය නො පිරිහීමෙකි. කස්සප, 'අවවාද කරණ භික්ෂූහු ඇත්තාහ' යන මෙය නො පිරිහීමෙකි යි.

## 4. 1. 8

## තතිය ඔවාදසුත්තං

291 **සාවත්ථියං**[1] -

අථ ඛො ආයස්මා **මහාකස්සපො** යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං මහාකස්සපං භගවා එතදවොච: "ඔවද කස්සප, භික්ඛූ, කරොහි කස්සප, භික්ඛූනං ධම්මිං කථං. අහං වා කස්සප, භික්ඛූ[2] ඔවදෙය්‍යං ත්වං වා. අහං වා භික්ඛූනං ධම්මිං කථං කරෙය්‍යං, ත්වං වා"ති.

දුබ්බචා ඛො භන්තෙ,[3] එතරහි භික්ඛූ, දොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතා, අක්ඛමා, අප්පදක්ඛිණග්ගාහිනො අනුසාසනින්ති.

තථා හි පන කස්සප පුබ්බෙ ථෙරා භික්ඛූ ආරඤ්ඤකා චෙව අහෙසුං ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදිනො. පිණ්ඩපාතිකා චෙව අහෙසුං පිණ්ඩපාතිකත්තස්ස ච වණ්ණවාදිනො. පංසුකූලිකා චෙව අහෙසුං පංසුකූලිකත්තස්ස ච වණ්ණවාදිනො. තෙචීවරිකා චෙව අහෙසුං තෙචීවරිකත්තස්ස ච වණ්ණවාදිනො. අප්පිච්ඡා චෙව අහෙසුං අප්පිච්ඡතාය ච[4] වණ්ණවාදිනො. සන්තුට්ඨා චෙව අහෙසුං සන්තුට්ඨියා[5] ච වණ්ණවාදිනො. පවිවිත්තා චෙව අහෙසුං පවිවෙකස්ස ච වණ්ණවාදිනො. අසංසට්ඨා චෙව අහෙසුං අසංසග්ගස්ස ච වණ්ණවාදිනො. ආරද්ධවිරියා චෙව අහෙසුං විරියාරම්භස්ස ච වණ්ණවාදිනො.

තත්‍ර යො හොති භික්ඛු ආරඤ්ඤකො චෙව ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදී, පිණ්ඩපාතිකො චෙව පිණ්ඩපාතිකත්තස්ස ච වණ්ණවාදී, පංසුකූලිකො චෙව පංසුකූලිකත්තස්සච වණ්ණවාදී, තෙචීවරිකො චෙව තෙචීවරිකත්තස්ස ච වණ්ණවාදී, අප්පිච්ඡො චෙව අප්පිච්ඡතාය ච වණ්ණවාදී, සන්තුට්ඨො චෙව සන්තුට්ඨියා ච වණ්ණවාදී, පවිවිත්තො චෙව පවිවෙකස්ස ච වණ්ණවාදී, අසංසට්ඨො චෙව අසංසග්ගස්ස ච වණ්ණවාදී, ආරද්ධවිරියො චෙව විරියාරම්භස්ස ච වණ්ණවාදී, තං ථෙරා භික්ඛූ ආසනෙන නිමන්තෙන්ති "එහි භික්ඛු, කො නාමායං[6] භික්ඛු, භද්දකො වතායං භික්ඛු, සික්ඛාකාමො වතායං භික්ඛු, එහි භික්ඛු, ඉදං ආසනං නිසීදාහී"ති.

තත්‍ර කස්සප, නවානං භික්ඛූනං එවං හොති. 'යො කිර සො හොති භික්ඛු ආරඤ්ඤකො චෙව ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදී, පිණ්ඩපාතිකො චෙව -පෙ- පංසුකූලිකො චෙව - තෙචීවරිකොච චෙව -පෙ- අප්පිච්ඡො චෙව -පෙ- සන්තුට්ඨො චෙව -පෙ- පවිවිත්තො චෙව -පෙ- අසංසට්ඨො චෙව -පෙ- ආරද්ධවිරියො චෙව විරියාරම්භස්ස ච වණ්ණවාදී, තං ථෙරා භික්ඛූ ආසනෙන නිමන්තෙන්ති "එහි භික්ඛු කො නාමායං, භද්දකො වතායං භික්ඛු සික්ඛාකාමොවතායං භික්ඛු "එහි භික්ඛු, ඉදං ආසනං නිසීදාහීති. තෙ තථත්තාය පටිපජ්ජන්ති. තෙසං තං හොති දීඝරත්තං හිතාය සුඛාය.

---

1 රාජගහෙ කලන්දක නිවාපෙ - මජ්සං, ස්‍යා. 2. භික්ඛූනං - මජ්සං. 3. භන්තෙ භගවා - සිමු. 4 අප්පිච්ඡාය ච සිමු, සි 2. 5 සන්තුට්ඨිතාය ච - සි 2.
6. කොනාමො අයං සිමු සි 1, 2.

## 4. 1. 8.

## තෙවන ඔවාද සූත්‍රය

291 **සැවැත්නුවර-**

එකල්හි ආයුෂ්මත් මහකසුප් තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පසෙක හුන් ආයුෂ්මත් මහකසුප්හට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: කස්සප, භික්ෂූන්ට අවවාද කරව. කස්සප, භික්ෂූන්ට දැහැමි කතා කරව. කස්සප, මම හෝ භික්ෂූන්ට අවවාද කරන්නෙමි. තෙපි හෝ (අවවාද කරවු.) මම හෝ භික්ෂූන්ට දැහැමි කතා කරන්නෙමි. තෙපි හෝ (කරවු) යි.

වහන්ස, දැන් භික්ෂූහු දුර්වචය. දුර්වචබව කරණ දහමින් සමන්විතය. නො ඉවසන්නෝය. අනුශාසනාව නුහුරට ගන්නෝය යි.

කස්සප, ඒ එසේ මැ යි. පෙර ස්ථවිර භික්ෂූහු ආරණ්‍යක වූවෝත්, ආරණ්‍යක බැව්හි ගුණ කියන්නෝත් වූහ. පිණ්ඩපාතික වූවෝත්, පිණ්ඩපාතික බැව්හි ගුණ කියන්නෝත් වූහ. පාංශුකූලික වූවෝත්, පාංශුකූලික බැව්හි ගුණ කියන්නෝත් වූහ. තෙචීවරික වූවෝත්, තෙචීවරික බැව්හි ගුණ කියන්නෝත් වූහ. අල්පෙච්ඡ වූවෝත් අල්පෙච්ඡ බැව්හි ගුණ කියන්නෝත් වූහ. සන්තුෂ්ට වූවෝත්, සන්තුෂ්ට බැව්හි ගුණ කියන්නෝත් වූහ. ප්‍රවිවික්ත වූවෝත්, ප්‍රවිවෙකයෙහි ගුණ කියන්නෝත් වූහ. අසංසෘෂ්ටයෝත්, අසංසර්ගයෙහි ගුණ කියන්නෝත් වූහ. ආරබ්ධවීර්‍ය්‍යයෝත්, වීර්‍ය්‍යාරම්භයෙහි ගුණ කියන්නෝත් වූහ.

එහි යම් මහණෙක් ආරණ්‍යකත් ආරණ්‍යක බැව්හි ගුණ කියන්නේත්, පිණ්ඩපාතිකත් පිණ්ඩපාතික බැව්හි ගුණ කියන්නේත්, පාංශුකූලිකත් පාංශුකූලික බැව්හි ගුණ කියන්නේත්, තෙචීවරිකත් තෙචීවරික බැව්හි ගුණ කියන්නේත්, අල්පේච්ඡත් අල්පේච්ඡ බැව්හි ගුණ කියන්නේත්, සන්තුෂ්ටත් සන්තුෂ්ට බැව්හි ගුණ කියන්නේත්, ප්‍රවිවික්තත් ප්‍රවිවෙකයෙහි ගුණ කියන්නේත්, අසංසෘෂ්ටත් අසංසර්ගයෙහි ගුණ කියන්නේත්, ආරබ්ධවීර්‍ය්‍යත් වීර්‍ය්‍යාරම්භයෙහි ගුණ කියන්නේත් වේ නම්, ස්ථවිර භික්ෂූහු ඔහුට "මහණ, එව, මේ මහණ තෙමේ කිනම් ද? මේ මහණ තෙමේ ඒකාන්තයෙන් සොඳුරු ය. මේ මහණ තෙමේ ඒකාන්තයෙන් ශික්ෂාකාමී ය. මහණ, එව, මේ අසුන ය. ඉඳගණුව" යි අසුනෙන් පවරත්.

කස්සප, එහි ලා නවක භික්ෂූන්ට "යම් ඒ මහණෙක් ආරණ්‍යකත් ආරණ්‍යක බැව්හි ගුණ කියනුයේත් පිණ්ඩපාතිකත් ... පංසුකූලිකත් ... තෙචීවරිකත් ... අල්පෙච්ඡත් ... සන්තුෂ්ටත්... ප්‍රවිවික්තත්... අසංසෘෂ්ටත් ... ආරබ්ධවීර්‍ය්‍යත් වීර්‍ය්‍යාරම්භයෙහි ගුණ කියනුයේත් වේ නම්, ස්ථවිර භික්ෂූහු ඔහුට "මහණ, එව, මේ මහණ තෙමේ කිනම් ද? මේ මහණ තෙමේ ඒකාන්තයෙන් සොඳුරු ය. මේ මහණ තෙමේ ඒකාන්තයෙන් ශික්ෂාකාමී ය. මහණ එව, මේ අසුන ය, හිඳගණුවයි අසුනෙන් පවරති"යි මෙසේ අදහස් වේ නම් ඔහු ඒ පිණිස පිළිපදිත්. ඔවුන්ට එය දිගුකලක් හිත පිණිස සැප පිණිස වේ.

එතරහි පන කස්සප, ථෙරා භික්ඛූ න චෙව ආරඤ්ඤකා න ච ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදිනො. න චෙව පිණ්ඩපාතිකා න ච පිණ්ඩපාතිකත්තස්ස ච වණ්ණවාදිනො. න චෙව පංසුකූලිකා න ච පංසුකූලිකත්තස්ස ච වණ්ණවාදිනො. න චෙව තෙචීවරිකා න ච තෙචීවරිකත්තස්ස ච වණ්ණවාදිනො. න චෙව අප්පිච්ඡා න ච අප්පිච්ඡතාය ච වණ්ණවාදිනො. නචෙව සන්තුට්ඨා න ච සන්තුට්ඨියා ච වණ්ණවාදිනො. න චෙව පවිවිත්තා න ච පවිවෙකස්ස ච වණ්ණවාදිනො. න චෙව අසංසට්ඨා න ච අසංසග්ගස්ස ච වණ්ණවාදිනො. න චෙව ආරද්ධවිරියා න ච විරියාරම්භස්ස ච වණ්ණවාදිනො.

තත්‍ර යො හොති භික්ඛු ඤාතො යසස්සී ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, තං ථෙරා භික්ඛූ ආසනෙන නිමන්තෙන්ති "එහි භික්ඛු, කො නාමායං භික්ඛු, භද්දකො වතායං භික්ඛු, සබ්‍රහ්මචාරිකාමො වතායං භික්ඛු, එහි භික්ඛු, ඉදං ආසනං, නිසීදාහී"ති.

තත්‍ර කස්සප නවානං භික්ඛූනං එවං හොති: "යො කිර සො හොති භික්ඛු ඤාතො යසස්සී ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන , තං ථෙරා භික්ඛූ ආසනෙන නිමන්තෙන්ති "එහි භක්ඛු කොනාමායං භික්ඛු, භද්දකො වතායං භික්ඛු: සබ්‍රහ්මචාරිකාමො වතායං භික්ඛු, එහි භික්ඛු, ඉදං ආසනං, නිසීදාහීති තෙ තථත්තාය පටිපජ්ජන්ති තෙසං තං හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය.

යං හි තං කස්සප, සම්මාවදමානො වදෙය්‍ය උපද්දුතා බ්‍රහ්මචාරී බ්‍රහ්මචාරූපද්දවෙන, අභිභවතා[1] බ්‍රහ්මචාරී බ්‍රහ්මචාරාභිභවනෙනාති[2] එවංහිතං කස්සප සම්මාවදමානො වදෙය්‍ය[2] උපද්දුතා බ්‍රහ්මචාරී බ්‍රහ්මචාරූපද්දවෙන අභිභවතා බ්‍රහ්මචාරී බ්‍රහ්මචාරාභිභවනෙනාති.

### 4. 1. 9.

### ඣානාභිඤ්ඤසුත්තං

292. **සාවත්ථියං**-

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරාමි. **කස්සපො**පි භික්ඛවෙ, යාවදෙ[4] ආකඞ්ඛති විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති.

---

1. අභිපත්ථිතා - මජ්ඣං, 2 බ්‍රහ්මචාරී අභිපත්ථිතෙනාති - මජ්ඣං.
3. ඣානාභිඤ්ඤ - මජ්ඣං. 4 යාවදෙ - මජ්ඣං.

කස්සපය, දැන් ස්ථවිර භික්ෂූහු ආරණ්‍යක ද ආරණ්‍යක බැව්හි ගුණ කියනුවෝ ද නො වෙති. පිණ්ඩපාතික ද පිණ්ඩපාතික බැව්හි ගුණ කියනුවෝ ද නො වෙති. පංසුකූලික ද පංසුකූලික බැව්හි ගුණ කියනුවෝ ද නො වෙති. තෙචීවරිකද තෙචීවරිකබැව්හි ගුණ කියනුවෝ ද නො වෙති. අල්පේච්ඡ ද අල්පේච්ඡ බැව්හි ගුණ කියනුවෝ ද නො වෙති. සන්තුෂ්ට ද සන්තුෂ්ට බැව්හි ගුණ කියනුවෝ ද නො වෙති. ප්‍රවිවික්ත ද ප්‍රවිවේකයෙහි ගුණ කියනුවෝ ද නො වෙති. අසංසෘෂ්ට ද අසංසර්ගයෙහි ගුණ කියනුවෝ ද නො වෙති. ආරබ්ධවීර්‍ය්‍ය ද වීර්‍ය්‍යාරම්භයෙහි ගුණ කියනුවෝ ද නො වෙති

එහි යම් මහණෙක් ප්‍රසිද්ධ වූයේ යසස් ඇත්තේ සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙසත්පිරිකර ලබන සුලු වේ නම්, ස්ථවිර භික්ෂූහු ඔහුට "මහණ, එව මේ භික්ෂු තෙමේ කිනම් ද? මේ භික්ෂු තෙමේ ඒකාන්තයෙන් සොඳුරු ය. මේ භික්ෂු තෙමේ ඒකාන්තයෙන් සබ්‍රම්සරුණට කැමති ය. මහණ, එව, මේ අසුන ය. හිඳගනුව"යි අසුනෙන් පවරත්.

කස්සපය, එහි දී නවක භික්ෂූන්ට "යම් ඒ මහණෙක් ප්‍රසිද්ධ වූයේ යසස් ඇත්තේ සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙසත්පිරිකර ලබනසුලු වූයේ වේ නම් ස්ථවිර භික්ෂූහු ඔහුට 'මහණ, එව මේ මහණ තෙමේ කිනම් ද? මේ මහණ තෙමේ ඒකාන්තයෙන් සොඳුරු ය. මේ මහණ තෙමේ ඒකාන්තයෙන් සබ්‍රම්සරුන්ට කැමති ය. මහණ, එව මේ අසුනය හිඳගණුව'යි අසුනෙන් පවරති" යි මෙසේ අදහස් වේ. ඔහු ඒ පිණිස පිළිපදිත්. ඔවුනට එය දිගුකලක් අහිත පිණිස දුක් පිණිස වෙයි.

කස්සපය, යම් හෙයකින් මැනවින් (සත්‍යය) කියන්නෙක් "බ්‍රහ්මචාරීහු බඹසර උවදුරින් හටගත් උවදුරු ඇත්තෝ ය. බ්‍රහ්මචාරීහු බ්‍රහ්මචාරීන් පිළිබඳ සිවුපසෙහි වූ අභිකප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත අභිභවනයෙන් යුක්තයෝ ය"යි කියන්නේ නම්, කස්සපය, සත්‍යය කියන්නේ "බ්‍රහ්මචාරීහු බඹසර උවදුරින් හටගත් උවදුරු ඇත්තෝ ය. බ්‍රහ්මචාරීහු බ්‍රහ්මචාරීන් පිළිබඳ සිවුපසයෙහි වූ අභිකප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත අභිභවනයෙන් යුක්තයෝ" යි මෙසේ කියන්නේ යි.

## 4. 1. 9.

## ඣානාභිඤ්ඤ සූත්‍රය

292 **සැවැත්නුවර**-

මහණෙනි, මම යම්තාක් කල් කැමති වන්නෙම් නම් (ඒ තාක්) කාමයන් ගෙන් වෙන් ව ම අකුශලධර්මයන් ගෙන් වෙන් ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙහි හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානය උපදවා වෙසෙමි. මහණෙනි, කාශ්‍යප ද යම්තාක් කල් කැමති වන්නේ නම් (ඒ තාක්) කාමයන්ගෙන් වෙන් ව ම අකුශලධර්මයන් ගෙන් වෙන්ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙහි හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානය උපදවා වෙසෙයි.

අහං භික්ඛවෙ, යාවදෙ[1] ආකඞ්ඛාමි විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරාමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ[1] ආකඞ්ඛති විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියංඣානං උපසම්පජ්ජ විහරති.

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරාමි' සතො ච සම්පජානො. සුඛං ච කායෙන පටිසංවෙදෙමි. යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං උපසම්පජ්ජ විහරාමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති.

අහං භික්ඛවෙ,. යාවදෙ ආකඞ්ඛාමි සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්ස දෙමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරාමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරාමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා -පෙ- ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති.

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරාමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති.

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරාමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති -පෙ- ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති.

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරාමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති-පෙ-නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති.

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරාමි. කස්සපොපි භික්ඛවෙ -පෙ- සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති.

1. යාවදෙව - සිමු.

මහණෙනි, මම යම් තාක් කල් කැමති වෙම් ද (ඒ තාක්) විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමහේතුවෙන් සවසන්තානයෙහි උපන් පැහැදීම ඇති, සිත්හුගේ එකලාව උපදනා උතුම් සමාධිය වඩන, විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යානය උපදවා වෙසෙමි. මහණෙනි, කාශ්‍යප ද යම් තාක් කල් කැමති වේ නම් ඒ තාක් විතර්ක විචාරයන්ගේ ව්‍යුපශම හේතුවෙන් ද්විතීයධ්‍යානය උපදවා වෙසෙයි.

මහණෙනි, මම යම් තාක් කල් කැමති වෙම් ද (ඒ තාක් ප්‍රීතියගේ ද විරාගයෙන් උපේක්‍ෂා ඇත්තෙම් ද සිහි ඇත්තෙම් ද මනා නුවණ ඇත්තෙම් ද වෙසෙමි. සුවද කයින් විඳිමි. යම් ධ්‍යානයක් හේතු කොට ගෙණ තෘතීයධ්‍යාන සමන්විත පුද්ගලයා 'උපේක්‍ෂක ය, සිහි ඇත්තේය, සුඛවිහාර ඇත්තේ' යයි ආර්‍යයෝ කියත් ද, ඒ තෘතීයධ්‍යානය උපදවා වෙසෙමි. මහණෙනි, කසුප් ද යම් තාක් කැමති වේ නම් (ඒ තාක්) ... තෘතීයධ්‍යානය උපදවා වෙසෙයි.

මහණෙනි, මම යම් තාක් කල් කැමති වෙම් ද (ඒ තාක්) සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පූර්වයෙහිම සොම්නස් දොම්නස් අස්තඞ්ගමයෙන් දුක් නැති සුව නැති උපේක්‍ෂායෙන් හටගත් සමෘති පාරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානය උපදවා වෙසෙමි. මහණෙනි, කාශ්‍යප ද යම් තාක් කල් කැමති වේ නම් (ඒ තාක්) සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් චතුර්ථධ්‍යානය උපදවා වෙසෙයි.

මහණෙනි, මම යම් තාක් කල් කැමති වෙම් නම් (ඒ තාක්) සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ සමතික්‍රමයෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්මසංඥාවන් නො මෙනෙහි කිරීමෙන් "ආකාශය අනන්ත ය" යි ආකාසානඤ්චායතනය උපදවා වෙසෙමි. මහණෙනි, කස්සප ද, යම් තාක් කල් කැමති වේ ද (ඒ තාක්) සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් සමතික්‍රමයෙන් ආකාසානඤ්චායතනය උපදවා වෙසෙයි

මහණෙනි, මම යම් තාක් කල් කැමති වෙම් නම් (ඒ තාක්) සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා "විඤ්ඤාණය අනන්ත ය" යි විඤ්ඤාණඤ්චායතනය උපදවා වෙසෙමි. මහණෙනි, කාශ්‍යප ද, යම් තාක් කැමති වේ ද (ඒ තාක්) සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා "විඤ්ඤාණය අනන්ත ය" යි විඤ්ඤාණඤ්චායතනය උපදවා වෙසෙයි

මහණෙනි, මම යම් තාක් කල් කැමති වෙම් නම් (ඒ තාක්) සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා "කිසිවක් නැත" යි ආකිඤ්චඤ්ඤායතනය උපදවා වෙසෙමි. මහණෙනි, කසුප් ද යම් තාක් කැමති වේද (ඒ තාක්) ... ආකිඤ්චඤ්ඤායතනය උපදවා වෙසෙයි.

මහණෙනි, මම යම් තාක් කල් කැමති වෙම් නම් (ඒ තාක්) සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනය උපදවා වෙසෙමි. මහණෙනි, කස්සප ද යම් තාක් කල් කැමති වේ ද (ඒ තාක්) ... නේවසඤ්ඤානාසඤ්ඤායතනය උපදවා වෙසෙයි.

මහණෙනි, මම යම් තාක් කල් කැමති වෙම් නම් (ඒ තාක්) සර්වප්‍රකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසෙමි. මහණෙනි, කස්සප ද සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වෙසෙයි

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොමි: එකොපි හුත්වා බහුධා හොමි. බහුධාපි හුත්වා එකො හොමි. ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡාමි, සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොමි සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභෙජ්ජමානෙ ගච්ඡාමි සෙය්‍යථාපි පඨවියං. ආකාසෙපි පල්ලඞ්කෙන චඞ්කමාමි[1] සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසුරියෙ එවම්මහිද්ධිකෙ එවම්මහානුභාවෙ පාණිනා පරාමසාමි පරිමජ්ජාමි, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාමි දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති දිබ්බාය සොතධාතුයා උභොසද්දෙ සුණාති -පෙ- යෙ දූරෙ සන්තිකෙ ච.

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි, පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාමි: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාමි. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාමි. සදොසං වා චිත්තං -පෙ- වීතදොසං වා චිත්තං -පෙ- සමොහං වා චිත්තං -පෙ- වීතමොහං වා චිත්තං -පෙ- සඞ්ඛිත්තං වා චිත්තං -පෙ- වික්ඛිත්තං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං-පෙ-විමුත්තං වා චිත්තං-පෙ-අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි - සෙය්‍යථීදං: "එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාලීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ "අමුත්‍රාසිං එවං නාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං එවන්නාමො එවංගොත්තො. එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො"ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති - සෙය්‍යථීදං: "එකම්පි ජාතිං -පෙ- ඉධූපපන්නො"ති ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

---

1. කමාමි - මජසං.

මහණෙනි, මම යම් තාක් කැමති වෙම් නම් (ඒ තාක්) නන්වැදෑරුම් සෘද්ධි කොටස් වළඳමි. එකෙක් ව ද බොහෝ පරිදි වෙමි. බොහෝ පරිදි ව ද එකෙක් වෙමි. ප්‍රකටබව ද සැඟවුනුබව ද (කරමි.) බිතුසරස පවුරුසරස පවුසරස අහසෙහි මෙන් නො ගැටෙමින් යෙමි. පොළොවෙහි ද දියෙහි මෙන් මතු වීම කිමිදීම කරමි. පොළොවෙහි මෙන් නො බිඳෙන දියෙහි ද යෙමි. පියාපත් ඇති ලිහිණියකු මෙන් අහසෙහි ද පලඟින් සක්මන් කරමි. මේ සා මහත් සෘද්ධි ඇති මේ සා මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙන ද අතින් පරාමර්ශනය කරමි. පිරිමදිමි. බඹලොව තෙක් ද කයින් වශයෙහි පවත්වමි මහණෙනි, කස්සප ද යම් තාක් කැමති වේ ද (ඒ තාක්) නන්වැදෑරුම් සෘද්ධි කොටස් වළඳයි ... බඹලොව තෙක් ද කයින් වශයෙහි පවත්වයි.

මහණෙනි, මම යම් තාක් කැමති වෙම් ද, (ඒ තාක්) විශුද්ධ වූ මනුෂ්‍ය විෂය ඉක්ම පැවති දිව්කණින් දිව්‍ය වූත් මනුෂ්‍ය වූත්, දුර වූත් ළඟ වූත්, දෙසද අසමි. මහණෙනි, කස්සප ද යම් තාක් කැමති වේ ද ... (ඒතාක්) දිව්කණින් දිව්‍ය වූත් මනුෂ්‍ය වූත් දුර වූත්, ළඟ වූත් දෙසද අසයි.

මහණෙනි, මම යම් තාක් කැමති වෙම් නම් (ඒ තාක්) අන්‍යසත්ත්වයන්ගේ අන්‍යපුද්ගලයන්ගේ සිත (තම) සිතින් පිරිසිඳ දැන ගණිමි: සරාග සිත හෝ සරාග සිතැයි දැන ගණිමි. වීතරාග සිත වීතරාග සිතැයි දැන ගණිමි. සදෝස සිත හෝ ... වීතදෝස සිත හෝ...සමෝහ සිත හෝ ... වීතමෝහ සිත හෝ ... සඞ්ඛිත්ත සිත හෝ ... වික්ඛිත්ත සිත හෝ ... මහග්ගත සිත හෝ ... අමහග්ගත සිත හෝ ... සඋත්තර සිත හෝ ... අනුත්තර සිත හෝ ... සමාහිත සිත හෝ... අසමාහිත සිත හෝ... විමුත්ත සිත හෝ ...අවිමුත්ත සිත හෝ අවිමුත්ත සිතැ යි දැන ගණිමි. මහණෙනි, කස්සප ද යම් තාක් කැමති වේ නම් (ඒ තාක්) පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ සිත (තම සිතින්) පිරිසිඳ දැන ගණියි: සරාග සිත හෝ සරාග සිතැ යි දැන ගණියි ... අවිමුත්ත සිත හෝ අවිමුත්ත සිතැයි දැන ගණියි.

මහණෙනි, මම යම් තාක් කැමති වෙම් ද (ඒ තාක්) පෙර විසූ කඳ පිළිවෙළ සිහි කෙරෙමි. ඒ මෙසේ යි: "එක් ජාතියක් ද, දෙජාතියක් ද, තුන් ජාතියක් ද, සිවු ජාතියක් ද, පස් ජාතියක් ද, දස ජාතියක් ද, විසි ජාතියක් ද, තිස් ජාතියක් ද, සාලිස් ජාතියක් ද, පණස් ජාතියක් ද, සිය ජාතියක් ද, දහස් ජාතියක් ද, සියදහස් ජාතියක්ද, නොයෙක් වැනසෙන කප් ද, නොයෙක් වැඩෙන කප් ද, නොයෙක් වැනසෙන වැඩෙන කප් ද" අසුවල් තැන මෙනම් ඇත්තෙම් මෙබඳු ගොත් ඇත්තෙම් මෙබඳු පැහැ ඇත්තෙම් මෙබඳු අහර ඇත්තෙම් මෙසේ සුවදුක් විඳිනෙම් මෙසේ ආයුකෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් අසුවල් තැන පහළ වීමි. එහි දු මෙ නම් ඇත්තෙම් මෙබඳු ගොත් ඇත්තෙම් මෙබඳු පැහැ ඇත්තෙම් මෙබඳු අහර ඇත්තෙම් මෙසේ සුවදුක් විඳිනෙම් මෙසේ ආයු කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත ව මෙහි උපන්මි"යි මෙසේ අයුරු සහිත උදෙසුම් සහිත නන්වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙමි. මහණෙනි, කස්සපද යම් තාක් කැමති වේ නම් (ඒ තාක්) නන්වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි. ඒ මෙසේ යි: "එක් ජාතියක් ද ... මෙහි උපන්මියි මෙසේ අයුරු සහිත උදෙසුම් සහිත නන්වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි.

අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි: චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි. ‘ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා’ති ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි: චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති -පෙ- චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

අහං භික්ඛවෙ, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමි. කස්සපොපි භික්ඛවෙ, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උප..මපජ්ජ විහරතීති.

## 4. 1. 10.

### භික්ඛුනූපස්සයසුත්තං

293 එකං සමයං ආයස්මා **මහාකස්සපො සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ අථ ඛො ආයස්මා **ආනන්දො** පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙනායස්මා මහාකස්සපො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකස්සපං එතදවොච: “ආයාම භන්තෙ, කස්සප, යෙනඤ්ඤතරො භික්ඛුනූපස්සයො තෙනුපසඞ්කමිස්සාමා”ති.

ගච්ඡ ත්වං ආවුසො ආනන්ද, බහුකිච්චො ත්වං බහුකරණීයොති

දුතියම්පි ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තං මහාකස්සපං එතදවොච: “ආයාම භන්තෙ කස්සප, යෙනඤ්ඤතරො භික්ඛුනූපස්සයො තෙනුපසඞ්කමිස්සාමා”ති

ගච්ඡ ත්වං ආවුසො ආනන්ද, බහුකිච්චො ත්වං බහුකරණීයොති.

තතියම්පි ඛො ආයස්මා ආනන්දො, ආයස්මන්තං මහාකස්සපං එතදවොච: “ආයාම භන්තෙ කස්සප, යෙනඤ්ඤතරො භික්ඛුනූපස්සයො තෙනුපසඞ්කමිස්සාමා”ති.

මහණෙනි, මම යම් තාක් කැමති වෙම් නම් (ඒ තාක්) විශුද්ධ වූ මිනිසැස ඉක්මවා පැවති දිවැසින් සත්ත්වයන් දකිමි: ච්‍යුත වන, උපදින, හීන ප්‍රණීත, මනා පැහැ ඇති, නපුරු පැහැ ඇති, මනා ගති ඇති, නපුරු ගති ඇති, කම් වූ පරිදි පැමිණි සතුන් දැන ගණිමි: 'මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිත-යෙන් සමන්විතහ. වාක්දුශ්චරිතයෙන් සමන්විතහ. මනෝදුශ්චරිතයෙන් සමන්විතහ. ආර්‍යයන්ට උපවාද කරන්නෝ ය. මිථ්‍යාදෘෂ්ටිකයෝ ය. මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝ ය. ඔහු කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති, විවස ව පතිත වන, නිරයට පැමිණියාහු ය. මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් සමන්විතහ, වාග්සුචරිතයෙන් සමන්විතයහ. මනඃසුචරිතයෙන් සමන්විතහ. ආර්‍යෝපවාද නො කරන්නෝ ය. සම්‍යග්-දෘෂ්ටි ගත්තෝ ය. සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන් වූවෝ ය. ඔහු කාබුන් මරණින් මතු මනා ගති ඇති ස්වර්ගලෝකයට පැමිණියහයි, මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්ම පැවති දිවැසින් සතුන් දකිමි. ච්‍යුත වන උපදින හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත යථාකර්මෝපග සත්ත්වයන් දැන ගණිමි. මහණෙනි, කස්සප ද යම් තාක් කැමති වේ නම් (ඒ තාක්) විශුද්ධ වූ මිනිසැස ඉක්ම පැවති දිවැසින් සතුන් දකී. ... ච්‍යුත වන උපදින හීනප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත යථාකර්මෝපග සත්ත්වයන් දැන ගණියි.

මහණෙනි, මම ආස්‍රවයන් ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ ඵලසමාධිය ද ඵලප්‍රඥාව ද මේ අත්බැව්හි ම තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට පැමිණ වෙසෙමි. මහණෙනි, කස්සප ද ආස්‍රවයන් ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ අර්හත් ඵලසමාධිය ද අර්හත් ඵලප්‍රඥාව ද මේ අත්බැව්හි ම තෙමේ ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට පැමිණ වෙසේ යි.

## 4. 1. 10.

### භික්ඛුනූපස්සය සූත්‍රය

293. එක්කලෙක ආයුෂ්මත් මහසුප් තෙරණුවෝ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ පෙරවරු හැඳ පොරවා පා සිවුරු ගෙණ ආයුෂ්මත් මහසුප් තෙරණුවන් වෙත එළඹියේ ය- එළඹ ආයුෂ්මත් මහසුප් තෙරණුවන්ට "වහන්ස, කාශ්‍යපයෙනි, යමු, එක්තරු මෙහෙණ අසපුවක් වෙත එළඹෙන්නෙමු" යි මෙය කී ය.

ඇවැත්නි, ආනන්දයෙනි, තෙපි යවු. තෙපි බොහෝ කිස ඇත්තහු, බොහෝ කටයුතු ඇත්තහු ය.

දෙවන වට දු ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙමේ ආයුෂ්මත් මහසුප් තෙරණුවන්ට "වහන්ස, කාශ්‍යපයෙනි, යමු, එක්තරා මෙහෙණ අසපුවක් වෙත එළඹෙන්නෙමු" යි මෙය කී ය.

ඇවැත්නි, ආනන්දයෙනි, තෙපි යවු. තෙපි බොහෝ කිස ඇත්තහු, තෙපි බොහෝ කටයුතු ඇත්තහු ය.

තෙවන වට දු ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ ආයුෂ්මත් මහසුප් තෙරණුවන්ට "වහන්ස, කාශ්‍යපයෙනි, යමු, එක්තරා මෙහෙණ අසපුවක් වෙත එළඹෙන්නෙමු" යි මෙය කී ය.

අථ ඛො ආයස්මා මහාකස්සපො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ආයස්මතා ආනන්දෙන පච්ඡාසමණෙන යෙන අඤ්ඤතරො භික්ඛුනුපස්සයො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

අථ ඛො සම්බහුලා භික්ඛුනියො යෙනායස්මා මහාකස්සපො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකස්සපං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තා භික්ඛුනියො ආයස්මා මහාකස්සපො ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො ආයස්මා මහාකස්සපො තා භික්ඛුනියො ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි

අථ ඛො ථුල්ලතිස්සා භික්ඛුනී අනත්තමනා අනත්තමනවාචං නිච්ඡාරෙසි: "කිං පන අය්‍යො[1] මහාකස්සපො අය්‍යස්ස ආනන්දස්ස වෙදෙහමුනිනො සම්මුඛා ධම්මං භාසිතබ්බං මඤ්ඤති? සෙය්‍යථාපි නාම සූචිවාණිජකො සූචිකාරස්ස සන්තිකෙ සූචිං වික්කෙතබ්බං මඤ්ඤෙය්‍ය, එවමෙවං අය්‍යො මහාකස්සපො අය්‍යස්ස ආනන්දස්ස වෙදෙහමුනිනො සම්මුඛා ධම්මං භාසිතබ්බං මඤ්ඤතී"ති.

අස්සොසි ඛො ආයස්මා මහාකස්සපො ථුල්ලතිස්සාය භික්ඛුනියා ඉමං වාචං භාසමානාය. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං ආනන්දං එතදවොච: "කින්නු ඛො ආවුසො ආනන්ද, අහං සූචිවාණිජකො, ත්වං සූචිකාරො? උදාහු අහං සූචිකාරො, ත්වං සූචිවාණිජකො"ති? ඛමථ[2] භන්තෙ කස්සප, බාලො මාතුගාමොති

ආගමෙහි ත්වං ආවුසො ආනන්ද, මා තෙ සංඝො උත්තරිං[3] උපපරික්ඛි.

තං කිං මඤ්ඤසි ආවුසො ආනන්ද? අපි නු ත්වං භගවතො සම්මුඛා භික්ඛුසංඝෙ උපනීතො: "අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරාමි. ආනන්දොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරතී"ති?

'නො හෙතං භන්තෙ.'

අහං ඛො ආවුසො භගවතො සම්මුඛා භික්ඛුසඞ්ඝෙ උපනීතො: "අහං භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛාමි විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරාමි. කස්සපොපි භික්ඛවෙ, යාවදෙ ආකඞ්ඛති විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි - පෙ - පඨමං ඣානං උපසම්පජ්ජ-විහරතී"ති

(නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනං පඤ්චන්නඤ්ච අභිඤ්ඤාණං පෙය්‍යාලො[4])

---

1. පන අය්‍යො-මජසං, සනා, PTS. 2. ඛම-මජසං. 3. උත්තරි - මජසං.
4. අභිඤ්ඤානං විත්ථාරො වෙදිතබ්බො - මජසං,

එකල්හි ආයුෂ්මත් මහසුප් තෙරණුවෝ පෙරවරු හැඳ පෙරව පා සිවුරු ගෙණ ආයුෂ්මත් අනඳතෙරුන් පසුමහණහු කොට ගෙණ එක්තරා මෙහෙණ අසපුවක් වෙත එළඹියහ. එළඹ පණවන ලද අසුන්හි වැඩහුන්හ

එකල්හි බොහෝ මෙහෙණහු ආයුෂ්මත් මහසුප් තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් මහසුප් තෙරණුවන් වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ මෙහෙණින් ආයුෂ්මත් මහසුප් තෙරණුවෝ දහැමි කතාවෙන් කරුණු දක්වූහ. සමාදන් කරවූහ. තෙද ගැන්වූහ. සතුටු කළහ ඉක්බිති ආයුෂ්මත් මහසුප් තෙරණුවෝ ඒ මෙහෙණින් දහැමි කතායෙන් කරුණු දක්වා, සමාදන් කරවා, තෙද ගන්වා, සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩියහ

එකල්හි ථුල්ලතිස්සා මෙහෙණ නො සතුටු සිත් ඇත්තී "කිමෙක් ද, ආර්ය වූ මහා කාශ්‍යප තෙරණුවෝ ආර්ය වූ වෛදේහ මුනි ආනන්ද තෙරණුවන් හමුයෙහි දහම් කිණිය යුතු ය සි හඟිද්ද? යම් සේ හිඳි වෙළෙඳෙක් හිඳිකරු ලඟ හිඳි විකිණිය යුතු ය යි හඟනේ නම්, එසෙයින් ම ආර්ය වූ මහසුප් තෙරණුවෝ ආර්ය වූ වෛදේහ මුනි අනඳ තෙරුන් හමුයෙහි දහම් කිණිය යුතු ය යි හඟිති"යි නො සතුටු වදන් කීණුවා ය.

ආයුෂ්මත් මහසුප් තෙරණුවෝ ථුල්ලතිස්සා මෙහෙණ මේ වදන් කියද්දී (අනෙකෙකු චිත් නැළකළ පරිදි) ඇසූහ. එකල්හි ආයුෂ්මත් මහසුප් තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට "ඇවැත්නි, ආනන්දයෙනි, කිමෙක් ද, මම හිඳි වෙළෙඳෙකිම් ද? නෙපි හිඳිකරු ද? නොහොත් මම හිඳිකරු වෙම් ද? නෙපි හිඳිවෙළෙඳෙක් දැ"යි? මෙය කීහ "වහන්ස කාශ්‍යපයෙනි, කමා කළ මැනවි. මාගම මෝඩය"යි

ඇවැත්නි, ආනන්දයෙනි, නෙපි සිටිවු. බික්සඟ තෙමේ මතු (අතිරේක කරුණෙක්හි) තොප නොපිරික්සාවා. (තොප කෙරෙහි සිකබුනී සත්වාදීන් සැක නො කෙරේවා.)

ඇවැත්නි, ආනන්දයෙනි, ඒ කිමැයි හඟිවු ද? "මහණෙනි, මම යම් තාක් කල් කැමති වෙම් ද (ඒ තාක්) කාමයන්ගෙන් වෙන් ව ම අකුශලධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානය උපදවා වෙසෙමි. මහණෙනි. ආනන්දත් යම් තාක් කල් කැමති වේ නම් (ඒ තාක්) කාමයන්ගෙන් වෙන් ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානය උපදවා වෙසේ"යි තෙපි භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි බික්සඟන කෙරෙහි (බුදුනට ප්‍රතිභාග ශ්‍රාවකයෙකු වශයෙන්) පමුණුවන ලද්හු ද?

'වහන්ස, මෙය නො වේ ම ය.'

ඇවැත්නි, මම් වූකලි "මහණෙනි, මම යම් තාක් කල් කැමති වෙම් ද (ඒ තාක්) කාමයන්ගෙන් වෙන් ව ම අකුසල ධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙමි. මහණෙනි, කාශ්‍යපත් යම් තාක් කල් කැමැති වේ ද (ඒ තාක්) කාමයන්ගෙන් වෙන් ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන් ව ම ... ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ"යි භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි බික්සඟන කෙරෙහි (බුද්ධප්‍රතිභාග ශ්‍රාවක වශයෙන්) පමුණුවන ලද්දෙම් වෙමි.

(ප්‍රථමධ්‍යානාදි නවවිධ අනුපූර්ව විහාරසමාපත්තීන්ගේ ද පඤ්චාභිඥාවන්ගේ ද පෙය්‍යාලය දතයුතු.)

තං කිං මඤ්ඤසි ආවුසො ආනන්ද, අපි නු ත්වං භගවතො සම්මුඛා භික්ඛුසඞ්ඝස්ස උපනීතො "අහං භික්ඛවෙ, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමි. ආනන්දොපි භික්ඛවෙ, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී"ති?

'නො හෙතං භන්තෙ.'

අහං ඛො ආවුසො භගවතො සම්මුඛා භික්ඛුසඞ්ඝස්ස උපනීතො "අහං භික්ඛවෙ, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා විහරාමි. කස්සපොපි භික්ඛවෙ ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී"ති.

සත්තරතනං වා සො ආවුසො නාගං අඩ්ඪට්ඨරතනං වා තාලපත්තිකාය ඡාදෙතබ්බං මඤ්ඤෙය්‍ය, යො මෙ ඡ අභිඤ්ඤා ඡාදෙතබ්බං මඤ්ඤෙය්‍යාති.

චවිත්ථ ච පන **ථුල්ලතිස්සා** භික්ඛුනී බ්‍රහ්මචරියම්හාති.

## 4. 1. 11.

## චීවරසුත්තං

294. එකං සමයං ආයස්මා **මහාකස්සපො** රාජගහෙ විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ**. තෙන ඛො පන සමයෙන ආයස්මා **ආනන්දො දක්ඛිණාගිරිස්මිං**[1] චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. තෙන ඛො පන සමයෙන ආයස්මතො ආනන්දස්ස තිංසමත්තා සද්ධිවිහාරිනො භික්ඛූ සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තා භවන්ති යෙභුය්‍යෙන කුමාරභූතා. අථ ඛො ආයස්මා ආනන්දො දක්ඛිණාගිරිස්මිං යථාභිරන්තං[2] චාරිකං චරිත්වා යෙන රාජගහං වෙළුවනං කලන්දකනිවාපො, යෙනායස්මා මහාකස්සපො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකස්සපං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං ආයස්මා මහාකස්සපො එතදවොච:

"කති නු ඛො ආවුසො ආනන්ද අත්ථවසෙ පටිච්ච භගවතා කුලෙසු තිකභොජනං පඤ්ඤත්තන්ති?"

තයො ඛො භන්තෙ කස්සප, අත්ථවසෙ පටිච්ච භගවතා කුලෙසු තිකභොජනං පඤ්ඤත්තං: දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, මා පාපිච්ඡා පක්ඛං නිස්සාය සංඝං භින්දෙය්‍යුං, කුලානුද්දයතාය ච.[3] ඉමෙ ඛො භන්තෙ කස්සප, තයො අත්ථවසෙ පටිච්ච භගවතා කුලෙසු තිකභොජනං පඤ්ඤත්තන්ති.

---

1. දක්ඛිණාගිරිස්මිං - මජසං. 2. යථාභිරන්තං - සිමු, සි 1,2
3. කුලානුද්දයතාය ච - සං.

ඇවැත්නි, ආනන්දයෙනි, ඒ කුමැයි හඟිවු ද, "මහණෙනි, මම ආස්‍රවයන් ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ අර්හත් ඵලසමාධියත් අර්හත් ඵලප්‍රඥාවත් මේ අත්බැව්හි ම තෙමේම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට පැමිණ වෙසෙමි. මහණෙනි, ආනන්දත් ආස්‍රවයන් ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ අර්හත් ඵලසමාධියත්, අර්හත් ඵලප්‍රඥාවත් මේ අත්බැව්හි ම තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට පැමිණ වෙසේ" යි තෙපි භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි භික්සඟන මැද පමුණුවන ලදහු ද?

'වහන්ස, එය නො වේ ම ය.'

"මහණෙනි, මම ආස්‍රවයන් ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ අර්හත් ඵලසමාධියත් අර්හත් ඵලප්‍රඥාවත් මේ අත්බැව්හි ම තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට පැමිණ වෙසෙමි. මහණෙනි, කාශ්‍යපත් ආස්‍රවයන් ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ අර්හත් ඵලසමාධියත් අර්හත් ඵලප්‍රඥාවත් මේ අත්බැව්හි ම තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට පැමිණ වෙසේ" යි ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි භික්සඟන මැද පමුණුවන ලද්දෙමි.

ඇවැත්නි, යමෙක් මාගේ ෂඩභිඥාවන් වැසිය හැකි ය යි හඟනේ නම් හෙතෙමේ සත්රියන් වූ හෝ අඩකින් අඩු අටරියන් (=සත්රියන් හමාරක්) වූ හෝ ඇතකු තල්පතකින් වැසිය හැකි ය යි හඟනේ ය.

**ථුල්ලතිස්සා** මෙහෙණ බඹසරින් චුත වූවා ය.

## 4. 1. 11.

## චීවර සූත්‍රය

294. එක් සමයෙක ආයුෂ්මත් **මහසුප්** තෙරණුවෝ **රජගහනුවර** සමීපයෙහි **කලන්දකනිවාප** නම් වූ **වේළුවනාරාමයෙහි** වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් **ආනන්දස්ථවිර** තෙමේ මහත් භික්සඟන සමග **දක්ඛිණාගිරි** දනව්වෙහි චාරිකාවෙහි හැසිරෙයි. එසමයෙහි ආයුෂ්මත් ආනන්ද තෙරුන්ගේ සද්ධිවිහාරික වූ බෙහෙවින් තරුණ වූ තිසක් පමණ භික්‍ෂූහු සිකපද පිළිකෙව් කොට ගිහි බවට පෙරළුනාහු වෙති. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ දකුණුගිරි දනව්වෙහි කැමතිතාක් චාරිකා කොට රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි ආයුෂ්මත් මහසුප් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහසුප් තෙරණුවන් වැඳ එකත්පසෙක හිඳ ගත්තේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට ආයුෂ්මත් මහසුප් තෙරණුවෝ මෙය කීහ:

"ඇවැත්නි, ආනන්දයෙනි, කෙතෙක් කරුණු නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් කුලයන්හි තිකභොජනය* පණවන ලද්දේ දැ"යි.

වහන්ස, කාශ්‍යපයෙනි, කරුණු තුණක් නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් කුලයන්හි තිකභෝජනය පණවන ලදි: දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහ කිරීම පිණිස ද, ප්‍රියශීල භික්‍ෂූන්ගේ පහසු විහරණය පිණිස ද, ලාමක අදහස් ඇත්තෝ (කුලවිතවා බුදිමින්) පක්‍ෂය (=එවැනි ලාමකයන්ගෙන් ම වඩාගත් සමූහයා) නිසා සඞසයා නො බිඳිත්වා යි ද, වැලි කුලයන් කෙරෙහි වූ අනුකම්පාව නිසා ද වේ. වහන්ස, කාශ්‍යපයෙනි, මේ කරුණු තුණ නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් කුලයන්හි තිකභොජනය පණවන ලදි.

---

* "ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියන්ති — ගණ භොජනයෙහි හෙවත් යටත් පිරිසෙයින් භික්‍ෂූන් සතර දෙනෙකුන් අකැපසේ පවරා කුලයන්හි දෙන බොජුනක් දුර්භික්‍ෂාදියක් නැති කල සතරදෙන එකතුව වැළඳීමෙහි පචිති ඇවැත් වී" ය යි පැණවූ ශික්‍ෂාපදය මෙහි තිකභොජන ය යි වදළහ. අකැප වූ ද පැවරුමෙකින් තිදෙනෙකු එක්ව කුලයන්හි වැළඳීම ආපත්තිකර නොවේ ය යි කී හෙයින් ද, කරුණු තුණක් සලකා පැණවූ හෙයින් ද මෙය 'තිකභොජන'ය යි ගත්තේ ය.

අථ කිඤ්චරහි ත්වං ආවුසො ආනන්ද ඉමෙහි නවෙහි භික්ඛූහි ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරෙහි භොජනෙ අමත්තඤ්ඤූහි ජාගරියං අනනුයුත්තෙහි සද්ධිං චාරිකං චරසි? සස්සඝාතං මඤ්ඤෙ චරසි. කුලූපඝාතං මඤ්ඤෙ චරසි. ඔලුජ්ජති[1] ඛො තෙ ආවුසො, ආනන්ද පරිසා පලුජ්ජන්ති ඛො තෙ ආවුසො නවප්පායා න වායං කුමාරකො මත්තමඤ්ඤාසීති.

"අපි මෙ භන්තෙ, කස්සප, සිරස්මිං පලිතානි ජාතානි. අථ ච පන මයං අජ්ජාපි ආයස්මතො මහාකස්සපස්ස කුමාරකවාදා න මුච්චාමා"ති.

තථා හි පන ත්වං ආවුසො ආනන්ද, ඉමෙහි නවෙහි භික්ඛූහි ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරෙහි භොජනෙ අමත්තඤ්ඤූහි ජාගරියං අනනුයුත්තෙහි සද්ධිං චාරිකං චරසි සස්සඝාතං මඤ්ඤෙ චරසි, කුලූපඝාතං මඤ්ඤෙ චරසි. ඔලුජ්ජති ඛො තෙ ආවුසො ආනන්ද පරිසා. පලුජ්ජන්ති ඛො තෙ ආවුසො නවප්පායා. න වායං කුමාරකො මත්තමඤ්ඤාසීති

අස්සොසි ඛො ථුල්ලනන්දා භික්ඛුනී "අය්‍යෙන කිර මහාකස්සපෙන අය්‍යො ආනන්දො වෙදෙහමුනි කුමාරකවාදෙන අපසාදිතො"ති අථ ඛො ථුල්ලනන්දා භික්ඛුනී අනත්තමනා අනත්තමනවාචං නිච්ඡාරෙසි. "කිං පන අය්‍යො මහාකස්සපො අඤ්ඤතිත්ථියපුබ්බො සමානො අය්‍යං ආනන්දං වෙදෙහමුනිං කුමාරකවාදෙන අපසාදෙතබ්බං මඤ්ඤතී"ති

අස්සොසි ඛො ආයස්මා මහාකස්සපො ථුල්ලනන්දාය භික්ඛුනියා ඉමං වාචං භාසමානාය. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං ආනන්දං එතදවොච: තග්ඝාවුසො ආනන්ද, ථුල්ලනන්දාය භික්ඛුනියා සහසා අප්පටිසඞ්ඛා වාචා භාසිතා. යතොහං[2] ආවුසො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො, නාභිජානාමි අඤ්ඤං සත්ථාරං උද්දිසිතුං අඤ්ඤත්‍ර තෙන භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන.

පුබ්බෙ මෙ ආවුසො අගාරියභූතස්ස සතො එතදහොසි. "සම්බාධො ඝරාවාසො රජාපථො[3], අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති සො ඛො අහං[4] ආවුසො අපරෙන සමයෙන පටපිලොතිකානං සඞ්ඝාටිං කරිත්වා[5] යෙ ලොකෙ අරහන්තො තෙ උද්දිස්ස කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං.

---

1. උල්ලුජ්ජති - සීමු, සීමු අට්ඨකථා. 2. යත්වාහං - මජසං. යතො වාහං - සී 1, 2.
3. රජොපථො - සීමු. 4. සො ඛ්වාහං - මජසං, ස්‍යා P T S. 5. කාරෙත්වා - මජසං.

ඇවැත්නි, ආනන්දයෙනි, ඉදින් එසේ නම් කුමක් හෙයින් තෙපි ඉඳුරන්හි නො රක්නා ලද දොර ඇති බොජුනෙහි පමණ නො දන්නා නිදි වැරීමෙහි නො යෙදුනු මේ නව භික්ෂූන් සමග චාරිකාවෙහි හැසිරෙවු ද? ශස්‍ය නසමින් හැසිරෙණු වැන්න. කුලයන් නසමින් හැසිරෙණු වැන්න. ඇවැත් ආනන්දයෙනි, තොපගේ පිරිස බිඳේ. ඇවැත්නි, බෙහෙවින් තරුණ වූ ඔහු බිඳෙත්. මේ ළදරු තෙමේ තමන් පමණ නො දනී යි.

"වහන්ස, කාශ්‍යපයෙනි, මාගේ හිසෙහි පලිතයෝත් (=පැසුනු කෙසුත්) හට ගත්හ. එහෙත් අද දු ආයුෂ්මත් මහසුප් තෙරණුවන්ගේ කුමාරක වාදයෙන් නො මිදෙමු" යි.

ඇවැත්නි, ආනන්දයෙනි, ඒ එසේ මැයි: (කුමාරකයන් සමග හැසිරෙණ බැවින් තෙපි දු කුමාරක වාදයට නිසි ය යි සූ යේ ය:) තෙපි ඉඳුරන්හි නො රක්නා ලද දොර ඇති බොජුනෙහි පමණ නො දන්නා නිදිවැරීමෙහි නො යෙදුණු මේ නවක භික්ෂූන් සමග චාරිකාවෙහි හැසිරෙවු. ශස්‍ය නසමින් හැසිරෙණු වැන්න. කුලයන් නසමින් හැසිරෙණු වැන්න. ඇවැත්නි, ආනන්දයෙනි, තොපගේ පිරිස බිඳේ. ඇවැත්නි, බෙහෙවින් නවක වූ ඔහු බිඳෙත්. මේ ළදරු තෙමේ තමන් පමණ නො ම දනී යි.

**ථුල්ලනන්දා** මෙහෙණ "ආර්‍ය වූ මහසුප් තෙරුන් විසින් ආර්‍ය වූ වේදේහ මුනි ආනන්ද ස්ථවිර තෙමේ කුමාරකවාදයෙන් ගරහන ලදැ"යි ඇසූ. එකල්හි ථුල්ලනන්දා මෙහෙණ නො සතුටු සිත් ඇත්තී "කිමෙක් ද, පෙර අන්තොටු වූ ම ආර්‍ය වූ මහසුප් තෙරණුවෝ ආර්‍ය වූ වෙදෙහමුනි ආනන්ද තෙරුන්ට කුමාරක වාදයෙන් ගැරහිය යුතු ය යි සිතද්දැ"යි නො සතුටු වදන් පහළ කළා ය.

ආයුෂ්මත් මහසුප් තෙරණුවෝ ථුල්ලනන්දා මෙහෙණ මේ වචන කියද්දී ඇසූහ. ඉක්බිති ආයුෂ්මත් මහසුප් තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට මෙය කීහ: ඇවැත්නි, ආනන්දයෙනි, ථුල්ලනන්දා මෙහෙණ විසින් ඒකාන්තයෙන් කරුණු නො සලකා ද්වේෂයෙන් වචන කියන ලදි. ඇවැත්නි, මම යම් කලෙක කෙස් රැවුල් බා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් ද, (එවක් පටන්) ඒ භාග්‍යවත් අර්හත් සම්මා-සම්බුද්ධරජාණන් වහන්සේ හැර අන් ශාස්තෘවරයකු (මාගේ ශාස්තෘ ය යි) උදෙසන්නට (=උදෙසූ බවක්) නො දනිම්.

ඇවැත්නි, පෙර ගිහිවූ ම මට "ගෘහවාසය සම්බාධ (=අවකාශ රහිත) ය, කෙලෙස් රජස් රැස්වන මඟ ය. පැවිද්ද අභ්‍යවකාශ ය. ගිහිගෙහි වසන්නහු විසින් එකැතින් පිරිපුන් එකැතින් පිරිසුදු දෙවූ සකක් බඳු කොට (මොහොතකුදු මල නො ගන්වා හැසිරිය යුතු) මේ බඹසර හැසිරෙන්නට සුකර නො වේ. මම කෙස් රැවුල් බා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම පැවිදි වන්නෙම් නම් මැනවැ"යි මේ සිත විය. ඇවැත්නි, ඒ මම පසුකලෙක මහගුවත් කඩකපාගත් පිළියෙන් සඟළ (සිවුරක්) කොට ගෙණ ලොව යම් රහත්හු වෙත් නම් ඒ රහතුන් උදෙසා කෙස් රැවුල් බා ඒ කසාවත් හැඳ ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙමි.

සො එවං පබ්බජිතො සමානො අද්ධානමග්ගපටිපන්නො අද්දසං භගවන්තං අන්තරා ච රාජගහං අන්තරා ච නාලන්දං බහුපුත්තෙ චෙතියෙ නිසින්නං. දිස්වාන මෙ එතදහොසි: සත්ථාරඤ්ච වතාහං පස්සෙය්‍යං භගවන්තමෙව පස්සෙය්‍යං, සුගතඤ්ච වතාහං පස්සෙය්‍යං භගවන්තමෙව පස්සෙය්‍යං, සම්මාසම්බුද්ධඤ්ච වතාහං පස්සෙය්‍යං භගවන්තමෙව පස්සෙය්‍යන්ති. සො ඛොහං ආවුසො තත්ථෙව භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: "සත්ථා මෙ භන්තෙ භගවා. සාවකොහමස්මි. සත්ථා මෙ භන්තෙ භගවා. සාවකොහමස්මී"ති.

එවං වුත්තෙ මං ආවුසො, භගවා එතදවොච: "යො ඛො කස්සප එවං සබ්බචෙතසා සමන්නාගතං සාවකං අජානඤ්ඤෙව වදෙය්‍ය ජානාමීති, අපස්සඤ්ඤෙව වදෙය්‍ය පස්සාමීති, මුද්ධාපි තස්ස විපතෙය්‍ය. අහං ඛො පන කස්සප ජානඤ්ඤෙව වදාමි ජානාමීති, පස්සඤ්ඤෙව වදාමි පස්සාමී"ති.

තස්මාතිහ තෙ කස්සප එවං සික්ඛිතබ්බං: "තිබ්බං මෙ හිරොත්තප්පං පච්චුපට්ඨිතං භවිස්සති ථෙරෙසු නවෙසු[1] මජ්ඣිමෙසූ"ති. එවං හි තෙ කස්සප සික්ඛිතබ්බං.

තස්මාතිහ තෙ කස්සප, එවං සික්ඛිතබ්බං: "යං කිඤ්චි ධම්මං සුණිස්සාමි[2] කුසලූපසංහිතං, සබ්බං තං අට්ඨිකත්වා මනසිකත්වා සබ්බචෙතසා සමන්නාහරිත්වා ඔහිතසොතො ධම්මං සුණිස්සාමී"ති. එවං හි තෙ කස්සප සික්ඛිතබ්බං.

තස්මාතිහ තෙ කස්සප, එවං සික්ඛිතබ්බං "සාතසහගතා ච මෙ කායගතා සති න විජහිස්සතී"ති. එවං හි තෙ කස්සප සික්ඛිතබ්බන්ති.

අථ ඛො මං ආවුසො, භගවා ඉමිනා ඔවාදෙන ඔවදිත්වා උට්ඨායාසනා පක්කාමි.

සත්තාහමෙව ඛො අහං ආවුසො සාණො[3] රට්ඨපිණ්ඩං භුඤ්ජිං අථ අට්ඨමියා අඤ්ඤා උදපාදි.

අථ ඛො ආවුසො, භගවා මග්ගා ඔක්කම්ම යෙන අඤ්ඤතරං රුක්ඛමූලං තෙනුපසඞ්කමි. අථ ඛොහං ආවුසො පටපිලොතිකං සඞ්ඝාටිං චතුග්ගුණං පඤ්ඤාපෙත්වා භගවන්තං එතදවොචං: "ඉධ භන්තෙ, භගවා නිසීදතු, යං මමස්ස[4] දීඝරත්තං හිතාය සුඛායා"ති. නිසීදි ඛො ආවුසො භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො මං ආවුසො භගවා එතදවොච: "මුදුකා ඛො ත්‍යායං කස්සප, පටපිලොතිකා සඞ්ඝාටී"ති. පටිග්ගණ්හාතු මෙ භන්තෙ භගවා පටපිලොතිකං සඞ්ඝාටිං, අනුකම්පං උපාදායාති.

1. නවකෙසු - සීමු 2. සුස්සාමි - සීමු, P T S. සී 1, 2. 3. සරණො - මජසං
4. මම අස්ස - සීමු, සී 1.

ඒ මම මෙසේ පැවිදි වූයෙම් ම අදත් මඟට පිළිපන්නෙමි. රජගහ-නුවරට ද නාලන්දාවට ද අතර බහුපුත්‍ර සෑයෙහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දිටිමි. දැක "මම ශාස්තෘවරයකු දක්නෙම් නම් මේ භාග්‍යවතුන් වහන්සේ ම මාගේ ශාස්තෘවශයෙන් දක්නෙමි. මම සුගත කෙනකුන් දක්නෙම් නම් මේ භාග්‍යවතුන් වහන්සේ ම දක්නෙමි. මම සම්මාසම්බුද්ධ කෙනකුන් දක්නෙම් නම් මේ භාග්‍යවතුන් වහන්සේ ම දක්නෙමි"යි මට මේ සිත විය. ඇවැත්නි, ඒ මම එහි ම භාග්‍යවතුන් වහන්සේගේ පා වෙත හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘවරයා ය. මම සවු වෙමි, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘවරයා ය. මම සවු වෙමි"යි* මෙය සැලකෙළෙමි.

ඇවැත්නි, මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ මට මෙය වදාළ සේක: "කස්සප, යමෙක් මෙසේ මුළුහිතින් සමන්විත වූ සවුවකු (ගුණ-විසින්) නො දන්නේ ම දනිමි යි (ස්වකීය ශාස්තෘභාවය ප්‍රතිඥා කෙරේ ද) නොදක්නේ ම දකිමි යි කියා ද, ඔහුගේ හිසත් ගිලිහෙන්නේ ය.(සත්කඩකට) පැලෙන්නේය. කස්සප, මම වනාහි (මාගේ ශාස්තෘභාවය) දන්නෙම් ම දනිමි යි කියමි. දක්නෙම් ම දකිමියි කියමි†

කස්සප, එහෙයින් (මා ශාස්තෘ බැවින්) තොප විසින් මෙහි මෙසේ හික්මිය යුතු: "ස්ථවිර නව මධ්‍යම භික්ෂූන් කෙරෙහි මාගේ දැඩි හිරි ඔතප් එළඹ සිටියේ වන්නේ" ය යි. කස්සප, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි.

කස්සප, එහෙයින් මෙහි තොප විසින් මෙසේ හික්මිය යුතු. "කුසල් ඇසුරු කළ යම්කිසි දහමක් අසන්නෙම් නම් ඒ සියලු දහම් (තමහට අර්ථයකැයි) අර්ථවත් කොට මෙනෙහි කරමින් මුළුහිත එක්කොට යොමු කළ කන් ඇති ව අසන්නෙමි" යි. කස්සප, තොප විසින් මෙසේ ම හික්මිය යුතු.

කස්සප, එහෙයින් මෙහි තොප විසින් මෙසේ ම හික්මිය යුතු. "සුඛසම්ප්‍රයුක්ත (ප්‍රථමධ්‍යාන සුඛයෙන් යුක්ත) වූ මාගේ කායගතාසතිය, නො මා හරණේ ය" යි. කස්සප, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි.

ඇවැත්නි, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ (ත්‍රිවිධ) අවවාදයෙන්‡ මට අවවාද කොට හුනස්නෙන් නැගී වැඩිසේක.

ඇවැත්නි, මම සත්දවසක් ම රටවැසියා විසින් දෙන පිණ්ඩාහාරය ණය ගැති ව වැළඳුවෙමි. ඉක්බිති අටවැනි දිනයෙහි මට රහත් බව පහළ විය.

ඇවැත්නි, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මගින් ඉවත් ව එක්තරා රුක්මුලකට එළඹි සේක. ඇවැත්නි, එකල්හි මම පටපිලොතිකායෙන් කළ සඟල සිවුර සිවුගුණ කොට පණවා භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහි වැඩ හිඳිනා සේක්වා, දිගු කලක් එය මට හිත පිණිස සැප පිණිස වනු ඇතැයි" මෙය සැලකෙළෙමි. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ පැණවූ අස්නෙහි වැඩහුන් සේක. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳ "කස්සප, මේ පටපිලොතිකා සඞ්ඝාටිය මෘදු ය"යි මෙය මට වදාළ සේක. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ පටපිලොතිකා සඞ්ඝාටිය අනුකම්පා කොට පිළිගන්නා සේක්වා යි සැලකෙළෙමි

---

* මෙය දෙවරක් කියූ සේ මෙහි දැක්වෙතත් තෙවරක් සැලකළ බව දත යුතු. මෙයින් මහසුප් මහ තෙරණුවෝ තමන්ගේ බුද්ධශ්‍රාවකභාවය පැවසූහ. මෙහි සාතිශය ප්‍රීති-සංවේගජනක විස්තරය අර්ථකථාවෙන් දත යුතු

† ඉදින් කාශ්‍යපයෝ අන්‍ය ශාස්තෘවරයෙකුට මෙබඳු පරම නිපාත්‍යාකාර ගෞරවයක් කෙරෙත් නම් ඒ ශාස්තෘහට එය ඉවසිය නොහෙන බවත්, බුදුරජුන්ගේ ශාස්තෘ මහත්වයත් මෙයින් කියූසේ ය.

‡ මේ ත්‍රිවිධ අවවාදය තෙරුන්ගේ පැවිද්ද හා උපසම්පදාව විය.

ධාරෙස්සසි පන මෙ ත්වං කස්සප සාණානි පංසුකූලානි නිබ්බසනානීති? ධාරෙස්සාමහං භන්තෙ භගවතො සාණානි පංසුකූලානි නිබ්බසනානීති.

සො ඛො අහං ආවුසො පටපිලොතිකානං සඞ්ඝාටිං භගවතො පාදාසිං අහං පන භගවතො සාණානි පංසුකූලානි නිබ්බසනානි පටිපජ්ජිං. යං හි තං ආවුසො සම්මා වදමානො වදෙය්‍ය "භගවතො පුත්තො ඔරසො මුඛතො ජාතො ධම්මජො ධම්මනිම්මිතො ධම්මදායාදො පටිග්ගහෙතා[1] සාණානි පංසුකූලානි නිබ්බසනානී"ති, මමං තං සම්මා වදමානො වදෙය්‍ය "භගවතො පුත්තො ඔරසො මුඛතො ජාතො ධම්මජො ධම්මනිම්මිතො ධම්මදායාදො පටිග්ගහෙතා සාණානි පංසුකූලානි නිබ්බසනානී"ති.

අහං ඛො ආවුසො යාවදෙ ආකඞ්ඛාමි විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහාරාමි.

අහං ඛො ආවුසො යාවදෙව ආකඞ්ඛාමි -පෙ- (නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනං පඤ්චන්නඤ්ච අභිඤ්ඤානං එවං විත්ථාරො වෙදිතබ්බො.[2])

අහං ඛො ආවුසො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමි.

සත්තරතනං වා සො ආවුසො[3] නාගං අඩ්ඪට්ඨරතනං වා තාලපත්තිකාය ඡාදෙතබ්බං මඤ්ඤෙය්‍ය, යො මෙ අභිඤ්ඤා ඡාදෙතබ්බං මඤ්ඤෙය්‍යාති.

චවිත්ථ ච පන ථුල්ලනන්දා භික්ඛුනී බ්‍රහ්මචරියස්මාති

## 4. 1. 12.

## තථාගත පරම්මරණසුත්තං

295. එකං සමයං ආයස්මා ච මහාකස්සපො ආයස්මා ච සාරිපුත්තො බාරාණසියං විහරන්ති ඉසිපතනෙ මිගදායෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාකස්සපො තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකස්සපං එතදවොච:

"කින්නු ඛො ආවුසො, කස්සප හොති තථාගතො පරම්මරණාති?

අබ්‍යාකතං ඛො එතං ආවුසො, භගවතා "හොති තථාගතො පරම්මරණා"ති.

1. පටිග්ගහිතානි - මජසං, සයා, PTS. පටිග්ගහිතො - සී 1, 2,
2. අභිඤ්ඤාණං එවං විත්ථාරෙතබ්බං - සිමු.
3. සත්තරතනං වා ආවුසො - මජසං, PTS.

කස්සප, තෙපි පරිභෝගයෙන් දිරාගිය හණවැහැරි(පිළි)යෙන් කළ මාගේ පවුල්සිවුරු දරන්නෙහි ද? වහන්ස, මම පරිභෝගයෙන් දිරාගිය හණවැහැරියෙන් කළ භාග්‍යවතුන් වහන්සේගේ පවුල්සිවුරු දරන්නෙමි යි.

ඇවැත්නි, මම මගේ වත් කඩ කපා කළ සඟළසිවුර භාග්‍යවතුන් වහන්සේට ප්‍රදානය කෙළෙමි. පරිභෝගයෙන් දිරාගිය හණවැහැරියෙන් කළ භාග්‍යවතුන් වහන්සේගේ පවුල්සිවුර මම පිළිගතිමි. ඇවැත්නි, මැනවින් සත්‍යය කියන්නෙක් "මුවෙන් (බුදුමුවෙන් නිකුත් අවවාදයෙන්) උපන්, ධර්මයෙන් හටගත්, ධර්මයෙන් නිමියා වූ ධර්මය දායාද කොට ඇති, පරිභෝගයෙන් දිරාගිය හණවැහැරිමුවා පවුල්සිවුරු පිළිගත්තා වූ, භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍ර (ළෙහි උපන් පුතා)ය"යි ඒ යමකු සඳහා කියන්නේ නම්' මැනවින් කියන්නේ "මුවෙන් උපන්, දහමෙන් හටගත්, දහමෙන් නිමියා වූ, දහම දායාද කොට ඇති, පරිභෝගයෙන් දිරාගිය හණවැහැරිමුවා පවුල්සිවුරු පිළිගත්තා වූ, භාග්‍යවතුන් වහන්සේගේ උරදපුත්‍රය" යි මට කියන්නේ ය.

ඇවැත්නි, මම යම් තාක් කල් කැමති වෙම් නම් (ඒ තාක්) කාමයන් කෙරෙන් වෙන් ව ම, අකුශල ධර්මයන් කෙරෙන් වෙන් ව ම, විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානය උපදවා වෙසෙමි.

ඇවැත්නි, මම යම් තාක් කල් කැමැති වෙම් නම් (ඒතාක්) (නවානුපූර්ව විහාර සමාපත්තීන්ගේ ද පඤ්චාභිඥාවන්ගේ ද විස්තරය පෙය්‍යාලයෙන් දත යුතු යි)

ඇවැත්නි, මම ආස්‍රවයන් ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ චිත්තසමාධියත් ඵලප්‍රඥාවත් මේ අත්බැව්හි ම තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ලබා වෙසෙමි.

ඇවැත්නි, යමෙක් මාගේ ෂඩභිඥාවන් වැසිය හැකි ය යි හඟනේ නම් හෙතෙමේ සත්රියන් වූ හෝ අඩකින් අඩු අටරියන් වූ හෝ ඇතකු තලපතෙකින් වැසිය හැකි ය යි හඟනේ ය

**ථුල්ලනන්දා**, මෙහෙණ බඹසරින් චුත වූවා ය.

## 4. 1. 12.

## තථාගත පරම්මරණ සූත්‍රය

295 එක්කලෙක ආයුෂ්මත් **මහසුප්** තෙරණුවෝ ද, ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ ද **බරණැස** සමීපයෙහි **මිගදාය** නම් වූ **ඉසිපතනාරාමයෙහි** වැඩ වෙසෙත්. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස් කාලයෙහි පලසමවතින් නැගී සිටියෝ ආයුෂ්මත් කසුප් තෙරුන් වෙත එළඹියහ ... එකත්පසෙක හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහසුප් තෙරුන්ට මෙය කීහ.

ඇවැත්නි, කාශ්‍යපයෙනි, කිමෙක් ද, තථාගත (සත්ත්ව) තෙමේ මරණින් මතුවේ ද?

ඇවැත්නි, "සත්ත්ව තෙමේ මරණින් මතු වෙයි" යන මේය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදාරණ ලදි.

කිං පනාවුසො, න හොති තථාගතො පරම්මරණාති?

එතම්පි[1] ඛො ආවුසො, අබ්‍යාකතං භගවතා "න හොති තථාගතො පරම්මරණා"ති.

කින්නු ඛො ආවුසො, හොති ච න හොති ච තථාගතො පරම්මරණාති?

අබ්‍යාකතං ඛො එතං ආවුසො භගවතා, "හොති ච න හොති ච තථාගතො පරම්මරණා"ති.

කිං පනාවුසො, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති?

එතම්පි ඛො ආවුසො, අබ්‍යාකතං භගවතා "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති.

කස්මා චෙතං ආවුසො, අබ්‍යාකතං භගවතාති?

න හෙතං ආවුසො අත්ථසංහිතං ආදිබ්‍රහ්මචරියකං, න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. තස්මා තං අබ්‍යාකතං භගවතාති.

අථ කිඤ්චරහාවුසො,[2] බ්‍යාකතං භගවතාති?

ඉදං දුක්ඛන්ති ඛො ආවුසො, බ්‍යාකතං භගවතා. අයං දුක්ඛසමුදයොති බ්‍යාකතං භගවතා. අයං දුක්ඛනිරොධොති බ්‍යාකතං භගවතා. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති බ්‍යාකතං භගවතාති.

කස්මා චෙතං ආවුසො බ්‍යාකතං භගවතාති?

එතං හි ආවුසො, අත්ථසංහිතං, එතං ආදිබ්‍රහ්මචරියකං, එතං නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. තස්මා තං භගවතා බ්‍යාකතන්ති

## 4. 1. 13.

## සද්ධම්මපතිරූපකසුත්තං

296. එකං සමයං භගවා සාවත්ථියං විහරති -පෙ-

අථ ඛො ආයස්මා මහාකස්සපො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකස්සපො භගවන්තං එතදවොච:

---

1 එවම්පි ඛො - මජසං, PTS.

කිඤ්චරහි ආවුසො - සී 1, 2.

ඇවැත්නි, කිමෙක් ද, සත්ත්ව තෙමේ මරණින් මතු නො වේ ද?

ඇවැත්නි "සත්ත්ව තෙමේ මරණින් මතු නො වෙයි" යන මේ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරණ ලදි.

ඇවැත්නි, කිමෙක් ද, සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේත් නො වන්නේත් වේ ද?

ඇවැත්නි, "සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේත් නො වන්නේත් වෙයි" යන මේද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරණ ලදී.

ඇවැත්නි, කිමෙක් ද, සත්ත්ව තෙමේ මරණින් මතු නො ම වන්නේත් නො ම නො වන්නේත් වේ ද?

ඇවැත්නි, "සත්ත්ව තෙමේ මරණින් මතු නො ම වන්නේත් නො ම නො වන්නේත් වෙයි" යන මේ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරණ ලදි.

ඇවැත්නි, කුමක් හෙයින් මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරණ ලද්දේ ද?

ඇවැත්නි, මෙය අර්ථ සහිත වූයේ නො වෙයි. මගබඹසරට මුල් වූයේ නො වෙයි. කලකිරීම පිණිස, නො ඇලීම පිණිස, නිරොධය පිණිස, ව්‍යුපශමය පිණිස, විශිෂ්ටඥානය පිණිස, සම්බොධිය පිණිස, නිවන පිණිස නො පවතී. එහෙයින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරණ ලදි.

ඇවැත්නි, වැලි, කිමෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලද්දේ ද?

ඇවැත්නි, 'මේ දුක'යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලදි. 'මේ දුක හටගැණීමේ හේතුව'යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලදි. 'මේ දුක නැති වීම වූ නිවන'යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලදි 'මේ දුක් නැති වීමට පමුණුවන පිළිවෙත'යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලදි.

ඇවැත්නි, කුමක් හෙයින් මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලද ද?

ඇවැත්නි, මෙය අර්ථ සහිත ය. මෙය මගබඹසරට මුල් වූයේ ය. මෙය කලකිරීම පිණිස, නො ඇලීම පිණිස, නිරොධය පිණිස, ව්‍යුපශමය පිණිස, විශිෂ්ටඥානය පිණිස, සම්බොධිය පිණිස, නිවන පිණිස පවතී. එහෙයින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලදී.

### 4. 1. 13

### සද්ධම්මපතිරූපක සූත්‍රය

296. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර සමීපයෙහි** ... වැඩ වසන සේක.

එකල්හි ආයුෂ්මත් **මහකාශ්‍යප** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ.... එකත්පසෙක හුන් ආයුෂ්මත් මහකසුප් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ:

කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙන පුබ්බෙ අප්පතරානි චෙව සික්ඛාපදානි අහෙසුං, බහුතරා ච භික්ඛූ අඤ්ඤාය සණ්ඨහිංසු? කො පන භන්තෙ. හෙතු කො පච්චයො යෙනෙතරහි බහුතරානි චෙව සික්ඛාපදානි අප්පතරා ච භික්ඛූ අඤ්ඤාය සණ්ඨහන්තීති?

එවං හෙතං කස්සප, හොති. සත්තෙසු හායමානෙසු, සද්ධම්මෙ අන්තරධායමානෙ, බහුතරානි චෙව සික්ඛාපදානි හොන්ති. අප්පතරා ච භික්ඛූ අඤ්ඤාය සණ්ඨහන්ති.

න තාව කස්සප, සද්ධම්මස්ස අන්තරධානං හොති, යාව න සද්ධම්ම-පතිරූපකං ලොකෙ උප්පජ්ජති. යතො ච ඛො කස්සප සද්ධම්මපතිරූපකං ලොකෙ උප්පජ්ජති, අථ සද්ධම්මස්ස අන්තරධානං හොති. සෙය්‍යථාපි කස්සප, න තාව ජාතරූපස්ස අන්තරධානං හොති යාව න ජාතරූප-පතිරූපකං ලොකෙ උප්පජ්ජති. යතො ච ඛො කස්සප ජාතරූපපතිරූපකං ලොකෙ උප්පජ්ජති, අථ ජාතරූපස්ස අන්තරධානං හොති. එවමෙව ඛො කස්සප, න තාව සද්ධම්මස්ස අන්තරධානං හොති, යාව න සද්ධම්ම-පතිරූපකං ලොකෙ උප්පජ්ජති. යතො ච ඛො කස්සප සද්ධම්මපති-රූපකං ලොකෙ උප්පජ්ජති, අථ සද්ධම්මස්ස අන්තරධානං හොති.

න ඛො කස්සප, පඨවිධාතු සද්ධම්මං අන්තරධාපෙති න ආපොධාතු සද්ධම්මං අන්තරධාපෙති න තෙජොධාතු සද්ධම්මං අන්තරධාපෙති. න වායොධාතු සද්ධම්මං අන්තරධාපෙති. අථ ඛො ඉධෙව තෙ උප්පජ්ජන්ති මොඝපුරිසා යෙ ඉමං සද්ධම්මං අන්තරධාපෙන්ති

සෙය්‍යථාපි කස්සප, නාවා ආදිකෙනෙව ඔපිලවති, න ඛො කස්සප, එවං සද්ධම්මස්ස අන්තරධානං හොති.

පඤ්ච ඛො මෙ කස්සප, ඔක්කමනීයා ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච?

ඉධ කස්සප, භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො සත්ථරි අගාරවා විහරන්ති අප්පතිස්සා, ධම්මෙ අගාරවා විහරන්ති අප්පතිස්සා, සඞ්ඝෙ අගාරවා විහරන්ති අප්පතිස්සා, සික්ඛාය අගාරවා විහරන්ති අප්පතිස්සා, සමාධිස්මිං අගාරවා විහරන්ති අප්පතිස්සා. ඉමෙ ඛො කස්සප, පඤ්ච ඔක්කමනීයා ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති.

වහන්ස, යම් හෙයකින් පෙර ශික්ෂාපදයෝත් ඉතා මඳ වූහු නම් ඉතා බොහෝ භික්ෂුහුත් රහත්බැව්හි පිහිටියාහු නම් ඊට හේතු කවරේ ද? ප්‍රත්‍යය කවරේ ද? වහන්ස, දැන් යම් හෙයකින් ශික්ෂාපදයෝත් ඉතා බොහෝ වෙත් නම් ඉතා මඳ වූ භික්ෂුහුත් රහත්බැව්හි පිහිටත් නම් ඊට හේතු කවරේ ද? ප්‍රත්‍යය කවරේ ද?

කස්සප, මෙය මෙසේ ම වෙයි. සත්ත්වයන් පිරිහෙන කල්හි සදහම් අතුරු-දන් වන කල්හි ශික්ෂාපදයෝත් ඉතා බොහෝ වෙති ඉතා මඳ වූ භික්ෂුහුත් රහත්බැව්හි පිහිටත්.

කස්සප, ලොව යම් තාක් සදහම් පිළිරුවෙක් (=සදහම් වැනි වූවෙක්) නූපදී ද, ඒ තාක් සදහම්හුගේ අතුරුදන් වීමෙක් නො වේ. කස්සප, ලොව යම් කලෙක සදහම්පිළිරුවෙක් උපදී ද, එකල්හි සදහම්හුගේ අතුරුදන් වීම වේ. කස්සප, යම් සේ ලොව යම් තාක් රන්බඳු දෙයක් නො හටගණී නම් ඒ තාක් රන් අතුරුදන් වීමෙක් නො වේ ද, කස්සප, ලොව යම් කලෙක රන්බඳු දෙයක් හටගණී නම් එකල්හි රන් පිළිබඳ අතුරුදන් වීම වේ ද, කස්සප, එසෙයින් ම ලොව යම් තාක් සදහම්පිළිරුවෙක් නූපදී ද, ඒ තාක් සදහම්හුගේ අතුරුදන් වීම නො වේ. කස්සප, යම් කලෙක ලොව සදහම්පිළිරුවෙක් උපදී ද, එකල්හි සදහම්හුගේ අතුරු-දන් වීම වේ

කස්සප, පඨවිධාතුව සදහම් අතුරුදන් නො කෙරෙයි. ආපෝධාතුව සදහම් අතුරුදන් නො කරයි. තේජෝධාතුව සදහම් අතුරුදන් නො කෙරෙයි. වායෝධාතුව සදහම් අතුරුදන් නො කෙරෙයි. වැලි, යම් කෙනෙක් මේ සදහම් අතුරුදන් කෙරෙද්ද, ඒ හිස් පුරුෂයෝ මේ සසුනෙහි ම උපදිත්

කස්සප, යම් සේ නැව වඩාලා බඩු ගැණීමෙන් ම ගිලේ ද, කස්සප, එසෙයින් (පරියත්ති ආදීන් පිරීමෙන්) සදහම් අතුරුදන් නො වේ.

කස්සප, පිරිහීමට හේතු වන මේ දහම් පසෙක් සදහම්හුගේ නැසීම පිණිස අතුරුදන් වීම පිණිස පවතී. කවර පසෙක් ද යත්:

කස්සප මේ සසුන්හි භික්ෂුහු භික්ෂුණීහු උපාසකයෝ උපාසිකාවෝ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තාහු යටත් පැවතුම් නැත්තාහු වෙසෙත්. ධර්මය කෙරෙහි ගෞරව නැත්තාහු යටත් පැවතුම් නැත්තාහු වෙසෙත්. සඞ්ඝයා කෙරෙහි ගෞරව නැත්තාහු යටත් පැවතුම් නැත්තාහු වෙසෙත්. ශික්ෂාව කෙරෙහි ගෞරව නැත්තාහු යටත් පැවතුම් නැත්තාහු වෙසෙත්. සමාධිය කෙරෙහි ගෞරව නැත්තාහු යටත් පැවතුම් නැත්තාහු වෙසෙත්. කස්සප, පිරිහීමට හේතු වන මේ දහම් පස සදහම්හුගේ නැසීම් පිණිස, අතුරුදන් වීම පිණිස පවතී.

පඤ්ච ඛො මෙ කස්සප, ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච? ඉධ කස්සප, භික්ඛූ භික්ඛු-නියො උපාසකා උපාසිකායො සත්ථරි සගාරවා විහරන්ති සප්පතිස්සා, ධම්මෙ සගාරවා විහරන්ති සප්පතිස්සා, සංඝෙ සගාරවා විහරන්ති සප්පතිස්සා, සික්ඛාය සගාරවා විහරන්ති සප්පතිස්සා, සමාධිස්මිං සගාරවා විහරන්ති සප්පතිස්සා ඉමෙ ඛො කස්සප, පඤ්ච ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තන්තීති

**කස්සපවග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

සන්තුට්ඨඤ්ච අනොත්තාපී චන්දූපමං කුලූපගං,
ජිණ්ණං තයො ච ඔවාදා ඣානාභිඤ්ඤා උපස්සයං,
චීවරං පරම්මරණං සද්ධම්මපතිරූපකන්ති.

**කස්සපසංයුත්තං සමත්තං.**

කස්සප, මේ දහම් පසෙක් සද්ධර්මයාගේ පැවැත්ම පිණිස නොනැසීම පිණිස අතුරුදන් නො වීම පිණිස පවතී. කවර පසෙක් ද යත්: කස්සප, මෙසස්නෙහි භික්ෂූහු භික්ෂුණීහු උපාසකයෝ උපාසිකාවෝ ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තාහු යටත් පැවතුම් ඇත්තාහු වෙසෙත්. ධර්මය කෙරෙහි ගෞරව ඇත්තාහු යටත් පැවතුම් ඇත්තාහු වෙසෙත්. සඞ්ඝයා කෙරෙහි ගෞරව ඇත්තාහු යටත් පැවතුම් ඇත්තාහු වෙසෙත්. ශික්ෂාව කෙරෙහි ගෞරව ඇත්තාහු යටත් පවතුම්, ඇත්තාහු වෙසෙත් සමාධිය කෙරෙහි ගෞරව ඇත්තාහු යටත් පැවතුම් ඇත්තාහු වෙසෙත්. කස්සප, මේ දහම්පස සද්ධර්මයාගේ පැවැත්ම පිණිස නො නැසීම පිණිස අතුරුදන් නො වීම පිණිස පවතී.

කස්සපවර්ගය පළමුවැනි යි.

එහි උද්දානය:

සන්තුට්ඨ, අනොත්තාපී, චන්දූපම, කුලූපග, ජිණ්ණ යන සූත්‍ර ය, ඔවාද-සූත්‍ර තුණ ය, ඣානාභිඤ්ඤා, උපස්සය, චීවර, පරම්මරණ, සද්ධම්මපතිරූපක සූත්‍ර ය යි සූත්‍ර තෙළෙසකි.

කස්සපසංයුත්තය නිමියේ ය.

# 5. ලාභසක්කාරසංයුත්තං

## 1. දාරුණවග්ගො

### 5. 1. 1.

### දාරුණසුත්තං

297. එවං මෙ සුතං එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො කටුකො ඵරුසො අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං "උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම. න ච නො[1] උප්පන්නො ලාභසක්කාරසිලොකො චිත්තං පරියාදාය ඨස්සතී"ති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

### 5. 1. 2

### බළිසසුත්තං

298 **සාවත්ථියං**-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො කටුකො ඵරුසො අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. සෙය්‍යථාපි භික්ඛවෙ බාළිසිකො ආමිසගතං බළිසං ගම්භීරෙ උදකරහදෙ පක්ඛිපෙය්‍ය. තමෙනං අඤ්ඤතරො ආමිසචක්ඛු මච්ඡො ගිලෙය්‍ය, එවං හි සො භික්ඛවෙ, මච්ඡො ගිලබළිසො[2] බාළිසිකස්ස අනයං ආපන්නො, ව්‍යසනං ආපන්නො, යථාකාමකරණීයො බාළිසිකස්ස. බාළිසිකොති ඛො භික්ඛවෙ මාරස්සෙතං පාපිමතො අධිවචනං. බළිසන්ති ඛො භික්ඛවෙ ලාභසක්කාරසිලොකස්සෙතං අධිවචනං

යො හි කොචි භික්ඛවෙ, භික්ඛු උප්පන්නං ලාභසක්කාරසිලොකං අස්සාදෙති නිකාමෙති, අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු ගිලබළිසො[2] මාරස්ස අනයං ආපන්නො, ව්‍යසනං ආපන්නො, යථාකාමකරණීයො පාපිමතො, එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො කටුකො ඵරුසො අන්තරායිකො යොගක්ඛෙමස්ස අධිගමාය. තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: "උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම. "න ච නො උප්පන්නො ලාභසක්කාරසිලොකො චිත්තං පරියාදාය ඨස්සතී"ති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

---

1. න චන නො - සී 1, 2.
2. ගිලිතබළිසො - සීමු. PTS

# 5. ලාභසක්කාරසංයුත්තය

## 1. දරුණවර්ගය

### 5. 1. 1

### දරුණ සූත්‍රය

297. මා විසින් මෙසේ අසන ලදි: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'වහන්සැ' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය, තියුණු ය, රළු ය, අනුත්තර වූ අර්හත්ත්වාවබෝධය පිණිස අන්තරාය කර ය. එහෙයින් මහණෙනි, මෙහි මෙසේ හික්මිය යුතු:–"උපන් ලාභසත්කාර කීර්ති-ප්‍රශංසා බැහැර කරන්නෙමු. උපන් ලාභසත්කාර කීර්තිප්‍රශංසා අපගේ සිත ක්‍ෂයකොට ගෙණ නොම සිටිනේ" ය යි මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතු මැ යි.

### 5. 1. 2.

### බළිස සූත්‍රය

298. සැවැත්නුවර-

මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය, තියුණු ය, රළු ය· අනුත්තර වූ අර්හත්ත්වාවබෝධය පිණිස අන්තරාය කර ය. මහණෙනි, යම් සේ බිළී වැද්දෙක් ඇමිත් යුත් බිළිය ගැඹුරු දිය විලෙක බහන්නේ ද, ඇමෙහි ලූ ඇස් ඇති එක්තරු මසෙක් එය ගිලිනේ ය මහණෙනි, මෙසේ ඒ මසු තෙමේ බිළිය ගිලගන්නේ දුකට පැමිණියේ වැනසුමට පැමිණියේ බිළීවැදි විසින් කැමති සේ කටයුත්තෙක් වන්නේ ය. මහණෙනි, "බිළීවැද්ද" යනු පවිටු මරුට මේ නමෙකි. මහණෙනි, "බිළිය" යනු ලාභසත්කාර කීර්තිප්‍රශංසාවනට මේ නමෙකි.

මහණෙනි, යම් කිසි මහණෙක් උපන් ලාභසත්කාරකීර්තිප්‍රශංසා ආස්වාද කෙරේ ද, කැමැති වේ ද, මහණෙනි, මේ මහණ තෙමේ ගිලගත් බිළී ඇත්තේ දුකට පැමිණියේ වැනසුමට පැමිණියේ පවිටු මරු විසින් කැමති සේ කටයුත්තෙක් ය යි කියනු ලැබේ. මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය, තියුණු ය, රළු ය, අනුත්තර වූ අර්හත්ත්වාව-බෝධය පිණිස අන්තරාය කර ය, මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු. "උපන් ලාභ සත්කාරකීර්තිප්‍රශංසා දුරුකරන්නෙමු. උපන් ලාභසත්කාර කීර්තිප්‍රශංසා අපගේ සිත ක්‍ෂය කොට නොම සිටිනේ ය"යි මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතු මැ යි.

### 5. 1. 3.

## කුම්මසුත්තං

299 සාවත්‍ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

භූතපුබ්බං භික්ඛවෙ, අඤ්ඤතරස්මිං උදකරහදෙ මහාකුම්මකුලං චිරනිවාසි අහොසි. අථ ඛො භික්ඛවෙ, අඤ්ඤතරො කුම්මො අඤ්ඤතරං කුම්මං එතදවොච: “මා ඛො ත්වං තාත කුම්ම, එතං පදෙසං අගමාසී”ති අගමාසි ඛො භික්ඛවෙ, සො කුම්මො තං පදෙසං. තමෙනං ලුද්දො පපතාය විජ්ඣි. අථ ඛො භික්ඛවෙ, සො කුම්මො යෙන සො කුම්මො තෙනුපසඞ්කමි. අද්දසා ඛො භික්ඛවෙ සො කුම්මො තං කුම්මං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන තං කුම්මං එතදවොච: කච්චි ත්වං තාත කුම්ම, න තං පදෙසං අගමාසීති? අගමාසිං ඛො අහං තාත කුම්ම, තං පදෙසන්ති. කච්චි පනාසි තාත කුම්ම, අක්ඛතො අනුපහතොති? අක්ඛතො ඛොම්හි තාත කුම්ම, අනුපහතො. අත්‍ථි පන මෙ[1] ඉදං සුත්තකං පිට්ඨිතො පිට්ඨිතො, අනුබද්ධන්ති.[2]

තඝස්සසි[3] තාත කුම්ම, ඛතො උපහතො. එතෙන හි තෙ තාත කුම්ම, සුත්තකෙන පිතරො ච පිතාමහා ච අනයං ආපන්නා ව්‍යසනං ආපන්නා. ගච්ඡදානි ත්වං තාත කුම්ම, න දානි ත්වං අම්හාකන්ති

ලුද්දොති[4] ඛො භික්ඛවෙ, මාරස්සෙතං පාපිමතො අධිවචනං. පපතාති ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකස්සෙතං අධිවචනං. සුත්තකන්ති ඛො භික්ඛවෙ නන්දිරාගස්සෙතං අධිවචනං. යො හි කොචි භික්ඛවෙ භික්ඛු උප්පන්නං ලාභසක්කාරසිලොකං අස්සාදෙති, නිකාමෙති, අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු ගිද්ධො පපතාය අනයං ආපන්නො, ව්‍යසනං ආපන්නො, යථාකාම-කරණීයො පාපිමතො. එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාර සිලොකො -පෙ- [තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: උප්පන්නං ලාභ-සක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

### 5. 1. 4.

## දීඝලොමිඑළකසුත්තං

300. සාවත්‍ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො - පෙ -.

සෙය්‍යථාපි භික්ඛවෙ දීඝලොමිකා එළකා කණ්ටකාගහනං පවිසෙය්‍ය, සා තත්‍ර තත්‍ර සජ්ජෙය්‍ය, තත්‍ර තත්‍ර ගය්හෙය්‍ය,[5] තත්‍ර තත්‍ර බජ්ඣෙය්‍ය, තත්‍ර තත්‍ර අනයව්‍යසනං ආපජ්ජෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ, ඉධෙකච්චො භික්ඛු ලාභසක්කාරසිලොකෙන අභිභූතො පරියාදින්නචිත්තො[6] පුබ්බණ්හ-සමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති, සො තත්‍ර තත්‍ර සජ්ජති, තත්‍ර තත්‍ර ගය්හති.[7] තත්‍ර තත්‍ර බජ්ඣති, තත්‍ර තත්‍ර අනයව්‍යසනං ආපජ්ජති. එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාර-සිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම =පෙ-] එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

---

1. අත්‍ථි ච මෙ —මජ්සං, P T S. 2. අනුබන්ධන්ති—මජ්සං: ස්‍යා, P T S.
3. තග්ඝසි—ස්‍යා 4. ලුද්දකොති—සීමු, සී 1, 2, P T S.
5. ගච්ජෙය්‍ය - සීමු. ගණ්හෙය්‍ය, PTS, ස්‍යා. 6. පරියාදින්න චිත්තො - සීමු, මජ්සං.
7. ගච්ජති - සීමු.

## 5. 1. 3.

## කුම්ම සූත්‍රය

299. සැවත්නුවර-

මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණු ය. ...

මහණෙනි, පෙර වූවක් කියමි. එක්තරා දියවිලෙක මහ කැසුප් කුලක් දිගුකලක් වුසුයේ විය. මහණෙනි, එකල්හි එක්තරා කැසුබුවෙක් අනෙක් කැසුබුවකුට "පුත, කැස්බ, තෝ මේ පෙදෙසට නො යා "යි මෙය කී ය. ඒ කැසුබු ඒ පෙදෙසට ගියේ ය. උහුට වැද්දෙක් යොත් බත් යකටුවකින් විද්දේ ය. මහණෙනි, එකල්හි ඒ කැසුබු ඒ කැසුබුවා වෙත එළඹියේ ය. මහණෙනි. ඒ කැසුබු තෙමේ එන්නා වූ ඒ කැසුබුවා දුර දී ම දුටුයේ ය. දැක ඒ කැසුබුවාට මෙය කී ය පුත, කැස්බ, කිම? තෝ ඒ පෙදෙසට නො ගියෙහි ද? පියේ, කැස්බ, මම ඒ පෙදෙසට ගියෙමි යි. පුත, කැස්බ, කිම? අක්‍ෂත (නුබුත් සිරුරු ඇති) යෙහි ද? අනුපහත (නොනැසුනේ) වෙහිද? පියේ, කැස්බ, අක්‍ෂතයෙමි, අනුපහතයෙමි. එහෙත් මා පසුපස ලුහුබැඳි මේ හුයෙක් ඇතැයි.

පුත, කැස්බ, ඒකාන්තයෙන් ක්‍ෂත වූයේ උපහත වෙහි. පුත, කැස්බ, මේ හුයෙන් තාගේ පියහු ද මුත්තු ද දුකට පැමිණියහ. විපතට පැමිණියහ. පුත, කැස්බ, දැන් තෝ යව දැන් තෝ අපගේ නො වෙහි යි.

මහණෙනි, 'වැද්දා' යනු පවිටු මරුට මේ නමෙකි මහණෙනි, 'යකටු' යනු ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවනට මේ නමෙකි. මහණෙනි, 'හුය' යනු තෘෂ්ණාවට මේ නමෙකි. මහණෙනි, යම් කිසි මහණෙක් උපන් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ආස්වාද කෙරේ ද, කැමති වේ ද, මහණෙනි, මේ මහණ තෙමේ ගිජු වූයේ යකටුවෙන් දුකට පැමිණියේ වැනසුමට පැමිණියේ පවිටු මරු විසින් කැමති සේ කටයුත්තේ ය යි කියනු ලැබේ මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා මෙසේ දරුණු ය. ... උපන් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා බැහැරලමු... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 5. 1. 4

## දීඝලෝමි එළක සූත්‍රය.

300. සැවත්නුවර-

මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණු ය...

මහණෙනි, යම් සේ දික්ලොම් ඇති එළුදෙනක් කටුලැහැබකට පිවිසියාද, හි ඒ ඒ තන්හි ඇලෙන්නී ය. ඒ ඒ තන්හි ගැණෙන්නී ය, ඒ ඒ තන්හි බැඳෙන්නී ය. ඒ ඒ තන්හි දුකට විපතට පැමිණෙන්නී ය. මහණෙනි, එසෙයින් ම මෙහි ඇතැම් මහණෙක් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසායෙන් මඩනා ලද්දේ ගන්නා ලද සිත් ඇත්තේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ ගමකට හෝ නියම්ගමකට හෝ පිඬු පිණිස පිවිසේ ද, හෙතෙමේ ඒ ඒ තන්හි ඇලෙයි ඒ ඒ තන්හි ගැණෙයි ඒ ඒ තන්හි බැඳෙයි. ඒ ඒ තන්හි දුකට විපතට පැමිණෙයි. මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය උපන් ලාභ සත්කාර කීර්තිප්‍රශංසා බැහැර ලමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 5. 1. 5.

## මීළ්හකසුත්තං

301. සාවත්ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

සෙය්‍යථාපි භික්ඛවෙ, මීළ්හකා[1] ගූථාදී, ගූථපූරා, පුණ්ණා ගූථස්ස, පුරතො චස්ස මහාගූථපුඤ්ජො. සා තෙන අඤ්ඤා මීළ්හකා අතිමඤ්ඤෙය්‍ය: අහං හි ගූථාදී, ගූථපූරා, පුණ්ණා ගූථස්ස, පුරතො ච ම්‍යායං මහාගූථපුඤ්ජොති.

එවමෙව ඛො භික්ඛවෙ, ඉධෙකච්චො භික්ඛු ලාභසක්කාරසිලොකෙන අභිභූතො පරියාදින්නචිත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති. සො තත්ථ භුත්තාවී ච හොති යාවදත්ථො, නිමන්තිතො ච ස්වාතනාය, පිණ්ඩපාතො චස්ස පූරො. සො ආරාමං ගන්ත්වා භික්ඛුගණස්ස මජ්ඣෙ විකත්ථති:[2] භුත්තාවී චම්හි යාවදත්ථො, නිමන්තිතොචම්හි ස්වාතනාය, පිණ්ඩපාතො ච ම්‍යායං පූරො, ලාභී චම්හි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ අප්පපුඤ්ඤා අප්පෙසක්ඛා න ලාභිනො චීවරපිණ්ඩපාත සෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. සො තෙන ලාභසක්කාරසිලොකෙනාභි-භූතො පරියාදින්නචිත්තො අඤ්ඤෙ පෙසලෙ භික්ඛූ අතිමඤ්ඤති. තං හි තස්ස භික්ඛවෙ, මොඝපුරිසස්ස හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති

## 5. 1. 6

## අසනිවිචක්කසුත්තං

302. සාවත්ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

කං භික්ඛවෙ, අසනි විචක්කං ආගච්ඡතු? සෙඛං අප්පත්තමානසං ලාභසක්කාරසිලොකො අනුපාපුණාතු.[3] "අසනි විචක්කන්ති" ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකස්සෙතං අධිවචනං. එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො, -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

## 5. 1. 7.

## දිද්ධවිසල්ලසුත්තං.

303. සාවත්ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

කං භික්ඛවෙ, දිද්ධගතෙන විසල්ලෙන[4] සල්ලෙන විජ්ඣතු? සෙඛං අප්පත්තමානසං ලාභසක්කාරසිලොකො අනුපාපුණාතු. 'විසල්ල'න්ති ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකස්සෙතං අධිවචනං. එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති,

---

1. එළකා - පිළකා - PTS. කාසළකා - ස්‍යා. 2. විකත්ථෙති - ස්‍යා. විකත්ථෙන්ති-සීමු.
3. අනුපාපුණාති - PTS. 4. දිට්ඨගතෙන සල්ලෙන විජ්ඣතු-ස්‍යා, දිද්ධගතෙන විසල්ලෙන - සීමු.

## 5. 1. 5.

## මීළ්හක සූත්‍රය

301 **සැවැත්නුවර-**

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, යම්සේ වර්චස් බුදිත වර්චස් හරිත වර්චසින් පිරුණු මීළ්හක වර්චස් බුදිතා) පණුවෙක් වේ ද, ඉදිරියෙහිත් මහා වර්චස් පිඬෙක් වන්නේ ද, ඕ එයින් “මම් වූ කලි වර්චස් කන්නෙමි වර්චස් හරිතයෙමි වර්ච සි න් පිරුණෙමි වෙමි මා ඉදිරියෙහිත් මේ අශුචිපිඬෙක් වේ ය”යි අන් මීළ්හකාවන් ඉක්මවා සිතයි.

මහණෙනි, එසෙයින් ම මෙහි ඇතැම් මහණෙක් ලාභ සත්කාර කීර්තිප්‍රශංසායෙන් මඩනා ලද්දේ හාත්පසින් පැහැරගන්නා ලද හිත් ඇත්තේ පෙරවරු හැඳ පොරොවා පාසිවුරු ගෙණ ගමකට හෝ නියම්ගමකට හෝ පිඩු පිණිස පිවිසේ. හෙතෙමේ එහි දී ඇති තාක් වැළඳුයේත් සෙට පිණිස පවරණ ලද්දේත් වෙයි. පිණ්ඩපාතය ද පිරුණේ වන්නේ ය හෙතෙම අරමට ගොස් මහණගණා මැද “මම ඇති තාක් වැළඳුයෙමි ද වෙමි. සෙට පිණිස පවරණ ලද්දෙමි ද වෙමි. මාගේ මේ පිණ්ඩපාතය ද පිරුණේ ය. සිවුරු පිඬුසෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන සුල්ලෙමි ද වෙමි. මේ අන් මහණහු මඳ පිණැත්තහ, අල්පේශාක්‍යයහ. සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකර නො ලබන සුල්ලහ” යි තමා වණයි. හෙ තෙමේ ඒ ලාභ සත්කාර කීර්තිප්‍රශංසායෙන් මඩනා ලද්දේ ගන්නා ලද සිත් ඇත්තේ අනෙක් ප්‍රියශීල භික්ෂූන් ඉක්මවා සිතයි. මහණෙනි, එය ඒ හිස්පුරුෂයාහට දිගුකලක් අහිත පිණිස දුක් පිණිස වේ. මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය ... උපන් ලාභසත්කාර කීර්ති ප්‍රශංසා බැහැරලන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු ම ය.

## 5 1 6.

## අසනිවක්ක සූත්‍රය.

302 **සැවැත්නුවර —**

මහණෙනි, ලාභසත්කාර කීර්ති ප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, හෙනසක කවරකු කරා පැමිණිය හෙයි ද? නො පැමිණි රහත්බැව් ඇති ශෛක්ෂයා වෙත ය. ලාභසත්කාර කීර්තිප්‍රශංසා (ඔහු කරා) පැමිණිය හෙයි. මහණෙනි, “හෙනසක” යනු ලාභසත්කාර කීර්තිප්‍රශංසා-වනට මේ නමෙකි. මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය... උපන් ලාභසත්කාර කීර්ති ප්‍රශංසා බැහැර ලන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 5. 1. 7.

## දිද්ධවිසල්ල සූත්‍රය

303. **සැවැත්නුවර —**

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, විසපී විස වැකි හුලෙකින් කවරකුට විදිය හේ ද? නො පැමිණි රහත්බැව් ඇති ශෛක්ෂයාට ය ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා (ඔහු වෙත) පැමිණිය හෙයි. මහණෙනි, “හුල” යනු ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා-වනට මේ නමෙකි. මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා මෙසේ දරුණු-ය ... උපන් ලාභසත්කාර කීර්ති ප්‍රශංසා බැහැර ලන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

5. 1 8.

## සිඞාලසුත්තං[1]

304 සාවත්ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

අස්සුත්ථ[2] නො තුම්හෙ භික්ඛවෙ, රත්තියා පච්චූසසමයං ජරසිගාලස්ස වස්සමානස්සාති? එවං භන්තෙ, එසො ඛො භික්ඛවෙ, ජරසිගාලො උක්කණ්ඩකෙන[3] නාම රොගජාතෙන ඵුට්ඨො නෙව බිලගතො රමති. න රුක්ඛමූලගතො රමති. න අජ්ඣොකාසගතො රමති. යෙන යෙන ගච්ඡති, යත්ථ යත්ථ තිට්ඨති, යත්ථ යත්ථ නිසීදති, යත්ථ යත්ථ නිපජ්ජති, තත්ථ තත්ථ අනයබ්‍යසනං ආපජ්ජති.

එවමෙව ඛො භික්ඛවෙ, ඉධෙකච්චො භික්ඛු ලාභසක්කාරසිලොකෙන අභිභූතො පරියාදින්නචිත්තො නෙව සුඤ්ඤාගාරගතො රමති. න රුක්ඛමූලගතො රමති. න අජ්ඣොකාසගතො රමති. යෙන යෙන ගච්ඡති, යත්ථ යත්ථ තිට්ඨති, යත්ථ යත්ථ නිසීදති, යත්ථ යත්ථ නිපජ්ජති, තත්ථ තත්ථ අනයබ්‍යසනං ආපජ්ජති එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

5. 1. 9

## වෙරම්භසුත්තං

305. සාවත්ථියං -

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

උපරි භික්ඛවෙ, ආකාසෙ වෙරම්භා[4] නාම වාතා වායන්ති. තත්ථ යො පක්ඛී ගච්ඡති, තමෙනං වෙරම්භා වාතා ඛිපන්ති. තස්ස වෙරම්භවාතඛිත්තස්ස[5] අඤ්ඤෙනෙව පාදා ගච්ඡන්ති, අඤ්ඤෙන පක්ඛා ගච්ඡන්ති, අඤ්ඤෙන සීසං ගච්ඡති, අඤ්ඤෙන කායො ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ, ඉධෙකච්චො භික්ඛු ලාභසක්කාරසිලොකෙන අභිභූතො පරියාදින්නචිත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති, අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්ථ පස්සති මාතුගාමං දුන්නිවත්ථං වා දුප්පාරුතං වා. තස්ස මාතුගාමං දිස්වා දුන්නිවත්ථං වා දුප්පාරුතං වා රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසිතෙන චිත්තෙන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති තස්ස අඤ්ඤෙ චීවරං හරන්ති. අඤ්ඤෙ පත්තං හරන්ති. අඤ්ඤෙ නිසීදනං හරන්ති. අඤ්ඤෙ සූචිඝරං හරන්ති. වෙරම්භවාතඛිත්තස්සෙව සකුණස්ස. එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

---

1. සිඞ්ගාල සුත්තං - මජ්සං. 2. අස්සත්ථ - සයා. 3. උක්කන්තකෙන - සීමු. උක්කණ්ණකෙන-සයා. PTS. 4. වෙරම්බා-මජ්සං. 5. වෙරම්භවාතෙ ඛිත්තස්ස- සීමු, සී 1, 2 වෙරම්භවාතුක්ඛිත්තස්ස -සයා.

## 5. 1. 8.

## සිඟාල සූත්‍රය

304. සැවැත්නුවර —

මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, තෙපි රෑ පැසුළු යම හඬලන ජරසිවලකුගේ හඬ ඇසුහු ද? එසේය, ස්වාමීනි. මහණෙනි, මේ ජරසිවලා උක්කණ්ණක නම් රෝග ජාතියෙන් පහස්නා ලද්දේ බිලයට ගියේ නො ම ඇලෙයි. රුක්මුලට ගියේ නො ම ඇලෙයි. අබවසට ගියේ නො ම ඇලෙයි. යම් යම් තැනෙක යේ ද, යම් යම් තැනෙක සිටී ද, යම් යම් තැනෙක හිඳී ද, යම් යම් තැනෙක හොවී ද, ඒ ඒ තැන්හි දුකට පීඩාවට පැමිණෙයි.

මහණෙනි, එසෙයින් ම මෙහි ඇතැම් මහණෙක් ලාභ සත්කාර කීර්ති-ප්‍රශංසායෙන් මඩනා ලද්දේ ගන්නා ලද සිත් ඇත්තේ ශූන්‍යාගාරයට ගියේ නො ම ඇලෙයි. රුක්මුලට ගියේ නො ම ඇලෙයි. අබවසට ගියේ නො ම ඇලෙයි. යම් යම් තැනෙක යේ ද, යම් යම් තැනෙක සිටී ද, යම් යම් තැනෙක හිඳී ද, යම් යම් තැනෙක හොවී ද, ඒ ඒ තැන්හි දුකට පීඩාවට පැමිණෙයි. මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු යි ... උපන් ලාභ සත්කාර කීර්තිප්‍රශංසා බැහැර ලන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 5. 1. 9.

## වෙරම්බ සූත්‍රය.

305. සැවැත්නුවර —

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය...

මහණෙනි, මතු අහසෙහි වෙරම්බනම් වාතයෝ හමත්. එහි යම් පක්ෂි (වාලිහිණි)යෙක් යේ නම් ඒ මූ වෙරම්බ වාතයෝ දමාපියත්. වෙරම්බ වාතයෙන් දමා ලූ උගේ පාදයෝ අන් දෙසකට යෙත්. පියාපත් අන් දෙසකට යේ. හිස අන් දෙසකට යේ කය අන්දෙසකට යේ.

මහණෙනි, එසෙයින් ම මෙහි ඇතැම් මහණෙක් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසායෙන් මඩනා ලද්දේ ක්‍ෂය කොට ගන්නා ලද සිත් ඇත්තේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ නොරක්නා ලද කයින් යුතු ව ම නොරක්නා ලද වචනයෙන් යුතුව ම නොරක්නා ලද සිතින් යුතුව ම නො රක්නා ලද සිහියෙන් යුතු ව ම සංවරණය නො කළ ඉඳුරන්ගෙන් යුතු ව ම ගමකට හෝ නියම්ගමකට හෝ පිඬු පිණිස පිවිසේද, හෙතෙමේ එහි දී නපුරු කොට හැන්දවූ හෝ නපුරු කොට පෙර වූ හෝ මාගමක දකී ද, නපුරු කොට හැන්ද වූ හෝ නපුරු කොට පෙර වූ හෝ මාගම් දැකීමෙන් ඔහුගේ සිත රාගය තෙමේ වනසයි. හෙතෙමේ රාගයෙන් වනසන ලද සිතින් සිකපද පිළිකෙව් කොට ගිහි බවට පෙරළෙයි. අන්නු ඔහුගේ සිවුර හැර ගණිත්. අන්නු පාත්‍රය හැර ගණිත්. අන්නු නිසීදනය හැර ගණිත්. අන්නු හිදිගුලාව හැර ගණිත්. වෙරම්බ වාතයෙන් බැහැර ලූ පක්ෂියාගේ (අවයව) මෙනි. මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු යි ... උපන් ලාභ සත්කාරකීර්තිප්‍රශංසා බැහැර ලන්නෙමු .... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 5. 1. 10.

### සගාථසුත්තං

306. **සාවත්ථියං** —

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

ඉධාහං භික්ඛවෙ, එකච්චං පුග්ගලං පස්සාමි ලාභසක්කාරෙන අභිභූතං පරියාදින්නචිත්තං කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං.

ඉධ පනාහං භික්ඛවෙ, එකච්චං පුග්ගලං පස්සාමි අසක්කාරෙන අභිභූතං පරියාදින්නචිත්තං කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං.

ඉධ පනාහං භික්ඛවෙ, එකච්චං පුග්ගලං පස්සාමි සක්කාරෙන ච අසක්කාරෙන ච උභයෙන අභිභූතං පරියාදින්නචිත්තං කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං.

එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො කටුකො ඵරුසො අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. තස්මාතිහ භික්ඛවෙ, සික්ඛිතබ්බං: 'උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම. න ච නො උප්පන්නො ලාභසක්කාරසිලොකො චිත්තං පරියාදාය ඨස්සතී'ති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

යස්ස සක්කරියමානස්ස අසක්කාරෙන චූභයං,
සමාධි න විකම්පති අප්පමාණවිහාරිනො.[1]

තං ඣායිනං සාතතිකං සුඛුමදිට්ඨිවිපස්සකං,
උපාදානක්ඛයාරාමං ආහු සප්පුරිසො ඉතීති.

**දාරුණවග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

දාරුණො බළිසං කුම්මො දීඝලොමිං මිළ්හකං,[2]
අසනි දිද්ධං සිඟාලඤ්ච වෙරම්බෙන සගාථකන්ති.

1. අප්පමාද විහාරිනො - PTS 2. පුළ්හකං - සිමු.

## 5. 1. 10.

## සඟාථ සූත්‍රය

306. **සැවැත්නුවර-**

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, මෙහි මම ලාභ සත්කාරයෙන් මඩනා ලද ගන්නා ලද සිත් ඇති, කාබුන්. මරණින් මතු සැපයෙන් පහ වූ තපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණි ඇතැම් පුගුලකු දකිමි.

මහණෙනි, මෙහි මම අසත්කාරයෙන් මඩනා ලද ගන්නා ලද සිත් ඇති කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ තපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණි ඇතැම් පුගුලකු දකිමි.

මහණෙනි, මෙහි මම සත්කාරයෙන් ද, අසත්කාරයෙන් ද යන දෙකින් ම මඩනා ලද ගන්නා ලද සිත් ඇති කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ තපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණි ඇතැම් පුගුලකු දකිමි.

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය, තියුණු ය, රළු ය, අනුත්තර වූ අර්හත්ත්වාවබෝධය පිණිස අන්තරාය කර ය. මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු: "උපන් ලාභ සත්කාරකීර්ති ප්‍රශංසා බැහැර ලන්නෙමු. උපන් ලාභ සත්කාර කීර්තිප්‍රශංසා අපගේ සිත ගෙණ නො ම සිටින්නේ ය"යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු ම ය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා යළි මතු ද මෙය වදාළසේක:

සත්කාර කරණු ලබන අප්‍රමාණ සමාධිවිහරණ ඇති යමකුගේ සමාධිය අසත්කාරයෙන් ද සත්කාරයෙන් ද යන දෙකින් නො සැලේ ද,

ධ්‍යාන කරණසුලු සතතක්‍රියා ඇති සූක්‍ෂම දෘෂ්ටි හා විදර්ශනා ඇති උපාදානක්‍ෂය සඞ්ඛ්‍යාත නිවනෙහි ඇලුනු ඔහුට සත්පුරුෂය යි කියති යි.

**දරුණවර්ගය පළමුවැනි යි.**

**එහි උද්දානය:**

දරුණ, බළිස, කුම්ම, දීඝලෝමි, මිළ්හක, අසනි, දිද්ධ, සිඟාල, වෙරම්බ, සඟාථක යි සූත්‍ර දශයෙකි යි.

## 2. පාතිවග්ගො.

### 5. 2. 1.

### සුවණ්ණපාතිසුත්තං.

307. සාවත්ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

ඉධාහං භික්ඛවෙ, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි, "න චායමායස්මා සුවණ්ණපාතියාපි රූපියචුණ්ණපරිපූරාය හෙතු සම්පජාන මුසා භාසෙය්‍යා"ති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන ලාභසක්කාරසිලොකෙන අභිභූතං පරියාදින්නචිත්තං සම්පජානමුසා භාසන්තං.

එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති

### 5. 2. 2.

### රූපියපාතිසුත්තං.

308. සාවත්ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

ඉධාහං භික්ඛවෙ, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි "න චායමායස්මා රූපියපාතියාපි සුවණ්ණචුණ්ණපරිපූරාය හෙතු සම්පජානමුසා භාසෙය්‍යා"ති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන ලාභසක්කාරසිලොකෙන අභිභූතං පරියාදින්නචිත්තං සම්පජානමුසා භාසන්තං.

එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

## 2. පාති වග්ගය.

### 5. 2. 1.

### සුවණ්ණපාති සුත්‍රය.

307 **සැවැත්නුවර-**

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, මම මෙහි ඇතැම් පුහුලකු "මේ ආයුෂමත් තෙමේ රිදී සුණු පිරුණු රන්තලියක් හේතු කොට ද දැන දැන මුසා නොම බණන්නේ ය"යි මෙසේ සිතින් සිත පිරිසඳ දනිමි පසු කලෙක ලාභසත්කාර කීර්ති ප්‍රශංසායෙන් මඩනා ලද ක්‍ෂය කොට ගන්නා ලද සිත් ඇතිව දැන දැන මුසා බණන ඒ පුහුල් දකිමි.

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය ... උපන් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

### 5. 2. 2.

### රූපියපාති සුත්‍රය.

308. **සැවැත්නුවර-**

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, මම මෙහි ඇතැම් පුහුලකු "මේ ආයුෂමත් තෙමේ රන්සුණු පිරුණු රිදීතලියක් හේතු කොට ද දැන දැන මුසා නො ම බණන්නේ ය" යි මෙසේ සිතින් සිත පිරිසිඳ දනිමි. පසු කලෙක ලාභ සත්කාර කීර්ති ප්‍රශංසායෙන් මඩනා ලද ගන්නා ලද සිත් ඇතිව දැන දැන මුසා බණන ඒ පුහුල් දකිමි.

මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා මෙසේ දරුණු ය ... උපන් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 5. 2. 3-10.

## සුවණ්ණනික්ඛසුත්තාදිඅට්ඨකං.

309-316. සාවත්ථියං-

[දාරුණො භික්ඛවෙ ලාභසක්කාරසිලොකො -පෙ-]

ඉධාහං භික්ඛවෙ, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: න වායමායස්මා -
සුවණ්ණනික්ඛස්සාපි හෙතු -පෙ- (තතියං)
සුවණ්ණනික්ඛසතස්සාපි හෙතු -පෙ- (චතුත්ථං)
සිඞ්ගීනික්ඛස්සපි හෙතු -පෙ- (පඤ්චමං)
සිඞ්ගීනික්ඛසතස්සාපි හෙතු -පෙ- (ඡට්ඨං)
පඨවියාපි ජාතරූපපරිපූරය හෙතු -පෙ- (සත්තමං)
ආමිසකිඤ්චික්ඛහෙතුපි -පෙ- (අට්ඨමං)
ජීවිතහෙතුපි -පෙ- (නවමං)
ජනපදකල්‍යාණියාපි හෙතු සම්පජානමුසා භාසෙය්‍යාති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන ලාභසක්කාරසිලොකෙන අභිභූතං පරියාදින්නචිත්තං සම්පජානමුසා භාසන්තං.

එවං දාරුණො ඛො භික්ඛවෙ ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති. (දසමං)

### පාතිවග්ගො දුතියො.

තස්සුද්දානං:-

ද්වෙ පාති ද්වෙ සුවණ්ණා සිඞ්ගීහි අපරෙ දුවෙ,
පඨවී කිඤ්චික්ඛ ජීවිතං ජනපදකල්‍යාණියා දසාති.

## 5. 2. 3 - 10.

## සුවණ්ණනික්ඛ සූත්‍රාදි අෂ්ටකය.

309 - 316. **සැවැත්නුවර-**

මහණෙනි, ලාභසත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය ...

මහණෙනි, මෙහි මම ඇතැම් පුහුලකු "මේ ආයුෂ්මත් තෙමේ
රන්නිකක් හේතු කොට ද ... (තෙවැන්න)
රන්නික සියක් හේතු කොට ද ... (සිවුවැන්න)
සිඟුරන්නිකක් හේතු කොට ද ... (පස්වැන්න)
සිඟුරන්නික සියක් හේතු කොට ද ... (සවැන්න)
රනින් පිරුණු පොළොව හේතු කොට ද ... (සත්වැන්න)
කිසියම් ආමිසයක් හේතු කොට ද (අටවැන්න)
ජීවිතය හේතු කොට ද ... (නවවැන්න)

ජනපද කල්‍යාණිය හේතු කොට ද, දැන දැන මුසා නො ම බණන්නේ ය යි මෙසේ සිතින් සිත පිරිසිඳ දනිමි. පසු කලෙක ලාභ සත්කාර කීර්ති ප්‍රශංසායෙන් මඩනා ලද ගන්නා ලද සිත් ඇතිව දැන දැන මුසා බණනු ඒ මොහු දකිමි.

මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා මෙසේ දරුණු ය. ... උපන් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි. (දසවැන්න).

පාතිවර්‍ගය දෙවෙනි යි.

එහි උද්දානය:

පාති සූත්‍ර දෙක ය. සුවණ්ණ සූත්‍ර දෙක ය. අනෙක් සිඞ්ගී නමින් සූත්‍ර දෙකක, පඨවි, කිඤ්චික්ඛ, ජීවිත, ජනපදකල්‍යාණී සූත්‍ර ය යි සූත්‍ර දශයෙකි.

# 3. මාතුගාමවග්ගො

5. 3. 1.

## මාතුගාමසුත්තං

317. සාවත්ථියං-

දරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

න තස්ස භික්ඛවෙ, මාතුගාමො එකො එකස්ස චිත්තං පරියාදය තිට්ඨති, යස්ස ලාභසක්කාර සිලොකො චිත්තං පරියාදය තිට්ඨති.

එවං දරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

5. 3. 2.

## ජනපදකල්‍යාණිසුත්තං

318 සාවත්ථියං-

දරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

න තස්ස භික්ඛවෙ, ජනපදකල්‍යාණී එකා එකස්ස චිත්තං පරියාදය තිට්ඨති, යස්ස ලාභසක්කාරසිලොකො චිත්තං පරියාදය තිට්ඨති

එවං දරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

5. 3. 3.

## එකපුත්තසුත්තං

319. සාවත්ථියං-

දරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

සද්ධා භික්ඛවෙ, උපාසිකා එකං පුත්තං පියං මනාපං එවං සම්මා ආයාචමානා ආයාචෙය්‍ය "තාදිසො තාත භවාහි, යාදිසො චිත්තො ච ගහපති හත්ථකො ච ආළවකො.

එසා භික්ඛවෙ තුලා, එතං පමාණං, මම සාවකානං උපාසකානං යදිදං චිත්තො ච ගහපති, හත්ථකො ච ආළවකො.

"සචෙ ඛො ත්වං තාත, අගාරස්මා අනගාරියං පබ්බජසි, "තාදිසො තාත භවාහි යාදිසා සාරිපුත්ත-මොග්ගල්ලානා"ති.

එසා භික්ඛවෙ තුලා, එතං පමාණං, සාවකානං භික්ඛූනං යදිදං සාරිපුත්තමොග්ගල්ලානා.

## 3. මාතුගාම වර්ගය

### 5. 3. 1.

### මාතුගාම සූත්‍රය

317. සැවැත්නුවර-

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය. ...

මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා යමකුගේ සිත (ධර්මයේ) ක්‍ෂය කොට සිටී ද, එකලා වූ මාගමක් එකලා වූ ඔහුගේ සිත (ඒ ධර්මයෙන් ද) එසේ ක්‍ෂය කොට නො සිටී.

මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා මෙසේ දරුණු ය. ... උපන් ලාභසත්කාර කීර්තිප්‍රශංසා දුරු කරන්නෙමු ... මහණෙනි, නොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

### 5. 3. 2.

### ජනපදකල්‍යාණී සූත්‍රය

318. සැවැත්නුවර-

මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණු ය. ...

මහණෙනි, ලාභසත්කාර කීර්ති ප්‍රශංසා යමකුගේ සිත යම්සේ ක්‍ෂයකොට ගෙණ සිටී ද, එකලා වූ ද ඔහුගේ සිත එකලා වූ ද ජනපද කල්‍යාණී (ජනපදයෙහි රූපසපුවෙන් උතුම් සත්‍රී) නොමෝ එසේ ක්‍ෂය කොට ගෙණ නො සිටී.

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය ... උපන් ලාභසත්කාර කීර්තිප්‍රශංසා දුරු කරන්නෙමු ... මහණෙනි, නොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

### 5 3 3

### එකපුත්‍ත සූත්‍රය

319. සැවැත්නුවර-

මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, සැදැහැති (සෝවාන්) උපාසිකාවක් ප්‍රිය මනාප වූ එක් පුතකු මැනැවින් යදින්නී "පුත චිත්‍ත ගෘහපති නෙමෙත් හත්ථක ආලවක නෙමෙත් යම් බඳු නම් එබඳු වෙව"යි මෙසේ යදින්නී ය.

මහණෙනි යම් ඒ චිත්‍ත ගෘහපතිත් හත්ථක ආලවකත් වෙත් නම් මා සවු උවසුන්ට මෝ තුලාව ය. මේ ප්‍රමාණ ය.

"දරුව, ඉදින් තෝ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙහි නම්, දරුව, සැරියුත්-මුගලන් දෙනම යම් බඳු ද එබඳු වෙව" යි.

මහණෙනි, යම් මේ සැරියුත් මුගලන් දෙනම වෙත් නම්, මා සවු මහණුන්ට මෝ තුලාව ය. මේ ප්‍රමාණ ය.

"මා ච බො ත්වං තාත සෙඛං අප්පත්තමානසං ලාභසක්කාරසිලොකො අනුපාපුණාතූ"ති.

තඤ්ච භික්ඛවෙ, භික්ඛුං සෙඛං අප්පත්තමානසං ලාභසක්කාර-සිලොකො අනුපාපුණාති, සො[1] තස්ස හොති අන්තරායාය.

එවං දාරුණො බො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛි-තබ්බන්ති.

## 5. 3. 4.

## එකධීතුසුත්තං

320. සාවත්ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාර සිලොකො -පෙ-

සද්ධා භික්ඛවෙ, උපාසිකා එකං ධීතිකං[2] පියං මනාපං එවං සම්මා ආයාචමානා ආයාචෙය්‍ය: "තාදිසා අය්‍යෙ, භවාහි, යාදිසා ඛුජ්ජුත්තරා උපාසිකා වෙළුකණ්ටකියා[3] ච නන්දමාතා"ති.

එසා භික්ඛවෙ තුලා, එතං පමාණං, මම සාවිකානං උපාසිකානං යදිදං ඛුජ්ජුත්තරා ච උපාසිකා, වෙළුකණ්ටකියා ච නන්දමාතා.

"සචෙ බො ත්වං අය්‍යෙ අගාරස්මා අනගාරියං පබ්බජසි, තාදිසා අය්‍යෙ භවාහි, යාදිසා ඛෙමා ච භික්ඛුනී, උප්පලවණ්ණා චා"ති.

එසා භික්ඛවෙ, තුලා, එතං පමාණං, මම සාවිකානං භික්ඛුනීනං යදිදං ඛෙමා ච භික්ඛුනී උප්පලවණ්ණා ච.

"මා ච බො ත්වං අය්‍යෙ සෙඛං අප්පත්තමානසං ලාභසක්කාරසිලොකො අනුපාපුණාතූ"ති.

තඤ්ච භික්ඛවෙ, භික්ඛුනිං සෙඛං අප්පත්තමානසං ලාභසක්කාර-සිලොකො අනුපාපුණාති, සො තස්ස හොති අන්තරායාය.

එවං දාරුණො බො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛි-තබ්බන්ති.

## 5. 3. 5.

## සමණබ්‍රාහ්මණසුත්තං

321 සාවත්ථියං-

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ලාභසක්කාරසිලොකස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති, න මෙතෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පන තෙආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

---

1. යො. සී. 1. 2. 2. ධීතරං - මජසං. 3. වෙළුකණ්ටකී ච - සීමු

"දරුව, ශෛක්‍ෂ වූ නො පැමිණි රහත් බැව් ඇති තා කරා ලාභ-සත්කාර කීර්ති ප්‍රශංසා නො පැමිණේවා".

මහණෙනි, ශෛක්‍ෂ වූ නො පැමිණි රහත් බැව් ඇති ඒ මහණහු කරා ලාභසත්කාර කීර්ති ප්‍රශංසා ඉදින් පැමිණේ නම්, ඒ ඔහුට අන්තරාය පිණිස වෙයි.

මහණෙනි, ලාභසත්කාරකීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය ... උපන් ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

5. 3. 4.

## එකධීතු සූත්‍රය

320. සැවැත්නුවර-

මහණෙනි, ලාභසත්කාරකීර්තිප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, සැදැහැති ඉසුවත් උපාසිකාවක් ප්‍රියමනාප වූ එක ම දුවක් මැනැවින් අයදනී "දියණියෙනි, ඛුජ්ජුත්තරා උවැසියත් වෙළුකණ්ටකියා නන්ද මාතාවත් යම්බඳු නම් එබඳු වෙව"යි මෙසේ අයදනී ය.

මහණෙනි, යම් මේ ඛුජ්ජුත්තරා උපාසිකාවත් වෙළුකණ්ටකියා නන්ද-මාතාවත් වෙත් නම්, මා සවු උවැසියන්ට මෝ තුලාව ය, මේ පමණ ය.

"දියණියෙනි, ඉදින් තී ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙහි නම් ඛෙමා මෙහෙණත් උප්පලවණ්ණාත් යම්බඳු ද, එබඳු වෙව"යි.

මහණෙනි, යම් මේ ඛෙමා මෙහෙණත් උප්පලවණ්ණාවත් වෙද්ද, මා සවු මෙහෙණනට මෝ තුලාව ය. මේ පමණ ය.

"දියණියෙනි, ශෛක්‍ෂ වූ නො පැමිණි රහත් බැව් ඇති තී කරා ලාභ සත්කාර කීර්තිප්‍රශංසා නො පැමිණේවා."

මහණෙනි, ශෛක්‍ෂ වූ නො පැමිණි රහත්බැව් ඇති ඒ මෙහෙණ කරා ලාභසත්කාරකීර්තිප්‍රශංසා ඉදින් පැමිණේ නම්, ඒ ඇයට අන්තරාය පිණිස වෙයි.

මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය. උපන් ලාභසත්කාරකීර්තිප්‍රශංසා දුරුකරන්නෙමු. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු ම ය.

5. 3. 5.

## සමණබ්‍රාහ්මණ සූත්‍රය

321 සැවැත්නුවර-

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලාභසත්කාරකීර්ති ප්‍රශංසාවන්ගේ ආස්වාදයත් ආදීනවයත් නිස්සරණ යත් තතු සේ නො දනිද්ද, මහණෙනි, ඒ මේ මහණෝ හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහි හෝ මහණෝ ය යි සම්මත නො වෙති. බමුණන් කෙරෙහි හෝ බමුණෝ ය යි සම්මත නො වෙති. ඒ ආයුෂ්මත්හු මහණ-බැව්හි ඵලය හෝ බමුණු බැව්හි ඵලය හෝ දිට්ඨධම්මයෙහි ම තුමූ විශේෂ නැණින් දැන පසක් කොට සපයා නො ම වසෙති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ලාභසක්කාරසිලොකස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානන්ති, තෙ ච ඛො මෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා, බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා. තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

### 5. 3. 6.

### දුතියසමණබ්‍රාහ්මණසුත්තං

322. **සාවත්ථියං**-

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ලාභසක්කාරසිලොකස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති -පෙ- න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ලාභසක්කාරසිලොකස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානන්ති -පෙ- තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

### 5. 3. 7.

### තතියසමණබ්‍රාහ්මණසුත්තං

323. **සාවත්ථියං**-

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ලාභසක්කාරසිලොකං නප්පජානන්ති, ලාභසක්කාරසිලොකසමුදයං නප්පජානන්ති, ලාභසක්කාරසිලොකනිරොධං නප්පජානන්ති, ලාභසක්කාරසිලොකනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති -පෙ- යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා -පෙ- පජානන්ති -පෙ- තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

### 5. 3. 8

### ඡවිසුත්තං

324. **සාවත්ථියං**-

දරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො. ලාභසක්කාරසිලොකො භික්ඛවෙ ඡවිං ඡින්දති, ඡවිං ඡෙත්වා මංසං ඡින්දති, මංසං ඡෙත්වා චම්මං ඡින්දති, චම්මං ඡෙත්වා නහාරුං ඡින්දති, නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දති, අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨති.

එවං දරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ- එවං හි ඛො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලාභසත්කාරකීර්ති ප්‍රශංසාවන්ගේ ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දනිද් ද, මහණෙනි, ඒ මේ මහණෝ හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහිත් මහණෝ ය යි සම්මත වෙති. බමුණන් කෙරෙහිත් බමුණෝ ය යි සම්මත වෙති. ඒ ඇවත්හු ද ශ්‍රමණ ඵලය ද බ්‍රාහ්මණ ඵලය ද දිට්ඨධම්මයෙහි ම තුමූ විශිෂ්ට ඥානයෙන් දැන පසක් කොට එළඹ වෙසෙති යි.

**5. 3. 6.**

## දුතියසමණබ්‍රාහ්මණ සූත්‍රය.

322. **සැවැත්නුවර-**

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවන්ගේ සමුදයත් අස්තගමයත් ආස්වාදයත් ආදීනවයත් නිඃශරණයත් තතු සේ නො දනිද්ද ... ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ ඵලයත් බ්‍රාහ්මණ ඵලයත් දිට්ඨධම්මයෙහි තුමූ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට පැමිණ නො ම වෙසෙති.

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවන්ගේ සමුදයත් අස්තගමයත් ආස්වාදයත් ආදීනවයත් නිඃශරණයත් තතු සේ දනිද්ද ... ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ ඵලයත් බ්‍රාහ්මණ ඵලයත් දිට්ඨධම්මයෙහි තුමූ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට පැමිණ වෙසෙති යි.

**5. 3. 7.**

## තතියසමණබ්‍රාහ්මණ සූත්‍රය.

323. **සැවැත්නුවර-**

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ලාභසත්කාර සිලොක නො දනිත් ද, ලාභසත්ාර සිලොක සමුදය නො දනිත් ද, ලාභ සක්කාර සිලොක නිරොධය නො දනිද් ද, ලාභ සක්කාර සිලොක නිරොධගාමිනිපටිපදාව නො දනිද්ද ... යම්කිසි මහණ කෙණෙක් හෝ බමුණු කෙනෙක් හෝ ... දනිද් ද ... ඒ ආවත්හු මහණදම්හි ඵලයත් බමුණුදම්හි ඵලයත් දිට්ඨධම්මයෙහි ම විශිෂ්ටඥානයෙන් තුමූ දැන පසක් කොට එළඹ වෙසෙති යි.

**5 3. 8.**

## ඡවි සූත්‍රය

324 **සැවැත්නුවර-**

මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය. මහණෙනි, ලාභසත්කාරකීර්තිප්‍රශංසා සිවිය සිඳියි, සිවිය සිඳ සම සිඳියි. සම සිඳ මස් සිඳියි. මස් සිඳ නහර සිඳියි. නහර සිඳ ඇට සිඳියි ඇට සිඳ ඇටමිදුලු හැනගෙණ සිටියි.

මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය උපන් ලාභසත්කාර කීර්තිප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 5. 3. 9.

## වාලරජ්ජුසුත්තං

325. සාවත්ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො. ලාභසක්කාරසිලොකො භික්ඛවෙ, ඡවිං ඡින්දති, ඡවිං ඡෙත්වා චම්මං ඡින්දති, චම්මං ඡෙත්වා මංසං ඡින්දති, මංසං ඡෙත්වා න්හාරුං ඡින්දති, න්හාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දති, අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨති.

සෙය්‍යථාපි භික්ඛවෙ, බලවා පුරිසො දළ්හාය වාලරජ්ජුයා[1] ජඞ්ඝං වෙඨෙත්වා ඝංසෙය්‍ය, සා ඡවිං ඡින්දෙය්‍ය, ඡවිං ඡෙත්වා චම්මං ඡින්දෙය්‍ය, චම්මං ඡෙත්වා මංසං ඡින්දෙය්‍ය, මංසං ඡෙත්වා න්හාරුං ඡින්දෙය්‍ය, න්හාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දෙය්‍ය, අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො ඡවිං ඡින්දති, ඡවිං ඡෙත්වා චම්මං ඡින්දති, චම්මං ඡෙත්වා මංසං ඡින්දති, මංසං ඡෙත්වා න්හාරුං ඡින්දති, න්හාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දති, අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨති.

එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාර සිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

## 5. 3. 10.

## ඛීණාසවභික්ඛුසුත්තං

326. සාවත්ථියං-

යොපි සො භික්ඛවෙ, භික්ඛු අරහං ඛීණාසවො, තස්ස පාහං[2] ලාභසක්කාරසිලොකං අන්තරායාය වදාමීති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච කිස්ස පන භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො ලාභසක්කාරසිලොකො අන්තරායායාති?

යා හිස්ස සා ආනන්ද, අකුප්පා චෙතොවිමුත්ති, නාහං තස්සා ලාභසක්කාර සිලොකං අන්තරායාය වදාමි. යෙ ච ඛ්වස්ස ආනන්ද අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො දිට්ඨධම්මසුඛවිහාරා අධිගතා, තෙසාහමස්ස ලාභසක්කාරසිලොකං අන්තරායාය වදාමි.

එවං දාරුණො ඛො ආනන්ද, ලාභසක්කාරසිලොකො කටුකො ඵරුසො, අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. තස්මාතිහ ආනන්ද, එවං සික්ඛිතබ්බං. උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම, න ච නො උප්පන්නො ලාභසක්කාරසිලොකො චිත්තං පරියාදාය ඨස්සතීති. එවං හි වො ආනන්ද, සික්ඛිතබ්බන්ති.

**මාතුගාමවග්ගො තතියො.**

**තස්සුද්දානං:**

මාතුගාමො ච කල්‍යාණී එකපුත්තෙක ධීතු ච[3]
සමණබ්‍රාහ්මණා තීණි ඡවි රජ්ජු ච භික්ඛු චෙති.

---

1. වාලරජ්ජුයා - මජසං  2. පහං - ස්‍යා, සී 1, 2  3. ධීතියා - සීමු. සී 1.

5. 3. 9.

## වාලරජ්ජු සූත්‍රය

325. සැවැත්නුවර-

මහණෙනි, ලාභසත්කාරකීර්තිප්‍රශංසා දරුණු ය. මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා සිවිය සිඳියි. සිවිය සිඳ සම සිඳියි. සම සිඳ මස් සිඳියි. මස් සිඳ නහර සිඳියි. නහර සිඳ ඇට සිඳියි. ඇට සිඳ ඇටමිදුලු හැනගෙණ සිටියි.

මහණෙනි, යම් සේ බලවත් පුරුෂයෙක් දළ අස්කෙඳි රැහැණෙකින් කෙණ්ඩය වෙළා ගවන්නේ ද, එය සිවිය සිඳිනේ ය සිවිය සිඳ සම සිඳිනේ ය. සම සිඳ මස් සිඳිනේ ය. මස් සිඳ නහර සිඳිනේ ය. නහර සිඳ ඇට සිඳිනේ ය. ඇට සිඳ ඇටමිදුලු හැනගෙණ සිටින්නේ ය. මහණෙනි, එසෙයින් ම ලාභසත්කාරකීර්තිප්‍රශංසා සිවිය සිඳියි. සිවිය සිඳ සම සිඳියි. සම සිඳ මස් සිඳියි. මස් සිඳ නහර සිඳියි. නහර සිඳ ඇට සිඳියි ඇට සිඳ ඇටමිදුලු හැනගෙණ සිටියි.

මහණෙනි, ලාභසත්කාරකීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය ... උපන් ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දුරු කරන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ සි.

6. 3. 10.

## ඛීණාසවභික්ඛු සූත්‍රය

326. සැවැත්නුවර-

මහණෙනි, අභීත් වූ ක්ෂීණාස්‍රව වූ යම් ඒ මහණෙක් වේ නම්, ඔහුට ද ලාභසත්කාර කීර්තිප්‍රශංසා අන්තරාය පිණිස වේ ය යි මම කියමි.

මෙසේ වදාළ කල්හි ආයුෂමත් ආනන්ද තෙමේ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, රහත් මහණහුට කුමක් සඳහා ලාභසත්කාර කීර්තිප්‍රශංසා අන්තරාය පිණිස වේ ද" යි මෙය සැලකෙළේ ය.

ආනන්ද, ඔහුගේ යම් ඒ අකෝප්‍ය වූ චිත්තවිමුක්තියෙක් වේ ද, ලාභසත්කාරකීර්තිප්‍රශංසා එයට අන්තරාය පිණිස වේ ය යි මම නො කියමි. ආනන්ද, නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ම වසනහු විසින් ලබන ලද යම් දිට්ඨදම් පලසමවත් සුව විහරණයෝ වෙද්ද, ලාභසත්කාරකීර්තිප්‍රශංසා ඔවුනට අන්තරාය (බාධා) පිණිස වන්නේ ය යි මම කියමි.

ආනන්ද, ලාභසත්කාරකීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය, තියුණු ය, රළු ය, නිරුන්තර වූ අභීතාවබොධයට අන්තරායකර ය. ආනන්ද, එසේ හෙයින් මෙහි මෙසේ හික්මිය යුතු සි: උපන් ලාභසත්කාර කීර්තිප්‍රශංසා දුරු කරන්නෙමු. උපන් ලාභසත්කාරකීර්තිප්‍රශංසා අපගේ සිත ක්ෂය කොට නො ම සිටුනේ යයි. ආනන්ද, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ සි

### මාතුගාම්වර්ගය තෙවෙනි සි.

එහි උද්දානය:

මාතුගාම, කල්‍යාණී, එකපුත්ත, එකධීතු සූත්‍ර ද, සමණබ්‍රාහමණ සූත්‍ර තුණ ද, ඡවි, රජ්ජු, භික්ඛු සූත්‍ර ද යි සූත්‍ර දශයෙකි.

# 4. සඞ්ඝභෙදවග්ගො

### 5. 4. 1

### සඞ්ඝභෙදසුත්තං*

427. **සාවත්ථියං-**

දරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

ලාභසක්කාරසිලොකෙන අභිභූතො පරියාදින්නචිත්තො භික්ඛවෙ, දෙවදත්තො සඞ්ඝං භින්දි. එවං දරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාර-සිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

### 5. 4. 2.

### කුසලමූලසමුච්ඡෙදසුත්තං*

328. **සාවත්ථියං-**

දරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

ලාභසක්කාරසිලොකෙන අභිභූතස්ස පරියාදින්නචිත්තස්ස භික්ඛවෙ, දෙවදත්තස්ස කුසලමූලං සමුච්ඡෙදමගමා. එවං දරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

### 5. 4. 3.

### කුසලධම්මසමුච්ඡෙදසුත්තං*

329. **සාවත්ථියං-**

දරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ-

ලාභසක්කාරසිලොකෙන අභිභූතස්ස පරියාදින්නචිත්තස්ස භික්ඛවෙ දෙවදත්තස්ස කුසලො ධම්මො සමුච්ඡෙදමගමා. එවං දරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරයිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

### 5. 4. 4.

### සුක්කධම්මසමුච්ඡෙදසුත්තං*

330. **සාවත්ථියං-**

දරුණො භික්ඛවෙ; ලාභසක්කාරසිලොකො -පෙ-

ලාභසක්කාරසිලොකෙන අභිභූතස්ස පරියාදින්නචිත්තස්ස භික්ඛවෙ, දෙවදත්තස්ස සුක්කො ධම්මො සමුච්ඡෙදමගමා. එවං දරුණො ඛො භක්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- [උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ-] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති

### 5. 4. 5.

### අත්තවධසුත්තං*

331. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ගිජ්ඣකූටෙ** පබ්බතෙ අචිරපක්කන්තෙ **දෙවදත්තෙ**. තත්‍ර ඛො භගවා දෙවදත්තං ආරබ්භ භික්ඛූ ආමන්තෙසි: අත්තවධාය භික්ඛවෙ, දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි. පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

---

* අභිහිතසුත්තන්ත පඤ්චකං 'භින්දි-මූල-ධම්ම-සුක්ක-පක්කන්ත'-නාමවසෙන උද්දානෙ ආගතං.

# 4. සඞ්ඝභේදවග්ගය

## 5. 4. 1.

### සඞ්ඝභේද සූත්‍රය

327. සැවැත්නුවර-

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසායෙන් මැඩුනු ක්‍ෂය කොට ගන්නා ලද සිත් ඇති දෙව්දත් තෙමේ සඞ්ඝයා බින්දේ ය. මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය ... උපන් ලාභසත්කාරකීර්තිප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතු මැ යි

## 5. 4. 2.

### කුසලමූලසමුච්ඡෙද සූත්‍රය

428. සැවැත්නුවර-

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, ලාභ-සත්කාරකීර්තිප්‍රශංසායෙන් මැඩුනු ගන්නා ලද සිත් ඇති දෙව්දත්ගේ කුසල්මුල් සහමුලින් සිඳීමට ගියේ ය. මහණෙනි, ලාභසත්කාරකීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය...උපන් ලාභසත්කාරකීර්තිප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතු මැ යි.

## 5. 4. 3.

### කුසලධම්මසමුච්ඡෙද සූත්‍රය

429. සැවැත්නුවර

මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, ලාභසත්කාරකීර්තිප්‍රශංසායෙන් මැඩුනු ගන්නා ලදසිත් ඇති දෙව්දත්ගේ කුසල්දහම් සහමුලින් ඡේදයට ගියේ ය. මහණෙනි, ලාභසත්කාරකීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය ... උපන් ලාභසත්කාරකීර්තිප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතු මැ යි.

## 5. 4. 4.

### සුක්කධම්මසමුච්ඡෙද සූත්‍රය

430. සැවැත්නුවර-

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය ...

මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසායෙන් මඩනා ලද නිශෙෂණයෙන් ගන්නා ලද සිත් ඇති දෙව්දත්ගේ ශෝභන ධර්මය සහමුලින් ඡේදයට ගියේ ය. මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය ... උපන්ලාභසත්කාරකීර්තිප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, තොප විසින් හික්මිය යුතු මැ යි.

## 5. 4. 5.

### අත්තවධ සූත්‍රය

331. භාග්‍යවතුන් වහන්සේ එක්සමයෙක දෙව්දත් බැහැර ගිය නොබෝ කල්හි රජගහනුවර ගිජ්ඣකූළපව්වෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ දෙව්දත් ඇරබ භික්‍ෂූන් ඇමතූ සේක: මහණෙනි, තමාගේ ම විනාශය පිණිස දෙව්දත්හට ලාභ සත්කාර කීර්තිප්‍රශංසා පහළ විය. පිරිහීම පිණිස දෙව්දත්හට ලාභසත්කාර කීර්තිප්‍රශංසා පහළ විය.

සෙය්‍යථාපි භික්ඛවෙ, කදලි අත්තවධාය ඵලං දෙති, පරාභවාය ඵලං දෙති, එවමෙව ඛො භික්ඛවෙ, අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි. පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

සෙය්‍යථාපි භික්ඛවෙ, වෙළු අත්තවධාය ඵලං දෙති, පරාභවාය ඵලං දෙති, එවමෙව ඛො භික්ඛවෙ, අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි. පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

සෙය්‍යථාපි භික්ඛවෙ, නළො අත්තවධාය ඵලං දෙති, පරාභවාය ඵලං දෙති, එවමෙව ඛො භික්ඛවෙ, අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි. පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාර සිලොකො උදපාදි.

සෙය්‍යථාපි භික්ඛවෙ, අස්සතරී අත්තවධාය ගබ්භං ගණ්හාති, පරාභවාය ගබ්භං ගණ්හාති, එවමෙව ඛො භික්ඛවෙ අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි. පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ- එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

ඵලං වෙ කදලිං හන්ති ඵලං වෙළුං ඵලං නළං,
සක්කාරො කාපුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථාති.

## 5. 4. 6.

## පඤ්චරථසතසුත්තං*

332. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන දෙවදත්තස්ස අජාතසත්තු කුමාරො පඤ්චහි රථසතෙහි සායංපාතං උපට්ඨානං ගච්ඡති. පඤ්ච ච ථාලිපාකසතානි භත්තාභිහාරො අභිහරීයති. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "දෙවදත්තස්ස භන්තෙ, අජාතසත්තුකුමාරො පඤ්චහි රථසතෙහි සායංපාතං උපට්ඨානං ගච්ඡති. පඤ්ච ච ථාලිපාකසතානි භත්තාභිහාරො අභිහරීයතී"ති.

මා භික්ඛවෙ, දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකං පිහයිත්ථ යාවකීවඤ්ච භික්ඛවෙ, දෙවදත්තස්ස අජාතසත්තුකුමාරො පඤ්චහි රථසතෙහි සායංපාතං උපට්ඨානං ගමිස්සති, පඤ්ච ච ථාලිපාකසතානි භත්තාභිහාරො අභිහරීයිස්සති, හානි යෙව භික්ඛවෙ, දෙවදත්තස්ස පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි.

---

* රථසුත්තං - උදදූත.

මහණෙනි, යම්සේ කෙසෙල්ගස තමන් නැසීම පිණිස පල දේ ද, විනාශය පිණිස පල දේ ද, මහණෙනි, එසෙයින් ම තමන් නැසීම පිණිස දෙව්දත්හට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පහළ විය. විනාශය පිණිස දෙව්දත්හට ලාභ සත්කාර කීර්තිප්‍රශංසා පහළ විය

මහණෙනි, යම් සේ හුණගස තමන් නැසීම පිණිස පලදේ ද, විනාශය පිණිස පල දේ ද, මහණෙනි, එසෙයින් ම තමන් නැසීම පිණිස දෙව්දත්හට ලාභ සත්කාර කීර්තිප්‍රශංසා පහළ විය. විනාශය පිණිස දෙව්දත්හට ලාභ සත්කාර කීර්තිප්‍රශංසා පහළ විය

මහණෙනි, යම් සේ බටගස තමන් නැසීම පිණිස පල දේ ද, විනාශය පිණිස පල දේ ද, මහණෙනි, එසෙයින් ම තමන් නැසීම පිණිස දෙව්දත්හට ලාභ සත්කාර කීර්තිප්‍රශංසා පහළ විය. විනාශය පිණිස දෙව්දත්හට ලාභ සත්කාර කීර්තිප්‍රශංසා පහළ විය.

මහණෙනි, යම් සේ අශ්වතරිය (වෙළඹකුස කොටළුවකුට දාව උපන්නී) තමන් නැසීම පිණිස ගැබ් ගණී ද, විනාශය පිණිස ගැප් ගණී ද, මහණෙනි, එසෙයින් ම තමන් නැසීම පිණිස දෙව්දත්ට ලාභ සත්කාර කීර්තිප්‍රශංසා පහළ විය. විනාශය පිණිස දෙව්දත්හට ලාභ සත්කාර කීර්තිප්‍රශංසා පහළ විය.

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය ... උපන් ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා වැළි මෙය ද වදාළ සේක:

ඵලය ඒකාන්තයෙන් කෙසෙල්ගස නසයි. ඵලය හුණගස (නසයි). ඵලය බටගස (නසයි). ගැබ අශ්වතරිය (නසයි). එමෙන් සත්කාරය නින්දිතපුරුෂයා නස යි.

## 5. 4. 6.

## පඤ්චරථසතසූත්‍රය.

332. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක-නිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි අජාසත් කුමර තෙමේ රිය පන්සියකින් උදය සවස දෙව්දත්හට උවටැනට යෙයි. මුළුබත් පන්සියක්වූ බත ද එළවනු ලැබේ. එකල්හි බොහෝ මහණහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැද එක්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: "වහන්ස, අජාසත් කුමර තෙමේ රිය පන්සියකින් උදය සවස දෙව්දත්හට උවටැනට යෙයි. තලි පන්සියක බත ද එළවනු ලැබේ"යි

මහණෙනි, දෙව්දත්ගේ ලාභ සත්කාර කීර්තිප්‍රශංසා කැමති නො වවු. මහණෙනි, යම් තාක් අජාසත් කුමර තෙමේ රිය පන්සියකින් උදය සවස දෙව්දත්හට උවටැනට යන්නේ ද, තලි පන්සියක බතත් එළවනු ලබන්නේ ද, මහණෙනි, (ඒතාක්) දෙව්දත්ගේ කුසල් දහම්හි පිරිහීම ම කැමති විය යුතු යි. වැඩීම නො කැමති විය යුතු යි

සෙය්‍යථාපි භික්ඛවෙ, චණ්ඩස්ස කුක්කුරස්ස නාසාය පිත්තං භින්දෙය්‍යුං, එවං හි සො භික්ඛවෙ, කුක්කුරො භිය්‍යොසොමත්තාය චණ්ඩතරො අස්ස. එවමෙව ඛො භික්ඛවෙ, යාවජීවම්පි දෙවදත්තස්ස අජාතසත්තුකුමාරො පඤ්චහි රථසතෙහි සායංපාතං උපට්ඨානං ගමිස්සති, පඤ්ච ච ථාලිපාක සතානි භත්තාභිහාරො අභිහරීයිස්සන්ති, හානි යෙව භික්ඛවෙ, දෙවදත්තස්ස පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි.

එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො -පෙ- උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම -පෙ- එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

## 5. 4. 7.

### මාතුසුත්තං.

333. සාවත්ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො කටුකො, ඵරුසො, අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. ඉධාහං භික්ඛවෙ, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "න චායමායස්මා මාතුපි හෙතු සම්පජානමුසා භාසෙය්‍යා"ති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන ලාභසක්කාරසිලොකෙන අභිභූතං පරියාදින්නචිත්තං සම්පජානමුසා භාසන්තං

එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො කටුකො ඵරුසො අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: "උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම, න ච නො උප්පන්නො ලාභසක්කාරසිලොකො චිත්තං පරියාදාය ඨස්සතී"ති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

## 5. 4. 8.-13.

### පිතුසුත්තාදිඡක්කං

334-439 සාවත්ථියං-

දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො කටුකො ඵරුසො අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. ඉධාහං භික්ඛවෙ, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "න චායමායස්මා

පිතුපි හෙතු -පෙ- (අට්ඨමං)

භාතුපි හෙතු -පෙ- (නවමං)

භගිනියාපි හෙතු -පෙ- (දසමං)

පුත්තස්සපි හෙතු -පෙ- (එකාදසමං)

ධීතුයාපි හෙතු -පෙ- (ද්වාදසමං)

මහණෙනි, යම් සේ සැඩ බල්ලකුගේ නැහැයෙහි (නැහැසිදුරෙහි) පිත (වලස් හෝ සැඩමසු පිත) බිඳින්නාහු (පුණ්‍ණකොට බහන්නාහු) ද, මහණෙනි, මෙසින් ඒ බල්ලා අතිශයින් ම සැඩ වන්නේ ය. මහණෙනි, එසෙයින් ම අජාසත් කුමාර තෙමේ රිය පන්සියකින් උදේ සවස දෙව්දත්හට උවටැනට යම් තාක් යන්නේ ද, තලිපන්සියක බතත් එළවනු ලබන්නේ ද, මහණෙනි එයින් දෙව්දත්හුගේ කුසල් දහම් පිරිහීම කැමැති විය යුතු. වැඩීම නො කැමැති විය යුතු.

මහණෙනි, ලාභසත්කාර කීර්ති ප්‍රශංසා මෙසේ දරුණු ය. ... උපන් ලාභසත්කාර කීර්තිප්‍රශංසා දුරුකරන්නෙමු ... මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 5. 4. 7.

### මාතු සූත්‍රය

333 **සැවැත්නුවර**-

මහණෙනි, ලාභසත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය තියුණු ය රළු ය. අනුත්තර අර්හත්ඵලාවබෝධයට අන්තරායකර ය. මහණෙනි, මෙහි මම ඇතැම් පුගුලකු "මේ ආයුෂ්මත් තෙමේ මව හේතු කොට හෙණ ද දැන දැන මුසා නො බණන්නේ ය" යි මෙසේ සිතින් සිත පිරිසිඳ දනිමි. පසුකලෙක ලාභ සත්කාර කීර්තිප්‍රශංසායෙන් මඩනා ලද ගන්නා ලද සිත් ඇති, දැන දැන මුසා බණන ඔහු දකිමි.

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය, තියුණු ය, රළු ය, අනුත්තර අර්හත්ඵලාවබෝධයට අන්තරායකර ය.

මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු: "උපන් ලාභසත්කාර කීර්තිප්‍රශංසා දුරු කරන්නෙමු. උපන් ලාභ සත්කාර කීර්තිප්‍රශංසා අපගේ සිත සිඳ ගෙණ නො ම සිටින්නේ ය"යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි

## 5. 4. 8-13.

### පිතුසූත්‍රාදිෂට්කය.

334-339 **සැවැත්නුවර**-

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා දරුණු ය, තියුණු ය, රළු ය, අනුත්තර අර්හත්ඵලාවබෝධයට අන්තරායකර ය. මහණෙනි, මෙහි මම ඇතැම් පුගුලකු "මේ ආයුෂ්මත් තෙමේ පියා හේතු කොට ද (අට වැන්න)

බෑයා හේතු කොට ද ... (නව වැන්න).

බුහුන හේතු කොට ද ... (දස වැන්න).

පුතා හේතු කොට ද ... (එකොළොස් වැන්න.)

දුව හේතු කොට ද (දොළොස් වැන්න).—

පජාපතියාපි හෙතු සම්පජානමුසා භාසෙය්‍යාති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන ලාභසක්කාරසිලොකෙන අභිභූතං පරියාදින්නචිත්තං සම්පජානමුසා භාසන්තං.

එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො කටුකො, ඵරුසො, අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: උප්පන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම, න ච නො උප්පන්නො ලාභසක්කාරසිලොකො චිත්තං පරියාදාය ඨස්සතීති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති. (තෙරසමං.)

සඞ්ඝභෙදවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

භින්දි මූලං පක්ඛො ධම්මො පක්කන්තං රථමානරො,
පිතා ච මාතා භගිනී පුත්තා ධීතා පජාපතීති.

ලාභසක්කාරසංයුත්තං සමත්තං.

බිරිය හේතු කොට ද දන දන මුසා නො බණන්නේ ය"යි මෙසේ සිතින් සිත පිරිසිඳ දනිමි. පසු කලෙක ලාභ සත්කාර කීර්තිප්‍රශංසායෙන් මඩනා ලද ගන්නා ලද සිත් ඇති දන දන මුසා බණන එ මොහු දකිමි.

මහණෙනි, ලාභ සත්කාර කීර්තිප්‍රශංසා මෙසේ දරුණු ය, තියුණු ය, රළු ය, අනුත්තර අභීත්‍යාවබෝධයට අන්තරාකර ය.

මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු: "උපන් ලාභසත්කාර කීර්තිප්‍රශංසා දුරු කරන්නෙමු. උපන් ලාභ සත්කාර කීර්තිප්‍රශංසා අපගේ සිත ක්‍ෂය කොට නො ම සිටින්නේ ය"යි. මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතු මැ යි. (තෙළෙස් වැන්න.)

**සඞ්ඝභේදවර්ගය සිවුවැනි යි.**

එහි උද්දානය:

භින්දි, මූල, සුක්ක, ධම්ම, පක්කන්ත, රථ, මාතු, පිතු, භාතු, භගිනී, පුත්ත, ධීතු, පජාපති යි සූත්‍ර තෙළෙසකි යි.

**ලාභසක්කාරසංයුත්තය නිමියේ ය.**

# 6. රාහුලසංයුත්තං

## 1. පඨමො වග්ගො

### 6. 1. 1.

### චක්ඛුආදිසුත්තං

340. එවං මෙ සුතං, එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

අථ ඛො ආයස්මා **රාහුලො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාහුලො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

තං කිම්මඤ්ඤසි රාහුල, චක්ඛුං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලන්නු තං සමනුපස්සිතුං "එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ.

සොතං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ, -පෙ- ඝාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ -පෙ- ජිව්හා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ, -පෙ-කායො නිච්චො වා අනිච්චො වාති? අනිච්චො භන්තෙ -පෙ- මනො නිච්චො වා අනිච්චො වාති? අනිච්චො භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං විපරිණාම ධම්මං, කල්ලන්නු තං සමනුපස්සිතුං "එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, සොතස්මිම්පි නිබ්බින්දති, ඝාණස්මිම්පි නිබ්බින්දති, ජිව්හායපි නිබ්බින්දති, කායස්මිම්පි නිබ්බින්දති, මනස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්ම-චරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතී'ති.

[එත්තෙන පෙය්‍යාලෙන දස සුත්තන්තා කාතබ්බා].

# 6. රාහුලසංයුත්තය

## 1. ප්‍රථම වර්ගය

### 6. 1. 1.

### චක්ඛුආදි සූත්‍රය

340. මා විසින් මෙසේ අසන ලදි. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඩු** සිටුහුගේ අරමෙහි වැඩ වසන සේක.

එකල්හි ආයුෂ්මත් **රාහුල** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැද එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේ ය: "වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකලා ව ගණයා කෙරෙන් වෙන් ව සමෘතියෙන් තොර නොවී කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ (එබඳු) දහමක් මට සැකෙවින් දේශනා කරණ සේක්වා, මැනවි"යි.

රාහුල, ඒ කිමැයි හඟිහි ද, ඇස නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස' අනිත්‍ය ය.' යමක් අනිත්‍ය නම් එය දුක් ද සැප ද? 'වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරලෙන සුළු නම් එය 'මෙය මාගේ ය. මේ මම වෙමි, මේ මාගේ ආත්මය' යි දකිනට සුදුසු ද? 'වහන්ස, සුදුසු නො වේ ම ය.'

කණ නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... නැහැය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... දිව අනිත්‍ය ද, නිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය.' ... කය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය.' ... සිත නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය'. යමක් අනිත්‍ය නම් එය දුක් ද, සැප ද? 'වහන්ස, දුක් ය.' යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරලෙනසුළු නම් එය 'මෙය මාගේ ය' මේ මම වෙමි, මේ මාගේ ආත්මය' යි දක්නට සුදුසු ? ද 'වහන්ස, සුදුසු නො වේ ම ය.'

රාහුල, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ඇසෙහි ද කලකිරෙයි. කණෙහි ද කලකිරෙයි. නැහැයෙහි ද කලකිරෙයි. දිවෙහි ද කලකිරෙයි. කයෙහි ද කලකිරෙයි. සිතෙහි ද කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇලෙන්නේ මිදෙයි. මිදුනු කල්හි මිදුණේ ය යි දැනීම වෙයි. "ජාතිය ක්ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදි. සිවුමග කිස කරණ ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ"යි දැන ගණී යි.

[පෙය්‍යාලනයින් සූත්‍රාන්ත දශය සංක්ෂෙප කට යුතු යි].

## 6. 1. 2.

### රූපාදි සුත්තං

341. සාවත්ථියං-

තං කිම්මඤ්ඤසි රාහුල, රූපා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ, සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ -පෙ-

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති, සද්දෙසුපි[1] නිබ්බින්දති, ගන්ධෙසුපි නිබ්බින්දති, රසෙසුපි නිබ්බින්දති, ඵොට්ඨබ්බෙසුපි නිබ්බින්දති, ධම්මෙසුපි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 6. 1. 3.

### විඤ්ඤාණසුත්තං

442. සාවත්ථියං-

තං කිම්මඤ්ඤසි රාහුල, චක්ඛුවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ, -පෙ- සොතවිඤ්ඤාණං -පෙ- ඝාණවිඤ්ඤාණං -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං -පෙ- මනොවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ -පෙ-

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො චක්ඛුවිඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති -පෙ- සොතවිඤ්ඤාණස්මිම්පි -පෙ- ඝාණවිඤ්ඤාණස්මිම්පි -පෙ- ජිව්හාවිඤ්ඤාණස්මිම්පි -පෙ- කායවිඤ්ඤාණස්මිම්පි -පෙ- මනොවිඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 6. 1. 4.

### සම්ඵස්සසුත්තං

443. සාවත්ථියං-

තං කිම්මඤ්ඤසි රාහුල චක්ඛුසම්ඵස්සො නිච්චො වා අනිච්චො වාති අනිච්චො භන්තෙ -පෙ- සොතසම්ඵස්සො -පෙ- ඝාණසම්ඵස්සො -පෙ- ජිව්හාසම්ඵස්සො -පෙ- කායසම්ඵස්සො -පෙ- මනොසම්ඵස්සො නිච්චො වා අනිච්චො වාති? අනිච්චො භන්තෙ -පෙ-

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො චක්ඛුසම්ඵස්සස්මිම්පි නිබ්බින්දති, සොතසම්ඵස්සස්මිම්පි නිබ්බින්දති, ඝාණසම්ඵස්සස්මිම්පි නිබ්බින්දති, ජිව්හාසම්ඵස්සස්මිම්පි නිබ්බින්දති, කායසම්ඵස්සස්මිම්පි නිබ්බින්දති, මනොසම්ඵස්සස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

---

1. සද්දෙසුපි -පෙ- ගන්ධෙසුපි -පෙ-, රසෙසුපි -පෙ-, ඵොට්ඨබ්බෙසුපි -පෙ- — සිමු, සී 1, 2.

## 6. 1. 2.

### රූපාදි සූත්‍රය.

341. **සැවැත්නුවර—**

රාහුල, ඒ කිමැයි හඟිහි ද? රූප (ආරම්මණ) යෝ නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍යයහ.' ශබ්දයෝ ...ගන්ධයෝ ... රසයෝ ... සප්‍රෂ්ටව්‍යයෝ... ධර්මයෝ නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍යයහ.'

රාහුල, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙමේ රූපයන්හිත් කලකිරෙයි. ශබ්දයන්හිත් කලකිරෙයි. ගන්ධයන්හිත් කලකිරෙයි. රසයන්හිත් කලකිරෙයි. සප්‍රෂ්ටව්‍යයන්හිත් කලකිරෙයි. ධර්මයන්හිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණී යි.

## 6. 1. 3.

### විඤ්ඤාණ සූත්‍රය.

342. **සැවැත්නුවර—**

රාහුල, ඒ කිමැයි හඟිහි ද? චක්ඛුවිඤ්ඤාණය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... සෝතවිඤ්ඤාණය ... ඝාණවිඤ්ඤාණය ... ජිව්හාවිඤ්ඤාණය ... කායවිඤ්ඤාණය ... මනෝවිඤ්ඤාණය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය.' ...

රාහුල, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙමේ චක්ඛුවිඤ්ඤාණයෙහි ද කලකිරෙයි. සෝතවිඤ්ඤාණයෙහි ද කලකිරෙයි. ඝාණවිඤ්ඤාණයෙහි ද කලකිරෙයි. ජිව්හාවිඤ්ඤාණයෙහි ද කලකිරෙයි. කායවිඤ්ඤාණයෙහි ද කලකිරෙයි. මනෝවිඤ්ඤාණයෙහි ද කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණී යි.

## 6. 1. 4.

### සම්ඵස්ස සූත්‍රය.

343. **සැවැත්නුවර—**

රාහුල, ඒ කිමැයි හඟිහි ද? චක්ඛුසම්ඵස්සය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... සෝතසම්ඵස්සය ... ඝාණසම්ඵස්සය ... ජිව්හාසම්ඵස්සය ... කායසම්ඵස්සය ... මනෝසම්ඵස්සය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය ...

රාහුල, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙමේ චක්ඛුසම්ඵස්සයෙහිත් කලකිරෙයි. සෝතසම්ඵස්සයෙහිත් කලකිරෙයි. ඝාණසම්ඵස්සයෙහිත් කලකිරෙයි. ජිව්හාසම්ඵස්සයෙහිත් කලකිරෙයි කායසම්ඵස්සයෙහිත් කලකිරෙයි. මනෝසම්ඵස්සයෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණී යි.

## 6. 1. 5.

### වෙදනාසුත්තං

344. සාවත්ථියං-

තං කිම්මඤ්ඤසි **රාහුල,** චක්ඛුසම්ඵස්සජා වෙදනා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ -පෙ- සොතසම්ඵස්සජා වෙදනා-පෙ- ඝාණසම්ඵස්සජා වෙදනා -පෙ- ජිව්හාසම්ඵස්සජා වෙදනා -පෙ- කායසම්ඵස්සජා වෙදනා -පෙ- මනොසම්ඵස්සජා වෙදනා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ -පෙ-

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො චක්ඛුසම්ඵස්සජාය වෙදනායපි නිබ්බින්දති. සොතසම්ඵස්සජාය -පෙ- ඝාණසම්ඵස්සජාය පෙ- ජිව්හා-සම්ඵස්සජාය -පෙ- කායසම්ඵස්සජාය -පෙ- මනොසම්ඵස්සජාය වෙදනායපි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති ජානාතීති.

## 6. 1. 6.

### සඤ්ඤාසුත්තං.

345. සාවත්ථියං-

තං කිම්මඤ්ඤසි **රාහුල,** රූපසඤ්ඤා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ -පෙ- සද්දසඤ්ඤා පෙ- ගන්ධසඤ්ඤා -පෙ- රසසඤ්ඤා -පෙ- ඵොට්ඨබ්බසඤ්ඤා -පෙ- ධම්මසඤ්ඤා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ -පෙ-

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො රූපසඤ්ඤායපි නිබ්බින්දති. සද්දසඤ්ඤායපි නිබ්බින්දති ගන්ධසඤ්ඤායපි නිබ්බින්දති. රසසඤ්ඤායපි නිබ්බින්දති. ඵොට්ඨබ්බ සඤ්ඤායපි නිබ්බින්දති. ධම්මසඤ්ඤායපි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 6. 1. 7.

### සඤ්චෙතනාසුත්තං.

346. සාවත්ථියං-

තං කිම්මඤ්ඤසි **රාහුල,** රූපසඤ්චෙතනා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ -පෙ- සද්දසඤ්චෙතනා -පෙ- ගන්ධසඤ්චෙතනා -පෙ- රසසඤ්චෙතනා -පෙ- ඵොට්ඨබ්බසඤ්චෙතනා -පෙ- ධම්මසඤ්චෙතනා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ -පෙ-

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො රූපසඤ්චෙතනායපි නිබ්බින්දති. සද්දසඤ්චෙතනායපි නිබ්බින්දති. ගන්ධසඤ්චෙතනායපි නිබ්බින්දති. රස-සඤ්චෙතනායපි නිබ්බින්දති. ඵොට්ඨබ්බ සඤ්චෙතනායපි නිබ්බින්දති. ධම්ම සඤ්චෙතනායපි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 6. 1. 5.

### වේදනා සූත්‍රය

344. සැවැත්නුවර-

රාහුල, ඒ කිමැයි හගිහි ද? චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වේදනාව නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... සොතසම්ඵස්සයෙන් හටගත් වේදනාව ... ඝාණසම්ඵස්සයෙන් හටගත් වේදනාව ... ජිව්හාසම්ඵස්සයෙන් හටගත් වේදනාව ... කායසම්ඵස්සයෙන් හටගත් වේදනාව ... මනෝසම්ඵස්සයෙන් හටගත් වේදනාව නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ...

රාහුල, මෙසේ දක්නා ශ්‍රුතවත් ආය්‍ර්‍යශ්‍රාවක තෙමේ චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වේදනාවෙහිත් කලකිරෙයි. සොතසම්ඵස්සයෙන් හටගත් ... ඝාණසම්ඵස්සයෙන් හටගත් ... ජිව්හාසම්ඵස්සයෙන් හටගත් ... කායසම්ඵස්සයෙන් හටගත් ... මනෝසම්ඵස්සයෙන් හටගත් වේදනාවෙහිත් කලකිරෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැයි දැන ගණී යි.

## 6. 1. 6.

### සඤ්ඤා සූත්‍රය

345. සැවැත්නුවර-

රාහුල, ඒ කිමැයි හගිහි ද? රූපසඤ්ඤාව නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... සද්දසඤ්ඤාව ... ගන්ධසඤ්ඤාව රසසඤ්ඤාව .... ඵොට්ඨබ්බසඤ්ඤාව ධම්මසඤ්ඤාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ...

රාහුල, මෙසේ දක්නා ශ්‍රුතවත් ආය්‍ර්‍යශ්‍රාවක තෙමේ රූපසඤ්ඤායෙහිත් කලකිරෙයි. සද්දසඤ්ඤායෙහිත් කලකිරෙයි. ගන්ධසඤ්ඤායෙහිත් කලකිරෙයි. රසසඤ්ඤායෙහිත් කලකිරෙයි. ඵොට්ඨබ්බසඤ්ඤායෙහිත් කලකිරෙයි. ධම්මසඤ්ඤායෙහිත් කලකිරෙයි. ... මේ බැව් පිණිස අනෙකක් නැතැයි දැන ගණී යි.

## 6. 1. 7.

### සඤ්චේතනා සූත්‍රය

346 සැවැත්නුවර-

රාහුල, ඒ කිමැයි හගිහි ද? රූපසඤ්චෙතනාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... සද්දසඤ්චෙතනාව ... ගන්ධසඤ්චෙතනාව ... රසසඤ්චෙතනාව ... ඵොට්ඨබ්බසඤ්චෙතනාව ... ධම්මසඤ්චෙතනාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ...

රාහුල, මෙසේ දක්නා ශ්‍රුතවත් ආය්‍ර්‍යශ්‍රාවක තෙමේ රූපසඤ්චෙතනායෙහිත් කලකිරෙයි. සද්දසඤ්චෙතනායෙහිත් කලකිරෙයි. ගන්ධසඤ්චෙතනායෙහිත් කලකිරෙයි. රසසඤ්චෙතනායෙහිත් කලකිරෙයි. ඵොට්ඨබ්බසඤ්චෙතනායෙහිත් කලකිරෙයි ධම්මසඤ්චෙතනායෙහිත් කලකිරෙයි. ... මේ බැව් පිණිස අනෙකක් නැතැයි දැන ගණී යි

## 6. 1 8.

### තණ්හාසුත්තං

347. **සාවත්ථියං-**

තං කිම්මඤ්ඤසි **රාහුල**, රූපතණ්හා නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ' -පෙ- සද්දතණ්හා -පෙ- ගන්ධතණ්හා -පෙ- රසතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා -පෙ- ධම්මතණ්හා නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ' -පෙ-

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො රූපතණ්හායපි නිබ්බින්දති, සද්දතණ්හායපි නිබ්බින්දති, ගන්ධතණ්හායපි නිබ්බින්දති, රසතණ්හායපි නිබ්බින්දති, ඵොට්ඨබ්බතණ්හායපි නිබ්බින්දති, ධම්මතණ්හායපි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 6. 1 9.

### ධාතුසුත්තං

348. **සාවත්ථියං-**

තං කිම්මඤ්ඤසි **රාහුල**, පඨවිධාතු නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ' -පෙ- ආපොධාතු -පෙ- තෙජොධාතු -පෙ- වායොධාතු -පෙ- ආකාසධාතු -පෙ- විඤ්ඤාණධාතු නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ' -පෙ-

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො පඨවිධාතුයාපි නිබ්බින්දති. ආපොධාතුයාපි නිබ්බින්දති, තෙජොධාතුයාපි නිබ්බින්දති, වායොධාතුයාපි නිබ්බින්දති, ආකාසධාතුයාපි නිබ්බින්දති, විඤ්ඤාණධාතුයාපි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 6. 1 10.

### ඛන්ධසුත්තං

349. **සාවත්ථියං-**

තං කිම්මඤ්ඤසි **රාහුල**, රූපං නිච්චං වා අනිච්චං වාති? 'අනිච්චං භන්තෙ' -පෙ- වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? 'අනිච්චං භන්තෙ' -පෙ-

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සංඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. 'ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං. නාපරං ඉත්ථත්තායාති පජානාතී'ති.

**වග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

චක්ඛුං රූපඤ්ච විඤ්ඤාණං සම්ඵස්සං වෙදනාය ච,
සඤ්ඤා සඤ්චෙතනා තණ්හා ධාතු ඛන්ධෙන තෙ දසාති.

## 6. 1. 8.

### තණ්හා සූත්‍රය

347. සැවැත්නුවර-

රාහුල, ඒ කිමැයි හඟිහි ද? රූපතණ්හාව නිත්‍ය ද, අනිත්‍ය ද? වහන්ස, අනිත්‍ය ය'... සද්දතණ්හාව ... ගන්ධතණ්හාව ... රසතණ්හාව ... ඵොට්ඨබ්බ-තණ්හාව... ධම්මතණ්හාව නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ....

රාහුල, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපතණ්හාවෙහිත් කලකිරෙයි, සද්දතණ්හාවෙහිත් කලකිරෙයි, රසතණ්හායෙහිත් කලකිරෙයි, ඵොට්ඨබ්බතණ්හායෙහිත් කලකිරෙයි, ධම්මතණ්හායෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණී යි.

## 6. 1. 9.

### ධාතු සූත්‍රය

348. සැවැත්නුවර-

රාහුල ඒ කිමැයි හඟිහි ද? පඨවිධාතුව නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය'...ආපෝධාතුව...තේජෝධාතුව...වායෝධාතුව ... ආකාසධාතුව ... විඤ්ඤාණ ධාතුව නිත්‍ය ද, අනිත්‍ය ද? දැ යි. 'වහන්ස, අනිත්‍ය ය' ...

රාහුල මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ පඨවිධාතුයෙහි ද කලකිරෙයි, ආපෝධාතුයෙහි ද කලකිරෙයි, තේජෝධාතුයෙහි ද කලකිරෙයි, වායෝධාතුයෙහි ද කලකිරෙයි, ආකාසධාතුයෙහි ද කලකිරෙයි, විඤ්ඤාණ-ධාතුයෙහි ද කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණී යි.

## 6. 1. 10.

### ඛන්ධ සූත්‍රය

349. සැවැත්නුවර-

රාහුල, ඒ කිමැයි හඟිහි ද? රූපය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... වේදනාව ... සඤ්ඤාව ... සඞ්ඛාර ... විඤ්ඤාණය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය ...'

රාහුල, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපයෙහි ද කලකිරෙයි, වේදනායෙහි ද කලකිරෙයි, සඤ්ඤායෙහි ද කලකිරෙයි, සඞ්ඛාරයන්හි ද කලකිරෙයි, විඤ්ඤාණයෙහි ද කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි, මිදුනේ යි දැනීම වේ. 'ජාතිය ක්‍ෂය වූවා ය. මගබඹසර වැස නිමවන ලදී. කටයුතු කරණ ලදී. මේ බැව් පිණිස අනෙකක් නැතැයි දැන ගණී' යි.

[ආයාචනාවෙන් දෙසූ] පළමුවැනි වර්ගය යි.

**එහි උද්දාන:**

චක්ඛු, රූප, විඤ්ඤාණ, සම්ඵස්ස, වේදනා, සඤ්ඤා, සඤ්චේතනා, තණ්හා, ධාතු යන ඔහු ඛන්ධ සූත්‍රය සමග දශයෙකි.

## දුතියො වග්ගො

6. 2. 1.

### චක්ඛුආදිසුත්තං

350. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො ආයස්මා රාහුලො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාහුලං භගවා එතදවොච:

තං කිම්මඤ්ඤසි රාහුල, චක්ඛුං නිච්චං වා අනිච්චං වාති? 'අනිච්චං භන්තෙ'. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? 'දුක්ඛං භන්තෙ'. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං "එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා"ති 'නො හෙතං භන්තෙ'.

සොතං -පෙ- ඝාණං -පෙ- ජිව්හා -පෙ- කායො -පෙ- මනො නිච්චො වා, අනිච්චො වාති? 'අනිච්චො භන්තෙ'. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? 'දුක්ඛං භන්තෙ'. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලන්නු තං සමනුපස්සිතුං: "එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා"?ති. 'නො හෙතං භන්තෙ'.

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, සොතස්මිම්පි නිබ්බින්දති ඝාණස්මිම්පි නිබ්බින්දති ජිව්හායපි නිබ්බින්දති, කායස්මිම්පි නිබ්බින්දති, මනස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතී'ති.

(එතෙන පෙය්‍යාලෙන දස සුත්තන්තා කාතබ්බා.)

6. 2. 2

### රූපාදිසුත්තං

351 සාවත්ථියං-

තං කිම්මඤ්ඤසි රාහුල, රූපා නිච්චා වා අනිච්චා වා ති? 'අනිච්චා භන්තෙ' -පෙ- සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා [නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ.'] -පෙ- එවං පස්සං රාහුල -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

6. 2. 3

### විඤ්ඤාණසුත්තං

352. තං කිම්මඤ්ඤසි රාහුල, චක්ඛුවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? 'අනිච්චං භන්තෙ' -පෙ- සොතවිඤ්ඤාණං -පෙ- ඝාණ විඤ්ඤාණං -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං -පෙ- මනො විඤ්ඤාණං [නිච්චං වා අනිච්චං වාති? 'අනිච්චං භන්තෙ.'] -පෙ- එවං පස්සං රාහුල -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## දෙවෙනි වර්ගය

### 6. 2. 1

### චක්ඛුආදි සූත්‍රය

350 මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඩු සිටුහුගේ** අරමෙහි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් **රාහුල** තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය ... එකත්පසෙක හුන් ආයුෂ්මත් රාහුලහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

රාහුල, ඒ කිමැයි හඟිහි ද? ඇස නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය,' යමක් අනිත්‍ය නම් එය දුක් ද, සැප ද? 'වහන්ස, දුක් ය.' යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරලෙනසුලු නම් එය "මේ මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම ය"යි දක්නට සුදුසු ද යි? 'වහන්ස, සුදුසු නො වේ ම ය.' කණ ... නැහැය ... දිව ... කය... සිත නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍යය.' යමක් අනිත්‍ය නම් එය දුක් ද? සැප ද, 'වහන්ස, දුක් ය.' යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරලෙනසුලු නම් එය "මේ මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම ය" යි දක්නට සුදුසු ද 'වහන්ස, සුදුසු නො වේ ම ය.'

රාහුල, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ඇසෙහි ද කලකිරෙයි,... කණෙහි ද කලකිරෙයි ... නැහැයෙහි ද කලකිරෙයි .. දිවෙහි ද කලකිරෙයි, ... කයෙහි ද කලකිරෙයි ... සිතෙහි ද කලකිරෙයි කල කිරෙන්නේ නො ඇලෙයි. නො ඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේ ය යි දැනීම වෙයි. 'ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදී කට යුතු කරණ ලදී මේ බැව් පිණිස අනෙකක් නැතැ'යි දැනගණී.

(පෙය්‍යාලනයින් සූත්‍රාන්ත දශය සංක්‍ෂෙප කට යුතු යි)

### 6. 2. 2

### රූපාදි සූත්‍රය

351. **සැවැත් නුවර**-

**රාහුල**, ඒ කිමැ යි හඟිහි ද? රූපයෝ නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍යයහ.' ශබ්දයෝ ... ගන්ධයෝ ... රසයෝ ... ස්ප්‍රෂ්ටව්‍යයෝ ... ධර්මයෝ නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍යය.'...රාහුල, මෙසේ දක්නේ .. මේ බැව් පිණිස අනෙකක් නැතැයි දැනගණී යි.

### 6. 2. 3

### විඥානසූත්‍රය.

352. රාහුල, ඒ කිමැයි හඟිහි ද? චක්ඛුවිඥානය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... ශෝතවිඥාන ය ... ඝාණවිඥානය .. ජිව්හා-විඥානය ... කායවිඥානය ... මනෝවිඥානය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍යය.' ... රාහුල, මෙසේ දක්නේ ... මේ බැව් පිණිස අනෙකක් නැතැයි දැනගණී යි.

### 6. 2. 4.

### සම්ඵස්සසුත්තං

353. තං කිම්මඤ්ඤසි රාහුල, චක්ඛුසම්ඵස්සො නිච්චො වා අනිච්චො වාති? අනිච්චො භන්තෙ -පෙ- සොතසම්ඵස්සො -පෙ- ඝාණසම්ඵස්සො -පෙ- ජිව්හාසම්ඵස්සො -පෙ- කායසම්ඵස්සො -පෙ- මනොසම්ඵස්සො [නිච්චො වා අනිච්චො වාති?] 'අනිච්චො භන්තෙ.' -පෙ- එවං පස්සං රාහුල -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 6. 2. 5.

### වෙදනාසුත්තං

354. තං කිම්මඤ්ඤසි රාහුල, චක්ඛුසම්ඵස්සජා වෙදනා නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ' -පෙ- සොතසම්ඵස්සජා වෙදනා -පෙ- ඝාණසම්ඵස්සජාවෙදනා -පෙ- ජිව්හාසම්ඵස්සජා වෙදනා -පෙ- කායසම්ඵස්සජා වෙදනා -පෙ- මනොසම්ඵස්සජා වෙදනා [නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ.']-පෙ-එවං පස්සං, රාහුල-පෙ-නාපරං ඉත්ථත්තායා ති පජානාතීති.

### 6. 2. 6

### සඤ්ඤාසුත්තං

355. තං කිම්මඤ්ඤසි රාහුල, රූපසඤ්ඤා නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ' -පෙ- සද්දසඤ්ඤා -පෙ- ගන්ධසඤ්ඤා -පෙ- රසසඤ්ඤා -පෙ- ඵොට්ඨබ්බසඤ්ඤා -පෙ- ධම්මසඤ්ඤා [නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ'] -පෙ- එවං පස්සං රාහුල -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 6. 2. 7.

### සඤ්චෙතනාසුත්තං

356. තං කිම්මඤ්ඤසි රාහුල, රූපසඤ්චෙතනා නිච්චා වා අනිච්චාවාති? 'අනිච්චා භන්තෙ' -පෙ- සද්දසඤ්චෙතනා -පෙ- ගන්ධසඤ්චෙතනා -පෙ- රසසඤ්චෙතනා -පෙ- ඵොට්ඨබ්බසඤ්චෙතනා -පෙ- ධම්මසඤ්චෙතනා [නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ'] -පෙ- එවං පස්සං, රාහුල -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 6. 2. 8.

### තණ්හාසුත්තං

357. තං කිම්මඤ්ඤසි රාහුල, රූපතණ්හා නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ' -පෙ- සද්දතණ්හා -පෙ- ගන්ධතණ්හා -පෙ- රසතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා -පෙ- ධම්මතණ්හා [නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ'] -පෙ- එවං පස්සං රාහුල -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 6 2 9.

### ධාතුසුත්තං

358. තං කිම්මඤ්ඤසි රාහුල, පඨවීධාතු නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ-පෙ- ආපොධාතු-පෙ- තෙජොධාතු-පෙ- වායොධාතු -පෙ- ආකාසධාතු -පෙ- විඤ්ඤාණධාතු [නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ'] -පෙ- එවං පස්සං රාහුල -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 6. 2. 4.

### සම්ඵස්ස සූත්‍රය

353. රාහුල, ඒ කිමැයි හඟිහි ද? චක්ඛුසම්ඵස්සය නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය.' ... සෝතසම්ඵස්සය ... ඝාණසම්ඵස්සය ... ජිව්හා-සම්ඵස්සය ... කායසම්ඵස්සය ... මනෝසම්ඵස්සය නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍යය.' රාහුල, මෙසේ දක්නේ ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණී යි.

### 6. 2. 5.

### වෙදනා සූත්‍රය

354. රාහුල, ඒ කිමැයි හඟිහි ද? චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වේදනාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... සොතසම්ඵස්සයෙන් හටගත් වේදනාව ... ඝාණසම්ඵස්සයෙන් හටගත් වේදනාව ... ජිව්හාසම්ඵස්සයෙන් හටගත් වේදනාව ... කායසම්ඵස්සයෙන් හටගත් වේදනාව ... මනෝ-සම්ඵස්සයෙන් හටගත් වේදනාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍යය.'... රාහුල, මෙසේ දක්නේ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණී යි

### 6. 2. 6.

### සඤ්ඤා සූත්‍රය

355. රාහුල ඒ කිමැයි හඟිහි ද? රූපසඤ්ඤාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... සද්දසඤ්ඤාව ... ගන්ධසඤ්ඤාව ... රසසඤ්ඤාව ... ඵොට්ඨබ්බසඤ්ඤාව ... ධම්මසඤ්ඤාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය.'... රාහුල, මෙසේ දක්නේ ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණී යි.

### 6. 2. 7.

### සඤ්චෙතනා සූත්‍රය

356. රාහුල, ඒ කිමැයි හඟිහි ද? රූපසඤ්චේතනාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... සද්දසඤ්චේතනාව ... ගන්ධසඤ්චේතනාව ... රස-සඤ්චේතනාව ... ඵොට්ඨබ්බසඤ්චේතනාව ... ධම්මසඤ්චේතනාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය.' රාහුල, මෙසේ දක්නේ ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණී යි.

### 6. 2. 8.

### තණ්හා සූත්‍රය

357. රාහුල, ඒ කිමැයි හඟිහි ද? රූපතණ්හාව නිත්‍ය ද, අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය.' .... සද්දතණ්හාව ... ගන්ධතණ්හාව ... රසතණ්හාව ... ඵොට්ඨබ්බතණ්හාව ... ධම්මතණ්හාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය'. රාහුල, මෙසේ දක්නේ ... මේබැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණී යි.

### 6. 2. 9

### ධාතු සූත්‍රය

358. රාහුල, ඒ කිමැයි හඟිහි ද? පඨවිධාතුව නිත්‍ය ද අනිත්‍ය ද? වහන්ස, අනිත්‍ය ය ... ආපෝධාතුව ... තේජෝධාතුව ... වායෝ ධාතුව ... ආකාසධාතුව ... විඤ්ඤාණධාතුව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය.' ... රාහුල, මෙසේ දක්නේ ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගණියි.

## 6. 2. 10

### ඛන්ධසුත්තං

359 තං කිම්මඤ්ඤසි රාහුල, රූපං නිච්චං වා අනිච්චං වාති? 'අනිච්චං භන්තෙ' -පෙ- වෙදනා -පෙ- සඤ්ඤා-පෙ- සඞ්ඛාරා-පෙ-විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? 'අනිච්චං භන්තෙ' -පෙ- එවං පස්සං රාහුල සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 6. 2. 11.

### මානානුසයසුත්තං

360. සාවත්ථියං-

අථ ඛො ආයස්මා රාහුලො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාහුලො භගවන්තං එතදවොච:

"කථන්නු ඛො භන්තෙ, ජානතො, කථං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිංකාරමමිංකාරමානානුසයා[1] න හොන්ති? ති."

යං කිඤ්චි රාහුල, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා - සබ්බං රූපං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති.

යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති.

එවං ඛො රාහුල, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිංකාරමමිංකාරමානානුසයා න හොන්තීති.

## 6 2. 12.

### මානාපගතසුත්තං

361. සාවත්ථියං-

අථ ඛො ආයස්මා රාහුලො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ-එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාහුලො භගවන්තං එතදවොච: "කථන්නු ඛො භන්තෙ, ජානතො කථං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිංකාරමමිංකාරමානාපගතං මානසං හොති, විධාසමතික්කන්තං සන්තං සුවිමුත්ත"න්ති.?

1. අහංකාර මමංකාරමානානුසයා - මජසං, සතා, PTS , සී 1, 2.

## 6. 2. 10.

## ඛන්ධ සූත්‍රය

359. රාහුල, ඒ කිමැයි හඟිහි ද? රූපය නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... වෙදනාව ... සඤ්ඤාව ... සඞ්ඛාර ... විඤ්ඤාණය නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය ය' ... රාහුල මෙසේ දක්නා උගත් අරිසවු තෙමේ ... මේ බැව් පිණිස අනෙකක් නැතැයි දැන ගණී යි.

## 6. 2. 11

## මානානුසය සූත්‍රය

360. **සැවැත්නුවර-**

එකල්හි ආයුෂ්මත් **රාහුල** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ ... එකත්පසෙක හුන් ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේ ය: "වහන්ස, කෙසේ දන්නහුට කෙසේ දක්නහුට සවිඤ්ඤාණක වූ මේ (සවකීය) කයෙහිත්, පිටත සියලු (සවිඤ්ඤාණක හෝ අවිඤ්ඤාණක වූ) නිමිත්තයන්හිත් අහඞ්කාර (මම යන දෘෂ්ටිය) ද, මමිඞ්කාර (මාගේ යන තෘෂ්ණාව) ද මානානුසයයෝ ද නො වෙද් ද" යි?

රාහුල, අතීත වූ හෝ අනාගත වූ හෝ වර්තමාන වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදාරික වූ හෝ සූක්ෂම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි රූපයෙක් වේද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙක් වේ ද, ඒ සියලු රූපය "මෙය මාගේ නො වේ. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේ ය'යි මෙසේ මෙය තතු සේ මනා නුවණින් දකී.

යම් කිසි වෙදනාවක් ... යම් කිසි සඤ්ඤාවක් ... යම්කිසි සංස්කාර කෙනෙක් ... අතීත වූ හෝ අනාගත වූ හෝ වර්තමාන වූ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදාරික වූ හෝ සූක්ෂම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි විඤ්ඤාණයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් විඤ්ඤාණයෙක් වේ ද, ඒ සියලු විඤ්ඤාණය "මෙය මාගේ නො වේ. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේ ය" යි මෙසේ මෙය තතු සේ මනා නුවණින් දකී.

රාහුල මෙසේ දන්නහුට මෙසේ දක්නහුට සවිඤ්ඤාණක වූ මේ කයෙහිත්, පිටත සියලු නිමිත්තයන්හිත් අහඞ්කාරමමිඞ්කාරමානානුසයයෝ නො වෙති යි.

## 6. 2. 12.

## මානාපගත සූත්‍රය

361. **සැවැත්නුවර-**

එකල්හි ආයුෂ්මත් **රාහුල** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... එකත්පසෙක හුන් ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේ ය: වහන්ස, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ සිත සවිඤ්ඤාණක වූ මේ කයෙහිත්, පිටත සියලු නිමිත්තයන්හිත් අහඞ්කාරයෙන් මමිඞ්කාරයෙන් මානයෙන් පහ වූයේ වේ ද, මානකොටස් මැනවින් ඉක්ම වූයේ සන්සුන් වූයේ මනා කොට මිදුනේ වේ දැ යි?

යං කිඤ්චි රාහුල, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුපාදාවිමුත්තො හොති. (පඤ්චන්නං ඛන්ධානං එවං කාතබ්බං.) යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා - සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා" ති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුපාදාවිමුත්තො හොති.

එවං ඛො රාහුල, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ, බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහඞ්කාරමමඞ්කාරමානාපගතං මානසං හොති විධාසමතික්කන්තං සන්තං සුවිමුත්තන්ති

**වග්ගො දුතියො.**

**තස්සුද්දානං:**

චක්ඛුං රූපඤ්ච විඤ්ඤාණං සම්ඵස්සො වෙදනාය ච,
සඤ්ඤා සඤ්චෙතනා තණ්හා ධාතු ඛන්ධෙන තෙ දස
අනුසයං අපගතඤ්චෙව වග්ගො තෙන පවුච්චතීති

**රාහුලසංයුත්තං සමත්තං.**

රාහුල, අතීත වූ හෝ අනාගත වූ හෝ වර්තමාන වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදාරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් කිසි රූපයකුත් වේ ද, ඒ සියලු රූපය "මෙය මාගේ නො වේ. මේ මම නො වෙමි මේ මාගේ ආත්මය නො වේ ය"යි මෙසේ මෙය තතු සේ මනා නුවණින් දැක උපාදාන රහිත ව මිදුනේ වේ. (පඤ්චස්කන්ධය පිළිබඳ පෙය්‍යාලය මෙසේ කට යුතු යි.) ... යම්කිසි වේදනාවක් ... යම් කිසි සංඥාවක් ... යම් කිසි සංස්කාර කෙනෙක් .. අතීත වූ හෝ අනාගත වූ හෝ වර්තමාන වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදාරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි විඥානයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් කිසි විඥානයකුත් වේ ද, ඒ සියලු විඥානය "මෙය මාගේ නො වේ. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේ ය"යි මෙසේ මෙය තතු සේ මනා නුවණින් දැක උපාදාන රහිත ව මිදුනේ වේ.

රාහුල, මෙසේ දන්නහුගේ මෙසේ දක්නහුගේ සිත සවිඤ්ඤාණක වූ මේ කයෙහි ද, පිටත සියලු නිමිත්තයන්හි ද අහඞ්කාරමමඞ්කාරමානයෙන් පහ වූයේ මාන කොටස් මනා කොට ඉක්මවූයේ සන්හුන් වූයේ මැනවින් මිදුනේ වේ යි

**දෙවෙනි වර්ගය යි.**

**එහි උද්දානය:**

චක්ඛු, රූප, විඤ්ඤාණ, වේදනා, සඤ්ඤා, සඤ්චේතනා, තණ්හා, ධාතු, ඛන්ධ යන දශය ද, අනුසය අපගත දෙක ද යන මේ සූත්‍ර දොළසින් වර්ගය කියනු ලැබේ.

**රාහුලසංයුත්තය නිමියේ ය.**

# 7. ලක්ඛණසංයුත්තං

## 1. පඨමො වග්ගො

### 7. 1. 1

### අට්ඨිසඞ්ඛලිකසුත්තං

362. එවම්මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති වෙළුවනෙ **කලන්දකනිවාපෙ**. තෙන ඛො පන සමයෙන ආයස්මා ච **ලක්ඛණො** ආයස්මා ච **මහාමොග්ගල්ලානො** **ගිජ්ඣකූටෙ** පබ්බතෙ විහරන්ති. අථ ඛො ආයස්මා **මහාමොග්ගල්ලානො** පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙනායස්මා **ලක්ඛණො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ලක්ඛණං එතදවොච: ආයාමාවුසො ලක්ඛණ, රජගහං පිණ්ඩාය පවිසිස්සාමාති. එවමාවුසොති ඛො ආයස්මා ලක්ඛණො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස පච්චස්සොසි.

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අඤ්ඤතරස්මිං පදෙසෙ සිතං පාත්වාකාසි. අථ ඛො ආයස්මා ලක්ඛණො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: කො නු ඛො ආවුසො මොග්ගල්ලාන, හෙතු කො පච්චයො සිතස්ස පාතුකම්මායාති? අකාලො ඛො ආවුසො ලක්ඛණ, එතස්ස පඤ්හස්ස. භගවතො මං සන්තිකෙ එතං පඤ්හං පුච්ඡාති.

අථ ඛො ආයස්මා ච ලක්ඛණො ආයස්මා ච මහාමොග්ගල්ලානො පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ලක්ඛණො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: ඉධායස්මා මහාමොග්ගල්ලානො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අඤ්ඤතරස්මිං පදෙසෙ සිතං පාත්වාකාසි. කො නු ඛො ආවුසො මොග්ගල්ලාන, හෙතු කො පච්චයො සිතස්ස පාතුකම්මායාති?

ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං අට්ඨිකසඞ්ඛලිකං වෙහාසං ගච්ඡන්තිං. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා ඵාසුළන්තරිකාහි විතුදන්ති.[1] සාසුදං[2] අට්ටස්සරං කරොති. තස්ස මය්හං අවුසො, එතදහොසි: අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, එවරූපොපි නාම සත්තො භවිස්සති, එවරූපොපි නාම යක්ඛො භවිස්සති, එවරූපොපි නාම අත්තභාවපටිලාභො භවිස්සතීති.

---

1 විතුදෙන්ති-සීමු, සී. 1, 2, විතුදෙන්ති විතච්ඡෙන්ති විරාජෙන්ති-මජසං, ස්‍යා, විතච්ඡෙන්ති, විභාජෙන්ති-PTS 2. සාසුදං-සීමු. සී1, 2.

# 7. ලක්ඛණසංයුත්තය.

## 1. ප්‍රථමවර්ගය

### 7. 1. 1.

### අට්ඨිසඞ්ඛලික සූත්‍රය

362. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් ලක්ඛණ තෙරණුවෝ ද, ආයුෂ්මත් මහා-මොග්ගල්ලාන තෙරණුවෝ ද ගිජ්ඣකූළපව්වෙහි වැඩවෙසෙති. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ ආයුෂ්මත් ලක්ඛණ තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ලක්ඛණ තෙරුන්ට "ඇවැත්නි, ලක්ඛණයෙනි, යමු, රජගහනුවරට පිඩු පිණිස පිවිසෙන්නෙමු"යි මෙය කීහ. ඇවැත්නි, එසේ ය යි ආයුෂ්මත් ලක්ඛණ තෙරණුවෝ ආයුෂ්මත් මහාමොග්ගල්ලාන තෙරුන්ට පිළිවදන් ඇස්වූහ

ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන තෙරණුවෝ ගිජ්ඣකූළපව්වෙන් බස්නාහු එක්තරා පෙදෙසක දී සිනහ පහළ කළහ. එකල්හි ආයුෂ්මත් ලක්ඛණ තෙරණුවෝ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට "ඇවැත්නි, මොග්ගල්ලානයෙනි, සිනහ පහළ කිරීමට හේතුව කවරේ ද? ප්‍රත්‍යය කවරේ ද"යි මෙය කීහ ඇවැත්නි, ලක්ඛණයෙනි, මේ ප්‍රශ්නයට තො කල් ය. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ප්‍රශ්නය මා විචාරව යි.

ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ තෙරණුවෝ ද ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ද රජගහනුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ එකත්පසෙක හුන් ආයුෂ්මත් ලක්ඛණ තෙරණුවෝ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට මෙය කීහ: මෙහි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ගිජ්ඣකූළපව්වෙන් බස්නාහු එක්තරා පෙදෙසක දී සිනහ පහළ කළහ "ඇවැත්නි, මොග්ගල්ලානයෙනි, සිනහ පහළ කිරීමට හේතුව කවරේ ද, ප්‍රත්‍යය කවරේ ද"යි?

ඇවැත්නි, මෙහි මම ගිජ්ඣකූළපව්වෙන් බස්නෙම් අහසෙහි ගමන් කරණ ඇටසැකිල්ලක් වූ (ප්‍රෙතයකු දිවැසින්) දිටිමි. (යක්) ගිජුලිහිණියෝත් කවුඩෝත් උකුස්සෝත් ඒ මේ ඇටසැකිල්ල ලුහුබඳිමින් ඉළඇට අතරින් විදිත්. ඒ ඇටසැකිල්ල බැගෑහඬ කෙරෙයි ඇවැත්නි, ඒ මට "භවත්නි, ආශ්චර්‍ය්‍යයෙක් ම ය! භවත්නි, අද්භූතයෙක් ම ය! මෙබඳු වූත් සත්ත්වයෙක් වේ ද! මෙබඳු වූත් යක්ෂයෙක් වේ ද! මෙබඳු වූත් අත්බැව් ලැබීමෙක් වේ ද!යි මේ අදහස විය.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: චක්ඛුභූතා වත භික්ඛවෙ, සාවකා විහරන්ති, ඤාණභූතා වත භික්ඛවෙ, සාවකා විහරන්ති, යත්‍ර හි නාම සාවකො එවරූපං ඤස්සති වා දක්ඛති වා සක්ඛිං වා කරිස්සති. පුබ්බෙව මෙ සො භික්ඛවෙ, සත්තො දිට්ඨො අහොසි. අපි චාහං න ව්‍යාකාසිං. අහමෙවෙතං[1] ව්‍යාකරෙය්‍යං, පරෙ මෙ[2] න සද්දහෙය්‍යුං. යෙ මෙ න සද්දහෙය්‍යුං, තෙසං තං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛාය. එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ ගොඝාතකො අහොසි සො තස්ස කම්මස්ස විපාකෙන බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසහස්සානි බහූනි වස්සසතසහස්සානි නිරයෙ පච්චිත්වා[3] තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙන[4] එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදයතීති.

(සබ්බෙසං සුත්තන්තානං එසෙව හි පෙය්‍යාලො.)

## 7. 1. 2

### මංසපෙසිසුත්තං

363 ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං මංසපෙසිං වෙහාසං ගච්ඡන්තිං. තමෙතං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති, විරාජෙන්ති. සා සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ ගොඝාතකො අහොසි -පෙ- [එවරූපං අත්තභාවපටිලාභං] පටිසංවෙදයතිති

## 7. 1. 3

### මංසපිණ්ඩසුත්තං

364. ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං මංසපිණ්ඩං වෙහාසං ගච්ඡන්තං. තමෙතං ගිජ්ඣාපි කාකාපි කුල ලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති, විරාජෙන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ සාකුණිකො අහොසි -පෙ- [එවරූපං අත්තභාවපටිලාභං] පටිසංවෙදයතීති.

## 7. 1. 4

### නිච්ඡවිසුත්තං

365. ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං නිච්ඡවිං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තමෙතං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති, විරාජෙන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා-පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ ඔරබ්භිකො අහොසි -පෙ- [ එවරූපං අත්තභාවපටිලාභං ] පටිසංවෙදයතීති.

---

1 අහඤ්චෙතං - මජ්ඣං, ස්‍යා, PTS. 2. පරෙ ච මෙ - මජ්ඣං. PTS. පරෙපි මෙ - ස්‍යා
3. පච්චිත්වා - සී 1, 2, 4. විපාකවසෙසෙන - සීමු 1, 2.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, යම් හෙයකින් සත්වෙක් ද මෙබන්දක් දන්නේ හෝ දක්නේ හෝ සාක්ෂ්‍ය කරන්නේ හෝ වේ ද, එහෙයින් උපන් (දිව) ඇස් ඇති සත්වෝ මෙහි වෙසෙති. මහණෙනි, උපන් (දිව) නැණ ඇති සත්වෝ මෙහි වෙසෙති. මහණෙනි, මේ සත්ත්වතෙමේ මා විසින් පෙර ම දක්නා ලද්දේ විය. එහෙත් මම නො පැවසුවෙමි. මම ම මෙය පැවසුයෙම් නම් අන්හු (නොදනීමෙන්) මා වදන නො අදහන්නාහු (විය හැකි) ය. යම් කෙනෙක් මා වදන නො අදහන්නාහු නම් එය ඔවුන්ට දිගුකලක් අහිත පිණිස දුක් පිණිස වන්නේ ය. මහණෙනි මේ සත්ත්වතෙමේ මේ රජගහනුවර ම ගෝඝාතකයෙක් (ගෙරින් නසා ඇටෙන් මස් මුදා විකොට වැටෙන්නෙක්) විය. හෙ තෙමේ ඒ කර්මයෙහි විපාකයෙන් බොහෝ වස් ගණන් බොහෝ වස් සියගණන් බොහෝ වස් දහස් ගණන් බොහෝ වස් සියදහස් ගණන් නිරයෙහි පැස ඒ කර්මයාගේ ම ඉතිරි විපාකයෙන් (අට්ඨිසඞ්ඛලිකා පෙතව) මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

(මෙය ම මතු දැක්වෙන සියලු සූත්‍රයන්ගේ පෙය්‍යාලය වේ.)

## 7. 1. 2.

## මංසපෙසි සූත්‍රය

363. ඇවැත්නි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්නෙම් අහසෙහි යන මස්වැදැල්ලක් (වූ ප්‍රේතයකු) දිටිමි ගිජුලිහිණියෝත් කවුඩෝත් උකුස්සෝත් ඒ මේ මස්වැදැල්ල ලුහුබඳිමින් කඩා කති, ඉරා කති. ඒ මස්වැදැල්ල ද බැගෑහඬ කෙරෙයි ... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ... මේ සත්ත්වතෙමේ මේ රජගහනුවර ම ගෙරින් මරන්නෙක් විය ... ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත් බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

## 7. 1. 3.

## මංසපිණ්ඩ සූත්‍රය

364. ඇවැත්නි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්නෙම් අහසෙහි ගමන් කරණ මස්පිඩක් (වූ ප්‍රේතයකු) දිටිමි. ගිජුලිහිණියෝත් කවුඩෝත් උකුස්සෝත් ඒ මෙය ලුහුබඳිමින් කඩා කත්, ඉරා කත්. ඒ මස් පිඩ ද බැගෑහඬ නගයි... මහණෙනි, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ... මේ සත්ත්වතෙමේ මේ රජගහනුවර ම ලිහිණි වැද්දෙක් විය ... ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත් බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

## 7. 1 4.

## නිච්ඡවි සූත්‍රය

365. ඇවැත්නි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්නෙම් අහසෙහි ගමන් කරණ (ඇඟ) සිවිය නැති පුරුෂ(ප්‍රේත)යකු දිටිමි. ගිජුලිහිණියෝත් කවුඩෝත් උකුස්සෝත් ඒ මොහු ලුහුබඳිමින් කඩා කත්, ඉරා කත්. හෙතෙමේ ද බැගෑහඬ කෙරෙයි ... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ... මහණෙනි, මේ සත්ත්වතෙමේ මේ රජගහනුවර ම බැටෙළුවැද්දෙක් විය ... ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

7. 1. 5.

## අසිලොමසුත්තං

366. ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං අසිලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තස්ස තෙ අසී උප්පතිත්වා උප්පතිත්වා තස්සෙව කායෙ නිපතන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ සූකරිකො අහොසි. -පෙ- [එවරූපං අත්තභාවපටිලාභං] පටිසංවෙදයතීති.

7. 1. 6.

## සත්තිලොමසුත්තං

367. ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං සත්තිලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තස්ස තා සත්තියො උප්පතිත්වා උප්පතිත්වා තස්සෙව කායෙ නිපතන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ මාගවිකො අහොසි -පෙ- [එවරූපං අත්තභාවපටිලාභං] පටිසංවෙදයතීති.

7. 1. 7.

## උසුලොමසුත්තං

368 ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං උසුලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තස්ස තෙ උසූ උප්පතිත්වා උප්පතිත්වා තස්සෙව කායෙ නිපතන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ කාරණිකො අහොසි -පෙ- [එවරූපං අත්තභාවපටිලාභං] පටිසංවෙදයතීති.

7 1. 8

## සූචිලොමසුත්තං

369. ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං සූචිලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තස්ස තා සූචියො උප්පතිත්වා උප්පතිත්වා තස්සෙව කායෙ නිපතන්ති. සො සුදං අට්ටස්සරං කරොති. -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ සූතො අහොසි -පෙ- [එවරූපං අත්තභාවපටිලාභං] පටිසංවෙදයතීති.

## 7. 1. 5.

### අසිලෝම සූත්‍රය

366. ඇවැත්නි, මෙහි මම ගිජ්ඣකූළ පව්වෙන් බස්නෙමි අහසෙහි ගමන් කරණ අසිලෝම් (=කඩුමුවා ලෝම්) ඇති පුරුෂ (ප්‍රේත) යකු දිටිමි. ඔහුගේ ඒ අසි උඩ නැග නැග ඔහුගේ ම සිරුරෙහි වැටේ. හෙතෙමේද බැගෑහඬ කෙරෙයි... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ... මහණෙනි, මේ සත්ත්වතෙමේ මේ රජගහ නුවර ම හූරුවැද්දෙක් විය ... ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

## 7. 1. 6.

### සත්තිලෝම සූත්‍රය

367. ඇවැත්නි, මෙහි මම ගිජ්ඣකූළ පව්වෙන් බස්නෙමි අහසෙහි ගමන් කරණ සැත්ලෝම් (=සැත්මුවා ලෝම්) ඇති පුරුෂයකු දිටිමි. ඔහුගේ ඒ සැත් උඩට නැග නැග ඔහුගේ ම කයෙහි වැටේ. හෙතෙමේ ද බැගෑහඬ කෙරෙයි... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ... මහණෙනි, මේ සත්ත්වතෙමේ මේ රජගහ-නුවර ම මුවවැද්දෙක් විය ... ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

## 7. 1. 7.

### උසුලෝම සූත්‍රය

368. ඇවැත්නි, මෙහි මම ගිජ්ඣකූළ පව්වෙන් බස්නෙමි අහසෙහි ගමන් කරණ හීලෝම් (=හීමුවා ලෝම්) ඇති පුරුෂයකු දිටිමි. ඔහුගේ ඒ හී උඩට නැග නැග ඔහුගේ ම කයෙහි වැටේ. හෙතෙමේ ද බැගෑහඬ තගයි ... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ... මහණෙනි, මේ සත්ත්වතෙමේ මේ රජගහ-නුවර ම වධකයෙක් විය ... ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

## 7. 1. 8

### සූචිලෝම සූත්‍රය

369 ඇවැත්නි, මෙහි මම ගිජ්ඣකූළ පව්වෙන් බස්නෙමි අහසෙහි ගමන් කරණ හිදිලෝම් (=හිදිමුවා ලෝම්) ඇති පුරුෂයකු දිටිමි. ඔහුගේ ඒ හිදි උඩට නැග නැග ඔහුගේ ම කයෙහි වැටේ. හෙතෙම ද බැගෑහඬ කෙරෙයි ... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ... මහණෙනි, මේ සත්ත්වතෙමේ මේ රජගහ-නුවර ම රියැදුරෙක් විය ... ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

## 7. 1. 9.

### දුතියසූචිලොමසුත්තං

370. ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං සූචිලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තස්ස තා සූචියො සීසෙ පවිසිත්වා මුඛතො නික්ඛමන්ති. මුඛෙ පවිසිත්වා උරතො නික්ඛමන්ති, උරෙ පවිසිත්වා උදරතො නික්ඛමන්ති, උදරෙ පවිසිත්වා ඌරූහි නික්ඛමන්ති, ඌරූසු පවිසිත්වා ජඞ්ඝාහි නික්ඛමන්ති, ජඞ්ඝාසු පවිසිත්වා පාදෙහි නික්ඛමන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ සූචකො අහොසි -පෙ- [එවරූපං අත්තභාව පටිලාභං] පටිසංවෙදයතීති.

## 7. 1. 10.

### කුම්භණ්ඩසුත්තං

371 ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං කුම්භණ්ඩං පුරිසං වෙහාසං ගච්ඡන්තං. සො ගච්ඡන්තොපි තෙව අණ්ඩෙ ඛන්ධෙ ආරොපෙත්වා ගච්ඡති. නිසීදන්තොපි තෙසෙව අණ්ඩෙසු නිසීදති. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති, විරාජෙන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ ගාමකූටො අහොසි -පෙ- [එවරූපං අත්තභාව පටිලාභං] පටිසංවෙදයතීති.

පඨමො වග්ගො.

තස්සුද්දානං:

අට්ඨි පෙසි උභො ගොඝාතකා
පිණ්ඩසාකුණියො නිච්ඡවොරබ්භි,
අසි සූකරිකො සත්ති මාගවි
උසුකාරණියො සූචි සාරථි,
යො ච සිබ්බියති සූචකො හි සො
අණ්ඩභාරී අහු ගාමකූටකොති.

## 7. 1. 9.

### දෙවන සූචිලෝම සූත්‍රය

370. ඇවැත්නි, මෙහි මම ගිජ්ඣකූළ පව්වෙන් බස්නෙම් අහස්හි ගමන් කරණ හිදිලොම් (=හිදිමුවා ලොම්) ඇති පුරුෂයකු දිටිමි. ඔහුගේ ඒ හිදි හිසෙහි පිවිස මුවෙන් නික්මෙයි. මුවෙහි පිවිස ලයෙන් නික්මෙයි. ලයෙහි පිවිස කුසෙන් නික්මෙයි. කුසෙහි පිවිස කලවෙන් නික්මෙයි. කලවෙහි පිවිස කෙණ්ඩයෙන් නික්මෙයි. කෙණ්ඩයෙහි පිවිස පාදයෙන් නික්මෙයි. හෙතෙමේ ද බැගෑහඬ නගයි ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ... මහණෙනි, මේ සත්ත්වතෙමේ මේ රජගහනුවර ම සූචකයෙක් (=පිසුණු බණන්නෙක්) විය ... ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

## 7. 1. 10

### කුම්භණ්ඩ සූත්‍රය

371. ඇවැත්නි, මෙහි මම ගිජ්ඣකූළ පව්වෙන් බස්නෙම් අහසෙහි ගමන් කරණ කුම්භණ්ඩ (=කළ පමණ අණ්ඩ) ඇති පුරුෂයකු දිටිමි. හෙතෙමේ යන්නේ ද ඒ අණ්ඩ කඳට නගා ගෙණ ම යෙයි. හිඳින්නේ ද ඒ අණ්ඩයන්හි ම හිඳියි. ඒ මොහු ගිජුලිහිණියෝත් කවුඩෝත් උකුස්සෝත් ලුහුබඳිමින් කඩා කත්, ඉරා කත්. හෙතෙමේ ද බැගෑහඬ කෙරෙයි. ... ඉක්බිති භාග්‍ය-වතුන් වහන්සේ ... මහණෙනි, මේ සත්ත්වතෙමේ මේ රජගහනුවර ම (අල්ලස් ගන්නා) විනිසකරු ඇමතියෙක් විය ... ඒ කර්මයාගේ විපාකාවශේෂ-යෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

පළමුවැනි වර්ගය යි.

එහි උද්දානය:

ගෝඝාතක වූ අට්ඨි පෙසි සූත්‍ර දෙක ය, සාකුණික වූ පිණ්ඩ සූත්‍රය, ඔරබ්භික වූ නිච්ඡවි සූත්‍රය, සූකරික වූ අසි සූත්‍රය, මාගවික වූ සත්ති සූත්‍රය, කාරණික වූ උසු සූත්‍රය, සාරථි වූ සූචි සූත්‍රය, සූචක වූ සූචි සූත්‍රය, ගාමකූටක වූ අණ්ඩභාරී (=කුම්භණ්ඩ) සූත්‍රය යි සූත්‍ර දශයෙකි.

## 2. දුතියො වග්ගො

### 7. 2. 1

### ගූථකූපසුත්තං

372. **රාජගහෙ**-

ඉධාහං ආවුසො, **ගිජ්ඣකූටා** පබ්බතා ඔරෝහන්තො අද්දසං පුරිසං ගූථකූපෙ සසීසකං[1] නිමුග්ගං -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව රාජගහෙ පාරදාරිකො අහොසි -පෙ- එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදයතීති

### 7. 2. 2.

### ගූථඛාදිසුත්තං

373. ඉධාහං ආවුසො, **ගිජ්ඣකූටා** පබ්බතා ඔරෝහන්තො අද්දසං පුරිසං ගූථකූපෙ නිමුග්ගං, උභොහි හත්ථෙහි ගූථං ඛාදන්තං -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව **රාජගහෙ** දුට්ඨබ්‍රාහ්මණො අහොසි. සො **කස්සපස්ස** සම්මාසම්බුද්ධස්ස පාවචනෙ භික්ඛුසඞ්ඝං භත්තෙන නිමන්තෙත්වා දොණියො ගූථස්ස පූරාපෙත්වා කාලං ආරොචාපෙත්වා එතදවොච: අතො භොන්තො, යාවදත්ථං භුඤ්ජන්තු චෙව හරන්තු චාති -පෙ- එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදයතීති

### 7. 2. 3

### නිච්ඡවිත්ථිසුත්තං

374. ඉධාහං ආවුසො, **ගිජ්ඣකූටා** පබ්බතා ඔරෝහන්තො අද්දසං නිච්ඡවිං ඉත්ථිං වෙහාසං ගච්ඡන්තිං. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති, විරාජෙන්ති. සා සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසා භික්ඛවෙ, ඉත්ථී ඉමස්මිං යෙව **රාජගහෙ** අතිචාරිනී අහොසි -පෙ- එවරූපං අත්තභාවපටිලාභං පටිසං-වෙදයතීති.

### 7. 2. 4

### මඞ්ගුලිත්ථිසුත්තං

375. ඉධාහං ආවුසො, **ගිජ්ඣකූටා** පබ්බතා ඔරෝහන්තො අද්දසං ඉත්ථිං දුග්ගන්ධං මඞ්ගුලිං[2] වෙහාසං ගච්ඡන්තිං. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති, විරාජෙන්ති. සා සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසා භික්ඛවෙ, ඉත්ථී ඉමස්මිං යෙව **රාජගහෙ** ඉක්ඛණිකා අහොසි -පෙ- එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදයතීති.

---

1. සීසකං - සිමු. සතා. 2. මඞ්කුලිං - අට්ඨකථා

# 2. දෙවනවග්ගය

## 7. 2. 1

### ගූථකූප සූත්‍රය

372. **රජගහනුවර-**

**ඇවැත්නි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්නෙම් අසූචිවළක හිස සහිත ව ගිලුනු පුරුෂයකු දිටිමි ... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ... මහණෙනි, මේ සත්ත්වතෙමේ මේ රජගහනුවර ම පරඹුන් සෙවුනෙක් විය ... ඒකම්යාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත් බැව් පිළිලැබීමක් විඳි සි වදාළසේක.**

## 7. 2. 2

### ගූථඛාදි සූත්‍රය

373. මහණෙනි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්නෙම් අසුචිවළක ගිලුනු දෑතින් අසුචි කන පුරුෂයකු දිටිමි... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ... මහණෙනි, මේ සත්ත්වතෙමේ මේ රජගහනුවර ම දුෂ්ට බමුණෙක් විය. හෙතෙමේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ සස්නෙහි භික්සඟන බතින් පවරා අසුචියෙන් ඔරු පුරවා කල් දන්වා "පින්වත්නි, මෙයින් ඇති තාක් අනුභව කෙරෙත්වා හැර ගෙණ ද යෙත්වා" යි මෙය කී ය ... ඒ කම්යාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳි සි වදාළසේක.

## 7. 2. 3.

### නිච්ඡවිත්ථි සූත්‍රය

374. ඇවැත්නි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්නෙම් අහසෙහි ගමන් කරණ සිවිය නැති ස්ත්‍රියක දිටිමි. යක්ගිජුලිහිණියෝ ද කවුඩෝ ද උකුස්සෝ ද ඒ මැය ලුහුබඳිමින් කඩා කති, ඉරා කති. ඕතොමෝ බැගෑහඩ කෙරෙයි ... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ... මහණෙනි, මේ ස්ත්‍රී තොමෝ මේ රජගහ-නුවර ම වෛශ්‍යාවක් වූවා ය ... ඒ කම්යාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත් බැව් පිළිලැබීමක් විඳි සි වදාළසේක.

## 7. 2. 4.

### මඞ්ගුලිත්ථි සූත්‍රය

375. ඇවැත්නි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්නෙම් අහසෙහි ගමන් කරණ දුගඳ පිළිකුල් කට යුතු ස්ත්‍රියක දිටිමි යක්ගිජුලිහිණියෝ ද කවුඩෝ ද උකුස්සෝ ද ඒ මැය ලුහුබඳිමින් කඩා කති, ඉරා කති. ඕතොමෝ බැගෑහඩ කෙරෙයි ... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ... මහණෙනි, මේ ස්ත්‍රී තොමෝ මේ රජගහනුවර ම යක්දැස්සක් (යක්දෙහිකම් කරන්නියක්) වූවා ය ... මහාජනයා මිසදිටු ගැන් වූ ඒ කම්යාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබිමක් විඳි සි වදාළසේක

7. 2. 5.

## ඔකිලිනීසුත්තං

376. ඉධාහං ආවුසො, **ගිජ්ඣකූටා** පබ්බතා ඔරොහන්තො අද්දසං ඉත්ථිං උප්පක්කං ඔකිලිනිං ඔකිරිණිං වෙහාසං ගච්ඡන්තිං. සා සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසා භික්ඛවෙ, ඉත්ථී **කාලිඞ්ගස්ස**[1] රඤ්ඤො අග්ගමහෙසී අහොසි. සා ඉස්සාපකතා සපත්තිං අඞ්ගාරකටාහෙන ඔකිරි -පෙ- එවරූපං අත්තභාව පටිලාභං පටිසංවෙදයතීති.

7. 2. 6.

## අසීසකසුත්තං

377. ඉධාහං ආවුසො, **ගිජ්ඣකූටා** පබ්බතා ඔරොහන්තො අද්දසං අසීසකං කබන්ධං[2] වෙහාසං ගච්ඡන්තං. තස්ස උරෙ අක්ඛීනි චෙව හොන්ති මුඛඤ්ච. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති, විරාජෙන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, සත්තො ඉමස්මිං යෙව **රාජගහෙ** **හාරිකො** නාම චොරඝාතකො අහොසි -පෙ- එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදයතීති.

7. 2. 7.

## භික්ඛුසුත්තං

378. ඉධාහං ආවුසො **ගිජ්ඣකූටා** පබ්බතා ඔරොහන්තො අද්දසං භික්ඛුං වෙහාසං ගච්ඡන්තං. තස්ස සඞ්ඝාටිපි ආදිත්තා සම්පජ්ජලිතා සජොතිභූතා, පත්තොපි ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො, කාය-බන්ධනම්පි ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං, කායොපි ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො, සො සුදං අට්ටස්සරං කරොති -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ, භික්ඛු **කස්සපස්ස** සම්මාසම්බුද්ධස්ස පාවචනෙ පාපභික්ඛු අහොසි -පෙ- එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදයතීති.

7. 2. 8.

## භික්ඛුනීසුත්තං

379. ඉධාහං ආවුසො, **ගිජ්ඣකූටා** පබ්බතා ඔරොහන්තො අද්දසං භික්ඛුනිං වෙහාසං ගච්ඡන්තිං. තස්සා සඞ්ඝාටිපි ආදිත්තා -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසා භික්ඛවෙ භික්ඛුනී **කස්සපස්ස** සම්මාසම්බුද්ධස්ස පාවචනෙ පාපභික්ඛුනී අහොසි -පෙ- එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදයතීති

---

1 කලිඞ්ගස්ස - මජ්සං, සතා, PTS. 2. කවන්ධං - සීමු, PTS. සී 1, 2.

7. 2. 5.

## ඛකලිනි සූත්‍රය.

376. ඇවැත්නි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්තෙම් අහසෙහි ගමන් කරණ ගින්නෙන් පැසුනු සිරුරු ඇති ඩහ වැගිරෙණ ගිනි අඟුරින් හාත්පස ගැවසුනු ස්ත්‍රියක දිටිමි. ඕතොමෝ බැගෑහඬ කෙරෙයි... [ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ...] මහණෙනි, මේ ස්ත්‍රී තොමෝ කලිඟුරජ්ජුගේ අගමෙහෙසිය වූවා ය. ඕ තොමෝ ඊර්ෂ්‍යායෙන් මඩනා ලද්දී සැතිරිය (=සැමියාගේ අන් බිරිය) මත ඇඟුරුකබලක් හලාලීය ... ඒ කම්යාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳි සි වදාළසේක.

7. 2. 6.

## අසීසක සූත්‍රය

377. ඇවැත්නි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්තෙම් අහසෙහි ගමන් කරණ හිස නැති සිරුරක් (=කවන්ධයක්) දිටිමි. එහි ළයෙහි ඇස් ද, මුව ද වෙයි. ගිජුලිහිණියෝ ද කවුඩෝ ද උකුස්සෝ ද ඒ මෙග ලුහුබඳිමින් කඩා කති, ඉරා කති. හේ ද බැගෑ හඬ කෙරෙයි. [ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ...] මහණෙනි, මේ සත්ත්ව තෙමේ මේ රජගහනුවර ම හාරික නම් චෝරඝාතයෙක් විය ... ඒ කම්යාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳි සි වදාළසේක.

7. 2. 7.

## භික්ඛු සූත්‍රය

378. ඇවැත්නි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්තෙම් අහස්හි ගමන් කරණ මහණකු දිටිමි. ඔහුගේ සඟල ද හාත්පසින් ඇවිල ගත්තේ ය. ගිනි ගෙණ දිලියෙන්නේ ය. ගිනිදැල් සහිත ය. පාත්‍රය ද හාත්පසින් ඇවිල ගත්තේ ය. ගිනි ගෙණ දිලියෙන්නේ ය. ගිනිදැල් සහිත ය කාබන්ධ ද ආදිත්තය, සම්පජ්ජලිත ය, සජෝතිභූත ය. කය ද ආදිත්ත ය, සම්පජ්ජලිත ය, සජෝතිභූත ය. හෙතෙමේ ද බැගෑ හඬ කෙරෙයි. [ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ..] මහණෙනි, මේ මහණ තෙමේ කාශ්‍යප සම්මාසම්බුද්ධ-රජාතන් වහන්සේගේ සස්නෙහි පැවිදි මහණෙක් විය ... ඒ කම්යාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳි සි වදාළසේක.

7. 2. 8.

## භික්ඛුණී සූත්‍රය

379. ඇවැත්නි, මෙහි මම ගිජුකුළු පව්වෙන් බස්තෙම් අහසෙහි ගමන් කරණ මෙහෙණක දිටිමි. ඇගේ සඟල ද හාත්පසින් ඇවිල ගත්තේ ය. ... [ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ...] මහණෙනි, මේ මෙහෙණ තොමෝ කාශ්‍යප සම්මාසම්බුද්ධරජාතන් වහන්සෙගේ සස්නෙහි පැවිදි මෙහෙණක් වූවාය. ... ඒ කම්යාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳි සි වදාළසේක.

## 7. 2. 9.

### සික්ඛමානාසුත්තං

380. ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං සික්ඛමානං වෙහාසං ගච්ඡන්තිං. තස්සා සංඝාටිපි ආදිත්තා -පෙ- [අථ ඛො භගවා-පෙ-] එසා භික්ඛවෙ සික්ඛමානා කස්සපස්ස සම්මාසම්බුද්ධස්ස පාවචනෙ පාපසික්ඛමානා අහොසි -පෙ- එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදයතීති

## 7. 2. 10

### සාමණෙරසුත්තං

381. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං සාමණෙරං වෙහාසං ගච්ඡන්තං. තස්ස සඞ්ඝාටිපි ආදිත්තා -පෙ- [අථ ඛො භගවා -පෙ-] එසො භික්ඛවෙ සාමණෙරො කස්සපස්ස සම්මාසම්බුද්ධස්ස පාවචනෙ පාපසාමණෙරො අහොසි -පෙ- එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදයතීති

## 7. 2. 11

### සාමණෙරීසුත්තං

382. ඉධාහං ආවුසො, ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං සාමණෙරිං වෙහාසං ගච්ඡන්තිං තස්සා සඞ්ඝාටිපි ආදිත්තා සම්පජ්ජලිතා සජොතිභූතා. පත්තොපි ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො. කායබන්ධනම්පි ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං. කායොපි ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො. සා සුදං අට්ටස්සරං කරොති තස්ස මය්හං ආවුසො, එතදහොසි. අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, එවරූපොපි නාම සත්තො භවිස්සති. එවරූපොපි නාම යක්ඛො භවිස්සති එවරූපොපි නාම අත්තභාවපටිලාභො භවිස්සතීති. [-පෙ-]

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: චක්ඛුභූතා වත භික්ඛවෙ, සාවකා විහරන්ති. ඤාණභූතා වත භික්ඛවෙ, සාවකා විහරන්ති. යත්‍ර හි නාම සාවකො එවරූපං ඤස්සති වා දක්ඛිති වා සක්ඛිං වා කරිස්සති. පුබ්බෙව මෙ සා භික්ඛවෙ, සාමණෙරී දිට්ඨා අහොසි අපි චාහං න බ්‍යාකාසිං. අහමෙතං බ්‍යාකරෙය්‍යං, පරෙ මෙ න සද්දහෙය්‍යුං. යෙ මෙ න සද්දහෙය්‍යුං. තෙසං තං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛාය.

## 7 2. 9

## සික්ඛමානා සූත්‍රය

380. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකූළ පව්වෙන් බස්නෙම් අහස්හි ගමන් කරණ සික්ඛමානාවක දිටිමි. ඇගේ සඟළ ද ආදිත්ත ය ... [ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ...] මහණෙනි, මේ සික්ඛමානාව කසුප් සම්මාසම්බුදුරජාතන් වහන්සේගේ සස්නෙහි පවිටු සික්ඛමානාවක් වූවා ය. ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳි යි. වදාළසේක.

## 7. 2. 10.

## සාමණේර සූත්‍රය

381. ඇවැත්නි, මෙහි මම ගිජ්ඣකූළ පව්වෙන් බස්නෙම් අහස්හි ගමන් කරණ හෙරණකු දිටිමි. ඔහුගේ සඟළ ද ආදීප්ත ය ... ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ .. මහණෙනි, මේ හෙරණ තෙමේ කසුප් සම්මාසම්බුදුරජාතන් වහන්සේගේ සස්නෙහි පවිටු හෙරණෙක් විය .. ඒ කර්මයාගේ විපාකාවශේෂයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳි යි වදාළසේක.

## 7. 2. 11.

## සාමණේරී සූත්‍රය

382. ඇවැත්නි, මෙහි මම ගිජ්ඣකූළ පව්වෙන් බස්නෙම් අහස්හි ගමන් කරණ හෙරණක දිටිමි. ඇගේ සඟළ ද ආදිත්ත ය, සම්පජ්ජලිත ය, සජෝතිභූත ය. පාත්‍රය ද ආදිත්ත ය, සම්පජ්ජලිත ය, සජෝතිභූත ය. කාබන ද ආදිත්ත ය, සම්පජ්ජලිත ය, සජෝතිභූත ය. කය ද ආදිත්ත ය, සම්පජ්ජලිත ය, සජෝතිභූත ය. ඕතොමෝ ද බැගෑහඬ කෙරෙයි. ඇවැත්නි, ඒ මට මේ අදහස විය. “පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත්නි, ඒකාන්තයෙන් අද්භූතයෙකි මෙබඳු නම් සත්ත්වයෙක් වන්නේ ද, මෙබඳු නම් යක්ෂයෙක් වන්නේ ද, මෙබඳු නම් අත්බැව් පිළිලැබීමෙක් වන්නේදැ”යි. ...

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. යම් හෙයෙකින් ශ්‍රාවක තෙමේ මෙබන්දක් දන්නේ හෝ වේ ද, දක්නේ හෝ වේ ද, සාක්ෂ්‍ය කරන්නේ හෝ වේ ද, (එහෙයින්) මහණෙනි, ශ්‍රාවකයෝ ඒකාන්තයෙන් ඝට ගත් ඇස් ඇත්තාහු වෙසෙත් මහණෙනි, ශ්‍රාවකයෝ ඒකාන්තයෙන් ඝට ගත් නුවණ ඇත්තාහු වෙසෙත්. මහණෙනි, පෙර ම මා විසින් ඒ හෙරණී දක්නා ලද්දී වූවා ය. එහෙත් මම නො පැවසීමි. මම ම මෙය පැවසුයෙම් නම් අන්නු මා වදන නො අදහන්නාහු ය. යම් කෙනෙක් මා වදන නො අදහන්නාහු නම් එය ඔවුනට දිගුකලක් මුළුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේ ය.

එසා භික්ඛවෙ, සාමණෙරී කස්සපස්ස සම්මාසම්බුද්ධස්ස පාවචනෙ පාපසාමණෙරී අහොසි, සා තස්ස කම්මස්ස විපාකෙන බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසහස්සානි බහූනි වස්සසතසහස්සානි නිරයෙ පච්චිත්වා තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙන එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදයතීති

### වග්ගො දුතියො

තස්සුද්දානං:

කූපෙ නිමුග්ගො හි සො පාරදරිකො
ගූථඛාදී අහු දුට්ඨසමණබ්‍රාහ්මණො,
නිච්ඡවිත්ථී අතිචාරිනී අහු
මඞ්ගුලිත්ථී අහු ඉක්ඛණිත්ථිකා,
ඔකිලිනී සපත්තඞ්ගාරකොකිරි
සීසච්ඡින්නො අහු චොරඝාතකො,
භික්ඛු භික්ඛුනී සික්ඛමානා සාමණෙරො අථ
සාමණෙරිකා කස්සපස්ස විනයස්මිං පබ්බජ්ජ,
පාපකම්මං අකරිංසු තාවදෙති

ලක්ඛණසංයුත්තං සමත්තං.

මහණෙනි, මේ සෙරණ තොමෝ කසුප් සම්මාසම්බුදුන්ගේ සස්නෙහි පැවිදි මෙහෙණක් වූවා ය. ඕ තොමෝ ඒ කර්මයේ විපාකයෙන් බොහෝ වස් ගණන් බොහෝ වස් සියගණන් බොහෝ වස් දහස්ගණන් බොහෝ වස් සියදහස්ගණන් නිරයෙහි පැස ඒ කර්මයාගේ ම ඉතිරි විපාකයෙන් මෙබඳු අත්බැව් පිළිලැබීමක් විඳී යි වදාළසේක.

**දෙවෙනි වර්ගය යි.**

**එහි උද්දානය**:

කූපයෙහි නිමග්න වූ මෙතෙමේ පාරදාරික වූයේ ය. අශුචි කන්නේ දුෂ්ටබ්‍රාහ්මණයෙක් වූයේ ය. සිවිය නැත්තී වෛශ්‍යාවක් වූවා ය. පිළිකුල් කටයුත්තී සද්දූස්සක් වූවා ය. ඔහ වැගිරෙන්නී සැතිරිය මත අඟුරු විසිරීය. හිස්හුන් නැතැත්තේ චෞරඝාතකයෙක් විය. භික්ෂු භික්ෂුනී සික්ඛමානා සාමණේර සාමණේරීහු කසුප් සස්නෙහි පැවිදිව රිසිසේ පව්කම් කළහ.

**ලක්ඛණසංයුත්තය නිමියේ ය.**

# 8. ඔපම්මසංයුත්තං

## 1. පඨමො වග්ගො

### 8. 1. 1.

### කූටසුත්තං

383. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා -පෙ- එතදවොච:

සෙය්‍යථාපි භික්ඛවෙ, කූටාගාරස්ස යා කාචි ගොපානසියො, සබ්බා තා කූටඞ්ගමා කූටසමොසරණා, කූටසමුග්ඝාතා සබ්බා තා සමුග්ඝාතං ගච්ඡන්ති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි අකුසලමූලා[1] සබ්බෙ තෙ අවිජ්ජඞ්ගමා[2] අවිජ්ජාසමොසරණා. අවිජ්ජාසමුග්ඝාතා සබ්බෙ තෙ සමුග්ඝාතං ගච්ඡන්ති.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: "අප්පමත්තා විහරිස්සාමා"ති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති

### 8 1 2.

### නඛසිඛාසුත්තං

384. **සාවත්ථියං**-

අථ ඛො භගවා පරිත්තං නඛසිඛායං පංසුං ආරොපෙත්වා භික්ඛූ ආමන්තෙසි: තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, කතමන්නු ඛො බහුතරං යො වායං[3] මයා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො, අයං වා[4] මහාපථවීති?

එතදෙව භන්තෙ බහුතරං යදිදං මහාපථවී. අප්පමත්තකොයං භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො. සඞ්ඛම්පි න උපෙති, උපනිධිම්පි න උපෙති, කලභාගම්පි න උපෙති මහාපථවිං උපනිධාය භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතොති.

එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අඤ්ඤත්‍ර මනුස්සෙහි පච්චාජායන්ති.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: "අප්පමත්තා විහරිස්සාමා"ති එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

---

1. අකුසලා ධම්මා - මජසං, PTS, ස්‍යා 2. අවිජ්ජා-මූලකා මජසං PTS, ස්‍යා
3. යො චායං - මජසං. 4. යො වායං - මජසං.

# 8. ඕපම්මසංයුත්තය

## 1. ප්‍රථමවර්ගය

### 8. 1. 1.

### කූට සූත්‍රය

383. මා විසින් මෙසේ අසන ලදි: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් **අනේපිඩු** සිටුහුගේ අරමෙහි වැඩ වසන සේක.

එහි දී භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: මහණෙනි, යම් සේ කුළුගෙයක හැම ගොනැස්හු ම කූටයෙහි (කැණිමඩලෙහි) පිවිසියාහු කූටයෙහි මුළුදුන්නාහු ද කූටය බිඳීමෙන් ඒ හැම විනාශයට යෙත් ද, මහණෙනි, එසෙයින් ම යම් කිසි අකුසල්මුල් කෙනෙක් වෙත් ද, ඒ හැම අවිද්‍යාවෙහි පිවිසියාහු අවිද්‍යාවෙහි මුළුදුන්නාහු වෙත්. අවිද්‍යාව නැසීමෙන් ඒ සියලු අකුශලමූලයෝ විනාශයට යෙති.

එහෙයින් මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු. "අප්‍රමත්ත ව වසන්නමෝ"යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැයි.

### 8. 1. 2.

### නඛසිඛා සූත්‍රය

384. **සැවැත්නුවර**-

එකල්හි භාග්‍යවතුන් වහන්සේ නියසිළෙහි පස් බුදක් තගා භික්ෂූන් ඇමතූ සේක "මහණෙනි, ඒ කිමැයි හඟිවු ද? කිමෙක් ඉබොහෝ ද? මා විසින් නියසිළෙහි තගන ලද මේ පස් බිඳ ද, නොහොත් මේ මහ පොළොව දැ"යි.

වහන්ස, යම් මේ මහපොළවක් වේ ද, එය ම ඉබොහෝ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් නියසිළෙහි තගන ලද මේ පස්බුද සවල්ප ය. භාග්‍යවතුන් වහන්සේ විසින් නියසිළෙහි තගන ලද පස්බුද මහපොළොව හා සැසඳීමෙහි දී ගණනකට ද නො පැමිණේ. උපමාවට ද නො පැමිණේ. සොළොස්වැනි කලාවෙන් කලාවට ද නො පැමිණේ. මහණෙනි, එසෙයින් ම යම් කෙනෙක් මිනිසුන් කෙරෙහි උපදිද්ද, ඒ සත්ත්වයෝ ඉතා අල්පය. වැලි යම් කෙනෙක් මිනිස්ලොවින් අන් තන්හි උපදිත් ද, මේ සත්ත්වයෝ ම ඉතා බොහෝය

එහෙයින් මහණෙනි, තොප විසින් මෙහි මෙසේ හික්මිය යුතු. "නො පමා ව වෙසෙන්නමෝ"යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 8. 1. 3.

## කුලසුත්තං

385. සාවත්ථියං-

සෙය්‍යථාපි භික්ඛවෙ, යානි කානිචි කුලානි බහුත්ථිකානි අප්පපුරිසානි, තානි සුප්පධංසියානි හොන්ති චොරෙහි කුම්භත්ථෙනකෙහි. එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි භික්ඛුනො මෙත්තා චෙතොවිමුත්ති අභාවිතා අබහුලීකතා, සො සුප්පධංසියො හොති අමනුස්සෙහි.

සෙය්‍යථාපි භික්ඛවෙ, යානි කානිචි කුලානි අප්පිත්ථිකානි[1] බහුපුරිසානි, තානි දුප්පධංසියානි හොන්ති චොරෙහි කුම්භත්ථෙනකෙහි. එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි භික්ඛුනො මෙත්තා චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා, සො දුප්පධංසියො හොති අමනුස්සෙහි

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: මෙත්තා නො චෙතොවිමුත්ති භාවිතා භවිස්සති බහුලිකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධාති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

## 8. 1. 4.

## ඔක්ඛාසතසුත්තං

386. සාවත්ථියං-

යො භික්ඛවෙ, පුබ්බණ්හසමයං ඔක්ඛාසතං[2] දානං දදෙය්‍ය, යො මජ්ඣන්තිකං සමයං ඔක්ඛාසතං දානං දදෙය්‍ය, යො සායණ්හසමයං ඔක්ඛාසතං දානං දදෙය්‍ය, යො වා පුබ්බණ්හසමයං අන්තමසො ගද්දුහනමත්තම්පි මෙත්තං චිත්තං භාවෙය්‍ය, යො වා මජ්ඣන්තිකං සමයං අන්තමසො ගද්දුහනමත්තම්පි මෙත්තං චිත්තං භාවෙය්‍ය, යො වා සායණ්හසමයං අන්තමසො ගද්දුහනමත්තම්පි මෙත්තං චිත්තං භාවෙය්‍ය, ඉදං තතො මහප්ඵලතරං.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: මෙත්තා නො චෙතොවිමුත්ති භාවිතා භවිස්සති බහුලිකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

---

1. අප්පත්ථිකානි, - සීමු, සී 1, 2, සයා.
2. උක්ඛාසතං - සී 1, 2.

## 8. 1. 3.

## කුල සූත්‍රය

385 **සැවැත්නුවර**-

මහණෙනි, යම් සේ බොහෝ ස්ත්‍රීන් ඇති අල්ප පුරුෂයන් ඇති යම් කිසි කුලයෝ වෙද්ද, ඔහු කළයෙහි සැඟවූ පහන් එළියෙන් සොරකම් කරණ කුඹු සොරුන් විසින් සුවසේ වෙහෙසිය හැක්කාහු වෙති. මහණෙනි, එසෙසින් ම යම් කිසි මහණකු විසින් මෛත්‍රාචේතොවිමුක්තිය (මෛත්‍රීධ්‍යානය) නො වඩන ලද ද, බහුල නො කරණ ලද ද, හෙතෙමේ අමනුෂ්‍යයන් විසින් සුවසේ වෙහෙසිය හෙන්නේ වෙයි.

මහණෙනි, යම් සේ අල්ප ස්ත්‍රීන් ඇති බොහෝ පුරුෂයන් ඇති යම් කිසි කුලයෝ වෙද්ද, ඔහු කුඹු සොරුන් විසින් නො වෙහෙසිය හෙන්නාහු වෙති. මහණෙනි, එසෙසින් ම යම් කිසි මහණකු විසින් මෛත්‍රාචේතොවිමුක්තිය වඩන ලද ද, බහුල කරණ ලද ද, හෙතෙමේ අමනුෂ්‍යයන් විසින් නො වෙහෙසිය හෙන්නේ වෙයි.

මහණෙනි, එහෙසින් මෙහි මෙසේ හික්මිය යුතු: "අප විසින් මෛත්‍රා චේතොවිමුක්තිය වඩන ලද්දී බහුල කරණ ලද්දී යුක්ත යානයක් මෙන් කරණ ලද්දී ප්‍රතිෂ්ඨාවයෙන් වාස්තුවක් මෙන් කරණ ලද්දී එළඹ සිටියක් කරණ ලද්දී පුරුදු කරණ ලද්දී මැනවින් පිරිපුන් කරණ ලද්දී වන්නී ය" යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැයි.

## 8. 1. 4.

## ඔක්ඛාසත සූත්‍රය

386. **සැවැත්නුවර**-

මහණෙනි, යමෙක් පෙරවරු මහබත් සැළි සියක් දන් දෙන්නේ ද, යමෙක් මද්දහනෙහි මහබත් සැළි සියක් දන් දෙන්නේ ද, යමෙක් සවස් කල මහබත් සැළි සියක් දන් දෙන්නේ ද, යමෙකුත් පෙරවරු යටත් පිරිසෙසින් ගෝදෝහා (දෙනකේ තනපුඩු එක් වරක් අදනා) කල් පමණකුදු මෙත් සිත වඩන්නේ ද, යමෙකුත් මද්දහනෙහි යටත් පිරිසෙසින් ගෝදෝහා කල් පමණකුදු මෙත් සිත වඩන්නේ ද, යමෙකුත් සවස් වරු යටත් පිරිසෙසින් ගෝදෝහා කල් පමණකුදු මෙත් සිත වඩන්නේ ද, මෙය ඒ දනට වඩා මහත්ඵල ය.

මහණෙනි, එහෙසින් මෙහි මෙසේ හික්මිය යුතු: "අප විසින් මෛත්‍රා-චේතොවිමුක්තිය වඩන ලද්දී බහුල කරණ ලද්දී යානයක් මෙන් කරණ ලද්දී වාස්තුවක් මෙන් කරණ ලද්දී එළඹ සිටියක් කරණ ලද්දී පුරුදු කරණ ලද්දී මැනවින් පිරිපුන් කරණ ලද්දී වන්නී ය" යි. මහණෙනි. තොප විසින් මෙසේ හික්මිය යුතු මැයි.

## 8. 1. 5.

### සත්තිසුත්තං

387. සාවත්ථියං-

සෙය්‍යථාපි භික්ඛවෙ, සත්ති තිණ්හඵලා, අථ පුරිසො ආගච්ඡෙය්‍ය "අහං ඉමං සත්තිං තිණ්හඵලං පාණිනා වා මුට්ඨිනා වා පතිලෙණිස්සාමි පතිකොට්ටෙස්සාමි[1] පතිවට්ටෙස්සාමී"ති.[2] තං කිම්මඤ්ඤසි භික්ඛවෙ, භබ්බො නු ඛො සො පුරිසො අමුං සත්තිං තිණ්හඵලං පාණිනා වා මුට්ඨිනා වා පතිලෙණෙතුං පතිකොට්ටෙතුං පතිවට්ටෙතුන්ති? නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු? අසු හි භන්තෙ සත්ති තිණ්හඵලා න සුකරා පාණිනා වා මුට්ඨිනා වා පතිලෙණෙතුං පතිකොට්ටෙතුං පතිවට්ටෙතුං. යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සාති.

එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි භික්ඛුනො මෙත්තා චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, තස්ස චෙ අමනුස්සො චිත්තං ඛිපිතබ්බං මඤ්ඤෙය්‍ය, අථ ඛො ස්වෙව අමනුස්සො කිලමථස්ස විඝාතස්ස භාගී අස්ස.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං. මෙත්තා නො චෙතොවිමුත්ති භාවිතා භවිස්සති බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධාති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

## 8. 1. 6

### ධනුග්ගහසුත්තං

388. සාවත්ථියං-

සෙය්‍යථාපි භික්ඛවෙ, චත්තාරො දළ්හධම්මා ධනුග්ගහා සික්ඛිතා කතහත්ථා කතුපාසනා චතුද්දිසා ඨිතා අස්සු, අථ පුරිසො ආගච්ඡෙය්‍ය "අහං ඉමෙසං චතුන්නං දළ්හධම්මානං ධනුග්ගහානං සික්ඛිතානං කතහත්ථානං කතුපාසනානං චතුද්දිසා කණ්ඩෙ ඛිත්තෙ අප්පතිට්ඨිතෙ පථවියං[3] ගහෙත්වා ආහරිස්සාමී"ති. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, ජවනො පුරිසො පරමෙන ජවෙන සමන්නාගතොති අලං වචනායාති?

එකස්ස චෙපි භන්තෙ, දළ්හධම්මස්ස ධනුග්ගහස්ස සික්ඛිතස්ස[3] කතහත්ථස්ස කතුපාසනස්ස කණ්ඩං ඛිත්තං අප්පතිට්ඨිතං පථවියං[4] ගහෙත්වා ආහරෙය්‍ය, ජවනො පුරිසො පරමෙන ජවෙන සමන්නාගතොති අලං වචනාය. කො පන වාදො චතුන්නං දළ්හධම්මානං ධනුග්ගහානං සික්ඛිතානං කතහත්ථානං කතුපාසනානන්ති.

1. පතිකොට්ටස්සාමි - සී 1, 2.
2. පතිවට්ටස්සාමි - සී 1, 2.
3. සුසික්ඛිතස්ස - මජ්ඣං
4. පුථුවියං - සී 1, 2, පඨවියං - මජ්ඣං.

### 8. 1. 5.

## සත්ති සූත්‍රය

387. **සැවැත්නුවර-**

මහණෙනි, යම් සේ තියුණු තල ඇති සිරියක් වේ ද, එකල්හි "මම තියුණු තල ඇති මේ සිරිය අතින් හෝ මිටෙන් හෝ පැහැර නමන්නෙමි. (ධාරා දෙක එක් කොට) අලවන්නෙමි. දිග හැර තැවත හකුළුවන්නෙමි" යි පුරුෂයෙක් එන්නේ ය. මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, ඒ පුරුෂ තෙමේ තියුණු තල ඇති මේ සිරිය අතින් හෝ මිටෙන් හෝ නමන්නට අලවන්නට දිග හැර තැවත හකුළුවන්නට නිසි ද? වහන්ස, මෙය නො වේ ම ය. ඒ කවර හෙයින්ද? වහන්ස, තියුණු තල ඇති ඒ සිරිය අතින් හෝ මිටෙන් හෝ නමන්නට අලවන්නට දිග හැර තැවත හකුළුවන්නට සුකර නො වේ. ඒ පුරුෂ තෙමේ (ඒ සඳහා යම්තාක් වැර වඩා ද,) ඒතාක් ම වෙහෙසීමට විඩාවට හිමියෙක් වන්නේ ය.

මහණෙනි, එහෙයින් ම යම් කිසි මහණකු විසින් මෛත්‍රා චේතෝ-විමුක්තිය වඩන ලද ද, බහුල කරණ ලද ද, යානයක් මෙන් කරණ ලද ද, වාසතුවක් මෙන් කරණ ලද ද, එළඹ සිටියක් කරණ ලද ද, පුරුදු කරණ ලද ද, මැනවින් පිරිපුන් කරණ ලද ද, ඉදින් අමනුෂ්‍යයෙක් ඔහුගේ සිත පෙරළිය යුතු ය යි හඟනේ නම් වැලි ඒ අමනුෂ්‍ය තෙමේ වෙහෙසීමට විඩාවට හිමියෙක් වන්නේ ය.

මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු: "අප විසින් මෛත්‍රා චේතෝවිමුක්තිය වඩන ලද්දී බහුල කරණ ලද්දී යානයක් මෙන් කරණ ලද්දී වාසතුවක් මෙන් කරණ ලද්දී එළඹ සිටියක් කරණ ලද්දී පුරුදු කරණ ලද්දී මැනවින් පිරිපුන් කරණ ලද්දී වන්නී ය"යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැයි.

### 8. 1. 6.

## ධනුග්ගහ සූත්‍රය

388. **සැවැත්නුවර-**

මහණෙනි, යම් සේ දැඩි දුනු දරණ නිපුණ වූ කෘතහස්ත වූ දක්වූ ධනුශ්ශිල්ප ඇති දුනුවායෝ සිව්දෙනෙක් සිවුදිග සිටියෝ ද, එකල්හි දැඩි දුනු ඇති නිපුණ වූ කෘතහස්ත වූ දක් වූ ධනුශ්ශිල්ප ඇති මේ සිව් දුනුවායන් විසින් සිවුදිගට විදින ලද ඊතල පොළොවෙහි නො පිහිටියවුන්ම (පොළොව නොහෙන තෙක්ම) මම හැර ගෙණ එන්නෙමි"යි. පුරුෂයෙක් එන්නේ ය. මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, "එසේ දිවිය හෙන්නා වූ මේ පුරුෂ තෙම උතුම් ජව ඇත්තේ ය යි - දිවිය ගෙන්නේ ය යි කියන්නට සුදුසු දැ"යි:

වහන්ස, දැඩි දුනු දරණ උගත් කළපුරුදු දක්වූ සිප් ඇති එක් දුනුවායකු විසිනුදු විදිතලද හීය පොළොව නො හෙන තෙක් ම ඉදින් හැර ගෙණ එන්නේ නම් එසේ දිවිය හෙන පුරුෂයා උතුම් ජව ඇත්තේ ය යි කියන්නට සුදුසු ය. දැඩි දුනු දරණ උගත් කළපුරුදු දක්වූ සිප් ඇති දුනුවායන් සිව්දෙනෙකුන් විදි හී ගැණ කවර කථා ද?

යථා ච භික්ඛවෙ, තස්ස පුරිසස්ස ජවො යථා ච චන්දිමසුරියානං ජවො තතො සීඝතරො. යථා ච භික්ඛවෙ, තස්ස පුරිසස්ස ජවො, යථා ච චන්දිමසුරියානං ජවො, යථා ච යා දෙවතා චන්දිමසුරියානං පුරතො ධාවන්ති, තාසං දෙවතානං ජවො තතො සීඝතරො.[1] යථා ච භික්ඛවෙ, තස්ස පුරිසස්ස ජවො, යථා ච චන්දිමසුරියානං ජවො, යථා ච යා දෙවතා චන්දිමසුරියානං පුරතො ධාවන්ති තාසං දෙවතානං ජවො, තතො සීඝතරං ආයුසඞ්ඛාරා ඛීයන්ති.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: අප්පමත්තා විහරිස්සාමාති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

## 8. 1. 7.

### ආණිසුත්තං

389 සාවත්ථියං-

භූතපුබ්බං භික්ඛවෙ, දසාරහානං[2] ආණකො නාම මුදිඞ්ගො අහොසි තස්ස දසාරහා ආණකෙ ඵලිතෙ[3] අඤ්ඤං ආණිං ඔදහිංසු. අහු ඛො සො භික්ඛවෙ සමයො යං ආණකස්ස මුදිඞ්ගස්ස පොරාණං පොක්ඛර ඵලකං[4] අන්තරධායි, ආණිසඞ්ඝාටොව අවසිස්සි.

එවමෙව ඛො භික්ඛවෙ, භවිස්සන්ති භික්ඛූ අනාගතමද්ධානං, යෙ තෙ සුත්තන්තා තථාගතභාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතපටි-සංයුත්තා,[5] තෙසු භඤ්ඤමානෙසු න සුස්සූසිස්සන්ති,[6] න සොතං ඔදහිස්සන්ති, න අඤ්ඤාචිත්තං උපට්ඨාපෙස්සන්ති. න ච තෙ ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤිස්සන්ති. යෙ පන තෙ සුත්තන්තා කවිකතා කාවෙය්‍යා චිත්තක්ඛරා චිත්තබ්‍යඤ්ජනා බාහිරකා සාවකභාසිතා, තෙසු භඤ්ඤමානෙසු සුස්සූසිස්සන්ති, සොතං ඔදහිස්සන්ති, අඤ්ඤාචිත්තං උපට්ඨාපෙස්සන්ති තෙ ච ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤිස්සන්ති. එවමෙතෙසං භික්ඛවෙ, සුත්තන්තානං තථාගතභාසිතානං ගම්භීරානං ගම්භීරත්ථානං ලොකුත්තරානං සුඤ්ඤතපටිසංයුත්තානං අන්තරධානං භවිස්සති

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: "යෙ තෙ සුත්තන්තා තථාගත-භාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතපටිසංයුත්තා, තෙසු භඤ්ඤමානෙසු සුස්සූසිස්සාම, සොතං ඔදහිස්සාම, අඤ්ඤාචිත්තං උපට්ඨා-පෙස්සාම තෙ ච ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤිස්සාමාති එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

---

1. සීඝතරං - මජසං. 2. දසහානිසානං - සීමු. 3. ඵලිතෙ - මජසං, PTS
4. පොක්ඛරං ඵලකං - සීමු, සභා. 5. සුඤ්ඤතපපටිසංයුත්තා - මජසං.
6. සුස්සූසිස්සන්ති - සීමු, සී 1, 2

මහණෙනි, ඒ පුරුෂයාගේ වෙගය යම්බඳු ද, සඳහිරු දෙදෙනාගේ යම්බඳු වෙගයෙක් වේ නම් (එය) ඊට වඩා ශීඝ්‍ර ය. මහණෙනි, ඒ පුරුෂයාගේ වෙගය යම් බඳු ද, සඳහිරු දෙදෙනාගේ වෙගය, යම් බඳු ද, යම් දේවතා කෙනෙක් සඳහිරු දෙදෙනාට පෙරටු ව යම් සේ දිවෙත් නම් ඒ දේවතාවන්ගේ වේගය එයට වඩා ශීඝ්‍රය. ඒ පුරුෂයාගේ වේගය යම් බඳු ද, සඳහිරු දෙදෙනාගේ වේගය යම් බඳු ද, යම් දේවතා කෙනෙක් සඳහිරු දෙදෙනාට පෙරටු ව දිවෙත් නම් ඒ දේවතාවන්ගේ වේගය යම් බඳු ද, ඊට වඩා ශීඝ්‍රව ආයුසංසකාරයෝ (රූප ජීවිතින්ද්‍රියයෝ) ක්‍ෂය වෙත්.

**මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු. "නො පමා ව වෙසෙත්නෙමු"යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.**

## 8 1. 7.

## ආණි සූත්‍රය

389 **සැවැත්නුවර-**

**මහණෙනි,** පෙර වූවක් කියමි: (අස්වැන්නෙන් දශයෙන් කොටසක් ගන්නා බැවින්) **දසාරහ** (නම් වූ) **ක්‍ෂත්‍රියයන්ගේ ආණක** නම් මිහිඟු බෙරයෙක් විය. **දසාරහයෝ** ඒ අණබෙරය පැළුනු කල්හි ඊට අන් ඇණයක් ගැසූහ. මහණෙනි, යම් කලෙක්හි ආණක මිහිඟුබෙරයේ පැරණි බෙරකඳ අතුරුදන් වී ද, ඇණකැකිල්ල ම ඉතිරි වීද, එබඳු කලෙක් වූයේ ම ය.

මහණෙනි, එහෙයින් ම මතුකාලයෙහි භික්‍ෂූහු වන්නාහ. (ඔහු) තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද ගැඹුරු වූ ගැඹුරු අරුත් ඇති ලොවුතුරු අරුත් දක්වන ශූන්‍යතාධර්මය පවසන යම් ඒ සූත්‍රාන්ත කෙනෙක් වෙද්ද, ඔවුන් දේශනා කරණු ලබන කල්හි අසනු කැමති නො වන්නාහ. කන් යොමු නො කරන්නාහ. අවබෝධය පිණිස සිත නො එළවන්නාහ. ඒ දහම් උගත යුතු ය යි පිරිවැහිය යුතු ය යි නොසිතන්නාහ. කවීන් විසින් කරණ ලද කවීන් විසින් නිපදවන ලද විසිතුරු අකුරු ඇති විසිතුරු ව්‍යඤ්ජන ඇති සස්නෙන් පිටත්හි වූ (අන්) සව්වන් විසින් දෙසන ලද යම් ඒ සූත්‍රාන්ත කෙනෙක් වෙද්ද, ඔවුන් කියනු ලබන කල්හි අසනු කැමති වන්නාහ. කන් යොමු කරන්නාහ. අවබෝධය පිණිස සිත එළවන්නාහ. ඒ දහම් උගත යුතු ය යි ද පිරිවැහිය යුතු ය යි ද හඟින්නාහ. මහණෙනි, මෙසේ තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද ගැඹුරු වූ ගැඹුරු අරුත් ඇති ලොවුතුරු අරුත් දක්වෙන ශූන්‍යතා ධර්මය පැවසෙන සූත්‍රාන්තයන්ගේ අතුරුදහන් වීම වන්නේ ය.

මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු: තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද ගැඹුරු වූ ගැඹුරු අරුත් ඇති ලොවුතුරු අරුත් දක්වෙන ශූන්‍යතා ධර්මය පැවසෙන යම් ඒ සූත්‍රාන්ත කෙනෙක් වෙද්ද, ඔවුන් දේශනා කරණු ලබන කල්හි අසනු කැමති වන්නෙමු. කන් යොමු කරන්නෙමු. අවබෝධය පිණිස සිත එළවන්නෙමු. ඒ දහම් ම උගත යුතුය යි, පිරිවැහිය යුතු ය යි සිතන්නෙමු"යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මියයුතු මැ යි.

## 8. 1. 8

## කලිඞ්ගරූපධානසුත්තං

390. එවං මෙ සුතං: එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තත්‍ර -පෙ- භගවා එතදවොච:

කලිඞ්ගරූපධානා භික්ඛවෙ, එතරහි ලිච්ඡවී විහරන්ති අප්පමත්තා ආතාපිනො උපාසනස්මිං. තෙසං රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො න ලභති ඔතාරං, න ලභති ආරම්මණං. භවිස්සන්ති භික්ඛවෙ, අනාගතමද්ධානං ලිච්ඡවී සුඛුමාලා මුදුතලුණහත්ථපාදා. තෙ මුදුකාසු සෙය්‍යාසු තූලබිම්බොහනාදිසු යාව සූරියුග්ගමනා සෙය්‍යං කප්පෙස්සන්ති. තෙසං රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො ලච්ඡති ඔතාරං, ලච්ඡති ආරම්මණං.

කලිඞ්ගරූපධානා භික්ඛවෙ, එතරහි භික්ඛූ විහරන්ති අප්පමත්තා ආතාපිනො පධානස්මිං. තෙසං මාරො පාපිමා න ලභති ඔතාරං, න ලභති ආරම්මණං. භවිස්සන්ති භික්ඛවෙ, අනාගතමද්ධානං භික්ඛූ සුඛුමාලා මුදුතලුණහත්ථපාදා. තෙ මුදුකාසු සෙය්‍යාසු තූලබිම්බොහනාදිසු යාව සූරියුග්ගමනා සෙය්‍යං කප්පෙස්සන්ති තෙසං මාරො පාපිමා ලච්ඡති ඔතාරං, ලච්ඡති ආරම්මණං.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: "කලිඞ්ගරූපධානා විහරිස්සාම අප්පමත්තා ආතාපිනො පධානස්මි"න්ති.[1] එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

## 8. 1. 9.

## නාගසුත්තං

391. සාවත්ථියං-

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො නවො භික්ඛු අතිවෙලං කුලානි උපසඞ්කමති. තමෙනං භික්ඛූ එවමාහංසු: "මා ආයස්මා අතිවෙලං කුලානි උපසඞ්කමී"ති. සො භික්ඛු භික්ඛූහි වුච්චමානො එවමාහ: "ඉමෙහි නාම ථෙරා භික්ඛූ කුලානි උපසඞ්කමිතබ්බං මඤ්ඤිස්සන්ති, කිමඞ්ගපනාහ"න්ති.

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. -පෙ- එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ භන්තෙ අඤ්ඤතරො නවො භික්ඛු අතිවෙලං කුලානි උපසඞ්කමති. තමෙනං භික්ඛූ එවමාහංසු: "මා ආයස්මා එවං අතිවෙලං කුලානි උපසඞ්කමී"ති. සො භික්ඛු භික්ඛූහි වුච්චමානො එවමාහ: "ඉමෙහි නාම ථෙරා භික්ඛූ කුලානි උපසඞ්කමිතබ්බං මඤ්ඤිස්සන්ති, කිමඞ්ගපනාහ"න්ති.

---

1. පධානස්මිං - සීමු.

8. 1. 8.

## කලිඞ්ගරූපධාන සූත්‍රය

390 මා විසින් මෙසේ අසන ලදි: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **විසල්පුර මහාවනයෙහි කූටාගාරශාලාවෙහි** වැඩ වසන සේක. එහි දී ... මෙය වදාළ සේක.

**මහණෙනි,** දැන් ලිච්ඡවීහු ලීකොටයක් කන්වයින් කොට ඇත්තාහු අප්‍රමත්ත ව වීර්‍ය්‍ය ඇති ව ගුරුපාසනයෙහි (ශිල්ප හැදෑරීමෙහි) යෙදුනාහු වාසය කෙරෙති. මගධාධිපති **වේදේහි** පුත් **අජාසත්** රජ තෙමේ ඔවුන්ගේ සිදුරක් නො ලබයි. **අරමුණක්** (ප්‍රත්‍යයයක්) නො ලබයි. **මහණෙනි,** අනාගත කාලයෙහි ලිච්ඡවීහු සියුමැලි වූවෝ මුදුතුරුණු අත් පා ඇත්තෝ වන්නාහ. ඔහු පුලුන් කන්වයින් (=කොට්ට) ඇති මුදු යහන්හි හිරු උදාවන තෙක් ශයනය කරන්නාහ. මගධාධිපති වේදේහි පුත් අජාසත් රජ තෙමේ (ඔවුන් දිනුමට) ඔවුන්ගේ සිදුරක් ලබන්නේ ය. අරමුණක් ලබන්නේ ය.

**මහණෙනි,** දැන් භික්ෂූහු ලීකොට කන්වයින් කොට ඇත්තාහු අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව ප්‍රධන්වීර්‍ය්‍යයෙහි යෙදුනාහු වාසය කෙරෙත්. පවිටු මරු තෙමේ ඔවුන්ගේ සිදුරක් නො ලබයි. අරමුණක් නො ලබයි. මහණෙනි, අනාගත කාලයෙහි භික්ෂූහු සියුමැලි වූවෝ මුදුතුරුණු අත් පා ඇත්තෝ වන්නාහ. ඔහු පුලුන් කන්වයින් ඇති මුදු යහන්හි හිරු උදාවන තෙක් ශයනය කරන්නාහ. පවිටු මරු තෙමේ ඔවුන්ගේ සිදුරක් (අවකාශයක්) ලබන්නේ ය. අරමුණක් ලබන්නේ ය.

**මහණෙනි,** එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු: "දැව කඩක් කන්වයින් කොට ඇත්තමෝ අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව ප්‍රධන්වීර්‍ය්‍යයෙහි යෙදුනමෝ වාසය කරන්නෙමු"යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

8. 1. 9.

## නාග සූත්‍රය

391. **සැවැත්නුවර-**

එකල්හි එක්තරා නවක මහණෙක් වෙලාව ඉක්මවා කුලයන් කරා එළඹෙයි. භික්ෂූහු ඒ මේ මහණහට "ආයුෂ්මතුනි, වෙලාව ඉක්මවා කුලයන් කරා නො එළඹෙව" යි මෙසේ කීහ. ඒ මහණ තෙමේ භික්ෂූන් විසින් කියනු ලබන්නේ "මේ ස්ථවිර භික්ෂූහු කුලයන් කරා එළඹිය යුතු කොට හඟිත්. කවර හෙයෙකින් මම නො එළඹෙම් දැ"යි මෙසේ කී ය.

එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ ... එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, මෙහි එක්තරා නවක මහණෙක් වෙලාව ඉක්මවා කුලයන් වෙත එළඹෙයි. ඒ මේ මහණහට භික්ෂූහු "ආයුෂ්මතුනි, මෙසේ වෙලාව ඉක්මවා කුලයන් කරා නො එළඹෙව"යි කීහ. ඒ මහණ තෙමේ භික්ෂූන් විසින් කියනු ලබන්නේ "මේ ස්ථවිර භික්ෂූහු කුලයන් කරා එළඹිය යුතු කොට හඟිති. කවර හෙයෙකින් මම නො එළඹෙම් දැ යි මෙසේ කීය" යි මෙය සැළකළහ.

භූතපුබ්බං භික්ඛවෙ, අරඤ්ඤායතනෙ මහාසරසී. තං නාගා උපනිස්සාය විහරන්ති. තෙ තං සරසිං ඔගාහෙත්වා සොණ්ඩාය භිසමුළාලං අබ්බුග්ගහෙත්වා[1] සුවික්ඛාලිතං වික්ඛාලෙත්වා අකද්දමං සඞ්ඛාදිත්වා[2] අජ්ඣොහරන්ති. තෙසං තං වණ්ණාය චෙව හොති බලාය ච, න ච තතොනිදානං මරණං වා නිගච්ඡන්ති, මරණමත්තං වා දුක්ඛං.

තෙසඤ්ඤෙව ඛො පන භික්ඛවෙ, මහානාගානං අනුසික්ඛමානා තරුණා භිඞ්කච්ඡාපා, තෙ තං සරසිං ඔගාහෙත්වා සොණ්ඩාය භිසමුළාලං අබ්බුග්ගහෙත්වා[1] න සුවික්ඛාලිතං වික්ඛාලෙත්වා සකද්දමං අසඞ්ඛාදිත්වා අජ්ඣොහරන්ති. තෙසං තං නෙව වණ්ණාය හොති න බලාය. තතොනිදානං මරණං වා නිගච්ඡන්ති, මරණමත්තං වා දුක්ඛං.

එවමෙව ඛො භික්ඛවෙ, ඉධ ථෙරා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසන්ති. තෙ තත්ථ ධම්මං භාසන්ති. තෙසං ගිහී පසන්නාකාර කරොන්ති. තෙ තං ලාභං අගථිතා අමුච්ඡිතා අනජ්ඣොපන්නා,[3] ආදීනවදස්සාවිනො නිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති. තෙසං තං වණ්ණාය චෙව හොති බලාය ච, න ච තතොනිදානං මරණංවා නිගච්ඡන්ති, මරණමත්තං වා දුක්ඛං.

තෙසඤ්ඤෙව ඛො පන භික්ඛවෙ, ථෙරානං භික්ඛූනං අනුසික්ඛමානා නවා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසන්ති. තෙ තත්ථ ධම්මං භාසන්ති. තෙසං ගිහී පසන්නාකාරං කරොන්ති. තෙ තං ලාභං ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා අනාදීනවදස්සාවිනො අනිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති. තෙසං තං නෙව වණ්ණාය හොති න බලාය. තෙ තතොනිදානං මරණං වා නිගච්ඡන්ති, මරණමත්තං වා දුක්ඛං.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: ''අගථිතා අමුච්ඡිතා අනජ්ඣොපන්නා ආදීනවදස්සාවිනො නිස්සරණපඤ්ඤා ලාභං පරිභුඤ්ජිස්සාමා''ති එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

## 8. 1. 10.

## බිළාලසුත්තං

392. **සාවත්ථියං-**

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අතිවෙලං කුලෙසු චාරිත්තං ආපජ්ජති. තමෙනං භික්ඛූ එවමාහංසු: ''මා ආයස්මා අතිවෙලං කුලෙසු චාරිත්තං ආපජ්ජී''ති. සො භික්ඛු භික්ඛූහි වුච්චමානො න රමති.[4]

---

1 අබ්බාගහෙත්වා - සීමු, සී 1, 2; අබ්බුහෙත්වා - අට්ඨකථා, අබ්බාගගහෙත්වා - මජසං.

2. සංඛරිත්වා. PTS 3. අනජ්ඣාපන්නා - සීමු, සයා.

4. විරමති - මජසං, PTS

මහණෙනි, පෙර වූවක් කියමි: "වන පෙදෙසක මහවිලෙක් විය. ඇත්තු ඒ විල ඇසුරු කොට වෙසෙති. ඔහු ඒ විලට බැස සොඬින් නෙළුඹල හා නෙළුම්දැලි උදුරා ගෙණ සුපිරිසිදු ව සෝද මඩ රහිතව සපා ගිලිත්. එය ඔවුන්ගේ වර්ණය පිණිස ද බලය පිණිස ද වේ. ඒ හේතුවෙන් මරණයට හෝ මරණය හා සම දුකකට හෝ නො පැමිණෙති.

මහණෙනි, ඒ මහ ඇතුන් අනු ව හික්මෙන්නා වූ තරුණ ඇත්පැටව් වෙත්. ඔහු ඒ විලට බැස සොඬින් නෙළුඹල හා නෙළුම්දැලි උදුරා ගෙණ පිරිසිදු ව නො සෝද මඩ සහිතව නො සපා ගිලිත්. එය ඔවුන්ගේ වර්ණය පිණිස නො වේ ම ය. බලය පිණිස ද නො වේ ම ය. ඒ හේතුවෙන් මරණයට හෝ මරණය හා සම දුකට හෝ පැමිණෙත්.

මහණෙනි, එපරිද්දෙන් ම මෙසස්නෙහි ස්ථවිරභික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පෙරව පාසිවුරු ගෙණ ගමට හෝ නියම්ගමට හෝ පිඬු පිණිස පිවිසෙත්. ඔහු එහි දී දහම් දෙසත්. ගිහියෝ ඔවුනට පහන් අයුරක් කෙරෙත්. (ප්‍රත්‍යය දෙත්.) ඔහු නො ගිජු වූවාහු මූසපත් නො වූවාහු තෘෂ්ණාවෙන් නො ගැලී සිටියාහු දොස් දක්නාසුලු වූවාහු සසරින් නික්ම යෑමේ නුවණින් යුක්ත වූවාහු ඒ ලාභය පරිභෝග කෙරෙත් එය ඔවුන්ගේ වර්ණය පිණිස ද බලය පිණිස ද වේ. ඒ හේතුවෙන් මරණයට හෝ මරණය හා සම දුකට හෝ නො පැමිණෙත්.

ඒ ස්ථවිර භික්ෂූන් අනුව ම හික්මෙන්නා වූ නවක භික්ෂූහු තුමූ පෙරවරු කාලයෙහි හැඳ පෙරව පාසිවුරු ගෙණ ගමකට හෝ නියම්ගමකට හෝ පිඬු පිණිස පිවිසෙත්. ඔහු එහි දහම් දෙසත්. ගිහියෝ ඔවුනට පහන් අයුරක් කෙරෙත් (ප්‍රත්‍යය දෙත්.) ඔහු ගිජු වූවාහු මූසපත් වූවාහු තෘෂ්ණාවෙන් ගැලුනාහු දොස් නො දක්නාසුලු වූවාහු නික්ම යෑමේ නුවණ නැත්තාහු ඒ ලාභය වළඳත්. එය ඔවුන්ගේ වර්ණය පිණිස නො ම වේ. බලය පිණිස ද නො ම වේ. ඔහු ඒ හේතුවෙන් මරණයට හෝ මරණය හා සම දුකට හෝ පැමිණෙත්.

මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු: "නො ගිජු වූවමෝ මූසපත් නුවූවමෝ තෘෂ්ණාවෙහි නො ගැලුනමෝ දොස් දක්නමෝ නිස්සරණ ප්‍රඥ ඇත්තමෝ ලාභය වළඳන්නෙමු"යි. මහණෙනි, නොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 8. 1. 10.

## බිළාල සූත්‍රය

392. **සැවැත්නුවර**.

එකල්හි එක්තරා මහණෙක් වේලාව ඉක්මවා කුලයන්හි හැසිරීමට පැමිණෙයි. භික්ෂූහු ඒ මොහුට "ආයුෂ්මත්නි, වේලාව ඉක්මවා කුලයන්හි හැසිරීමට නො පැමිණෙව"යි මෙසේ කීහ. භික්ෂූන් විසින් කියනු ලබන ඒ මහණ තෙමේ නො ඇලෙයි.

අථ ඛො සම්බහුලා භික්ඛූ -පෙ- භගවන්තං එතදවොචුං: "ඉධ භන්තෙ අඤ්ඤතරො භික්ඛු අතිවෙලං කුලෙසු චාරිත්තං ආපජ්ජති. තමෙතං භික්ඛූ එවමාහංසු "මා ආයස්මා අතිවෙලං කුලෙසු චාරිත්තං ආපජ්ජී"ති. සො භික්ඛු භික්ඛූහි වුච්චමානො න රමතී"ති.

භූතපුබ්බං භික්ඛවෙ, බිළාලො[1] සන්ධිසමලසඞ්කටීරෙ[2] ඨිතො අහොසි මුදුමූසිං මග්ගයමානො,[3] "යදායං මුදුමූසි ගොචරාය පක්කමිස්සති, තත්ථෙව නං ගහෙත්වා ඛාදිස්සාමී"ති. අථ ඛො භික්ඛවෙ, මුදුමූසි ගොචරාය පක්කමි. තමෙනං බිළාලො ගහෙත්වා සහසා අසඞ්ඛාදිත්වා[4] අජ්ඣොහරි. තස්ස මුදුමූසි අන්තම්පි ඛාදි, අන්තගුණම්පි ඛාදි. සො තතො නිදානං මරණම්පි නිගච්ඡි, මරණමත්තම්පි දුක්ඛං.

එවමෙව ඛො භික්ඛවෙ, ඉධෙකච්චො භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති, අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි.

සො තත්ථ පස්සති මාතුගාමං දුන්නිවත්ථං වා දුප්පාරුතං වා, තස්ස මාතුගාමං දිස්වා දුන්නිවත්ථං වා දුප්පාරුතං වා රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසෙන චිත්තෙන මරණං වා නිගච්ඡති, මරණමත්තං වා දුක්ඛං. මරණං හෙතං භික්ඛවෙ, අරියස්ස විනයෙ යො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. මරණමත්තං හෙතං භික්ඛවෙ, දුක්ඛං යදිදං අඤ්ඤතරං සඞ්කිලිට්ඨං ආපත්තිං ආපජ්ජති, යථාරූපාය ආපත්තියා වුට්ඨානං පඤ්ඤායති.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: "රක්ඛිතෙනෙව කායෙන රක්ඛිතාය වාචාය රක්ඛිතෙන චිත්තෙන උපට්ඨිතාය සතියා සංවුතෙහි ඉන්ද්‍රියෙහි ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමා"ති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

### 8. 1. 11.

### සිගාලසුත්තං.

393. **සාවත්ථියං**-

අස්සුත්ථ නො තුම්හෙ භික්ඛවෙ, රත්තියා පච්චූසසමයං සිගාලස්ස වස්සමානස්සාති?[5] එවං භන්තෙ. එසො ඛො භික්ඛවෙ, ජරසිගාලො උක්කණ්ණකෙන[6] නාම රොගජාතෙන ඵුට්ඨො. සො යෙන යෙන ඉච්ඡති, තෙන තෙන ගච්ඡති. යත්ථ යත්ථ ඉච්ඡති, තත්ථ තත්ථ තිට්ඨති. යත්ථ යත්ථ ඉච්ඡති, තත්ථ තත්ථ නිසීදති. යත්ථ යත්ථ ඉච්ඡති, තත්ථ තත්ථ නිපජ්ජති. සීතකොපි නං වාතො උපවායති. සාධු ඛ්වස්ස භික්ඛවෙ, යං ඉධෙකච්චො සක්‍යපුත්තියපටිඤ්ඤො එවරූපම්පි අත්තභාවපටිලාභං පටිසංවෙදයෙථ.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: "අප්පමත්තා විහරිස්සාමා"ති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

---

1. බිළාරො - ස්‍යා. 2 සඞ්කාතීරෙ - ස්‍යා. 3 ආගමයමානො - ස්‍යා. මග්ගමානො - සීමු, මග්ගයමානො - මජසං, PTS 4. සංඛාදිත්වා - සීමු, මජසං, මාසංඛාදිත්වා - ස්‍යා. සංඛාරිත්වා - PTS 5 වස්සමානස්සාති - සීමු, ස්‍යා. 6 උක්කණ්ණකෙන - මජසං, උක්කාලකණ්ණකෙන - සීමු, සී 1, 2 PTS

එකල්හි බොහෝ භික්ෂූහු ... භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, මෙහි එක්තරා මහණෙක් වෙලාව ඉක්මවා කුලයන්හි හැසිරීමට පැමිණෙයි. භික්ෂූහු ඔහුට ආයුෂ්මත්නි, "වෙලාව ඉක්මවා කුලයන්හි හැසිරීමට තහමක් පැමිණෙව"යි මෙසේ කීහ. ඒ මහණ තෙමේ භික්ෂූන් විසින් කියනු ලබන්නේ නො ඇලේ ය" යි මෙය සැලකළහ.

මහණෙනි, පෙර වූවක් කියමි. බළලෙක් ගෘහසන්ධියෙහි (දෙගෙයක් අතර) හෝ මලවහන දියැලක හෝ කසළගොඩෙක හෝ "යම් කලෙක මේ මෑදූ මූෂිකාව ගොදුරු පිණිස යන්නේ ද, එහි දී ම උඃ ගෙණ කන්නෙමි"යි මුදුමියකු සොයමින් සිටියේ විය. මහණෙනි, එකල්හි ඒ මුදු මීයා ගොදුරු පිණිස නික්මුනේ ය. බළලා ඒ මූ ගෙණ නො සපා වහා ගැලපී ය. ඒ මුදු මීයා ඒ බළලාගේ අතුනු ද කෑ ය. අතුනුබහන් ද කෑ ය ඒ හේතුවෙන් ඒ බළලා මරණයට හෝ මරණය සම දුකට හෝ පැමිණියේ ය.

මහණෙනි, එසෙයින් ම මෙහි ඇතැම් මහණෙක් පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ නො රක්නා ලද්දවූ ම කයින් නො රක්නා ලද වචනයෙන් නො රක්නා ලද සිතින් නො එළඹ සිටි සිහියෙන් සංවරණය නො කළ ඉඳුරන්ගෙන් යුතු ව ගමට හෝ නියම්ගමට හෝ පිඬු පිණිස පිවිසෙයි.

හෙතෙමේ එහි දී තපුරු කොට හැන්ද වූ හෝ තපුරු කොට පෙරවූ හෝ මාගමක් දකී. තපුරු කොට හැන්ද වූ හෝ තපුරු කොට පෙරවූ හෝ මාගම දැකීමෙන් රාගය ඔහුගේ සිත වනසයි. හෙතෙමේ රාගයෙන් නැසුනු සිතින් මරණයට හෝ මරණය සම දුකකට හෝ පැමිණෙයි. මහණෙනි, යමෙක් සික්පිළිකෙව් කොට ගිහිබවට පෙරළේ ද, මේ සස්නෙහි මරණය යි. මහණෙනි, යම් බඳු ඇවතකින් නැගී සිටීමෙක් පෙණේ නම් (එබඳු) යම් කිලිටි වූ එක්තරා (උට්ඨානගාමිනී) ඇවතකට පැමිණේ ද, මේ මරණය හා සම දුක ය.

මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු: "රක්නා ලද්ද වූ ම කයින් රක්නා ලද වචනයෙන් රක්නා ලද සිතින් එළඹ සිටි සිහියෙන් සංවෘත ඉඳුරන්ගෙන් යුතු ව ගමට හෝ නියම්ගමට හෝ පිඬු පිණිස පිවිසෙන්නෙමු"යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 8. 1. 11.

### සිගාල සූත්‍රය.

393. සැවැත්නුවර-

මහණෙනි, තෙපි රෑ පැසුළුයම්හි හඬන සිවලකුගේ හඬ ඇසුහු ද? වහන්ස, එසේ ය. මහණෙනි, මේ ජරසිවල් තෙමේ උක්කණ්ණක නම් රෝගයකින් පහස්නා ලද්දේ ය. හේ යම් යම් තැන කැමැත්තේ නම් ඒ ඒ තැන යෙයි. යම් යම් තැන කැමැත්තේ නම් ඒ ඒ තැන සිටී. යම් යම් තැන කැමැත්තේ නම් ඒ ඒ තැන හිඳී. යම් යම් තැන කැමැත්තේ නම් ඒ ඒ තැන හොවී. සිහිල් වාතය ද ඔහු වෙත හමයි. (හේ මෙසිනුදු විත්තාස්වාදයක් ලබයි.) මහණෙනි, යම් හෙයකින් මෙහි 'ශාක්‍ය පුත්‍රීයෙමි'යි ප්‍රතිඥ ඇති ඇතැමෙක් මෙබඳු වූ ද අත්බැව් පිළිලැබීමක් (විත්තාස්වාදයක්) විඳිනේ නම් එය යහපත් වන්නේ ය. (මෙය දෙව්දත් සඳහා කියූ.)

මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු: "නො පමා ව වෙසෙන්නෙමු" යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

## 8. 1. 12.

## දුතියසිඞ්ගාලසුත්තං.

394. **සාවත්ථියං-**

අස්සුත්ථ නො තුම්හෙ භික්ඛවෙ, රත්තියා පච්චූසසමයං සිගාලස්ස වස්සමානස්සාති? එවං භන්තෙ. සියා බො භික්ඛවෙ, තස්මිං ජරසිගාලෙ යා කාචි කතඤ්ඤුතා කතවෙදිතා. න ත්වෙව ඉධෙකච්චෙ සක්‍යපුත්තියපටිඤ්ඤෙ සියා කාචි කතඤ්ඤුතා කතවෙදිතා.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: "කතඤ්ඤුනො භවිස්සාම කතවෙදිනො. අම්හෙසු අප්පකම්පි කතං මා නස්සිස්සතී"ති[1]. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

### වග්ගො පඨමො

තස්සුද්දානං:

කූටං නඛසිඛං කුලං ඔක්ඛා සත්ති ධනුග්ගහො,
ආණි කලිඞ්ගරො නාගො බිළාලො ද්වෙ සිගාලකාති.

### ඔපම්මසංයුත්තං සමත්තං.

1 න ච නො අම්හෙසු අප්පකම්පි කතං නස්සිස්සතීති - මජසං.

## 8. 1. 12.

## දුතිය සිගාලසුත්‍රය

394. සැවැත්නුවර-

මහණෙනි, තෙපි රෑ පැසුළු යම් හඬන සිවලකු හඬ ඇසුහු ද? වහන්ස, එසේ ය. මහණෙනි, ඒ ජරසිවලා කෙරෙහි ද යම් කිසි කළ ගුණ දත්තා බවෙක් කළ ගුණ ප්‍රකට කරණ බවෙක් වත්තේ ම ය. මෙහි ශාක්‍යපුත්‍රීය භාවය පිළිණ කරණ ඇතමකු කෙරෙහි කිසි ම කළ ගුණ දත්තා බවෙක්, කළ ගුණ ප්‍රකට කරණ බවෙක් නො වත්තේ ම ය (මෙද දෙව්දත් සඳහා කියූ සේ ය.)

එහෙයින් මහණෙනි, මෙහි මෙසේ හික්මිය යුතු: "කළ ගුණ දත්තමෝ කළ ගුණ ප්‍රකට කොට දත්තමෝ වත්තෙමු. අප කෙරෙහි මඳකුදු කරණ ලද්ද තනමක් නැසේවා (සිතින් තොර නොවේවා)" යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

**පළමුවන වර්ගය යි.**

එහි උද්දානය:

කූට, නඛසිඛා, කුල, ඔක්ඛා, සත්ති, ධනුග්ගහ, ආණි, කලිඞ්ගර, නාග, බිළාල සූත්‍ර ය, සිගාල සූත්‍ර දෙක ද යි සූත්‍ර දොළසෙකි යි.

**ඔපම්මසංයුත්තය නිමියේ යි.**

# 9. භික්ඛුසංයුත්තං

## 1. පඨමො වග්ගො

### 9. 1. 1.

### මොග්ගල්ලානසුත්තං[1]

395 එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති. ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භික්ඛූ ආමන්තෙසි: ආවුසො භික්ඛවොති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාමොග්ගල්ලානස්ස පච්චස්සොසුං. ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

ඉධ මය්හං ආවුසො රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "අරියො තුණ්හීභාවො අරියො තුණ්හීභාවොති වුච්චති, කතමො නු ඛො අරියො තුණ්හීභාවො"ති?

තස්ස මය්හං ආවුසො එතදහොසි: "ඉධ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති අරියො තුණ්හීභාවො"ති

සො ඛ්වාහං[2] ආවුසො, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරාමි.[3] තස්ස මය්හං ආවුසො ඉමිනා විහාරෙන විහරතො විතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති. අථ ඛො මං ආවුසො, භගවා ඉද්ධියා උපසඞ්කමිත්වා එතදවොච: "මොග්ගල්ලාන, මොග්ගල්ලාන, මා බ්‍රාහ්මණ අරියං තුණ්හීභාවං පමාදො. අරියෙ තුණ්හීභාවෙ චිත්තං සණ්ඨපෙහි අරියෙ තුණ්හීභාවෙ චිත්තං එකොදිං[4] කරොහි. අරියෙ තුණ්හීභාවෙ චිත්තං සමාදහා"ති

සො ඛ්වාහං ආවුසො, අපරෙන සමයෙන විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහාසිං.[5] යං හි තං ආවුසො, සම්මා වදමානො වදෙය්‍ය, "සත්ථාරා අනුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තො"ති, මමං තං සම්මා වදමානො වදෙය්‍ය "සත්ථාරා අනුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තො"ති.

---

1 කොලිතසුත්ත - මජසං, ස්‍යා. කොලිත-උද්දාන - සී 1, 2. ඛොහං - සීමු, සී 1, 2
3. විහරිං -මජසං. 4. එකොදිභාවං - මජසං.
5. විහරාමි - මජසං, ස්‍යා.

# 9. භික්ඛුසංයුත්තය

## 1. ප්‍රථමවර්ගය

### 9. 1. 1.

### මොග්ගල්ලාන සූත්‍රය

395. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. එහි දී ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ 'ඇවැත්නි, මහණෙනි' යි භික්ෂූන් ඇමතූහ. 'ඇවැත්නි'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදාළහ:

ඇවැත්නි, මෙහි එකලා වූ විවේකයෙන් යුත් මට "ආර්‍ය්‍ය තුෂ්ණීම්භාවය, ආර්‍ය්‍ය තුෂ්ණීම්භාවය යි කියනු ලැබේ. කිමෙක් නම් ආර්‍ය්‍ය තුෂ්ණීම්භාවය වේ ද"යි මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය.

ඇවැත්නි, ඒ මට "මෙහි මහණ තෙමේ විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් ස්වසන්තානයෙහි පැහැදීම් ඇති සිතේ උතුම් එකඟබැව් වඩන විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානය උපදවා වෙසේ නම් මේ ආර්‍ය්‍ය වූ තුෂ්ණීම්භාව ය යි කියනු ලැබේ"යි මේ සිත විය.

ඇවැත්නි, ඒ මම විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් සිය සතන්හි පැහැදීම ඇති සිතේ උතුම් එකඟ බැව් වඩන විතර්කරහිත විචාරරහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානය උපදවා වෙසෙමි. ඇවැත්නි, මේ විහරණයෙන් වෙසෙන මට විතර්ක සහගත වූ සංඥමනසිකාරයෝ පවතිත්. ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත වැඩ "මුගලන, මුගලන, බමුණ, ආර්‍ය්‍යතුෂ්ණීම්භාවය නො වරදව. ආර්‍ය්‍ය තුෂ්ණීම්භාවයෙහි සිත මැනවින් තබව. ආර්‍ය්‍යතුෂ්ණීම්භාවයෙහි සිත එකඟ කරව. ආර්‍ය්‍යතුෂ්ණීම්භාවයෙහි සිත නගාලව යි' මෙය වදාළ සේක.

ඇවැත්නි, ඒ මම අන් කලෙක විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් සිය සතන්හි පැහැදීම ඇති සිතේ එකඟබැව් වඩන විතර්කරහිත වූ විචාර රහිත වූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානය උපදවා විසීමි. ඇවැත්නි, සත්‍යය කියන්නෙක් "ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහිත වූ ශ්‍රාවකයෙක් මහාභිඥ ඇති බවට පැමිණියේ ය" යි යමකු සඳහා කියන්නේ නම්, සත්‍යය කියන්නා "ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහිත වූ ශ්‍රාවකයෙක් මහාභිඥ ඇති බවට පැමිණියේ ය"යි මා සඳහා එය කියන්නේ යි.

### 9 1 2.

### සාරිපුත්තසුත්තං[1]

396. **සාවත්ථියං-**

තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි: ආවුසො භික්ඛවෙති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

ඉධ මය්හං ආවුසො, රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "අත්ථි නු ඛො තං කිඤ්චි ලොකස්මිං යස්ස මෙ විපරිනාමඤ්ඤථාභාවා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා"ති.

තස්ස මය්හං ආවුසො, එතදහොසි: "නත්ථි ඛො තං කිඤ්චි ලොකස්මිං යස්ස මෙ විපරිනාමඤ්ඤථාභාවා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා"ති

එවං වුත්තෙ ආයස්මා **ආනන්දො**, ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "සත්ථුපි ඛො තෙ ආවුසො, සාරිපුත්ත විපරිනාමඤ්ඤථාභාවා නුප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා"ති.

සත්ථුපි ඛො මෙ ආවුසො, විපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. අපි ච මෙ එවමස්ස: මහෙසක්ඛො වත භො සත්ථා අන්තරහිතො මහිද්ධිකො මහානුභාවො, සචෙ හි භගවා චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍ය, තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

තථා හි පනායස්මතො සාරිපුත්තස්ස දීඝරත්තං අහඞ්කාරමමිංකාරමානානුසයා සුසමූහතා. තස්මා ආයස්මතො සාරිපුත්තස්ස සත්ථුපි විපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති.

### 10 1. 3

### මහානාගසුත්තං[2]

397. **සාවත්ථියං-**

තෙන ඛො පන සමයෙන ආයස්මා ච **සාරිපුත්තො** ආයස්මා ච **මහාමොග්ගල්ලානො රාජගහෙ** විහරන්ති **වෙළුවනෙ කලන්දකනිවාපෙ එකවිහාරෙ**. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායණ්හසමයං පතිසල්ලාණා වුට්ඨිතො යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා මහාමොග්ගල්ලානෙන සද්ධිං සම්මොදි-පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: විප්පසන්නානි ඛො තෙ ආවුසො මොග්ගල්ලාන, ඉන්ද්‍රියානි. පරිසුද්ධො මුඛවණ්ණො පරියොදාතො, සන්තෙන නූනායස්මා මහාමොග්ගල්ලානො අජ්ජ විහාරෙන විහාසීති.

1. උපතිස්සසුත්තං - මජ්ඣ., ස්‍යා. 2. ඝටසුත්තං - මජ්ඣං. ඝට - උද්දන

9. 1. 2

**ශාරිපුත්ත සූත්‍රය**

396. **සැවැත්නුවර-**

එහි දී ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ 'ඇවැත්නි, මහණෙනි' යි භික්ෂූන් ඇමතූහ. ඒ භික්ෂූහු 'ඇවැත්නි' යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට පිළිවදන් ඇස්සූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙය වදාළහ.

ඇවැත්නි, මෙහි එකලා ව විවෙකී ව හුන් මට "යම්බඳු මට විපරිණාම අන්‍යථාභාවයෙන් (=යමක් පෙරෙළීම වෙනස් වීම නිසා) සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ උපදනාහු නම් එබඳු කිසිවක් ලොව ඇද්දෝ" යි මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය.

ඇවැත්නි, ඒ මට "යම්බඳු මට විපරිණාම - අන්‍යථාභාවයෙන් සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ උපදනාහු නම් එබඳු කිසිවක් ලොව නැතැ"යි මේ සිත විය

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, ශාස්තෲන් වහන්සේගේ ද විපරිණාම අන්‍යථාභාවයෙන් ඔබ වහන්සේට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදනාහු දැ"යි මෙය කීහ.

ඇවැත්නි, ශාස්තෲන් වහන්සේගේ ද විපරිණාම අන්‍යථාභාවයෙන් මට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදනාහු ය. වැළිදු මට "පින්වත්නි, ඒකාන්තයෙන් මහේශාක්‍ය වූ මහත් සෘද්ධි ඇති මහත් අනුභාව ඇති සත්ත්වයෙක් අතුරුදන් වූයේ ය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ බොහෝ දිගුකලක් සිටුනා සේක් නම් එය බොහෝ ජනයාට හිත පිණිස බොහෝ ජනයාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙවිමිනිසුන්ට වැඩ පිණිස, හිත පිණිස සුව පිණිස වන්නේ ය යි මෙසේ සිතෙන්නේ ය

ඒ එසේ මැයි: ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ විසින් දිගු කලෙක අහංකාරමමඞ්කාරමානානුසයෝ මැනවින් උපුටා හරිණ ලදහ. එහෙයින් ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේට ශාස්තෲන් වහන්සේගේ ද විපරිණාම අන්‍යථාභාවයෙන් සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදනාහ යි.

10. 1. 3.

**මහානාග සූත්‍රය.**

397. **සැවැත්නුවර-**

එකල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ ද, ආයුෂ්මත් **මහමුගලන්** තෙරණුවෝ ද **රජගහනුවර** සමීපයෙහි **කලන්දකනිවාප** නම් **වේළුවනාරාම** යෙහි එක වෙහෙර (=එක ම ගර්භයක) වෙසෙති. එකල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ සවස්කල පලසමවතින් නැඟී සිටියාහු ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් **මහමුගලන්** තෙරණුවන් සමඟ සතුටු වූහ .. එකත්පසෙක හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට මෙය කීහ: "ඇවැත්නි, මොග්ගල්ලානයෙනි, ඔබගේ ඉඳුරෝ වෙසෙසින් පහන්හ. මුහුණුපැහැය පිරිසිදු ය වෙසෙසින් බබලන්නේ ය ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ අද ඒකාන්ත යෙන් ශාන්ත වූ විහරණයකින් වුසූහු ය"යි.

ඔළාරිකෙන බො අහං ආවුසො; අජ්ජ විහාරෙන විහාසිං. අපි ච මෙ අහොසි ධම්මී කථාති. "කෙන සද්ධිං පනායස්මතො මහාමොග්ගල්ලානස්ස අහොසි ධම්මී කථා"ති? භගවතා බො මෙ ආවුසො, සද්ධිං අහොසි ධම්මී කථාති. "දූරෙ බො ආවුසො, භගවා එතරහි සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. කින්නු බො ආයස්මා මහාමොග්ගල්ලානො භගවන්තං ඉද්ධියා උපසඞ්කමි, උදාහු භගවා ආයස්මන්තං මහාමොග්ගල්ලානං ඉද්ධියා උපසඞ්කමී"ති?

තග්ඝාහං ආවුසො, භගවන්තං ඉද්ධියා උපසඞ්කමිං. තපි මං භගවා ඉද්ධියා උපසඞ්කමි. අපි ච මෙ යාවතා භගවා එත්තාවතා දිබ්බං චක්ඛුං විසුජ්ඣි දිබ්බා ච සොතධාතු. භගවතොපි යාවතාහං එත්තාවතා දිබ්බං චක්ඛුං විසුජ්ඣි, දිබ්බා ච සොතධාතූති.

යථා කථං පනායස්මතො මහාමොග්ගල්ලානස්ස භගවතා සද්ධිං අහොසි ධම්මී කථාති?

ඉධාහං ආවුසො, භගවන්තං එතදවොචං: "ආරද්ධවිරියො ආරද්ධ-විරියො"ති භන්තෙ වුච්චති. කිත්තාවතා නු බො භන්තෙ, ආරද්ධවිරියො හොතීති? එවං වුත්තෙ මං ආවුසො, භගවා එතදවොච: ඉධ මොග්ගල්ලාන භික්ඛු ආරද්ධවිරියො විහරති, "කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ, උපසුස්සතු මංසලොහිතං. යං තං පුරිසථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතී"ති. එවං බො මොග්ගල්ලාන, ආරද්ධවිරියො හොතීති. එවං බො මෙ ආවුසො, භගවතා සද්ධිං අහොසි ධම්මී කථාති.

සෙය්‍යථාපි ආවුසො, හිමවතො පබ්බතරාජස්ස පරිත්තා පාසාණ-සක්ඛරා යාවදෙව උපනික්ඛෙපනමත්තාය. එවමෙව බො මයං ආයස්මතො මහාමොග්ගල්ලානස්ස යාවදෙව උපනික්ඛෙපනමත්තාය, ආයස්මා හි මහා-මොග්ගල්ලානො මහිද්ධිකො මහානුභාවො, ආකඞ්ඛමානො කප්පං තිට්ඨෙය්‍යාති.

සෙය්‍යථාපි ආවුසො, මහතියා ලොණඝටාය පරිත්තා ලොණසක්ඛරා යාවදෙව උපනික්ඛෙපනමත්තාය. එවමෙව මයං ආයස්මතො සාරිපුත්තස්ස යාවදෙව උපනික්ඛෙපනමත්තාය. ආයස්මා හි සාරිපුත්තො භගවතා අනෙකපරියායෙන ථොමිතො වණ්ණිතො පසත්ථො:

"සාරිපුත්තොව පඤ්ඤාය සීලෙන උපසමෙන ච,
යොපි පාරඞ්ගතො භික්ඛු එතාව[1] පරමො සියා"ති.

ඉති හෙතෙ උභො මහානාගා අඤ්ඤමඤ්ඤස්ස සුභාසිතං සුලපිතං සමනුමොදිංසූති.

1. එතාවා-සයා.

ඇවැත්නි, අද මම ඖදාරික (දිබ්බචක්ඛු – දිබ්බසොතධාතු විෂය වූ) විහරණයකින් විසීමි. එහෙත් මාගේ දැහැමි කතාවෙක් වී ය. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ගේ දැහැමි කතාව කවරකු සමග වී ද? ඇවැත්නි, මාගේ දැහැමි කතාව භාග්‍යවතුන් වහන්සේ ම සමග වී ය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ දුර් දුරෙහි ම සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු මහසිටුහුගේ අරමෙහි වැඩ වසන සේක. කිමෙක් ද? ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ සෘද්ධියෙන් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාහු ද? නැතහොත් භාග්‍යවතුන් වහන්සේ සෘද්ධියෙන් ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත වැඩි සේක් දැ යි?

ඇවැත්නි, මම සෘද්ධියෙන් භාග්‍යවතුන් වහන්සේ වෙත නො ම එළඹියෙමි. භාග්‍යවතුන් වහන්සේ ද සෘද්ධියෙන් මා වෙත නො එළඹි සේක. එහෙත් භාග්‍යවතුන් වහන්සේ යම්තාක් (දුරෙහි වූ) ද, ඒ තාක් මාගේ දිවැස ද දිවකණ ද (භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස ඇසීම පිණිස) විශුද්ධ (=යොමු) විය. මම යම්තාක් දුරෙහි ද, ඒ තාක් භාග්‍යවතුන් වහන්සේගේ ද දිවැසත් දිවකණත් විශුද්ධ විය.

ඒ කෙසේ නම් භාග්‍යවතුන් වහන්සේ සමග ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ගේ දැහැමි කතාව වී ද?

ඇවැත්නි, මෙහි මම භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, ආරබ්ධවීර්‍ය්‍ය ය, ආරබ්ධවීර්‍ය්‍ය ය යි කියනු ලැබේ වහන්ස, කෙතෙකින් ආරබ්ධවීර්‍ය්‍ය වේ දැ"යි මෙය සැළකෙළෙමි. ඇවැත්නි, මෙසේ සැළකළ කල්හි භාග්‍යවතුන් වහන්සේ මට මෙය වදාළ සේක: මොග්ගල්ලානය, මෙහි මහණ තෙමේ "ඒකාන්තයෙන් සිරුරෙහි සිවියත් නහරත් ඇටත් ඉතිරි වේවා, මස් ලේ වියළේවා, පුරුෂ ශක්තියෙන් පුරුෂවීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් ඒ යමක් ලැබිය යුතු නම් එය නො ලබා වීර්‍ය්‍යයාගේ සිරීමෙක් නො වන්නේ ය" යි පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇති ව වෙසෙයි. මොග්ගල්ලානය, මෙසේ ආරබ්ධවීර්‍ය්‍ය වේ ය"යි. ඇවැත්නි, මෙසේ භාග්‍යවතුන් වහන්සේ සමග මාගේ දැහැමි කතාව විය.

ඇවැත්නි, යම් සේ කුඩා ගල් කැටක් හිමවත් පවුරජුගේ (මහත් බව සඳහා) ලක් තැබීම (උපමා කිරීම) පිණිස පමණක් ම වේ ද, එසෙයින් ම අපි දු ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ගේ (සෘද්ධිමහත්ත්වය සඳහා) ලක් තැබීම පිණිස පමණක් ම වෙමු. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මහත් සෘද්ධි ඇත්තාහ. මහත් අනුභාව ඇත්තාහ. කැමැත්තෝ නම් ආයුෂ්කල්පය ම සිටිනාහු ය.

යම් සේ කුඩා ලුණුකැටක් (සක්වල මුවවිට හා බඹලොව හිම් කොට පිහිටි) ලුණු කළයක (මහත්බව සඳහා) ලක් තැබීම පිණිස පමණක් වේ ද, එසෙයින් ම අපි දු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ ප්‍රඥාමහත්ත්වය සඳහා) ලක් තැබීම පිණිස පමණක් ම වෙමු. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරෙන් ස්තුති කරණ ලදහ. වර්ණනා කරණ ලදහ. පසස්නා ලදහ:

ප්‍රඥාවෙන් ද ශීලයෙන් ද ව්‍යුපශමයෙන් ද සැරියුත් තෙරණුවෝ ම ශ්‍රෙෂ්ඨයහ. යම් කිසි මහණෙක් පරතෙරට (නිවනට) පැමිණියේ නම් හෙතෙම සැරියුත් තෙරණුවන් ම පරම කොට ඇත්තේ වන්නේ ය (තෙරුන්ට වඩා උත්තරිතරයෙක් නැත.)

මෙසේ මේ මහානාගයෝ (මහරහත්) දෙනම මැනැවින් බණන ලද ඔවුනොවුන්ගේ සුබැසිය සතුටින් පිළිගත්හ.

## 9. 1. 4

## නවභික්ඛුසුත්තං[1]

398. **සාවත්ථියං-**

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො නවො භික්ඛු පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො විහාරං පවිසිත්වා අප්පොස්සුක්කො තුණ්හීභූතො සඞ්කසායති, න භික්ඛූනං වෙය්‍යාවච්චං කරොති චීවරකාරසමයෙ. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "ඉධ භන්තෙ, අඤ්ඤතරො නවො භික්ඛු පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො විහාරං පවිසිත්වා අප්පොස්සුක්කො තුණ්හීභූතො සඞ්කසායති න භික්ඛූනං වෙය්‍යාවච්චං කරොති චීවරකාරසමයෙ"ති.

අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි "එහි ත්වං භික්ඛු මම වචනෙන තං භික්ඛුං ආමන්තෙහි, සත්ථා තං ආවුසො ආමන්තෙතී"ති. එවං භන්තෙති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: "සත්ථා තං ආවුසො, ආමන්තෙතී"ති එවමාවුසොති ඛො සො භික්ඛු තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා -පෙ- එකමන්තං නිසින්නං ඛො තං භික්ඛුං භගවා එතදවොච: "සච්චං කිර ත්වං භික්ඛු, පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො විහාරං පවිසිත්වා අප්පොස්සුක්කො තුණ්හීභූතො සංකසායසි, න භික්ඛූනං වෙය්‍යාවච්චං කරොසි චීවරකාර සමයෙ"ති? අහම්පි ඛො භන්තෙ, සකං කිච්චං කරොමීති.

අථ ඛො භගවා තස්ස භික්ඛුනො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය භික්ඛූ ආමන්තෙසි: මා ඛො තුම්හෙ භික්ඛවෙ, එතස්ස භික්ඛුනො උජ්ඣායිත්ථ. එසො ඛො භික්ඛවෙ, භික්ඛු චතුන්නං ඣානානං ආභිචෙතසිකානං[2] දිට්ඨ-ධම්මසුඛවිහාරානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී. යස්ස චත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

නයිදං සිථිලමාරබ්භ නයිදං අප්පෙන ථාමසා,
නිබ්බානං අධිගන්තබ්බං සබ්බගන්ථප්පමොචනං.[3]

අයඤ්ච දහරො භික්ඛු අයමුත්තමපොරිසො,
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනින්ති.

1. නවසුත්තං - මජ්සං, නව - උද්දාන.
2. අභිචෙතසිකානං - සීමු, සභා. 3. සබ්බදුක්ඛප්පමොචනං - මජ්සං, PTS.

## 9. 1. 4

## නවභික්ඛු සූත්‍රය.

398. **සැවැත්නුවර-**

එකල්හි එක්තරා නව මහණෙක් පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණේ වෙහෙරට පිවිස නිරුත්සුක ව නිහඬ ව වෙසෙයි. සිවුරු කරණ සමයෙහි භික්ෂූන්ට වතාවත් නො කෙරෙයි. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හු. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ: වහන්ස, මෙහි එක්තරා නවක මහණෙක් පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණේ වෙහෙරට පිවිස නිරුත්සුක ව නිහඬ ව වෙසෙයි. සිවුරු කරණ සමයෙහි භික්ෂූන්ට වතාවත් නො කෙරේ යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණකු ඇමතූ සේක: "මහණ එව, තෝ මාගේ වචනයෙන් ඇවැත්නි, ශාස්තෘන් වහන්සේ තොප අමතන සේකැ"යි ඒ මහණ අමතව. "වහන්ස, එසේ ය" යි ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා ඒ මහණ කරා එළඹියේ ය. එළඹ "ඇවැත්නි, ශාස්තෘන් වහන්සේ තොප අමතන සේකැ"යි ඒ මහණහට මෙය කී ය. ඒ මහණ තෙමේ "ඇවැත්නි, එසේ ය"යි ඒ මහණහට පිළිවදන් අස්වා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ ... එකත්පසෙක හුන් ඒ මහණහට භාග්‍යවතුන් වහන්සේ: "මහණ තෝ පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණේ වෙහෙරට පිවිස නිරුත්සුක වූයේ නිහඬ ව වෙසෙහි, සිවුරු කරණ සමයෙහි භික්ෂූන්ට වතාවත් නො කෙරෙහි, සැබෑ දැ"යි මෙය වදාළ සේක. 'වහන්ස, මම සිය කට යුතු කෙරෙමි යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සිය සිතින් ඒ මහණහුගේ චිත්ත-පරිවිතර්කය දැන භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, තෙපි තෙල මහණහට නගමක් අවමන් කරවූ. "මහණෙනි, තෙල මහණ තෙමේ උතුම් සිත ඇසුරු කළ ඉහාත්මයෙහි සැපවිහරණ වූ සතර ධ්‍යානයන් කැමැති සේ ලබන්-නෙක. නිදුකින් ලබන්නෙක. මහත් සේ ලබන්නෙක. යමක් පිණිස කුල පුත්‍රයෝ මැනවින් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණෙද්ද, මගබඹසර අවසන් කොට ඇති ඒ අනුත්තර වූ අර්හත්ඵලය මේ අත්බැව්හි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ලබා වාසය කෙරේ" යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාරා සුගත වූ ශාස්තෘන් වහන්සේ වැලි අන් අයුරින් මෙය වදාළ සේක:

සිංහල ග්‍රන්ථයන් මුද්‍රන මේ නිවන ශිථිලවීර්‍යයෙන් අවබෝධ නො කට හැකි ය. මේ නිවන සවල්ප වූ ශක්තියකින් ලැබිය නො හැකි ය.

මේ දහර මහණෙකි. උතුම් පුරුෂයෙක් වූ මෙතෙමේ සේනා සහිත මරු දිනා අන්තිම ශරීරය දරණේ යි.

## 9. 1. 5.

## සුජාතසුත්තං

399 සාවත්ථියං-

අථ ඛො ආයස්මා **සුජාතො** යෙන භගවා තෙනුපසඞ්කමි. අද්දසා ඛො භගවා ආයස්මන්තං සුජාතං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භික්ඛූ ආමන්තෙසි:

උභයෙනෙවායං භික්ඛවෙ, කුලපුත්තො සොභති: යඤ්ච අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො, යස්ස චත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. ඉදමවොච භගවා -පෙ- එතදවොච සත්ථා:

සොභති වතායං භික්ඛු උජුභූතෙන චෙතසා,
විප්පමුත්තො[1] විසඤ්ඤුත්තො අනුපාදාය නිබ්බුතො,
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනින්ති.

## 9. 1. 6.

## ලකුණ්ටකභද්දියසුත්තං

490. සාවත්ථියං-

අථ ඛො ආයස්මා **ලකුණ්ටකභද්දියො** යෙන භගවා තෙනුපසඞ්කමි. අද්දසා ඛො භගවා ආයස්මන්තං ලකුණ්ටකභද්දියං දූරතොව ආගච්ඡන්තං දිස්වාන භික්ඛූ ආමන්තෙසි:

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, එතං භික්ඛුං ආගච්ඡන්තං දුබ්බණ්ණං දුද්දසිකං ඔකොටිමකං භික්ඛූනං පරිභූතරූපන්ති? එවං භන්තෙ. එසො ඛො භික්ඛවෙ, භික්ඛු මහිද්ධිකො මහානුභාවො, න ච සා සමාපත්ති සුලභරූපා යා තෙන භික්ඛුනා අසමාපන්නපුබ්බා. යස්ස චත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. ඉදමවොච භගවා -පෙ- එතදවොච සත්ථා:

හංසා කොඤ්චා මයූරා ච හත්ථියො පසදා මිගා,
සබ්බෙ සීහස්ස භායන්ති නත්ථි කායස්මිං තුල්‍යතා.

එවමෙව මනුස්සෙසු දහරො චෙපි පඤ්ඤවා,
සො හි තත්ථ මහා හොති නෙව බාලො සරීරවාති.

---

1 විප්පයුත්තො - මජසං, සතා, PTS.

## 9. 1. 5.

## සුජාත සූත්‍රය

399. **සැවැත්නුවර-**

එකල්හි ආයුෂ්මත් **සුජාත** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. භාග්‍යවතුන් වහන්සේ එන්නා වූ සුජාත තෙරුන් දුර දී ම දුටු සේක. දැක භික්ෂූන් ඇමතූ සේක:

මහණෙනි, මේ කුලදරු තෙමේ කරුණු දෙකෙකින් හොබී: "විශිෂ්ට රූප ඇත්තේ දැකුම්කලු වූයේ පැහැ එලවන උතුම් වර්ණ සෞන්දර්යයෙන් යුක්ත වූයේ ය" යන යම් කරුණෙකුත් වේ ද, "යමක් පිණිස කුලපුත්‍රයෝ මැනවින් ගිහිගෙන් නික්ම පැවිද්දට වදිත් නම් මගබඹසර අවසන් කොට ඇති ඒ අනුත්තර වූ අර්හත්ඵලය මේ අත් බැව්හි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ලබා වාසය කෙරෙයි" යන යම් කරුණෙකුත් වේ ද යන කරුණු දෙකෙනි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක ... ශාස්තෘන් වහන්සේ මෙද වදාළ සේක:

මේ මහණ තෙමේ සෘජු වූ සිතින් ඒකාන්තයෙන් හොබී. කෙලෙසුන් කෙරෙන් මිදුනේ සංයෝජනයන්ගෙන් වෙන් වූයේ උපාදානරහිත ව නිවියේ සේනා සහිත මරු දිනා අන්තිමශරීරය දරණේ යි.

## 9. 1. 6.

## ලකුණ්ටකභද්දිය සූත්‍රය

400. **සැවැත්නුවර-**

එකල්හි ආයුෂමත් **ලකුණ්ටකභද්දිය** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. භාග්‍යවතුන් වහන්සේ ආයුෂමත් ලකුණ්ටකභද්දිය තෙරුන් දුර දී ම එනුවන් දුටු සේක. දැක භික්ෂූන් ඇමතූ සේක:

මහණෙනි, තෙපි තෙල එන්නා වූ දුර්වර්ණ තපුරු දැකුම් ඇති මිටි වූ භික්ෂූන් විසින් අවමත් කරණ ලද සවරූප ඇති මහණ දකිවු දැ' වහන්ස, එසේ ය. මහණෙනි, මේ මහණ තෙමේ මහත් සෘද්ධි ඇත්තෙකි. මහත් අනුභාව ඇත්තෙකි. ඒ මහණහු විසින් නො සමවත්වීරූ යම් සමවතෙක් වේ ද, එබඳු සමවතෙක් සුලබ නො වේ. කුලපුත්‍රයෝ යමක් පිණිස මැනවින් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණෙද්ද, මගබඹසර අවසන් කොට ඇති ඒ අනුත්තරඅර්හත්ඵලය මේ අත්බැව්හි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට පැමිණ වෙසේ ය යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක ... ශාස්තෘන් වහන්සේ මෙය ද වදාළ සේක:

හංසයෝත් කොස්වාලිහිණියෝත් මොනරුත් ඇත්තුත් තිත් මුවෝත් සියල්ලෝ සිංහයාගෙන් බති. කයෙහි සමබවෙක් (පමණ හිණිමෙක්) නැත.

එසෙයින් ම මිනිසුන් අතර නුවණැත්තේ ඉදින් ලදරු වූයේ ද, හෙතෙමේ ම එහි පූජ්‍ය වෙයි. බාල (අඥ) තෙමේ මහත් සිරුරක් ඇත්තේ ද නො ම පූජ්‍ය වේ යි.

## 9. 1. 7.

### විසාඛපඤ්චාලිපුත්තසුත්තං[1]

401. එකං සමයං භගවා **වෙසාලියං** විහරති මහාවනෙ **කූටාගාරසාලායං**. තෙන ඛො පන සමයෙන ආයස්මා **විසාඛො පඤ්චාලිපුත්තො** උපට්ඨානසාලායං භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති, පොරියා වාචාය විස්සට්ඨාය අනෙලගලාය[1] අත්ථස්ස විඤ්ඤාපනියා පරියාපන්නාය අනිස්සිතාය.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනුපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: කොනු ඛො භික්ඛවෙ, උපට්ඨානසාලායං භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති පොරියා වාචාය විස්සට්ඨාය අනෙලගලාය[2] අත්ථස්ස විඤ්ඤාපනියා පරියාපන්නාය අනිස්සිතායාති? ආයස්මා භන්තෙ, විසාඛො පඤ්චාලිපුත්තො උපට්ඨානසාලායං භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති, පොරියා වාචාය විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා පරියාපන්නාය අනිස්සිතායාති.

අථ ඛො භගවා ආයස්මන්තං විසාඛං පඤ්චාලිපුත්තං ආමන්තෙසි: සාධු, සාධු, විසාඛ, සාධු ඛො ත්වං විසාඛ, භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි, පොරියා වාචාය විස්සට්ඨාය අනෙලගලාය[2] අත්ථස්ස විඤ්ඤාපනියා පරියාපන්නාය අනිස්සිතායාති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

න භාසමානං ජානන්ති මිස්සං බාලෙහි පණ්ඩිතං,
භාසමානඤ්ච ජානන්ති දෙසෙන්තං අමතං පදං.

භාසයෙ ජොතයෙ ධම්මං පග්ගණ්හෙ ඉසිනං ධජං,
සුභාසිතධජා ඉසයො ධම්මො හි ඉසිනං ධජොති.

## 9. 1. 8.

### නන්දසුත්තං

402. **සාවත්ථියං**-

අථ ඛො ආයස්මා **නන්දො** භගවතො මාතුච්ඡාපුත්තො ආකොටිතපච්චාකොටිතානි චීවරානි පාරුපිත්වා අක්ඛීනි අඤ්ජිත්වා අච්ඡං පත්තං ගහෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං නන්දං භගවා එතදවොච:

---

1. විසාඛසුත්තං - මජසං, විසාඛ - උදදක 2. අනෙලමූගාය - සීමු.

## 9. 1 7

## විසාඛ පඤ්චාලිපුත්ත සූත්‍රය

401 එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලාමහනුවර මහවෙනෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක. එකල්හි (පඤ්චාලීරාජ දුහිතෘ පුත්‍ර බැවින්) පඤ්චාලිපුත්‍ර වූ ආයුෂ්මත් විශාඛ තෙරණුවෝ නො පැකුළුණු කෙලතොලු නො වූ (=නිදෙස් වූ) අර්ථය අඟවන සිවුසස් නො හැර පවසන සසරට නිසි නො වූ නාගරික (=පුරවැසිබස් සෙයින් මිහිරි වූ) වචනයෙන් දහැමි කතාවෙන් උවටැන් හලෙහි භික්ෂූන් කරුණු දක්වති. සමාදන් කරවති. තෙද ගන්වති. සතුටු කරවති.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කල පලසමවතින් නැගී සිටි සේක් උවටැන්හල වෙත එළඹි සේක. එළඹ පණවන ලද අසුන්හි වැඩහුන් සේක වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක· මහණෙනි, කවරෙක් නො පැකුළුණු කෙලතොලු නුවූ (=නිදෙස් වූ) අරුත් හඟවන සිවුසස් පවසන සසරට නිසි නො වූ මිහිරි වචනයෙන් දහැමි කතායෙන් උවටැන් හලෙහි භික්ෂූන් කරුණු දක්වා ද, සමාදන් කරවා ද, තෙද ගන්වා ද, සතුටු කෙරේ ද යි? වහන්ස, පඤ්චාලි පුත්‍ර වූ ආයුෂ්මත් විසාඛ තෙරණුවෝ නො පැකුළුණු නිදෙස් වූ අරුත් හඟවන සිවුසස් පවසන සසරට නිසි නො වූ මිහිරි වචනයෙන් දහැමි කතාවෙන් උවටැන්හලෙහි භික්ෂූන් කරුණු දක්වත්, සමාදන් කරවත්, තෙද ගන්වත්, සතුටු කෙරෙති යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂමත් පඤ්චාලිපුත්‍ර විසාඛ තෙරුන් ඇමතූ සේක. විසාඛ, මැනැවි. මැනැවි විසාඛ, තෙපි නො පැකුළුණු නිදෙස් වූ අරුත් හඟවන සිවුසස් පවසන සසර ඇසුරු නො කළ මධුර වචනයෙන් දහැමි කථායෙන් භික්ෂූන් කරුණු දක්වවූ. සමාදන් කරවවූ, තෙද ගන්වවූ, සතුටු කරවවූ යි භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා වැලි දු මෙය වදාළ සේක:

බාලයන් හා එක් වූ කපිකා (පණ්ඩිතයා) ලෝවැඩසෝ නො දනිත් අමාපදය දෙසන කපිකා (පණ්ඩිතයා) දන ගණිත්

ධර්මය කියන්නේ ය. බබුලුවන්නේ ය. සෘෂීන්ගේ ධවජය දැඩි කොට ගන්නේ ය. සෘෂිහු සුභාෂිතය ධවජ කොට ඇත්තාහ. තව ලොවුතුරු දහම සෘෂින්ගේ ධවජය යි.

## 9. 1. 8.

## නන්ද සූත්‍රය

402. සැවැත්නුවර-

එකල්හි භාග්‍යවතුන් වහන්සේගේ සුලුමවුපුත් ආයුෂමත් නන්ද ස්ථවිර තෙමේ කොළන ලද පිළිකොළන ලද (මටසිලුටු සිහින්) සිවුරු පොරවා ඇස් අඳුනෙන් සඳා වෙසෙසින් පහන් පැහැති පාත්‍රයක් ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂමත් නන්දහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

න ඛො තෙ තං නන්ද, පතිරූපං කුලපුත්තස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතස්ස යං ත්වං ආකොටිතපච්චාකොටිතානි චීවරානි පාරුපෙය්‍යාසි, අක්ඛීනි ච අඤ්ජෙය්‍යාසි, අච්ඡඤ්ච පත්තං ධාරෙය්‍යාසි. එතං[1] ඛො තෙ නන්ද පතිරූපං කුලපුත්තස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතස්ස යං ත්වං ආරඤ්ඤකො ච අස්සසි පිණ්ඩපාතිකො ච පංසුකූලිකො ච කාමෙසු ච අනපෙක්ඛො විහරෙය්‍යාසීති. ඉදමවොච භගවා -පෙ- එතදවොච සත්ථා:

කදාහං නන්දං පස්සෙය්‍යං ආරඤ්ඤං පංසුකූලිකං,
අඤ්ඤාතුඤ්ඡෙන[2] යාපෙන්තං කාමෙසු අනපෙක්ඛිනන්ති.

අථ ඛො ආයස්මා නන්දො අපරෙන සමයෙන ආරඤ්ඤකො චාපි පිණ්ඩපාතිකො ච පංසුකූලිකො ච කාමෙසු ච අනපෙක්ඛො විහාසීති.

## 9. 1. 9.

## තිස්සසුත්තං

403. සාවත්ථියං-

අථ ඛො ආයස්මා තිස්සො භගවතො පිතුච්ඡාපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, දුක්ඛී දුම්මනො අස්සූනි පවත්තයමානො. අථ ඛො භගවා ආයස්මන්තං තිස්සං එතදවොච: කිං ත්වං තිස්ස, එකමන්තං නිසින්නො දුක්ඛී දුම්මනො අස්සූනි පවත්තයමානොති?

තථා හි පන මං භන්තෙ, භික්ඛූ සමන්තා වාචාසන්නිතොදකෙන[3] සඤ්ජම්භරිං අකංසූති. තථා හි පන ත්වං තිස්ස, වත්තා නො ච වචනක්ඛමො. න ඛො තෙ තං තිස්ස පතිරූපං කුලපුත්තස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතස්ස, යං ත්වං වත්තා නො ච වචනක්ඛමො. එතං ඛො තෙ තිස්ස පතිරූපං කුලපුත්තස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතස්ස යං ත්වං වත්තා ච අස්සසි[4] වචනක්ඛමො චාති. ඉදමවොච භගවා -පෙ- එතදවොච සත්ථා:

කින්නු කුජ්ඣසි මා කුජ්ඣි අක්කොධො තිස්ස තෙ වරං,
කොධමානමක්ඛවිනයත්ථං හි තිස්ස බ්‍රහ්මචරියං වුස්සතීති.

## 9. 1. 10.

## ථෙරනාමකසුත්තං

404. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ථෙරනාමකො එකවිහාරී චෙව හොති එකවිහාරස්ස ච වණ්ණවාදී. සො එකො ගාමපිණ්ඩාය පවිසති. එකො පටික්කමති. එකො රහො නිසීදති. එකො චඞ්කමං අධිට්ඨාති.

---

1. එවං - සී 1, 2. 2. අඤ්ඤාතුඤ්ජෙන - ස්‍යා. 3. වාචාය සන්නිතොදකෙන - මජසං, ස්‍යා, PTS. සී 1, 2. 4 අස්ස - මජසං, ආසි - ස්‍යා

තන්ද, යම්බඳු තෝ කොළත ලද පිළිකොළත ලද සිවුරු පොරවත්තෙහි නම්, ඇස් අඳුනෙත් සදන්නෙහි නම්, වෙසෙසින් පහන් පැහැති පාත්‍රයක් දරන්නෙහි නම් එය සැදැහැයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණි කුලපුත්‍ර වූ තොපට නිසි නො වේ. තන්ද යම්බඳු තෝ ආරණ්‍යක ද පිණ්ඩපාතික ද පංසුකූලික ද වන්නෙහි නම්, කාමයන්හිත් නිරපේක්ෂක ව වෙසෙන්නෙහි නම්, සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූ කුලපුත්‍ර වූ තොපට මේය සුදුසු වේ මැ යි. භාග්‍යවතුන් වහන්සේ මේය වදාළ සේක ... ශාස්තෲන් වහන්සේ මේ ද වදාළ සේක:

ආරණ්‍යක වූ පංසුකූලික වූ ප්‍රකට කුලයන්හි ම නොව ගෙපිළිවෙළින් පිඬු සිඟීමෙන් යැපෙන්නා වූ කාමයන්හි නිරපේක්ෂක වූ නන්දයන් මම කවදා දක්නෙම් ද?

ඉක්බිති ආයුෂ්මත් නන්ද තෙමේ මෑත භාගයෙහි ආරණ්‍යක ද පිණ්ඩපාතික ද පංසුකූලික ද විය. කාමයන්හි නිරපේක්ෂක ව විසී ය.

## 9. 1. 9.

## තිස්ස සූත්‍රය

403. සැවැත්නුවර-

එකල්හි භාග්‍යවතුන් වහන්සේගේ නැන්දනියගේ පුත් වූ ආයුෂ්මත් තිස්ස ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ දුක් ඇත්තේ නවගත් දොම්නස් ඇත්තේ කඳුළු වගුරුවමින් එකත්පසෙක හුන්නේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් තිස්සහට - තිස්ස, තෝ කුමක් හෙයින් දුක් ඇත්තෙහි නවගත් දොම්නස් ඇත්තෙහි කඳුළු වගුරුවමින් එකත්පසෙක හුන්නෙහි දැයි මේය වදාළ සේක.

වහන්ස, එය එසේ මැයි: භික්ෂූහු වචනකෙවිටෙන් මට හාත්පස මතුමතුයෙහි විද්දාහු ය. තිස්ස, එය එසේ මැයි. තෝ (මෙරමාහට) කියන්නෙහි. මෙරමා වදන් නො ම ඉවසන්නෙහි. තිස්ස, යම්බඳු තෝ කියන්නෙක් වෙහි ද, මෙරමා වදන් නො ඉවසන්නෙක් වෙහි ද, සැදැහැයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට වන් කුලපුත්‍ර වූ තට එය නිසි නො වේ. තිස්ස, යම්බඳු තෝ කියන්නෙහිත් මෙරමා වදන් ඉවසන්නෙහිත් වන්නෙහි නම් සැදැහැයෙන් ගිහිගෙන් නික්ම පැවිදිවන් කුලපුත්‍ර වූ තට මේය නිසි වේ මැ යි. භාග්‍යවතුන්වහන්සේ මේය වදාළ සේක ... ශාස්තෲන් වහන්සේ මේය ද වදාළ සේක:

කුමක් හෙයින් කිපෙහි ද? නො කිපෙව. තිස්ස, තට නො කිපීම උතුම්. තිස්ස ක්‍රෝධය, මානය, මකුගුණය දුරු කිරීම පිණිස ම බඹසර වෙසේ යි.

## 9. 1. 10.

## ථෙරනාම සූත්‍රය

404. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි ථෙර නම් එක්තරා මහණෙක් එකලා ව වෙසෙන්නේ ද එකලා ව විසීමෙහි ගුණ කියන්නේ ද වෙයි. හෙතෙමේ එකලා ව ගමට පිඬු පිණිස පිවිසෙයි. එකලා ව පෙරළා එයි. එකලා ව රහසිගත ව හිඳී. එකලා ව සක්මනට නඟී.

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ භන්තෙ අඤ්ඤතරො භික්ඛු ථෙරනාමකො එකවිහාරී එකවිහාරස්ස ච වණ්ණවාදීති.

අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: එහි ත්වං භික්ඛු මම වචනෙන ථෙරං භික්ඛුං ආමන්තෙහි "සත්ථා තං ආවුසො, ථෙර ආමන්තෙතී"ති. 'එවං භන්තෙ'ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා ථෙරො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ථෙරං එතදවොච: "සත්ථා තං ආවුසො, ථෙර ආමන්තෙතී"ති. 'එවමාවුසො'ති ඛො ආයස්මා ථෙරො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ථෙරං භගවා එතදවොච: සච්චං කිර ත්වං ථෙර එකවිහාරී, එකවිහාරස්ස ච වණ්ණවාදීති? එවං භන්තෙ.

යථා කථං පන ත්වං ථෙර, එකවිහාරී එකවිහාරස්ස ච වණ්ණවාදීති? ඉධාහං භන්තෙ, එකො ගාමං පිණ්ඩාය පවිසාමි. එකො පටික්කමාමි. එකො රහො නිසීදාමි. එකො චඞ්කමං අධිට්ඨාමි. එවං ඛ්වාහං භන්තෙ එකවිහාරී, එකවිහාරස්ස ච වණ්ණවාදීති.

අත්ථෙසො ථෙර එකවිහාරො, න සො නත්ථීති වදාමි. අපි ච ථෙර, යථා එකවිහාරො විත්ථාරෙන පරිපුණ්ණො හොති, තං සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො ථෙරො භික්ඛු භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

කථං ච ථෙර එකවිහාරො විත්ථාරෙන පරිපුණ්ණො හොති? ඉධ ථෙර යං අතීතං තං පහීනං, යං අනාගතං තං පටිනිස්සට්ඨං. පච්චුප්පන්නෙසු ච අත්තභාවපටිලාභෙසු ඡන්දරාගො සුප්පටිවිනීතො. එවං ඛො ථෙර එකවිහාරො විත්ථාරෙන පරිපුණ්ණො හොතීති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

සබ්බාභිභුං සබ්බවිදුං සුමෙධං
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තං,
සබ්බං ජහං තණ්හක්ඛයෙ විමුත්තං
තමහං නරං එකවිහාරීති බ්‍රූමීති.

එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, මෙහි ථේර නම් එක්තරා මහණෙක් එකලා ව වෙසෙන්නේත් එකලා ව විසීමෙහි ගුණ කියන්නේත් වේ ය" යි මෙය සැලකළහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණකු ඇමතූ සේක: මහණ, එව, තෝ 'ඇවැත්නි, ථේරයෙනි, ශාස්තෘන් වහන්සේ තොප අමතන සේකැ'යි මාගේ වචනයෙන් ථේර මහණ අමතව. 'වහන්ස, එසේ ය' යි ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා ආයුෂ්මත් ථේර මහණ වෙත එළඹියේ ය. එළඹ, ආයුෂ්මත් ථේර මහණහට 'ඇවැත්නි, ථේරයෙනි, ශාස්තෘන් වහන්සේ තොප අමතන සේකැ' යි මෙය කී ය. 'ඇවැත්නි, එසේ ය' යි ආයුෂ්මත් ථේර මහණ තෙමේ ඒ මහණහට පිළිවදන් අස්වා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් ථේරහට භාග්‍යවතුන් වහන්සේ: ථේර, තෝ එකලා ව වෙසෙන්නෙහි, එකලා ව විසීමෙහි ගුණ කියන්නෙහිත් සැබෑ දැ යි මෙය වදාළහ. වහන්ස, එසේ ය.

ථේර, කෙසේ නම් එකලා ව වෙසෙන්නේ එකලා ව විසීමෙහි ගුණ කියන්නේත් වෙහි දැ? වහන්ස, මෙහි මම එකලා ව ගමට පිඬු පිණිස පිවිසෙමි එකලා ව පෙරලා එමි. එකලා ව රහසිගත ව හිඳිමි. එකලා ව සක්මනට බසිමි. වහන්ස, මෙසේ මම එකලා ව වෙසෙන්නෙම් එකලා ව විසීමෙහි ගුණ කියන්නෙම් ද වෙමි.

ථේර, මේ එකලා විහරණය ඇත්තේ ය. එය නැත්තේ නො වේ ය යි කියමි. වැලි දු ථේර, යම් සේ එකලා විහරණය විතර විසින් පිරිපුන් වේ ද, එය අසව. මැනවින් මෙනෙහි කරව. කියන්නෙමි යි. වහන්ස, එසේ ය යි ථේර මහණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී ය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

ථේර, කෙසේ නම් එකලා විහරණය විතර විසින් පිරිපුන් වේ ද, ථේර, මෙහි අතීත වූ (ස්කන්ධපඤ්චකයෙහි) යම් ඡන්දරාගයෙක් වී නම් එය ප්‍රහීණ ය. අනාගත වූ (ස්කන්ධපඤ්චකයෙහි) යම් ඡන්දරාගයෙක් වේ නම් එය දුරු කරණ ලද්දේ ය. වත්මන් අත්බැව් පිළිලැබුම්හි ඡන්දරාගය මැනවින් හික්මවන (=මඩනා) ලද්දේ ය. ථේර, මෙසේ එකලා විහරණය පිරිපුන් වෙයි. භාග්‍ය-වතුන් වහන්සේ මෙය වදාළසේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා යළි මෙය ද වදාළ සේක:

සියල්ල (ස්කන්ධ ධාතු ආයතන ත්‍රිවිධ භව) මැඩ ලූ, ඒ සියල්ල දන්නා, මනා නුවණ ඇති, ඒ සියලු දහම්හි නො ඇලුනු, ඒ සියල්ල දුරු කළ තෘෂ්ණාක්ෂයසංඛ්‍යාත නිවන අරමුණු කොට මිදුනු ඒ මිනිසා එකලා විහරණ ඇත්තේ ය යි මම කියමි යි.

## 9. 1. 11

### මහාකප්පිනසුත්තං

405. සාවත්ථියං-

අථ ඛො ආයස්මා මහාකප්පිනො යෙන භගවා තෙනුපසඞ්කමි. අද්දසා ඛො භගවා ආයස්මන්තං මහාකප්පිනං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භික්ඛූ ආමන්තෙසි: පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, එතං භික්ඛුං ආගච්ඡන්තං ඔදාතං[1] තනුකං. තුඞ්ගනාසිකන්ති? එවං භන්තෙ.

එසො ඛො භික්ඛවෙ, භික්ඛු මහිද්ධිකො මහානුභාවො. න ච සා සමාපත්ති සුලභරූපා, යා තෙන භික්ඛුනා අසමාපන්නපුබ්බා. යස්ස චත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං යෙ ගොත්තපටිසාරිනො,
විජ්ජාචරණසම්පන්නො සො සෙට්ඨො දෙවමානුසෙ.

දිවා තපති ආදිච්චො රත්තිං ආභාති චන්දිමා
සන්නද්ධො ඛත්තියො තපති ඣායී තපති බ්‍රාහ්මණො,
අථ සබ්බමහොරත්තං[2] බුද්ධො තපති තෙජසාති.

## 9. 1. 12.

### සහායකසුත්තං

406. සාවත්ථියං-

අථ ඛො ද්වෙ භික්ඛූ සහායකා ආයස්මතො මහාකප්පිනස්ස සද්ධිවිහාරිනො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. අද්දසා ඛො භගවා තෙ භික්ඛූ දූරතොව ආගච්ඡන්තෙ දිස්වාන භික්ඛූ ආමන්තෙසි: පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, එතෙ ද්වෙ භික්ඛූ[3] සහායකෙ ආගච්ඡන්තෙ මහාකප්පිනස්ස සද්ධිවිහාරිනොති? එවං භන්තෙ.

එතෙ ඛො භික්ඛවෙ, භික්ඛූ මහිද්ධිකා මහානුභාවා, න ච සා සමාපත්ති සුලභරූපා තෙහි භික්ඛූහි අසමාපන්නපුබ්බා. යස්ස චත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

---

1. ඔදාතකං - මජසං, PTS  2. අහොරත්තිං - සී 1, 2. මජසං, PTS.
3. එතෙ භික්ඛූ - මජසං

## 9. 1. 11.

### මහාකප්පින සූත්‍රය

405. **සැවැත්නුවර**-

එකල්හි ආයුෂ්මත් **මහාකප්පින** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. භාග්‍යවතුන් වහන්සේ එන්නා වූ ආයුෂ්මත් මහාකප්පින තෙරුන් දුර දී ම දුටු සේක. 'දක භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, තෙපි එන්නා වූ සුදු සිහින් උස් නැහැයක් ඇති මෙල මහණහු දකිවු ද? වහන්ස, එසේ ය.

මහණෙනි, මෙල මහණ තෙමේ මහත් සෘද්ධි ඇත්තෙකි. මහත් ආනුභාව ඇත්තෙකි. ඒ මහණහු විසින් යම් සමවතක් නො සමවත් විරූ නම් එබදු සමවතක් නො ම සුලබ ය. කුලපුත්‍රයෝ යමක් පිණිස මැනවින් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණෙත් නම් මගබඹසර අවසන් කොට ඇති අනුත්තර වූ ඒ අභීත්භවය මේ අත්බැව්හි ම තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට පැමිණ වෙසේ ය යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෲන් වහන්සේ මෙය වදරා වැලි මෙය ද වදාළ සේක:

යම් කෙනෙක් ගෝත්‍රය ප්‍රතිඥා කෙරෙත් නම් මේ ප්‍රජාව කෙරෙහි ක්ෂත්‍රියයා ශ්‍රේෂ්ඨ ය. අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් සමන්විත වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දෙව්මිනිසුන් කෙරෙහි ශ්‍රේෂ්ඨහ.

හිරු දහවල් බබලයි. සඳු රෑ බබල යි. ක්ෂත්‍රිය තෙමේ සන්නාහ සන්නද්ධ වූයේ බබලයි. රහත් බමුණු තෙමේ ධ්‍යාන කරන්නේ බබලයි. වැලි, බුදුරජාණන් වහන්සේ මුළු රෑ දවල් තෙදින් බබලති යි.

## 9. 1. 12.

### සහායක සූත්‍රය

406. **සැවැත්නුවර**-

එකල්හි ආයුෂ්මත් **මහාකප්පින** තෙරුන්ගේ සද්ධිවිහාරික වූ යහළු භික්ෂූහු දෙනමක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. භාග්‍යවතුන් වහන්සේ එන්නා වූ ඔවුන් දුරදී ම දුටු සේක. දක භික්ෂූන් ඇමැතූ සේක: මහණෙනි, තෙපි මහාකප්පිනගේ සද්ධිවිහාරික වූ මෙල එන යහළු භික්ෂූන් දෙනම දකිවු ද? වහන්ස, එසේ ය.

මහණෙනි, මෙල භික්ෂූහු මහත් සෘද්ධි ඇතියහ. මහත් ආනුභාව ඇතියහ. ඒ භික්ෂූන් විසින් යම් සමවතක් නො සමවත් විරූ නම් එවැනි සමවතක් නො ම සුලබ ය. කුලපුත්‍රයෝ යමක් පිණිස මැනවින් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණෙද්ද, මගබඹසර අවසන් කොට ඇති අනුත්තර වූ ඒ අභීත්භවය මේ අත්බැව්හි ම තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට පැමිණ වෙසෙති යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෲන් වහන්සේ මෙය වදරා වැලි මෙය ද වදාළ සේක:

සහායා වතිමෙ භික්ඛූ චිරරත්තං සමෙතිකා,[1]
සමෙති තෙසං සද්ධම්මො ධම්මෙ බුද්ධප්පවෙදිතෙ.

සුවිනීතා කප්පිනෙන ධම්මෙ අරියප්පවෙදිතෙ,
ධාරෙන්ති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනින්ති.

**වග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

කොලිතො සාරිපුත්තො[2] ඝටො චාපි පවුච්චති,
නවො සුජාතො භද්දී ච විසාඛො නන්දො තිස්සො ච,
ථෙරනාමො ච කප්පිතො සහායා චාපි ද්වාදසාති.*

**භික්ඛුසංයුත්තං සමත්තං.**

**නිදානවග්ගස්ස සංයුත්තුද්දානං:**

අභිසමයො ධාතු ච අනමතග්ගෙන කස්සපො,
ලාභසක්කාරරාහුල ලක්ඛණොපම්මභික්ඛුහි,
නිදානවග්ගො දුතියො පූරිතොති පවුච්චතීති.*

**නිදානවග්ගො නිට්ඨිතො.**[3]

1. සමෙතිකා - ස්‍යා. සමාහිතා - සී.
2. උපතිස්සො ච - මජසං, ස්‍යා.

* උද්දානගාථායො පන ස්‍යාමම්මරම්ම සීහල පොත්ථකෙසු විසදිසාව දිස්සන්ති.

3. දිස්සන්තෙයං අතිරෙක ගාථා - සී 1, 2 -
"දසබල සෙලප්පභවා නිබ්බාණමහාසමුද්දපරියන්තා,
අට්ඨඞ්ගමග්ගසලිලා ජිනවචනනදී චිරං වහතූ"ති

මේ යහලු භික්ෂූහු දිගුකලක් සමෙතිකා (මනා යේ සැසඳීම් වසයෙන් සම වූ සම්මාදිට්ඨි ආදි ලබ්ධි) ඇතියෝ ම ය. (එහෙයින් ම දූත්) බුදුරජුන් විසින් පැවසූ ධර්මයෙහි ඔවුන්ගේ ප්‍රතිපත්ශාසන ධර්මය සම වේ. (හොබනේ වේ.)

ආංශී බුදුරජුන් දෙසූ ධර්මයෙහි **කප්පින** විසින් මැනැවින් හික්මවන ලද ඔහු ශේනා සහිත මරු දිනා අවසන් සිරුර දරත්.

**පළමුවන වර්ගය යි.**

# ගාථාදිපාදානුක්කමණිකා


| | පිට්ඨඞ්කා |
|---|---|
| අනිච්චා වත සඞ්ඛාරා | 296 |
| අයඤ්ච දහරො භික්ඛු | 428 |
| එකස්සෙකෙන කප්පෙන | 286 |
| එවමෙව මනුස්සෙසු | 430 |
| එවං කුසීතමාගම්ම | 246 |
| කදාහං නන්දං පස්සෙය්‍යං | 434 |
| කින්නු කුජ්ඣසි මා කුජ්ඣි | 438 |
| කූපෙ නිමුග්ගො හි සො පාරදාරිකො | 404 |
| ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං | 438 |
| තං ඛායිතං සාතතිකං | 352 |
| දිවා තපති ආදිච්චො | 438 |
| න භාසමානං ජානන්ති | 432 |
| නයිදං සිථිලමාරබ්භ | 428 |
| පච්චයෙකාදස වුත්තා | 200 |
| පරිවීමංසනුපාදානං | 146 |
| පවිවිත්තෙහි අරියෙහි | 246 |
| පාචීනවංසො තිවරානං | 296 |
| ඵලං වෙ කදලිං හන්ති | 368 |
| භාසයෙ ජොතයෙ ධම්මං | 432 |
| යතො ච අරියසච්චානි | 286 |
| යස්ස සක්කරියමානස්ස | 352 |
| යෙ ච සඞ්ඛාතධම්මාසෙ | 74, 76, 78 |
| සංසග්ගා වනථො ජාතො | 246 |
| සබ්බාභිභුං සබ්බවිදුං සුමෙධං | 436 |
| සහායා වතිමෙ භික්ඛූ | 440 |
| සාරිපුත්තො ච පඤ්ඤාය | 426 |
| සුවිනීතා කප්පිනෙන | 440 |
| සො ඛො පන්තායං අක්ඛාතො | 286 |
| සොභති වතායං භික්ඛු | 430 |
| හංසා කොඤ්චා මයූරා ච | 430 |

# සඤ්ඤානාමානුක්කමණිකා


| | පිට්ඨඞ්කො |
|---|---|
| අචිරවතී | 214 |
| අචේලකස්සප | 30, 34 |
| අජාතසත්තු | 368, 414 |
| අනාථපිණ්ඩික | 2, 106, 126, 148, 200, 212, 264, 276, 288, 326, 344, 374, 382, 406, 422 |
| අනුරුද්ධ | 242 |
| ආණක | 412 |
| ආනන්ද | 54, 60, 144, 168, 180, 188, 242, 310, 326, 330, 332, 364 |
| ආභිඤ්ජික | 310 |
| ඉසිපතන | 176, 300, 336 |
| උපවාණ | 64, 72 |
| උපාලි | 242 |
| උප්පලවණ්ණා | 360 |
| කකුසන්ධ | 16, 18, 294 |
| කච්චාන | 28, 238 |
| කම්මාසදම්ම | 142, 166 |
| කලන්දකනිවාප | 30, 54, 284, 308, 330, 368, 424, 434 |
| කස්සප | 16, 18, 32, 294, 298, 308, 320, 322, 324, 398, 402, 404 |
| කළාරඛත්තිය | 78, 86 |
| කාලිඞ්ග | 400 |
| කුරු | 144, 160, 166 |
| කූටාගාරසාලා | 414, 432 |
| කොනාගමන | 16, 18, 294 |
| කොසම්බි | 18 |
| ඛුජ්ජුත්තරා | 360 |
| ඛෙමා | 360 |
| ගඞ්ගා නදී | 184 |
| ගිජ්ඣකූට | 242, 284, 286, 292, 366, 390, 396, 398, 402 |
| ගිඤ්ජකාවසථ | 114, 238 |

| | පිට්ඨඞ්කො |
|---|---|
| ගොතම | 30, 32, 284, 358 |
| ඝොසිතාරාම | 180 |
| චිත්ත | 358 |
| ජම්බුදීප | 276 |
| ජාණුස්සොණි | 118 |
| ජෙතවන | 2, 126, 148, 200, 212, 264, 276, 288, 326, 344, 374, 382, 406, 422 |
| ඤාතික | 114, 238 |
| තිම්බරුක පරිබ්බාජක | 36 |
| තිවර | 294 |
| තිස්ස | 294, 434 |
| ථුල්ලතිස්සා | 328, 330 |
| ථුල්ලනන්දා | 332, 336 |
| ථෙර | 434 |
| දක්ඛිණාගිරි | 330 |
| දසාරහ | 412 |
| දෙවදත්ත | 242, 366, 368 |
| නන්ද | 432 |
| නාරද | 180, 184 |
| පාචීනවංස | 294 |
| පුණ්ණ මන්තානිපුත්ත | 242 |
| බහුපුත්තචෙතිය | 334 |
| බාරාණසී | 176, 300, 336 |
| භණ්ඩ | 310 |
| භාරද්වාජ | 294 |
| භිය්‍යස | 294 |
| භූමිජ | 58 |
| මගධ | 286 |
| මහාකච්චායන | 28 |
| මහාකප්පින | 438 |
| මහාකස්සප | 242, 300, 308, 310, 314, 318, 326, 336 |

| | පිටඅංකය |
|---|---|
| මහාකොට්ඨිත | 176 |
| මහාමොග්ගල්ලාන | 242, 390, 422 |
| මහාවන | 414 |
| මාගධ | 414 |
| මූසිල | 180 |
| මොග්ගල්ලාන | 424 |
| මොළියඵග්ගුණ | 22, 78 |
| රාජගහ | 30, 52, 242, 284, 286, 288, 308, 310, 330, 366, 368, 390, 392, 394, 396, 398, 400, 424, 434 |
| රාහුල | 290, 292, 382, 386, 394 |
| රොහිතස්ස | 294 |
| ලක්ඛණ | 390 |
| ලකුණ්ටකභද්දිය | 430 |
| ලොකායතික බ්‍රාහ්මණ | 118 |
| වඞ්කක | 294 |
| විධුර | 294 |
| විපස්සී | 8, 12, 14, 18 |
| විසාඛපඤ්චාලිපුත්ත | 432 |
| වෙදෙහමුනි | 328, 332 |
| වෙදෙහිපුත්ත | 414 |
| වෙපුල්ලපබ්බත | 286, 294 |
| වෙරම්බ | 350 |
| වෙසාලි | 414, 432 |
| වෙස්සභූ | 14, 18 |

| | පිටඅංකය |
|---|---|
| වෙළුවන | 30, 54, 284, 308, 330, 368, 390, 424, 434 |
| සරභූ | 214 |
| සවිට්ඨ | 180, 184 |
| සාරිපුත්ත | 52, 58, 72, 78, 80, 86, 88, 176, 242, 296, 300, 336, 358, 424 |
| සාවත්ථි | 2, 4, 8, 20, 22, 24, 28, 36, 44, 46, 58, 64, 68, 70, 98, 100, 102, 104, 112, 114, 116, 118, 120, 122, 126, 134, 138, 140, 142, 148, 152, 162, 200, 202, 212, 216, 222, 226, 228, 234, 244, 246, 248, 254, 258, 260, 262, 264, 266, 268, 270, 272, 274, 276, 278, 280, 282, 284, 288, 314, 318, 338, 344, 346, 348, 352, 354, 360, 364, 374, 380, 382, 386, 406, 408, 410, 412, 414, 416, 420, 422, 424, 428, 430, 432, 436 |
| සිඛී | 14, 18 |
| සුජාත | 430 |
| සුත්තර | 294 |
| සුප්පිය | 294 |
| සුඵස්ස | 294 |
| සුසීම | 188, 194 |
| හාරිත | 400 |
| හිමවන්තු | 426 |

# පදානුක්කමණිකා


| අ | පිට්ඨඞ්කා |
| --- | --- |
| අකද්දමං | 416 |
| අකම්මාසෙහි | 108 |
| අකසිරලාභී | 428 |
| අකායූපගො | 40 |
| අකාලිකො | 108, 304 |
| අකිච්ඡලාභී | 428 |
| අකුප්පා චෙතොවිමුත්ති | 266, 364 |
| අකුසලමූලා | 406 |
| අකුසලසඤ්ඤං | 236 |
| අක්කොධනො පුරිසපුග්ගලො | 316 |
| අක්ඛමං | 314 |
| අක්ඛාතො | 286 |
| අක්ඛීනි අඤ්ජිත්වා | 432 |
| අඛණ්ඩෙහි | 108 |
| අගපිතා | 416 |
| අගධිතො | 298 |
| අගරුකතා | 188 |
| අගාරං අජ්ඣාවසතා | 332 |
| අගාරවා විහරන්ති අප්පතිස්සා | 340 |
| අගාරස්මා අනගාරියං | 332 |
| අගාරියභූතස්ස | 332 |
| අග්ගං භද්දයුගං | 294 |
| අග්ගමක්ඛෙසි | 400 |
| අග්ගස්ස පත්ති | 46 |
| අග්ගිනා ඩය්හෙය්‍ය | 138, 146 |
| අඞ්ගාරකටාහෙන | 400 |
| අඞ්ගාරකාසු | 156 |
| අචරි බ්‍රහ්මචරියං | 38 |
| අචිරපක්කන්තෙ දෙවදත්තෙ | 366 |
| අචිරවතී | 214 |
| අචිරූපසම්පන්නො | 34 |
| අච්චයතො පතිගණ්හාතු | 198 |
| අච්චයෙන | 34 |
| අච්චයො මං භන්තෙ අච්චගමා | 198 |
| අච්චාවදන්තෙ | 310 |
| අච්ඡං පත්තං | 432 |
| අච්ඡරියං වත භො | 390 |
| අච්ඡාදෙත්වා | 332 |
| අච්ඡිද්දෙහි | 108 |
| අච්ඡිද්දෙ | 280 |
| අජාතං සතං අජහුතාතං | 290 |

| අ | පිට්ඨඞ්කා |
| --- | --- |
| අජානඤ්ඤෙව වදෙය්‍ය ජානාමීති | 334 |
| අජානතා | 204 |
| අජ්ජතග්ගෙ | 284 |
| අජ්ඣගමං | 266 |
| අජ්ඣත්තං | 42, 194, 322, 422 |
| අජ්ඣත්තං කණ්ටකම්පි භවිස්සති | 42 |
| අජ්ඣත්තං වා බහිද්ධා වා | 386, 388 |
| අජ්ඣත්තවිමොක්ඛා | 84 |
| අජ්ඣාවසතා | 332 |
| අජ්ඣාවුත්ථං | 164 |
| අජ්ඣොකාසගතො | 350 |
| අජ්ඣොසිතං | 148 |
| අජ්ඣොහරි | 418 |
| අඤ්ජලිකරණීයො | 108 |
| අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉති වා | 94, 98 |
| අඤ්ඤතරො බ්‍රාහ්මණො | 284 |
| අඤ්ඤතරෙ භික්ඛූ | 282 |
| අඤ්ඤත්‍ර අනුස්සවා | 180 |
| අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා | 180 |
| අඤ්ඤත්‍ර කල්‍යාණා | 186 |
| අඤ්ඤතිත්ථියපුබ්බා | 34 |
| අඤ්ඤතිත්ථියසමණබ්‍රාහ්මණ පරිබ්බාජකානං | 220 |
| අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා | 52, 188 |
| අඤ්ඤතිත්ථියපුබ්බො | 332 |
| අඤ්ඤත්‍ර කුසලා | 186 |
| අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා | 180 |
| අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්ති | 54, 64 |
| අඤ්ඤත්‍ර රුචියා | 180 |
| අඤ්ඤත්‍ර සද්ධාය | 180 |
| අඤ්ඤමඤ්ඤං | 180, 310 |
| අඤ්ඤමඤ්ඤෙහි | 84, 86, 88 |
| අඤ්ඤා | 334 |
| අඤ්ඤා චිත්තං | 412 |
| අඤ්ඤාණා | 144 |
| අඤ්ඤා බ්‍යාකතා | 18, 80, 84. 190 |
| අඤ්ඤා වෙදනා අඤ්ඤො වෙදියති | 36 |
| අඤ්ඤාය සණ්ඨහිංසු | 340 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අඤ්ඤෙ සඞ්ඛාරා අඤ්ඤස්ස ච පනිමෙ සඞ්ඛාරා ඉති වා | 98 |
| අඤ්ඤො කරොති අඤ්ඤො පටිසංවෙදයති | 34, 116 |
| අඤ්ඤො භවො අඤ්ඤස්ස ච පනායං භවො ඉති වා | 98 |
| අට්ටස්සරං | 16, 402 |
| අට්ඨපුරිසපුග්ගලා | 108 |
| අට්ඨි | 46 |
| අට්ඨිං ඡින්දති | 362 |
| අට්ඨිකත්වා | 334 |
| අට්ඨිසඞ්ඛලිකං | 390 |
| අට්ඨිපුඤ්ජො | 286 |
| අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨති | 362 |
| අට්ඨිරාසි | 286 |
| අට්ඨිසඤ්චයො | 286 |
| අඩ්ඪට්ඨරතනං | 330, 336 |
| අණ්ඩෙ ඛණ්ඩෙ ආරොපෙත්වා | 396 |
| අණ්ඩෙසු නිසීදති | 396 |
| අතික්කන්තමානුසකාය | 190, 196, 322,326 |
| අතික්කන්තමානුසකෙන | 192 |
| අතික්කන්තා | 282, 284 |
| අතික්කම්මරූපෙ ආරුප්පා | 198 |
| අතිවාරිණී | 398 |
| අතිප්පගො ඛො තාව | 52 |
| අතිමඤ්ඤති | 348 |
| අතිවෙලං | 414, 416, 418 |
| අතීතමද්ධානං | 42, 170 |
| අතීතම්පි අද්ධානං | 244 |
| අතීතානාගත පච්චුප්පන්නං | 194, 386, 388 |
| අත්තතො අද්දක්ඛුං | 170 |
| අත්තතො උපගච්ඡෙය්‍ය | 148 |
| අත්තත්ථං | 46 |
| අත්තභාවපටිලාභං | 396, 400, 404, 418 |
| අත්තමනා | 4 |
| අත්තමනො හොති සුමනො | 304 |
| අත්තවධාය | 366 |
| අත්තවාදුපාදානං | 6 |
| අත්ථගමං | 362 |
| අත්ථගාමා | 322 |
| අත්ථඞ්ගමො | 272 |
| අත්ථවසෙ සම්පස්සමානො | 310 |
| අත්ථසංහිතො | 116 |
| අත්ථස්ස විඤ්ඤාපනියා | 432 |
| අත්ථි ඛො කස්සප දුක්ඛං | 30 |
| අත්ථිතඤ්චෙව නත්ථිතඤ්ච | 28 |
| අත්ථි තණ්හා | 158 |
| අත්ථි නන්දි | 158 |
| අත්ථිතා | 28 |
| අදරං | 162 |
| අදින්නාදානා පටිවිරතා | 258, 260 |
| අදින්නාදායිනො අදින්නාදායීහි සද්ධිං | 258, 260 |
| අදුක්ඛමසුඛං | 130, 322 |
| අදුක්ඛමසුඛවෙදනීයං | 152 |
| අදුක්ඛමසුඛා වෙදනා | 82 |
| අද්ධානමග්ගපටිපන්නා | 334 |
| අධිකරණං තං න හොති | 62 |
| අධිගතො ඛො ම්‍යායං මග්ගො බොධාය | 164 |
| අධිගමාය | 300 |
| අධිච්චසමුප්පන්නං දුක්ඛන්ති | 32, 36, 52, 176 |
| අධිමුච්චථ | 132 |
| අධොගමානි | 138, 144 |
| අනගාරියං | 34, 332 |
| අනජ්ඣාපන්නා | 298, 416 |
| අනජ්ඣොසිතානි පජානාති | 130 |
| අනඤ්ඤථා | 40 |
| අනත්ථාය සංවත්තෙය්‍යුං | 300 |
| අනත්තමනවාචං | 328 |
| අනධිගතස්ස අධිගමාය | 46 |
| අනන්තරධානාය | 342 |
| අනනුස්සුතෙසු ධම්මෙසු | 12, 14 |
| අනපචිතා | 188 |
| අනපෙඛො | 434 |
| අනභාවකතානි | 96, 98 |
| අනභාවකතො | 138, 146 |
| අනභාවං ගමෙති | 236 |
| අනභිජ්ඣාලූතො | 260 |
| අනභිනන්දිතානි | 130 |
| අනභිසඞ්ඛරෙන්තො | 130 |
| අනභිසම්බුද්ධස්ස | 8, 14, 16, 26, 162 |

අ — පිට්ඨඞ්කා

අනඤ්ඤසෙධුතගතෙනා 130
අනමතග්ගො 276, 278, 280, 282, 284, 286, 288
අනමතග්ගොයං සංසාරො 290
අනයබ්‍යසනං 350
අනයං ආපන්නා 346
අනයව්‍යසනං 336
අනවකඞ්ඛන්තා දුක්ඛෙන 270
අනවකඞ්ඛන්තා සුඛෙන 270
අනාගතමද්ධානං 170, 412, 414
අනාගතම්පි අද්ධානං 244
අනාතාපී අනොත්තාපී 300
අනාසවං 326, 330
අනාහාරො 136
අනිච්චං භණෙන 42, 374
අනිච්චා 4, 82, 264
අනිච්චාති පජානාති 130
අනිච්චො 42
අනිත්තිණ්ණො 154
අනිදූතං 236
අනිස්සිතාය 432
අනුකම්පං උපාදාය 304
අනුග්ගහාය 20, 22, 152
අනුග්ගහිතො 422
අනුට්ඨිතා 408, 410
අනුත්තරං 264
අනුත්තරස්ස [illegible]00, 344
අනුත්තරො පුරිසදම්මසාරථි 108
අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස 108
අනුද්දයං පටිච්ච 304
අනුද්ධංසෙති 350
අනුධම්මචාරී 126, 128
අනුපගම්ම 34
අනුපට්ඨිතාය සතියා 350
අනුපතිත්වා අනුපතිත්වා 392, 398, 400
අනුපතාහී පුරිසපුග්ගලොති 316
අනුපතිසං 46
අනුපවාදකා 326
අනුපහතො 346
අනුපහාරා 136
අනුපාදාය ආසවෙහි 288, 290
අනුපාද විමුත්තො හොති 30, 76, 180, 388

අ — පිට්ඨඞ්කා

අනුපාදියං න පරිතස්සති 130
අනුපාපුණාති 360
අනුපායාසං 162, 238
අනුප්පන්නා 302
අනුප්පාදධම්මා 96
අනුප්පාදධම්මාති 98
අනුප්පාද වා තථාගතානං 40
අනුපුබ්බවිහාරසමාපත්තීනං 336
අනුමොදි 86
අනුයාතං 164
අනුයාතො 166
අනුසයං 388
අනුසාසනිං 310
අනුසික්ඛමානා 416
අනුසෙති 102
අනුස්සරති 324
අනෙකපරියායෙන 34, 426
අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොථ 19, 192, 196
අනෙකෙපි සංවට්ටකප්පෙ 192
අනෙලගලාය 432
අනෙසනං 298
අනොත්තාපී පුරිසපුග්ගලොති 300, 314
අනොත්තාපිනො අනොත්තාපීහි 246, 258
අන්තගුණම්පි 418
අන්තම්පි 418
අන්තමසො 136, 146, 408
අන්තරසරං 32
අන්තරධානං 4, 66, 68, 340
අන්තරධායමානෙ 340
අන්තරධායිස්සති 296
අන්තරහිතො 294, 424
අන්තරායාය 364
අන්තරායිකො 344, 364
අන්තරාසම්මසතං සම්මසථ 166
අන්තරෙ වාලිකා 284
අන්ධකාරං 234
අබ්බයෙ කණ්ණං 90, 92
අපකස්ස චිත්තං 302
අපකස්සෙව කායං 302
අපචයොපි 148
අපචිතො 188

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අපයන්තියො | 186 |
| අපයන්තො | 186 |
| අපයාපෙන්ති | 186 |
| අපරන්තං වා උපධාවිස්සති | 42 |
| අපරංකාරං | 32, 36, 52, 176 |
| අපරඤ්ච අපකඩ්ඪෙය්‍ය | 180 |
| අපරප්පච්චයා | 28, 120, 122 |
| අපරාපපතෙය්‍ය | 180 |
| අපරාමට්ඨෙහි | 108 |
| අපරික්ඛීණා | 38 |
| අපරිතස්සං | 130 |
| අපරිමුත්තො දුක්ඛස්මා | 272 |
| අපරියාදින්නා | 276 |
| අපරිසුද්ධා ධම්මදෙසනා | 304 |
| අපරිහාතමෙතං | 316 |
| අපරිළාහං | 238 |
| අපසාදෙතබ්බං | 330 |
| අපස්සඤ්ඤෙව වදෙය්‍ය පස්සාමීති | 334 |
| අපස්සතා | 204 |
| අපාපුණිත්වා | 46 |
| අපායං | 144, 192 |
| අපුඤ්ඤං | 130 |
| අපුඤ්ඤාභිසඞ්ඛාරං | 130 |
| අපුඤ්ඤූපගං | 130 |
| අපූජිතො | 188 |
| අප්පං වා භිය්‍යො | 296 |
| අප්පකා | 406 |
| අප්පගබ්භා | 306 |
| අප්පටිවෙධා | 144 |
| අප්පතිස්සා | 340 |
| අප්පදක්ඛිණග්ගාහිනො | 310 |
| අප්පටිසඞ්ඛා වාචා | 332 |
| අප්පටිසංවිදිතං | 86 |
| අප්පටිවානී | 208 |
| අප්පතිට්ඨිතං විඤ්ඤාණං අවිරූළ්හං | 162 |
| අප්පතිරූපං | 298 |
| අප්පත්තමානසං | 348, 360 |
| අප්පත්තස්ස පත්තියා | 46 |
| අප්පතරන්ති | 340 |
| අප්පසුඤ්ඤ | 348 |
| අප්පමත්තකො | 212 |
| අප්පමත්තා | 406, 414 |
| අප්පමත්තිකා | 220 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අප්පමත්තො | 34 |
| අප්පමාදෙ | 200 |
| අප්පස්සුතා අප්පස්සුතෙහි | 246 |
| අප්පගීතා | 36 |
| අප්පගීයමානා | 300 |
| අප්පිච්ඡතාය | 308 |
| අප්පිච්ඡා | 308 |
| අප්පිත්තිකානි | 408 |
| අප්පෙසක්ඛා | 348 |
| අප්පොස්සුක්කා | 428 |
| අබහුලීකතා | 408 |
| අබ්‍යාකතං ඛො එතං | 336 |
| අබ්‍යාපන්නචිත්තා | 260 |
| අබ්භඤ්ඤංසු | 90 |
| අබ්භඤ්ඤාසිං | 116 |
| අබ්භාතීතා | 282, 284 |
| අබ්භුග්ගහෙත්වා | 416 |
| අබ්භුතං වත භො | 390, 402 |
| අබ්භොකාසො පබ්බජ්ජා | 332 |
| අභබ්බා අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය | 300 |
| අභබ්බා නිබ්බානාය | 300 |
| අභබ්බා සම්බොධාය | 300 |
| අභවිස්ස | 270 |
| අභාවිතා | 408 |
| අභික්කන්තං | 34 |
| අභිජාතිස්සන්ති | 90 |
| අභිජ්ඣාලුතො | 260 |
| අභිඤ්ඤා | 70 |
| අභිඤ්ඤාය | 338 |
| අභිඤ්ඤා සච්ඡිකත්වා | 24, 26, 200, 272 |
| අභිනිබ්බත්ති | 4, 272 |
| අභිනිම්මිණෙය්‍ය | 158 |
| අභිභූතො | 346 |
| අභිභවතා | 320 |
| අභිරූපො | 430 |
| අභිසඞ්ඛතං | 100 |
| අභිසඞ්ඛරොන්ති | 62, 130 |
| අභිසඤ්චෙතයිකං | 100 |
| අභිසමෙතාවිනො | 212 |
| අභිසමෙති | 40 |
| අභිසම්බුජ්ඣති | 40 |
| අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං | 264 |
| අභිහරීයති | 368 |
| අභූතෙන අබ්භාචික්ඛෙය්‍යාම | 52, 64 |

අ — පිට්ඨඞ්කා

අභෙජ්ජමානෙ උදකෙ 196
අමතද්වාරං 66, 70, 90, 92, 122, 124
අමනසිකාරා 322
අමනාපසම්පයොගා 278
අමනුස්සෙහි 408
අමහග්ගතං 190
අමහග්ගතං වා චිත්තං 324
අමාතිතා 188
අමුච්ඡිතො 298
අමුත්‍රාසිං 192
අයඤ්චෙව කායො 38
අයං දුක්ඛනිරොධොති 338
අයං දුක්ඛසමුදයොති 338
අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති 338
අයං දුතියො අන්තො 28
අයං නුඛො සත්තො 42
අයං පිතුපිතා 276
අයමන්තිමා ජාති 266
අයං මෙ පිතා 276
අයමෙකො අන්තො 28
අරක්ඛිතාය වාචාය 350
අරක්ඛිතෙන චිත්තෙන 350
අරක්ඛිතෙනෙව කායෙන 350
අරඤ්ඤායතනෙ 416
අරඤ්ඤෙ පවනෙ 148, 164
අරහං 108
අරහත්තං 34
අරියං තුණ්හීභාවං 422
අරියකන්තෙහි සීලෙහි 108
අරියසාවකස්ස 106, 212, 220
අරියස්ස විනයෙ 198
අරියානං උපවාදකා 192
අරියානං අනුපවාදකා 192
අරියො අට්ඨඞ්ගිකො මග්ගො 90, 166
අරියො ඤායො 106, 108
අරියො තුණ්හීභාවො 422
අරියො නිබ්බෙධිකපඤ්ඤො ඉතිපි 124
අරූපභවො 4
අලත්ථ 34
අලද්ධා ච ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං 298
අලද්ධා ච චීවරං 298

අ — පිට්ඨඞ්කා

අලද්ධා ච පිණ්ඩපාතං 298
අලද්ධා ච සෙනාසනං 298
අලමෙව නිබ්බින්දිතුං 276, 278
අලං වචනාය 30, 180, 410
අලං විමුච්චිතුං 276, 278, 282, 284, 286, 288, 290, 296
අලං විරජ්ජිතුං 276, 278, 290, 296
අවක්කන්ති 102, 142, 158
අවඩ්ඪා භවිස්සති 46
අවදන්තං 22, 24
අවසිට්ඨා 212, 216
අවසිස්සතු 46, 426
අවිඝාතං 238
අවිචාරං 322, 422
අවිතක්කං 322, 422
අවිතථතා 40
අවිජ්ජඛගමා 406
අවිජ්ජා 6, 130, 186
අවිජ්ජා උපයන්ති 186
අවිජ්ජාගතො 130
අවිජ්ජාජාතිකා 22, 128
අවිජ්ජාතිස්ස වචනීයං 50
අවිජ්ජාධාතු 240
අවිජ්ජානිදානා 22, 128
අවිජ්ජානිරොධා 18, 66, 68, 90
අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති 14
අවිජ්ජානීවරණානං 276, 278, 284, 288, 292
අවිජ්ජාපච්චයා 2, 4, 8, 22, 40, 62, 66, 94, 96, 98
අවිජ්ජාපච්චයා සඞ්ඛාරා 12, 16, 28, 34, 182
අවිජ්ජාපභවා 22, 128
අවිජ්ජාය 4, 6, 8, 18, 94, 96
අවිජ්ජාය අසති සඞ්ඛාරා න හොන්ති 14, 122
අවිජ්ජාය සති සඞ්ඛාරා හොන්ති 10, 16, 120
අවිජ්ජා විරාගා 130
අවිජ්ජා සමුග්ඝාතා 406

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අවිජ්ජාසමුදයා | 22, 66, 68, 96, 128 |
| අවිජ්ජාසමොසරණා | 406 |
| අවිජ්ජූපනිසා | 50 |
| අවිනිපාතධම්මො | 106, 110 |
| අවිමුත්තං | 190 |
| අවිමුත්තං වා චිත්තං | 324 |
| අවිරූළ්හා | 102 |
| අවිහිංසාච්ඡන්දො | 238 |
| අවිහිංසාධාතුං | 238 |
| අවිහිංසාපරියෙසනා | 238 |
| අවිහිංසාපරිළාහො | 238 |
| අවිහිංසාවිතක්කො | 236 |
| අවිහිංසාසඞ්කප්පො | 238 |
| අවිහිංසාසඤ්ඤා | 238 |
| අවෙච්චප්පසාදෙන | 108 |
| අව්‍යාපාදච්ඡන්දො | 238 |
| අව්‍යාපාදධාතුං | 238 |
| අව්‍යාපාදපරියෙසනා | 238 |
| අව්‍යාපාදපරිළාහො | 238 |
| අව්‍යාපාදවිතක්කො | 236 |
| අව්‍යාපාදසඞ්කප්පො | 238 |
| අව්‍යාපාදසඤ්ඤා | 238 |
| අසංසග්ගෙන | 246 |
| අසංවුතෙහි ඉන්ද්‍රියෙහි | 350 |
| අසංසට්ඨා | 308 |
| අසක්කච්චං දෙන්ති | 306 |
| අසක්කතා | 190 |
| අසක්කාරෙන | 352 |
| අසඞ්ඛාදිතා | 418 |
| අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය | 46 |
| අසජ්ජමානා ගච්ඡථ | 190 |
| අසතිවිච්චකං | 348 |
| අසබලෙහි | 108 |
| අසමාපත්ති | 192 |
| අසමාපන්නපුබ්බා | 430 |
| අසමාහිතං | 190, 260 |
| අසමාහිතා අසමාහිතෙහි | 258 |
| අසමාහිතං වා චිත්තං | 324 |
| අසම්පජානො | 62 |
| අසම්මාසම්බුද්ධෙසු සම්මාසම්බුද්ධාති | 238 |
| අසම්මොසාය | 342 |
| අසහංකාරං | 32, 36, 52, 176 |
| අසිලොමං පුරිසං | 394 |
| අසීසකං | 400 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අසුසිරො | 280 |
| අසෙසවිරාගනිරොධා | 4, 6, 8, 34, 58, 62, 96, 98, 112 |
| අසමා ලොකා | 284 |
| අස්සතරී | 368 |
| අස්සද්ධා අස්සද්ධෙහි | 246, 258 |
| අස්සද්ධො පුරිසපුග්ගලො | 314 |
| අස්සාදඤ්ච අස්සාදතො | 266, 360 |
| අස්සාදං | 272, 274, 360 |
| අස්සාදපරියෙසනං | 266 |
| අස්සාදානුපස්සිනො | 134, 144 |
| අස්සාදෙති | 344 |
| අස්සුතවා | 142 |
| අස්සුති පවත්තයමානො | 434 |
| අහං නු ඛොස්මි | 42 |
| අහං වා | 310 |
| අහංකාරමමංකාර මානානුසයා | 386, 388, 424 |
| අහිතාය | 174 |
| අහිරිකා අහිරිකෙහි | 246, 258 |
| අහිරිකො පුරිසපුග්ගලොති | 314 |
| අහු පඤ්ඤාය අභිසමයො | 8, 13, 14, 16, 18, 162, 164 |
| අහොසිං නු ඛො අහං අතීතමද්ධානං | 40 |
| **ආ** | |
| ආකඞ්ඛති | 34 |
| ආකඞ්ඛාමි | 320, 322 |
| ආකඞ්ඛමානො | 34, 106, 426 |
| ආකාසධාතු | 380 |
| ආකාසානඤ්චායතනං | 322 |
| ආකාසානඤ්චායතනධාතු | 234 |
| ආකාසෙ පාණිං චාලෙසි | 304 |
| ආකාසෙපි පල්ලඞ්කෙන කමථ | 190 |
| ආකිඤ්චඤ්ඤායතනං | 322 |
| ආකිඤ්චඤ්ඤායතනධාතු | 234 |
| ආකිණ්ණමනුස්සං | 166 |
| ආකොටිතපච්චාකොටිතානි | 432 |
| ආගතිගති | 104 |
| ආගතො ඉමං සද්ධම්මං ඉතිපි | 124 |
| ආගුචාරිං | 156 |
| ආචයොපි | 148 |
| ආචික්ඛති | 240 |
| ආණිං ඔදහිංසු | 412 |
| ආණිසඞ්ඝාටො | 412 |

ආ — පිට්ඨඞ්කා

ආතප්පං 208, 300
ආතාපිනො 34, 414
ආතාපී 302, 374
ආතාපී ච ඔත්තාපී ච 300
ආදුතම්පි 148
ආදිකෙනෙව 340
ආදිත්තං 236
ආදිත්තො 402
ආදිත්තො සන්තො 36
ආදිකෙනෙව ඔපිලවති 340
ආදිත්තා 400
ආදිබ්‍රහ්මචරියකො 116
ආදීනවදස්සාවී 298
ආදීනවං 266, 274, 360
ආදීනවදස්සාවිනො 416
ආදීනවපරියෙසනං 266
ආදීනවො 264
ආදීනවානුපස්සිනො 144
ආනෙඤ්ජං 130
ආනෙඤ්ජාභිසඞ්ඛාරං 130
ආනෙඤ්ජූපගං 130
ආපජ්ජෙය්‍යුං 236
ආපන්නා 8
ආපානීයකංසො 170
ආපොධාතු 264, 272, 340, 380
ආපොධාතුයා උප්පාදො 272
ආපොධාතුං අභිනන්දති 272
අපොධාතුං පටිච්ච 264
අපොධාතුයා අස්සාදො 264, 268
ආභාධාතු 234
ආභිචෙතසිකානං 428
ආමිසකිඤ්චික්ඛහෙතුපි 356
ආමිසගතං 344
ආමිසචක්ඛු 344
ආයතනං තං න හොති 62
ආයතනානං 66
ආයතනානං පටිලාභො 4
ආයතිං අනුප්පාදධම්මො 146
ආයතිං ජාතිජරාමරණං 162
ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති 162
ආයතිං සංවරාය 198
ආයසං නගරං 282
ආයාචමානා ආයාචෙය්‍ය 258
ආයාමේන යොජනං 212, 280, 288
ආයුප්පමාණං 294

ආ — පිට්ඨඞ්කා

ආයුසඞ්ඛාරා 412
ආරකා චෙතනා 156
ආරකා පණිධි 156
ආරකා පත්ථනා 156
ආරඤ්ඤකත්තස්ස 308
ආරඤ්ඤකො 434
ආරද්ධචිත්තා 34
ආරද්ධවිරියා ආරද්ධවිරියෙහි 248
ආරද්ධවිරියෙ 308, 426
ආරද්ධවිරියො පුරිසපුග්ගලොති 316
ආරම්මණං 414
ආරාමසම්පන්නං 164
ආරොග්‍යතො අද්දක්ඛුං 170
ආරොපෙත්වා 212
ආරොහපරිණාහෙන 314
ආලොකො උදපාදි 12, 14, 16, 18, 164
ආවිභාවං 196
ආසනං ඨානං 44
ආසවා 84
ආසවානං ඛයා 46, 330
ආහච්ච 124
ආහාරං ආහාරෙසුං 154
ආහාරසම්භවස්ස 74, 76
ආහාරෙති 22
ආහාරෙ 22
ආහුනෙය්‍යො 108

ඉ

ඉක්ඛණිකා 398
ඉතරීතරගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරසන්තුට්ඨියා 298
ඉතරීතරෙන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරෙන 298
ඉතරීතරෙන චීවරෙන 298
ඉතරීතරචීවර සන්තුට්ඨියා ච 298
ඉතරීතරෙන පිණ්ඩපාතෙන 298
ඉතරීතර පිණ්ඩපාත-සන්තුට්ඨියා ච 298
ඉතරීතරෙන සෙනාසනෙන 298
ඉතරීතරසෙනාසන-සන්තුට්ඨියා ච 298
ඉති රූපං 44
ඉති රූපස්ස අත්ථඞ්ගමො 44
ඉති රූපස්ස සමුදයො 44

| ඉ | පිට්ඨඞ්කා |
|---|---|
| ඉති විඤ්ඤාණං | 44 |
| ඉති විඤ්ඤාණස්ස අත්ථංගමො | 44 |
| ඉති විඤ්ඤාණස්ස සමුදයො | 44 |
| ඉති වෙදනා | 44 |
| ඉති වෙදනාය අත්ථංගමො | 44 |
| ඉති වෙදනාය සමුදයො | 44 |
| ඉති සඞ්ඛාරා | 44 |
| ඉති සඞ්ඛාරානං අත්ථංගමො | 44 |
| ඉති සඞ්ඛාරානං සමුදයො | 44 |
| ඉති සඤ්ඤා | 44 |
| ඉති සඤ්ඤාය අත්ථංගමො | 44 |
| ඉති සඤ්ඤාය සමුදයො | 44 |
| ඉතිහිදං අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො | 14 |
| ඉති රූපං වා | 158 |
| ඉදං දුක්ඛන්ති | 338 |
| ඉදප්පච්චයතා | 40 |
| ඉද්ධුපපන්නො | 192 |
| ඉද්ධඤ්චෙව ඵීතඤ්ච | 166 |
| ඉද්ධිවිධං | 190, 196, 324 |
| ඉන්ද්‍රියානං | 4, 66, 68, 88 |
| ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරෙහි | 332 |
| ඉමං ලොකං | 284 |
| ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති | 44, 100, 122 |
| ඉමස්මිං අසති ඉදං න හොති | 44, 100, 122 |
| ඉමස්මිං ධම්මවිනයෙ | 188 |
| ඉමස්මිං යෙව ආසනෙ | 228 |
| ඉමස්මිං සති ඉදං හොති | 44, 100, 120 |
| ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති | 44, 120 |
| ඉස්සාපකතා | 400 |

| උ | |
|---|---|
| උක්කණ්ටකෙන | 350, 418 |
| උග්ගහෙතබ්බං | 412 |
| උච්ඡින්නමූලො | 138, 146 |
| උච්ඡින්නමූලාති | 96, 98 |
| උච්ඡෙදං | 34 |
| උජුපටිපන්නො | 108 |
| උත්තරෙ | 286 |
| උත්තානකුත්තානකො විය ඛායති | 144 |
| උත්තානීකරොති | 40, 240 |
| උත්තානො | 44 |

| උ | පිට්ඨඞ්කා |
|---|---|
| උදකං දදෙය්‍ය | 140 |
| උදකනිස්සිතා | 154 |
| උදකඵුසිතානි | 214 |
| උදකරහදෙ | 344 |
| උදකවාරකො | 186 |
| උදකෙපි අභෙජ්ජමානෙ | 190 |
| උදපානො | 186 |
| උදරෙ පවිසිත්වා උදරතො නික්ඛමන්ති | 396 |
| උද්ධුපං | 164 |
| උද්ධං ඔජං අභිහරන්ති | 138,144 |
| උද්ධරිත්වා | 130 |
| උපකච්ඡේස්සථුං | 156 |
| උපක්කමෙන | 280,282 |
| උපච්ඡෙදෙ | 66 |
| උපට්ඨානං | 368 |
| උපට්ඨානසාලායං | 432 |
| උපට්ඨාපෙස්සන්ති | 412 |
| උපට්ඨිතස්සතිනො උපට්ඨිතස්සතීහි | 248 |
| උපඤ්ඤුතා | 320 |
| උපධිං | 170 |
| උපධිනිධානං | 168 |
| උපධිනිරොධං | 168 |
| උපධිනිරොධසාරුප්පගාමිනී පටිපදා | 168 |
| උපධිසමුදයං | 168 |
| උපනාහී පුරිසපුග්ගලොති | 314 |
| උපනික්ඛිත්තා | 218 |
| උපනික්ඛෙපනමත්තාය | 426 |
| උපනික්ඛිපෙය්‍ය | 216 |
| උපනිධාය | 212 |
| උපනිසා | 46,72 |
| උපනිස්සාය | 416 |
| උපමං කාතුං | 280 |
| උපමායපිධෙකච්චෙ | 178 |
| උපයන්තියො | 1 6 |
| උපයන්තො | 186 |
| උපයාපෙති | 186 |
| උපයාපෙන්තියො | 186 |
| උපවාදිකා | 326 |
| උපවායති | 418 |
| උපරිවෙහාසං ඛිත්තො | 284 |
| උපසම්මාය | 338 |
| උපසම්පජ්ජ | 272,320 |
| උපසම්පදං | 34 |

| උ | පිට්ඨඞ්කා |
|---|---|
| උපසම්පාදෙති | 34 |
| උපස්සුතිං | 116 |
| උපසුස්සතු | 46,426 |
| උපහතො | 346 |
| උපාදානං | 2, 4, 6, 8, 12, 16, 18, 24, 26, 58, 66, 68, 70, 72, 82, 90, 120, 122, 92, 178, 200 |
| උපාදානජාතිකො | 58, 80 |
| උපාදානනිදානො | 58, 80, 128 |
| උපාදානනිරොධා | 130 |
| උපාදානනිරොධා භවනිරොධොති | 12 |
| උපාදානනිරොධො | 4, 58, 112 |
| උපාදානන්තිස්ස වචනීයං | 48, 96 |
| උපාදානපච්චයා | 2, 4, 8, 24, 40, 92, 36, 176, 182 |
| උපාදානප්පභවො | 58, 80, 128 |
| උපාදානසමුදයො | 128 |
| උපාදානීයෙසු | 134, 144 |
| උපාදානුපතිසො | 50 |
| උපාදානෙ ඛො අසති භවො න හොති | 12 |
| උපාදානෙ ඛො සති භවො | 8 |
| උපාදාරූපං | 6 |
| උපාදියති | 24, 130 |
| උපායාසෙහි | 38, 170, 174 |
| උපායුපාදානං | 28 |
| උපායුපාදානාභිනිවෙසවිනිබන්ධො | 28 |
| උපාසකං | 284 |
| උපාසනස්මිං | 414 |
| උපෙක්ඛකො | 322 |
| උපෙක්ඛාසතිපාරිසුද්ධිං | 322 |
| උපෙති | 212 |
| උප්පක්කං | 400 |
| උප්පජ්ජති දිට්ඨි | 238 |
| උප්පජ්ජති විතක්කො | 238 |
| උප්පජ්ජති සඤ්ඤා | 238 |
| උප්පජ්ජමානා | 168, 300 |
| උප්පජ්ජමානෙ | 192 |
| උප්පාදා වා තථාගතානං | 40 |
| උබ්බෙධෙන | 212 |
| උබ්බෙධෙන යොජනං | 280 |
| උබ්භතං | 212 |
| උභයත්ථං | 46 |
| උභයමෙතං එකත්ථං | 98 |
| උභො අන්තෙ අනුපගම්ම | 28, 34 |
| උභො මහානාගා | 426 |
| උම්මුජ්ජනිම්මුජ්ජං | 196 |
| උරබ්භානං සතං උරබ්භභූතානං | 290 |
| උරෙ පවිසිත්වා උදරතො නික්ඛමති | 396 |
| උසීරනාළමත්තම්පි | 138, 146 |
| උස්සූලොමං පුරිසං | 394 |
| උස්සොළ්හි | 208 |
| උස්මා ජායති | 152 |
| ඌරූසු පවිසිත්වා ජඞ්ඝාහි නික්ඛමන්ති | 396 |

| එ | |
|---|---|
| එකං අපකඩ්ඪෙය්‍ය | 180 |
| එකග්ගතො | 280 |
| එකජ්ඣං සංහරෙය්‍ය | 276 |
| එකන්තදුක්ඛා | 273 |
| එකන්තපරිපුණ්ණං | 332 |
| එකන්තපරිසුද්ධං | 332 |
| එකපුග්ගලස්ස | 286 |
| එකපුත්තකො | 154 |
| එකමෙතං | 282 |
| එකම්පි වස්සං තිට්ඨමානො | 148 |
| එකවිහාරස්ස | 434 |
| එකවිහාරී | 434 |
| එකා පපතෙය්‍ය | 180 |
| එකෙන කප්පෙන | 286 |
| එකො අනෙනො | 116 |
| එකො එකස්ස | 358 |
| එකො ගාමං පිණ්ඩාය පවිසාමි | 436 |
| එකො චඞ්කමං අධිට්ඨාමි | 436 |
| එකොදිං කරොති | 422 |
| එකොදිභාවං | 322, 422 |
| එකො පටික්කමාමි | 436 |
| එකොපි හුත්වා බහුධා හොති | 190 |
| එකො රහො නිසීදාමි | 436 |
| එකො හොසි | 196 |
| එතං මම | 374 |
| එත්තකා කප්පා | 284 |
| එත්තකානි කප්පසතානි | 284 |
| එත්තකානි කප්පසහස්සානි | 284 |
| එත්තකානි කප්පසතසහස්සානි | 284 |
| එත්තකානි වස්සානි | 280 |

| එ | පිට්ඨඞ්කා |
|---|---|
| එත්තකානි වස්සසතානි | 280 |
| එත්තකානි වස්සසතසහස්සානි | 280 |
| එත්තකා වාලිකා | 284 |
| එත්තකානි වාලිකාසතානි | 284 |
| එත්තකානි වාලිකාසහස්සානි | 284 |
| එත්තකානි වාලිකාසතසහස්සානි | 284 |
| එවං අද්ධුවා | 294, 296 |
| එවං අනස්සාසිකා | 294, 296 |
| එවං අනිච්චා | 294, 296 |
| එවං ගොත්තො | 192 |
| එවං ජානන්තා | 190 |
| එවං පස්සං | 386 |
| එවංවණ්ණො | 192 |
| එවංවාදී | 186 |
| එවං සික්ඛිතබ්බං | 406 |
| එවං සුඛදුක්ඛපටිසංවෙදී | 192 |
| එවඤ්චින්තෙත්වා | 304 |
| එවන්නාමො | 192 |
| එවමායුපරියන්තො | 192 |
| එවමාහාරො | 192 |
| එවම්මහානුභාවෙ | 190, 196 |
| එවම්මහිද්ධිකෙ | 190, 196 |
| එවරූපං | 288 |
| එවරූපං සද්දස්සති වා | 392 |
| එවරූපොපි නාම යක්ඛො | 390 |
| එවරූපොපි නාම සත්තො | 390 |
| එසෙවන්තො දුක්ඛස්ස | 132 |
| එසො මෙ අත්තා | 148, 374 |
| එසොහමස්මි | 374 |
| එහිපස්සිකො | 108, 304 |
| එහිභික්ඛු | 318 |

| ඔ | |
|---|---|
| ඔකාසං | 32 |
| ඔකාසං කරොති | 30 |
| ඔකිරිණිං | 400 |
| ඔකිලිනිං | 400 |
| ඔකොටිමකං | 430 |
| ඔක්කමණියා ධම්මා | 340 |
| ඔක්කන්ති | 4 |
| ඔක්ඛාසතං | 408 |
| ඔතාරං | 414 |
| ඔත්තප්පං අත්ථි | 314 |
| ඔත්තප්පං නත්ථි | 314 |

| ඔ | පිට්ඨඞ්කා |
|---|---|
| ඔත්තපති | 300 |
| ඔත්තාපී | 302 |
| ඔත්තාපී පුරිසපුග්ගලොති | 316 |
| ඔත්තාපිනො ඔත්තාපීහි සද්ධිං | 248, 258 |
| ඔදහිස්සන්ති | 412 |
| ඔදාතං | 438 |
| ඔපනයිකො | 108, 304 |
| ඔපිලවති | 340 |
| ඔරබ්භිකො | 392 |
| ඔරසො | 336 |
| ඔරොහන්තො | 400, 402 |
| ඔළාරිකං වා සුඛුමං වා | 386, 388 |
| ඔළාරිකෙන විහාරෙන | 428 |
| ඔළාරිකො | 20, 22 |
| ඔලුජ්ජති | 332 |
| ඔලොකෙය්‍ය | 302 |
| ඔවද කස්සප භික්ඛු | 310 |
| ඔහිතසොතො | 334 |

| ක | |
|---|---|
| කඤ්චිදෙව දෙසං | 30 |
| කටසි වඩ්ඪිතා | 276, 292 |
| කටුකවිපාකතරා | 198 |
| කටුකො | 364 |
| කට්ඨවාහන | 134 |
| කට්ඨාතං | 152 |
| කණ්ටකාගහණං | 346 |
| කණ්ඩං | 410 |
| කතං කරණීයං | 34, 78, 130, 188, 374 |
| කතඤ්ඤුතා | 420 |
| කථං නු ඛො අහොසිං අතීතමද්ධානං | 42 |
| කථං නු ඛොස්මි | 42 |
| කථං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං | 42 |
| කථං නු ඛො භන්තෙ ජානතො | 386 |
| කතමන්නුඛො | 212 |
| කතමෙ සඞ්ඛාරා කස්ස ච පනිමෙ සඞ්ඛාරා ඉති වා | 98 |
| කතමො භවො කස්ස ච පනායං භවො ඉති වා | 98 |
| කතවෙදිතා | 420 |
| කතහත්ථා | 410 |

| ක | පිට්ඨඞ්කා |
|---|---|
| කතූපාසනා | 410 |
| කථං පස්සතො | 386 |
| කථං රූපො | 302 |
| කථාසල්ලාපො | 54, 194 |
| කදලි | 368 |
| කන්තාරගතානං | 154 |
| කන්තාරමග්ගං | 154 |
| කන්දන්තානං | 278 |
| කපල්ලානි අවසිස්සෙය්‍යුං | 130 |
| කප්පො | 280, 282 |
| කප්පං තිට්ඨෙය්‍ය | 426 |
| කප්පං සන්ධාවතො | 286 |
| කප්පසතසහස්සං | 282 |
| කබන්ධං | 400 |
| කබලිඞ්කාරො | 20, 22 |
| කබළීකාරො ආහාරො | 152 |
| කමසි | 196 |
| කම්මවාද | 52 |
| කම්මස්ස විපාකාවසෙසෙන | 392, 404 |
| කලං | 212, 220 |
| කලහාගම්පි න උපෙති | 406 |
| කලිඞ්ගරූපධානා | 414 |
| කළෙබරස්ස | 4, 66, 88 |
| කලලං | 22, 24 |
| කල්‍යාණාධිමුත්තිතා | 240 |
| කල්ලං නු තං සමනුපස්සිතුං | 374, 382 |
| කවිකතා | 412 |
| කස්සපසදිසො | 298 |
| කස්සපස්ස සම්මාසම්බුද්ධස්ස | 400 |
| කහං එකපුත්තක | 154 |

කා

| කා | පිට්ඨඞ්කා |
|---|---|
| කාකපෙය්‍යා | 212 |
| කාමං | 46 |
| කාමච්ඡන්දෙ | 236 |
| කාමධාතුං | 236 |
| කාමපරිළාහො | 236 |
| කාමභවො | 4 |
| කාමවිතක්කො | 236 |
| කාමසඞ්කප්පො | 236 |
| කාමුපාදනං | 6 |
| කාමෙසු මිච්ඡාචාරපච්චයා | 106 |
| කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා | 258, 266 |
| කාමෙසු මිච්ඡාචාරයො කාමෙසු මිච්ඡාචාරීහි | 258 |
| කාමෙසු මිච්ඡාචාරී | 106 |
| කායගතාසති | 334 |
| කායදුච්චරිතෙන | 326 |
| කායධාතු | 222 |
| කායබන්ධනං | 400, 402 |
| කායපරියන්තිකං | 130 |
| කායසඞ්ඛාරෙ | 6, 66, 68, 90 |
| කායසොච්චනතාහෙතු | 62 |
| කායසම්ඵස්සජා | 6, 378 |
| කායසම්ඵස්සො | 6, 222, 376 |
| කායවිඤ්ඤාණං | 6, 376 |
| කායවිඤ්ඤාණධාතු | 222 |
| කායසුචරිතං | 192, 326 |
| කායස්මිම්පි නිබ්බින්දති | 374 |
| කායස්ස භෙද | 130, 192 |
| කායායතනං | 6 |
| කායුජ්ජගො | 38 |
| කායෙ | 386 |
| කායෙන ඵුසිත්වා | 186 |
| කායෙන වසං වත්තෙන්ති | 190 |
| කායො | 170, 400, 402 |
| කායො නිච්චො වා අනිච්චො වා | 374 |
| කාරණිකො | 394 |
| කාරු | 46 |
| කාරුඤ්ඤං පටිච්ච | 304 |
| කාලකතා | 294 |
| කාලකිරියා | 4, 66 |
| කාලපක්ඛ | 314 |
| කාවෙය්‍යා | 412 |
| කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා | 332 |

කි

| කි | පිට්ඨඞ්කා |
|---|---|
| කිං නානාකරණං | 38 |
| කිං නු ඛොස්මි | 42 |
| කිං නුඛො අහොසිං අතීතමද්ධානං | 42 |
| කිං හුත්වා කිං අහොසිං නු ඛො අහං අතීතමද්ධානං | 42 |
| කිං පටිච්ච පඤ්ඤායති | 238 |
| කිංවාදී කිමක්ඛායී | 52, 64 |
| කිං සමුදයං | 20, 22, 56, 80, 82, 126, 168 |

කි — පිට්ඨඞ්කා


කිච්ඡං වතායං 8, 16, 162
කිඤ්ජාතිකං 20, 22, 56, 126, 168
කිඤ්ජාතිකා 20, 80
කිත්තාවතා 28, 126, 300
කින්නිදානං 20, 22, 56, 80, 126, 168
කින්නිදානා 80
කින්නිදානො 20
කිමක්ඛායී 52
කිමඞ්ග පන 414
කිම්පච්චයා 8, 22, 24
කිම්පච්චයා උපාදානං 8
කිම්පච්චයා ජරාමරණං 8, 16, 168
කිම්පච්චයා තණ්හා 10
කිම්පච්චයා නාමරූපං 10, 162
කිම්පච්චයා ඵස්සො 10
කිම්පච්චයා විඤ්ඤාණං 10, 162
කිම්පච්චයා වෙදනා 10
කිම්පච්චයා සඞ්ඛාරා 10
කිම්පච්චයා සළායතනං 10
කිම්පභවං 20, 22, 56, 82, 126, 168
කිම්පභවා 20, 80
කිම්පභවො 20
කිම්හි නු ඛො අසති උපාදානං න හොති 12
කිම්හි නු ඛො අසති ජරාමරණං න හොති 12, 164
කිම්හි නු ඛො අසති ජාති න හොති 12
කිම්හි නු ඛො අසති තණ්හා න හොති 12
කිම්හි නු ඛො අසති නාමරූපං න හොති 14
කිම්හි නු ඛො අසති ඵස්සො න හොති 12
කිම්හි නු ඛො අසති භවො න හොති 12
කිම්හි නු ඛො අසති විඤ්ඤාණං න හොති? 14, 164
කිම්හි නු ඛො අසති වෙදනා න හොති 12
කිම්හි නු ඛො අසති සඞ්ඛාරා න හොන්ති 14
කිම්හි නු ඛො අසති සළායතනං න හොති 14
කිම්හි නු ඛො සති උපාදානං හොති 8
කිම්හි නු ඛො සති ජරාමරණං හොති? 16, 162
කිම්හි නු ඛො සති ජාති හොති? 16, 162
කිම්හි නු ඛො සති තණ්හා හොති 16
කිම්හි නු ඛො සති නාමරූපං හොති? 16, 162
කිම්හි නු ඛො සති ඵස්සො හොති 10
කිම්හි නු ඛො සති විඤ්ඤාණං හොති? 16, 162
කිම්හි නු ඛො සති වෙදනා හොනති 10
කිම්හි නු ඛො සති සඞ්ඛාරා හොන්ති 10
කිම්හි නු ඛො සති සළායතනං හොති 10
කිලන්තා 170, 186
කිස්මිං අසති කිං න හොති 122
කිස්මිං අසති උපාදානං න හොති 122
කිස්මිං අසති ජරාමරණං න හොති 122, 168
කිස්මිං අසති ජාති න හොති 122
කිස්මිං අසති තණ්හා න හොති 122
කිස්මිං අසති නාමරූපං න හොති 122
කිස්මිං අසති ඵස්සො න හොති 122
කිස්මිං අසති භවො න හොති 122
කිස්මිං අසති විඤ්ඤාණං න හොති 122
කිස්මිං අසති වෙදනා න හොති 122
කිස්මිං අසති සඞ්ඛාරා න හොන්ති 122
කිස්මිං අසති සළායතනං න හොති 122
කිස්මිං සති උපාදානං හොති 120
කිස්මිං සති කිං හොති 120
කිස්මිං සති ජරාමරණං හොති 120, 168

**කි** පිට්ඨඞ්කා

කිස්මිං සති ජාති හොති 120
කිස්මිං සති තණ්හා හොති 120
කිස්මිං සති නාමරූපං හොති 120
කිස්මිං සති ඵස්සො හොති 120
කිස්මිං සති භවො හොති 120
කිස්මිං සති විඤ්ඤාණං හොති 120
කිස්මිං සති වෙදනා හොති 120
කිස්මිං සති සඞ්ඛාරා හොන්ති 120
කිස්මිං සති සළායතනං හොති 120
කිස්ස නිරොධා උපාදාන නිරොධොති 12
කිස්ස නිරොධා කිං නිරුජ්ඣති 122
කිස්ස නිරොධා ජරාමරණ නිරොධොති 12, 164
කිස්ස නිරොධා ජාති නිරොධොති 12
කිස්ස නිරොධා තණ්හා නිරොධොති 12
කිස්ස නිරොධා නාමරූප නිරොධොති 14, 164
කිස්ස නිරොධා ඵස්ස නිරොධොති 12
කිස්ස නිරොධා භවනිරොධොති 12
කිස්ස නිරොධා විඤ්ඤාණ නිරොධොති 14, 164
කිස්ස නිරොධා වෙදනා නිරොධොති 12
කිස්ස නිරොධා සඞ්ඛාර නිරොධොති 14
කිස්ස නිරොධා සළායතන නිරොධොති 14
කිස්සුප්පාදා කිං උප්පජ්ජති 120
කීව දීඝො නු ඛො භන්තෙ කප්පො 280, 282
කීව බහුකා නු ඛො භන්තෙ කප්පා 282

**කු**

කුක්කුටානං සතං කුක්කුට භූතානං 290
කුක්කුරො 370
කුඩ්ඩනිස්සිතා 154
කුතො ආගතො 42
කුදස්සු නාම 8, 16, 162
කුද්දාලපිටකං 138, 146

**කු** පිට්ඨඞ්කා

කුන්නදියො 186
කුම්භකාරපාකා 130
කුම්භණ්ඩං පුරිසං 396
කුම්භත්ථෙනකෙහි 408
කුමාරකවාද 332
කුම්මො 346
කුලානි 408, 414
කුලපුත්තා 428
කුලානුද්දයතාය 330
කුලූපකානං මඤ්ඤෙ චරසි 332
කුලූපගො හොතුං 306
කුසග්ගෙන 212
කුසලමූලං 366
කුසලූපසංහිතං 334
කුසලො ධම්මො 366
කුසීතා කුසීතෙහි 246
කුසීතො පුරිසපුග්ගලොති 314
කුසොබ්භා 50, 186
කුහිංගාමී භවිස්සති 40

**කූ**

කූටඞ්ගමා 406
කූටසමුග්ඝාතා 406
කූටසමොසරණා 406
කූටාගාරං වා 160
කූටාගාරසාලා වා 160

**කෙ**

කෙවලස්ස 2, 6, 8, 12, 14, 16, 18 22, 24, 28, 34, 58, 98
කෙසමස්සුං ඔහාරෙත්වා 332

**කො**

කො අධිප්පායො 38
කොධනො පුරිසපුග්ගලොති 314
කො නාමායං භික්ඛු 318
කො පන වාදෙ 410
කො විසෙසො 38
කොළට්ඨිකම්මන්තං 276

**ඛ**

ඛණ්ඩාඛණ්ඩිකං ඡෙදෙය්‍ය 138, 146
ඛණ්ඩිච්චං 4, 66. 68, 88
ඛත්තො 346
ඛන්ධානං 68, 88
ඛන්ධානං පාතුභාවො 4
ඛන්ධානං භෙදො 4
ඛෙත්ත 388

| ඛ | පිට්ඨඞ්කා |
|---|---|
| ඛයධම්මං | 42, 92, 94 |
| ඛයස්මිං ඛයෙ ඤාණං | 48 |
| ඛයා | 326 |
| ඛරස්සරෙන | 198 |
| **ඛි** | |
| ඛිත්තං | 410 |
| ඛිප්පතරං | 280 |
| ඛිප්පමෙව | 236 |
| **ඛී** | |
| ඛීණතිරච්ඡානයොනියො | 106, 110 |
| ඛීණනිරයොම්හි | 106, 110 |
| ඛීණපෙත්තිවිසයො | 106, 110 |
| ඛීණා ජාති | 34, 76, 84, 130, 188, 374 |
| ඛීණාපායදුග්ගතිවිනිපාතො | 106, 110 |
| ඛීණාසවො භික්ඛු | 132 |
| ඛීරං | 286 |
| ඛීරං ඛීරෙන | 246 |
| **ඛු** | |
| ඛුරමුණ්ඩකං | 198 |
| **ඛෙ** | |
| ඛෙත්තං තං න හොති | 62 |
| ඛෙමතො අද්දක්ඛුං | 170 |
| ඛෙළො ඛෙළෙන | 244 |
| **ග** | |
| ගඞ්ගා | 214, 286 |
| ගද්දූහනමත්තං | 408 |
| ගන්ධතණ්හා | 6, 380 |
| ගන්ධධාතු | 222 |
| ගන්ධසඤ්චෙතනා | 378 |
| ගන්ධසඤ්ඤා | 378 |
| ගන්ධසම්පන්නො | 170 |
| ගන්ධා | 376 |
| ගබ්භං ගණ්හාති | 368 |
| ගම්භීරත්ථ | 42 |
| ගම්භීරාවභාසො | 54, 144 |
| ගම්භීරා | 412 |
| ගම්භීරෙ | 56, 144, 344 |
| ගරුකතො | 188 |
| ගරුකානි | 308 |
| ගහපතිකානි චීවරානි | 308 |
| **ගා** | |
| ගාමං වා නිගමං වා | 416 |
| ගාමකූටො | 396 |
| ගාවී නිච්චම්මා | 154 |
| ගාළ්හබන්ධනං | 198 |

| ගි | පිට්ඨඞ්කා |
|---|---|
| ගිලබළිසො | 344 |
| ගිලානපච්චයභෙසජ්ජ පරික්ඛාරහෙතු | 298 |
| ගිහී | 416 |
| **ගු** | |
| ගුත්තං සතං ගොහූතානං | 290 |
| ගුළාගුණ්ඨිකජාතා | 144 |
| ගුළිකා | 216 |
| ගුළිකං කරිත්වා | 276 |
| **ගූ** | |
| ගූථකූපෙ | 398 |
| ගූථපූරා | 348 |
| ගූථස්ස පූරෙත්වා | 398 |
| ගූථාදී | 348 |
| ගූථො ගූථෙන | 244 |
| ගූථං ඛාදන්තං | 398 |
| **ගො** | |
| ගොඝාතකො | 392 |
| ගොචරාය | 418 |
| ගොපානසියො | 406 |
| **ඝ** | |
| ඝම්මපරෙතො | 170 |
| ඝම්මාභිතත්තා | 170 |
| ඝරාවාසො | 332 |
| ඝාණං | 170 |
| ඝාණධාතු | 222 |
| ඝාණවිඤ්ඤාණධාතු | 222 |
| ඝාණසම්ඵස්සො | 6, 222, 376, 384 |
| ඝාණසම්ඵස්සජා වෙදනා | 6, 378 |
| ඝාණස්මිම්පි නිබ්බින්දති | 374 |
| ඝාණායතනං | 6 |
| **ච** | |
| චක්ඛායතනං | 6 |
| චක්ඛුං | 388 |
| චක්ඛුං උදපාදි | 12, 14, 16, 18, 164 |
| චක්ඛුං නිච්චං වා අනිච්චං වාති | 374 |
| චක්ඛුධාතු | 222 |
| චක්ඛුභූතා | 402 |
| චක්ඛුභූතා වත භික්ඛවෙ සාවකා | 392 |
| චක්ඛුමන්තො | 34 |
| චක්ඛුවිඤ්ඤාණං | 6, 112, 376 |
| චක්ඛුවිඤ්ඤාණධාතු | 222 |
| චක්ඛුසම්ඵස්සජා වෙදනා | 6, 224, 378, 384 |

**ච** — පිට්ඨඞ්කා

චක්ඛුසම්ඵස්සො 6, 222, 376, 384
චක්ඛුස්මිම්පි නිබ්බින්දති 374
චඞ්කමති 242
චණ්ඩතරො 370
චණ්ඩස්ස කුක්කුරස්ස 370
චතස්සො ධාතුයො 264, 272, 274
චතුත්ථං ඣානං 322
චතුද්දිසා සීතා 410
චතුරඞ්ගුලං චතුරඞ්ගුලං සචිතං 276
චතුසච්චිකං 208
චතුසු මහාසමුද්දෙසු උදකං 288
චතුහෙත ආරොහන්ති 294
චතුහෙන ඔරොහන්ති 294
චත්තාරි පුරිසයුගානි 108
චත්තාරිපි වස්සානි තිට්ඨමානො 148
චත්තාරීසම්පි වස්සං තිට්ඨමානො 148
චත්තාරො ආහාරා 152
චත්තාළීසම්පි වස්සසහස්සානි 294
චන්දිමසුරියෙ 190
චන්දිමසුරියානං ජවො 412
චන්දූපමා 302
චම්මං ඡින්දති 362
චරමානො 164
චවනතා 4, 68, 88
චවමානෙ 192, 326

**චා**

චාතුම්මහාභූතිකස්මිං 148
චාරිත්තං 416

**චි**

චිත්තං 190
චිත්තං ඉතිපි 148
චිත්තං පරියාදාය තිට්ඨන්ති 358
චිත්තකාරො 158
චිත්තකබරා 412
චිත්තබ්‍යඤ්ජනා 412
චිත්තසඞ්ඛාරෙ 6, 66, 68 90
චිත්තානි විමුච්චිංසු 288
චිරතරං භාසිස්සති 310
චිරනිවාසී 346

**චී**

චීවරකාරසමයෙ 428
චීවරහෙතු 298
චීවරපිණ්ඩපාතසෙනාසනගිලාන-පච්චයභෙසජ්ජපරික්ඛාරානං 46, 188, 320, 348

**චු** — පිට්ඨඞ්කා

චුති 4, 66, 68, 88
චුතූපපාතො 104
චූළිකාබද්ධං 282

**චෙ**

චෙතනා 4
චෙතසා චෙතො පරිච්ච 190
චෙතසිකම්පි 106
චෙතසො අධිට්ඨානාභිනිවෙසානු-සයා 28
චෙතසො එකොදිභාවං 422
චෙතෙති 102
චෙතො 190
චෙතොවිමුත්තිං 326, 330, 336

**චො**

චොරඝාතකො 400
චොරා ගාමඝාතකාති ගහෙත්වා 290
චොරා පරිපන්ථකාති ගහෙත්වා 290
චොරෙහි 408

**ඡ**

ඡඅභිඤ්ඤා 330
ඡන්දනානත්තං 226, 232
ඡන්දරාගප්පහානං 264
ඡන්දරාගවිනයො 264
ඡන්දරාගො 436
ඡන්දො 208
ඡවිං ඡින්දති 362
ඡාදිස්සති 170
ඡින්නපිලොතිකො 46

**ජ**

ජනපදකල්‍යාණියාපි 356
ජයම්පතිකා 154
ජරසිගාලො 418
ජරා 2, 4, 66, 68, 88
ජරාමරණං 4, 8, 16, 18, 24, 26, 58, 66,68, 70, 72, 88, 90, 92, 94, 96, 168, 186, 200
ජරාමරණදුක්ඛස්ස නිස්සරණං 162
ජරාමරණනිරොධං 24, 66, 70, 72, 90, 200
ජරාමරණනිරොධාය 126, 168
ජරාමරණනිරොධෙ 88
ජරාමරණනිරොධො 12, 68, 16, 164

ජ — පිට්ඨඞ්කා

ජරාමරණං 12, 16, 120, 162, 164, 168
ජරාමරණනිරොධගාමිනිං පටිපදං 24, 26, 70, 72, 90, 126, 200
ජරාමරණස්ස අත්ථඞ්ගමො 272
ජරාමරණස්ස පාතුභාවො 272
ජරාමරණසමුදයං 66, 70, 72, 76, 88, 90, 126, 200
ජරාමරණසමුදයෙ 66, 88
ජරුදපානං වා 302
ජලොයා 134
ජවනො පුරිසො 410

ජා

ජාගරියං අනුයුත්තෙනාහි 332
ජාතරූපපතිරූපකං 340
ජාතරූපරජතාය 356
ජාති 2, 4, 16. 18, 24, 26, 58, 68, 72, 80, 92, 94, 120, 122, 128, 186, 200
ජාතිජාතිකං 56
ජාතිනිදානං 56
ජාතිනිරොධං 128
ජාතිනිරොධසාරුප්පගාමිනී පටිපදා 128
ජාතිනිරොධා 12, 18, 38, 92, 174
ජාතිනිරොධා ජරාමරණනිරොධොති 12, 162
ජාතිනිරොධාය 128
ජාතිනිරොධො 4, 58, 66, 112
ජාතිපච්චයා 2, 4, 40, 92, 94
ජාතිපච්චයා ජරාමරණං 8, 16, 162, 176, 180
ජාතිප්පභවං 56
ජාතියා 18, 38, 92, 174
ජාතියා අසති ජරාමරණං න හොති 12, 122, 162
ජාතියා සති ජරාමරණං හොති 8, 16, 120, 162
ජාතිසමුදයං 128
ජාතිසමුදයා 66, 90
ජාතිසතම්පි 192
ජාතිසතසහස්සම්පි 192
ජාතිසහස්සම්පි 192
ජාති හොති 8

ජා — පිට්ඨඞ්කා

ජානිතිස්ස වචනීයං 48
ජාතුපතිසං 50
ජානඤ්ඤෙව වදමි ජානාමීති 334
ජානතා 80
ජානාමි ඛ්වාහං කස්සප දුක්ඛං 32

ජි

ජිණ්ණාසිදන්ති 308
ජිව්හා 170
ජිව්හාධාතු 222
ජිව්හා නිච්චා වා අනිච්චා වාපි 374
ජිව්හායතනං 6
ජිව්හායපි නිබ්බින්දති 374
ජිව්හාවිඤ්ඤාණං 6, 376
ජිව්හාවිඤ්ඤාණධාතු 222
ජිව්හාසම්ඵස්සජා 6
ජිව්හාසම්ඵස්සජා වෙදනා 378
ජිව්හාසම්ඵස්සො 6, 222, 376, 384

ජී

ජීරණතා 4, 66, 68, 88
ජීවිතපරියාදනා 130
ජීවිතපරියන්තිකං 130
ජීවිතහෙතුපි 356
ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො 4
ජීවිතුකාමො 156
ජුණ්හපක්ඛෙ 316

ඤ

ඤස්සති වා දක්ඛති වා සක්ඛිං වා කරිස්සති 402
ඤාණං 88, 94
ඤාණං උදපාදි 12, 14, 16, 18, 164
ඤාණඤ්ච පන මෙ දස්සනං 266
ඤාණභූතා 392, 402
ඤාණවත්ථූ 92
ඤාණවත්ථූනි 88
ඤාතො 320
ඤායපටිපන්නා 108

ඨි

ඨිති 272
ඨිතාව සා ධාතු 40
ඨිතියා 20, 22

**ත** පිට්ඨඞ්කා

තං කිං මඤ්ඤථ භික්ඛවෙ 288
තඞ්කිම්මඤ්ඤසි 194, 386
තං කුතෙත්ථ ලබ්භා 306
තං ජීවං තං සරීරං ඉති වා 94, 96, 98
තචො ච 46, 426
තඤ්ඤෙවෙත්ථ පටිභාතු 54
තණ්හං 2, 4, 6, 16, 18, 20, 24, 26, 58, 66, 68, 70, 72, 90, 178, 186, 200, 388
තණ්හාකායා 6
තණ්හාජාතිකං 82
තණ්හාජාතිකා 20
තණ්හාජාතිකො 168
තණ්හාතිස්ස වචනීයං 48
තණ්හානිදානං 82
තණ්හානිදානා 20
තණ්හානිදානො 168
තණ්හා නිරුජ්ඣති 136
තණ්හානිරොධා 132
තණ්හානිරොධා උපාදාන නිරොධොති 12
තණ්හානිරොධො 4, 58
තණ්හාපච්චයා 2; 4, 24, 40, 92, 96
තණ්හාපච්චයා උපාදානං 10, 182
තණ්හාපභවං 82
තණ්හාපභවා 20
තණ්හාපභවො 168
තණ්හා පවඩ්ඪති 134
තණ්හාය අසති උපධි න හොති 168
තණ්හාය අසති උපාදානං න හොති 12
තණ්හාය සති උපාදානං හොති 10
තණ්හාය සති උපධි හොති 168
තණ්හාසංයොජනානං 276, 278, 284, 292
තණ්හාසමුදයං 82
තණ්හාසමුදයා 20
තණ්හාසමුදයො 168
තණ්හීයතීති 24
තණ්හූපනිසං 50
තතියං ඨානං 322
තතො චුතො 192
තතොනිදානං 170, 174, 198, 416

**ත** පිට්ඨඞ්කා

තත්‍ර තත්‍ර අනයව්‍යසනං ආපජ්ජෙය්‍ය 346
තත්‍ර තත්‍ර ගච්ඡෙය්‍ය 346
තත්‍ර තත්‍ර බජ්ඣෙය්‍ය 346
තත්‍ර තත්‍ර සජ්ජෙය්‍ය 346
තථතා 40
තථත්තාය 298
තථත්තාය පටිපජ්ජෙය්‍යුං 304
තථාගතභාසිතා 412
තථාගතො 28
තදපි ඵස්සපච්චයා 52
තදප්පතිට්ඨිතෙ 102
තදභිඤ්ඤා ආවික්ඛිං 166
තදාහාරනිරොධා 74, 76
තදාහාරසම්භවන්ති 74
තදාහාරො 134
තදුපාදානො 134
තනුකං 438
තන්තාකුලකජාතා 144
තන්නිස්සිතා 154
තරුණා 416
තරුණො රුක්ඛො 140
තසිතො 170, 186

**තා**

තාලපත්තිකාය 336
තාලාවත්ථුකතානි 96, 98
තාලාවත්ථුකතො 138, 146

**ති**

තිංසම්පි වස්සානි තිට්ඨමානො 148
තිංසවස්සසහස්සානි 294
තිකභොජනං 330
තිණකට්ඨං 286
තිණකට්ඨනිස්සිතා පාණා 236
තිණකට්ඨසාඛාපලාසං 276
තිණ්දුයෙ 236
තිණ්ඩුකකං 236
තිණ්ණං සඞ්ගති ඵස්සො 112
තිණ්හඵලා සත්ති 410
තිබ්බං පච්චනුභූතං 276, 292
තිරියංගමානි 138, 144
තිරොකුඩ්ඩං 190, 196
තිරොපබ්බතං 190, 196
තිරොපාකාරං 190, 196
තිරොභාවං 190 196
තිවරානං මනුස්සානං 294

**ති** — පිට්ඨඞ්කා

තිණ්ණිපි වස්සානි තිට්ඨමානො 148
තිහෙත ආරොහන්ති 294
තීහෙත ඔරොහන්ති 294

**තු**

තුණ්හීභූතො 428
තුලා 338
තුලබිම්බොහතාදිසු 414

**තෙ**

තෙචීවරිකස්ස 308
තෙජොධාතු 264, 340, 380
තෙජොධාතුං අභිනන්දති 270
තෙජොධාතුං පටිච්ච 264
තෙජොධාතුයා අස්සාදෙ 264, 268
තෙන කස්සපො න සන්දීයති 308
තෙන භික්ඛු න සන්දීයති 306
තෙන භික්ඛු සන්දීයති 306
තෙලං ආසිඤ්චෙය්‍ය 136
තෙලං තෙලෙන 246
තෙලඤ්ච පටිච්ච 136
තෙලප්පදීපො 136

**ථ**

ථුල්ලඵුසිතකෙ 50
ථෙරා භික්ඛූ 414, 416
ථොකං දෙන්ති 308
ථොමිතො 426

**ද**

දක්ඛන්ති වා 392
දක්ඛිණාය වා 160
දක්ඛිණෙය්‍යො 180
දණ්ඩං පණෙති 156
දණ්ඩො 284, 286
දධිමණ්ඩකෙන වා 174
දන්ධං දෙන්ති 306
දන්ධාසිතත්තං 84, 86
දවාය වා 154
දසකම්මපථෙන 262
දසඞ්ගිකෙන 262
දසපි වස්සානි තිට්ඨමානො 148
දසබලසමන්නාගතො 44
දසබලා 72
දස්සනසම්පන්නො 66, 70, 90, 92214
දස්සනීයො 430

**ද** — පිට්ඨඞ්කා

දළ්හධම්මා 410
දළ්හාය 364
දළ්හාය රජ්ජුයා 198

**දා**

දාරුණො 344, 354

**දි**

දිට්ඨධම්මනිබ්බාණප්පත්තො භික්ඛූති 30, 180
දිට්ඨධම්මසුඛවිහාරා 364, 428
දිට්ඨධම්මිකම්පි 106
දිට්ඨියා 94, 96
දිට්ඨිසම්පන්නො 66, 70, 90, 92, 122, 124
දිට්ඨෙ චෙව ධම්මෙ 236
දිට්ඨෙ ච ධම්මෙ 26, 28, 272
දිද්ධගතෙන 348
දිබ්බං චක්ඛුං විසුජ්ඣි 426
දිබ්බචක්ඛුකා 242
දිබ්බාය සොතධාතුයා 190, 324
දිබ්බෙන චක්ඛුනා 192, 326

**දී**

දීඝමද්ධානං 134, 278, 424
දීඝරත්තං 174, 176, 292
දීඝරත්තං අහිතාය දුක්ඛාය 402
දීඝලොමිකා 346
දීඝෙන අද්ධුනා 288, 290

**දු**

දුක්ඛං 286, 416
දුක්ඛං අභිනන්දති 272
දුක්ඛං පච්චනුභූතං 276, 278, 292
දුක්ඛං නාභිනන්දති 272
දුක්ඛං නිරුජ්ඣමානං නිරුජ්ඣති 28
දුක්ඛං වා තං සුඛං වාති 374
දුක්ඛක්ඛන්ධස්ස 2, 6, 8, 12, 14, 16, 18, 22, 24, 28, 34, 58, 66, 94, 98
දුක්ඛක්ඛන්ධස්ස නිරොධො 6
දුක්ඛන්තිස්ස වචනීයං 48
දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං 6
දුක්ඛනිරොධෙ අඤ්ඤාණං 6
දුක්ඛමෙව උප්පජ්ජමානං උප්පජ්ජති 28
දුක්ඛපටික්කූලො 156

දු — පිට්ඨඞ්කා

දුක්ඛවිපාකතරා 198
දුක්ඛවේදනා 82
දුක්ඛවේදනියං 152
දුක්ඛසමුදයෙ අඤ්ඤාණං 6
දුක්ඛසමුප්පාදං 286
දුක්ඛස්ස 112, 322
දුක්ඛස්ස උප්පාදෙ 272
දුක්ඛස්ස ච අතික්කමං 286
දුක්ඛස්ස නිරොධො 272
දුක්ඛස්ස නිස්සරණං 10, 8, 16
දුක්ඛස්සන්තකරො 286
දුක්ඛා 264
දුක්ඛාවක්කන්තා 270
දුක්ඛානුපතිතා 270
දුක්ඛී 434
දුක්ඛූපනිසා 50
දුක්ඛූපසමගාමිනං 286
දුක්ඛෙ අඤ්ඤාණං 6
දුග්ගතං දුරූපෙතං 288
දුග්ගති 144, 236
දුග්ගන්ධං 398
දුට්ඨබ්‍රාහ්මණො 398
දුතියං ඨානං 322, 422
දුතියො අන්තො 116
දුද්දසිකං 430
දුන්නිවත්ථං 350
දුප්පඤ්ඤ දුප්පඤ්ඤොති 246, 258
දුප්පඤ්ඤො පුරිසපුග්ගලොති 314
දුප්පධංසියාති 408
දුප්පාරුතං 350
දුබ්බලා 310
දුබ්බණ්ණං 192, 430
දුම්මනො 434
දුරූපෙතං 288
දුස්සපටෙ වා 158
දුස්සීල්‍යං 262
දූරෙ සන්තිකෙ වා 386

දෙ

දෙන්තුයෙව මෙ 306
දෙවතානං ජවො 412
දෙවමනුස්සානං 310
දෙවෙ 50
දෙසනා 18
දෙසිතං 278

දො

දොණියො 398
දොමනස්සෙහි 38, 170, 174
දොවචස්සකරණෙහි ධම්මෙහි 310

ද්ව

ද්වයං ද්වයං පටිච්ච එසො 38
ද්වයං නිස්සිතො ඛ්වායං කච්චාන ලොකො 28
ද්වීහෙන ආරොහන්ති 294
ද්වෙපි වස්සානි තිට්ඨමානො 148

ධ

ධනුග්ගහා 410
ධම්මං 28, 278
ධම්මං පරියාපුණිත්වා 188
ධම්මකථිකා 242
ධම්මකථිකො ධම්මකථිකොති 28
ධම්මකථිකො භික්ඛූති අලංවචනාය 30, 180
ධම්මචක්ඛුපටිලාභො 212
ධම්මච්ඡන්දෙ 226, 232
ධම්මට්ඨිතතා 40
ධම්මට්ඨිතිඤාණං 92, 94, 194
ධම්මජො 336
ධම්මතණ්හා 6, 380
ධම්මත්ථෙනකො 198
ධම්මාදායාදො 336
ධම්මධාතු 86, 222, 232
ධම්මනියාමතා 40
ධම්මනිම්මිතො 336
ධම්මපරියායො 116
ධම්මපරියෙසනතා 226
ධම්මපරියෙසනා 232
ධම්මපරිලාභො 226, 232
ධම්මලාභො 232
ධම්මවිනයෙ 34, 78, 198
ධම්මසඞ්කප්පා 226, 232
ධම්මසඤ්චෙතනා 378
ධම්මසඤ්ඤා 232, 378
ධම්මසම්ඵස්සජා වෙදනා 232
ධම්මසුධම්මතං 304

| ධ | පිට්ඨඞ්කා |
|---|---|
| ධම්මසොතං | 66, 70, 90, 92 |
| ධම්මසොතං සමාපන්නො ඉතිපි | 124 |
| ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍යාම | 52, 64 |
| ධම්මානුධම්මපටිපන්නො භික්ඛූති | 30, 180 |
| ධම්මාභිසමයො | 212 |
| ධම්මී කථා | 426 |
| ධම්මෙ ඤාණං | 90, 92 |
| ධාතු | 388, 234 |
| ධාතුනානත්තං | 222, 232 |
| ධාතුසොච | 240, 258, 260, 262 |
| ධීතුයාපි හෙතු | 370 |
| ධුතවාද | 242 |

| න | |
|---|---|
| න උපාදියති නාධිට්ඨාති අත්තා මෙති | 28 |
| නඛසිඛායං | 406 |
| නති | 104 |
| නත්ථිතා | 28 |
| නත්ථිදානි පුනබ්භවො | 266 |
| නදියා වා සීඝසොතාය පවාහෙය්‍ය | 138, 146 |
| නදීවිදුග්ගං වා | 302 |
| න ධීතාභූතපුබ්බා | 292 |
| න නිබ්බිජ්ජෙය්‍යුං | 268 |
| න නිස්සරෙය්‍යුං | 268 |
| න නු ඛො අහොසිං අතීතමද්ධානං | 42 |
| න නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං | 42 |
| නන්දී | 82 |
| න පඤ්ඤායථ | 276 |
| න පටිනිස්සජ්ජෙය්‍ය | 174 |
| න පරිතස්සති | 298 |
| න පිතාභූතපුබ්බො | 290 |
| න පුත්තභූතපුබ්බො | 292 |
| න බජ්ඣති | 304 |
| න භගිනීභූතපුබ්බා | 292 |
| න භාතාභූතපුබ්බො | 290 |
| න මාතාභූතපුබ්බා | 290 |
| න මෙසො අත්තා | 194, 386, 388 |
| නවන්නං අනුපුබ්බවිහාර සමාපත්තීනං | 328 |

| න | පිට්ඨඞ්කා |
|---|---|
| න විචිකිච්ඡති | 28 |
| නවො භික්ඛු | 414, 428 |
| න සජ්ජති | 304 |
| න සන්ති භික්ඛු ඔවාදකා | 314 |
| න සාරජ්ජෙය්‍යුං | 268 |
| න සුකරො සඞ්ඛාතුං | 280 |
| න ගාරං ජිඥති | 362 |
| න හොති තථාගතො පරම්මරණාති | 338 |
| නළකලාපියො | 180 |
| නළො | 368 |

| නා | |
|---|---|
| නාගා | 416 |
| නාතිවත්තති | 144 |
| නාධිට්ඨාති | 28 |
| නානත්තසඤ්ඤතං | 322 |
| නාපරං ඉත්ථත්තායාති | 34, 80, 130, 190, 374, 386 |
| නානප්පකාරකං | 126 |
| නානාබාහාසු | 156 |
| නානාභාවා විනික්ඛෙපා | 152 |
| නාමරූපං | 2, 4, 6, 16, 18, 20, 24, 26, 66, 68, 70, 72, 164, 178, 186, 202 |
| නාමරූපජාතිකං | 20 |
| නාමරූපනිදානං | 20 |
| නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධොති | 164, 180 |
| නාමරූපනිරොධා සළායතනනිරොධොති | 14, 104, 180 |
| නාමරූපනිරොධො | 4 |
| නාමරූපන්තිස්ස වචනීයං | 50 |
| නාමරූපපච්චයා | 2, 40, 92, 96 |
| නාමරූපපච්චයා විඤ්ඤාණං | 122, 180 |
| නාමරූපපච්චයා සළායතනන්ති | 10, 162, 180, 182 |
| නාමරූපප්පභවා | 20 |
| නාමරූපසමුදයං | 20 |
| නාමරූපස්ස අවක්කන්ති | 162 |
| නාමරූපෙ අසති සළායතනං න හොති | 14, 122 |
| නාමරූපෙ අසති විඤ්ඤාණං න හොති | 164 |
| නාමරූපෙ සති සළායතනං හොති | 10 |

| නා | පිට්ඨඞ්කා |
| --- | --- |
| නාමරූපෙ සති විඤ්ඤාණංහොති | 162 |
| නාමරූපූපනිසං | 50 |
| නාසාය | 370 |
| **නි** | |
| නිකාමෙති | 344 |
| නික්කඞ්ඛා එත්ථ හොථ | 132 |
| නික්කුජ්ජිතං | 34 |
| නික්ඛිපෙය්‍ය | 236 |
| නික්ඛෙපනම්පි | 148 |
| නික්ඛෙපො | 68, 88 |
| නිච්චං වා අනිච්චං වාති | 376, 386 |
| නිච්චතො අද්දක්ඛුං | 170 |
| නිච්චනවකා | 302 |
| නිච්ඡවිං ඉත්ථිං | 398 |
| නිච්ඡවිං පුරිසං | 392 |
| නිරුජ්ඣමානං නිරුජ්ඣති | 28, 300 |
| නිට්ඨං ගන්තබ්බං | 288 |
| නිත්ථරෙය්‍යාම | 154 |
| නිබ්බසනානි | 308 |
| නිබ්බානෙ ඤාණං | 194 |
| නිබ්බානාය | 338 |
| නිබ්බාපෙය්‍ය | 236 |
| නිබ්බිචිකිච්ඡා | 132 |
| නිබ්බිදා | 76 |
| නිබ්බිදානීස්ස වචනීයං | 46 |
| නිබ්බිදාය | 30, 836 |
| නිබ්බිදූපනිසො | 20 |
| නිබ්බින්දං විරජ්ජති | 150, 374, 380 |
| නිබ්බින්දෙය්‍යාපි | 148 |
| නිබ්බෙධිකපඤ්ඤා | 66, 70, 90, 92 |
| නිමන්තනෙසු | 308 |
| නිමන්තිතො | 348 |
| නිමුග්ගං | 398 |
| නියතො | 106, 110 |
| නිරයං | 192 |
| නිරුද්ධධම්මං | 42, 74, 92, 94 |
| නිරොධධම්මා | 42 |
| නිරොධසමාපත්ති පත්තබ්බා | 234 |
| නිරුද්ධා | 76 |
| නිරුද්ධාය | 30, 74, 338 |
| නිරොධො නිරොධොති | 14, 18 |
| නිවිසමානා | 168 |
| නිවුතස්ස | 38 |
| නිසීදනං | 350 |

| නි | පිට්ඨඞ්කා |
| --- | --- |
| නිස්සටා | 27 |
| නිස්සරණං | 8, 264, 272, 274 |
| නිස්සරණපඤ්ඤා | 298, 416 |
| නිස්සරණපරියෙසනං | 206 |
| නීලියා වා | 158 |
| නූපපජ්ජමානා | 300 |
| **නෙ** | |
| නෙක්ඛම්මච්ඡන්දො | 238 |
| නෙක්ඛම්මධාතුං | 238 |
| නෙක්ඛම්මපරියෙසනා | 238 |
| නෙක්ඛම්මපරිළාහො | 238 |
| නෙක්ඛම්මවිතක්කො | 236 |
| නෙක්ඛම්මසඞ්කප්පො | 238 |
| නෙක්ඛම්මසඤ්ඤා | 238 |
| නෙතං අඤ්ඤථා සද්දහථ | 132 |
| නෙතං මම | 386 |
| නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධාතු | 234 |
| නෙවසඤ්ඤානාසඤ්ඤායතනං | 322 |
| නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති | 338 |
| නෙසොහමස්මි | 194, 386, 358 |
| **නො** | |
| නො නු ඛොස්මි | 42 |
| නො බහුකං | 306 |
| නො පණීතං | 306 |
| නො වුද්ධි | 368 |
| නො සක්කච්චං | 306 |
| නො සීසං | 306 |
| **ප** | |
| පංසුං දදෙය්‍ය | 140 |
| පංසුකූලිකත්තස්ස | 308 |
| පංසුකූලිකො | 308, 434 |
| පකප්පෙති | 102 |
| පකාසිතො | 46 |
| පක්ඛී සකුණො | 196 |
| පග්ඝරිතං | 278 |
| පච්චත්තං යෙව පරිනිබ්බායති | 130 |
| පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි- | 108, 304 |
| පච්චත්තමෙව ඤාණං | 180 |
| පච්චනුභූතං | 288 |

| ප | පිට්ඨඞ්කා |
| --- | --- |
| පච්චනුභොසි | 196 |
| පච්චයං | 66 |
| පච්චයනිරොධං | 66 |
| පච්චයනිරොධගාමිනිං | 66 |
| පච්චයසමුදයං | 66 |
| පච්චුදවත්තති ඛො ඉදං- විඤ්ඤාණං | 162 |
| පච්චුපට්ඨිතං | 334 |
| පච්චුප්පන්නං අද්ධානං | 244 |
| පච්චූසසමයං | 350, 418 |
| පච්ඡාබාහං | 198 |
| පච්ඡාභත්තං | 54, 390, 428 |
| පජහිස්සාම | 366 |
| පජා | 270 |
| පජාපතියාපි සෙතු | 372 |
| පඤ්චකාමගුණිකො රාගො | 154 |
| පඤ්ච ච ථාලිපාකසතානි | 368 |
| පඤ්චන්නඤ්ච අභිඤ්ඤාණං | 328,336 |
| පඤ්චපි වස්සානි තිට්ඨමානො | 148 |
| පඤ්චසික්ඛාපදානි | 262 |
| පඤ්චහි රථසතෙහි | 368 |
| පඤ්ඤපෙති | 40, 240 |
| පඤ්ඤවන්තො පඤ්ඤවන්තෙහි- | 248, 258 |
| පඤ්ඤවා පුරිසපුග්ගලොති | 316 |
| පඤ්ඤා අත්ථි | 314 |
| පඤ්ඤා උදපාදි | 14, 16, 18, 164 |
| පඤ්ඤා න ත්ථි | 314 |
| පඤ්ඤාවිමුත්තො | 192 |
| පඤ්ඤාවිමුත්තිං | 326, 336 |
| පඤ්ඤාසම්පි වස්සං තිට්ඨමානො | 148 |
| පඤ්ඤාසංයොජනානි | 212 |
| පඤ්හස්ස කාලො | 32 |
| පඤ්හස්ස වෙය්‍යාකරණාය | 30, 32 |
| පඤ්හො | 22 |
| පටපිලොතිකානං | 332 |
| පටිග්ගහෙත්වා | 332 |
| පටිසසඤ්ඤතං | 322 |
| පටිච්ච | 236 |
| පටිච්චසමුප්පන්නං | 42 |
| පටිච්චසමුප්පාදා | 2, 4, 40 |
| පටිනිස්සජ්ජෙය්‍ය | 170 |
| පටිපජ්ජිතබ්බං | 298 |
| පටිපදා | 66, 88 |
| පටිපන්නො | 30 |
| පටිසංවෙදයෙථ | 156, 418 |
| පටිසල්ලානා වුට්ඨිතො | 58, 300 |

| ප | පිට්ඨඞ්කා |
| --- | --- |
| පටිසල්ලීනො | 114 |
| පටිසඞ්ඛා න පිවෙය්‍ය | 174 |
| පට්ඨපෙති | 40, 240 |
| පඨමං ඣානං | 320, 328, 336 |
| පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං- කරෙථ | 190 |
| පඨවී | 286 |
| පඨවීධාතු | 264,272, 276, 340,380,384 |
| පඨවීධාතුං අභිනන්දති | 270 |
| පඨවීධාතුං නප්පජානාති | 274 |
| පඨවිධාතුං නාභිනන්දති | 272 |
| පඨවීධාතුං පටිච්ච | 264 |
| පඨවීධාතුනිරොධං | 274 |
| පඨවීධාතුනිරොධගාමිනිං- පටිපදං | 274 |
| පඨවීධාතුසමුදයං | 274 |
| පඨවීධාතුයා අස්සාදෙ | 164 ,268 |
| පඨවීධාතුයා ආදීනවො | 268 |
| පඨවීධාතුයා උප්පාදෙ | 272 |
| පඨවීධාතුයා නිරොධො | 272 |
| පඨවීධාතුයා නිස්සරණං | 268 |
| පණවෙත | 198 |
| පණීතං ආචික්ඛති | 240 |
| පණීතඤ්ච මෙ දෙන්තු | 306 |
| පණීතා චෙතනා | 240 |
| පණීතා තස්ස උප්පත්ති | 240 |
| පණීතා දිට්ඨි | 240 |
| පණීතා පත්ථනා | 240 |
| පණීතා වාචා | 240 |
| පණීතා සඤ්ඤා | 240 |
| පණීතා පණිධි | 240 |
| පණීතො පුග්ගලො | 240 |
| පණීතො විතක්කො | 240 |
| පතිකොට්ටෙස්සාමි | 410 |
| පතිපිංසෙය්‍යුං | 154 |
| පතිරූපං | 434 |
| පතිලෙණිස්සාමි | 410 |
| පතිවට්ටෙස්සාමි | 410 |
| පතිවිසෙය්‍ය | 130 |
| පතිසල්ලාණා වුට්ඨිතො | 176, 336 |
| පතිසල්ලිනස්ස | 422 |
| පතෙනාපි | 400, 402 |
| පධානසම්මං | 414 |
| පපතාය | 346 |
| පපතිස්සාමි | 156 |
| පබ්බජ්ජා | 332 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පබ්බජිතො සමානො | 334 |
| පබ්බතං | 286 |
| පබ්බතකන්දරපදරසාඛා | 50 |
| පබ්බතවිසමං වා | 302 |
| පබ්බතසමො | 286 |
| පබ්බාජෙන්ති | 34 |
| පරංකතං දුක්ඛන්ති | 32, 34 |
| පරං කතං | 52 |
| පරං ලොකං | 284 |
| පරත්ථං | 46 |
| පරපුග්ගලානං | 190, 196 |
| පරමාය වණ්ණපොක්ඛරතාය | 430 |
| පරමෙන ජවෙන | 410 |
| පරම්මරණා | 192, 236 |
| පරසත්තානං | 190, 196 |
| පරස්මා ලොකා | 284 |
| පරාභවාය | 366 |
| පරාමසන්ති | 196 |
| පරාමට්ඨං | 148 |
| පරික්ඛයං | 214, 276, 280, 282 |
| පරික්ඛීණං | 212 |
| පරිචිතා | 410 |
| පරිච්ච | 190, 196 |
| පරිඤ්ඤතෙ | 154 |
| පරිණෙත්වා | 198 |
| පරිත්තං | 212, 296 |
| පරිදෙවෙති | 38, 174 |
| පරිණිබ්බුතො | 294 |
| පරිපාකො | 4, 88 |
| පරිපුණ්ණා | 436 |
| පරිපූරා | 50 |
| පරිපූරෙන්ති | 50 |
| පරිභුඤ්ජාම | 46 |
| පරිභූතරූපං | 430 |
| පරිමජ්ජසි | 196 |
| පරිමුත්තො දුක්ඛස්මා | 272 |
| පරියාදින්නං | 212 |
| පරියාදින්නචිත්තො | 346, 366 |
| පරියාදානං | 214, 276, 280, 282 |
| පරියාපන්නාය | 432 |
| පරියාපුණාති | 116 |
| පරියාපුණිතබ්බං | 412 |
| පරියායෙහි | 84, 86, 88 |
| පරියෙසිතබ්බො | 204 |
| පරියෙසමානො | 236 |
| පරියෙසනානානත්තං | 226, 232 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පරියොගාළ්හෙන | 90 |
| පරියොදාතො | 424 |
| පරිවජ්ජෙය්‍ය | 246 |
| පරිවසති | 34 |
| පරිවීමංසමානො | 126 |
| පරිවුත්ථපරිවාසං | 34 |
| පරිසුද්ධා ධම්මදෙසනා | 304 |
| පරිසුද්ධො | 424 |
| පරිහානමෙතං | 314 |
| පරිළාහනානත්තං | 226, 232 |
| පරෙ | 34, 62 |
| පරෙ මෙ න සද්දහෙය්‍යුං | 392, 402 |
| පරෙසං ලාභෙන | 304 |
| පලිබන්ධිත්වා | 138 |
| පලිබන්ධෙය්‍ය | 136 |
| පල්ලඞ්කෙන | 196 |
| පවත්තයමානො | 434 |
| පවනෙ | 164 |
| පවිට්ඨමහාන්ති | 32 |
| පවිවිත්තෙහි | 246 |
| පවිවිත්තො | 46, 308 |
| පවිවෙකස්ස | 308 |
| පසත්ථා | 426 |
| පසන්නාකාරං | 416 |
| පස්සන්තං | 278, 288 |
| පස්සන්තං පග්ඝරිතං | 290 |
| පස්සෙය්‍යාව වදාමි පස්සාමීති | 3 4 |
| පස්සති ඉමං සද්ධම්මං ඉතිපි | 124 |
| පස්සද්ධීතිස්ස වචනීයං | 46 |
| පස්සද්ධූපතිසං | 50 |
| පහාණා | 322 |
| පහිතත්තො | 34, 374 |
| **පා** | |
| පාචීනාය වා | 160 |
| පාටිකඞ්ඛා | 236, 314 |
| පාණාතිපාතපච්චයා | 106 |
| පාණාතිපාතා පටිවිරතා | 258, 260 |
| පාණාතිපාතිනො | 260 |
| පාණාතිපාතිනො පාණාතිපාතීති | 258 |
| පාණාතිපාතී | 106 |
| පාණිනා | 410 |
| පාණිනා පරාමසථ පරිමජ්ජථ | 190 |
| පාණූපෙතං | 116, 284 |
| පාතුභාවො | 272 |
| පාදෙහි | 236 |

පා — පිට්ඨඞ්කා

පානීයෙන වා 174
පාපසාමණෙරී 404
පාපසික්ඛමානා 400
පාපිච්ඡා 244, 330
පාපිමා 414
පාපිමතො මාරස්ස 344
පාමුජ්ජජාතිස්ස වචනීයං 48
පාමුජ්ජුපත්තිසා 50
පාරදාරිකො 398
පාලිච්චං 4, 66, 68, 88
පාවචනෙ 398, 400, 402, 404
පාවෙය්‍යකා භික්ඛූ 288
පාසාණසක්ඛරා 218, 424
පාසාදිකො 430
පාහුනෙය්‍යො 108

පි

පිණ්ඩපාතපටික්කන්තො 54, 390, 428
පිණ්ඩපාතහෙතු 298
පිණ්ඩපාතිකත්තස්ස 308
පිණ්ඩපාතිකො 308, 434
පිතාමහා 346
පිතුවජ්ඣාපුත්තො 434
පිතුපිතරෙ 276
පිතුපිහෙතු 370
පිතුමරණං 278
පිත්තං භින්දෙය්‍යුං 370
පිපාසිතො 170, 186
පියරූපං 168
පිසුණාවාචා 260
පිසුණාය වාචාය පටිවිරතො 260
පිහයිත්ථ 368

පී

පීතියා 322
පීතිසුඛං 320, 322, 328, 336, 422
පීතිතිස්ස වචනීයං 46
පීතුපත්තිසා 50

පු

පුග්ගලවෙමත්තතා 34
පුග්ගලා 286
පුඤ්ඤං 130
පුඤ්ඤාභිසඞ්ඛාරං 130
පුඤ්ඤූපගං 130
පුට්ඨො සමානො 36
පුණ්ණා අඞ්ගාරුතං 156

පු — පිට්ඨඞ්කා

පුත්තමංසානි ඛාදන්තා 154
පුත්තමරණං 278
පුත්තස්සපි හෙතු 370
පුථුජ්ජනො 148, 236
පුප්ඵුහුතං 166
පුනබ්භවාභිනිබ්බත්තියා 22, 102, 158
පුබ්බකෙහි මනුස්සෙහි 164
පුබ්බන්තං වා පරිධාවිස්සති 42
පුබ්බන්හසමයං 52, 156, 390, 408, 416
පුබ්බාකොටි 276, 278, 284, 288, 292
පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු 16, 18, 164
පුබ්බෙනිවාසං 192, 324
පුබ්බෙව සම්බොධා 8, 14, 16, 264
පුරාණං නගරං 164
පුරාණං මග්ගං 164
පුරාණං රාජධානිං 164
පුරාණඤ්ජසං 166
පුරාණමග්ගො 166
පුරිසත්ථාමෙන 46, 426
පුරිසපරක්කමෙන 46, 426
පුරිසපුග්ගලො 314
පුරිසරූපං වා 158
පුරිසවිරියෙන 46, 426
පුරිසස්ස ජවො 412
පුරිසො 276, 410
පූජිතො 188

පෙ

පෙය්‍යාලෙන 374
පෙසලෙ 348

පො

පොක්ඛරං 412
පොක්ඛරණීසම්පන්නං 164
පොක්ඛරණී 212
පොරාණං 412
පොරියා වාචාය 432

ඵ

ඵරුසාවාචා 260
ඵරුසාය වාචාය පටිවිරතා 260
ඵරුසො 364
ඵලං දෙති 368
ඵලකං 412
ඵලකෙ 158

**ඵ** — පිට්ඨඞ්කා

ඵලිතෙ 412
ඵස්සං 24, 26, 68, 70, 186, 202
ඵස්සජාතිකා 20, 82
ඵස්සනානත්තං 222, 232
ඵස්සනිදානා 20, 82
ඵස්සනිරොධා 132
ඵස්සනිරොධා වෙදනානිරොධො 12
ඵස්සනිරොධො 58
ඵස්සපච්චයා 4, 10, 22, 40, 92, 66, 112
ඵස්සපච්චයා වෙදනා 182
ඵස්සප්පභවා 20, 82
ඵස්සසමුදයා 20, 82
ඵස්සායතනං 88
ඵස්සාහාරෙ 152
ඵස්සුපනිසා 50
ඵස්සෙ ඛො අසති වෙදනා න හොති 12
ඵස්සෙ ඛො සති වෙදනා හොති 10
ඵස්සො 2, 4, 6, 16, 18, 20, 22, 58, 66, 90, 178
ඵස්සොතිස්ස වචනීයං 48

**ඵා**

ඵාණිතං ඵාණිතෙන 246
ඵාලෙය්‍ය 146
ඵාසුලනන්තරිකාහි විතුදන්ති 390

**ඵො**

ඵොට්ඨබ්බතණ්හා 6, 390
ඵොට්ඨබ්බධාතු 222
ඵොට්ඨබ්බසඤ්චෙතනා 378
ඵොට්ඨබ්බසඤ්ඤා 378

**බ**

බලාය 416
බහිද්ධා ච නාමරූපං 38
බහිද්ධා ච සබ්බනිමිත්තෙසු 386, 388
බහිද්ධා 194
බහුජනසුඛාය 310, 424
බහුජනහිතාය 310
බහුඤ්චෙව මෙ දෙන්තු 306
බහුතරානි 340

**බ** — පිට්ඨඞ්කා

බහුත්ථිකානි 408
බහුදෙව පුච්ඡිතුකාමා 32
බහුධාපි හුත්වා එකො හොති 190
බහුපුරිසානි කුලානි 408
බහුලීකතා 408, 410
බහුස්සුතා 242
බහුස්සුතා බහුස්සුතෙහි 248
බහූනි වස්සානි 404
බළිසං 344

**බා**

බාලස්ස 38
බාහිරකා 412
බාහුජඤ්ඤං 160,166
බාළිසිකො 344

**බි**

බිලගතො 350
බිළාලො 418

**බො**

බොධිසත්තස්ස 8, 144
බොධිසත්තස්සෙව 16, 264

**බ්‍ය**

බ්‍යඤ්ජනමෙව නානං 98
බ්‍යන්තීකරොති 236
බ්‍යාකතං භගවතා 388
බ්‍යාකරමානා 52
බ්‍යාකරෙය්‍යං 84
බ්‍යාපන්නචිත්තා 260

**බ්‍ර**

බ්‍රහ්මචක්කං 44
බ්‍රහ්මචරියං 166
බ්‍රහ්මචරියං චරිතුං 332
බ්‍රහ්මචරියපරියොසානං 34, 428
බ්‍රහ්මචරියවාසො 94, 96, 98
බ්‍රහ්මචාරිභවනෙන 320
බ්‍රහ්මචාරී 320
බ්‍රහ්මචාරූපද්දවෙන 320
බ්‍රහ්මඤ්ඤත්ථං වා 24, 26, 28, 70,- 200, 272, 360
බ්‍රහ්මලොකා 196

**බ්‍රා**

බ්‍රාහ්මණසම්මතා 24, 26, 200, 360
බ්‍රාහ්මණා වා 26, 170
බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා 26, 28, 272

| භ | පිට්ඨඞ්කා |
|---|---|
| භගවන්තං එව පටිභාතු | 38, 126 |
| භගවංනෙත්තිකා | 38, 126, 302 |
| භගවන්තමෙව පස්සෙය්‍යං | 334 |
| භගවම්පටිසරණා | 38, 126, 302 |
| භගවම්මූලකා | 38, 126, 302 |
| භගවතො සාවකසඞ්ඝො | 108 |
| භගිනියාපි හෙතු | 370 |
| භගිනීමරණං | 278 |
| භඤ්ඤමාතෙසු | 412 |
| භත්තාභිහාරො | 368 |
| භද්දකො වතායං භික්ඛු | 318 |
| භබ්බො | 410 |
| භබ්බො අනුත්තරස්ස-යොගක්ඛෙමස්ස අධිගමාය | 300 |
| භබ්බො නිබ්බානාය | 300 |
| භබ්බො සම්බොධාය | 300 |
| භයානි | 106 |
| භවං | 24, 26, 68, 72, 186, 200 |
| භවජාතිකා | 58, 80, 128 |
| භවනිදානා | 58, 80, 128 |
| භවනිරොධා | 128 |
| භවනිරොධගාමිනියා | 88 |
| භවනිරොධ සාරුප්පගාමිනීපටිපදා | 128 |
| භවනිරොධා ජාතිනිරොධො | 12, 66, 132 |
| භවනිරොධාය | 128 |
| භවනිරොධෙ | 88 |
| භවනිරොධො | 4, 58, 112 |
| භවපච්චයා | 2, 4, 40, 92, 94 |
| භවපච්චයා ජාති | 8, 182 |
| භවප්පභවා | 58, 80, 128 |
| භවසමුදයා | 66, 80, 128 |
| භවිස්සාමි නුඛො අහං-අනාගතමද්ධානං | 42 |
| භවූපනිසා | 50 |
| භවෙ | 88 |
| භවෙ ඛො අසති ජාති න හොති | 12 |
| භවෙ ඛො සති ජාති හොති | 8 |
| භවා | 2, 4, 16, 18, 58, 90, 92, 96 |
| භවොතිස්ස වචනීයං | 48 |
| **භා** | |
| භාතුපි හෙතු | 370 |
| භාතුමරණං | 278 |

| භා | පිට්ඨඞ්කා |
|---|---|
| භාතුයාපි හෙතු | 273 |
| භාවිතා | 408,410 |
| භාසිතස්ස | 192 |
| **භි** | |
| භිංකච්ඡාපා | 416 |
| භික්ඛුං වෙහාසං ගච්ඡන්තං | 400 |
| භික්ඛුනූපස්සයො | 326 |
| භික්ඛුනියො | 328 |
| භික්ඛුභාවාය | 34 |
| භික්ඛුසඞ්ඝොපි | 188 |
| භිත්තියා වා | 158 |
| භිසමුළාලං | 416 |
| **භී** | |
| භීයොසොමත්තාය | 370 |
| භීයොපි තිට්ඨමානො | 148 |
| **භු** | |
| භුජිස්සානි | 108 |
| භුත්තාවී | 348 |
| **භූ** | |
| භූතං | 74 |
| භූතපුබ්බං | 294, 346, 412, 416, 418 |
| භූතානං | 20, 22 |
| භූතානං වා සත්තානං | 152 |
| **භො** | |
| භොගව්‍යසනං | 278 |
| භොජනෙ අමත්තඤ්ඤූ | 332 |
| **ම** | |
| මංසං ඡින්දති | 362 |
| මංසපෙසිං | 392 |
| මංසලොහිතං | 46, 426 |
| මගධානං ගිරිබ්බජෙ | 286 |
| මගයමානො | 418 |
| මග්ගා ඔක්කම්ම | 334 |
| මඞ්ගුලිං ඉත්ථිං | 398 |
| මච්චුමරණං | 4, 66, 68 |
| මජ්ඣන්තිකං සමයං | 156, 408 |
| මජ්ඣිමං ආචික්ඛති | 240 |
| මජ්ඣිමා චෙතනා | 240 |
| මජ්ඣිමා තස්ස උප්පත්ති | 240 |
| මජ්ඣිමා දිට්ඨි | 240 |
| මජ්ඣිමා පඤ්ඤා | 240 |
| මජ්ඣිමා වාචා | 240 |

| ම | පිට්ඨඞ්කා |
|---|---|
| මජ්ඣිමා සඤ්ඤා | 240 |
| මජ්ඣිමො පණිධි | 240 |
| මජ්ඣිමො පුග්ගලො | 240 |
| මජ්ඣිමො විතක්කො | 240 |
| මජ්ඣෙන ධම්මං දෙසෙති | 28 |
| මඤ්ජිට්ඨාය වා | 158 |
| මණ්ඩපෙය්‍යං | 46 |
| මදය වා | 154 |
| මධු මධුනා සංසන්දති | 246 |
| මනසිකාරො | 6 |
| මනස්මිම්පි නිබ්බින්දති | 374 |
| මනායතනං | 6 |
| මනො ඉතිපි | 148 |
| මනොදුච්චරිතෙන | 192, 326 |
| මනොධාතු | 222 |
| මනො නිච්චො වා අනිච්චො වාති | 374 |
| මනොවිඤ්ඤාණං | 6, 112, 376 |
| මනොවිඤ්ඤාණධාතු | 222 |
| මනොසඞ්ඛාරං | 62 |
| මනොසඤ්චෙතනා | 20, 22, 152, 156 |
| මනොසඤ්චෙතනාහෙතු | 62 |
| මනොසම්ඵස්සජා වෙදනා | 6, 224, 378 |
| මනොසම්ඵස්සො | 6, 222, 376, 384 |
| මනොසුචරිතං | 326 |
| මත්ලොණිකාය වා විනෙතුං | 174 |
| මමඤ්ච සන්තිකෙ විහරාහි | 308 |
| මමායිතං | 148 |
| මරණං වා නිගච්ඡෙය්‍ය | 4, 66, 170, 416 |
| මරණමත්තං | 156, 416 |
| මරණමත්තම්පි දුක්ඛං | 418 |
| මසිං කරෙය්‍ය | 138, 146 |
| මහණ්ණවෙ | 246 |
| මහතියා පරිබ්බාජකපරිසාය | 188 |
| මහත්ථියො | 212 |
| මහප්ඵලතරං | 408 |
| මහප්ඵලා | 46 |
| මහග්ගතං | 190 |
| මහග්ගතං වා චිත්තං | 324 |
| මහාඅග්ගික්ඛන්ධො | 134 |
| මහාඅට්ඨිකඞ්ඛලො | 286 |
| මහාකුම්මකුලං | 346 |

| ම | පිට්ඨඞ්කා |
|---|---|
| මහාගුළපුඤ්ජා | 348 |
| මහාධිගමො | 220 |
| මහානදියො | 50, 186, 214 |
| මහානාගා | 426 |
| මහානිසංසා | 46 |
| මහානුභාවො | 424 |
| මහාපඤ්ඤා | 242 |
| මහාපථවිං උපනිධාය | 406 |
| මහාපථවී | 212, 406 |
| මහාභිඤ්ඤතං | 422 |
| මහාභිඤ්ඤො | 220 |
| මහාභූතා | 6 |
| මහායසො | 18 |
| මහාරුක්ඛො | 138, 144 |
| මහාවාතෙ වා ඔපුනෙය්‍ය | 138 |
| මහාසමුද්දං | 50 |
| මහාසමුද්දං අප්පෙති | 284 |
| මහාසරසී | 416 |
| මහාසාසපරාසි | 282 |
| මහාසෙලො පබ්බතො | 280 |
| මහාසොබ්භං | 20 |
| මහිද්ධිකා | 242 |
| මහිද්ධිකො | 324 |
| මහිසානං සතං මහිසභූතානං | 290 |
| මහී | 214 |
| මහෙසක්ඛො | 424 |
| මහෙසිනො | 286 |

| මා | |
|---|---|
| මාගධකා | 286 |
| මාගධකානං මනුස්සානං | 296 |
| මාගවිකො | 394 |
| මාතා | 276 |
| මාතුගාමො | 358 |
| මාතුවජ්ජා පුත්තො | 432 |
| මාතුඵස්සං | 280 |
| මාතුපි හෙතු | 370 |
| මාතුමරණං පච්චනුභූතං | 278 |
| මාතුමාතරො | 276 |
| මාතුමාතා | 276 |
| මානසං | 386, 386 |
| මා තාදංසු | 304 |
| මානිතො | 188 |

මා — පිට්ඨඞ්කා

මාරෙ පාපිමා 414
මාහෙවං අවච 32, 36
මාහෙවං ආනන්ද 144
මාහෙවං කස්සප (අවච) 32, 34

මි

මිගානං සතං මිගභූතානං 290
මිච්ඡා ආජීවා 262
මිච්ඡාකම්මන්තා 262
මිච්ඡාඤාණිනො 262
මිච්ඡාදිට්ඨිකම්මසමාදානා 192, 326
මිච්ඡාදිට්ඨිකා 192, 260, 262, 326
මිච්ඡාපටිපජ්ජති 236
මිච්ඡාපටිපදා 8
මිච්ඡාවායාමා 262
මිච්ඡාවාචා 263
මිච්ඡාවිමුත්තිනො 262
මිච්ඡාසඞ්කප්පා 262
මිච්ඡාසතිනො 262
මිච්ඡාසමාධිනො 262
මිලෙක්ඛො 348

මු

මුඛතො ජාතො 336
මුඛතො නික්ඛමන්ති 396
මුඛවණ්ණො 424
මුඛෙ පවිසිත්වා 396
මුඤ්ජබබ්බජාභූතා 144
මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි 246
මුට්ඨිතා 410
මුත්තං මුතෙන්ත 244
මුදිඞ්ගා 412
මුදුකා 334
මුදුකාසු සෙය්‍යාසු 414
මුදුතලුණහත්ථපාද 441
මුදුමුසිං 418
මුද්ධාපි තස්ස විපතෙය්‍ය 334
මුසාවාදපච්චයා 106
මුසාවාදපටිවිරතා 258
මුසාවාදිනො මුසාවාදීහි 358
මුසාවාදී 106
මුහුත්තෙන ආරොහන්ති 296, 410
මුහුත්තෙන ඔරොහන්ති 226

මූ

මූලානි උද්ධරෙය්‍ය 138, 146
මූලානි පලිසත්ථෙය්‍ය 140
මූලෙ ඡින්දෙය්‍ය 138, 146
මූලෙ ඡෙත්වා 138

මෙ — පිට්ඨඞ්කා

මෙත්තං චිත්තං 408, 410
මෙත්තා චෙතොවිමුත්ති 408, 410
මොඝපුරිසා 312, 340

ය

යං අතීතං තං පහීනං 436
යං අනාගතං තං පටිනිස්සට්ඨං 436
යං කිඤ්චි විඤ්ඤාණං 386
යත්‍ර හි නාම සාවකො 392, 402
යථා අකුසලං 198, 312
යථාකම්මූපගෙ 192, 326
යථාකාමකරණීයො 344
යථාධම්මං 312
යථාධම්මං පටිකරොසි 198
යථා තිත්තං 50
යථා බාලං 198
යථාභූතං 28, 122, 194, 272, 386, 388
යථාභූතඤාණාය 204
යථාභූතඤාණදස්සනූපනිසා 50
යථාභූතඤාණදස්සනත්ථිස්ස වචනීයං 48
යථාමූලකං 198
යන්නූනාහං 52
යමුනා 214
යම්පච්චයා 62
යසස්සී 320

යා

යා කාචි වෙදනා 386
යාකාචි සඤ්ඤා 386
යානීකතා 410
යාවතකො 54, 194
යාවදත්ථං භුඤ්ජන්තු චෙව හරන්තු ච 398
යාවදත්ථො 348
යාවදෙව මනුස්සෙහි සුප්පකාසිතං 166
යාවබ්‍රහ්මලොකා 190
යාවසූරියුග්ගමනා 414

යෙ

යෙ කෙචි සඞ්ඛාරා 386
යෙභුය්‍යෙන 28

යො

යොගක්ඛෙමස්ස 344
යොගො 208
යොජනං 280
යොනිසො මනසිකාරා 8, 12, 14, 16, 18, 162, 164

ර — පිට්ඨඞ්කා

රජකො 158
රජාපථො 332
රට්ඨපිණ්ඩං 334
රථියා රථියං 198
රසතණ්හා 6, 380
රසධාතු 222
රසසඤ්චෙතනා 378
රසසඤ්ඤා 378
රසසම්පන්නො 170
රස්මි 160
රහොගතො 114

රා

රාගානුද්ධංසිතෙන 350
රාසි 286

රු

රුක්ඛනිස්සිතා 154
රුක්ඛමූලගතො 350
රුදන්තානං 278

රූ

රූපං 6, 386, 388
රූපං නිච්චං වා අනිච්චං වා 386
රූපච්ඡන්දො 226, 230
රූපතණ්හා 6, 380, 384
රූපධාතු 222
රූපපරියෙසනා 226, 230
රූපපරිළාහො 226, 230
රූපභවො 4
රූපසඞ්කප්පො 226, 230
රූපසඤ්චෙතනා 378 384
රූපසඤ්ඤා 226, 230, 378, 384
රූපසම්ඵස්සජා වෙදනා 230
රූපසම්ඵස්සො 230
රූපස්මිම්පි නිබ්බින්දති 150, 280

රො

රොගජාතෙන 350, 418
රොගබ්‍යසනං 278
රොගානං ඊතී 272
රොගානං වූපසමො 272
රොහිතස්සානං මනුස්සානං 294

ල — පිට්ඨඞ්කා

ලච්ඡති 414
ලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජ-
පරික්ඛාරං 298
ලද්ධා ච චීවරං 298
ලද්ධා ච පිණ්ඩපාතං 298
ලද්ධා ච සෙනාසනං 298
ලහුකං 296

ලා

ලාභාය වා 158
ලාභං 416
ලාභකාමා 304
ලාභතානන්තං 232
ලාභසක්කාරසිලොකො 344, 354
ලාභසක්කාරසිලොකනිරොධං 362
ලාභසක්කාරසිලොකනිරොධගාමිනී
පටිපදං 362
ලාභසක්කාරසිලොකසමුදයං 362
ලාභී 188, 320

ලි

ලිච්ඡවී 414

ලූ

ලූඛං දෙන්ති 306

ලො

ලොකං 192
ලොකනිරොධං 28
ලොකවිදූ 108
ලොකසමුදයං 28
ලොකා 270
ලොකානුකම්පාය 310, 424
ලොකුත්තරා 412
ලොකෙ 168, 264
ලොණඝටාය 426
ලොණසක්ඛරා 426
ලොණසොවීරකෙන වා 174
ලොහිතං 288
ලොහිතං ලොහිතෙන 244

ව

වචනක්ඛමො 434
වචීදුච්චරිතෙන 192, 326
වචීසඞ්ඛාරෙ 6, 66, 68, 90
වචීසඤ්චෙතනා හෙතු 62

**ව** පිට්ඨඞ්කා

වචීසුචරිතං 326
වට්ටිං උපසංහරෙය්‍ය 136
වට්ටිං ච පටිච්ච 136
වඩ්ඪති ආහාර 316
වඩ්ඪති ආරොහපරිණාහෙන 316
වඩ්ඪති මණ්ඩලෙන 316
වඩ්ඪතෙව වණ්ණෙන 316
වණ්ණපොක්ඛරතාය 430
වණ්ණවාදී 298, 308, 434
වණ්ණසම්පන්නො 170
වණ්ණාය 416
වණ්ණිතො 426
වත්තා 434
වත්ථුකතා 408, 410
වදෙය්‍යං 22
වනථො 246
වනසම්පන්නං 104
වයධම්මං 42, 92, 94
වලිතතචතා 4, 66, 68, 88
වල්ලූරඤ්ච 154
වසං වත්තෙති 196
වස්සමාතස්ස 350, 418
වස්සසතං 296
වස්සසතජීවිතො 282
වස්සසතම්පි තිට්ඨමානො 148
වස්සසතානි 392, 404
වස්සසතායුකා 282
වස්සසතස්ස වස්සසහස්ස අච්චයෙන 280, 282
වස්සසතසහස්සානි 404
වස්සසහස්සානි 392, 402

**වා**

වාචාසත්තිතොදකෙන 434
වාතපාතා 160
වාතාතපෙ විසොසෙය්‍ය 138, 146
වායොධාතු 264, 272, 340, 380
වායොධාතුං අභිනන්දති 272
වායොධාතුං නප්පජානාති 274
වායොධාතුං පටිච්ච 264
වායොධාතුනිරොධං 274
වායොධාතුනිරොධගාමිනිං පටිපදං 274
වායොධාතුසමුදයං 274
වායොධාතුයා අස්සාදෙ 264, 268

**වා** පිට්ඨඞ්කා

වායොධාතුයා ආදීනවො 268
වායොධාතුයා නිරොධො 272
වායොධාතුයා නිස්සරණං 268
වාලරජ්ජුයා 364

**වි**

විකන්තති 348
වික්ඛිත්තං 190
වික්ඛිත්තං වා චිත්තං 324
විගතධූමාතං 156
විචිකිච්ඡාමි 78, 84
විජ්ජා 12, 14, 16, 18, 130, 164
විජ්ජාචරණසම්පන්නො 108
විජ්ජුප්පාද 130
විඤ්ඤාණං 2, 4, 6, 8, 16, 18, 20, 22, 24, 26, 66, 68, 94, 178, 186, 202, 388
විඤ්ඤාණං ඉතිපි 148
විඤ්ඤාණජාතිකං 20
විඤ්ඤාණඤ්චායතනං 322
විඤ්ඤාණඤ්චායතනධාතු 234
විඤ්ඤාණධාතු 380
විඤ්ඤාණනිදානං 20
විඤ්ඤාණනිරොධා 132
විඤ්ඤාණනිරොධා නාමරූපනි-රොධො 14, 164, 180
විඤ්ඤාණනිරොධො 4,6,8, 18, 28,34
විඤ්ඤාණන්තිස්ස වචනීයං 50
විඤ්ඤාණපච්චයා 2, 4, 40, 92
විඤ්ඤාණපච්චයා නාමරූපං 10, 162, 180, 182
විඤ්ඤාණප්පභවං 20
විඤ්ඤාණසමුදයං 20
විඤ්ඤාණම්පි නිබ්බින්දති 150, 380
විඤ්ඤාණාහාරො 22, 156
විඤ්ඤාණූපනිසං 50
විඤ්ඤාණෙ අසති 122
විඤ්ඤාණෙ ඛො අසති නාමරූපං න හොති 14, 164
විඤ්ඤාණෙ ඛො සති නාමරූපං හොති 10, 162
විඤ්ඤාණෙ සති නාමරූපං හොති 120
විඤ්ඤූපසත්ථෙහි 108
විතක්කවිචාරානං 322, 422

| වි | පිට්ඨඞ්කා |
| --- | --- |
| විතක්කසහගතා | 422 |
| විතච්ඡෙන්ති විරාජෙන්ති | 392, 396 |
| | 398, 400 |
| විත්ථාරිකං | 166 |
| විත්ථාරෙන | 192, 212 |
| විත්ථාරෙන යොජනං | 280, 282 |
| විධාසමතික්කන්තං | 386, 388 |
| විනයධරා | 242 |
| විනිපාතං | 144, 192 |
| විනොදෙති | 236 |
| විපරිණාමඤ්ඤථාභාවා | 424 |
| විපරිණාමධම්මං | 194, 374 |
| විප්පමුත්තා | 270 |
| විප්පසන්නාති | 424 |
| විප්ඵන්දිතානි | 98, 100 |
| විභජති | 40, 240 |
| විභඞ්ගපටිපදා | 18 |
| විභූසනාය වා | 154 |
| විමරියාදිකතෙන චෙතසා | 270 |
| විමුච්චෙය්‍යාපි | 148 |
| විමුත්තං | 190 |
| විමුත්තං වා චිත්තං | 324 |
| විමුත්තස්මිං විමුත්තමිති ඤාණං | 374 |
| විමුත්තීතිස්ස වචනීයං | 48 |
| විමුත්තූපනිසං | 50 |
| විමොක්ඛා | 84, 198 |
| විරජ්ජෙය්‍යාපි | 148 |
| විරාගධම්මං | 42, 92, 94 |
| විරාගාය | 30, 74, 338 |
| විරාගා විමුච්චති | 76, 322, 374, 380 |
| විරාගා විරජ්ජති | 150 |
| විරාගූපනිසා | 50 |
| විරාගොතිස්ස වචනීයං | 48 |
| විරියං | 210 |
| විරියං අත්ථි | 314 |
| විරියං ආරභථ | 46 |
| විරියං නත්ථි | 314 |
| විරියස්ස සණ්ඨානං | 46, 426 |
| විරියාරම්භස්ස | 308 |
| විරූළ්හං | 158 |
| විරූළ්හිං | 140 |
| විවටො | 46 |
| විවට්ටකප්පෙ | 192, 324 |
| විවරති | 40, 240 |

| වි | පිට්ඨඞ්කා |
| --- | --- |
| විවිච්ච අකුසලෙහි ධම්මෙහි | 320 |
| | 328, 336 |
| විවිච්චෙව කාමෙහි | 320, 328, 336 |
| විවෙකජං | 320, 328, 336 |
| විසඤ්ඤුත්තා | 270 |
| විසඤ්ඤුත්තෙන | 130 |
| විසමගතං | 236 |
| විසල්ලෙන සල්ලෙන | 348 |
| විසුද්ධෙන | 192 |
| විසූකායිතානි | 98, 100 |
| විසෙන සංසට්ඨො | 170 |
| විසෙවිතානි | 98, 100 |
| විස්සට්ඨාය | 432 |
| විහිංසාඡන්දො | 236 |
| විහිංසාධාතුං | 236 |
| විහිංසාපරියෙසනා | 236 |
| විහිංසාපරිළාහො | 236 |
| විහිංසාවිතක්කො | 236 |
| විහිංසාසඞ්කප්පො | 236 |
| විහිංසාසඤ්ඤා | 236 |

| වී | |
| --- | --- |
| වීතච්චිකානං | 156 |
| වීතදොසං | 190 |
| වීතදොසං වා චිත්තං | 324 |
| වීතමොහං | 190 |
| වීතමොහං වා චිත්තං | 322 |
| වීතරාගං | 190 |
| වීතරාගං වා චිත්තං | 324 |
| වීතිසාරෙත්වා | 30, 116, 300 |
| වීසතිපි වස්සානි තිට්ඨමානො | 148 |
| වීසතිවස්සසහස්සානි | 294 |

| වු | |
| --- | --- |
| වුත්තවාදිනො | 52, 64 |
| වුඩ්ඪිං | 140, 166 |
| වුඩ්ඪියෙව පාටිකඞ්ඛා | 314 |
| වුසිතං බ්‍රහ්මචරියං | 34, 78, 80, 130 |
| | 188, 374 |

| වූ | |
| --- | --- |
| වූපකට්ඨො | 34, 374 |
| වූපසන්තාති | 106 |
| වූපසමා | 422 |
| වූපසමෙය්‍ය | 130 |
| වූපසමො | 272 |

**වෙ** — **පිට්ඨඞ්කා**

වේදනා 2, 4, 6, 16, 18, 20, 22, 24, 56, 58, 66, 68, 70, 90, 96, 178, 186, 202, 386, 388
වේදනාජාතිකා 20, 82
වේදනාතිස්ස වචනීයං 48
වේදනානානත්තං 224, 232
වේදනානිදානා 20, 82
වේදනානිරෝධා 132
වේදනානිරෝධා තණ්හානිරෝධොති 12
වේදනා නිරෝධෝ 4, 58
වේදනා පච්චයා 2, 4, 24, 40, 92, 94, 112
වේදනාපච්චයා තණ්හා 10, 182
වේදනාපභවා 20, 82
වේදනාභිතුන්නස්ස 34, 36
වේදනාය බො අසති තණ්හා න හොති 12
වේදනාය බො සති තණ්හා හොති 10
වේදනායපි නිබ්බින්දති 150, 380
වේදනාසමුදයා 20, 82
වේදනූපනිසා 50
වේදයිතං 84, 100, 152
වේඨෙත්වා 364
වෙපුල්ලං 140
වෙපුල්ලප්පත්තං 166
වෙපුල්ලො 296
වෙය්‍යාකරණං 22, 192
වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ 290
වෙය්‍යාකරණාය 84
වෙය්‍යාවච්චං 428
වෙරම්බවාතක්ඛිත්තස්ස 350
වෙරානි 104
වෙසාරජ්ජානි 49
වෙහාසං ගච්ඡන්තිං 398, 400, 402
වෙළු 368

**වො**

වොකිණ්ණො 46

**ව්‍ය**

ව්‍යසනං ආපන්නං 346
ව්‍යසනං පච්චනුභූතං 276, 292

**ව්‍යා** — **පිට්ඨඞ්කා**

ව්‍යාපාදච්ඡන්දො 236
ව්‍යාපාදධාතුං 236
ව්‍යාපාදපරියෙසනා 236
ව්‍යාපාදපරිළාහො 236
ව්‍යාපාදවිතක්කො 236
ව්‍යාපාදසඞ්කප්පො 236
ව්‍යාපාදසඤ්ඤා 236

**ස**

සඞ්කප්පනානත්තං 226, 232
සඞ්කමිස්සාමි 326
සඞ්කසායති 428
සඞ්ඛතං 42
සඞ්ඛම්පි න උපෙති 406
සඞ්ඛලිඛිතං 332
සඞ්ඛාතධම්මො 76
සඞ්ඛාදිත්වා 416
සංසට්ටසමොධානා 152
සංවට්ටකප්පෙ 192
සංවට්ටවිවට්ටකප්පෙ 192, 324
සංසග්ගා 246
සංසන්දන්ති සමෙන්ති 214, 240, 258
සංසන්දිංසු සමිංසු 244
සංසන්දිස්සන්ති සමෙස්සන්ති 244
සංසරතං 276, 278, 284, 288,
සංසාරො 276, 280, 284, 286, 288
සංසිතං 280, 282
සංසිතො 280, 282
සංහානි 4
සංහාරකො 286
සඋත්තරං 190
සඋත්තරං වා චිත්තං 324
සඋද්දෙසං 192, 324
සඋද්ද්‍රයා 46
සඋපනිසං 48
සඋපායාසං 158, 236
සකං කිච්චං 428
සකලිකං සකලිකං කාරෙය්‍ය 138, 146
සකාය පරිසාය පටිස්සුත්වා 188
සකිම්පි අග්ගෙන නිපතති 284
සකිම්පි මූලෙන නිපතති 284
සකිං සකිං පරිමජ්ජෙය්‍ය 280
සකෙන ලාභෙන 304
සක්කච්චඤ්ඤෙව මෙ දෙන්තු 306
සක්කතො හොති 188
සක්ඛිං වා කරිස්සති 392

ස — පිට්ඨඞ්කා

සක්‍යපුත්තියපටිඤ්ඤා 418
සගාරවා විහරති සප්පතිස්සා 342
සග්ගං 192
සඞ්ඛාරනිරොධගාමිනිං 24, 26, 68, 70, 72
සඞ්ඛාරනිරොධගාමිනී පටිපදා 68, 90, 166, 202
සඞ්ඛාරනිරොධං 24, 26, 68, 70, 72, 90, 128, 202
සඞ්ඛාරනිරොධසාරුප්පගාමිනී පටිපදා 128
සඞ්ඛාරනිරොධා 34, 66, 132
සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො 14
සඞ්ඛාරනිරොධො 4, 6, 8, 18, 28, 34, 68, 90
සඞ්ඛාරපච්චයා 2, 4, 8, 22, 40, 66, 92, 94, 98
සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං 16, 28, 34, 182
සඞ්ඛාරසමුදයං 24, 26, 66, 68, 70, 72, 90, 128, 202
සඞ්ඛාරා 2, 4, 6, 8, 16, 18, 22, 66, 68, 90, 94, 96, 386, 388
සඞ්ඛාරාතිස්ස වචනීයං 50
සඞ්ඛාරූපනිසං 50
සඞ්ඛාරෙ උපයාපෙති 186
සඞ්ඛාරෙසු අසති විඤ්ඤාණං න හොති 14, 122
සඞ්ඛාරෙසුපි නිබ්බින්දති 150, 380
සඞ්ඛාරෙසු සති විඤ්ඤාණං හොති 120
සඞ්ඛිත්තං වා චිත්තං 324
සඞ්ඛිත්තෙන 374
සඞ්ඝං භින්දි 366
සඞ්ඝං භින්දෙය්‍යුං 330
සඞ්ඝාටිං කරිත්වා 332
සඞ්ඝාටිපි ආදිත්තා සම්පජ්ජලිතා 400, 402
සච්ඡිකත්වා 70
සජොතිභූතා 400, 402
සජ්ජිතං 288
සඤ්චෙතනා 388
සඤ්ඤමහරිං 434
සඤ්ජාති 4, 66
සඤ්ඤා 6, 386, 388

ස — පිට්ඨඞ්කා

සඤ්ඤානානත්තං 226, 232
සඤ්ඤාමනසිකාරා 422
සඤ්ඤායපි නිබ්බින්දති 150, 380
සඤ්ඤාවෙදයිතනිරොධං 322
සඤ්ඤාවෙදයිතනිරොධධාතු 234
සඤ්ඤොජනං 154
සඤ්ඤොජනීයෙසු 134
සණ්ඨානං 426
සතසහස්සිමං 212, 220
සති 210
සතිමා 322
සත්තො 8, 14, 16, 84, 332
සත්තකම්මපථං 262
සත්තකොලට්ඨිමත්තියො 216
සත්තක්ඛත්තුං පරමං 286
සත්තක්ඛත්තුං පරමතා 212
සත්තනිකායෙ 4, 66, 68, 88
සත්තමුග්ගමත්තියො 220
සත්තරතනං 330, 336
සත්තරිඤාණවත්ථූනි 92
සත්තසත්තරිඤාණවත්ථූනි 94
සත්තසාසපමත්තියො 218
සත්තා 4, 22, 240, 258, 260, 262, 268, 270, 278, 284, 288, 406
සත්ති 410
සත්තිසතෙන 156
සත්තෙසු කායමාතෙසු 340
සත්ථා 286
සත්ථා දෙවමනුස්සානං 108
සත්ථා මෙ භන්තෙ භගවා 334
සත්ථාරඤ්ච වතාහං පස්සෙය්‍යං 334
සත්ථා සම්මුඛීභූතො 46
සදත්ථං 46
සදරං 158
සදෙවකා 270
සදෙවකෙ 264
සදෙවමනුස්සා 270
සදෙවමනුස්සාය 264
සදෙසං 190
සදොසං වා චිත්තං 324
සද්දතණ්හා 6, 380
සද්දධාතු 222
සද්දසඤ්චෙතනා 378
සද්දසඤ්ඤා 378

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සද්දු | 376 |
| සද්ධම්මං | 66, 70, 90 |
| සද්ධම්මපතිරූපකං | 340 |
| සද්ධම්මස්ස ඨිතියා | 342 |
| සද්ධා අත්ථි | 314 |
| සද්ධාතිස්ස වචනීයං | 48 |
| සද්ධා නත්ථි | 314 |
| සද්ධාපබ්බජිතෙන | 46 |
| සද්ධා සද්ධෙහි සද්ධිං | 248, 258 |
| සද්ධිවිහාරිං | 310 |
| සද්ධූපනිසා | 50 |
| සද්ධො පුරිසපුග්ගලොති | 316 |
| සනිදානං | 236 |
| සන්තං | 386 388 |
| සන්තා විමොක්ඛා | 196 |
| සන්තිකෙ වා | 194 |
| සන්ති භික්ඛූ ඔවාදකා | 316 |
| සන්තුට්ඨා | 308 |
| සන්තෙන විහාරෙන | 424 |
| සන්දස්සෙති | 432 |
| සන්දිට්ඨිකො | 108, 304 |
| සන්ධාවතං | 276, 278, 284, 288 |
| සන්ධාවතං සංසරතං | 290 |
| සන්ධාවන්තා | 284 |
| සන්ධාවිත්වාන | 286 |
| සන්ධිසමලසඞ්කටීරෙ | 418 |
| සපත්තිං | 400 |
| සපරිළාහං | 236 |
| සප්පතිස්සා | 342 |
| සප්පි සප්පිනා | 246 |
| සඵලා | 46 |
| සබ්බං තප්පීති | 28, 118 |
| සබ්බං පුථුත්තනන්ති | 120 |
| සබ්බං රූපං | 386, 388 |
| සබ්බඞ්ගපච්චඞ්ගං | 158 |
| සබ්බචෙතසා සමන්නාගතං | 334 |
| සබ්බමප්පීති | 28, 118 |
| සබ්බමෙකත්තනන්ති | 120 |
| සබ්බවෙදයිතානි | 130 |
| සබ්බසඞ්ඛාරෙසු | 276, 278 |
| සබ්බසඞ්ඛාරෙසු නිබ්බිදිතුං | 292, 296 |
| සබ්බසඤ්ඤොජනක්ඛයා | 286 |
| සබ්බෙ ආරඤ්ඤකා | 288 |
| සබ්බෙ තෙචීවරිකා | 288 |
| සබ්බෙ පංසුකූලිකා | 288 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සබ්බෙ පිණ්ඩපාතිකා | 288 |
| සබ්බෙ සසංයොජනා | 288 |
| සබ්බො අත්ථො වුත්තො භවිස්සති | 56 |
| සබ්බූපාදානක්ඛයා | 84 |
| සබ්‍රහ්මකෙ | 264 |
| සමණුද්දසු | 294 |
| සමණබ්‍රාහ්මණා | 52 |
| සමණසම්මතා | 24, 26, 200, 360 |
| සමණා වා | 26, 236, 272 |
| සමණා වා බ්‍රාහ්මණා වා | 274 |
| සමණෙසු වා සමණසම්මතා | 26, 28, 272 |
| සමතිත්තිකා | 212 |
| සමනුමොදිංසු | 426 |
| සමන්නාගතා | 192, 310 |
| සමාදපෙති | 432 |
| සමාදපෙත්වා | 328 |
| සමාධිජං | 322, 422 |
| සමාධිසංවත්තනිකෙහි | 108 |
| සමාධිසමං | 340 |
| සමාධිතිස්ස වචනීයං | 48 |
| සමාධූපනිසං | 50 |
| සමාපත්ති | 430 |
| සමාපත්ති පත්තබ්බා | 234 |
| සමාරකා | 276 |
| සමාරකෙ | 264 |
| සමාහිතං | 190 |
| සමාහිතං වා චිත්තං | 324 |
| සමාහිතා සමාහිතෙහි සද්ධිං | 258 |
| සමුග්ඝාතං | 406 |
| සමුච්ඡෙදමග්ගමා | 366 |
| සමුත්තෙජෙති | 432 |
| සමුත්තෙජෙත්වා | 328 |
| සමුදයං | 66, 112, 274 |
| සමුදයති | 120 |
| සමුදයො | 2, 6,12, 16, 28, 34, 94,98 |
| සමුදයො සමුදයොති | 12, 16 |
| සමුදගතො | 38 |
| සමුදචරති | 422 |
| සමොහං | 199 |
| සමොහං වා චිත්තං | 324 |
| සම්පජඤ්ඤං | 210 |
| සම්පජානමුසා | 354 |
| සම්පජානො | 62, 322 |
| සම්පජ්ජලිතා | 400 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සම්පරායිකම්පි | 106 |
| සම්පසාදනං | 322, 422 |
| සම්පහංසෙති | 432 |
| සම්පහංසෙත්වා | 328 |
| සම්පස්සමානෙන | 46 |
| සම්පාදෙතුං | 46 |
| සම්ඵප්පලාපා පටිවිරතා | 260 |
| සම්ඵප්පලාපිනො | 260 |
| සම්ඵස්සො | 388 |
| සම්බලං | 154 |
| සම්බලමත්තා | 154 |
| සම්බහුලා | 414 |
| සම්බහුලා භික්ඛූ | 282 |
| සම්බාධො ඝරාවාසො | 332 |
| සම්බාධාය | 338 |
| සම්බොධිපරායණො | 106, 110 |
| සම්භතං | 286 |
| සම්භවෙසීනං වා | 152 |
| සම්භෙජ්ජ උදකං | 214 |
| සම්මප්පඤ්ඤාය | 74, 76, 194, 286, 386, 388 |
| සම්මප්පඤ්ඤාය පස්සතො | 28 |
| සම්මප්පඤ්ඤාය සුදිට්ඨො | 42 |
| සම්මසමානො සම්මසති | 168 |
| සම්මාආජීවො | 66, 262 |
| සම්මාකම්මන්තා | 262 |
| සම්මාඤාණිනො | 262 |
| සම්මාදිට්ඨි | 28, 66, 68, 90, 166 |
| සම්මාදිට්ඨිකම්මසමාදානා | 192, 326 |
| සම්මාදිට්ඨිකා | 192, 260, 262, 326 |
| සම්මාදිට්ඨි සම්මාදිට්ඨීති | 28 |
| සම්මා දුක්ඛක්ඛයාය | 38 |
| සම්මාපටිපජ්ජති | 238 |
| සම්මාපටිපදං | 8 |
| සම්මාවදමානො | 320 |
| සම්මාවාචා | 66, 262 |
| සම්මාවායාමා | 262 |
| සම්මාවායාමො | 66 |
| සම්මාවිමුත්තිනො | 262 |
| සම්මාසඞ්කප්පා | 262 |
| සම්මාසඞ්කප්පො | 66 |
| සම්මාසති | 66 |
| සම්මාසතිනො | 262 |
| සම්මාසමාධි | 66, 68, 90, 166 |
| සම්මාසමාධිනො | 262 |
| සම්මාසම්බුද්ධඤ්ච වතාහං පස්සෙය්‍යං | 334 |
| සම්මාසම්බුද්ධස්ස | 8, 14, 16, 402 |
| සම්මාසම්බොධිං | 264 |
| සම්මොදනීයං | 30, 116, 176,188, 300 |
| සම්මොදි | 30, 176 |
| සම්මොසාය | 340 |
| සයං කතං | 52 |
| සයං කතං දුක්ඛං | 32, 34 |
| සයං කතඤ්ච පරංකතඤ්ච දුක්ඛන්ති | 32 |
| සයං කතො භවො | 176 |
| සයං කතො ච පරංකතො ච භවො | 176 |
| සරසිං ඔගාහෙත්වා | 416 |
| සරාගං | 190, 196 |
| සරාගං වා චිත්තං | 324 |
| සරීරානි අවසිස්සන්ති | 130 |
| සවිඝාත | 236 |
| සවිඤ්ඤාණකෙ කායෙ | 386, 388 |
| සවිචාරං | 320, 328, 336 |
| සවිතක්කං | 320, 328, 336 |
| සසීසකං | 398 |
| සසොකං | 158 |
| සස්සමණබ්‍රාහ්මණී | 270 |
| සස්සමණබ්‍රාහ්මණියා පජාය | 264 |
| සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍ය | 52, 64 |
| සහසා අප්පටිසඞ්ඛා | 170 |
| සහස්සිමං | 212, 220 |
| සළායතනං | 2, 4, 6, 16, 18, 20, 22 24, 26, 66, 68, 70, 72, 90 96, 164, 186, 202 |
| සළායතනජාතිකො | 20, 58 |
| සළායතනනිදානො | 20, 52 |
| සළායතනනිරොධා | 132 |
| සළායතනනිරොධා ඵස්සනිරොධො | 12, 164, 180 |
| සළායතනනිරොධො | 4 |
| සළායතනානිස්ස වචනීයං | 50 |
| සළායතනපච්චයා | 2,4,22,40, 92, 96 |
| සළායතනපච්චයා ඵස්සො | 10, 162, 180, 181 |
| සළායතනප්පභවො | 20, 58 |
| සළායතනසමුදයො | 20, 58 |
| සළායතනූපනිසො | 50 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සළායතනෙ ඛො අසති ඵස්සො න හොති | 12 |
| සළායතනෙ ඛො සති ඵස්සො හොති | 10 |
| සළෙවායතනානි | 38 |
| **සා** | |
| සාකාරං | 192, 324 |
| සාකුණිකො | 392 |
| සාණානි | 336 |
| සාණානි පංසුකූලානි නිබ්බසනානි | 336 |
| සාණො | 334 |
| සාතච්චං | 210 |
| සාතරූපං | 168 |
| සාතසහගතා | 334 |
| සාධිකපොරිසා | 156 |
| සාධුජීවිපි | 246 |
| සාමං | 62 |
| සාමඤ්ඤඵලං | 24, 26, 28, 70, 200, 272, 360 |
| සාමණෙරං | 402 |
| සාමණෙරිං | 402 |
| සාමීචිපටිපන්නො | 108 |
| සායං පාතං | 368 |
| සායන්හසමයං | 58, 176, 408 |
| සාරාණීයං කථං | 30, 116, 300 |
| සාවකභාසිතා | 412 |
| සාවකයුගං | 294 |
| සාවකො | 286 |
| සාවකොහමස්මි | 334 |
| සා වෙදනා සො වෙදියති | 36 |
| සාසපාතං පුණ්ණං | 282 |
| සාසපො | 286 |
| **සි** | |
| සික්ඛං පච්චක්ඛාය | 300 |
| සික්ඛා | 208 |
| සික්ඛාකාමො වතායං භික්ඛු | 318 |
| සික්ඛාපදානි | 340 |
| සික්ඛිතබ්බං | 298 |
| සික්ඛිතා | 410 |
| සිඞ්ඝානිකඛෙළස්සාපි | 356 |
| සිඞ්ඝානිකස්සාපි | 356 |
| සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං | 198 |

| සි | පිට්ඨඞ්කා |
|---|---|
| සිතං පාත්වාකාසි | 390 |
| සිතස්ස පාතුකම්මාය | 390 |
| සිනෙරුපබ්බතරාජා | 220 |
| **සී** | |
| සීඝතරං | 412 |
| සීඝං සන්දව මෙ දෙන්තු | 306 |
| සීතීභවිස්සන්ති | 130 |
| සීදති | 246 |
| සීලබ්බතුපාදානං | 6 |
| සීසච්ඡින්නානං | 288, 290 |
| සීහනාදෙ | 86 |
| **සු** | |
| සුකරං | 410 |
| සුක්කා ධම්මා | 366 |
| සුක්ඛ | 236 |
| සුඛං | 264 |
| සුඛකාමො | 156 |
| සුඛතො අද්දක්ඛුං | 170 |
| සුඛදුක්ඛං | 36, 62 |
| සුඛදුක්ඛපටිසංවෙදී | 224 |
| සුඛන්තිස්ස වචනීයං | 48 |
| සුඛවිහාරී | 322 |
| සුඛවෙදනීයං | 152 |
| සුඛා | 270 |
| සුඛානුපතිතා | 270 |
| සුඛාවක්කන්තා | 270 |
| සුඛාවෙදනා | 82 |
| සුඛිතං සජ්ජිතං | 288 |
| සුඛුමං වා | 194 |
| සුඛුමාලො | 414 |
| සුඛුමො | 20, 22 |
| සුඛූපනිසො | 50 |
| සුගතස්ස වතාහං පස්සෙය්‍යං | 334 |
| සුගති | 238 |
| සුගතෙ | 192 |
| සුගතො | 108, 226 |
| සුඤ්ඤතපටිසංයුත්තා | 412 |
| සුඤ්ඤාගාරගතො | 350 |
| සුතවා අරියසාවකො | 386 |
| සුතෙන අච්චාවදන්තෙන | 310 |
| සුත්තකං | 346 |
| සුත්තන්තා | 412 |
| සුදිට්ඨො | 106, 108, 260 |
| සුන්දරතරං භාසිස්සති | 310 |

**සු** පිට්ඨඞ්කා

සුපටිපන්නො 108
සුප්පටිවිද්ධත්තා 86
සුප්පටිවිද්ධො 106, 108
සුප්පටිවිනීතො 436
සුප්පධංසියානි 408
සුප්පියානං මනුස්සානං 294
සුභධාතු 234
සුභාසිතං 426
සුමිද්ධො වා 158
සුරාපිපාසිතා 174
සුරාමෙරයමජ්ජපමාදට්ඨාන
පච්චයා 108
සුරාමෙරයමජ්ජපමාදට්ඨානා 108
සුරාමෙරයමජ්ජපමාදට්ඨානා
පටිවිරතා 258
සුරාමෙරයමජ්ජපමාදට්ඨායී 108
සුරාමෙරයමජ්ජපමාදට්ඨායිනො 258
සුරාමෙරයමජ්ජපමාදට්ඨායීහි 258
සුලපිතං 426
සුලහරූපො 290
සුවණ්ණචුණ්ණපරිපූරාය 354
සුවණ්ණනික්ඛසතස්සාපි 356
සුවණ්ණනික්ඛස්සාපි 356
සුවණ්ණපාතියාපි 354
සුවණ්ණො 192
සුවික්ඛාලිතං වික්ඛාලෙත්වා 416
සුවිමුත්තං 388
සුසමාරද්ධා 408, 410
සුසමුහතා 424
සුස්සූසිස්සන්ති 412

**සූ**

සූකරානං සතං සූකරභූතානං 290
සුවචො 396
සුවිසරං 350
සූචියො සීසෙ පවිසිත්වා 396
සූචිලොමං පුරිසං 394, 396

**සෙ**

සෙඛං 360
සෙඛාය 70
සෙඛාය විජ්ජාය 90, 92
සෙඛාය විජ්ජාය සමන්නාගතො
ඉතිපි 124

**සෙ** පිට්ඨඞ්කා

සෙඛෙන 66, 90
සෙඛෙන ඤාණෙන 92
සෙඛෙන ඤාණෙන සමන්නාගතො
ඉතිපි 124
සෙඛො 74
සෙතාසතහෙතු 298
සෙය්‍යං කප්පෙස්සන්ති 414
සෙය්‍යථාපි ආකාසෙ 190
සෙය්‍යථාපි උදකෙ 190
සෙය්‍යථාපි පක්ඛී සකුණො 190
සෙය්‍යථාපි පඨවියං 190
සෙය්‍යථීදං 214
සෙය්‍යාසු 414

**සො**

සොකපරිදෙවදුක්ඛදොමනස්සු-
පායාසා 2, 58, 102, 424
සො කරොති 34
සො කරොති සො පටිසංවෙදෙති116
සොචති 38, 174
සොණ්ඩාය 416
සොණ්ඩිකාකූව 154
සොතං 170, 412
සොතධාතු 196, 222, 324, 426
සොතවිඤ්ඤාණං 6, 376
සොතවිඤ්ඤාණධාතු 222
සොතසම්ඵස්සජා 6
සොතසම්ඵස්සජා වෙදනා 378
සොතස්මිම්පි නිබ්බින්දති 374
සොතසම්ඵස්සො 6, 222, 376, 384
සොතාපත්තියඞ්ගානි 106
සොතාපන්නො 106, 110
සොතායතනං 6
සො පටිසංවෙදියති 34
සොමනස්සං 264
සොමනස්සදොමනස්සානං 322
සො සුද්ධං අට්ටස්සරං කරොති 396
ස්වාක්ඛාතො 46
ස්වාක්ඛාතො භගවතා ධම්මො
108, 304

| හ | පිට්ඨඞ්කා |
|---|---|
| හථෙති | 236 |
| හලිද්දියා වා | 158 |
| **හා** | |
| හානියෙව පාටිකඞ්ඛා | 314 |
| හායති ආභාය | 314 |
| හායති ආරොහපරිණාහෙන | 314 |
| හායති මණ්ඩලෙන | 314 |
| හායතෙව වණ්ණෙන | 314 |
| **හි** | |
| හිතාය | 314 |
| හිරි අත්ථි | 314 |
| හිරි නත්ථි | 314 |
| හිරිමනා හිරිමනෙහි | 248, 258 |
| හිරිමා පුරිසපුග්ගලොති | 316 |
| හිරොත්තප්පං | 334 |
| **හී** | |
| හීනං ආවික්ඛති | 240 |
| හීනං වා පණීතං වා | 194, 386, 388 |

| හී | පිට්ඨඞ්කා |
|---|---|
| හීනවීරියං | 246 |
| හීනා චෙතනා | 240 |
| හීනා තස්ස උප්පත්ති | 240 |
| හීනා දිට්ඨි | 240 |
| හීනා පත්ථනා | 240 |
| හීනාධිමුත්තිකතා | 240 |
| හීනායාවත්තති | 350 |
| හීනායාවත්තා | 330 |
| හීනා වාචා | 240 |
| හීනා සද්ධා | 240 |
| හීනා පණිධි | 240 |
| හීනො පුග්ගලො | 240 |
| හීනො විතක්කො | 240 |
| **හො** | |
| හොති ච න හොති ච තථාගතො පරම්මරණාති | 338 |
| හොති තථාගතො පරම්මරණාති | 336 |

# ශුද්ධිපත්‍රය

## ERRATA

| පිටුව | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 7 | 11 | සිරුරෙහි ගැටීමෙන් වන වේදනා ය | දිවෙහි ගැටීමෙන් වන වේදනා-ය, සිරුරෙහි ගැටීමෙන් වන වේදනා ය, |
| 8 | 16 | විපස්සිසුත්තං | විපස්සීසුත්තං |
| 27 | 26 | සඞ්ඛරනිරොධගාමිනීප්‍රතිපදාව | සඞ්ඛාරනිරොධගාමිනී ප්‍රතිපදාව |
| 27 | 40 | ජරාමරණ දනිද්ද. | ජරාමරණ දනිත් |
| 32 | 5 | වෙය්‍යකරණායාති | වෙය්‍යාකරණායාති |
| 32 | 15, 25 | පරකතං | පරංකතං (අධොලිපිය "1. පරංකතං" යනු "1. පරකතං - කච්චි." සී විය යුතු.) |
| 32 | 17, 26 | අපරකාරං | අපරංකාරං (අධොලිපිය "2. අපරංකාරං" යනු "2. අපරකාරං-කච්චි." සී විය යුතු.) |
| 34 | 4 | වේදනඃභිතුන්නස්ස | වේදනාභිතුන්නස්ස. |
| 35 | 31 | පරිවෙසෙන්නෙමි | පිරිවෙසෙන්නෙමි |
| 39 | 34 | ප්‍රහිණ | ප්‍රහීණ |
| 42 | 23 | භවිස්සතීති | භවිස්සතීති[5] |
| 51 | 24 | යථභූතඥානදර්ශනය | යථාභූතඥානදර්ශනය |
| 59 | 14 | තොට | කොට |
| 67 | 18 | සම්මඃසමාධි | සම්මාසමාධිය |
| 69 | 23 | ජරාමරණගාමිනීප්‍රතිපදාවයි. | ජරාමරණනිරොධගාමිනී ප්‍රති-පදාව යි. |
| 72 | 11 | බ්‍රාහ්මණා ව | බ්‍රාහ්මණා වා |
| 75 | 32 | නිරොධයෙන් යමක් | නිරොධයෙන් යමක් |
| 76 | 22 | නිරොධම්මස්ස | නිරොධධම්මස්ස |
| 77 | 36 | සඞ්ඛීතධර්ම | සඞ්ඛ්‍යාතධර්ම |
| 77 | 42 | උපදනා | උපාදන |
| 80 | 28 | ත්‍ව, | ත්‍වං |
| 83 | 8 | සේ | එසේ |
| 83 | 9, 10 | වේදනාව කාරණ කොට ඇත. වේදනාව ජාති කොට ඇත. වේදනාව ප්‍රභව කොට ඇතැයි | තණ්හාව කාරණ කොට ඇත, තණ්හාව ජාති කොට ඇත, තණ්හාව ප්‍රභව කොට ඇතැයි |
| 83 | 18 | විචාරණත්තාහු | විචාරත්තාහු |
| 83 | 31 | ස්පර්ශයෙන් කාරණ | ස්පර්ශය කාරණ කොට |
| 84 | 3 | වෛය්‍යාකරණාය | වෙය්‍යාකරණාය |
| 86 | 30 | අඤ්ඤමඤ්ඤති | අඤ්ඤමඤ්ඤහි |
| 86 | 33 | පාරියායෙහි | පරියායෙහි |
| 88 | 3 | එකමත්ථං | එතමත්ථං |
| 89 | 11, 12 | සිවු රැදුවල කුදුකුදු | සිවු රැදුවල කුදු |
| 91 | 18 | අඹවයෙහි | අඹයෙහි |
| 92 | 20 | සුණථ | සුණාථ |

| පිටුව | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 93 | 12 | දෙණුවත | දෙනුවණ |
| 100 | 29 | විසදසදණං | විසදසදුණං |
| 104 | 10 | අරම්මණමෙතං | ආරම්මණමෙතං |
| 104 | 11 | අරම්මණෙ | ආරම්මණෙ |
| 104 | 27 | ජාතිජරාණමරණං | ජාතිජරාමරණං |
| 105 | 22, 23 | කල ගතිය | කල) ගතිය |
| 107 | 6 | හග්‍යවතුන් | භාග්‍යවතුන් |
| 108 | 27 | ඉමස්සුප්පභද | ඉමස්සුප්පාද |
| 109 | 25 | පුණ්‍යක්‍ෂ්‍යත්‍රය | පුණ්‍යක්‍ෂෙත්‍රය |
| 110 | 28 | අ ච්චප්පසාදෙන | අවෙච්චප්පසාදෙන |
| 111 | 35 | ආය්‍යකාත්තශීලයෙන් | ආය්‍යකාන්තශීලයෙන් |
| 113 | 21 | සප්‍රෂ්ටව්‍යත් | සප්‍රෂ්ටව්‍යන් |
| 125 | 17 | නි ෙවීදිකප්‍රඥ | නිර්වේධිකප්‍රඥ |
| 127 | 12 | ඇත්තාහ. වහන්ස, | ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිට කොට ඇත්තාහ. වහන්ස, |
| 127 | 20, 21, 22, 35, 36, 37 | කිමෙක් | කුමක් |
| 128 | 27 | අවිජ්ජනිදනා | අවිජ්ජානිදානා |
| 129 | 12, 13, 14, 26, 27, 28, 29, 30, 31, 32 | කිමෙක් | කුමක් |
| 130 | 8 | අපුඤ්ඤසඛකාරං | අපුඤ්ඤාභිසඞ්ඛාරං |
| 137 | 26 | උදපාන | උපාදන |
| 140 | 19 | තරුණෙ | තරුණො |
| 151 | 32 | පරශීමතය | පරාමශීතය |
| 124 | 6 | කනතාරාසෙසො | කන්තාරාවසෙසො |
| 155 | 26 | දත්තේ | දත්තේ |
| 160 | 30 | ආපසමං | ආපසමිං |
| 166 | 25 | කම්මාසදම්මං | කම්මාසසදම්මං |
| 169 | 5 | භ්‍යග්‍යවතුන් | භාග්‍යවතුන් |
| 110 | 16, 17 | තෙ න පරිමුච්චිස්සන්ති | යෙ දුක්ඛං වඩ්ඪිස්සන්ති, තෙ න පරිමුච්චිස්සන්ති |
| 171 | 27 | පියෑහැවි | පියසැහැවි |
| 184 | 11 | අහමෙත | අහමෙතං |
| 185 | 24 | ආකරපරිවිතර්කයෙන් | ආකාරපරිවිතර්කයෙන් |
| 186 | 11 | සම්මපරෙතො | සම්මපරෙතො |
| 190 | 22 | විතනනති | විතනනති |
| 191 | 11 | ඇසුරු | අසුරු |
| 195 | 16 | පෙරලෙනලුසු | පෙරලෙනසුලු |
| 195 | 17 | අත්මය | ආතමය |
| 196 | 28 | ජනතෙනා | ජාතනෙනා |
| 198 | 12 | සවකඛාතෙ | සවාකඛාතො |
| 200 | 7 | බ්‍රහමණා | බ්‍රාහමණා |
| 200 | 10 | බ්‍රහමාණෙසු | බ්‍රාහමණෙසු |
| 201 | 26 | දනීද | දනිත් ද |
| 203 | 31 | විශිෂ්ටඥතයන් | විශිෂ්ටඥතයෙන් |

| පිටුව | පෙළ | ශුද්ධ | අශුද්ධ |
|---|---|---|---|
| 214 | 20 | උදකපුසිතානි | උදකපුසිතානි |
| 214 | 29 | උදකපුසිකානි | උදකපුසිතානි |
| 216 | 33 | අප්පමත්තානි | අප්පමත්තකානි |
| 222-256 | 1 | අභිසමයසංයුත්තං | ධාතුසංයුත්තං |
| 223-255 | 1 | අභිසමයසංයුත්තය | ධාතුසංයුත්තය |
| 224 | 21 | විසත්තානත්තං | එසත්තානත්තං |
| 224 | 32 | මනොසම්ඵජා | මනොසම්ඵස්සජා |
| 226 | 18 | සබ්බප්පතානානත්තං | සබ්බප්පතානත්තං |
| 228 | 10 | ඡන්දනානානත්තං | ඡන්දනානත්තං |
| 230 | 14 | සඤ්ඤානානත්තං | සඤ්ඤානානත්තං |
| 230 | 35 | පරිසෙනානානත්තං | පරියෙසනානානත්තං |
| 231 | 9 | පරියෙසීෂණනානාත්වය | පයෙසීෂණනානානාත්වය |
| 232 | 18 | ධම්මසම්ඵස්සජං | ධම්මසම්ඵස්සජං |
| 233 | 11 | පොට්ඨබ්බධාතුව | ථොට්ඨබ්බධාතුව |
| 235 | 20 | විඤ්ඤාණඤ්චායතනධාතුවක් | විඤ්ඤාණඤ්චායතනධාතුවක් |
| 236 | 36 | උප්පපජ්ජති | උප්පජ්ජති |
| 238 | 26 | බ්‍රහ්මණො | බ්‍රාහ්මණො |
| 239 | 13 | අව්‍යාදපායෙසීෂණාව් | අව්‍යාපාදපයෙසීෂණාව |
| 244 | 37 | පච්චුප්පන්නං | පච්චුප්පන්නං |
| 248 | 13 | සිද්ධිං | සද්ධිං |
| 248 | 35 | දුප්පඤ්ඤති | දුප්පඤ්ඤති |
| 250 | 5 | අශ්‍රෝහි | අස්සද්ධෙහි |
| 250 | 14 | අසද්ධා | අස්සද්ධා |
| 250 | 23 | අස්සද්ධ | අස්සද්ධා |
| 250 | 25 | පඤ්ඤවන්තො | පඤ්ඤවන්තො |
| | | පඤ්ඤවන්තෙහි | පඤ්ඤවන්තෙහි |
| 250 | 34 | සංසන්දන්තිති | සංසන්දන්ති |
| 253 | 41 | පරිපුන් | පිරිපුන් |
| 254 | 18 | අද්ධානා | අද්ධානං |
| 255 | 24 | වසිත් ම | විසිත් ම |
| 256 | 32 | ඤ්ඤවන්තො | පඤ්ඤවන්තො |
| 262 | 6 | මච්ඡාචාචා | මිච්ඡාචාචා |
| 272 | 6 | දුක්ඛසමා | දුක්ඛසමාති |
| 273 | 24 | ව්‍යපශමයෙක් | ව්‍යුපශමයෙක් |
| 273 | 26 | අපොධාතුවෙහි | ආපොධාතුවෙහි |
| 275 | 15 | මගණෝ | මහණෝ |
| 279 | 9 | අවිවර්ජිතනා වූ | අපරිවර්ජිතනා වූ |
| 279 | 27 | බෙහෝමය. | බොහෝ ම ය, |
| 279 | 38 | තිස | තිසි |
| 280 | 15 | සංසරිතං | සංසරතං |
| 280 | 22, 24 | භික්ඛූ | භික්ඛු |

| පිටුව | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 282 | 24 | එතදවොංචු | එතදවොචුං |
| 284 | 34 | සංසංරො | සංසාරෙ |
| 287 | 10 | මගත් | මහත් |
| 288 | 31 | අමන්තෙසි | ආමන්තෙසි |
| 294 | 2 | පාවිතවංසොතෙ | පාවීතවංසොතෙව |
| 294 | 24 | කාලකත? | කාලකතා |
| 294 | 27 | සුප්පිය | සුප්පියා |
| 297 | 21 | ඉපැදල, | ඉපැද |
| 299 | 35 | අයුක්තාදොෂණයට | අයුක්තාදෙෂණයට |
| 300 | 7 | මහාකස්සනෙත | මහාකස්සපෙත |
| 300 | 25 | අතප්පං | ආතප්පං |
| 300 | 31 | සංවෙතෙනයුත්ති | සංවතෙනයුත්ති |
| 301 | 14. 17, 20, 29, 38 | කෙළෙස් | කෙලෙස් |
| 301 | 25 | පණීත | පිණීත |
| 302 | 14 | නුපජ්ජමානා | නුප්පජ්ජමානා |
| 302 | 31 | භගවන්තන්තිකා | භගවතොන්තිකා |
| 302 | 32 | භගවන්තමෙසොදව | භගවන්තසොදව |
| 302 | 83 | භිකඛු | භික්ඛු |
| 303 | 24 | සබ්බවාදියෙන්) | සබ්බවාදියෙන්) |
| 304 | 21 | සුණෙසුං | සුණෙය්‍යුං |
| 826 | 7 | ධරෙස්සන්තීති | ධාරෙස්සන්තීති |
| 309 | 24 | භාගවත්හු | භාග්‍යවත්හු |
| 309 | 32 | ගුණ තියනුයේ | ගුණ කියනුයේ |
| 310 | 10 | වණ්ණාවාදිතො | වණ්ණවාදිතො |
| 310 | 36 | භිකඛුතං | භික්ඛුතං |
| 312 | 3 | සද්ධිං විහාරිං | සද්ධිවිහාරිං |
| 312 | 17 | අජාතාථ | ආජාතාථ |
| 313 | 33 | යාවඥ | යාවඳ |
| 314 | 6 | නිසින්නං කො | නිසින්නං ඛො |
| 315 | 9 | කාස්සප | කස්සප |
| 316 | 16 | රත්තී | රත්ති |
| 317 | 22 | කුශීත | කුසීත |
| 318 | 8 | ඔවදෙයං | ඔවදෙය්‍යං |
| 318 | 29 | හොහි | හොති |
| 318 | 30 | ආරද්ධකන්තයා | ආරද්ධකන්තස්ස |
| 319 | 34 | ප්‍රවිවිකතත් | ප්‍රවිවිකතත් |
| 320 | 18 | ආසතං | ආසනං |
| 320 | 28 | සවිචාරාං | සවිචාරං |
| 321 | 8 | අසංසඟියෙහි | අසංසගීයෙහි |
| 322 | 19 | විහාරමි | විහරාමි |
| 323 | 24 | ආකාසනඤ්චායතනය | ආකාසානඤ්චායතනය |
| 324 | 4 | තිරොපබ්බං | තිරොපබ්බතං |

| පිටුව | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 326 | 23 | භික්ඛුනුඋපස්සයසුත්තං | භික්ඛුනුපස්සයසුත්තං |
| 329 | 25 | භික්ඛුනු උපස්සයසූත්‍රය | භික්ඛුනුපස්සය සූත්‍රය |
| 329 | 34 | පූතිභාග | ප්‍රතිභාග |
| 330 | 33 | ඵාසුවිහාරය | ඵාසුවිහාරාය |
| 332 | 31 | උදිස්ස | උද්දිස්ස |
| 332 | 31 | වත්ථිති | වත්ථාති |
| 332 | 32 | ආගරසමා | අගාරසමා |
| 333 | 12 | සූයේය | සූ යේ ය |
| 334 | 33 | සංඝාටි, | සඞ්ඝාටිං, |
| 335 | 28 | තො මා | තො ම |
| 336 | 13 | විහාරාමි | විහරාමි |
| 340 | 11 | අත්තරධාතං | අන්තරධාතං |
| 340 | 28 | සඞ්ඝ | සඞ්ඝෙ |
| 343 | 4 | ශස්තෲක් | ශාස්තෲත් |
| 344 | 1 | ලාභසක්කාරසංසංයුත්තං | ලාභසක්කාරසංයුත්තං |
| 344 | 22 | යථාකාමකාරිණියො | යථාකාමකරණියො |
| 346 | 22 | උපත්තං | උප්පත්තං |
| 349 | 9 | වර්සියෙන් | වර්වසින් |
| 349 | 10 | මීලහකාවත් | මීළ්හකාවත් |
| 349 | 39 | සිරියෙකින් | හුලෙකින් |
| 349 | 40 | "සිරිය" | "හුල" |
| 350 | 16 | අභයබ්‍යාසතං | අභයබ්‍යසතං |
| 350 | 30 | ඉද්‍රියෙහි | ඉන්ද්‍රියෙහි |
| 353 | 1 | 253 | 353 |
| 358 | 10 | පජාහිස්සාමි | පජහිස්සාම |
| 360 | 35 | ආයසමතො | ආයසමනොතා |
| 362 | 18 | පතායෂමනොතා | පතායසමනොතා |
| 362 | 34 | රවමමං | වමමං |
| 364 | 26 | චෙතොවිමුක්කි | චෙතොවිමුත්ති |
| 369 | 10 | දරණුය | දරුණු ය |
| 370 | 22 | ලාභසත්කාරසිලොකං | ලාභසක්කාරසිලොකං |
| 370 | 27 | 434-439 | 334-339 |
| 374 | 15 | සමපතාතිවචං | යමපතාතීවචං |
| 376 | 14 | 442 | 342 |
| 376 | 25 | 443 | 343 |
| 376 | 3 | රූපාදි ආරම්මණසුත්තං | රූපාදිසුත්තං |
| 378 | 4 | 444 | 344 |
| 378 | 2 | චක්ඛුස්මපස්සජාය | චක්ඛුසම්ඵස්සජාය |
| 379 | 36 | ධම්මසඞ්ඛතාවෙහිත් | ධම්මසඞ්ඛතතාවෙහිත් |
| 384 | 13 | ඝාණසමඵජා | ඝාණසමඵස්සජා |
| 390 | 19 | පණ්හං | පඤ්හං |

| පිටුව | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 393 | 40 | කෙබඳු | මෙබඳු |
| 396 | 5 | සුවිලොමං | සූවිලොමං |
| 396 | 27 | සිබබීයති | සිබ්බීයති |
| 401 | 6 | තෙමෝ | තොමෝ |
| 401 | 15 | ගීජුලිහිණියෝ | ගිජුලිහිණියෝ |
| 493 | 8 | විපාකාවශෙෂන් | විපාකාවශෙෂයෙන් |
| 403 | 26 | භා්‍යවතුන්හෙන්සේ | භාග්‍යවතුන් වහන්සේ |
| 410 | 16 | අමනුසෙස | අමනුසෙසා |
| 410 | 24 | ආගවිජ්ජයෙය | ආගවෙජ්ජය්‍ය |
| 410 | 25 | කතතත්ථාතං | කතනත්ථාතං |
| 411 | 29 | දූක් | දූක්වූ |
| 414 | 25 | අයසමා | ආයසමා |
| 416 | 14 | පසනනාකරං | පසනනාකාරං |
| 419 | 39 | ශාක්‍යපුත්‍රයෙමියි | ශාක්‍යපුත්‍රීයයෙමි යි |
| 421 | 7 | ශාක්‍යපුත්‍ර | ශාක්‍යපුත්‍රීය |

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාළි - ථෙරීගාථා පාළි

32 ඛුද්දක නිකාය - ජාතක පාළි I

33 ඛුද්දක නිකාය - ජාතක පාළි II

34 ඛුද්දක නිකාය - ජාතක පාළි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාළි

36 ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාළි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාළි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාළි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාළි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාළි - චරියා පිටක පාළි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධමමසංගනිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුගගලපඤඤත්තිපපකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රදැවන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

### ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

# NAME OF SPONSOR
## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES, Volume 15～Volume 28**

**書名：斯里蘭卡巴利文大藏經，第十五冊～第二十八冊**
**Book Serial No., 書號：SR215～SR228**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,206,373：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,527,473；Print 1,000 sets**
**以上合計，新台幣 1,527,473 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡巴利文大藏經 第十七冊》

財團法人佛陀教育基金會 印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
**This book is strictly for free distribution, it is not for sale.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**
Printed in Taiwan
1,000 copies; June 2013
SR217 - 11245